පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා **http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 2

7. පෙතවත්ථු
8. ථෙරගාථා
9. ථෙරීගාථා
10. ජාතක

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ ප්‍රඥාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රත්දොඹේ මහාචේතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී ප්‍රඥානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

# ඛුද්දක නිකාය

# 2

7. පෙතවත්ථු
8. ථෙරගාථා
9. ථෙරීගාථා
10. ජාතක

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**

**ඛුද්දක නිකාය 2**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනයː
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනයː
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණයː
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැඟීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 ජනවාරි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්මරස ඇතිකරන කථා රාශියක් අන්තර්ගත කර තිබේ. කාව්‍යරසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා හා ජාතක කාණ්ඩයේ එකොළොස්වෙනි නිපාතය අවසන්කොට ඇති කාණ්ඩ හතරක්ද ඇතුළත් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයර්‍යරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයර්‍යරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත පින්කන්දේ පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත කේ. පඤ්ඤාරාම ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත විමල විජයසූරිය මහතාද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

24 - 3 - 56.

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| පෙතවත්ථු | |
| 1. උරග වර්ගය | 507 |
| 2. උබ්බරී වර්ගය | 515 |
| 3. චුල්ල වර්ගය | 540 |
| 4. මහා වර්ගය | 553 |
| 8. ථෙර ගාථා | 579 |
| එකක නිපාතය | |
| 1 වන වර්ගය | 579 |
| 2 වන වර්ගය | 581 |
| 3 වන වර්ගය | 583 |
| 4 වන වර්ගය | 585 |
| 5 වන වර්ගය | 587 |
| 6 වන වර්ගය | 589 |
| 7 වන වර්ගය | 591 |
| 8 වන වර්ගය | 593 |
| 9 වන වර්ගය | 595 |
| 10 වන වර්ගය | 597 |
| 11 වන වර්ගය | 599 |
| 12 වන වර්ගය | 601 |
| දුක නිපාතය | |
| 1 වන වර්ගය | 603 |
| 2 වන වර්ගය | 606 |
| 3 වන වර්ගය | 608 |
| 4 වන වර්ගය | 611 |
| 5 වන වර්ගය | 613 |
| තික නිපාතය | 616 |
| චතුක්ක නිපාතය | 621 |

පඤ්චක නිපාතය 626
ඡක්ක නිපාතය 632
සත්තක නිපාතය 640
අට්ඨක නිපාතය 644
නවක නිපාතය 647
දසකනිපාතය 648
එකාදසක නිපාතය 656
ද්වාදසක නිපාතය 657
තෙරසක නිපාතය 659
චතුද්දසක නිපාතය 661
සොළසක නිපාතය 664
වීසති නිපාතය 668
තිංස නිපාතය 690
චත්තාළීස නිපාතය 700
පඤ්ඤාස නිපාතය 704
සට්ඨි නිපාතය 711
මහා නිපාතය 718
9 ථෙරීගාථා
එකක නිපාතය 725
දුක නිපාතය 728
තික නිපාතය 730
චතුක්ක නිපාතය 732
පංචක නිපාතය 732
ඡක්ක නිපාතය 738
සත්තක නිපාතය 742
අට්ඨක නිපාතය 744
නවක නිපාතය 744
එකාදසක නිපාතය 745
ද්වාදස නිපාතය 746
සොළස නිපාතය 747
වීසති නිපාතය 749
තිංස නිපාතය 759
චත්තාළීස නිපාතය 762
මහා නිපාතය 767

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10 ජාතක
ඒකක නිපාතය
1 අපණ්ණක වර්ගය 774
2 සීල වර්ගය 775
3 කුරුඬග වර්ගය 777
4 කුලාවක වර්ගය 779
5 අත්ථකාම වර්ගය 781
6 ආසිංස වර්ගය 782
7 ඉත්ථි වර්ගය 784
8 වරණ වර්ගය 785
9 අපායිම්හ වර්ගය 787
10 ලිත්ත වර්ගය 789
11 පරොසහස්ස වර්ගය 790
12 හංස වර්ගය 792
13 කුසනාළි වර්ගය 793
14 අසම්පදාන වර්ගය 795
15 කකණ්ටක වර්ගය 797
දුක නිපාතය
16 දළ්හ වර්ගය 798
17 සන්ථව වර්ගය 801
18 කල්‍යාණධර්ම වර්ගය 804
19 අසදෘශ වර්ගය 807
20 රූහක වර්ගය 809
21 නතංදළ්හ වර්ගය 812
22 බීරණත්ථම්භක වර්ගය 815
23 කාසාව වර්ගය 818
24 උපාහණ වර්ගය 821
25 සිගාල වර්ගය 824
තික නිපාතය
1. සංකප්ප වර්ගය 826
2. පදුම (කොසිය) වර්ගය 830
3. අරඤ්ඤ වර්ගය 834
4. අබ්භන්තර වර්ගය 838
5. කුම්භ වර්ගය 842

චතුක්ක නිපාතය
කාලිඞග වර්ගය 846
කුටිදූසක වර්ගය 855
කොකිල වර්ගය 860
චුල්ලකුණාල වර්ගය 865
මණිකුණ්ඩල වර්ගය 869
පඤ්චක නිපාතය 876
වණ්ණාරෝහ වර්ගය 876
අට්ට වර්ගය 882
ඡක්ක නිපාතය
අවාරිය වර්ගය 886
සත්තක නිපාතය
කුක්කුට වර්ගය 903
ගන්ධාර වර්ගය 912
අට්ඨක නිපාතය
කච්චානි වර්ගය 922
නවක නිපාතය 933
දශක නිපාතය 946
එකාදසක නිපාතය 966

# ඛුද්දක නිකාය.

## 7. පෙතවත්ථු

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## 1. උරග වර්ගය.

1. **කුඹුරක් උපමාකොට ඇති ප්‍රේතයාගේ කථාව**:- 1. "රහත්හු කුඹුරක් වැනිවෙත්. දායකයෝ ගොවියන් වැනිය. දියයුතු දෙය වපුරන බීජ බඳුය. මෙපමණකින් ඵලය උපදී.

2. ප්‍රෙතයාටද දායකයාටද, මේ බීජය, මේ වැපිරීමය, මේ කුඹුරය. ඒ පින ප්‍රේතයෝ ලබත්. දෙන තැනැත්තේ පිනින් වැඩේ.

3. මෙහිම පින්කොට ප්‍රෙතයන්ටද පින්දී යහපත් කර්මයක් කොට දිව්‍යලොකස්ථානයට යයි.

2. **සූකරමුඛ ප්‍රේතයාගේ කථාව**:- 1. "තොපගේ ශරීරය හැම තැන රන්වන්ය. සියලු දිසාවන් බබළවයි. තොපගේ කට ඌරෙකුගේ මෙනි. පෙර කිනම් කර්මයක් කෙළෙහිද?"

2. "කයින් සංවරවීමි. වචනයෙන් අසංවරවීමි. නාරදයන් වහන්ස, ඒ කරුණින් එබඳු වර්ණවීමි.

3. "නාරදයන් වහන්ස, ඔබ විසින්ම මෙය දක්නා ලදී. මම මෙය ඔබට කියමි. කටින් (වචනයෙන්) පවක් නොකරව ඌරුමුඛ ඇත්තෙක් නොවව."

3. **පූතිමුඛ ප්‍රේතයාගේ කථාව**:- 1. "යහපත්වූ දිව්‍යමයවූ ශරීර වර්ණයක් දරන්නෙහිය. වෙහාසය නම්වූ අහසෙහි සිටින්නෙහිය. ඔබගේ කුණු ගඳ ගහන මුඛයද පණුවෝ කත්. පෙර කවර කර්මයක් කෙළෙහිද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

2. "මම පවිටුවූ නපුරුවූ වචන ඇති ශ්‍රමණයෙක් වීමි. කටින් සංවර නොවූ තපස් ඇත්තෙක් වීමි. මාගේ තපස්කමින් වර්ණවත් ශරීර වර්ණයක් ලැබුනේවී නමුත් කේළාම් කීම නිසා කටකුණු විය.

3. "නාරදයන් වහන්ස, ඔබ විසින් මාගේ රූපය තෙමේම දක්නාලදී. අනුකම්පා ඇති යම්කිසි කෙනෙක් කියන්නාහු නම් යහපත් වචන කියන්නේය පංචකාමය කැමති දෙවියෙක් වනු කැමැත්තේ නම් කේළාම් නොකියනු මැනවි."

**4. පිට්ඨධීතලික (පිටියෙන් තැනූ රූපය) නම් ප්‍රේතයාගේ කථාවඃ**- 1. නොමසුරු තැනැත්තේ මළවුන්ද තවද ගෙවල් ආදියට අරක්ගත් දෙවතාවන්ද යන යම් කිසිවක් අරමුණු කොට දන් දෙන්නේය.

2. ඔව්හු ලෝකය රක්නා යසස් ඇත්තාවූ කුවෙරද, ධ්‍රතරාෂ්ටද, විරූපාක්ෂද, විරූළ්හකද යන සතර වරම් මහරජදරුවන් අරභයා දන් දෙන්නාහ. දායකයෝද ප්‍රයෝජන ලබති.

3. හැඬීමක් හෝ ශොකයක් හෝ යම් අන්කිසි වැළපීමක් හෝ ප්‍රෙතයාගේ ප්‍රයොජනය පිණිස නොවේ. ඥාතීහු මෙහිම සිටිත්.

4. සංඝයා කෙරෙහි මනාකොට පිහිටුවන ලද මේ දක්ෂිණාව බොහෝ කලක් ඔහුට හිත පිණිස එකෙණෙහිම පැමිණේ.

**5. (තිරොකුඩ්ඩ) ප්‍රාකාරාදියෙන් පිටත සිටි ප්‍රේතයන්ගේ කථාවඃ**- (මෙහි ඛුද්දක පාඨයේ 7 සූත්‍රය යොදාගත යුතුයි.)

**6. පඤ්ච පුත්‍රඛාදක ප්‍රේතියගේ කථාවඃ**- 1. "වස්ත්‍ර නැතිව නපුරු වර්ණ ඇතිව කුණු ගඳ ඇත්තියක් වෙහිය, මැස්සන් විසින් වසාගත් මෙහි සිටින ඔබ කවර තැනැත්තියක් වන්නෙහිද?"

2. "ස්වාමීනි, මම නපුරු ගති ඇති යම් ලොකයෙහිවූ ප්‍රේතියක් වෙමි. පාප කර්මයක් කොට මෙයින් ප්‍රේතලොකයට ගියේ වෙමි.

3. "උදය කාලයෙහි පුත්‍රයන් පස්දෙනෙක්ද සවස නැවත අනික් පස්දෙනෙක්ද වදා කන්නෙමි. ඔවුන්ද මට ප්‍රමාණ නොවෙත්.

4. "මාගේ හෘදය බඩගින්නෙන් දැවෙයි. දුම් නගියි. පැන් බොන්නට නොලබමි. විපතට පැමිණි මා බලන්න.

5. "කිමෙක්ද කයින් වචසින් මනසින් නපුරුකමක් කරණ ලද්දේද? කවර කර්ම විපාකයකින් පුත්‍රයන්ගේ මස් කන්නෙහිද?"

6. "මාගේ සැතිරිය ගැබ්ගත්තාය, ඈට පාපයක් සිතුවෙමි. ඒ මම දූෂිතවූ සිතින් ගැබ් හෙළීම කළේය.

7. "ඇගේ දෙමාසයක්වූ ගර්භය ලේම වැගිරවූයේය ඇගේ ඒ මව තරහවූවා මගේ ඤාතීන් කැඳවූයේය. මා (ii) දිව්රීමද කරවූයේය. මට නින්දාද කළේය. ඒ මම බොරුවූ දරුණු දිව්රීමක් දිවුරුවෙමි. ඉදින් මා විසින් එය කරණ ලද්දේද දැන් පුත්‍රයන්ගේ මස් කමි.

8. "ඒ කර්ම විපාකයෙන්ද මුසාවාදයෙන්ද යන දෙකින් සැරවින් හා ලෙයින් වැකුණු ශරීර ඇති පුත්‍රයන්ගේ මස්කමි."

**7. පුත්‍රයන් සත්දෙනෙකු කන (සප්ත පුත්‍ර ඛාදක) ප්‍රේතියගේ කථාවඃ-** (මෙහි 1-2-3 ඡෙද 6 වෙනි කථාවේ 1-2-3 ඡෙද මෙනි. පස්දෙනෙක් වෙනුවට සත්දෙනෙක් යන්න යෙදිය යුතුයි.)

4. "මාගේ ළය බඩගින්නෙන් දැවෙයි. දුම් නගියි අව්වෙහි ගින්නෙත් දැවුනාක්මෙන් නිවීමක් නොලබමි.

5. (6 වෙනි සූත්‍රයේ 5 ඡේදය යොදාගත යුතුයි.)

6. "මගේ පුත්‍රයන් දෙදෙනෙක්වූහ. දෙදෙනම වැඩුන තරුණයෝය. පුත්‍රයන්ගේ බලයෙන් යුත් ඒ මම ස්වාමියාට අවමන් කළෙමි.

7. "ඉන් මගේ සැමියා කිපී අනික් ස්ත්‍රියක් ගෙනාවේය. ඈද ගර්භයක් ලැබුවාය. ඈට පාපයක් සිතුවෙමි.

8. "ඒ මම ක්‍රොධ සිතින් ගැබ් හෙළීම කළෙමි. ඇගේ තුන්මසක් වූ ගර්භය කුණු ලේ වී වැටුනේය.

9. (මෙහි 6 කථාවේ 7 (ii) ඡෙදය යොදාගත යුතුයි.)

8. **ගොන් (ගොනා) ප්‍රේතයාගේ කථාව**:- 1. "කිමෙක්ද? පිස්සෙකු මෙන් අළුත් තණ කපා ඉක්ම ගිය ජීවිතය ඇති (මැරුණු) නාකි ගවයකුට කාපිය කාපිය,යි කියයි.

2. "මළ ගොනා ආහාරයෙන් පානයෙන් නැගිටුවාලිය නොහැක්කේය. අයහපත් අදහස් ඇති, අන් පුද්ගලයෙකු යම්සේද, නුඹත් නුවණ නැති, බාලයෙක් වූයෙහිද?"

3. "මේ පයද, මේ හිසද, වලිගයද සහිත මේ ශරීරයද නේත්‍රයෝද, එසේම තිබෙත්. මේ ගොනා නැගිටින්නේය."

4. "පියාගේ අත් පාද, ශරීරයද හිසද නොපෙනේ මැටි ථූපයක් ලඟ අඬන ඔබම නුවණ නැත්තෙක් නොවේද,

5. "ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් ශොකාග්නියෙන් ගිනි ගත්තාවූම මා ජලය වත්කරන්නෙකු මෙන් සියලු චිත්ත දාහය, නිවන්නේය.

6. "මාගේ හෘදය ආශ්‍රය කළ ශොක නමැති හුල උගුලන ලද්දේය. යමෙක් ශොකයෙන් පීඩිතවූ මාගේ පියා නිසාවූ ශොකය දුරු කළේද,

7. "ඒ මම ඉදිරුණු ශොක නමැති හුල් ඇත්තේ වෙමි. සිහිල් වූයේ වෙමි. නිවුනේ වෙමි. පින්වත් මාණවකය නුඹේ වචන අසා ශොක නොකරමි, නොහඬමි.

8. "යම්සේ යහපත්ව උපන් පුත්‍රයා පියා සෝ දුකින් මුදාලයිද, නුවණ ඇති අනුකම්පා ඇති යම් කෙනෙක් වෙත් නම් ඔව්හු එසේ කරත්. ශොකයෙන් මුදවත්"

9. **මහා පෙෂකාර ප්‍රේතියගේ කථාව**:- 1. "මේ ස්ත්‍රිය අශුචිද මුත්‍රද ලේද සැරවද අනුභව කරයි. කවර කර්මයක්හුගේ මේ විපාකයෙක්ද, යම්බඳු ප්‍රෙතියක් සෑමකල්හි ලේ හා සැරව අනුභව කරන්නීද, මේ ස්ත්‍රීතොමෝ කවර අකුශල කර්මයක් කළේද?

2. "මෑට දෙනලද යහපත්වූද මෘදුවූද පිරිසිදු පැහැ ඇත්තාවූද සුව පහස් ඇත්තාවූද, අළුත් වස්ත්‍ර ලොහ වස්ත්‍ර සමාන වෙත්. මේ ස්ත්‍රීතොමෝ කවර කර්මයක් කෙළේද?"

3. "ස්වාමීන්වහන්ස, මෝතොමෝ නොදෙන සුළු මසුරු වූ තද මසුරු සිත් ඇති මාගේ භාර්යාව විය. ඕතොමෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන් දෙන්නාවූ මට ආක්‍රොශ කරයි, පරිභව කරයි.

4. "මේ දානයද නුඹට පරලොවදී මලද මුත්‍රද රුධිරයද සැරවද වේවා, වස්ත්‍රද තට ලොහ වස්ත්‍ර වෙත්වා. නුඹ සියලු කාලයෙහි අශුචි අනුභව කරන්න. මෙබඳුවූ වාක් දුශ්චරිතාදිය කොට මේ ප්‍රේත ආත්ම භාවයට පැමිණියේ බොහෝ කාලයක් ගූථාදිය අනුභව කරයි"

**10. බල්ලාටිය (හිස මුඩු) ප්‍රේතියගේ කථාව:-** 1. "විමානය ඇතුළෙහි සිටින්නාවූ තී කවර ස්ත්‍රියක්ද, විමනෙන් නොනික්මෙයි. සොඳුර මහත් ඍද්ධි ඇති තී දකිනු කැමැත්තම්හ. තී විමනෙන් නික්මෙව."

2. "නිර්වස්ත්‍රව පිටත නික්මීමට ලජ්ජා ඇත්තෙමි. හෙවත් දුක් ඇතිවෙමි. ලජ්ජා වෙමි. හිසකේ වලින් වැසුනු මුහුණ ඇත්තේ වෙමි. මා විසින් මඳ පිනක් කරණ ලදී."

3. "එබැවින් තිට මගේ උතුරු සළුව දෙමි. මේ උතුරු සළුව හැඳගනුව, සුන්දරිය මේ වස්ත්‍රය හැඳගෙන පිටත නික්මෙව, සොඳුර පිටත සිටියාවූ තී දකිම්හ. තී පිටත නික්මෙව."

4. "අතින් අතට නුඹ විසින් දෙන ලද්ද මට නොලැබේ. සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවකවූ ශ්‍රද්ධාවත්වූ මේ උපාසකයෙක්තෙම මොවුන් අතරෙහි ඇත්තේය."

5. "මේ උපාසකයා වස්ත්‍රයෙන් අඳවා මට දක්ෂිණාව (පින්) දෙව. එසේ කල්හි මම සියලු කාම සැපතින් සමෘද්ධ වූවා සුවපත් වන්නෙමි."

6. "ඒ වෙළෙන්දෝ ඒ උපාසකයා නහවා උතුම් සුවඳ ගල්වා වස්ත්‍ර දෙකකින් හඳවා ඒ ප්‍රේතියට දක්ෂිණාව දුන්හ.

7. "දීමට අනතුරුවම විපාක උපනී. නානාප්‍රකාර දිව්‍ය භොජන සමානවූ භොජනද, දිව්‍ය වස්ත්‍ර සමාන වස්ත්‍රද නොයෙක් පාන වර්ගද උපන, දානයාගේ මේ විපාකයයි.

8. "ඉක්බිති නෑමෙන් පිරිසිදුවූවා පිරිසිදු කසීසළුවලටත් වඩා උතුම් වස්ත්‍රධාරීව සිනාසෙමින් විමානයෙන් නික්මුනාය. දානයාගේ මේ විපාකය වේ.

9. "තීගේ මොනවට කරණලද චිත්‍ර රූප ඇති සිත්කළු විමන බබළයි. පින්වත් දෙවඟන, විචාරණ ලද්දේ කවර කුශල කර්මයක්හුගේ මේ විපාක දැයි" කියව.

10. "මම පිඬු පිණිස හැසිරෙන්නාවූ ඇද නැති බවට ගිය භික්ෂුවක් හට මනා පැහැදුනු සිතින් තෙල් මිරිකාගත් තල ස්වල්පයක් දුනිමි.

11. "ඒ කුශල කර්මයාගේ විපාකය බොහෝ කලක් මුළුල්ලෙහි විමනෙහි අනුභව කරයි, ඒ විපාකයද දැන් ස්වල්පය

12. "සිව් මසකින් මතු මාගේ කාලක්‍රියාව වන්නේය. මම ඒකාන්තයෙන් කටුකවූ දරුණුවූ අවීචි මහ නිරයෙහි වැටෙන්නෙමි.

13. "කොන් සතරක් ඇත්තේය. දොරටු සතරක් ඇත්තේය. ප්‍රමාණ කරණ ලදුව කොටස් වශයෙන් බෙදන ලද්දේය. යකඩ ප්‍රාකාරයකින් වට කරණ ලද්දේය. යකඩ පියනකින් වසන ලද්දේය.

14. "ඒ අවීචි මහ නරකයෙහි යකඩින් වූ භූමිය දිලිසෙන්නේය. මහත් ගිනි දැලින් යුක්තය. හැමතන්හි හාත්පස යොදුන් සියයක් තැන පැතිර සිටී.

15. "මම ඒ මහා නරකයෙහි බොහෝ කලක් මුළුල්ලෙහි දුක් වේදනාව විඳින්නෙමි. මාවිසින් කළ පාප කර්මයාගේ ඵලයක් ඇත්තේය. ඒ හෙතුවෙන් මම බොහෝ කොට ශොක කරමි."

11. **නාග ප්‍රේතයාගේ කථාව:**- 1. "පළමුව සුදුපාට ඇති ඇත් වාහනයෙන් දෙවියෙක් යයි, අතරෙහි අස් වෙළඹුන් යෙදූ රියක්යයි, පසුව දිව්‍ය කන්‍යාවක් හාත්පසින් දසදිශා බබුළුවමින් දෝලාවකින් ගෙනයනු ලබයි.

2. "මුගුරු ගත් අත් ඇත්තාවූ තෙපි වනාහි හැඬූ මුහුණින් යුක්තව සිඳුණු බිඳුණු ශරීර ඇත්තාහු යම්හෙයකින්

එකිනෙකාගේ ලෙය බොන්නාහුද මිනිස් කල තෙපි කිනම් පාපකර්මයක් කළාහුද,

3. "යම් දෙවියෙක්තෙම ඉදිරියෙන් සුදුවූ පා සතරක් ඇති නාග සංඛ්‍යාතවූ ඇත් වාහනයෙන් යේද, හෙතෙම අපගේ ජ්‍යෙෂ්ඨවූ පුත්‍රයා විය. දන් දී සුවපත් වූයේ සතුටු වෙයි.

4. "යම් දෙවියෙක්තෙම මධ්‍යයෙහි සුන්දර ගමන් හා චතුර ගමන් ඇති වෙළඹුන් සතර දෙනෙකු යෙදුවාවූ අශ්වතරී රථයෙන් යේද හෙතෙම අපගේ මධ්‍යමවූ පුත්‍රයා විය මසුරු නොවූයේ දානපතියෙක් වූයේ දැන් බබළයි.

5. "ඤාණවත්වූ මුවදෙනෙකුට බඳු ඇස් ඇති, යම් ඒ ස්ත්‍රියක් තොමෝ පසුව රන්සිවි යහනින් ගෙනයනු ලැබේද, ඕතොමෝ අපගේ බාල දුව විය. තමා ලත් කොටසින් භාගයක් දීම හෙතුකොට ගෙන සුවපත්වූවා දැන් සතුටු වෙයි.

6. "මොව්හු පෙර තුනුරුවන් කෙරෙහි පැහැදීමෙන් මහණ බමුණන්ට දන් දුන්නාහුය. අපි වනාහි මසුරු සිත් ඇත්තෝ වීමු. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට පරිභව කළෝ වීමු, මොව්හු දන්දී දැන් දිව්‍ය සම්පත් විඳිත්. අපිදු අව්වේ දමනලද බටගස් මෙන් වියලුනෝ වම්හ."

7. "තොපගේ ආහාරය කෙබඳුද, සයනය කෙබඳුද, ඉතා ලාමක ස්වභාව ඇත්තාවූ තෙපි කවර ප්‍රකාරයකින් යැපෙන්නාහුද? ස්වල්ප නොවූ උදාර භොග සම්පත් ඇති කල්හි සැපය වරදවාගෙන මේ කාලයෙහි මේ දුකට පැමිණියාහුය."

8. "අපි එකිනෙකා තලාගෙන සැරව හා රුධිරය පානය කරමු. බොහෝ පානය කොට සෑහීමට නොපැමිණෙමු. තමන්ගේ රුචියෙන් එය නොබොන්නෙමු.

9. "මෙසේම මනුෂ්‍යයෝ පරලොව ප්‍රේත විෂයෙහි සිටිමින් විලාප කියත්. යම් ඒ මනුෂ්‍ය කෙනෙක් භොග සම්පත් ලබාගෙන මේ කරුණ දැන පින් නොකෙරේද්ද? අනුභව නොකෙරේත්ද?

10. "ඒ සත්වයෝ දුක්ඛ විපාකවූ පව්කම්කොට පරලෙව්හි සා පිපාසායෙන් මඩනා ලද්දාහු ප්‍රේතයෝව බොහෝ කලක්

මුළුල්ලෙහි දැවෙමින් දුක් විඳිත්. අනිෂ්ට ඵලවූ පව්කම් කොට දුක අනුභව කරත්.

11. "ධන ධාන්‍ය වැඩිකල් නොපවත්නේය. මේ ලොකයෙහි මනුෂ්‍ය ජීවිතය ස්වල්පය. ඥාණවන්ත තෙමේ සියලු දෙය කලක් නොපවත්නේයයි අනිත්‍ය වශයෙන් දැන යහපත කරන්නේය.

12. "ධර්මයෙහි දක්ෂවූ යම් ඒ මනුෂ්‍යකෙනෙක් මෙසේ තත්වූ පරිද්දෙන් දනිත්ද ඒ මනුෂ්‍යයෝ අර්හත්වූ බුද්ධාදී ආර්යයන්ගේ වචනය අසා දානයෙහි පමා නොවෙත්."

**12. උරග ප්‍රේතයාගේ කථාව:-** 1. "සර්පතෙම දිරුණාවූ සම සිය සිරුරෙන් හැර දමායේද එසේම ශරීරය නිරර්ථකවූ කල්හි (ආයු, උෂ්ම, විඥානයන්) පහවූ කල්හි කළුරිය කළ කල්හි

2. "දවනුලබන්නාවූ ශරීරය නෑයන්ගේ හැඬීම නොදනී. එහෙයින් මේ පුත්‍රයා නිමිතිකොට නොහඬමි. හෙතෙම ඔහුගේ ගමනක්වීද එහි ගියේය.

3. "ඒ සිටිතැනින් නොකැඳවන ලදුව පැමිණියේය. මෙලොවින් අනුනොදන්නා ලදුව ගියේය. යම් ආකාරයකින් ආයේද, එසේම ගියේ වෙයි. එහිදී කවර හැඬීමක්ද?

4. (මේ ඡේදය මේ කථාවේ 2 ඡේදය මෙනි.)

5. "ඉදින් අඬන්නෙහිනම් කෘශවූ ශරීර ඇත්තියක් වන්නෙමි. ඒ හැඬීමෙහිදී මට කවර ප්‍රයෝජනයක් වන්නේද? අපගේ ඥාති මිත්‍ර සහෝදරයන්ටද බොහෝ දුක්ම වන්නේය.

6. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

7. "පින්වත් බමුණ, යම්සේ දියකළය බිඳුනේ නොගැලපිය හැකිවේද යමෙක් තෙම කළුරිය කළ කෙනෙකු සඳහා ශොක කෙරේ නම් මේ කාරණයත් එසේයයි දත යුතුයි.

8. (මෙහි 2 ඡේදය යෙදිය යුතුයි.)

---

## 2. උබ්බරී වර්ගය.

**13.** සංසාර මොචක ප්‍රේතයාගේ කථාව:- 1. "වෙන්ව පෙනෙන ඉලඇට ඇත්තී, කෘශව නිර්වස්ත්‍රවූවාය. දුර්වර්ණ වූවාය. නහර වැල් ඉල්පී ගියාය. මෙහි සිටින තී කවරියක්ද?"

2 3. (මේ ඡේද 6 කථාවේ 5 ඡේදයමෙනි)

**4.** "ස්වාමීනි, පියා හෝ මවු හෝ නොහොත් නෑකෙනෙක් හෝ පැහැදුන සිතින් මහණ බමුණන්ට දන් දෙවයි කියා යම් කෙනෙක් මට නියම කරන්නාහුද එබඳු අනුකම්පා කරණ කෙනෙක් මටනුවූහ.

**5.** "යම් හෙයකින් මෙබඳුවූ විළිවැස්මක් නැතිව බඩගින්නෙන් හා පිපාසයෙනුත් පෙළනු ලබමින් මෙතැන් පටන් අවුරුදු පන්සියයක් මුළුල්ලෙහි මම හැසිරෙම්ද මාගේ පාප කර්මයාගේ මේ විපාකය වේ.

**6.** "ආර්යයන් වහන්ස, සතුටු සිත් ඇතිව නුඹ වහන්සේ වඳිමි. මහත් ආනුභාව ඇති ධීරයන් වහන්ස, මට අනුකම්පා කරණු මැනව. යම්කිසි දාන වස්තුවක්දී මට පින්දුන මැනව. ස්වාමීන් වහන්ස, දුගතියෙන් මා මුදනු මැනව."

**7.** අනුකම්පා සිත් ඇත්තාවූ ඒ ශාරිපුත්‍ර ස්ථවිරතෙම ඇගේ කීම "මැනවයි" පිළිගෙන භික්ෂුනමකට එක් බත් පිඩක්ද, එක්රියනක් පමණ රෙදි කඩක්ද, එක පැන් තැටියක්ද දී ඒ ප්‍රේතියට දක්ෂිණාව දුන්නේය.

8. (මේ 10 කථාවේ 8 වෙනි ඡේදය මෙනි.)

**9.** පසුව පිරිසිදු ශරීර ඇතිව පිරිසිදු වස්ත්‍ර හැඳ කසී සලු වලටත් වඩා උතුම් වස්ත්‍ර දරන්නීව විසිතුරු වස්ත්‍රාභරණ ඇතිව සැරියුත් තෙරුන් වෙත පැමිණ සිටියාය.

**10.** "පින්වත් දෙව්දුව යම්බඳුවූ තී යහපත් ශරීර වර්ණයෙන් ඔසධී තරුව මෙන් සියලු දිශාවන් බබුළුවමින් සිටින්නෙහිය. කවර හෙයකින් තිගේ මෙබඳුවූ ශරීරවර්ණයක් ඇතිවේද, කවර කුශල විශෙෂයකින් තිට මෙතැන්හි සුචරිත ඵල නිපදීද, තිට සිත් පිනවන යම්කිසි වස්තූපකරණ විශෙෂයෝ උපදිත්ද."

**11.** "මහත් ආනුභාව ඇති දෙවතාව තිගෙන් මම විචාරමි. මිනිස්වූවා කිනම් පිනක් කෙළෙහිද, කවර කුශල හෙතුවකින් මෙසේ දිලිසෙන ආනුභාව ඇත්තීද, තීගේ ශරීර වර්ණයද සියලු දිශා බබුළුවයි."

**12.** "ස්වාමීනි, ලොකයෙහි කරුණා සම්පන්නවූ ස්ථවිර තෙම පඩුවන්වූ කෘශවූ බඩ සයින් පීඩිතවූ නග්නවූ සුන්බුන් සිරුරු සිවිය ඇති දුක්පත්වූ ඒ මා දුටුවේය.

**13.** "භික්ෂූන් වහන්සේට බත් පිඩක්ද රියනක් පමණ රෙදි කඩක්ද පැන් තලියක්ද දී මට දක්ෂිණාව දුනි.

**14.** "බත් පිඩේ විපාකය බලනු මැනවි. අන්‍යයන් විසින් කැමති විය යුතුවූ කාම සැපතින් යුක්තව දහසක් අවුරුදු මුළුල්ලෙහි නොයෙක් රසමසවුලෙන් යුත් දිවබොජුන් මම වළඳමි.

**15.** "රියනක් පමණ රෙදිකඩේ යම්බඳු විපාකයක් ඇද්ද බලනු මැනවි. නන්ද රජුගේ රටෙහි යම් පමණක් වස්ත්‍රයෝ වෙත්ද.

**16.** "ස්වාමීනි, මට කොසෙය්‍ය වස්ත්‍ර හා කම්බිලිද කොමුපිලි හා කපුපිලීද යන හඳනා පොරෝනා වස්ත්‍ර ඊට වඩා බොහෝ වෙති.

**17.** "මහත්වූද මාහැඟිවූද ඒ වස්ත්‍රයෝ අහසෙහිම එල්බෙත්. ඒ මම යම් යම් වස්ත්‍රයක් සිතට ප්‍රිය වේ නම් එය හැඳ පොරවා ගනිමි.

**18.** "පැන් තලියේ යම්බඳු විපාකයක් ඇද්ද එය බලනු මැනවි. ගැඹුරුවූද සතරැස්වූද පොකුණු මනාව මැවුනේය.

**19.** "සුදුවැල්ලෙන් ගැවසීගත් යහපත් තොටුපල ඇති සිහිල් ජලය ඇති, සුවඳ ඇති, පියුම්, හෙළ පියුම් ඇති, මල් රේණුවෙන් ගැවසුණු ජලයෙන් පිරුනේය.

**20.** "එහි මම ඇලෙමි. ක්‍රීඩා කරමි. සතුටු වෙමි. කිසි බියක් නැතිව ස්වාමීනි, ලොකයෙහි කරුණාන්විතවූ නුවණැති ඔබවහන්සේ වැඳීමට පැමිණියෙමි."

**14. සාරිපුත්ත මාතුපෙතී කථාව:-** 1. "මම පෙර අනික් ජාතියකදී නුඹගේ ස්වකීය මව වීමි. ප්‍රේත ලොකයෙහි උපන්නී, සාපිපාසා දෙකින් මඩනා ලද්දී වෙමි.

2. "මම බැහැර දමනලද කෙළද සොටුද සෙමද සෑයෙහි දවනු ලබන මෘත ශරීරයාගේ වුරුණු තෙලද වැදූ ස්ත්‍රීන්ගේ ලේ හා ගර්භ මලද,

3. "වණඇත්තවුන්ගේ හා නාසය හා හිස කැපූවන්ගේද යම් ලෙයක් වේද ස්ත්‍රී පුරුෂ ශරීරයන් ආශ්‍රය කළ දේද සාගින්නෙන් මඩනා ලදුව අනුභව කරමි.

4. "ගෙරින්ගේද මිනිසුන්ගේද සැරව හා ලේ අනුභව කරන්නීවෙමි. පිහිටක් නැත්තී වසන තැනක් නැත්තී, සොහොනෙහි දැමූ මළ ඇඳේ නිදමි.

5. "පුතණ්ඩ මා සඳහා දානයක් දුන මැනව, දී මට පින් දෙනු මැනවි. ලේ සැරව බුදීමෙන් මිදෙන්නෙම් නම් යෙහෙක."

6. දයාවත්වූ ශාරීපුත්‍ර තෙමේ මවගේ වචන අසා මුගලන් තෙරුන්ද අනුරුද්ධ තෙරුන්ද කප්පින තෙරුන්ද ඇමතුයේය

7. කුටි සතරක් කොට සතර දිශාවෙහිවූ සංඝයාට කුටිද ආහාරපාන වර්ගද දුන්නේය. මවට දක්ෂිණාව දිනි.

8. (මේ ජෙදය 10 කථාවේ 7 ගාථාව මෙනි.)

9. (මේ ජෙදය 14 කථාවේ 8 ගාථාව මෙනි.)

10. "පින්වත් දෙව්දුව, යම්බඳුවූ තී විශිෂ්ටවූ ශරීර වර්ණයෙන් ඖෂධීතරුව මෙන් සියලු දිශාවන් බබුළුවමින් සිටින්නෙහිය.

11. "කවර හෙතුවකින් තිගේ මෙබඳුවූ ශරීර වර්ණයක් ඇතිවීද, කවර කුශල විශෙෂයෙන් තට මෙතැන්හි නිපදීද, තිට සිත් පිනවන වස්තු ලැබෙත්ද?"

12. "මහත් ආනුභාව ඇති දේවතාව, තිගෙන් විචාරමි. මිනිස්වූවා කිනම් පිනක් කළේද? කවර කුශල හෙතුවකින් මෙසේ දිලිසෙන ආනුභාව ඇත්තීද තීගේ ශරීර වර්ණයද සියලු දිගුන් බබුළුවයි."

**15. මත්තා ප්‍රේතියගේ කථාව**:- 1. (මෙහි 13 කථාවේ 1 ගාථාව මෙනි.)

**2.** "පූර්ව ජන්මයෙහි මම මත්තා නම් වීමි. තී තිස්ස නම් විය. තීට සම හිමියෙක් ඇත්තියක් වීමි. පව්කම් කොට මේ මිනිස් ලොවින් ප්‍රේත ලොකයට පැමිණියා වෙමි."

**3.** (මෙය 13 කථාවේ 3 ඡේදය මෙනි.)

**4.** "ක්‍රොධ ඇත්තියක්ද පරුෂ බස් කියන්නියක්ද ඊර්ෂ්‍යා කරන්නියක්ද මසුරු සිත් ඇත්තියක්ද කෛරාටික ගුණ ඇත්තියක්ද වීමි. මම ඒ දුර්භාෂිත නිරර්ථක වචන කියා මෙලොවින් ප්‍රේත ලොකයට පැමිණියාවෙමි."

**5.** "යම්සේ තී ක්‍රොධ කරන්නියක් වීද, සියල්ල මමත් දනිමි. තීගෙන් අනිකක්ම විචාරමි. කවර කර්මයක් හෙතුකොටගෙන කසල පස් වලින් ගැවසුන සිරුර ඇතිවීද,

**6.** "තී ඉස් සෝදා නෑවේ පිරිසිදු වස්ත්‍ර ඇන්දේ සැරසුනිවිය මමද පින්වතියට වඩා ඒ ඉතා වැඩියෙන් අතිශයින් සැරසුනී වීමි."

**7.** "ඒ මා බලා සිටියදී ස්වාමියා සමග කථා කළාය. ඒ හෙතුවෙන් මාගේ ඊර්ෂ්‍යාව මහත් විය. මට ක්‍රොධය උපන.

**8.** "එහෙයින් කුණු පස් ගෙන පසින් තීට දමා ගැසුවෙමි. ඒ අකුශල කර්ම විපාකය හේතුකොට ගෙන පස්වලින් ගැවසුන ශරීර ඇත්තියක් වීමි.

**9.** "තී මට පසින් දමා ගැසීය. ඒ සියල්ල මමත් දනිමි. තිගෙන් අනිකක්ද විචාරමි. කවර හෙතුවකින් කැසීම් රොගයකින් පෙළේද?"

**10.** "බෙහෙත් ගෙනෙන්නාවූ අපි දෙදෙන වනයට ගියෙමු. තී බෙහෙත් ගෙනායෙහිය. මම වනාහි කසඹිලියා ගෙඩි ගෙනාවෙමි.

**11.** "ඒ තී නොදන්නා කල්හි තිගේ සයනයෙහි මම ඒ කසඹිලියා ගෙඩි හාත්පස විසුරුවා දැමීමි. ඒ අකුශල කර්මයාගේ විපාක හෙතුවෙන් කැසීම් රොගයෙන් පෙළෙමි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

12. "තී මගේ සයනයෙහි කසඹිලියා කොළ ගෙඩි දැමූ බව දනිමි. තිගෙන් අනිකක් විචාරමි. කවර කාරණයකින් නුඹ නග්න වූවාද?"

13. "මිත්‍රයන්ගේ සමාගමක් විය. නෑයන්ගේ රැස්වීමක් විය. සැමියා සහිතවූ තීද කැඳවන ලද්දී විය. මම වනාහි නොකැඳවන ලදිමි.

14. "ඒ තී නොදැනුවත්වම තිගේ වස්ත්‍රයක් සොරාගතිමි. ඒ අකුශල කර්මයාගේ විපාකයෙහි මම නග්නවීමි."

15. "තී මගේ වස්ත්‍රය සොරකම් කෙළෙහිය යන මේ සියල්ල මමත් දනිමි. වෙනත් කරුණක් තිගෙන් මම අසමි. කවර කර්මයකින් ශරීරයෙන් අශුචි ගඳ හමන්නේද?"

16. "තීගේ සුවඳද අළුත් වටිනා මල්මාලාවක්ද විලවුන්ද අශුචි වලෙක බහාලීමි. මා විසින් ඒ පාපකර්මය කරණලදී.

17. "ඒ අකුශල කර්මයාගේ විපාකයෙන් අශුචි දුගඳ හමන ශරීර ඇතිවීමි. තී විසින් කරණලද ඒ පාප කර්මය සැබෑය. එය මමත් දනිමි.

18. "තිගෙන් අනිකක්ද විචාරමි. තී කවර හෙතුවකින් දුක්පත් වූයෙහිද?" "ගෙයි යම් ධනයක් විද්‍යමාන වීද, එය දෙදෙනාටම සමාන විය.

19. "දාන වස්තුව ඇති කල්හි තමහට පිනක් නොකෙළෙමි. ඒ අකුශල කර්ම විපාකයෙන් මම දුක්පත් වීමි."

20. "ඒ කාලයෙහිම තී මට මෙසේ කීය. පව්කම් සේවනය කෙරෙහි පව්කම්වලින් සුගතිය සුවසේ ලැබිය හැකි නොවේමය.

21. "තී මා විරුද්ධ වශයෙන් සැළකුවෙහිය. නැවත මට ඊර්ෂ්‍යා කෙළෙහිය. ලාමක කර්මයන්ගේ යම්බඳු විපාකයක් වේද එය බලව,

22. "තිගේ ගෘහ දාසියෝද එම ආභරණයෝත් වූවාහුද මේ ආභරණද ඒ දාසියනුත් අනික් ජනයෝද පරිභොග කෙරෙත්, භෝග සම්පත් සදාකාලික නොවෙත්,

23. "දැන් භූත නම් පුතාගේ පියතෙමේ සල්පිළෙන් ගෙදර එන්නේය. තිට කිසිවක් දෙන්නේ නම් යෙහෙක. ඒතාක් මෙතනින් නොයව,

24. "නග්නවූ දුර්වර්ණ ශරීර ඇත්තාවූ කෘශවූ ඉල්ප ගිය නහර වැල් ඇත්තියක් වීමි. මෙය ස්ත්‍රීන්ට ලජ්ජාවෙක, භූත නම් පුත්‍රයාගේ පියතෙමේ මා නොදකීවා."

25. "එසේ නම් යමක් හෙතුකොට ගෙන සියලු කාම සැපතින් සමෘද්ධ වූවා සුවපත් වන්නේද එබඳුවූ කුමක් තිට මම දෙම්ද, තිට මම මේ කාලයෙහි කිනම් උපකාරයක් කරම්ද?"

26. "භික්ෂු සංඝයා කෙරෙන් සතරනමක්ද පුද්ගල වශයෙන් භික්ෂු සතර නමක්දැයි භික්ෂූන් අට නමක් වළඳවා මට පින් දුන මැනව. එසේ කළ කල්හි මම සුවපත් වූවා සියලු කාමයෙන් සමෘද්ධවූවා වන්නෙමි."

27. "ඕතොමෝ මැනවැයි පිළිවදන්දී භික්ෂූන් අටනමක් වළඳවා වස්ත්‍රවලින් හඳවා ඈට පින්දුනි.

28. (මෙය 10 කථාවේ 7 ඡේදය මෙනි.)

29. (මෙහි 13 කථාවේ 9 ඡේදය මෙනි)

30. (මෙය 13 කථාවේ 10-11 ඡේද මෙන් වෙත්.)

31. (මෙය 13 කථාවේ 12 ඡේදය මෙනි.)

32. (මෙය 14 කථාවේ 2 ඡේදය මෙනි.)

33. "නැගණිය තී විසින් දෙනලද දානය හෙතුකොට ගෙන බිය නැතිව සතුටුවෙමි. සියලු නෑයන් සමග බොහෝ කලක් මුළුල්ලෙහි ජීවත්වෙව.

34. "සුන්දරිය, ලොභ ද්වෙෂ සහිතවූ මසුරුමලය දුරු කොට මෙහිදී ධර්මයෙහි හැසිර දන්දී ශොක රහිතවූ රජස් නැති දිව්‍යස්ථානයවූ කාමභොගීන්ගේ වාසස්ථානවූ දෙව් ලොවට නින්දා නැතිව පැමිණෙව."

**16. නන්දා ප්‍රේතියගේ කථාව:-** 1. "කළුවූ නපුරු ශරීරවර්ණ ඇති කර්කශ ශරීරයක් ඇති. පිඟුවන් ඇස් ඇතියෙහිය. කළුදත් ඇතියෙහිය. තී මනුෂ්‍ය ස්ත්‍රියෙකැයි නොහඟිමි."

2. "නන්දසෙනය, මම නන්දා නම්වූ පෙර ජාතියෙහි නුඹගේ බිරින්දවීමි. පව්කම්කොට මේ මිනිස් ලොවින් ප්‍රේත ලොකයට පැමිණියේ වෙමි.

3. (මේ ඡෙදය 6 කථාවේ 5 ඡෙදමෙනි.)

4. "ක්‍රොධ ඇත්තියක් ද රළුබස් කියන්නියක් ද, නුඹ කෙරෙහි ගරු නොකරන්නියක්ද වීමි. මම ඒ නිරර්ථක වචන කියා මේ මිනිස් ලොවින් ප්‍රේත අපායට පැමිණියේ වෙමි.

5. "එබැවින් තීට උතුරු සළුව දෙමි. මේ වස්ත්‍රය හැඳගනුව. මේ වස්ත්‍රය හැඳගෙන එව තී ගෙදරට පමුණුවන්නෙමි.

6. "වස්ත්‍රයද ආහාරපාන වර්ගද ගෙටගියාවූ තී ලබන්නෙහිය. තිගේ පුතුන්ද දක්නෙහිය. යෙහෙළියන්ද දක්නෙහිය." "නුඹ විසින් අතින් අතට දෙනලද්ද මට නොපැමිණෙයි. පහකරණලද රාග ඇති බහුශ්‍රැතවූ සිල්වත්වූ භික්ෂූන්ම.

7. "ආහාරපාන වර්ගයෙන් තර්පනය කරව. මට පින දුන මැනව. එකල්හි මම සියලු කාමයෙන් සමෘද්ධවූවා සුවපත් වන්නෙමි.

8. "හෙතෙම මැනවැයි ප්‍රතිවචනදී මහත් දානය පැවැත්විය. ආහාරද පාන වර්ගද කෑයුතුදේද වස්ත්‍ර හා සෙනසුන්ද

9. "කුඩුද සුවඳ ද මල්මාලාද නොයෙක් වර්ගයේ වහන්ද වීතරාගවූ බහුශ්‍රැතවූ සිල්වත් භික්ෂූන්ටදී ආහාරපානයෙන් සතප්පවා ඇට දක්ෂිණාව දුනි.

10. (මේ ඡෙදය 10 කථාවේ 7 ඡෙදයමෙනි.)

11 - 14 (මේ ඡෙද 1 කථාවේ 9-12 ඡෙදයමෙනි.)

15. (මේ ඡෙදය 16 කථාවේ 2 ඡෙදයමෙනි.)

16-17. (මේ ඡෙද 15 කථාවේ 34-35 ඡෙදමෙනි.)

17. **මට්ට කුණ්ඩලී ප්‍රේත කථාව:-** (විමාන වස්තුවේ 33 මට්ට කුණ්ඩලීවිමාන කථාව මෙනි.)

18. **කෘෂ්ණ ප්‍රේත කථාව:-** 1. "කෘෂ්ණ ගොත්‍ර ඇති වාසුදෙව රජතුමනි, නැගිටිනු මැනවි කුමක් සඳහා නිදන්නෙහිද, නුඹට නිදීමෙන් කුමන වැඩක්වේද, නුඹේ හෘදය වැනිවූ දකුණැස බඳුවූ ස්වකීය සහෝදරවූ යම් සත පණ්ඩිතයෙක්වීද ඔහුගේ උමතුව බලවත්වෙයි. කෙශව නම් වාසුදෙවයා සාවා, සාවා කියමින් විලාප කියයි.

2. "කෙශව නම් වාසුදෙවතෙම ඒ රොහිණෙයය නම් ඇමතියාගේ වචනය අසා සහෝදර ශොකයෙන් පෙළෙන ලදුව වෙව්ලමින් නැගී සිටියේය.

3. "කිමෙක්ද උමතුවූවෙකු මෙන් සියලු මේ ද්වාරවතී නුවර 'සාවා සාවා' යයි විලාප කියයිද, කෙබඳු සාවෙකු කැමැත්තෙහිද?"

4. "රනින් කළාවූද මැණික්වලින් කළාවූද ලොහයෙන් කළාවූද නැවත රිදීයෙන් කළාවූද සක්පබලුවෙන් කළාවූද සාවෙකු නුඹට කරවන්නෙමි.

5. "වනය ගොදුරුකොට ඇති අනිකුදු සාවෝද අරණ්‍යයෙහි ඇත්තාහ. ඔවුනුත් නුඹට ගෙනෙන්නෙමි. කෙබඳු සාවෙකු කැමැත්තෙහිද?"

6. "කෙශව නම් වාසුදෙවය, පොළොව ඇසුරුකොට ඇති යම් සාවෝ වෙත්ද, ඒ සාවුන් මම නොකැමැතිවෙමි. සඳමඬලෙන් සාවෙකු කැමැත්තෙමි. ඒ සාවා මට ගෙන දෙව.

7. "ඤාති සහෝදරය, සඳමඬලෙන් සාවා කැමැත්තෙහිය, නොපැතිය යුත්තක් පතයි. ඉතා මිහිරි ජීවිතය හරින්නෙහියයි ඒ මම සිතමි."

8. කෘෂ්ණ ගොත්‍රවත් මහරජ යම්සේ අන්හට අනුශාසනා කෙළෙහිද, මෙසේ දන්නෙහි නම් කවරහෙයකින් පෙර මළ පුතෙකු සඳහා අදත් ශොකකෙරෙහිද,

9. "උපන්නාවූ මාගේ පුත්‍රතෙම නොමැරේවා යන යමක් මිනිසෙකු විසින් හෝ අමනුෂ්‍යයෙකු විසින් හෝ නොලැබිය හැකිවේද, ඒ නොලැබිය හැකිදේ කවර හෙතුවකින් ලැබිය හැකිද?"

10. "කෘෂ්ණය, පරලොවගිය යම් පුතෙකු සඳහා ශොක කරයිද. ඔහු පමුණුවාගන්ට මන්ත්‍ර ප්‍රයොගයකින් හෝ මුල් බෙහෙතකින් හෝ නානාවිධ ඖෂධ වර්ගවලින් හෝ ධනයකින් හෝ නොහැකිය.

11. "මහත්ධන ඇත්තාවූද මහත් භොග සම්පත් ඇත්තාවූද සියලු රට ඇත්තාවූද බොහෝ ධනධාන්‍ය ඇත්තාවූද යම් ක්ෂත්‍රිය කෙනෙක් ඇද්ද ඔහු තුමූත් ජරාමරණ රහිතයෝ නුවූහ.

12. "ක්ෂත්‍රියයෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය, ශුද්‍රයෝය, සැඩොල් හා කසල සොධකයෝය. මෙකී ක්ෂත්‍රියාදීහුද අන්‍යයෝද ඔවුහුත් ජාතිය නිමිත්තකොට ජරාමරණ රහිතයෝ නුවූහ.

13. "යමෙක් තුමූ බ්‍රහ්මයා විසින් සිතනලද හෝ කියන ලද අංග සයෙන් යුක්තවූ වෙදය හදාරත්ද විද්‍යාඥානයෙන් යුක්තවූ මොව්හුද සෙස්සෝද යන ඔවුහුත් අජරාමර නොවූහ.

14. "සන්සුන් ස්වභාව ඇති තැන්පත් සිත් ඇති තපොගුණ ඇති හික්මුනාවූ යම් ඍෂීහුවෙත්ද ඔව්හුද සුදුසු කාලයෙහි ශරීරය හැර දමත්.

15. "වඩනාලද සිත් ඇතිව වාසය කරන්නාවූ අර්හත් ඵලය පිණිස කටයුතුකොට නිමකළාවූ ආශ්‍රව රහිතයෝද කුශලාකුශලයන් ක්ෂයකිරීමෙන් මේ ශරීරය හැර දමත්.

16-17-18 (8 කථාවේ 5-6-7 ඡෙද මෙනි)

19. "සත පණ්ඩිතතෙම වැඩිමල් සොහොයුරා පුත්‍ර ශොකයෙන් මුදාලූවාසේ සප්‍රාඥවූ අනුකම්පාකාරීවූ යම් කෙනෙක්වෙත්ද ඔව්හු මෙසේ කරත්.

20. "සත පණ්ඩිතතෙම වැඩි මහළු සහෝදරවූ වාසු දෙව රජු යහපත් වචනයෙන් නිශ්ශොකයට පැමිණ වූවාක් මෙන් යමෙකුට මෙබඳුවූ ඇමතියෝ සේවකයෝ වෙත්ද ඔහුට ශොක කොයින්ද"

19. ධනපාල ප්‍රෙතයාගේ කථාව:- 1 (මේ ඡෙදය 13 කථාවේ 1 ඡෙදය මෙනි)

2 (මේ ඡේදය 6 කථාවේ 2 ඡේදය මෙනි)

3 (මේ ඡේදය 6 කථාවේ 5 ඡේදය මෙනි)

4. "දසන්ත නම් රජුන්ගේ එරකච්ඡයයි ප්‍රසිද්ධවූ නුවරක් ඇත ඒ නගරයෙහි පෙර සිටුකෙනෙක් වීමි. ධනපාල සිටුයයි මහජනයෝ දනිත්.

5. "මට අමුරන් පිරූ ගැල්වාහ අසූවක් විය. මට බොහෝ වූ රත්රන්ද, මුතුද වෛඩූර්යය මැණික්ද බොහෝවූහ.

6. "එපමණ මහා ධනවතෙක්වූද, මට දන්දීමට ප්‍රියයක් නොවීය. යාචක ජනයෝ මා නොදකිත්වායි ගෙදොර වසාගෙන අනුභව කරමි.

7. "ශ්‍රද්ධානැත්තෙක්ද, මසුරෙක්ද, තදමසුරෙක්ද බියෙන් තර්ජනය කරන්නෙක්ද වීමි. දන් දෙන්නාවූද, පින්කරන්නාවූද, බොහෝ සත්වයන් වැළැක්වීමි.

8. "දන්දීමේ ඵලයක් නම් නැත. සීලයක හික්මීමේ කෙසේනම් විපාකයක් ලැබේද, පැන් පොකුණු හා ලිංද රෝපනය කරණ ලද්දාවූ උයන් වතුද,

9. "පැන්ශාලාද යා නොහැකි තන්හි ඒදඬුද වනසාලීමි. ඒ මේ නොකළ කුසල් ඇතිව කරණලද අකුසල් ඇතිව එයින් චුතව,

10. "ප්‍රෙතයොනියෙහි උපන්නේ සා පිපාසායෙන් මඩනා ලද්දේ වෙමි. යම් දිනක මම කළුරිය කෙළෙම්ද එතැන් පටන් පස් පනස් අවුරුද්දක් මුළුල්ලෙහි

11. "ආහාර අනුභවයක් හෝ පැන් පීමක් හෝ නොම දනිමි. යම් ශීලාදී හික්මීමක් වේද, එය මහත් වැනසීමක් වේයයිද, යම් වැනසීමක් වේද, එය ශීලාදී හික්මීමයයිද සිතීමි.

12. "යම් දානවස්තු පරිත්‍යාග නොකිරීමක්වේද, එය මහත් වැනසීමකැයි ප්‍රෙතයෝම දනිත්. මම පෙර බොහෝ ධනය ඇති කාලයෙහි පින් කිරීමෙන් වැළකුණෙමි.

13. "දානවස්තු විද්‍යමානකල්හි තමහට පිහිට නොකෙළෙමි. ස්වකීය කර්මවිපාකයට පැමිණියාවූ ඒ මම දැන් පසුතැවිලි වෙමි.

14-15-16-17 (10 කථාවේ 12-13-14-15 ඡෙද මෙනි)

18. "එහෙයින් තොපට කියමි. යුෂ්මතුන්ලාට යහපතක් වේවා. මෙතන්හි යම් පමණ ජනයෝ රැස්වූවෝ වෙත්ද, ප්‍රකට වශයෙන් හෝ ඉදින් රහසිගතව හෝ ලාමකවූ අකුශල කර්මය නොකරව්.

19. "ඉදින් ඒ ලාමක කර්මයක් කරන්නහු නම් දැන් කරව් නම් අහස නැගීවත් යන්නාවූ තොපට දුකින් මිදීමක් නැත්තේය.

20. "මවුට ආදර ඇත්තෝ වව්. මවු පියන්ට ගරු කරන්නෝ වව්. කුලදෙටුවන් පුදන්නෝ වව්. මහණුන් පුදන්නෝ වව් බමුණන් පුදන්නෝ වව්. මෙසේ කොට ස්වර්ග ලෝකයට පැමිණෙන්නටය."

20. "චුල්ලසෙට්ඨි ප්‍රෙතයාගේ කථාවඃ- 1. "ස්වාමීනි වස්ත්‍ර සහිතවූ කෘශවූ පැවිද්දෙක් වූයෙහිද කවර හේතුවකින් රාත්‍රියෙහි කොහියේද, ඒ කරුණ මට කියනුමැනව. හැකි වන්නෙමු නම් නුඹට සියලු භොගයෙන් වස්තුව සම්පාදනය කරන්නෙමි.

2. "සියලු තන්හි ප්‍රකටවූ බරණැස් නුවරක් ඇත. ඒ නගරයෙහි මම මහත් සම්පත් ඇති නිහීන සිත් ඇති දන් නොදෙන්නාවූ කාය සැපතෙහි ගිජු සිත් ඇති ගෘහපතියෙක් වීමි. දුශ්ශීල කර්මයෙන් ප්‍රෙතලෝකයට පැමිණියේ වෙමි.

3. "ඒ මම ඒ යථොක්ත පාපකර්ම හේතුකොට ගෙණ ඉදිකටුවලින් විදින්නාසේ සාගින්නෙන් පීඩිත වූයේ වෙමි. එහෙයින්ම කිසි ආහාරයක් ප්‍රාර්ථනාකොට නෑයන් සමීපයට යමි. දන් නොදෙන සුල්ලෝ පරලොවදී දානයාගේ විපාකයට යයි නොම අදහත්.

4. "මාගේ දියණිතොමෝද මවුපියන් උදෙසාද මුතුන් මී මුතුන් උදෙසාද දන් දෙන්නෙමැයි නිතර කියයි. දානවස්තු සදා බමුණන් වළඳවන්නී වෙයි. මම අන්ධකවින්ද නම් නුවරට කෑමට යමි."

5. අජාසත් රජතෙම ඒ ප්‍රෙතයාට මෙසේ කීය. "ඒ දානයද අනුභවකොට වහා එන්නෙහිය. මමත් පූජාවක් කරන්නෙමි

ඉදින් කිසි කරුණක් ඇත්නම් ඇදහිය යුතුවූ ඒ හේතුයුක්ත වචනය මට කියව එය මම අසමි.”

**6.** “එසේයයි” කියා ඒ වළඳවන තැනට ගියේය. බත බමුණෝ වැළඳුවාහුය. දක්ෂිණාර්හයෝ නොම වැළඳුවාහුය. නැවත අනික්වර රජගහනුවරට ආපසු ආයේය. රජහුගේ ඉදිරියෙහි පහළවිය.

**7.** රජතෙම නැවතද පැමිණියාවූ ප්‍රෙතයා දැක “මමත් කෙබඳු දානයක් දෙන්නෙම්දැයි” කීය. යම් කරුණකින් නුඹ බොහෝ කලක් මුළුල්ලෙහි සම්පතින් සෑහෙන්නේ වෙහිද ඉදින් එබඳු කිසිකාරණයක් ඇත්නම් එය මට කියව.”

**8.** “පින්වත් රජතුමනි බුදුන්ද සංඝයාද ආහාරයෙන් හා පානවර්ගයෙන්ද වළඳවා සිවුරෙන්ද පූජාකොට ඒ පින මා පිණිස දුන මැනව. එසේ කළකල්හි මම බොහෝ කල් මුළුල්ලෙහි සෑහීමට පත්වන්නෙමි.”

**9.** “ඒ වචනයෙන් රජතෙම එකෙණෙහිම නික්ම උදාරවූ දානය සියතින් සංඝයාට දී තථාගතයන් වහන්සේට ප්‍රවෘත්තිය සැළකෙළේය. ඒ ප්‍රෙතයාටද පින් දුනි.

**10.** පුදන ලද්දාවූ ඒ ප්‍රෙතතෙම ඉතාමත් බබළමින් රජුගේ ඉදිරියෙහි පහළවිය. “මම උතුම් ඍද්ධියට පැමිණියාවූ දෙවියෙක් වෙමි. මහා ආනුභාව සම්පත්තියෙන් සමවූ මනුෂ්‍යයෝ නොවෙත්.

**11.** “මගේ අප්‍රමාණවූ මේ දිව්‍යානුභාවය බලනු මැනවි. නුඹ විසින් ආර්ය සංඝයාට මහ දන් දී මට පින් පමුණුවන ලදී. මිනිස්දෙව්වූ මහරජ සැමකල්හි නිරන්තරයෙන් බොහෝ දාන වස්තුවෙන් පිනවන ලද්දාවූ මම සුවපත්වූයේවෙමි.”

**21. අංගුත්තර ප්‍රෙතයාගේ කථාව**:- 1. “වෙළඳාමෙන් ධනය හැර ගෙන යන්නාවූ අපි යම් කරුණක් පිණිස කාම්බෝජ රටට යමුද, මේ දෙව් පුත්තෙම කැමති සම්පත් දෙන්නේ වෙයි. මේ දිව්‍යපුත්‍රයා ගෙනයන්නෙමු.

**2.** "මේ දෙවියා යාඥා කිරීමෙන් හෝ මැඩ බලාත්කාරයෙන් හෝ අල්වාගෙන සැප යහනකට නංවාගෙන ද්වාරවතී නුවරට වහායමු.

**3.** "යම් ගසක්හුගේ සෙවනෙහි හිඳිනේ හෝ නිදන්නේ හෝ වේද, ඒ රුකගේ අත්ත නොබිඳින්නේය. යම්හෙයකින් මිත්‍රද්‍රෝහය ලාමකවේද එහෙයිනි.

**4.** "පින්වත් අංකුරය යම් ගසක්හුගේ සෙවනෙහි හිඳිනේ හෝ නිදන්නේ හෝ වේද එබඳු දැව සම්භාරයකින් ප්‍රයෝජනයක් වේනම් ඒ රුකේ කඳ පවා කපාගන්නේය අතු ආදිය ගැන කියනුම කවරේද,

**5.** "යම් ගසක සෙවනයට හිඳිනේ හෝ නිදන්නේ හෝ වේද, ඒ ගසේ කොළ පතක් පමණවත් නොකඩන්නේය. ශාඛාදිය කැඩීම් ගැන කියනුම කවරේද, එසේ සින්දේනම් ලාමක මිත්‍රද්‍රොහියෙක් වන්නේය.

**6.** "යම් ගසක සෙවන යට හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේද, එබඳු ප්‍රයෝජනයක් ඇත්තේ නම් මුලුත් සමගම රුක උදුරන්නේය.

**7.** "පුරුෂයෙක්තෙම යමෙකුගේ ගෙයි එක රැයක් පමණවත් වසන්නේද, යමෙකු සමීපයහි ආහාරපාන වර්ග ලබන්නේද, ඒ පුරුෂයාට සිතින්වත් නපුරක් නොසිතන්නේය. බුද්ධාදී උතුමන් විසින් කෙළෙහිගුණ සැළකීම වර්ණනා කරණලදී.

**8.** "යමෙක්හුගේ ගෘහයෙහි එක රැයක් පමණවත් යමෙක් වාසය කරන්නේද, ආහාරයෙන් හා පානවර්ගයෙන් උපස්ථාන කළේද, ඕහට සිතින්වත් අයහපතක් නොසිතන්නේය. අහිංසක හස්තය තෙමේ ඒ මිත්‍රද්‍රෝහි පුද්ගලයා විනාශ කරයි.

**9.** "යම් පුද්ගලයෙක්තෙම පෙරකාලයෙහි කරණලද උපකාර ඇත්තේ පසුකලෙක නපුරකින් පෙළාද උපකාර කිරීමට යෙදූ අත නසන පුරුෂයෙක්වේද, ඒ පුරුෂතෙම යහපත නොදකී.

**10.** "මම දෙවියෙකු විසින් හෝ මනුෂ්‍යයෙකු විසින් හෝ අතිශයින් මැඩ පැවැත්විය නොහැකි වෙමි. දිව්‍ය මනුෂ්‍ය

ඓශ්චර්යයකින් හෝ මැඩලිය නොහැක්කේ වෙමි. මම උත්තම ඍද්ධියට පැමිණි යක්ෂයෙක් වෙමි. සැනෙකින්ම දුරටද යන්නේ වෙමි. රූප සම්පත්තියෙන් හෝ ශරීර ශක්තියෙන් යුක්තවූයේ වෙමි.

11. "යුෂ්මත්හුගේ දකුණත හැමලෙසින් රන්වන් වෙයි. මිහිරි රස වැහෙන්නාවූ ධාරා ඇඟිලි පසක් ඇත්තේය. නන්වැදෑරුම් රසයෝ වැගිරෙත්. නුඹ ශක්‍රයායයි මම සිතමි."

12. "ප්‍රකට දෙවියෙක් නොවෙමි. ගන්ධර්ව කායික දෙවියෙක්ද නොවෙමි. පුරින්දද නම්වූ ශක්‍රදෙවෙන්ද්‍රයාද නොවෙමි. පින්වත් අංකුරය, භෙරුව නුවරින් චුතව මෙහි උත්පත්ති වශයෙන් පැමිණියාවූ ප්‍රේතයෙකැයි දනුව"

13. "නුඹ පෙර ආත්මභාවයෙහි භෙරුව නගරයෙහි කෙබඳු ශීල ඇත්තෙක්වීද, කෙබඳු සමාචාර ඇත්තෙක් වීද, කෙබඳු බ්‍රහ්මචර්යාවක් හෙතුකොටගෙන යුෂ්මතුන්ගේ අත්හි ප්‍රත්‍ය ඵලය දැන් නිපදීද?"

14. "පෙර එක්කලෙක්හි මම භෙරුව නුවර සන්නාලියෙක් වීමි. ඉතා දුකසේ දිවි පැවැත්ම ඇති බැගෑපත් කෙනෙක් වීමි. දන්දීමට මට කිසිවක් නැත.

15. "කර්මඵල විශ්වාශයෙන් යුක්තවූ දන්දීමෙහි ස්වාමීවූ පෙර කරණ ලද පින් ඇති පාපයට පිළිකුල් කරණ සුළුවූ අසය්හ සිටුහුගේ ගෙය සමීපයෙහි මාගේ ගෙය හෝ කර්මාන්තශාලාව විය.

16. "එතැනට නොයෙක් ගොත්‍ර ඇති යාචක ජනයෝද ගුණ කියා ඉල්වන්නෝද පැමිණෙත්. ඔව්හු අසය්හ සිටුහුගේ ගෘහය මා විචාරති"

17. "නුඹට යහපතක් වේවා. දානය කොතැන්හි දෙනු ලැබේද, කොතැන්හි යමුද ඔවුන් විසින් විචාරණ ලද්දාවූ මම අසය්හ සිටුවරයාගේ ගෘහය කියමි.

18. "අසය්හ සිටුවරයාගේ මේ නිවාසයෙහි දන් දෙනු ලැබේ මෙතනට යව. යුෂ්මතුන්ට සෙතක් වේයයි" දකුණත දිගුකොට කීවෙමි.

**19.** "ඒ හෙතුවෙන් අත දැන් කැමති කැමති සම්පත් දෙන්නේ වෙයි ඒ හෙතුකොට අතින් මිහිරි රස වැහෙන්නේ වෙයි. ඒ උතුම් හැසිරීම් හෙතුවෙන් මාගේ අතෙහි පුණ්‍ය විපාකය පහළ වෙයි."

**20.** "නුඹ කිසිවෙකුට සිය අතින් නුදුන්නෙහිය. අනිකෙකුගේ දානය අනුමෝදන් වෙමින් අතදිගු කොට නොකීයෙහිය.

**21.** (මේ කථාවේ 19 වෙනි ඡේදය මෙනි.)

**22.** "යම් ඒ අසය්හ සිටුකෙනෙක් පහන් සිත් ඇතිව සිය අතින් මහදන් දුන්නේද හෙතෙම මිනිසත් බව හැරපියා කෙබඳු තැනකට ගියේද

**23.** "බුදුරජාණන් වහන්සේ දන්නා යාම හෝ ඊම මම නොදනිමි. අසය්හ තෙම ශක්‍රයාගේ සහවාසයට ගියේයයි වෛශ්‍රවනයා සමීපයෙහිදී ඇසුවෙමි.

**24.** "යහපත කිරීමට සුදුසුමය සම්පත් බල පරිද්දෙන් දානය දීමට සුදුසුමය. කැමති සම්පත් දෙන අත දැක කවරෙක් පින් නොකරන්නේද,

**25.** "ඒ එසේමැයි ඒ මම මේ වාලුකා කාන්තාරයෙන් පහව ගොස් ද්වාරවතී නුවරට නැවත පැමිණ යම් පිනක් මට සැප දෙන්නේද, ඒ දානය දෙන්නෙමි.

**26.** "ආහාරයද පානවර්ගද වස්ත්‍ර හා සෙනසුන්ද දෙන්නෙමි, පැන් හල්ද ළිංද දුර්ගමස්ථානයන්හි හේදඬුද පිහිටුවන්නෙමි.

**27.** "කවර හෙතුවකින් තොපගේ ඇඟිලි කුණුව වකුටුවීද මුහුණද විරූප කෙළේද ඇස්වලින් අශ්‍රු වගුරුවන්නේද තා විසින් කෙබඳු පවක් කරණ ලද්දේද?"

**28.** "සිරුරෙන් රැස්විහිදුනාවූ ගෘහපතියෙක්වූ ගෘහවාසීවූ ඒ අසය්ය සිටුහුගේ දන්දෙන තැන දන්දීමෙහි මම අධිකාරියෙක් කරණ ලද්දේ වෙමි.

**29.** "එහි ආහාරයෙන් ප්‍රයෝජන ඇතිව පැමිණියාවූ යාචකයන් දැක එකත් පසෙක ඉවත්වී මුව හකුළුවා ගැනීම කෙළෙමි.

**30.** "එහෙයින් මාගේ ඇඟිලි වකුටු වූහ. මුහුණද විකාරයෙන් හැකුළුනේ විය. ඇස්ද අශ්‍රු වගුරත්. මා විසින් මෙබඳු පවක් කරණ ලද්දෙමි."

**31.** "නින්දිත පුරුෂය, තෝ යම් හෙයකින් අනුන්ගේ දානයෙහි මුව හකුළුවා ගැනීම කළෙහිද යුතුවූම කරුණෙන් තාගේ මුහුණද හැකිළී ගියාක් මෙන් කරණලදී. ඇස්ද අශ්‍රු වගුරත්.

**32.** "ආහාරපානද කෑ යුතු දේද වස්ත්‍ර හා සෙනසුන්ද යන දානය දෙන්නාවූ පුරුෂතෙමේ අනුන් විසින් සිදු කළ යුත්තක් කොට කෙසේ නම් කරන්නේද?"

**33-34.** (මේ කථාවේම 26-27 ඡේද මෙනි)

**35.** ඒ අංකුරතෙම ඒ මරු කතරින් නික්මී ද්වාරවතී නුවරට පැමිණ යම් දානයක් තමහට සැප එළවන්නේද ඒ දානය පිහිට විය.

**36.** පහන් සිතින් ආහාරද පාන වර්ගද වස්ත්‍ර හා සෙනසුන්ද දුන්නේය. පැන්හල්ද ළිංද පිහිටවී.

**37.** "කවරෙක් සාගිනි ඇත්තේද, කවරෙක් පිපාසා ඇත්තේද කවරෙක් වස්ත්‍ර වැළඳ ගන්නේද, රථයුග වාහනයෝ විඩාවට පැමිණියෝ වෙත්ද, මේ වාහන සමූහයෙන් රුචි වාහනයක් යොදත්වා.

**38.** "කවරෙක් තෙම කුඩ කැමති වේද, කවරෙක් තෙමෙ සුවඳ ද මල් මාලාද කැමතිද, කවරෙක් වහන් කැමතිද, මෙසේ වනාහි ඒ අංකුරයාගේ නිවසෙහි කපුවෝද අරක්කැමියෝද සුවඳ දෙන්නෝද හැමකල්හිම සවසද උදයද ඝොෂා කරත්.

**39.** "අංකුරතෙම සුවසේ සයනය කෙරේයයි ජනතෙමේ මා දනියි. සින්ධකය යම් හෙයකින් යාචකයන් නොදක්නෙම්ද දුකසේ නිදමි.

**40.** "අංකුරතෙම සුවසේ සයනය කෙරේයයි ජනතෙම මා දනියි සින්ධකය ස්වල්පවූ ගුණ කියා ඉල්වන ජනයා ඇතිකල්හි වනාහි දුකසේ සයනය කරමියි.

**41.** "තවුතිසා වැසි දෙවියන්ටද සියලු ලොකයාටද ඊශ්වරවූ සක්දෙව් රජතෙම නුඹට වරයක් ඉදින් දෙන්නේ නම් ප්‍රාර්ථනා කරන්නාවූ නුඹ කෙබඳු වරයක් පතන්නේද.

**42-43** "තව්තිසා වාසී දෙවියන්ට ස්වාමීවූ සක්දෙව් රජ මට වරයක් ඉදින් දෙන්නේ නම් උදය කාලයෙහි නැගීසිටියාවූම මට සූර්යොදය කාලයෙහි දෙව්ලොවට ඇතුළත්වූ ආහාරයෝ උපදින්නාවූ නම් යාචකයෝ සිල්වත්වන්නාහු නම් දන්දෙන්නාවූ මාගේ දාන වස්තුව ක්ෂය නොවේ නම් මම දන්දී පසු තැවිලි නොවෙන්නෙම් නම් දන් දෙමින් සිත පහදවන්නෙම් නම් මෙබඳුවූ වරය ශක්‍රයාගෙන් ප්‍රාර්ථනා කරමි.

**44.** "සියලු ධනයත් අන්හට නොදෙන්නේය. දානයද දෙන්නේය. ධනයද දකින්නේය එහෙයින්ම දීමට වඩා ධනයම ශ්‍රෙෂ්ඨවෙයි. අධික කොට දීමෙන් කුලයෝ නොපවතිත්.

**45.** "පණ්ඩිතයෝ නොදීමද පමණ ඉක්මවා දීමද නොපසසත්. එහෙයින් දීමට වඩා වස්තුව රැකීමම උතුම් වේ සමවිදියෙන් දීම නොදීම දෙක්හි පවත්නේය. එය බුද්ධිමතුන්ගේ ධර්මය වේ.

**46.** "එම්බල මාණවකය, මම දෙන්නෙම්මය සත්හුන් කාය වාක් මනො සමාචාර ඇති සත්පුරුෂයෝ මා ආශ්‍රය කරන්නාහුය. පහත් ස්ථානයන් මනාව පුරවමින් වර්ෂා කරණ මහාමෙඝය මෙන් සියලු යාචක ජනයන්ගේ අදහස සම්පූර්ණ කරන්නේ නම් යෙහෙක.

**47.** "සිඟන්නන් දැක යමෙකුගේ මුඛවර්ණය පහදීද දන්දී සතුටු සිත් ඇතිවේද, ඒ ගෙයි වසන්නාහට සැපවේ.

**48.** "යාචකයන් දැක යමෙකුගේ මුඛවර්ණය පහදීද දන්දී සතුටු සිත් ඇතිවේද, මෝතොමෝ කුශලයාගේ පිරීම වේ.

**49.** "දන්දීමෙන් පෙරම සතුටු සිත් ඇතිවේද, දන්දෙමින් සිත පහදවන්නේද දන්දී සතුටු වේද, මෝතොමෝ පුණ්‍යයාගේ සම්පත්ති යයි.

**50.** "දානාධ්‍යාශය ඇති අංකුර රජුගේ ගෘහයෙහි ගැල් හැටදාහක ආහාර සත්ව සමූහයාට නිතර දෙනු ලැබේ.

**51.** "මහායාගයයි සංඥා කරණ ලද දානයෙහි යෙදුනාවූ නොයෙක් වර්ණ කොඩොල් දැරූ තුන් දහසක් පමණ භත්තකාරකයෝ අංකුර රජු නිසා ජීවත් වෙත්.

**52.** "පැළඳගත් මාණික්‍ය කුණ්ඩලාභරණ ඇති සැටදහසක් තරුණ පුරුෂයෝ අංකුරයාගේ මහා දානයෙහි දර පලත්.

**53.** "අංකුරයාගේ දානයෙහි සර්වාලංකාරයෙන් සැරසුනාවූ සොළොස් දහසක් ස්ත්‍රීහු කුලුබඩු පිටි කරත්.

**54.** "අංකුරයාගේ මහාදානයෙහි සියලු අලංකාරයෙන් සැරසුනාවූ සොළොස් දහසක් ස්ත්‍රීහු හැඳිගෙන පැමිණ සිටියාහ.

**55.** "අංකුර රජතෙමේ බොහෝ දාන වස්තු නොයෙක් ජනයන්ට බොහෝ කලක් මුළුල්ලෙහි ඉතා උසස්ව දුන්නේය. සකස් කොටද සිතින්ද ගරුබුහුමන් සිත් ඇති කොට නැවත නැවත බොහෝසෙයින් ප්‍රදාන කෙළේය.

**56.** "අංකුර තෙමේ බොහෝ මාසයන් මුල්ලෙහිද නොයෙක් පක්ෂයන් මුළුල්ලෙහිද නොයෙක් ඍතු මුළුල්ලෙහිද බොහෝ අවුරුදු මුළුල්ලෙහිද දීර්ඝ කාලයක් මහත් දානය පැවැත්වීය.

**57.** "මෙසේ ඒ අංකුර රජ තෙමේ දීර්ඝ කාලයක් මුළුල්ලෙහි දන්දී මහත් යාග කොට මනුෂ්‍ය දෙහය හැරපියා තව්තිසා දෙව්ලොවට පැමිණියේ විය.

**58.** "ඒ ඉන්දකතෙමේ අනුරුද්ධ තෙරුන්ට හැන්දක් පමණ බත්දී මිනිස් බව හැරපියා තව්තිසා දෙව්ලොවට ගියේය.

**59, 60.** "ඉන්ද්‍රක දිව්‍යපුත්‍රතෙම අංකුර දිව්‍යපුත්‍රයාට වඩා සම්පත් කරුණු දහයකින් අධිකව බබලයි. සිත්කළුවූ රූපසම්පත්තියෙන්ද, ශබ්දයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද

ස්පර්ශයෙන්ද, ආයුසම්පත්තියෙන්ද, පිරිවර සම්පත්තියෙන්ද, ලක්ෂණ සම්පත්තියෙන්ද, සැප සම්පත්තියෙන්ද ඓශ්වර්ය සම්පත්තියෙන්ද, ඉන්දකතෙමේ අංකුරයා මැඩ බබළයි.”

**61.** “අංකුරය, තොප විසින් බොහෝ කලක් මුළුල්ලෙහි මහදන් දෙනලදී. ඉතා දුර තන්හි සිටියෙහිය. මාගේ සමීපයට එවයි” භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**62.** පුරුෂොත්තමවූ සර්වඥතෙම තව්තිසාභවනෙහි පරසතු රුක්මුල පාණ්ඩුකම්බලශෛලාසනයෙහි යම් කලෙක වාසය කෙළේද

**63.** දසදහසක් චක්‍රවාටයන්හි දෙවියෝ රැස්ව මෙර මුදුනෙහි වසන්නාවූ සම්බුදුන් සේවනය කරත්.

**64.** කිසි දෙවියෙක් ශරීර වර්ණයෙන් සම්බුදුන්ට වඩා නොබබළයි. සියලු දෙවියන් අභිභවනයකොට බුදුහුම බබළයි.

**65.** “මේ අංකුරතෙම් එකල්හි දොළොස් යොදුන් අතර විය. ඉන්දකතෙම බුදුන්ට නුදුරු තැනම අධිකව බබළයි.

**66.** “සම්‍යක් සම්බුද්ධතෙමේ අංකුරයාද, ඉන්දකයාද බලා වදාරා දක්ෂිණාර්හයා ප්‍රකාශ කරමින් මේ වචනය වදාළේය.

**67.** (මෙහි 62 වෙනි ඡේදය යොදාගත යුතුයි) දියුණු කරණලද සිත් ඇති බුදුන් විසින් මෙහෙයන ලද්දාවූ අංකුර තෙම මගේ දානය දක්ෂිණාර්හයාගෙන් හිස් විය. ඒ දානයෙන් කවර ප්‍රයෝජනදැයි” කීයේය.

**68.** “ඒ මේ ඉන්දක දෙවිතෙම සුලු දනක්දී තරු සමූහයන් මැද, චන්ද්‍රයාමෙන් අප ඉක්මවා බබළයි.

**69.** “යම්සේ ඉතා තද භූමිභාගය ඇති කෙතෙහි වපුරණ ලද බීජ බොහෝවුවත් මහත්ඵල නොවේද, ගොවියා නොමසතුටු කෙරේද,

**70.** “එසේම දුශ්ශීලයන් විෂයෙහි පිහිටුවන ලද මහත් දානය උදාර විපාක ඇත්තේ නොවේ, දායකයා සතුටු නොකරයි.

71. "යම්සේ යහපත් කෙතක වපුරණ ලද බීජය සුලු වුවත් වැස්ස මනාකොට පවත්නා කල්හි ශස්‍යඵලය ගොවියා සතුටු කෙරේද,

72. "එසේම ධ්‍යානාදී ගුණවත්වූ අටලෝදහමින් කම්පා නොවන ලක්ෂණ ඇති සිල්වතුන් විෂයෙහි කරණ ලද පුණ්‍යොපකාරය ස්වල්ප වුවත් මහත් ඵල වෙයි.

73. "යම් පුද්ගලයෙකු කෙරෙහි දෙනලද දානය මහත් ඵල වේද පින් කෙත නුවණින් සොයා දානය දියයුතුය. දායකයෝ නුවණින් සොයා දන් දී ස්වර්ගයට යත්.

74. "මේ මනුෂ්‍ය ලොකයෙහි යම් දක්ෂිණාර්හයෝ වෙත්ද, නුවණින් පරීක්ෂාකොට දීම බුදුන් විසින් ප්‍රශංසා කරණ ලදී. යහපත් කෙතෙහි වපුරණ ලද බීජයෝ යම්සේද, එමෙන් මේ දන් පිළිගැනීමට සුදුස්සන් කෙරෙහි දෙන ලද්ද මහත් ඵල ඇත්තාහු වෙත්."

22. **උත්තර මාතා ප්‍රේතයාගේ කථාව:-** 1 2. "දුර්වර්ණවූ බියකරු දැකුම් ඇති ඒ ප්‍රේති තොමෝ දිවා විහාරයට පැමිණ ගංතෙර හුන්නාවූ ඒ භික්ෂූහු වෙත පැමිණියා ඇගේ කෙශයෝද ඉතා දිගය. බිම දක්වා එල්බෙත්. ඕ තොමෝ ඒ කෙශයෙන් වැසුනී, ඒ ශ්‍රමණයන් වහන්සේට මේ වචනය කීවාය.

3. "ස්වාමීනි, මම යම් දවසක කළුරියකළේ වෙම්ද, පස් පනස් අවුරුද්දක් මුළුල්ලෙහි ආහාර ලැබීමක් හෝ පැන් බීමක් හෝ නොම දනිමි. පිපාසයෙන් මිරිකෙමි. පැන් පිණිස ඇවිදිනාවූ මට නුඹවහන්සේ පැන් දුන මැනව.

4. "සිහිල් ජලය ඇති මේ ගංගානදී තොමෝ හිමවත් පව්වෙන් ගලා බසියි. මේ ගංගා නදියෙන් ගෙන බොව. කුමක් හෙයින් පැන් මගෙන් ඉල්වන්නීද?"

5. "ස්වාමීනි, ඉදින් ඔබ ගංගානදියෙහි පැන් තෙමේ ගන්නේනම් මට ඒවා ලේවී ලැබෙයි. එහෙයින් පැන් යාච්ඤා කරමි"

6. "කිමෙක්ද? සිතින් කයින් වචනයෙන් නපුරක් කරණ ලද්දේද? කවර කර්ම විපාකයකින් ගංගා තොමෝ තිට ලේ වීද?"

7 8 "මාගේ පුත්‍රවූ උත්තර නම් මානවක තෙම ශ්‍රද්ධාවත්වූ උපාසකයෙක් විය. හෙතෙම මා නොකමැති කල්හි මහණුන්ට සිවුරුද, පිණ්ඩපාතයද, සෙනසුන්ද, ගිලන්පස ද දෙයි. මසුරු මලයෙන් පීඩිතවූ මම ඔහුට පරිභව කරමි.

9. "මා නොකමැති කල්හි නුඹ ශ්‍රමණයන්ට යම් බඳු සිවුරුද, පිණ්ඩපාතයද, සෙනසුන්ද, ගිලන්පසද දෙයි,

10. "උත්තරය, මේ ප්‍රත්‍යය සමූහය නුඹට පරලොවදී ලේ වේවායි කීවෙමි. ඒ අකුශල කර්මයාගේ විපාකයෙන් මට ගංගානදීතොමෝ ලේ වෙයි."

**23. සූත්‍ර ප්‍රේතයාගේ කථාව:-** 1. "මා වෙත පැමිණ ඉල්ලන ලද්දාවූ මම ප්‍රව්‍රජිත නම් වූ භික්ෂුවූ පසේ බුදුන්ට පෙර නූල් දුනිමි. ඒ දානයාගේ මහත් ඵල ඇති විපාකය දැන් ලැබෙයි. බොහෝවූම කෙළ ගණන් වස්ත්‍රයෝ මට උපදිත්."

2. "නොයෙක් මල්වලින් ගැවසුනාවූ සිත් අලවනලද නානාවිධ චිත්‍රකර්ම ඇති නොයෙක් රුවනින් විසිතුරු රූ ඇති ස්ත්‍රී පුරුෂයන් විසින් සෙවුනා ලද විමන ඒ මම පරිභොග කරමි. කැමති වස්ත්‍රයක් පොරවා ගනිමි. බොහෝ වස්තූපකරණ ඇත්තාහ. එය ක්ෂය නොවෙයි.

3. "ඒ නූල් දානමය කුශලකර්මයාගේ හේතුවෙන් සැප විපාකවූ සැපය මේ විමනෙහිදී ලැබේ. ඒ මම නැවතද මිනිස් ලොවට ගොස් කුසල් කරන්නෙමි. ස්වාමිපුත්‍රය මා පමුණුවනු මැනවි."

4. "තී අවුරුදු සත් සියයකට උඩදී මේ විමනට පැමිණියාය. ඒ මිනිස්ලොවදී ජාරාජීර්ණවූවාත් වයොවෘද්ධ වූවාත් වන්නෙහිය තිගේ සියලුම නෑයෝද කළුරිය කළෝය. මෙතැනින් එහි ගොස් කුමක් කරන්නෙහිද?"

5. "ස්වාමිපුත්‍රය, මෙතනට පැමිණියාවූ දිවසැපත් වැළඳුවාවූ මට අවුරුදු සතක්ම වූහ. ඒ මම නැවත මිනිස් ලොවට ගොස් පින් කරන්නෙමි. එහෙයින් මා මිනිස්ලොවට පමුණුවනු මැනවයි" කීය.

6. "ඒ විමාන ප්‍රෙතතෙම වයොවෘද්ධවූ අතිශයින් දුර්වලවූ ඒ ස්ත්‍රිය බලාත්කාරයෙන් අතින් අල්වාගෙන නැවත ගමට පමුණුවා මෙතැනට පැමිණියාවූ අනික් ජනයාටත් 'පින් කරව් සැප ලැබේයයි' කියවයි කියා ආපසු ගියේය.

7. "නොකළාවූ කුශල කර්මයෙන් ප්‍රෙතයෝද එසේම මිනිස්සුද වැනසෙත්. සැප විපාකවූ කුශල කර්මකොට සැපයෙන් දියුණුවූ දෙවිවූද, මිනිස්වූද ප්‍රජාව මා විසින් දක්නාලදී."

24. **කර්ණමුණ්ඩ ප්‍රෙත කථාව**:- 1. "ඒ පොකුණෙහි රනින් කළ හිනිපෙති හා පුවරුද ඇත්තාහ. රුවන්මය වැලි පිහිටියේය. රුචිරවූ පවිත්‍ර සුවඳැති, සිත්කළුවූ සුදුපියුම් වෙත්.

2. "නොයෙක් රුක්මලින් ගැවසීගත්තීය. හාත්පස නන්වැදෑරුම් සුවඳ වැහෙන සුළං හමන්නීය. නානාවිධ රතු උපුල්වලින් වැසුනු දියතලා ඇත්තීය. හෙළපියුමෙන්ද ගැවසී ගත්තීය.

3. "මනොඥව වාතයෙන් කම්පාකරණලද සුවඳ මනාව හමත්. හංසයන් හා කොස්වා ලිහිණියන් විසිනුත් මනාව නාදකරණ ලද්දේය.

4. "නානාවිධ පක්ෂි සමූහයාගෙන් ගැවසීගත්තීය. නන්වැදෑරුම් පක්ෂීන්ගේ ශබ්ද සමූහයෙන් යුක්තය. නොයෙක් ඵල දරන්නාවූ වෘක්ෂ ඇත්තාහ. නානාවිධ සුවඳ මල් දරණ වනයෝ ඇත්තාහ.

5. "මේ නුවර යම්බඳුවීද මෙබඳු නුවරක් මිනිසුන් අතරෙහි හෙවත් මිනිස් ලොව නැත. තිගේ රන් රිදීමය බොහෝවූ ප්‍රාසාදයෝ

6-7-8. "හාත්පස සිවු දිසාවන්හි ඉතාමත් බබලමින් හොබවත්. තිට යම් මේ වතාවත් කරන්නාවූ පන්සියයක් දාස

ස්ත්‍රීහු වෙත්ද, ඒ ස්ත්‍රීහු සක්වළලු ඇඟපළඳනාවෙන් සැරසුන රුවන් මුදුන් මල් කඩින් මනාව සරසනලද කේශකලාපය ඇත්තාහුය. සියලු කාමයෙන් සමෘද්ධවූ තී යම් පර්යංකයක විසීමට යන්නීද කෙහෙල් මුවසම් පසතුරුණු අතුරනලද්දාවූ දික් ලොම් කොඳුපිළියෙන් අතුරන ලද්දාවූ සාදනලද රන් රිදීයෙන් කළ ආසන තිට බොහෝ වෙත්.

9-10 "අඩ රැය පැමිණි කල්හි ඒ ආසනයෙන් නැගිට උයන් වත්තට යන්නෙහිය. ගොස් හාත්පස නිල්වූ ලා තණ සමූහ ඇති ශුද්ධවූ ඒ පොකුණු තෙර තී සිටිනෙහිය. ඉන්පසු සිඳුණු කන් ඇති බල්ලෙක් තීගේ ශරීරාවයවයන් කයි.

11. "යම්කලෙක සුනඛයා විසින් කනලද්දී ඇටසැකිල්ල පමණක් කරණ ලද්දීවේද, එකල පොකුණට බසින්නෙහිය. පෙරමෙන් ශරීරය ඇතිවෙයි.

12. "ඉන්පසු පරිපූර්ණ අංගප්‍රත්‍යංග ඇතිව ඉතාම මනරම්වූ ප්‍රිය දැකුම් ඇත්තාවූ තී වස්ත්‍රයකින් පොරවාගෙන මා හමුවට එන්නෙහිය.

13. "කන්සිඳුනාවූම සුනඛතෙම කිනම් කර්මවිපාකයකින් ශරීරාවයවයන් කයිද, සිතින් කයින් වචනයෙන් කවර නපුරක් කරණලදද,

14. "කිම්බිලා නුවර ගෘහපතියෙක්තෙම ශ්‍රද්ධාවත්වූ උපාසකයෙක් විය. ඕහට මම බිරින්ද වීමි. ස්වාමියා ඉක්මවන සිල් නැත්තියක් වීමි.

15. "මෙසේ හිමියා ඉක්මවා හැසිරෙන්නාවූ මාහට හිමි තෙම මෙය කීයේය. යම්හෙයකින් තී මා ඉක්මවා හැසිරෙහිද, මෙය යුතුනොවේ. සුදුසු නොවේ.

16. "ඒ මම දරුණුවූම දිවුරුම්කොට බොරු කීවෙමි. මම කයින් හෝ නොහොත් සිතින් ඔබ ඉක්මවා නො හැසිරෙමි.

17. "ඉදින් මම කයින් හෝ සිතින් නුඹ ඉක්මවා හැසිරෙම් නම් කන්සිඳුනාවූ මේ බලුතෙම ශරීරාවයවයන් අනුභව කෙරේවා.

18. "ඒ අනාචාර අකුශලයාගේද බොරු කී අකුශලයාගේද යන කර්ම දෙක පිළිබඳ විපාකය අවුරුදු සත්සියක් මුළුල්ලෙහිම විඳින ලද්දේ විය. මේ කර්ම හේතුවෙන්ම මාගේ ශරීරාවයවයන් සුන් කන් ඇතිවුම සුනඛතෙම අනුභවකරයි."

19. "දෙවයන් වහන්ස, නුඹ බොහෝ උපකාරවූයෙහිය. මට වැඩ පිණිස මෙතැනට ආයෙහිය. මම කන් සිඳුනු බලුගෙන් මිදුනෙමි. ශොකනැත්තියක්ද බියනැත්තියක්දවීමි.

20. "දේවයන් වහන්ස, මම ඔබ වඳිමි. ඇඳිළිබැඳ යාඥා කරමි. දෙවයන් වහන්ස, අමනුෂ්‍යවූ කාම සම්පත් වළඳව මා හා සමග ඇලෙව."

21. "තී හා සමග අමනුෂ්‍ය සම්පත් අනුභවකොට ඇලුනේ වෙමි. සුපින්වතිය, වහා මා දැන් මගේ නුවරට පමුණුවාලවයි තීගෙන් ඉල්ලමි."

25. "**උබ්බරී ප්‍රෙතයාගේ කථාව**:- 1 - 2. පඤ්චාල රට වැස්සන්ට අධිපතිවූ ශ්‍රෙෂ්ඨවූ බඹදත් නම් රජෙක්විය. රජ තෙම කලකට පසු කළුරිය කෙළේය. එකල්හි ඒ රජුගේ උබ්බරී නම් වූ දේවිතොමෝ ආදාහනස්ථානයට ගොස් හඬයි. බඹදත් රජු නොදක්නී බ්‍රහ්මදත්තයයි කියා අඬයි.

3. ඒ සොහොනට යහපත් පැවැත්මෙන් යුක්ත නුවණැති තාපසයෙක්තෙම පැමිණියේය. එතන්හි යම් මිනිස්සු රැස්වූවාහුද එහිදී හෙතෙමේද ඔවුන් විචාළේය.

4-5 "හාත්පස නන්වැදෑරුම් සුවඳ හමන්නාවූ මේ සොහොන කවරෙකුගේද, මේ භාර්යාතොමෝ කවරෙකු සඳහා අඬාද? මේ මිනිස්ලොවින් දුරගියාවූ ස්වාමීවූ බ්‍රහ්මදත්තයෙකු නොදක්නි බ්‍රහ්මදත්තයයි කියා අඬාද?" එහි යමෙක් රැස්වසිටියෝද ඔව්හු එහිදී ප්‍රකාශකළාහුය.

6. "නිදුකාණෙනි, ඒ බඹදත් රජහට යහපතක්වේවා. ඒ බඹදත් රජුගේ නොයෙක් සුවඳ හමන මේ සොහොන වෙයි.

7. "මේ බිරින්ද මිනිස් ලොවින් දුරගියාවූ ස්වාමිවූ බ්‍රහ්මදත්ත රජු සඳහා බ්‍රහ්මදත්තයයි කියමින් අඬයි."

8. "බඹදත් යන නම් ඇති අසූසාරදහසක් රජවරු මේ සොහොනෙහි දමනලදහ. ඔවුන්ගෙන් කවරෙකු සඳහා ශෝක කරයිද?"

9. "ස්වාමීනි, චූලනී නම් රජුගේ පුත්වූ මහාරථ නම් යොධයෙක්වූ පඤ්චාලයන්ගේ යම් රජෙක්වීද, සියලු කැමති දේ දෙන්නාවූ ඒ ස්වාමියා සඳහා ශොකකරමි."

10. "සියළු රජවරු බඹදත් නමැත්තෝවූහ සියල්ලෝම පඤ්චාලයන්ට අධිපති චූලනී පුත්‍රයෝවූහ.

11. "සියලු රජවරුන්ට පිළිවෙළින් අගමෙහෙසුන් බව තී කීවෙහිය කවර හේතුවකින් පළමු රජුන් හැර පසු වූ රජු සඳහා ශොක කෙරෙහිද?

12. "නිදුකාණෙනි, යම්බඳුවූ ස්ත්‍රීභාවයට පැමිණියාවූ මට සසර බොහෝ ජාති කියනසේක්ද, ස්ත්‍රීභාවයට පැමිණි බොහෝ කල්ද?"

13. "තී ස්ත්‍රියක් වූවෙහිය. පුරුෂද වූවෙහිය. තිරිසන් යොනියටද පැමිණියෙහිය. මෙසේ මේ අතීත ආත්මභාවයන්ගේ කෙළවරක් නොදන්නා ලැබේ.

14-15-16. (මෙහි 20 කථාවේ 5. 6. 7. ඡෙද යොදාගත යුතුයි.)

17. "ඒ ශ්‍රමණ තාපසයාගේ සුභාෂිතවූ ධර්ම කථාව අසා පාත්‍ර සිවුරු ආදිය රැගෙන අනගාරිය ස්ථානයෙහි පැවිදිවිය.

12. "ඕතොමෝ ගිහිගෙන් නික්ම තපසට සුදුසු තන්හි පැවිදිවූයේම බඹලොව ඉපදීම පිණිස මෛත්‍රී ධ්‍යානය වැඩුවාය.

19. "ගමින්ගම නියම්ගමක් පාසා රාජධානියක් පාසා හැසිරෙමින් උරුවෙල් නම් ඒ ගම යම් තැනෙක්හිද එහිදී කළුරිය කෙළේය.

20. "බඹලොව ඉපදීම පිණිස මෛත්‍රී සහගත සිත වඩා ස්ත්‍රීභාවයෙහි සිත දුරුකොට බඹලොවට පැමිණියේවිය."

**(උබ්බරී වර්ගය නිමි.)**

---

# 3. චුල්ල වර්ගය.

**26.** අභිජ්ජමාන (නොගැටෙන) ප්‍රේතයාගේ කථාව:- 1. "එම්බා ප්‍රේතය, ගංගා නදියගේ පා තැබීමෙන් නොගැටෙන දිය මතුයෙහි නිර්වස්ත්‍රවූ පූර්වාර්ධයෙන් දෙවියකු වැනිවූ මල්මාලා පැලැන්දාවූ සරසනලද හිස ඇතිව මෙහි යන්නෙහිය. කොතැන්හි යන්නෙහිද? විසීම කොහි වන්නේද?"

**2.** "වාසභ ගමටත් බරණැසටත් මැද බරණැසට සමීපවූ චුන්දත්ථික නම් ගමට යන්නෙමියි" ඒ ප්‍රේතතෙම කියයි.

**3.** කොකාලිකයි කියා ප්‍රකටවූ මහා ඇමතිතෙම ඒ ප්‍රේතයා දැක ප්‍රේතයා සඳහා අත්සුනුද බත්ද ස්වර්ණවර්ණවූ වස්ත්‍ර යුග්මයක්ද දුනි.

**4.** "නැව නැවත්වූ කල්හි කරනැවැමි උපාසකයෙකුට වස්ත්‍ර දෙකක් දෙවූයේය. ඔහුට වස්ත්‍ර දුන් කල්හි ස්ථාන වශයෙන් එකෙනෙහිම ප්‍රේතයාගේ ශරීරයෙහි දිවසළු දක්නා ලදී.

**5.** ඉන්පසු යහපත් දිව්‍යවස්ත්‍ර හැන්දේ මල් පැළැන්දේ සැරසුනේ විය. දන් දීමට සුදුසු තැන පිහිටියාවූ දක්ෂිණා තොමෝ මේ ප්‍රෙතයාට පින් පැමිණවූයේද එහෙයින් ප්‍රේතයන්ට අනුකම්පාවෙන් නැවත නැවත දන්දෙන්නේය.

**6.** සමහර ප්‍රේතයෝ සුන්බුන් රෙදිකඩ හැන්දෝද තවත් සමහරු කෙශයෙන් ලජ්ජාස්ථාන වසාගත්තෝද ආහාර පිණිස යත්. දිගින් දිගට යති.

**7.** ඇතැම් ප්‍රේතයෝ දුරතැන් දුවගොස් කිසිවක් නොලබාම නවතිත්. සාගිනි ඇත්තෝ හටගත් මුළා ඇතිව කරකැවෙමින් බිම වැටුනාහුවෙත්.

**8.** සමහරු ඒ ගිය තන්හි වැටී බිම වැටුනාහුවෙත්. පෙර ජාතියෙහි කුසල් නොකළාහුද අව්වෙහි ගින්නෙහි දැවුනවුන් මෙන් වෙත්.

**9.** "අපි පෙර ආත්මභාවයෙහිදී ලාමක ස්වභාව ඇති ගෘහ ස්වාමිනීවූ කුල මච්චරු වීමු. දිය යුතු දෙය ඇති කල්හි තමහට පිහිටක් නොකෙළෙමු.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10. "එසේ නමුත් බොහෝ වූ ආහාරපානද නසා දැමීමු සම්‍යක් ප්‍රතිපන්නවූ පැවිද්දන්ට කිසිවක් නොමදුනිමු.

11. "නොකටයුතු අකුශලයට කැමැත්තෝ වීමු. කුශල කරණයෙහි අලසයෝ වීමු. මිහිරි වස්තුවට ප්‍රියවීමු. බොහෝ කෑවෝ වෙමු. බත් පිඩක් පමණවත් දෙන්නාහු ප්‍රතිග්‍රාහකයන්ට පරිභව කෙළෙමු.

12. "ඒ ගෘහයෝද ඒ දාසයෝද ඒ ආභරණයෝද අපට නැත්තාහ. අනික් අය ඒ ගෘහාදිය පරිභොග කරත්, අපි දුකට හිමිවීමු.

13. "අවමන් කටයුතුවූ කුළු පොතු කුල ඇත්තෝ හෝ වෙත්. සම් කරු කුල ඇත්තෝද මිත්‍රද්‍රෝහි වූවෝද සැඩොල් කුල ඇත්තෝද ඉතා අකරුණාවට පැමිණියෝද කරනැවැම් කුලයෙහි නැවත නැවත උපදිත්.

14. "ඉතා දුක්පත්වූ යම් යම් නිහීන කුලයෝ වෙත්ද, ඒ ඒ කුලයන්හිම උපදිත්, මෙය මසුරුකම ඇත්තාගේ ස්වභාවයයි.

15. "පෙර පහකළ මසුරු මල ඇතිව කළ කුසල් ඇතිවූම දායකයෝ වෙත්ද, ඔව්හු තුමූ ස්වර්ග ලොකය පුරවත්. නන්දන වනය බබුළුවත්.

16. "වෛජයන්ත ප්‍රාසාදයෙහිද ඇලී කාමසම්පත් පරිභොග කළාහු එයින් චුතව මහත් සම්පත් ඇති උසස් කුලයන්හි උපදිත්.

17. "කුලයෙහි උපන්නෝ කුළුගෙයිද පහයෙහිද දික්ලොම් ඇති කොඳු පලස් අතුරණ ලද පර්යංකයෙහි දිනූ සිරුර ඇති මොණර පිලින් සැරසුන විජිනිපත් ගත් අතින් යුක්තව පිරිවර ජනයා ඇත්තෝව ඇලෙත්.

18. "මල් මාලා දරමින් අලංකාර වූවාහු ඇකයෙන් ඇකයට යත්. සැප කැමතිවූ කිරි මවුවරු සවස් කාලයෙහි ද උදය කාලයෙහිද උපස්ථාන කරත්.

19. "ශොක රහිතවූ රම්‍යවූ දෙවියන්ගේ මහා වනයවූ මේ නඳුනුයන පින් නොකළවුන්ට නොලැබේ. පින් කළවුන්ටම ලැබේ.

**20.** "පින් නොකළවුන්ට මෙලොවද පරලොවද සැපක් නැත. පින් කළවුන්ට මේ ආත්ම භාවයෙහිදීද පරලොවදීද සැපම ලැබේ.

**21.** "ඒ යථොක්ත දෙවියන් හා සහභාවය කැමැත්තන් විසින් බොහෝවූ කුශල කර්මය කටයුතුයි. පින් කළෝම දිව්‍ය පඤ්චකාම ගුණයෙන් යුක්තවූවාහු ස්වර්ගයෙහි සතුටු වෙත්"

**27. සාණවාසී ප්‍රේතයාගේ කථාව:-** 1. "කුණ්ඩි නම් නුවර උපන් සම්බන්ධ කම් ඇති සාණු පර්වතයෙහි වසන්නාවූ නමින් පොට්ඨපාද නම්වූ සමිත පාපීවූ වඩනාලද ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති ස්ථවිරනමක් විය.

**2.** ඒ තෙරුන්ගේ මවුද පියාද සහෝදරයා දුක්ඛිතවූද ප්‍රේත ලොකයෙහි උපන්නාහුය. පව්කම් කොට මෙයින් ප්‍රේතලොකයට ගියාහුය.

**3.** දුක්පත්වූ ඉදිකටු බඳු රූක්ෂ වස්ත්‍රාදියෙන් පීඩිතවූ ක්ලාන්තවූ කායචිත්ත ඇති නග්නවූ කෘශවූ බියෙන් තැති ගන්නාවූ හටගත් මහත් බිය ඇති දරුණු කම් කළාවූ ඒ ප්‍රේතයෝ තමන් නොදක්වත්.

**4.** ඒ තෙරුන්ගේ සොහොයුරුතෙම බියෙන් දුරුව නිර්වස්ත්‍රව තනිව මාර්ගයෙහි යන්නේ සතරට වකුටුවී තෙරනුවනට තමා දැක්වීය.

**5.** ස්ථවිර තෙමේද මෙනෙහි නොකොට නිශ්ශබ්දවූයේ වැඩිසේක. ඒ ප්‍රේතතෙමේද "මම සහෝදරයෙමි ප්‍රේතාත්මයට පැමිණියෙමියි" තෙරුන්ට දැන්වීය.

**6.** "ස්වාමීනි, නුඹගේ මවුද පියාද ප්‍රෙත ලොකයෙහි උපන්නෝ දුකට පත්වූවෝය. පව්වු කර්මයක් කොට මෙයින් ප්‍රෙත ලොකයට ගියෝය.

**7.** (මේ ඡේදය මේ කථාවේ 3 වෙනි ඡේදය මෙනි.)

**8.** කරුණාවන්තවූ ඔබවහන්සේ අපට අනුකම්පා කරණු මැනව. දන්දී පින් පමුණුවනු මැනව, නුඹ වහන්සේ විසින් දෙන ලද දාන හෙතුවෙන් ක්‍රෑර කම් ඇත්තෝ යැපෙන්නාහ."

**9.** ස්ථවිරතෙමේ තවත් භික්ෂූන් දොළොස් නමක්ද පිඬු පිණිස හැසිර බත්වැළඳීම නිමිත්ත කොට එකට රැස්වූවාහුය.

**10.** ස්ථවිරතෙමේ "ලද යම් යම් දානය මට දෙව. නෑයන්ට අනුකම්පා පිණිස සඟ බත් කරන්නෙමියි." ඒ සියල්ලන්ටම කීයේය.

**11.** "තෙරුන්ට භාර කළාහුය. ස්ථවිරතෙම සංඝයා ආරාධනා කෙළේය. ස්ථවිරතෙම දන්දී මවටද පියාටද සහෝදරයාටද,

**12-13.** "මාගේ නෑයන්ට මේ පින වේවා. නෑයෝ සුවපත් වෙත්වායි" පින් පැමිණ විය. පින් පැමිණවීමට අනතුරුවම පවිත්‍රවූ ප්‍රණීතවූ මිහිරිවූ නොයෙක් රසමසවුලෙන් යුක්තවූ දිව බොජුන් පහළ විය. ඉන්පසු සහෝදරයා වර්ණවත්වූයේ ශක්තිමත්වූයේ සුවපත්වූයේ තමා දැක්වීය.

**14.** "ස්වාමීනි බලනු මැනවි. බොහෝවූ දිව්‍ය භොජන ලබන ලදී. අපි නග්නයෝ වෙමු. ස්වාමීනි යම්සේ වස්ත්‍ර ලබමුද. එසේ වෑයම් කරනු මැනව."

**15.** ස්ථවිරතෙමේ දමනලද රෙදිකැබලි කසලගොඩින් අහුලාගෙන රෙදි කැබලි වස්ත්‍රයක් කොට සිව්දිගින් වැඩි සංඝයාට දුනි.

**16.** "ස්ථවිරතෙම දන් දුන්නේය. 'මවටද පියාටද සහෝදරයාටද මාගේ නෑයන්ට මේ පින වේවා නෑයෝ සුවපත් වෙත්වායි" පින් පැමිණ විය.

**17.** පින් පැමිණවීමට අනතුරුව පවිත්‍රවූ ප්‍රණීතවූ මිහිරිවූ නොයෙක් රසමසවුලෙන් යුක්තවූ දිව්‍ය වස්ත්‍ර පහළ විය. ඉක්බිති යහපත් වස්ත්‍ර හැන්දේ තමා තෙරුන්ට පෙනී සිටියේය.

**18-19-20.** (මේ ඡෙද 13 කථාවේ 16-17-18 මෙනි) "ස්වාමීනි, මම යම්සේ ගෙයක් ලබම්ද එසේ වෑයම් කරණු මැනව.

**21.** "තෙරුන් වහන්සේ කොළ ගෙයක් කොට සතර දිගින් වැඩි සංඝයාට දුන්නේය.

22. (මෙහි මේ කථාවේ 16 ඡේදය යොදාගත යුතුයි) පින් පැමිණවීමට අනතුරුව ගෙවල් පහළවූවාහුය.

23. බෙදන ලද්දාවූ කොටස් වශයෙන් පිරිසිඳින ලද්දාවූ කුළුගෙවල් හා නිවෙස්වූ ගෘහයෝ පහළවූහ. මේ ප්‍රේත ලොකයෙහි අපගේ ගෘහයෝ යම්බඳු වෙත්ද එබඳු ගෘහයෝ මිනිසුන් අතර නොවෙත්.

24. "දෙව්ලොව යම්බඳු පහයෝ වෙත්ද. මෙහි එබඳුවූ අපගේ ගෘහයෝ ඉතාමත් දිලිසෙමින් හාත්පස සිවුදිගුන් බබුළුවත්.

25. "ස්වාමීනි, දැන් අපට පැන් ලැබෙන පරිද්දෙන් වැයම් කරණු මැනව" එවිට ස්ථවිරතෙමේ පැන් පිරවූ ඩබරාව පුරවා සතර දිගින් වැඩි සංඝයාට දුන්නේය.

26. එසේදී තෙරුන් වහන්සේ "මවුපියන්ට හා සහෝදරයාටද මාගේ නෑයන්ට මේ පින වේවා නෑයෝ සුවපත් වෙත්වායි" කියා පින් දුන්නේය.

27. එකෙනෙහිම දිව පැන් පහළ විය. ගැඹුරු සතරැස් පොකුණු මැවුනාහ.

28. ඒ පොකුණු සුදු වැලිතලාවෙන් හා ජලයෙන් යුක්තවූහ. යහපත් තොටුපල් ඇත්තාහ. සිහිල් ජලය ඇත්තාහ. මනාසුවඳින් යුක්තවූහ. ඒ ඒ තැන ජලමත්තෙහි රතුපියුම් සුදුපියුම් ආදී මල්රේණු බරින් වැසී පිරුණාහ.

29. එහි නා බී තෙරුන්ට දැක්වූහ. "ස්වාමීනි, බොහෝවූ දිව පැන් පහළ විය. අපගේ පාදයෝ දුකින් පැලෙත්.

30. "කැටගල් ඇත්තාවූද කුසකටු ඇති භූමි ප්‍රදෙශයෙහි ඇවිදින්නාහු කොර ගසමින් යම්හ. ස්වාමීනි යම්සේ යානාවක් ලබමුද එසේ උත්සාහ කරණු මැනව."

31-32. ස්ථවිරතෙම සම්පටක් ඇති වහන් සඟලක් ලැබ සතර දිගින් වැඩි මහ සංඝයාට දුනි. මවුපියාදීන්ට පින්දුන්නේය. එකෙණෙහිම දිව්‍ය රථ පහළවී ප්‍රේතයෝ දිව්‍ය රථයෙන් පැමිණියාහුය.

33. "ස්වාමීනි, ඔබවහන්සේට යහපතක්වේවා. ආහාර දානයෙන්ද ගෘහ දානයෙන්ද පැන් දීමෙන්ද යාන දානයෙන්ද උභය දානයෙන් අනුකම්පා කරණ ලද්දෝ වම්හ. ස්වාමීනි, ලොකයෙහි කරුණා සම්පන්නවූ ඔබ වහන්සේ වැඳීමට පැමිණියෝ වෙමු."

**28. රථකාර ප්‍රේතයාගේ කථාව:-** 1. මහත් දිව්‍ය ආනුභාව ඇති දෙවඟන, වෛඩූර්යමය කණු ඇති මනොඥවූ පැහැ විහිදෙන්නාවූ, නොයෙක් සිතියමින් සැරසුණු විමනට නැඟී අහස්තලයෙහි පසලොස්වක් දින චන්ද්‍රයා මෙන් ඒ විමනෙහි හිඳිනෙහිය.

2. "තීගේ ශරීර වර්ණයද ඔප් නැගූ ස්වභාව ඇත්තේ රන් හා සමානවූයේ අතිශයින් දර්ශනීය වෙයි. බොහෝ වටිනා ශ්‍රෙෂ්ඨ ආසනයෙහි තී හුදකලාව හිඳින්නී වෙයි. තිට හිමියෙක්ද නැත්තේය.

3. "තීගේ මේ පොකුණු හාත්පස බොහෝ මල් ඇත්තාහ. බොහෝ සුදු පියුම් ඇත්තාහ. රුවන් වැල්ලෙන් හාත්පස ගැවසීගත්තාය. එහි මැද දියසෙවෙල්ද නැත්තේය.

4. "දර්ශනීයවූ මනොරම්‍යවූ මේ හංසයෝද, ජලයෙහි සැම කල්හි ඔබමොබ හැසිරෙත්. සියල්ලෝම එක්ව පිඬු කළ නාද ඇතිව ගෙරින්ගේ ඝොෂණය මෙන් මිහිරි කොට නාද කරත්.

5. "එම්බා ඉසුරුමතිය, තී දිව්‍යමය ඍද්ධියෙන් ඉතාමත් දිලිසෙමින් රුවන් නැවෙහි එල්බී හිඳිනෙහි වෙළුන නිල් දික් ඇස් ඇත්තී ලොව ඇති සිනහමුව ඇති ප්‍රියවචන කියන්නාවූ ශොභන අංගප්‍රත්‍යංග ඇත්තීය. අතිශයින් බැබලෙයි.

6. "මේ විමන රජස් රහිතවූ, සම භූමියෙහි පිහිටියාවූ නන්දන වනයෙන් යුක්තවූ සැප ප්‍රීති වර්ධනය කරන්නකි අලාමක දැකුම් ඇති ස්ත්‍රිය මම තී හා සමග නන්දන නම්වූ, මේ නන්දන වනයෙහි ඇලෙන්නට කැමැත්තෙමි."

7. "මෙහි විපාක වින්ද යුතුවූ, කුශල කර්මයක් කරව. නුඹගේ සිතද මෙහි පිහිටවා මෙසේ මෙතැන විපාක වින්ද යුතුවූ කුශල

කර්මයකොට කැමතිවියයුතු කාමයෙන් යුක්තවූ මා ලබන්නෙහිය."

8. හෙතෙම මැනවයි ඇගේ වචන පිළිගෙන එහි විපාක විඳීමට සුදුසු වූ කුශල කර්මය කෙළේය. මාණවකතෙම එතැන්හි වින්ද යුතුවූ කුශල කර්මය කොට ඇගේ සහභාවයට පැමිණියේය.

**28. තුස (බොල්) ප්‍රේතයාගේ කථාව:-** 1. "එකෙක් හැල් වී බොල් හිස විසුරුවා ගනී. නැවත තවත් එකෙක් හිස සිඳීමට පැමිණෙයි. මේ ස්ත්‍රියද තම පිට මස් හා ලේ අනුභව කරයි. තීද අපවිත්‍රවූ පිළිකුල්කටයුතුවූ අශුචි අනුභව කෙරෙහිය. කවර අකුශල කර්මයක්හුගේ මේ විපාකය වේද?"

2. "මේ තෙම පෙර මවට හිංසාපීඩා කෙළේය. මෙතෙම කූටවෙළෙන්දෙකි. මෝතොමෝ මස් කා බොරු කීමෙන් වංචාකෙළේය.

3. "මම මිනිස් ලොව මනුෂ්‍යයෙක්ව සියලු කුශලයට ඊශ්වරවූ ගෘහපතියෙක් වීමි. ධනය ඇති කල්හිම නැතැයි අඟවා මෙයින් කිසිවක් නුදුනිමි.

4. "මෙය මාගේ ගෙයි නැතැයි බොරු කියමින් වසාලීමි ඉදින් මාගේ ගෙයි ඇතිව සඟවන්නෙම් නම් මාගේ ආහාරය අශුචි වේවා.

5. "ඒ අකුශල කර්මයාගේද මුසාවාද අකුශලයාගේද, කර්ම දෙදෙනාගේ විපාක හේතුවෙන් සුවඳැල් සහල් පිළිබඳවූ බත මාහට අශුචි බවට පෙරළෙයි.

6. "කුශලා කුශල කර්මයෝ නිෂ් නොවෙත්. එය කර්මය නොවැනසේමය. දුගඳවූ හටගත් පණුවන් ඇති අශුචි අනුභව කරමි. පානයද කරමි."

**30. කුමාර ප්‍රේතයාගේ කථාව:-** 1. ශාස්තෘන් වහන්සේ යම්සේ පුද්ගලයා ප්‍රකාශ කළසේක්ද, සර්වඥයන් වහන්සේගේ සර්වඥතාඥානය ආශ්චර්ය ස්වභාව ඇත්තේය. අධික කුශල ධර්ම ඇත්තාවූද සමහර පුද්ගලයෝ වෙත්මය. ඉතාසුළු පින් ඇත්තාවූද සමහරු වෙත්මය.

**2.** "සොහොනෙහි බහාලනලද මේ කුමාරතෙම ඇඟිල්ලෙන් වැගුරුණු කිරෙන් රාත්‍රියෙහි යැපෙයි. කරණලද පින් ඇති කුමරා යක්ෂ භූතයෝද නොපෙලුවාහුය. සර්පජාතීහුද පීඩානොකළාහුය.

**3.** "සුනඛයෝද මේ කුමරුගේ පාදයන් පිරිමැද්දාහුය. කවුඩෝද සිවල්ලුද ඔබ්මොබ පෙරලත්. පක්ෂි සමූහයා ගැබ්මල පහකරත් කවුඩෝ වනාහි ඇස්මල පහකරත්.

**4.** "කිසි මනුෂ්‍ය කෙනෙක් මේ කුමරුගේ රැකීම නොකළාහුය. ඖෂධ හෝ අබදුම්දීම් හෝ නොකළාහුය. නැකැත්යොගද නොගත්තාහුය. ඇල්ආදී සර්වධාන්‍යයන්ද නොවිසුරුවාහුය.

**5-6.** "රාත්‍රියෙහි ගෙනෙන ලදුව සොහොනෙහි දමන ලද්දාවූ ඉතාම දුක්පත්වූ වෙඩරුපිඩක් බඳුවූ වෙවුලන්නාවූ ජීවත්වේදෝ නොවේදෝයි සැකසහිතවූ ජීවිත මාත්‍රයම ඉතිරිවූ මෙබඳුවූ ඒ කුමරු දෙව්මිනිසුන් විසින් පුදන ලද්දාවූ මහාප්‍රාඥවූ තථාගතයෝ දුටුසේක. ඔහු දැකම මේ කුමර තෙම මේ නුවර භොගසම්පත්තියෙන්ද කුලයෙන්ද උසස් කෙනෙක් වන්නේයයි" ප්‍රකාශ කළසේක.

**7.** "මේ කුමරුගේ ව්‍රතසමාදානය කුමක්ද, ශ්‍රෙෂ්ඨ හැසිරීම කුමක්ද, මොනවට පුරුදුකරණ ලද්දාවූ කෙබඳුවූවක් හුගේ මේ විපාකයවේද, මෙබඳුවූ විපතට පැමිණ එබඳුවූ කීපරිදි සම්පත්ද දිව්‍යසම්පත්ද නැවත වළඳන්නේද?

**8.** "ජනසමූහයා බුද්ධප්‍රමුඛවූ භික්ෂුසංඝයාහට මහත් පූජාවක් කෙළේය. එහිදී මොහුගේ සිතට අගෞරවයක් ඇතිවිය. යහපත් සභාවෙහි නොකිවයුතුවූ රළුවචනයක් කීයේය.

**9.** "හෙතෙම නැවත ඒ ලාමක විතර්කය පහකොට ප්‍රීතියද ප්‍රසාදයද ලැබ ජේතවනයෙහි වැඩවසන්නාවූ තථාගතයන් වහන්සේට සත් දිනක් කැඳදානයෙන් උපස්ථාන කෙළේය.

**10.** "මොහුගේ ඒ ව්‍රතසමාදානයද ඒ ශ්‍රෙෂ්ඨ චර්යාවදවේ. මනාසේ පුරුදු කරණලද්දාවූ ඒ කර්මයාගේ මේ විපාකයවේ

මෙබඳු විපතට පැමිණ එබඳුවූ ඒ උක්තප්‍රකාර සම්පත්ද දිව්‍යඍද්ධියද නැවත වළඳන්නේය.

11. "ඒ කුමාරතෙම මේ මිනිස් ලොවම අවුරුදු සියයක් මුළුල්ලෙහි සියලුකාම සැපතින් යුක්තව සිට ශරීරයාගේ බිඳීමෙන් ශක්‍රයාගේ සහභාවයට යන්නේය."

31. **සෙරිණි ප්‍රේතියගේ කථාව**:- (1) (මෙය 13 කථාවේ 1-2 ඡේදමෙනි)

(2) (මෙය 6 කථාවේ 5 ඡේදයමෙනි.)

3. "නොවලක්වන ලද්දාවූ තීර්ථ නම්වූ මහණ බමුණන් කෙරෙහි අධමසක් හැසුරුනෙමි. දානවස්තු විද්‍යමාන කල්හිද තමහට පිහිටක් නොකෙළෙමි.

4. "පිපාසා ඇතිව නදිය කරා පැමිණියෙම් නම් දිය හිස්ව පවතියි. උෂ්ණකාලයෙහි සෙවනකට පැමිණියෙම් නම් අව්ව පැමිණෙයි.

5. "වාතයද ගිනිසමානව මාගේ ශරීරය දවමින් හමයි. වහන්ස, මේ දුක්ද ඊටවඩා දරුණුවූ අනික් දුකටත් සුදුසුවෙයි.

6. "හස්තිනී පුරයට ගොස් මාගේ මවට කියව. පව්කම් කොට මෙයින් ප්‍රෙතලොකයට පැමිණියාවූ දුක්පත්වූ ප්‍රෙත ලොකවාසීවූ තීගේ දියනියද මා විසින් දක්නාලදී. මෙහි මා විසින් තබනලද වස්තුව ඇත්තේය. එය මා විසින් කිසිවෙකුට නොකියන ලද්දේය.

7. "ආසනය යටින් සාරලක්ෂයක් තබනලදහ. ඒ වස්තුවෙන් මා උදෙසා දන්දේවා. ඒ මවගේද ජීවිකාව වේවා

8. "මාගේ මවුතොමෝ දන්දී මට පින පමුණුවාවා. එකල්හි මම සියලු කාමයෙන් සමෘද්ධවූවා සුවපත් වන්නෙමියි" කීයේය.

9. ඒ උපාසකතෙම යහපතැයි පිළිවදන්දී හස්තිනී පුරයට ගොස් ඇගේ මවට කීයේය.

10. "තීගේ දියණිය පව්කම්කොට මෙයින් මැරීගොස් ප්‍රෙත ලොකයෙහි ඉපදී දුක් විඳින්නී මා විසින් දක්නාලදී.

11. "එහිදී ඒ ප්‍රෙතිතොමෝ මට 'තීගේ දියණිය අකුශල් කොට මෙයින් සැවගොස් ප්‍රෙතලොකයෙහි ඉපදී දුක් විඳින්නී මා විසින් දක්නා ලද්දේයයි' කියා මගේ මවුට කියනු මැනවැයි මට මෙසේද කීය.

12. "පව්කම්කොට ප්‍රෙතලොකයට ගියාවූ මාගේ එහි තබනලද මා විසින් කිසිවෙකුට නොකියනලද

13. "ආසනය යට සාරලක්ෂයක් ධනය ඇත. ඉන්මට දානයක් දුනමැනව. සෙස්ස ඇගේ ජීවිකාවටද ගනීවා.

14. "මාගේ මවුතොමෝ දන්දී මට පින් පමුණුවාවා. එකල්හි මම සියලු සැපතින් සම්පූර්ණව සුව ඇත්තියක් වන්නෙමි."

15. එහෙයින් වනාහි ඕතොමෝ දන්දුනි, දී ඒ ප්‍රෙතියට පින් පැමිණවී. ප්‍රෙතියද සුවපත්විය. ශරීරය මනාදැකුම් ඇතිවිය."

32. **මිගලුද්දක ප්‍රේතයාගේ කථාව:-** 1. "තරුණ දෙවතාවන් හා දිව්‍යප්සරාවන් විසින් පිරිවරණ ලද්දාවූ සිත්කළුවූ කාමකොට්ඨාසයන්ගෙන් යුක්තව රාත්‍රී කාලයෙහි හොබනෙහිය. දවල්කාලයෙහි දුක් අනුභව කරන්නෙහිය. පූර්වජාතියෙහි කිනම් කර්මයක් කෙළෙහිද?"

2. "මම රම්‍යවූ සිත්කළුවූ ගිරිබ්බජනම්වූ රජගහනුවර පූර්වජන්මයෙහි ලේවැකුණු අත් ඇති දරුණුවූ මුව වැද්දෙක්වීමි.

3. "එකල්හි ඉතා දරුණුවූ පරපීඩාවෙහි ඇලුනු නොහික්මුනාවූ කිසිවෙකු සමග විරුද්ධයක් නොකරන්නාවූ බොහෝ සත්වයන් කෙරෙහි දූෂිත වූ සිත් ඇතිව හැසුරුනෙමි.

4. "ඒ මට යහපත් සිත් ඇති ශ්‍රද්ධාවත්වූ උපාසක මිත්‍රයෙක්විය. හෙතෙමේද අනුකම්පාකරමින් නැවත නැවත මා වැලැක්විය.

5. "සහෝදරය, ලාමක අකුශල කර්මය නොකරව, දුගතියට නොයව, පරලොවදී සැපය ඉදින් කැමති නම් අසංවරවූ ප්‍රාණඝාත අකුශලයෙන් වෙන්වෙව.

6. "සැප කැමතිවූ හිත අනුකම්පා ඇති ඔහුගේ වචනය අසා බොහෝකල් පවෙහි ඇලුනාවූ නුවණ නැත්තාවූ මම සියලු අනුශාසනාව නොකෙළෙමි."

7. යහපත්වූ බොහෝ නුවණැති ඒ උපාසකතෙම නැවත දයාවෙන් මා සුචරිතයෙහි පිහිටවිය. ඉදින් දවල් කාලයෙහි සත්වයන් නසන්නෙහි නම් යලිත් රාත්‍රියෙහි තාගේ සංවරය ඇතිවේවා.

8. "ඒ මම දවල් කාලයෙහි සත්වයන් නසා රෑ කාලයෙහි වෙන්වූයේ සංවර ඇත්තෙක්වීමි. මම රාත්‍රියෙහි ඉඳුරන් හසුරුවම නොහොත් දෙව්සැප විඳිමි. දවල් කාලයෙහි දුකට පත් වූයේ දුක්විඳිමි.

9. "ඒ කුශල කර්මයාගේ විපාකයෙන් රාත්‍රියෙහි දිවසැප වළඳමි. දවල් කාලයෙහි බද්ධ වෛර ඇත්තවුන්සේ සුනඛයෝ හාත්පසින් කෑමට දිවඑත්.

10. "යම් ඒ පුරුෂයෝ වනාහී තථාගත ශාසනයෙහි ස්ථිර වශයෙන් ඇඩිසේ යෙදුනාහු නිතර අනුයොගවත්වූවෝ වෙත්ද, ඒ පින්වත්හු හුදෙක් රැස්කිරීමෙන් තොර නිර්වාණයටම පැමිණෙත්යයි සිතමි."

33. **දෙවෙනි මිගලුද්දක ප්‍රේත කථාව:-** 1. "දිව්‍යමය කූටාගාරයෙහි හා පහයෙහිද දික් ලොම් ඇති කොඳු පලස් අතුරන ලද්දාවූ පර්යංකයෙහි පඤ්චාංගික තූර්ය නාදයන් විසින් මනාව වාදනය කරණ කල්හි සිත් අලවන්නෙහිය.

2. "ඉන්පසු රාත්‍රිය අවසන්වූ කල්හි සූර්යයා උදාවූ කල්හි සොහොනෙහි බහාලන ලදුව බොහෝ දුකට පැමිණෙන්නෙහිය.

3. (මෙය 6 කථාවේ 5 ඡෙදය මෙනි.)

4. "මම පෙර රම්‍යවූ රජගහ නුවර නොහික්මී රෞද්‍රකම් ඇති සතුන් මරණ මුව වැද්දෙක් වීමි.

5. "ඒ මට යහපත් සිත් ඇති සැදැහැවත් උපාසක යහළුවෙක් විය. ඒ උපාසකයාගේ ගෙදරට පැමිණෙන ගෞතම ශ්‍රාවකවූ රහත් භික්ෂු නමක් විය.

6. "ඒ රහතන් වහන්සේද 'දරුව ලාමකවූ ප්‍රාණඝාත අකුශල කර්මය නොකරව. දුගතියට නොයවයි' කියා අනුකම්පා කරමින් නැවත නැවතත් මා පවින් වැළැක් විය.

7. "ඉදින් පරලොවදී සැප කැමැත්තේ නම් ප්‍රාණඝාතයෙන් වලකිනු යන සැප කැමතිවූ හිතානුකම්පීවූ උන්වහන්සේගේ වචනය අසා,

8. "බොහෝ කල් පවෙහි ඇලුනාවූ අඥානවූ මම සියලු කල්හි සතුන් මැරීමෙන්, වැලකීමට කළ අවවාදය නොකෙළෙමි.

9. "මහත්වූ ප්‍රඥාවත්වූ ඒ රහතන් වහන්සේ දයාවෙන් ඉදින් දවල් කාලයෙහි සතුන් මැරීමෙන් වැළකිය නොහැකි නම් රාත්‍රියෙහිවත් සත්ව ඝාතනයෙන් වලකුවයි' කීහ. ඒ මම දවල් සතුන් මරා රෑ සතුන් මැරීමෙන් වැළකුනෙමි.

10. "මම රාත්‍රියෙහි දිව්‍ය ස්ත්‍රී පුරුෂයන් විසින් පිරිවරන ලදුව දැන් දිවසැප විඳිමි. දවල් කාලයෙහි බල්ලන් විසින් කන ලදිමි. රාත්‍රි ප්‍රාණඝාතයෙන් වැලකුණු කුශල විපාකයෙන් රෑ දිවසැප විඳිමි. දවල් බද්ධ වෛර ඇත්තවුන් මෙන් සුනඛයෝ හාත්පසින් මා කන්නට දුවත්.

11. "යම් පුරුෂ කෙනෙක් වනාහි තථාගත ශාසනයෙහි අධි ශීලාදියෙහි නිතර දැඩිසේ යෙදුනාහුද ඒ පින්වත් ජනයෝ හුදෙක් ලෞකික සැප හා මිශ්‍ර නොවූ නිවනට පැමිණෙත් යයි සිතමි."

**34. කූට විනිශ්චයික ප්‍රේතයාගේ කථාව:-** 1. "දිවමල් දරන්නාවූ හිස් වෙළුම් ඇති බාහු වලලු ඇත්තෙහිය. තාගේ ශරීරය සඳුන් රස ගල්වන ලද්දාහ. මුහුණේ පාට පැහැදිලිය තරුණ සූර්යයා වැනි පැහැය ඇතිව බබළයි.

2. "යුෂ්මතාගේ අත් පා මෙහෙ කරන්නාවූ දෙව්වූ යම් මේ පිරිසෙහි වූවෝ වෙත්ද, නුඹගේ යම් යම් පරිචාරිකාවූ දස දහසක් දෙවඟනෝ වෙත්ද ඔව්හු,

3. "සක් වළලු හා අඟු පළඳනා දරන්නාහ. රුවන් මුදුන් මල් කඩින් සැරසුනාහ. නුඹ ලොමු දැහැගැනුම් ස්වභාව ඇති

මහත් ආනුභාව ඇත්තෙහිය. තමාගේ පිට මස් තෙමේම කන්නෙහිය.

4. "කයින් වචනින් මනසින් කිනම් දුශ්චරිතයක් කරණ ලදද, කිනම් අකුශල කර්මයක්හුගේ විපාක හෙතුවකින් තමාගේ පිට මස් තෙමේම කඩාගෙන කන්නෙහිද?"

5. "මම මිනිස් ලොවදී කේලාම් හා බොරු කීමෙන්ද කෛරාටික කමින් හා වංචාවෙන්ද තමහට අවැඩ පිණිස හැසුරුනෙමි.

6. "එහිදී මම පිරිස් මැදට ගොස් හැබෑ කියන්ට යුතු කාලය පැමිණ සිටි කල්හි වැඩ ඇති කාරණය හැරදමා අධර්මය අනුව පැවතුනෙමි.

7. "යම්සේ මම අද තමාගේ පිට මස් කම්ද යමෙක් තෙම අනුන් පිට මස් කන්නේ (නැති තැන නින්දා කරන්නේවේද) එතෙම මෙසේම කයි."

35. "ධාතු විවර්ණක ප්‍රේතයාගේ කථාව:- 1. "දුගඳවූ තෝ අහසෙහි සිටිනේ කුණු ගඳ හමන්නෙහිය. තාගේ කුණු ගඳ ඇති කටද පණුවෝ කත්. පූර්ව ජාතියෙහි කිනම් අකුශල කර්මයක් කෙළෙහිද?

2. "ඉක්බිති ආයුධයක් ගෙන නැවත නැවත කපත්. කාරම් ජලයෙන් තවරා නැවත නැවතත් කපත්.

3. "(මෙය 6 කථාවේ 5 ඡෙදය මෙනි.)

4. "නිදුකාණෙනි, මම රම්‍යවූ සිත් කළුවූ ගිරිබ්බජ නම්වූ රජගහ නුවර ඉතා බොහෝවූ ධන ධාන්‍යයට හිමියෙක් වීමි.

5. "මෝතොමෝ ඒ මාගේ පෙර ආත්මයෙහි බිරින්ද විය. මෝතොමෝ දියණි විය. මෑ යෙහෙළි විය. මල් ද උපුල් ද අලුත් වූ විලවුන් ද චෛත්‍ය පූජාවට හැරගෙන යන ඇලා මම වැලැක්වීමි. මා විසින් ඒ පාපය කරණ ලදී.

6. "සයානූ දහසක් පමණ වූ අපි චෛත්‍ය පූජාවට නුගුණ කියා වෙන් වෙන් වශයෙන් අතිශයින් ප්‍රේත ලොකයෙහි පැසෙමු.

7. "අර්හත්වූ බුදුන්ගේ චෛත්‍ය පූජාව පිළිබඳ උත්සවය පවත්නා කල්හි යමෙක් දොස් කියත්ද, ඔවුන් ඒ පිනින් බැහැරයයි දනිව්.

8. "දිවමල් දරන්නාවූ සැරසුනාවූ පුෂ්ප පූජා ඵලය වළඳන්නාවූ සම්පතකින් පිරි පිරිවර ඇතිව එන්නාවූ ඒ මේ දිව්‍ය ස්ත්‍රීන්ද බලව.

9. "ආශ්චර්යවූ අද්භූතවූ ලොමු දැහැගන්නාවූ ඒ විපාක දැක නුවණැත්තෝ ඒ මහා මුනිවූ තථාගතයන් නමස්කාර කරත්.

10. "එසේමැයි ඒ මම මෙයින් ගොස් මිනිසත් බව ලබාගෙන ප්‍රමාද නොවී නැවත නැවත චෛත්‍ය පූජාව කරන්නෙමි."

(තුන්වෙනි චුල්ල වර්ගය නිමි.)

## 4. මහා වර්ගය.

36. අම්බසක්ඛර ප්‍රේතයාගේ කථාව:- 1. වැදෑ රජුන්ගේ වෙසාලී නම්වූ නුවරක් ඇත්තේය. එහි අම්බසක්ඛර නම් වූ ලිච්ඡවී රජෙක් විය. ප්‍රේතයෙක් කී කාරණය දැනගනු කැමැත්තේ නුවරින් පිටත සිටි ප්‍රෙතයකු දැක එතනදීම ඔහු විචාළේය.

2. "මොහුට නිදීමක්ද හිඳීමක්ද නැත. ඉදිරි ගමනක් හෝ පසු ගමනක් හෝ නැත. ආහාරයක්ද පීමක්ද කඩා කෑමක්ද, වස්ත්‍ර පරිභොගයක්ද ඉඳුරන් හැසිරවීමේ ආශාවක්ද නැත.

3. "මොහුට පෙර අනුකම්පා ඇත්තා වූ යම් ඤාතීහුද දැක ඇසූ යම් මිත්‍රයෝත් වූවාහුද ඔව්හු තුමූ දැන් ඔහු දක්නට වත් නොලබත්. ඒ ජනයා විසින් හැර දමනලද ආත්මභාව ඇත්තේය.

4. "මළ අයට මිත්‍රයෝ නොවෙත්. මිත්‍රයෝ වස්තු විනාශයට පත් පුරුෂයා අතහැර දමත්. ධනය දැක මිත්‍රයෝ පිරිවරත්. සම්පත් ඇත්තාහට බොහෝවූම මිත්‍රයෝ වෙත්.

5. "සියලු උපභොග පරිභොග වස්තුවෙන් පිරිහුනු ස්වභාව ඇති දුක්පත්වූ ලෙයින් වැකුණ ශරීරය ඇත්තාවූ ඇතුළත පැලුන ශරීර ඇත්තේ තණ අග රැඳුනාවූ පිණිබිඳ මෙන් අද හෝ හෙට හෝ ජීවිතයාගේ නිරුද්ධය වෙයි.

6. "පින්වත්, යක්ෂය, මෙබඳුවූ ඉතාමත් දුකට පත්වූ කොසඹ හුලෙහි නංවන ලද්දහුට යලි පින්වත ජීවත්වෙව, ජීවිතයම ශ්‍රෙෂ්ඨයයි කවරකරුණකින් නුඹ කියන්නෙහිද?"

7. "පින්වත් රජ මේ පුරුෂතෙම මගේ සහලේ නෑයෙක් විය. "මම පූර්ව ජාතිය සිහි කරමි. දැකම ලාමක ස්වභාව ඇති මේ පුරුෂතෙම නරකයෙහි නොවැටේවායි, මට කරුණා සිතක් විය.

8. "පින්වත් ලිච්ඡවී රජ නැමති පව්කම් කළා වූ මේ පුරුෂ තෙම මෙයින් චුතව ජනයන්ගෙන් උත්සන්නවූ දරුණු ස්වභාව ඇති මහත් දුක් ඇති මහත් සන්තාප ඇති කටුකවූ බිය උපදවන්නාවූ මහා නරකයෙහි උපදී.

9. "මේ තෙම ඒකාන්තයෙන්ම දුක් වූ අයහපත් වූ භයජනකවූ ඒකාන්තයෙන්ම තියුණු දුක් ඇති මහා නරකයෙහි නොවැටේවා. ඒ මහා නිරයට වඩා මේ හුලම නොයෙක් කොටස් වූ අනුසසින් උතුම් වෙයි.

10. "මේ තෙම මාගේ මේ වචනය අසා නිරා දුකට පමුණු වන ලද්දෙකු සේ ප්‍රාණය හැර ලන්නේය. එහෙයින් ජීවිතයාගේ නිරොධය මා විසින් කරණ ලද්දේ නොවේවායි මම ඔහු සමීපයෙහිදී නොකියමි.

11. "පුරුෂයා පිළිබඳ මේ කාරණය මා විසින් දැනගන්නා ලදී. ඉදින් තෝ අපට අවකාශ දෙන්නෙහි නම් අනිකක්ද විචාරන්ට කැමැත්තෙමු. එයත් විචාරමි. අපට නොකිපිය යුතුයි."

12. "එහිදී එකාන්තයෙන් මාගේ ප්‍රතිඥාව විය. අප්‍රසන්නයාහට නොකීම වෙයි. අකමැත්තෙන් ඇදහිය යුතු වචන ඇත්තෙකැයි කියා කැමති පරිද්දෙන් මා විචාරව. යම්සේ ඉවසිය හැකිනම් කියමි."

13. "යක්ෂය, මම යම් කිසිවක් ඇසින් දක්නෙම්ද, මම ඒ සියල්ල එසේම අදහන්නෙමි. එය දැක ඉදින් නොම අදහන්නෙම් නම් මට නිග්‍රහ කරව."

14. "යුෂ්මතාගේ මේ ප්‍රතිඥාතොමෝ මට සැබෑවේවා දැනගනු කැමැත්තේ කොපවූ සිත් නැත්තේ මවිසින් කියනු ලබන ධර්මය අසා යහපත් ප්‍රසාදය ලබව, නුඹ විසින් අසන ලද්දාවූ යම් ධර්මයක් වේද යම්සේ අන්‍යයාත් දන්නේ වේද, යම්සේ මා විසින් දන්නා ලදද සියල්ල මම කියන්නෙමි.

15. "අලංකෘතවූ ශ්වෙත වර්ණවූ අශ්ව යානාවකින් හුල උන්නහුගේ හමුවට පැමිණෙහිය. මේ යහන අද්භූතය දැකුම් කළුය. මේ කිනම් කර්මයක්හුගේ විපාකයවේද?"

16. "වේසාලී නම් ඒ නගරයාගේ මැද මඩයුත් මාර්ගයෙහි වළක් විය. මම පහන් සිත් ඇතිව සුදුවූ එක් ගව හිසක් ගෙන මඩ වලෙහි බහාලීමි.

17. "මේ මත්තෙහි අපිද සෙස්සෝද පාදයන් තබා ගමන් කෙළෙමු මේ යහන අද්භූතය දැකුම් කළුය. ඒ කර්මයාගේ මේ විපාකය වෙයි."

18. "යක්ෂය, තොපගේ ශරීර වර්ණය සියළු දිසාවන් බබුළුවයි. යුෂ්මතාගේ ශරීරගන්ධයද සියලු දිශා හමයි. ඍද්ධියට පැමිණියේ මහත් ආනුභාව ඇත්තෙහිය. යලි නග්නයෙක් වෙහිය. කවර කර්මයක්හුගේ මේ විපාකයවේද?"

19. "ක්‍රොධ නැත්තාවූ නිති පහන් සිත් ඇතිව සිලුටු වචනයෙන් ජනයා කථාකරමි. ඒ කුශලකර්මයාගේම මේ විපාකය වෙයි. මාගේ දිව්‍යමයවූ ශරීර වර්ණය නිතර බළලයි.

20. "පැහැදුන සිත් ඇති මම ධර්මයෙහි සිටියවුන්ගේ ඓශ්චර්යයද, ගුණකීර්තිය දැක, ගුණකීර්තිනයද කරමි. ඒ කුශල කර්මයාගේම මේ විපාකය වෙයි. මාගේ දිව්‍යමයවූ ශරීර ගන්ධය නිතර හමයි.

21. "ක්‍රීඩාව ප්‍රයෝජනකොට ඇත්තේ සිනා අදහස් ඇතිව දුෂ්ට සිත් නැතිව තොටෙහි ජලස්නානය කරන්නාවූ යහළුවන්ගේ

ගොඩ තිබුණු වස්ත්‍රයක් ගෙන සැඟවීමි. ඒ හේතුවෙන් නග්නවූයෙමි දුක් පැමිනීමද ඇතිවිය."

**22.** "යමෙක්තෙම ක්‍රීඩා අදහස් ඇතිව පවක් කෙරේද ඕහට මෙබඳුවූ කර්ම විපාකය කියත්. යමෙක් වනාහි ක්‍රීඩා අදහස් නැතිව ලොභාදියෙන් දූෂිතවූ සිත් ඇතිව පව් කෙරේද ඒ අකුශල කර්මයාගේ කොපමණ විපාකයක් කියත්ද?"

**23.** "යම් මනුෂ්‍යයෝ දූෂිත මනොවිතර්ක ඇත්තාහු කයින්ද වචනයෙන්ද කිලුටුවූවෝ වෙත්ද, ඔව්හු තුමූ ශරීරයාගේ බිඳීමෙන් පරලොවදී නිසැකව නරකයට පැමිණෙත්.

**24.** "සමහරු වනාහි සුගතිය බලාපොරොත්තු වෙමින් දන්දීමෙහි ඇලුනෝ පිළිකුල් වශයෙන් සලකන ආත්මභාව ඇත්තාහුද, ඔව්හු තුමූ කය බිඳීමෙන් පරලොවදී නිසැකව සුගතියට පැමිණෙත්.

**25.** "කුශලාකුශල කර්මයාගේ මේ විපාකය කියනලදී. ඒ කොයිප්‍රකාරදැයි කියා මම දැන අදහන්නෙම්ද මම කෙබන්දෙක් වනාහි දැක අදහන්නෙම්ද නැවත කවර පණ්ඩිතයෙක් මට මේ කරුණ විශ්වාස කරවන්නේද?"

**26.** "කුශලාකුශල කර්මයාගේ මේ විපාකයයි දැකද ධර්මය අසාද අදහාගණුව කුශලාකුශල යන දෙවැදෑරුම් කර්මය අවිද්‍යමානකල්හි සත්වයෝ සුගතියට ගියෝය. දුගතියට ගියෝ හෝ වෙතැයි යන කරුණ කෙසේ වන්නේද?

**27.** "මේ මිනිස් ලොවද මනුෂ්‍යයෝ කුශලාකුශල කර්මයන් නොකරන්නාහු නම් සුගතියට ගියාවූ හෝ දුගතියට ගියාවූ හෝ සත්වයෝ නොවන්නාහ. මිනිස් ලොව හීන ප්‍රණීතයෝත් නොවන්නාහ.

**28.** "යම්හෙයකිනුත් මිනිස් ලොවදී මනුෂ්‍යයෝ කුශලාකුශල කර්මයන් කෙරෙත්ද, එහෙයින් සුගතියට ගියාවූ හෝ දුගතියට ගියාවූ හෝ මිනිස් ලොව හීන ප්‍රණීතබවද වන්නේය.

**29.** "සැපයාගේද දුඃඛයාගේද මිදීමට සුදුසුවූ කර්මයන්ගේ දෙවැදෑරුම් විපාකය දැන් කියත්. ඒ දෙවියෝ ඉඳුරන් හසුරුවත්. අඥාණයෝ ඒ දෙක නොදක්නාහු නිරයාදී දුකට පැමිණෙත්

**30.** "තමා විසින් පෙර කරණලද්දාවූ කුශලකර්මයෝ මට නැත්තාහුද, යලි වස්ත්‍රද සෙනසුන්ද ආහාරපානද දී පින් ලබන්නේද, එබන්දෙකුත් මට නැද්ද, ඒ හෙතුවෙන් නග්නවූයේ වෙමි දුක් පැවතුම්ද ඇත්තේවිය."

**31.** "ප්‍රෙතය, යම් කරුණකින් හෝ වස්ත්‍ර ලබන්නෙහිද කිසිකරුණක් වන්නේද, ඉදින් කාරණයක් ඇත්නම් ඇදහිය යුතුවූ මෙය මට කියව හෙතු සහිත වචනය අසමි."

**32.** "මේ සමීපයෙහි ධ්‍යාන කරණසුළු සිල්වත් අර්හත්වූ ක්ලේශයන්ගෙන් මිදුනාවූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූ රක්ෂා කරණලද ප්‍රාතිමොක්ෂ සංවර ශීලය ඇති සිහිල් වූ අග්‍රඵලයට පැමිණියාවූ කප්පින නම් වූ භික්ෂු නමක් ඇත.

**33.** "මෘදුවූ දාන ශීලීවූ යහපත් වචන ඇත්තාවූ යහපත් මුහුණ ඇති මනාව දත් ආගම ධර්මය ඇති පමණ දැන කථාකරන්නාවූ පින්කෙත්වූ මෛත්‍රී විහරණ ඇති දෙවිමිනිසුන්ට දක්ෂිණාර්හවූ කප්පිනක නම් භික්ෂුනමක් ඇත.

**34.** "සන්සුන් කෙලෙස් ඇති පහවූ මිථ්‍යා විතර්ක දුම් ඇති නිදුක් වූ ආශා රහිතවූ සර්වභවයෙන් මිදුනා වූ පහකරණ ලද රාගාදී හුල් ඇති අහංකාර රහිතවූ අවංකවූ කෙලෙස් නැත්තාවූ ක්ෂය කරණලද සියලු ප්‍රපඤ්ච ඇති ත්‍රිවිද්‍යාවට පැමිණියාවූ ඥාණයෙන් දීප්තිමත්වූ කප්පිනක නම් භික්ෂු නමක් ඇත.

**35.** "ප්‍රකටනොවූ දැකද සුවසේ නොදතහැක්කාවූ කප්පිනක නම් වූ භික්ෂුනමක් ඇත. වජ්ජීන් අතර උන්වහන්සේට දන්නෙකැයි ව්‍යවහාර කරත්. ලෝකයෙහි යක්ෂ භූතයෝද තෘෂ්ණා රහිතවූ සුන්දර ශීලාදී ගුණවත්වූ ඒ භික්ෂුව දනිත් ගුණකියා හැසිරෙත්.

**36.** "තෝ උන්වහන්සේට එක වස්ත්‍ර යුග්මයක් හෝ වස්ත්‍ර යුග්ම දෙකක් හෝ මා උදෙසා ඉදින් දෙන්නෙහි නම් ඒ වස්ත්‍රයෝ පිළිගන්නාලද්දෝ වන්නාහුනම් වස්ත්‍රයෙන් කළ සැට්ට ඇති හැඳ පෙරවූ වස්ත්‍ර ඇති මාද දන්නෙහිය.

37. "කවර පෙදෙසක වසන්නාවූ ශ්‍රමණයන් වහන්සේ අපි දැන් ගොස් දක්නෙමුද? ඒ කවරෙක් තෙම අද සැකයද ඒ විචිකිත්සාවද දෘෂ්ටි නමැති කටුද, පහකරන්නේද?"

38. "කපිනච්චනා ප්‍රදෙශයෙහි හුන්නාවූ සත්‍ය නාම ඇති ආශ්චර්යවූ ස්වකීය කෘත්‍යයෙහි අප්‍රමත්තවූ මේ කප්පිනක භික්ෂුතෙම බොහෝ දෙවියන් විසින් පිරිවරණලදුව දැහැමි කථා දැන් කියයි."

39. "මම එසේ කරන්නෙමි. දැන් ශ්‍රමණයන් වෙත ගොස් වස්ත්‍ර යුග්මයකින් හන්දවන්නෙමි. ඒ වස්ත්‍රයෝ පිළිගන්නා ලද්දෝ වන්නාහු නම් වස්ත්‍රයෙන් සැරසුනාවූ නුඹද දක්නෙමු."

40. "පින්වත් ලිච්ඡවි රජ නොකල්හි පැවිද්දෙකු වෙත නොපැමිණේවායි ආයාචනා කරමි. යුෂ්මතුන්ගේ මේ ධර්මය නොවේ. එහෙයින්ම සුදුසු කල්හි ඒ තන්හිම රහසිව හුන් භික්ෂුව බලව."

41. ඒ ලිච්ඡවී රජතෙම එසේයයි කියා දාස සමූහයා විසින් පිරිවරණලදුව එහි ගියේය. ඒ නුවරට පැමිණ සිය නිවසෙහි විසීමට පැමිණියේය.

42. ලිච්ඡවී රජතෙම ඉක්බිති සුදුසු කාලයෙහි ගෘහ කෘත්‍යයන්කොට ජලස්නානය කොට කා බී යහපත් කාලය ලැබ පරීක්ෂාකොට පෙට්ටියෙන් වස්ත්‍ර යුග්ම අටක් ගෙන්වීය.

43. ඒ රජතෙම ඒ පෙදෙසට පැමිණ සන්හුන් සිත් ඇති පිණ්ඩපාතයෙන් පෙරලා වැඩමවූ නැවතුනාවූ සිහිල්වූ රුක් මුල වැඩහුන්නාවූ ඒ ශ්‍රමණයන් වහන්සේ දුටුවේය.

44. ඔහු වෙත පැමිණ නිරෝගිබවද පහසු විහරණයද විචාළේය. "ස්වාමීනි, මම විශාලාමහනුවර ලිච්ඡවී රජවෙමි." "අම්බසක්ඛර නම් වූ ලිච්ඡවී රජයයි මා දනිත් යයි" කීයේය.

45. "ස්වාමීනි, මාගේ යහපත්වූ මේ වස්ත්‍ර යුග්ම අට පිළිගනු මැනව ඔබවහන්සේට දෙමි. යම්සේ මම සතුටු සිත් ඇතිවන්නෙම්ද, ඒ කරුණෙන්ම මෙතනට පැමිණියෙමි."

46. "ශ්‍රමණයෝද බ්‍රාහ්මණයෝද යුෂ්මතාගේ නිවස දුරින්ම දුරුකරත්. නුඹගේ ගෘහ සමීපයෙහිදී පාත්‍රයන් බිඳිත්. නැවත සඟල සිවුරුද ඉරාදමත්.

47. "නැවත පා නැමැති කෙටේරිවලින් සමහර ශ්‍රමණයන් හිස යටිකුරුව හෙළත්. තා විසින් කරණලද මෙබඳුවූ වෙහෙසට පැමිදිවූ ශ්‍රමණයෝ පැමිණෙත්.

48. "තෝ තණ අගින් තෙල් බිඳක් වත් නුදුන්නෙහිය මුළාවූවහුට මාර්ගයවත් නොකීයෙහිය. අන්ධයාගේ දණ්ඩ තෙමේ හැරගත්තෙහිය, මෙබඳුවූ තද මසුරුවූ නොහික්මුනාවූ තෝ නැවත කවර ගුණයකින් කුමක් දැක අප සමග සංභොග කෙරෙහිද?"

49. "ස්වාමීනි, නුඹ වහන්සේ යමක් කියන සේක්ද, එය මම පිළිගනිමි. ක්‍රීඩා අදහස් ඇතිව දූෂිතවූ සිත් නැතිව ශ්‍රමණයන්ටද බමුණන්ටද වෙහෙස කෙළෙමි. ස්වාමීනි, මෙයද මා හට පව්ද වෙයි.

50. "ක්‍රීඩා සිතින් පව්කම් රැස්කොට ප්‍රෙතයෙක් තෙම අසම්පූර්ණ භොග ඇති යෞවනයෙන් යුක්තවූ තරුණයෙක් වූයේ නග්න භාවයට හිමිවී, දුකවිඳියි ඊට වඩා අතිශයින් දුකක් මොහුට කෙසේ නම් වේද?

51. "ස්වාමීනි, ඔහු දැක සංවේගවීමි. ඒ හෙතුවෙන් මම නුඹ වහන්සේට වස්ත්‍ර දානය දෙමි. ස්වාමීනි වස්ත්‍ර යුග්ම අට පිළිගනු මැනව. මේ පින් ප්‍රෙතයාට පැමිණෙත්වා."

52. "දන්දීම් නොයෙක් ප්‍රකාරයෙන් ඒකාන්තයෙන් පසස්නා ලදී. දෙන්නාවූද නුඹට ක්ෂය නොවන ස්වභාව ඇති වේවා. නුඹගේ වස්ත්‍ර යුග්ම අට පිළිගනිමි. ප්‍රෙතයාට මේ දක්ෂිණාවෝ පැමිණෙත්වා."

53. "ඒ ලිච්ඡවී රජතෙමේ ඉන්පසු මුවසෝදාගත තෙරණුවන්ට වස්ත්‍ර යුග්ම අටදී ඒ වස්ත්‍රයෝද පිළිගන්නා ලද්දෝද වෙත්වා, වස්ත්‍රයෙන් සැරසුනාවූ ප්‍රෙතයාද දකීවා."

**54.** සඳුන් සුනු ගල්වන ලද්දාවූ ආජානෙය අසු පිටට නැංගාවූ උතුම් රූ ඇති මනාකොට හැඳගත් වස්ත්‍ර ඇතිව සැරසුනාවූ ජනයා විසින් පිරිවරණ ලද්දාවූ මහත් යක්ෂ ඍද්ධියෙන් පැමිණියාවූ ඔහු දුටුවේය.

**55.** ඒ ලිච්ඡවී රජතෙම ඔහු දැක සතුටු සිත් ඇතිව ඔද වැඩිසිත් ඇතිව තුටු පහටු සිත් ඇතිව අතිශය භාග්‍ය සම්පන්න ශරීර ඇතිව සාංදෘෂ්ටිකවූ කර්මයද මහත් කර්මවිපාකයද සියැසින් ප්‍රත්‍යක්ෂ කොට දැක.

**56.** ඔහු වෙත පැමිණ මෙය කීයේය. "මහණ බමුණන්ට දානය දෙන්නෙමි. මාගේ දන් නොදිය යුතුවූ කිසි වස්තුවක් නැත්තේය. යක්ෂය තෝද මට බොහෝ උපකාරවූයෙහිය."

**57.** "ලිච්ඡවිය, නුඹද මට එක් කොටසක්වූ වස්ත්‍ර දානය දුන්නේය. මේ දානය හිස් නොවෙයි අමනුෂ්‍යවූ ඒ මම මනුෂ්‍යවූ නුඹ සමගම සාක්ෂි කරන්නෙමි.

**58.** "යක්ෂය, මට යහපත් ගති ඇත්තෙක්ද නෑයෙක්ද පිහිටක්ද මිත්‍රයෙක්ද වෙහිය. නැවත දෙවියෙක් වෙහිය. මම ඇඳිලි බැඳ යාච්ඤා කරමි. නුඹ නැවතත් දැකීමට කැමැත්තෙමි.

**59.** "ඉදින් තෝ අශ්‍රද්ධාවත් වන්නෙහි නම් තද මසුරු ස්වභාව ඇත්තෙහි නම් මිථ්‍යා ප්‍රතිපන්න සිත් ඇති වන්නෙහි නම් ඒ හෙතුවෙන්ම මා දැකීමට නොලබන්නෙහිය. නුඹ දැකද කථාද නොකරන්නෙමි.

**60.** "ඉදින් තෝ කුශල ධර්මයෙහි ගෞරව ඇත්තේ වන්නෙහි නම් දන්දීමෙහි ඇලුනේවී නම් ශරීරයෙහි ආදීනව සලකන්නේ වීනම් මහණ බමුණන්ට පැන් සැළක් මෙන් වන්නෙහි නම් මෙසේ ඇති කල්හි මා දක්නට ලබන්නෙහිය.

**61.** "නුඹ දැකද කථාකරන්නෙමි. යුෂ්මතාට යහපතක් වේවා යමකු නිමිති කොට සාක්ෂි කෙළෙමුද හුල සිටි පුරුෂයා වෙත යාම හෙතුකොටයයි සිතමු. මේ පුරුෂයා ද හුලෙන් වහාමුදව,

62. "ඒ අපි එකිනෙකා ශාක්ෂි කෙළෙමුද හුල හිදින මේ තෙමේද වහා මිදුනේවී නම් හෙතෙම සකස් කොට කුශල ධර්මයන් මනාසේ කරමින් ඒ නිරාදුකිනුත් මිදෙන්නේය.

63. "අන් තැනෙක වින්ද යුතුවූ අකුශල කර්මයක් වන්නේය. ඔහු හා සමගම සුදුසු කාලයෙහි කප්පිනක තෙරුන් වෙත පැමිණ හිඳ දාන සංවිභාගකොට ස්වමුඛයෙන්ම විචාරව.

64. "හෙතෙම නුඹට මේ කරුණ කියන්නේය. ඒ භික්ෂුව මෙතෙම පැමිණ දැනගනු කැමැත්තේ දූෂිත නොවූ සිත් ඇතිව විචාරව. බහුශ්‍රැතවූ හෙතෙම යුෂ්මතා විසින් අසන ලද්දාවූද නැවත නොඅසන ලද්දාවූද සියලු කුශල ධර්මය දත් පරිද්දෙන් කියන්නේය. සුගති ගාමීවූ ධර්මය කියන්නේය."

65. ඒ රජතෙම එහිදී අමනුෂ්‍යයා සමග රහසින් කථා කොට ශාක්ෂිකොට ගෙන ලිච්ඡවීන්ගේ සමීපයට ගියේය. නැවත ඒ ලිච්ඡවී රජතෙම රැස්ව හුන්නාවූ පිරිසට මෙසේ කීයේය.

66. (i) "පින්වතුනි, මාගේ එක වචනයක් අසත්වා වරයක් යදින්නෙමි. කැමතිවන ලද අර්ථය ලබන්නෙමි. (ii) රෞද්‍රක්‍රියා ඇති කරණලද ශරීර දඬුවම් ඇති හුල තිබූ පුරුෂ තෙම රජු කෙරෙහි ඇලුන ස්වභාව ඇත්තේය. යම් දිනක පටන් හුල හිඳුවන ලද්දේද මේ තාක් විසි රැයක් පමණ විය. නොම ජීවත් වෙයි. මළේද නොවේ,

67. "මම ඔහු දැන් මුදවන්නෙමි. සමූහයා කැමති පරිද්දෙන් අනු දනීවා, මොහුද අනිකාද වහා මුදනු මැනව. එසේ කරන්නාවූ ඔබට කවරෙක් නම් නොකරවයි කියන්නේද, යම් සේ දන්නෙහිද එසේ කරණු මැනව. රුචි පරිද්දෙන් සමූහයා අනුදනී.

68. ඒ රජතෙම ඒ පෙදෙසට පැමිණ හුල සිටි පුරුෂයා වහා මිදවීය. "යහළුව, බිය නොවෙවයි කියාද ඔහුට කීයේය" වෙදුන්ද එළවා තැබීය.

69. කරුණු දැනගනු කැමතිවූ ලිච්ඡවී රජතෙම සුදුසු කාලයෙහි ඔහු හා සමග කප්පිනක තෙරණුවන් වෙත පැමිණ දාන සංවිභාගකොට ඉදිරියෙහි හිඳ එසේම උන්වහන්සේ අතින් විචාළේය.

70. "(මේ කථාවේ 66 යේ (ii) ඡේදය මෙනි)

71. "ස්වාමීනි, මා විසින් ගොස් දැන් ඒ පුරුෂ තෙමේ මුදවන ලදී. මේ යක්ෂයාගේ වචනමැයි. යම් හේතුවකින් හෙතෙම නරකයට නොයන්නේද, කිසියම් කරුණක් වන්නේද?

72. "ස්වාමීනි ඉදින් කරුණක් ඇත්තේ නම් කියනු මැනවි. ඇදහිය යුතුවූ හෙතු යුක්ත වචනය අසමු. මෙහිදී කළ ඒ කර්මයාගේ විපාකය නොවිඳ වැනසීමක්ද ගෙවීමක්ද නැද්ද?"

73. "ඉදින් හෙතෙම කුශල කර්මයෙහි මනාව හැසිරෙන්නේ නම් සකස්කොට දිවා රාත්‍රි දෙක්හි අප්‍රමාද වන්නේනම් හෙතෙම ඒ නිරා දුකින් මිදෙන්නේය. අකුශල කර්මය අන් තැනකදී වින්ද යුතු වන්නේය."

74. "ස්වාමීනි, ඒ පුරුෂයාගේ මේ අර්ථය දැනගන්නා ලදින් දැන් මටද අනුකම්පා කළ මැනව බොහෝ නුවණැතියන් වහන්ස, යම්සේ මම නිරයට නොයන්නෙම්ද, එසේ මට අනුශාසනා කරණු මැනව. අවවාද කරණු මැනව."

75. "පහන් සිත් ඇතිව අදම බුදුන්ද, ධර්මයද, ආර්ය සංඝයාද, පිහිට කොට යන්න. එසේම ශික්ෂාව, පිළිබඳවූ පද පසද කඩනොකොට සමාදන් වෙව.

76. "ප්‍රාණඝාතයෙන් වහා වෙන්වෙව. ලොකයෙහි නුදුන්දෙය දුරුකරව. මත්පැන් බොන්නෙක් නොවව. බොරු නොකියව. ස්වකීය භාර්යාව සමග සතුටු වෙව. නිරවද්‍යවූ සැපවිපාකවූ, ආර්යවූ මේ උත්තම අෂ්ටාංගයෙන් යුක්තවූ උපොසථ ශීලයද, සමාදන්වෙව.

77 - 78. "සිවුරුද, පිණ්ඩපාතද, ගිලන්පසද, බොහෝ පිරිකරද, සෙනාසනද, ආහාරද, පානවර්ගද, කැයුතුදැද, වස්ත්‍ර හා සෙනසුන්ද, විශෙෂයෙන් ප්‍රසන්න සිතින් යුක්තව ඍජුව පිළිපන්නවුන් විෂයෙහි දෙව, සිල්වත්වූ පහකළ රාග ඇති බහුශ්‍රැතවූ භික්ෂූන්ද, ආහාර පානවර්ගයෙන් සතප්පව, සෑම කල්හි පින් වැඩෙයි.

79. "මෙසේම කුශල කර්මයන් මනාව කරමින් සකස්ව රෑ දාවල් අප්‍රමාදවූවාහු තෝ ඒ නිරා දුකින් මිදෙව. අකුශල කර්මය අන්තැනකදී වින්ද යුතු වන්නේය.

80, 81, 82. "(මේ කථාවේම 75, 76, 77 ඡෙද මෙනි.)

83. "බුදුන්ගේ සස්නෙහි ඇලුනාවූ සිල්වත්වූ, බහුශ්‍රැතවූ රහත්වූ භික්ෂූන්ටද දෙමි. සිව්පසය දීම කඩ නොකරමි."

84. මෙබඳුවූ අම්බසක්ඛර නම් ලිච්ඡවී රජතෙම එකල්හි විසාලා මහනුවර ශ්‍රද්ධාවත්වූ, මෘදු සිත් ඇති එක්තරා උපාසකයෙක් විය. උපකාරකාරී වූයේ භික්ෂුසංඝයාටද, සකස් කොට උපස්ථාන කෙළේය.

85. හුල හුන් පුරුෂයාද, නිරොගීව නිදහස්ව, හැසිරෙන්නේ සුවපත්වූයේ උතුම් කප්පිනක නම් වූ භික්ෂුව වෙත අවුත් පැවිද්දට පැමිණියේය. දෙදෙනම පැවිදිවීමේ ඵලයන්ට පැමිණියාහුය.

86. සත්පුරුෂයන්ගේ ආශ්‍රය කරුණු දත්තාවූ, සත්පුරුෂයන්ට මෙබඳුවූ මහත් ආනිසංස ඇතිවෙයි. හුල සිටි පුරුෂතෙමේ අර්හත්ඵලයද, අම්බසක්ඛර තෙමේ වනාහි සොවාන් ඵලයද, ලැබුයේය."

37. **සෙරිස්සක ප්‍රෙත කථාවː-** (මෙය විමාන වස්තුවේ 84 සෙරිස්සක විමාන කථාව මෙනි.)

38. **නන්දක ප්‍රෙත කථාවː-** 1. සුරට්ඨ දෙශයට අධිපතිවූ පිංගල නම් රජෙක් විය. මොරිය රජුන්ට උපස්ථානයට ගොස් සුරට්ඨ දෙශයට ආපසු පැමිණියේය.

2. රජතෙම මධ්‍යාහ්ණයෙහිවූ උෂ්ණ කාලයෙහි මගට පැමිණියේය. මොලොක් බිම ඇති සිත් කලුවූ ප්‍රෙතයා විසින් මවනලද මාර්ගය දුටුයේය.

3. රජතෙම රියැදුරා ඇමතුවේය "රියැදුර, මේ මග සිත්කලුය, නිර්භයය, යහපත ගෙනදෙයි. උවදුරු රහිතය. මේ මගින් යව, මේ ගමනින් සුරට්ඨදෙශය සමීපයෙහි වෙමු."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. සුරට්ඨ රජතෙම සිවුරඟ සෙනඟ සමගින් ඒ මගින් ගියේය. තැතිගත් ස්වභාවය ඇති පුරුෂයෙක් සුරට්ඨ දෙශාධිපතියාට මෙය කීයේය.

5. "භයජනකවූ ලොමුදැහැගත්තාවූ නපුරු මගකට පිවිසියේ වෙමු. ඉදිරියෙහි මාර්ගය දක්නා ලැබේ. පස්සෙන් නොදක්නා ලැබේමය.

6. "ප්‍රෙතයන්ගේ සමීපයෙහිවූ නපුරු මගට පිවිසියෝ වෙමු. ප්‍රෙතයන් පිළිබඳ ගඳ හමයි. දරුණුවූ ශබ්දය ඇසෙයි"

7. කළකිරුණු සුරට්ඨාධිපති රජතෙම රියැදුරුට මෙය කීය. "භයජනක ලොමු දැහැගත්තාවූ නපුරු මගකට පැමිණියෝ වෙමු. ඉදිරියෙහි මග පෙනේ. පසුමග නොපෙනේ.

8. "ප්‍රෙතයන්ගේ සමීපයෙහිවූ නපුරු මගට පැමිණියෝ වෙමු. ප්‍රෙතයන් පිළිබඳ ගඳ හමයි. දරුණු හඬ ඇසෙයි."

9. ඇත් කඳට නැගී සිවු දිග බලන්නේ සිත්කලුවූ සෙවනින් යුක්තවූ නිල්වන් වලාකුල් සමාන සොභාමත් නුගරුකක් දුටුයේය.

10. රජතෙම රියැදුරා ඇමතුයේය. "මහත්වූ නිල් වලාකුලක් බඳු නිල්පාටට මහත්ව පේන මෙය කුමක්ද?"

11. "මහරජ්ජුරුවෙනි, සෙවනින් යුත් නිල්වලාකුලකට සමාන (කළු) වැසිවලාකුලක් වැනි එය නුගරුකෙක."

12. සුරට්ඨාධිපති රජතෙම මහත්වූ නිල්වලාකුල් බඳු කළුපාට ඒ රුක යම් තැනෙක්හි දක්නා ලැබේද ඒ දෙසට පිටත්ව ගියේය.

13. රජතෙම ඇත් කඳින් බැස රුක වෙත පැමිණියේය. ඇමතියන් පිරිවර ජනයා සහිතවූ (රජතෙම) රුක් මුල හුන්නේය.

14. පැනින් පිරුණාවූ බඳුනක්ද, සතුට උපදවන මිහිරි කැවුම්ද දුටුවේය. දිව්‍ය වර්ණ ඇති සියලු අබරණින් සැරසුනාවූ පුරුෂයෙක්ද සුරට්ඨ දෙශයට අධිපති රජුවෙත පැමිණ මෙය කීයේය.

15. "මහරජ නුඹගේ ගමන නපුරු ගමනක් නොවෙයි. නුඹගේ පැමිණීම යහපත් පැමිණීමක් වෙයි. රජතෙම පැන්

පානය කෙරේවා සතුරන් දමනය කරන සුලු රජ කැවුම් වළඳනු මැනවි."

16. ඇමතියන් සහිත පිරිවර ජනයා සහිතවූ සුරට්ඨ අධිපති රජතෙම නා කැවුම් කා පැන් බී මෙය මෙසේ කීයේය.

17. "නුඹ දෙවියෙක් වෙහිද? ගන්ධර්වයෙක්ද, නොහොත් පුරින්දද නම් වූ ශක්‍රයා වෙහිද, නොදන්නාවූ අපි නුඹ විචාරමු ඔබ කෙසේ දනිමුද?"

18. "මහරජ මම දෙවියෙක් නොවෙමි. ගන්ධර්වයෙක්ද නොවෙමි. පුරින්දදනම් ශක්‍රයාද නොවෙමි. සුරට්ඨ නුවරින් මෙහි පැමිණි ප්‍රෙතයෙක් වෙමි."

19. "නුඹ පෙර සුරට්ඨ දෙශයේදී කෙබඳු සිල්වතෙක් වූයෙහිද, කෙබඳු හැසිරීම් ඇතිවූයෙහිද, නුඹගේ කෙබඳු බ්‍රහ්මචර්යයාවක් හෙතු කොට ගෙන නුඹට මේ ආනුභාවය ඇතිවීද?"

20. "සතුරන් දමනය කරන සුලු රට වර්ධනය කරණ මහරජ මෙය අසනු මැනවි. ඇමතියෝද පිරිවර ජනයෝද පුරොහිත බමුණු තෙමේද මාකියනදේ අසත්වා."

21. "දෙවයන්වහන්ස, මම පව් සිත් ඇති විපරීත දැකුම් ඇති සිල් නැත්තාවූ තද මසුරුවූ මහණ බමුණන්ට පරිභව කරන්නාවූ සුරට්ඨ වැසි පුරුෂයෙක් වීමි."

22. "මම දන්දෙන්නවුන්ට අනුන්ටද උපකාර කරන්නවුන්ටද අනතුරු කරන්නෙක්ව දන් දෙන බොහෝ ජනයා වැළැක් වීමි.

23. "දානයාගේ මතු විපාකයක් නැත, සීලයන් හික්මීමේ විපාකයෙක් නම් කොයින්ද, සිරිත් විරිත්හි හික්මවන ආචාර්යයෙක් නම් කොයින්ද, නොදැමුනහු කවරෙක් දමනය කරත්ද?

24. "සත්වයෝ (ඔවුනොවුන්) සම සමයෝ වෙත්. වැඩිමහල්ලන් හෝ පුණ්‍යයක් නම් කොයින්ද? බලයක් හෝ වීර්යයක් නැත. නැඟී සිටියාවූ පුරුෂ පරාක්‍රමයක් කොයින්ද?

25. "දාන විපාකයක් නම් නැත, ක්‍රොධාදී පව් රැස්කළ වෛර ඇති පුද්ගලයා පිරිසිදු නොකරයි. මනුෂ්‍ය තෙමේ නියම ලැබීම වශයෙන් ලැබිය යුතුදේ ලබයි.

26. "මවෙක්ද පියෙක්ද සොහොයුරෙක්ද නැත. මෙලොවින් මතු ලොකයක් නැත. මහා දානයක් නැත. දුරසිට එලවන ලද සත්කාරයක්ද නැත. මොනවට තබන ලද්දකුත් නැත්තේය.

27. "යමෙකුන් පුරුෂයකු නසන්නේද, අන් පුරුෂයකුගේ හිස සිඳින්නේද කිසිවෙක් තෙම කිසිවෙකු නොනසයි. පෘථිවි ආදී සප්ත ධාතුන්ගේ සිදුරු අතරෙහි (ප්‍රවේශ වෙයි.)

28. "ජීවය තෙම සිඳ බිඳ ලියහැකි නොවේ. කිසි දවසක පැති අටක්ද කිසි දවසක බොලයක්සේ වට මඬුලුද වෙයි. යොදුන් පන්සියයක් උසද වෙයි. කවරෙක් තෙම ජීවය සිඳින්ට සුදුසුද?

29. "යම්සේ (වෙළාකළ) නූල් ගුලියක් (වෙළුම් හැරීම වශයෙන්) දැමූ කල්හී වෙලුම් හරිමින්යේද එසේම ඒ ජීවය තෙම වෙලුම් හරිමින් යයි.

30. "යම්සේ ගෙයින් නික්ම තවත් ගෙයක පිවිසේද එසේම ඒ ජීවයම අන් සිරුරකට පිවිසෙයි.

31. "යම්සේ ගමින් පිටවූවෙක් අනික් ගමකට ප්‍රවිෂ්ට වේද, එසේම ඒ ජීවය අනික් ශරීරයකට ඇතුල්වේ.

32. "යම් අන්ධ බාලයෝත් වෙත්ද යම් පණ්ඩිතයෝත් වෙත්ද (ඔව්හු) මහා කල්ප සුවාසූ ලක්ෂයක් මුලුල්ලෙහිම සසර ඔබ මොබ ඉපදීම් වශයෙන් ගෙවා දුක් කෙළවර කරන්නාහුය.

33. "සුවදුක් ද්‍රොණයකින් හෝ පැසකින් හෝ මණින ලද්දක්හුමෙන්. යථොක්ත කාල පරිච්ඡේදයෙන් පමණ කරණ ලදහ. ජින භූමියෙහි සිටියෙක් සියල්ල දනී. අන් ප්‍රජා තොමෝ අතිශයින් මුළාවෙයි.

34. "පෙර මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වීමි. අතිශයින් මුළාවූ වෙක්ද මොහයෙන් වැසුනෙක්ද මිථ්‍යාදෘෂ්ටි ඇත්තෙක්ද සිල් නැත්තෙක්ද තද මසුරෙක් ද පරිභව කරන්නෙක් ද වීමි.

35. "මාසයකින් මෙහා මාගේ කාලක්‍රියාව වන්නේය. මම ඒකාන්තයෙන් කටුකවූ ඝොරවූ නරකයෙහි වැටෙන්නෙමි.

36. "කොන් සතරක් ඇත්තේය. සිවු දොරක් ඇත්තේය. පමණ කරන ලදුව කොටස් වසයෙන් මොනවට බෙදන ලද්දේය. යකඩ පවුරකින් වටකරන ලද්දේය. යකඩ පියනකින් වසන ලද්දේය.

37. "ඒ අවිචිමහනිරයාගේ යකඩින් කළ බිම (ගිනි දැලින්) දිලිසුනේය. (හාත්පස නැගි) මහත් ගිනි දැලින් නිරන්තරයෙන් යුක්තය. හැමකල්හි පහත් පස යොදුන් සියයක් තැන පැතිර සිටී.

38. "මහරජ, අවුරුදු ලක්ෂයක් ඉක්මගිය කල්හි එතනින් ශබ්දයක් ඇසෙයි. සියක් කොටස්වූ හවුරුදු කොටියක් වෙති. මෙය (ආයු) පරිච්ඡෙදයයි.

39. "යම් සත්ව කෙනෙක් හවුරුදු කොට ලක්ෂයක් මුලුල්ලෙහි නරකයෙහි පැසෙත්. (ඔව්හු) මිථ්‍යාදෘෂ්ටිකයෝද දුස්සීලයෝද ආර්යොපවාද කළෝද වෙත්.

40. "මම ඒ මහ නිරයෙහි බොහෝ කලක් මුලුල්ලෙහි දුක් වෙදනා විඳින්නෙමි. (මවිසින් කළ පාපකර්මයාගේ විපාකය එහෙයින් මම බොහෝ සේ ශොක කරමි.)

41. "රට වඩන සතුරන් දමනය කරන මහරජ එය අසව. මහරජ නුඹට යහපතක් වේවා. මාගේ උත්තරා නම් දියණිය.

42. "කුශල කර්මය කරයි. නිති පඤ්ච සීලයෙහිද උපොසථ සීලයෙහිද ඇලුනී වෙයි. හික්මුනීද දාන සංවිභාග ඇත්තීද බොහෝ දෑ දෙන්නීද පහවූ මසුරු මල ඇත්තීද වෙයි.

43. "අන්කුලයක යෙහෙලියක් වුවත් ශික්ෂාවක් කඩනොකරණ සුලුය. ශාක්‍යමුනිවූ ශ්‍රීමත්වූ සම්බුදුන්ගේ උපාසිකාවක් විය.

44. "යට හෙළන ලද ඇස් ඇති සිහි ඇති රකින ලද ඉඳුරන් ඇති මනාව හික්මුනාවූ සිල්වත්වූ භික්ෂුනමක් ගමට පිඬු පිණිස වැඩියේය.

45. "මහරජ නුඹට යහපතක් වේවා, ගෙපිළිවලින් වඩිමින් ඒ ගෙදරට වැඩියේය. උත්තරා තොමෝ ඒ භික්ෂුව දුටුවේය.

46. "ඕ තොමෝ පැන් පිරූ බඳුනක්ද විචිත්‍රවූ කැවිලිද දුනි. ස්වාමිනි මගේ පිය තෙම කළුරිය කෙළේය. ඕ හට මේ පිණ පැමිණේවා.

47. "(දක්ෂිණාව) පින්දීමට අනතුරුව විපාක උපන්නේය. වෙසමුනි රජ යම්සේද (එසේ) මම කාමයෙන් සමෘද්ධව සැප විඳිමි.

48. "සතුරන් දමනය කරණ රට වර්ධනය කරණ මහ රජ, දෙවියන් සහිත ලොකයාහට සර්වඥතෙම අග්‍රයයි කියනු ලැබේ. පින්වත් රජතුමනි, පුත්‍ර දාරාවන් සහිතව බුදුන් සරණ කොට යව.

49. "රජ ආර්ය අෂ්ටාංගික නිවන්පදය ස්පර්ශ කරන්න. ඒ සමග ධර්මය සරණ කොට යව.

50. "ආර්ය මාර්ගයට පිළිපන්නේනෝ සිව් දෙනෙක් වෙති. පලයෙහි සිටියහු සිව් දෙනෙකි. මේ සංඝතෙම ඍජුය ප්‍රඥාශීලයන් ගෙන් යුක්තය. පින්වත් රජතුමනි, ඒ සංඝයා සරණ කොට යව.

51. "සතුන් මැරීමෙන් වහා වෙන්වෙව. ලෙව්හි නුදුන් දෙය දුරුකරව. මත්පැන් බොන්නෙක් නොවෙව. බොරු නොකියව. සිය බිරිඳ සමග තුටුවෙව.

52. "යක්ෂය (නුඹ) මට වැඩ කැමැත්තෙහිය. පින්වත් දෙවිය හිත කැමැත්තෙහිය. නුඹගේ වචනය කරමි. නුඹ මගේ ආචාර්යයා වෙහිය.

53. "මම බුදුන් සරණ කොට යමි. බුදුන්ගේ නිරුත්තවූ ධර්මයද සංඝයාද පිහිට කොට යමි.

54. "සතුන් මැරීමෙන් වහා වෙන්වෙමි. ලෙව්හි නුදුන් දෙය දුරුකරමි. මත් පැන් නොබොන්නෙක් වෙමි. මුසාවාද නොකියමි. සිය බිරිඳ සමඟ තුටුවෙමි.

**55.** "බුදුන්ගේ සස්නෙහි ඇලුනෝ ලාමක (බොල්) මිථ්‍යා දෘෂ්ටිය මහත් වාතයෙහි පිඹ හරිමි. සීඝ්‍ර සැඩ පහර ඇති නදියෙහි හෝ පාකර හරිමි."

**56.** සුරට්ඨ අධිපති රජතෙම මෙය කියා ලාමක දෘෂ්ටියෙන් වැළකී බුදුන්ට වැඳ පෙරදිගට අභිමුඛව රියට නැංගේය.

**39. රෙවතී ප්‍රේතියගේ කථාව:-** 1. "ඉතා පවිටු ස්වභාව ඇති දන් නොදෙන සුළු රෙවතිය, යම්හෙයකින් තිට නිරයට යාම පිණිස දොර නොවසන ලදද එහෙයින් හුන් තැනින් වහා නැඟී සිටුව දුකට පැමිණෙව නිරාදුකින් සමවෙහි නිරි සත්තු යම් නිරයක කෑ ගසත්ද එහි තී පමුණුවන්නෙමු නොහොත් දමන්නෙමු."

**2.** මෙසේත් කියා ලේ වන් ඇස් ඇති මහත්වූ යම දූතයන් සමාන ඒ යක්ෂයෝ දෙදෙන වෙන වෙනම අත් අල්වාගෙන දිව්‍ය සමූහයා වෙත රේවතිය පැමිණවූහ.

**3.** සිත් කළුවූද දහසක් රැසින් දිළිසෙන හිරු විමනක් බඳු රන් දැල් වසා සිටි යහපත් හිරු මඬලක් සේ බබළන බොහෝ දෙවඟනන් ගෙන් ගැවසී ගත් අර විමන කාගේද?

**4.** "සඳුන් සුවඳ විලවුන් ගල්වන ලද සිරුරු ඇති දෙවඟනෝ විමන (ඇතුලත පිටත) දෙපසින් හොබවත්. ඒ විමන හිරු මඬලක්සේ පෙනෙයි. දෙව්ලොවට පැමිණි කවරෙක් (මේ) විමනෙහි සතුටු වේද?"

**5.** "බරණැස් නුවර මසුරු නොව දානපතිව දන් දුන්නාවූ බුද්ධාදී තුනුරුවන්හී පහන් සිතැති නන්දිය නම් උවසුවෙක් විය. ඕහට (දහසක් රැසින් දිලිසෙන) හිරු මඬලක් සේ බබළන දිව්‍යාංගනා සමූහයෙන් ගැවසීගත් මේ විමන (පහළ විය.)

**6.** "සඳුන් සුවඳ විලවුන් ගල්වන ලද සිරුර ඇති දිව්‍යාංගනා සමූහයා විසින් දෙපස හොබවත්. එය හිරුමඬලක් සේ පෙනේ. ඒ නන්දියතෙම දෙව්ලොවට පැමිණියේ විමනෙහි සතුටු වෙයි."

7. "මම ඒ නන්දියාගේ බිරින්ද වීමි. ගෙයි සිටියාවීමි. ඔහුගේ සියලු වස්තුවට ස්වාමි දුවක් වීමි. දැනුදු ස්වාමියාගේ විමනෙහි සිත් අලවමි. (ඒ) නරකය දැකීමටවත් නොපතමි."

8. "ඉතා ලාමක ස්වභාවය ඇති රේවතිය මේ තීගේ නිරයයි. තී විසින් මිනිස් ලොවදී පින්කම් නොකරණ ලද්දේය. තී වැනි මසුරු මලයෙන් යුත් අනුන්ට ක්‍රොධ උපදවන ලාමක ස්වභාව ඇත්තේ දෙවියන්ගේ සහභාවය නොලබයි.

9. මලමුත්‍රවලින් හා මහත් පණුවන්ගෙන් ගැවසීගත් දුගඳ හමන මේ අසූචි වැළකීම දක්නා ලැබේද මෙසේ දුගඳ හමන අශුචි වළ කුමක්ද?"

10. "මේ සංසවක නම් නරකය වෙයි. සියක් පුරුෂ ප්‍රමාණ ගැඹුරුය, යම් නරකයක අවුරුදු දහසක් ආයුෂ නම් එහි රේවතිය (නුඹ) පැසෙන්නේය.

11. "කයින් හා වචනයෙන්ද, මනසින්ද, කිනම් අකුශලයක් මවිසින් කරන ලද්දේද, සියක් පුරුෂ ප්‍රමාණවූ සංසවක නම් අශුචි නරකය කවර අකුශලයක් හේතුකොට ගෙන මවිසින ලබන ලද්දේද,

12. "මහණුන්ද, බමුණන්ද, අන් යදියන්ද මුසාවාදයෙන් වංචා කෙළෙහිය. පාපය තා විසින් කරණලදී.

13. "රේවතිය, ඒ අකුශල හේතුවෙන් සියක්පුරුෂ ප්‍රමාණ ගැඹුරුවූ සංසවක නම් ගූථ නිරය (තී විසින්) ලබනලදී. තී එහි අවුරුදු දාහක් පැසෙන්නෙහිය.

14. "(තිගේ) අත්ද කපත්, පාද කපත්, කන්ද කපත්, නාසයද කපත්, තවත් කවුඩු රැළ එක්රැස්ව පෙරළෙමින් කති.

15. "සත්වයෝ යම් කුශලයක්කොට සුවපත් වෙත්ද, පසුතැවිලි නොවෙත්ද, එබඳු දන් දීමෙන් ද සම හැසිරීමෙන් ද හික්මීමෙන් ද, ඉන්ද්‍රිය දමනයෙන් ද, බොහෝ කුසල් කරන්නෙමි. මා (මිනිස් ලොවට) පමුණුවන්නාහුනම් මැනවි"

16. "තී පෙර (කුසල් නොකොට) ප්‍රමාදව දැන් (කුමක් පිණිස) හඬයිද තමන් කළ අකුශල කර්ම විපාකය (තීම) විඳින්නෙහිය.

17. "මෙසේ මා විසින් විචාරන ලද්දාවූ කවරෙක් දෙව් ලොවින් මිනිස් ලොවට ගොස් බහා තබනලද දඬු ඇති ගුණවතුන් කෙරෙහි දන්දෙව, වස්ත්‍ර සෙනසුන් ආහාර පාන වර්ග දන් දෙවයි කියන්නේද, (තී වැනි) මසුරු ස්වභාව ඇති අනුන්ට ද්වෙෂ කරණසුලු ලාමක ස්වභාව ඇති පුද්ගලයා දෙවියන්ගේ සහභාවය නොලබායයි කියන්නේද?

18. "ඒ මම මෙතනින් මිදීගොස් මිනිසත්බව ලබාගෙන යදියන් බස් දන්නාසුලුව සීලයෙන් යුක්තව දන්දීමෙන්ද මනා පැවැත්මෙන්ද සීල සංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන්ද යුක්තව ඒකාන්තයෙන් බොහෝ පින් කරන්නෙමි.

19. "පුෂ්පාරාම ඵලාරාමයන් රොපනය කරන්නෙමි. යා නොහැකි තන්හි ඒදඬු, පාලම් දමන්නෙමි. පිරිසිදු සිතින් ළිං පැන් පොකුණු ආදිය කරවන්නෙමි.

20. "පක්ෂය සම්බන්ධ යම් අටවකක් වී නම් එදා ද තුදුස්වකද පසළොස්වකද වස් කාලයෙහිද අෂ්ටාංගයෙන් යුක්ත

21. "උපොසථ සීලය සමාදන් වන්නෙමි. නිත්‍ය පංචශීලයෙහි හික්මෙන්නෙමි (පිහිටන්නෙමි) මා විසින් මේ අපාදුක තමන්ම දක්නා ලදී. දන්දීමෙහි පහ නොවන්නෙමි."

22. මෙසේ ඔබමොබ පෙරළෙමින් විලාප කියමින් හඬන ලේවතිය පා උඩුකුරුව හිස යටිකුරුව සිටිනසේ සංසවක නම් ගූථ නරකයෙහි හෙලූහ.

23. "මම පෙර (මිනිස් ලොවදී) තදමසුරු තැනැත්තියක්ද මහණ බමුණන්ට පරිභව කරන්නියක්ද වීමි. බොරුවෙන් හිමියා වඤ්චාකොට (දැන්) මම දරුණු ස්වභාව ඇති සංසවක නම් ගූථ නරකයෙහි පැසෙමි."

**40. "උච්ඡු (උක්) ප්‍රෙතයාගේ කථාව**:- 1. "ස්වාමීනි, මදනොවූ කුශල විපාක වූ මහත් වූ ඒ මේ උක්වනය මට පහළ වෙයි. මෙය දැන් මාගේ පරිභොගයට නොපැමිණෙයි. කුමන අකුශලයක විපාකදැයි, කියනු මැනවි.

2. "ඒ මම කිසි උක් රසයක් පරිභොග කිරීමට වෑයම් කෙරෙම්ද, ප්‍රයෝග කරම්ද, වැනසෙමි. මම කපනු ලබමි. දුබල ඇතිව බැගෑපත්ව අතිශයින් විලාප කියමි. කෙබඳු අකුශල කර්මයක්හුගේ මේ විපාකයක්ද,

3. "ස්වාමීනි, මම නැසුණු ආසා ඇතිව, නොහොත් ශක්ති නැතිව බිම වැටෙමි. අව්වෙන් රත්වූ මත්ස්‍යයකු මෙන් පෙරළෙමි. අඬන්නාවූ මාගේ කඳුළු ගලා බසිත්." "කෙබඳු අකුශල කර්මයක්හුගේ මේ විපාකයෙක්දැයි කියව."

4. "ස්වාමීනි, ක්ෂුධා ඇත්තෙක්ද, ක්ලාන්තවූයේද, පිපාසා ඇත්තේද, (උගුර තොල් තලු) ඉතාමත් වියලුනේ සාතයයි කියන ලද සැපත නොවිඳිමි. කෙසේ නම් උක්රස අනුභවය ලබන්නෙම්දැයි" මේ කාරණය ඔබ විචාරමි.

5. "තෝ පෙර පූර්ව ජන්මයෙහි මනුෂ්‍ය වූයේ තමා අකුශලකර්මයක් කෙළෙහිය. මම මේ කාරණය තට කියමි. තෙමේ කාරණය අසා දනුව.

6. "තෝ උක් දණ්ඩක් කමින් ගියේය. තාගේ පිටිපසින් පුරුෂයෙක්ද ලුහුබැඳ ගියේය. හෙතෙමේද එය පතමින් කථා කෙළේය. තෝ ඕහට කිසිවක් නොකීවෙහිය.

7. "හෙතෙමේද, කථා නොකරන්නාවූ තා ඇයැදියේය. මහතාණෙනි, උක් දණ්ඩක් දෙවයි තට කීයේය. තෝ ඕහට පිටිපසින් උක් දණ්ඩක් දුන්නෙහිය. ඒ කර්මයාගේ මේ විපාකය වෙයි.

8. "එබැවින් තෝ පිටුපසින් උක් දඬු ගනුව. ගෙන යැපෙනතාක් කව. එයින්ම තෝ සතුටු සිත් ඇති වන්නෙහිය සතුටුවූයේද, ඔදවැඩියේද, ප්‍රමුදිතවූයේද වන්නේය.

9. "ඒ ප්‍රෙතතෙම ගොස් පිටිපසින් ගත්තේය. එය ගෙන පමණ තෙක් කෑවේය. හෙතෙම එයින් සතුටු සිත් ඇති විය. තුටුවූයේද, ඔදවැඩියේද, ප්‍රමුදිත වූයේද, විය.

41. **කුමාර ප්‍රේත කථාවඃ-** 1. "හිමාලය වනයාගේ එක් පසෙකින් ශ්‍රාවස්ති නම් නුවරෙක් ඇත්තේය. එහි රජ පුත්වූ කුමරුවෝ දෙදෙනෙක් වූවාහුයයි මා අසන ලදී.

**2.** සිත් ඇලවිය යුතු කාමයන්හි ඉතාමත් කාම ගුණාස්වාද, වසයෙන් සතුටුවනසුලුවූ වර්තමාන සැප මාත්‍රයෙහි ගිජුවූ ඔව්හු තුමූ මතු සැපය නොබැලුවාහුය.

**3.** ඔහු දෙදෙනා මේ මිනිස් බැවින් චුතව පරලොව (ප්‍රෙත ලොකය) ට පැමිණියෝ වූහ. ඔවුහු තුමූ තමන්ගේ පෙර දුශ්චරිතය (දැන) අදෘශ්‍යමානව මේ සැවැත් නුවර සමීපයෙහි දැන් කැගසත්.

**4.** "බහුශ්‍රැත (දක්ෂිණාර්හයන්) ඇති කල්හි දාන වස්තුව පැමිණ සිටි කල්හි තමන්ට සැප එලවන්නාවූ ස්වල්පවූද පිනක් කරන්ට එකාන්තයෙන් නොහැකි වීමු.

**5.** "අපි යම් පව් කමකින් රාජ කුලයෙන් චුතව සා පිපාසා දුකින් මඩනාලද ප්‍රේත ලොකයෙහි උපන්නෙමු. ඊට වඩා ලාමක දෙයක් නම් කුමක් වන්නේද?

**9.** "මෙලොවදී යම් යම්දේ හිමිවූවෝ එහි කිසිවකටත් අහිමියෝ වෙත්. මිනිස්බැව්හි උසස්වූ ඒ මිනිස්සු ප්‍රෙතවිෂයෙහි පහත්ව සා පිපාසා දුකින් යුක්තව හැසිරෙත්.

**7.** "මිනිස් තෙම ඉසුරුමදයෙන්වූ දොෂය මෙසේ දැක ඉසුරු මදය හැරපියා ස්වර්ගයට ගියෙක් වන්නේද සප්‍රාඥව ඒ මිනිස්තෙම ශරීරයාගේ බිඳීමෙන් ස්වර්ගයට පැමිණෙයි."

**42. රාජ පුත්‍ර ප්‍රේත කථාව:-** 1. පූර්ව ජන්මයෙහි කරන ලද අකුසල කර්මයන්ගේ විපාකයතෙම (අන්ධ බාලයන්ගේ) සිත මනරම් රූප හෙතුවෙන්ද, ශබ්ද හෙතුවෙන්ද රස හේතුවෙන්ද, ගන්ධහේතුවෙන්ද, ස්පර්ශ හේතුවෙන්ද මැඩලන්නේය.

**2.** බොහෝවූ නෘත්‍යය ගීතය කාම රතිය හා මිත්‍රාදීන් හා ක්‍රීඩාව උයනෙහි විඳ රජගහ නුවරට පිවිසෙන්නේය.

**3.** මහර්ෂිවූ දැමුණු සිත් ඇති අර්හත් ඵල සමාදියෙන් සන්හුන්වූ ආසා ඇත්තාවූ, ලජ්ජා සහිතවූ පාත්‍රයට ගත් ආහාරයෙහි සතුටුවූ සුනෙත්ත නම් පසේබුදුන් දුටුවේය.

**4.** රාජ පුත්‍රතෙම ඇතුපිටින් බැස ස්වාමීනි, භික්ෂාව ලබන ලදදැයි ඇසීය. උන්වහන්සේගේ පාත්‍රය ගෙන ඉතා උස්කොට ඔසවා,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. තද භූමිප්‍රදෙශයක පාත්‍රය (දමා) බිඳ සිනාසෙමින් මඳක් ඉවත්ව සිටියේය. "මහණ මම කිතව රජුගේ පුත්‍රයා වෙමි. මට කුමක් කරන්නෙහිද?"

6. දරුණුවූ ඒ අකුශල කර්මයාගේ විපාකය කටුක විය. කරන ලද දරුණු පව ඇති රාජ පුත්‍රතෙම නරකයෙහි පිහිටියේ යම් විපාකයක් විඳීද?

7. "සුවාසූ දහස් සයක්ම එහෙයින්ම නහුත ගණන් හවුරුදු නරකයෙහි ඉතාමත් දුකට පැමිණියේය.

8. "අඥාන (රාජ පුත්‍ර) යා උඩුකුරුව වම් ඇලයෙන් හා දකුණු ඇලයෙන් යුක්තවද, උඩුකුරු පාඇතිවද, සිටියේද, බොහෝ කලක් මුළුල්ලෙහි නිරයෙහි පැසුණේය.

9. "කරන ලද දරුණු පව් ඇත්තේ නොයෙක් හවුරුදු දහස් ගණන් මුළුල්ලෙහිද, හවුරුදු සමූහයක් මුළුල්ලෙහිද නහුත ගණන් මුළුල්ලෙහිද, ඉතාමත් දුකට පැමිණියේය.

10. "අපරාධීන් කෙරෙහි මෙත් සිතැති මනා පැවතුම් ඇති ඍෂීහු වෙත වරදවා පව්කම් කරන පුද්ගලයෝ මෙබඳුවූම ඉතාදුක් ඇතිව පැසෙත්.

11. "ඒ රාජ පුත්‍රයා ඒ නරකයෙහි අවුරුදු ගණනක් මුළුල්ලෙහි බොහෝ දුක්විඳ එයින් චුතවූයේ සා පිපාසායෙන් මැඩුනාවූම ප්‍රෙතයෙක් විය.

12. "යමෙක් මෙසේ ඉසුරුමදයෙන්වූ, දොෂය දැක ඉසුරු මදය හැරපියා යටත් පැවැත්මට අනුව ජීවත්වේද, බුදුන් කෙරෙහි ගෞරව සහිත වේද, නුවණැති හෙතෙම මේ ආත්මයෙහිදීම පැසසිය යුතුවේ. මරණින් මතු දෙව් ලොවට පැමිණෙයි."

13. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රාජපුත්‍ර ප්‍රෙත කථා වස්තුවෙන් එතැන්හි රැස්වූ මහජනයාට සංවේග උපදවා පසුව චතුස්සත්‍ය ධර්මය දෙශනාකළසේක. දෙසුන් කෙළවර බොහෝ ජනයා සෝවාන් ඵලාදියට පැමිණියාහ.

43. **ගූථඛාදක ප්‍රෙත කථාව:-** 1. "කවරෙක් අසූචි වළෙන් නැගී බැගෑපත්වම සිටින්නෙහිද පව් කම් ඇත්තා නිසැකව කවරෙක්දැයි තේරුම් ගන්නේද? කිම,

2, 3. (6 කථාවේ 2-5 යොදාගත යුතුයි.)

4. "ඊර්ෂ්‍යා සිත් ඇති කුලයා කෙරෙහි මසුරුවූ තද මසුරු සිත් ඇති (සිල්වතුන්ට) පරිභව කරන්නාවූ මාගේ ගෙදර තෘෂ්ණාවෙහි බැඳුනාවූ මාගේ ආවාසයෙහි නිත්‍ය වාසී භික්ෂුවක් විය.

5. "මම ඒ මහණගේ කීම අසා (ප්‍රියශීලි) භික්ෂූන්ට නින්දා කෙළෙමි. ඒ කර්මයාගේ විපාකයෙන් මෙයින් ප්‍රෙත ලොකයට ගියෙමි."

6. "තට මිත්‍ර ස්වරූපයෙන් කුළුපගවූ (ක්‍රියාවෙන්) අමිත්‍ර වූ යම් මහණෙක්වීද ඒ දුෂ්ප්‍රාඥයා මරණින් මතු පරලොව කෙබඳු දුගතියකට පැමිණෙයිද?"

7. "පවිටු සමාචාර ඇති ඒ ශ්‍රමණ ප්‍රෙතයාගේ හිස මුදුනේම මම දැන් සිටිමි. හෙතෙමේද ප්‍රෙත ලොකයට පැමිණියේ මාගේම මෙහෙකරුවෙකු විය.

8. "ස්වාමීනි, සෙස්සෝ යම් අසූචියක් හෙළත්ද, ඒ අසූචි මාගේ භොජනය (ආහාරය) වෙයි. මමද වනාහි යම් අසූචියක් පහරම්ද එය (කෑමෙන්) ඒ ශ්‍රමණ ප්‍රෙතයා දිවි පවත්වයි."

44. **ගූථඛාදිකා ප්‍රෙතියගේ කථාව:-** (මෙහි සියලුම ඡේද 43 වෙනි කථාවේ ඡේද මෙනි.)

45. **ගණ ප්‍රෙත කථාව:-** 1. "නිදුකාණෙනි, තෙපි කෘශවූ ඉල්පී ගිය නහරවැල් ඇති, උස්ව නැගුණ ඉල ඇට ඇති, ඉතා කෘශවූ නග්නවූ දුර්වර්ණ ශරීර ඇත්තෝවූහ. තෙපි කවරහු වව්ද?"

2 - 6 (31 කථාවේ 4-5-6 මෙනි.)

7. "චිර කාලයක් සා දුකින් පීඩිතවූ ආහාරයෙහි ගිජුවූ (අපි) නොයෙක් යොදුන් ගණන් යමු. කිසිවක් නොලබාම නවතිමු. අපගේ පින් මද බව අඥෝමය.

8. "බඩගිනිවූ සා පිපාසා දුකින් ක්ලාන්තවූ අපි කැරකෙන්නාහු බිම (දැමූ මැටි පිඩක් මෙන්) ඇද වැටෙන්නෝ

වෙමු. උඩුකුරුව වැටුනාහු විසුරුණු අවයව ඇත්තෝ වෙමු. යටිකුරුව වැටුනෙමු.

9. "ඒ ගිය තැනම වැටුණාවූද බිම (සිටීමට අසමර්ථ භාවයෙන්) වැටුණාවූද ඒ අපි ළයටද හිසටද ගසා ගනිමු. අපගේ අහෝ පින් නැති බවයි.

10. "ස්වාමීනි, මේ දුකටද ඊට වඩා ලාමකවූ අනිකුදු දුකටත් (අපි) සුදුස්සෝ වෙමු. දිය යුතුදේ විද්‍යමාන කල්හි තම හට පිහිටක් නොකෙළෙමු.

11. "ඒ එසේ මැයි. ඒ අපි මෙයින් සැව ගොස් මිනිසත් බව ලැබ පරිත්‍යාගශීලීව නොහොත් යාචකයන්ගේ වදන් දන්නාසුලුව සිල්වත්ව බොහෝ කුසල් ඒකාන්තයෙන් කරන්නෙමු."

12. තෙරුන්වහන්සේ එපවත් භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය. බුදුරජාණන් වහන්සේ ඒ කරුණ අර්ථොත්පත්ති කොට පැමිණි පිරිසට දහම් දෙසූසේක. ඒ ධර්මය අසා මහජනතෙම මසුරු මල පහකොට දානාදී කුශල ක්‍රියා කරමින් සුචරිතෙහි යෙදුනේ විය.

46. **පාටලී පුත්‍ර ප්‍රෙත කථාව:-** 1. "තී විසින් නරකයෙහි වූවෝද තිරිසන්හුද ප්‍රෙතයෝද අසුරයෝද යලි මනුෂ්‍යයෝද දෙවියෝද දක්නා ලද්දාහුය. තමාගේ කර්ම විපාකය තෙමේම දුටුවේය. තී කිසිවකු විසින් නොදක්නාලදුව පැළලුප් නුවරට පමුණුවන්නෙමි. එහි ගොස් කුශලක්‍රියා කරව."

2. "යක්ෂය, නුඹ මට වැඩ කැමැත්තෙක් වෙහිය. දෙවිය නුඹ මට හිත කැමැත්තෙක් වෙහිය. (එහෙයින්) මම ඔබගේ අවවාද වචන කරමි. නුඹ මාගේ ආචාර්යද වෙහි.

"මා විසින් (මේ කොටස මෙහිම 1 ඡෙදය මෙනි.)

47. **අම්බවන ප්‍රෙත කථාව:-** 1. "තාගේ මේ පොකුණද අතිරම්‍ය වෙයි. සමතලා වූ මනා තොටුපල් ඇත්තී මහත් දිය ඇත්තීද වෙයි. මනාව පිපි මල් ඇත්තීද බමර සමූහයාගෙන් ගැවසුනේද වෙයි. තා විසින් මේ මනරම් පොකුණ කෙසේ ලබන ලද්දීද?

**2.** "තාගේ මේ අඹ උයන ඉතා මනරම්වෙයි. සියලු ඍතුන්හී සැප එලවයි. පලදරයි. මනාව පිපි මල් ඇත්තේ බමර සමූහයාගෙන් ගැවසුණේ වෙයි. තා විසින් මේ විමන කෙසේ ලබන ලද්දේද?"

**3.** "මා දුව විසින් ඒ දෙනලද දාන හේතුවෙන් ඉදුනු අඹ හා පැන්ද, කැඳද, සිහිල් සෙවනද එහිදී මට ලැබෙයි දානයාගේද, ඉන්ද්‍රිය දමනයාගේද, සීල සංයමයාගේද, මෙලොවමවූ විපාකය මෙසේ බලව්. මම ස්වාමීන්ගේ ගෙදර දාසියෙක්වී (නැවත) යෙහෙළියක් වී නැවත ස්වාමිදුවක්ද වීමි."

**48. අක්ඛරුක්ඛ ප්‍රෙත කථාවඃ-** 1. "යම් දාන වස්තුවක් (දායකතෙම) දේද, එයම විපාක භාවයෙන් නොවෙයි. දානය දෙන්නේමය. දී මෙලොව දුක ඉක්මවයි. ඒ දාන හේතුවෙන් දෙව්ලොව සැපතට නොහොත් තමන් හා අනුන්යයි දෙවැදෑරුම් හිත සැපයට පැමිණෙයි. පුබුදුවයි, පමා නොවව්."

**49. භොගසංහාර ප්‍රෙත කථාවඃ-** 1. "අපි යුක්ති වශයෙන්ද අයුක්තියෙන්ද වස්තු සම්පත් රැස්කළෙමු. ඒ වස්තුව සෙස්සෝ පරිභොග කරත්. අපි මහත් දුකට හිමිවූවෝ වෙමු."

**50. සෙට්ඨිපුත්ත ප්‍රෙත කථාවඃ-** 1. "ලොහො කුඹු නිරයෙහි පැසෙන්නාවූ අපට සැට දහසක් හවුරුදු සැම ලෙසින් පිරුණාහුය. කවර කලෙක කෙළවර වන්නේද?

**2.** "නිදුකාණෙනි, මාගේද, තාගේද (දුක් විඳීමේ කෙළවරක්) නැත්තේය. අවසනක් කොයින්ද කෙළවර දක්නා නොලැබේ. එපරිද්දෙන්ම පව්කම් (මා හා තා විසිනුත්) කරණ ලදී.

**3.** "යම්බඳු අපි (දාන වස්තු) ඇති කල්හී කිසිවක් නොදුනිමු. ගර්හිත ජීවිතයක් ඇතිව ජීවත් වීමු. දාන වස්තු ඇතිකල්හි තමහට පිහිටක් (අපි) නොකෙළෙමු."

**4.** "ඒ එසේ මැයි. ඒ මම මෙයින් සැව ගොස් මිනිසත් බව ලැබ පරිත්‍යාගශීලීව නොහොත් යාචකයන්ගේ වදන් දක්නාසුලුව සිල්වත්ව ඒකාන්තයෙන් බොහෝ කුසල් කරන්නෙමි."

**51. සට්ඨිකූට ප්‍රෙත කථාව:-** 1. "තෝ උතුම් ස්වභාව ඇත්තකු මෙන්ද, කරකැවෙන්නාවූ මුවකු මෙන්ද, කුමක් හෙයින් (ඔබමොබ) දුවන්නෙහිද නිසැකව පවකම් ඇත්තෙකි. කුමක් හෙයින් ඉතා නාද කරමින් හැසිරෙන්නෙහිද?"

**2.** (මේ ඡේදය 6 කථාවේ 2 ඡේදය මෙනි.)

**3.** "මාගේ හිසෙහි අඩුනැති කුළු සැටදහසක් සියලු දිසාවෙන් වැටෙත්. ඒ යකුළු (මාගේ) මස්තකය බඳිත්.

**4.** (මේ ඡේදය 6 කථාවේ 5 ඡේදය මෙනි.)

**5.** "තාගේ හිසෙහි (මෙහි 3 ඡේදය මෙනි.)

**6.** "ඉක්බිති වඩනාලද ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති රුක්මුල භාවනා කරමින් වැඩහුන්නාවූ බිය නැත්තාවූ සුනෙත්‍ර නම් වූ පසේ බුදුන් මම දුටුවෙමි.

**7.** "උන්වහන්සේගේ හිස ගල් විදුම් පහරින් පොඩි කෙළෙමි. ඒ අකුශල කර්ම විපාක හේතුවෙන් මෙබඳු දුකට පැමිණියෙමි.

8. (මෙහි 3 ඡේදය මෙනි)

**9.** නින්දිත පුරුෂය තට සුදුසුවූ කරුණෙන්ම (මෙහි 3 ඡේදය මෙනි)

**(ප්‍රෙත වස්තුව නිමි.)**

---

# 8. ථේරගාථා

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## 1. එකක නිපාතය.

### 1. පළමුවන වර්ගය.

ප්‍රථම ගාථා:- (i) උතුම් දළ ඇත්තාවූ පර්වත ගුහායෙහි ගුගුරන මෘගරාජයින්ගේ අභීත නාද වැනි (සමථ විදර්ශනා වශයෙන් වඩනාලද සිත් ඇති) ක්ෂීණාශ්‍රවයන්ගේ ආත්මාර්ථාදී අර්ථයන් එළවන්නාවූ ගාථාවන් අසව්.

(ii) සුභූති-මහාකොට්ඨිත ආදී යොග්‍ය නම් ඇත්තාවූ ගෞතම කාශ්‍යපාදී යොග්‍ය ගොත්‍ර ඇත්තාවූ (ශ්‍රද්ධා විමුක්ති ප්‍රඥා විමුක්තීන් අතුරෙන්) යොග්‍ය උසස් මිදීම් ඇත්තාවූ සප්‍රාඥවූ ක්ෂීණාශ්‍රවයෝ නොමැළිව වාසය කළහ.

(iii) ඒ ඒ වනරුක් මුල්හි විදසුන් වඩා නිර්වාණ පදයට පැමිණ නිවන් සුව සලකා බලන්නාහු මේ අර්ථය ගාථා බන්ධන වශයෙන් වදාළහ.

1. **සුභූතිථෙර ගාථා**:- "වැසිවළාව, මාගේ කුටිය සෙවෙනි කරන ලද්දීය. සැපය, වාත ප්‍රවෙශ රහිතය තෝ රිසිසේ වසින්න. මගේ සිත (මාර්ගඵල සමාධීන්ගෙන්) මොනවට එකඟ බවෙහි පිහිටියේය. සැම කෙලෙසුන් කෙරෙහි මිදිණ. වීර්ය සම්පන්නව වෙසෙමි. වැසිවළාව, වසින්න' ආයුෂ්මත් සුභූති ස්ථවිරතෙම මේ ගාථාව වදාළේය.

2. **මහාකොට්ඨිතථෙර ගාථා**:- "සංසිඳුනාවූ, සැම පවින් වැළකුණාවූ පමණින් යුක්තව කථාකරණ උඩඟු නොවූ මහණතෙම ගසක කොළයක් හෙළලන සුළඟක් සෙයින් ලාමකවූ, අකුශල ධර්මයන් කම්පාකොට හරනේය." මහා කොට්ඨිත ස්ථවිරතෙම මේ ගාථාව වදාළේය.

**3. කංඛාරේවත ථෙරගාථා**:- "යම් තථාගත කෙනෙක් තමන් වෙත පැමිණි දිව්‍ය-බ්‍රහ්මාදීන්ගේ සැක දුරුකෙරෙද්ද ඒ තථාගතවරයන්ගේ මධ්‍යම රාත්‍රියෙහි දල්වනලද ගිනිකඳක් මෙන් බබළන මේ ප්‍රඥා මහිමය බලන්න.

"ඒ මේ බුදුවරයෝ හික්මියයුතු ජනයාට ප්‍රඥාලෝකය දෙන්නෝ වෙති. නුවණැස දෙන්නෝ වෙති." ආයුෂ්මත් සංඛාරේවත ස්ථවිරතෙම මේ ගාථාව වදාළේය.

**4. පුණ්ණ තෙරගාථා**:- "නුවණැත්තාවූ, අත්වැඩ පර වැඩ ආදී හිතාභිවෘද්ධිය දන්නාසුළුවූ බුද්ධාදී සත්පුරුෂයන් හා එක්ව හිඳිනේය. නොපමාවූ විචක්ෂණවූ වීරයෝ ගැඹුරුවූ දැක්මට අපහසු සියුම් ඉතා සියුම් මහත්වූ අර්ථය නම්වූ ආර්ය සත්‍යය මොනවට අවබොධ කෙරෙත්." ආයුෂ්මත් පුණ්ණ මන්තානි පුත් තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. දබ්බ (මල්ලපුත්ත) ථෙරගාථා**:- "යමෙක් අමාරුවෙන් හික්මිය යුතුවූයේ බුදුරදුන් විසින් හික්මවනලද්දේද, ප්‍රඥාදී මගපල සුවින් හටගත් සතුටු ඇති, දුරුකළ සැක ඇති කෙළෙස් සතුරන් මැඩ ජය ගත්තාවූ පහවගිය සසර බිය ඇති (ලෝකධර්මයන්ගෙන් කම්පානොවන හෙයින්) අචලවූ ඒ දබ්බ තෙමේ ක්ලේශ පරිනිර්වාණය කෙළේය." ආයුෂ්මත් දබ්බ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. සීතවනිය ථෙරගාථා**:- "යම් මහණෙක් තනිව ශීතවනයට පැමිණියේද, ඒ මහණතෙම, ධෛර්ය සම්පන්නවූයේ 'කායගතා සතිය' රකිමින් සතුටට පත්විය. අග්‍රමාර්ගයෙන් සන්සිඳින සියලු කෙලෙස් සතුරන් මැඩ ජයගත. පහවගිය ලොමුඩැහැගැනීම් ඇත්තේවී" ආයුෂ්මත් සීතවනිය සම්භූත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. භල්ලිය ථෙරගාථා**:- "යමෙක්තෙම ඉතා දුර්වල උන හෝ බට ඒදණ්ඩක් පාකොට යන මහා වතුරක් සෙයින් මරසෙනග දුරුකළේද, කෙළෙස් සතුරන් ජයගත්, පහවූ බිය ඇති දැමුණ, අචලවූ ඒ භල්ලිය මහණතෙම කෙළෙස් පිරිනිවනින් නිවීගියේය" ආයුෂ්මත් භල්ලිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

9. **වීර ථෙරගාථා:-** "යමෙක් අමාරුවෙන් හික්මිය යුතුවූයේ බුදුරදුන් විසින් හික්මවන ලද්දේද, මගඵල සුවින් හටගත් සතුටු ඇති තරණය කළ සැක ඇති, කෙලෙස් සතුරන් මැඩ ජයගත්තාවූ, පහවගිය ලොමුඩැහැගැනීම් ඇති අචලවූ ඒ වීර මහණතෙම, කෙලෙස් පිරිනිවනින් නිවීගියේය." ආයුෂ්මත් වීර තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

8. **පිළින්දිවච්ඡ ථෙරගාථා:-** "මාගේ මේ පැමිණීම මනා පැමිණීමකි නපුරු පැමිණීමක් නොවේ. (බුදුන් වෙත පැමිණෙමැයි) මා විසින් සිත විමසන ලද්දේද, නපුරු විමසීමක් නොවේ. (ඒ, ඒ ශාස්තෘවරයන් විසින් නොයෙක් ලෙස) විභාගකොට, දෙසනලද ධර්මයන් අතුරෙහි යම් ධර්මයක් අතිශයින් උතුම්වේද, ඒ ආර්යසත්‍ය ධර්මයට මම පැමිණියෙමි" ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **පුණ්ණමාස ථෙරගාථා:-** "යමෙක් මාර්ගඥාන පිළිවෙළින් නිවන් පැමිණියේද, සතර සත්‍යයන් දැන සිටියේද, (කෙලෙස් නිවීමෙන් සංසිඳුනේද, සැම පවින් වැළකී ගිය සිත් ඇත්තේද මෙලොවෙහි හා පරලොවෙහි තෘෂ්ණාව වෙසෙසින් හැරදැමූයේවේද, හෙතෙම ලොකයාගේ ඇතිවීමද, නැතිවීමද, දැන සියලු රූපාදී අරමුණු සයෙහි නොතැවරී සිටින්නේයි ආයුෂ්මත් පුණ්ණමාස තෙරණුවෝ මේ ගාථාව වදාළහ."

(පළමුවන වර්ගය නිමි.)

---

## 2. දෙවෙනි වර්ගය.

1. **චූලගවච්ඡ ථෙර ගාථා:-** "තථාගත බුදුන් විසින් දෙසන ලද සත්තිස් බොධිපාක්ෂික ධර්මයෙහි නොහොත් නව ලොවුතුරා දහමෙහි (ඇලීම් වශයෙන් ප්‍රීති බහුල ඇති මහණ තෙම සියලු සංස්කාරයන්ගේ සංසිඳීමට පිහිටවූ පරම සුඛවූ ශාන්ත පදයට පැමිණෙන්නේය." ආයුෂ්මත් චූලගවච්ඡ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. මහාගවච්ඡ ථෙර ගාථා:-** "අතිශය ප්‍රඥාබලයෙන් යුක්තවූ සිව් පිරිසුදු සිල්වලින් හා තෙළෙස් ධූතාංග ගුණයයි, කියන ලද ව්‍රතයන්ගෙන් සමන්විතවූ (උපචාර අර්පණා සමාධි විසින්) මුල, මැද, අග සමසේ පිහිටුවන ලද සිත් ඇත්තාවූ දෙවැදෑරුම් ධ්‍යානයෙහි ඇලුනාවූ, මුසුකළ සිහි ඇත්තාවූ පිණ්ඩපාත සේවනයෙන් ලැබෙන අටවැදෑරුම් ප්‍රයෝජනයෙන් පහනොවූ භොජනය වළඳන්නාවූ මේ සස්නෙහි පහකරනලද රාගය ඇති රහත් මහණ තෙමේ පරිනිර්වාණ කාලය බලාහිඳින්නේය."

ආයුෂ්මත් මහා ගවච්ඡ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. වන වච්ඡ ථෙර ගාථාව:-** "නිල් වලාකුළුබඳු සිත් කලුවූ සිහිල් දිය ඇති සුවිශුද්ධ ප්‍රදෙශයෝ නොහොත් ආර්යයන් දරන්නාවූ (පබලුවන්) ඉඳුගොව් පණුවන්ගෙන් වැසීගියාවූ ඒ පර්වතයෝ මා පිනවා ලති." ආයුෂ්මත් වනවච්ඡ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. වන වච්ඡ සාමණෙර ගාථා:-** "සීවකය, මෙයින් වනයට යම්හ"යි උපධ්‍යයන් වහන්සේ මට කීහ. මගේ කය ගම්හි වෙසේ, මා සිත වනයට ගියේය. සයනය කරමින් හෝ යෙමි කවර හෙයින්ද යත්? නුවණැතියන්ගේ කිසිතැනෙක ඇල්මෙක්නැත. එහෙයිනි" වන වච්ඡ සාමණෙර තෙම මේ ගාථාව වදාළේය.

**5. කුණ්ඩධාන ථෙර ගාථා:-** "කාමරාගාදී ඔරම්භාගිය පස් සංයෝජනයන් සිඳිනේය. රූප රාගාදී උද්ධම්භාගිය පස් සංයොජනයන් හරනේය. ශ්‍රද්ධාදී පස් ඉන්ද්‍රිය ධර්මයන් අනාගාමී මාර්ගයෙන් මත්තෙහිත් වඩනේය. පස් වැදෑරුම් සංඝයන් (ඇලුම්) ඉක්ම ගියාවූ රහත් මහණතෙම 'ඔඝතිණ්ණය'යි කියනු ලැබේ" ආයුෂ්මත් කුණ්ඩධාන තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. බෙල්ලට්ඨසීස ථෙර ගාථා:-** "යම්සේ යහපත් අං ඇති වාෂභාජානීය තෙමේ නගුල් මාර්ගයෙහි මද වෙහෙසින් යුක්තව ගමන් කෙරේද, එසෙයින්ම සසරට අයත් ආමිස නොමුසුවූ ඵල සමාපත්ති සුවයලත් කල්හි මා හට රෑ දාවල් මඳ වෙහෙසින්ම

(සුවසේම) ඉක්ම යන්නාහ." බෙල්ලට්ඨසීස නම් තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

7. **දාසක ථෙර ගාථා:-** "යම් කලෙක පුරුෂතෙම සිත කය පිළිබඳ අලසභාවයෙන් මැඩී ගියේ වේද, අධික ආහාර සේවනය ඇත්තේ වේද, නිදන සුලුවූයේ පෙරළි පෙරළි හෝනා සුළුවේද, කෑමෙන් පොෂණය කරන ලද මහත් ඌරෙකු මෙන් මඳ නුවණැති ඒ පුද්ගලතෙම නැවත නැවතත් මවුකුසට පැමිණේ." මේ ගාථාව ආයුෂ්මත් දාසක තෙරණුවෝ වදාළහ.

8. **සිගාලක පිතා ථෙර ගාථා:-** "බුදුහුගේ නව ලොවිතුරා දහම් නමැති දායාදයට හිමිවූ භික්ෂුවක් භෙසකලා නම්වූ වෙනෙහි වෙයි. (හෙතෙම) ඇට සැකිල්ලක් අරමුණු කොට ගෙන වඩන හෙයින් අට්ඨික සඤ්ඤා නම් ලත් භාවනායෙන් මේ අත් බැව් නමැති මුළු පොළොව පතුරුවාලීය. ඒ මහණ තෙම වහාම කාම රාගය පහ කෙරේයයි මම් හඟිමි." ආයුෂ්මත් සිගාලක පිතු තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

9. **කුණ්ඩල ථෙර ගාථා:-** "ජලය බෙදන්නෝ තමන් රිසි රිසි තැනට දිය ගෙන යති. හී වඩුවෝ හී ඇදහැර ලති. රිය වඩුවෝ ලී නමා ගනිති. ශීලාදී මහා ව්‍රත ඇති ධීරයෝ ආත්ම දමනය කෙරෙත්." ආයුෂ්මත් කුණ්ඩල තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **අජිත ථෙර ගාථා:-** "මරණය නිමිතිකොටගෙන මට බියෙක් නැත. ජීවිතය කෙරේ ආලයෙක් නැත. තීරණ ප්‍රඥාවෙන් හා මුහුකළ සිහියෙන් යුත් මම ස්වකීය දෙහය ඉවත ලා පියන්නෙමි." ආයුෂ්මත් අජිත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 3. තුන්වන වර්ගය.

1. **නිග්‍රොධ ථෙර ගාථා:-** "මම ජාති, ජරා, මරණාදිය හෙතුකොටගෙන පවත්නා සසර බියෙන් බිය පත් නොවෙමි. අපගේ ශාස්තෘන් වහන්සේ අමා මහ නිවන් විෂයෙහි දක්ෂ

වන සේක. යම් ආර්ය මාර්ගයෙක්හි (යථොක්ත) බිය නොසිටීද, භික්ෂූහු ඒ ආර්ය මාර්ගය කරණ කොටගෙන අභය ස්ථානයට යෙති" ආයුෂ්මත් නිග්‍රොධ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. චිත්තක ථෙර ගාථා:-** "නිල්වන් මනා බෙල්ලක් ඇති, මස්තකයෙහි හටගත් ශිඛායෙන් ශොභනවූ මයුරයෝ 'කාරවී' නම් වෙනෙහි නාද කරන්නාහ. ඒ මයුරයෝ තුමූ වැසි සුළං පීඩායෙන් හටගත් මිහිරිනාද ඇත්තාවූ, භාවනානු යුක්තවූ, ශයනප්‍රාප්තවූ මා ප්‍රබොධ කෙරෙත්." ආයුෂ්මත් චිත්තක තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. ගොසාල ථෙර ගාථා:-** "මම වූකලි හුණ ලැහැබෙක්හි මීයෙන් හැනූ කිරිබත වළඳා ස්කන්ධයන්ගේ ඇතිවීම නැතිවීම ශාස්තෘ ශාසනය යහපත් සේ පිළිගැන්මෙන් සම්මර්ශනය කොට (රහත්වීමි.) විවේක සුවය වඩමින් (යළිත් සාණු පර්වතය කරා යමි)" ආයුෂ්මත් ගොසාල තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. සුගන්ධ ථෙර ගාථා:-** "පැවිදිව ඉක්ම ගිය එක් වස් ඇති මහණෙකි. ඔහු විසින් ත්‍රි විද්‍යාවෝ පැමිණෙන ලදහ. බුදුන්ගේ අවවාදය කරණ ලදී. ධර්මයාගේ නෛර්යාණික බවක් බලව" ආයුෂ්මත් සුගන්ධ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. නන්දිය ථෙර ගාථා:-** "යමක්හුගේ සිත නිත්‍යයෙන් ඥානාලොකයෙන් හටගත් ආලොක ඇත්තේ වේද, අග්‍ර ඵලයට පැමිණියේ වේද, පාපිය, එබඳු රහත් මහණහුට විරොධ කොට (තෝ) දුකට පත්වන්නෙහිය." ආයුෂ්මත් නන්දිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. අභය ථෙර ගාථා:-** "සූර්ය බන්ධුවූ බුදුහුගේ සුභාෂිත තෙපුල් අසා සත් කඩක් කොට පැළූ අශ්ව රොමයක් ඊයකින් විදුනාක් මෙන් පරම සුඛවූ නිර්වාණ ධර්මය මම අවබොධ කළෙමි." ආයුෂ්මත් අභය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. ලොමසකංගිය ථෙර ගාථා:-** 1. "හීතණ වුවද, කුසතණ වුවද, වැලුක් පඳුරු වුවද, මෘදු තණ වුවද, සුවඳ හොට පඳුරු වුවද, බබුස්තණ වුවද, ත්‍රිවිධ විවේකය වඩන්නෙමි අතින් පයින්

කියනු කිම? ළයින් උවදු ඉවත් කරන්නෙමි.” ආයුෂ්මත් ලොමසකංගිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

8. **ජම්බුගාමිය පුත්ත ථෙර ගාථා:-** “කිම? තෙපි චීවරාදී සැරසීමෙහි නොයෙදුනහුද? කිම? ආත්ම භාවය සැරසීමෙහි නොඇලුනහුද? කිම? තොපගේ ශීලමය සුගන්ධය හැම දිශාවන්හි හමවහුද, දුශ්ශීල ප්‍රජාතොමෝ එසේ කළ හැකි නොවන්නීය.” ආයුෂ්මත් ජම්බුගාමිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

9. **හාරිත ථෙර ගාථා:-** “හාරිතය, තාගේ සිත සමාපත්ති වශයෙන් හෝ වීර්යාරම්භ වශයෙන් ඔසවා ගන්න. හී ඇද හරින හී වඩුවකු සේ සිත ඍජු කොටගෙන සිව්සස් වසා සිටි සසරට මුල්වූ අවිද්‍යාව බිඳලන්න.” ආයුෂ්මත් හාරිත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **උත්තිය ථෙර ගාථා:-** “මාහට ආබාධයක් හටගත් කල්හි මට මේ ආබාධයෙක් උපන. මට නොපමා වන්නට මේ කලැයි සිහියක් පහළවී” ආයුෂ්මත් උත්තිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 4. සතරවන වර්ගය.

1. **ගහ්වර තීරිය ථෙර ගාථා:-** “අරණ්‍ය නම් ලත් ඒ මහා වනයෙහි ඇටමැසි-මදුරු මැස්සන් විසින් පහස්නා ලද්දාවූ ස්මෘති සම්පන්න බුද්ධ ශ්‍රාවකතෙම යුද පෙරමුණෙහි ඇතකු මෙන් ඉවසන්නේය.” ආයුෂ්මත් ගහ්වර තීරිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

2. **සුප්පිය ථෙර ගාථා:-** “ඇසිල්ලක් පාසා ජරාවට පැමිණෙන්නාවූ රාගාදී එකළොස් ගින්නකින් දැවෙන්නාවූ මේ කයින් ජරා විරහිතවූ පරම ශාන්තවූ කාමාදී යොගයන්ගේ විනාශයට පිහිටවූ අතිශයින් උතුම්වූ නිවන පරිවර්තනය කරන්නෙමි.” ආයුෂ්මත් සුප්පිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. සොපාක ථෙර ගාථා:-** "යම්සේ ප්‍රියවූ එක් පුත්‍රයකු විෂයෙහි දෙමවුපියෝ ඒකාන්ත හිතවත්හු වෙද්ද, එමෙන් හැමතන්හි සෑම සතුන් විෂයෙහි ඒකාන්ත හිතෛෂී වන්නේය." ආයුෂ්මත් සොපාක තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. පොසිය ථෙර ගාථා:-** "මේ ස්ත්‍රීහු නම් නිතොර නොළංවූව හුම හිත වැඩ එළවන්නෝ වෙති. නුවණැත්තහු විසින් මේ බව දතයුතුය. පොසිය නම් ලත් මම වනයෙන් නික්ම ගමට ගොස් ඉන් ගෙට ගියෙමි. ඉන් නැඟිට පැරණි දෙවැන්නියට නොකියාම ඉවත්ව ගියෙමි." ආයුෂ්මත් පොසිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. සාමඤ්ඤකානි ථෙර ගාථා:-** "ලොවී ලොවුතුරා සුවයෙන් ප්‍රයෝජන ඇති යමෙක් නිවන් පසක් කරනු සඳහා ඍජුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය සිය සතන්හි උපදවා ගනීද, ඒ ආර්ය මාර්ගයෙහි හැසිරෙන්නාවූ පුද්ගලතෙම ඒ ලොවී ලොවුතුරා සැපය ලබන්නේය. එපමණක් නොවේ කීර්තියටද පරිවාර සම්පත්තියටද පැමිණේ." ආයුෂ්මත් සාමඤ්ඤකානි තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. කුමාපුත්ත ථෙර ගාථා:-** "බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබව මැනව, යහපත් චරිතය මැනව, පංචකාම ගුණ නැමැති නිකෙතනයෙන් (ගෙයින්) වෙන්වූ වාසය සෑම කල්හි මැනව, කුශලාකුශලාදී අර්ථයන් ප්‍රශ්න කිරීම මැනවි, ගෞරවයෙන් අවවාදය පිළිගන්නේ මැනව, මේ ගුණ පස කෙත්වත් රන් රිදී ආදී අයිතියක් නැති ශ්‍රමණයාගේ ශ්‍රමණ භාවය වේ." ආයුෂ්මත් කුමාපුත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. කුමාපුත්ත සහායක ථෙර ගාථා:-** "අසංයතවූ (හික්මීමක් නැති) භික්ෂූහු ඒ ඒ ජනපදයන්හි හොඳට ආහාරපාන ලැබීමාදී කල්පනාවන් කෙරෙමින් නොයෙක් ජනපදයනට යන්නාහ. සමාධියද වරදවා ගනිති, ජනපද චාරිකාව කුමක් කරන්නීද? එහෙයින් වෙසෙන ප්‍රදෙශයන් කෙරේ උපන් විරොධය සංසිඳුවා ගෙන මිථ්‍යා කල්පනා පෙරටුකොට නොගෙන ධ්‍යාන වඩන්නේය." ආයුෂ්මත් කුමාපුත්ත තෙරුන්ගේ යහළු තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

8. **ගවම්පති ථෙර ගාථා:-** "යමෙක් ඍද්ධි බලයෙන් 'සරභූ' නම් මහා ගඟ (ගලන්නට නොදී දිය පහර නවතා පර්වත කූටයක් සේ මහත් දිය කඳ) රැඳවීද, ඒ ගවම්පති තෙර කිසිදු බන්ධනයකින් නොබැඳුණෙක, තෘෂ්ණා නැත්තෙක. සියලු රාගාදී ඇලීම් ඉක්මවා ගියාවූ භවයාගේ පරතෙරට පැමිණි පූජ්‍යවූ ඒ ක්ෂීණාශ්‍රව මුනීන් දෙවියෝ වඳනාහ." ආයුෂ්මත් ගවම්පති තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

9. **තිස්ස ථෙර ගාථා:-** "සිහි ඇති සසර බිය දක්නා මහණතෙම සිරියෙන් (අඩයටියෙන්) පහළක්හු මෙන්ද මස්තකය ගිනිගෙන දැවෙන කළෙක්හි මෙන්ද, කාම රාගය ගෙවා හරනා පිණිස අප්‍රමාදව වාසය කරන්නේය." ආයුෂ්මත් තිස්ස තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **වඩ්ඪමාන ථෙර ගාථා:-** "ස්මෘති සම්පන්න සසර බිය දක්නා මහණතෙමේ සිරියෙන් පහළක්හු මෙන්ද, භව රාගය ගෙවා හරනා පිණිස අප්‍රමාදව වාසය කරන්නේය." ආයුෂ්මත් වඩ්ඪමාන තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 5. පස්වන වර්ගය.

1. **සිරිවඩ්ඪ ථෙර ගාථා:-** "විදුලීහු වෙභාර පර්වතයාගේද පාණ්ඩව පර්වතයාගේද අතර එල්ල කොට ගෙන හෙන්නාහ. උපමා රහිතවූ අෂ්ට ලෝක ධර්ම විෂයෙහි අකම්පිතවූ බුදුහුගේ පුතෙක් පර්වත දෙකක් අතරට පැමිණියේ ධ්‍යාන වඩයි." ආයුෂ්මත් සිරිවඩ්ඪ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

2. **ඛදිරවනිය රෙවත ථෙර ගාථා:-** "චාලායෙනි, උපචාලායෙනි, සීසූප චාලායෙනි, කිම තෙපි සිහියෙන් යුක්තව වාසය කරන්නහුද? විනිවිද දක්නාවූ වාලවෙධියකු වැනි තොපගේ මයිල් තෙරණුවෝ වැඩිසේක." ආයුෂ්මත් ඛදිරවනිය රෙවත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

3. **සුමංගල ථෙර ගාථා:-** "අර්හත් ඵල විමුක්තියෙන් යහපත්ව මිදුණෙමි. මනාකොටම මිදුණෙමි. කුදුගති තුනෙකින් මනාසේ

ඒකාන්තයෙන්ම මිදුණෙමි. දෑකැති කුදයෙන් මම මිදුණෙමි. නගුල් කුදයෙන් මම මිදුණෙමි. උදලු කුදයෙන් මම මිදුණෙමි. ඉදිනුත් ඒ දෑකැති ආදිය මෙහි මා සමීපයෙහිම පවතිද්ද, එතෙකුදු වුවත් එයින් කමෙක් නැත, කමෙක් නැත්මය, සුමංගලය, ධ්‍යාන වඩව, සුමංගලය, ධ්‍යාන වඩව, සුමංගලය අප්‍රමාදව වාසය කරව." ආයුෂ්මත් සුමංගල තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. සානු ථෙර ගාථා:-** "මෑණියෙනි, (මේ ලොකයෙහි ජනයෝ) මළවුන් ගැනද ජීවත් වුවත් නොපැනෙන්නවුන් ගැනද හඬන්නාහ. මෑණියෙනි, ජීවත්ව සිටින මා දන්නෙහිය. මෑණියෙනි, මා ගැන කුමට හඬනෙහිද" ආයුෂ්මත් සානු තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. රමණීය විහාරී ථෙර ගාථා:-** 1. යම්සේ යහපත්වූ වෘෂභාජානීය තෙම (වෙහෙසට පත්ව) පැකිලී යළිත් සිටිසේම පිහිටා සිටීද, එසේ මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් දර්ශන සම්පන්නවූ, සම්‍යක් සම්බුද්ධයන්ගේ ශ්‍රාවකයා සලකව්." ආයුෂ්මත් රමණීය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. සමිද්ධි ථෙර ගාථා:-** "මම සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවීමි. මාගේ ස්මෘති ප්‍රඥාගුණයෝ වැඩී ගියහ. මාගේ සිතද මනාකොට එකාරම්මණයෙක්හි පිහිටියේය. මාරය, තෝ රිසිසේ භයජනක රූපයන් කරන්න, තෝ මා පෙළාලිය නොහෙන්නෙහිමය" ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. උජ්ජය ථෙර ගාථා:-** "බුද්ධ වීරයන් වහන්ස, නුඹ වහන්සේට මාගේ නමස්කාරය වේවා. නුඹ වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණු සේක. නුඹවහන්සේගේ අවවාදයෙහි (ප්‍රතිපත්ති මාර්ගයෙහි) පිහිටා වාසය කරන්නෙමි කාමාදී කල්ගතවූ කෙලෙස් නැතිව වෙසෙමි" ආයුෂ්මත් උජ්ජය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**8. සංජය ථෙර ගාථා:-** "යම් තැනෙක පටන් මම ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදිවීම්ද, එතැන් පටන් ලාමකවූ රාගාදී දොසින්

යුක්තවූ, මිථ්‍යාවිතර්කයක් නොදනිමි.” ආයුෂ්මත් සංජය තෙරණුවෝ මේ ගාථා වදාළහ.

**9. රාමණෙය්‍යක ථෙර ගාථා:-** “විහ විහ, යයි රැව් දෙන වටුවන්ගේ නාදය හෙතුකොට ගෙන වේවයි, උණහපුළුවන්ගේ නොහොත් වඳුරන්ගේ නාදය හෙතුකොට ගෙන වේවයි මාගේ සිත නෙසැලෙන්නේය. ඒ එසේමැයි මාගේ සිත එකත්වයෙහි එකඟබවෙහි නිති ඇලී ගියේය” ආයුෂ්මත් රාමණෙය්‍යක තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**10. විමල ථෙර ගාථා:-** “පොළවද, තෙමීයයි. සුළඟද හමයි. අහස්හි විදුලියද, හැසිරෙයි. කාමාදී විතර්කයෝ සංසිඳෙති. මාගේ සිත ලොකොත්තර සමාධියෙන් යහපත්ව පිහිටියේය. ආයුෂ්මත් විමලතෙරණුවෝ මේ ගාථා වදාළහ.

**පස්වන වර්ගය නිමි.**

---

# 6 වන වර්ගය

**1. ගොධික ථෙර ගාථා:-** “වැසි වලාව සුන්දර ගීතයක් මෙන් ගර්ජනය කෙරෙමින් වසී. මාගේ සෙවෙනි කළ කුටිය සැප එළවන්නීය. වාත ප්‍රවේශ රහිතය. මාගේ සිත නිවන් අරමුණුකොටගෙන යහපත්ව පිහිටියේය. මෙඝයා දැන් කැමැත්තෙහි නම් වසින්න” ආයුෂ්මත් ගොධික තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. සුබාහු ථෙර ගාථා:-** “වැසි වලාව සුන්දර ගීතක් මෙන් ගර්ජනය කෙරෙමින් වසී. සෙවෙනි කළ මාගේ කුටිය සැප එළවන්නීය. වාතප්‍රවේශ රහිතය. මාගේ සිත කායගතාසතිභාවනාරම්මණයෙහි යහපත්ව පිහිටියේය. වැසිවළාව කැමැත්තෙහි නම් වසින්න.” ආයුෂ්මත් සුබාහු තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. වල්ලිය ථෙර ගාථා:-** “වැසිවළාව සුන්දර ගීතයක් ගර්ජනය කෙරෙමින් වසී. සෙවෙනි කළ මාගේ කුටිය සැප එළවන්නීය.

වාතප්‍රවේශ රහිතය. එහි අප්‍රමාදව වෙසෙමි. වැසිවළාව, දැන් කැමැත්තෙහි නම් වසින්න.” ආයුෂ්මත් වල්ලිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. උත්තිය ථෙර ගාථා:-** “මෙඝය තෙමේ සුන්දර ගීතයක් මෙන් වසී. සෙවෙනි කළ මාගේ කුටිය සැපය එළවන්නීය. වාතප්‍රවේශ රහිතය. එහි තනියම වාසය කෙරෙමි. මෙඝය, දැන් කැමැත්තෙහි නම් වසින්න.” ආයුෂ්මත් උත්තිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. අංජනවනීය ථෙර ගාථා:-** “අඳුන් වනයට බැස දික්හඟලා පුටුව කුටියක් කොටගෙන (වාසය කළ මා විසින්) ත්‍රිවිද්‍යාවෙන් පැමිණෙන ලද්දාහ. බුදුහුගේ අනුශාසනය කරන ලදී.” ආයුෂ්මත් අංජනවනීය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. කුටි විහාරි ථෙර ගාථා:-** “කුටියෙහි කවරෙක්ද? කුටියෙහි පහකළ රාගය ඇති නිර්වාණාරම්මණයෙහි යහපත්ව පිහිටි සිත් ඇති භික්ෂුවෙකි. ඇවත, මෙසේ දැනගන්න. තා විසින් කරනලද කුටිකා තොමෝ නොසිස් වූවාය.” ආයුෂ්මත් කුටිවිහාරි තෙරණුවෝ මේ ගාථා වදාළහ.

**7. දෙවන කුටි විහාරී ථෙර ගාථා:-** “මේ කුටි තොමෝ පරණව ගියාවෙයි. තෝ වෙන අලුත් කුටියක් පතන්නෙහිය අලුත් කුටියෙහි ආශාව දුරුකරන්න මහණ, නැවත අලුත් කුටිය දුක්වන්නීය.” ආයුෂ්මත් කුටිවිහාරී තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**8. රමණීය කුටික ථෙර ගාථා:-** “මාගේ කුටිකා තොමෝ සිත්කලුය. සැදැහැවතුන් විසින් දෙන ලද්දීය. සිත් අලවන්නීය. (තොප කීයේ සැබෑමය. එහෙයින්) මට කුමරියන්ගෙන් ප්‍රයොජනයක් නැත. කාන්තාවෙනි, (තොපගෙන් යම් කෙනෙකුන්ට ප්‍රයොජනයෙක් වේ නම් එහි යව්.” ආයුෂ්මත් රමණීය කුටික තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**9. කොසල විහාරී ථෙර ගාථා:-** “මම සැදැහැයෙන් පැවිදිවීමි. මට වෙනෙහි කුටිකාවක් කරන ලදු, නොපමාවිමි.

කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත වීමි. මුහු කළ නුවණ ඇත්තෙමි. පැමිණි සිටි සිහි ඇත්තෙමි.” ආයුෂ්මත් කොසල විහාරී තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **සීවලී ථෙර ගාථා**:- “විද්‍යාවිමුක්ත්‍යාදී යම් ලාභයක් ප්‍රයෝජන කොට ඇත්තෙම් කුටි නම්වූ ශූන්‍යාගාරයට වැද්ද ගනිම්ද, මාගේ ඒ කුශලසංකල්පයෝ සමෘද්ධව ගියහ. ත්‍රිවිද්‍යාවන් හා අර්හත්ඵල විමුක්තිය සොයමින් නවවිධ මානය හා සප්තවිධ අනුශය ගෙවා හැරියෙමි.” ආයුෂ්මත් සීවලී තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 7 වන වර්ගය

1. **වප්ප ථෙරගාථා**:- “මනා නුවණින් ස්වභාව ධර්මය අවිපරීත ලෙස දක්නා තැනැත්තේ දර්ශන සම්පන්න අන්‍යයාද (ආර්යයාද) දකියි. ස්වභාව ධර්මය අවිපරීත ලෙස නොදත් පෘථග්ජනයාද දකියි. ස්වභාව ධර්මය අවිපරීත ලෙස නොදත් පෘථග්ජනතෙමේ දර්ශන විරහිත පෘථග්ජනයාද දර්ශන සම්පන්න ආර්යයාද නොදකියි.” ආයුෂ්මත් වප්පතෙරණුවෝ මේ ගාථාව වදාළහ.

2. **වජ්ජිපුත්ත ථෙරගාථා**:- “අපි වෙනෙහි හරනලද දරකඩක්සේ තනිව වාසය කෙරෙමු. ඒ මාහට බොහෝ නුවණැත්තෝ ස්වර්ගගාමීන්ට නිරයේ උපනුන් මෙන් කැමැති වෙත්.” ආයුෂ්මත් වජ්ජිපුත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

3. **පක්ඛ ථෙරගාථා**:- “යම් කෙනෙක් කුශලධර්මයෙන් ගිලිහුණෝ වෙද්ද, ඔවුහු නිරයාදියෙහි වැටීයෙති, (එසේ) වැටී ගියෝද භව සැපතෙහි ගිජුවූවාහු යළි යළිත් සසරදුකට වැටෙන්නාහ. මා විසින් සිවු මගින් කටයුතු සොළොස් වැදෑරුම් කිසකොට නිමවනලදී. ඇලියයුතු නිවනෙහි ඇලුම් කරනලදී. ඵල සමාපත්ති සුඛයෙන් නිවණට අනුක්‍රමයෙන් පැමිණෙනලදී.” ආයුෂ්මත් පක්ඛ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. විමල කොණ්ඩඤ්ඤ ථෙරගාථා:-** "ගසෙක නම ඇත්තියකු කෙරේ හෙවත් අම්බපාලී ගණිකාවගේ කුසෙහි උපන්නේය. සුදු කොඩියක් ඇත්තකු හෙවත් බිම්සර රජහු කරණකොටගෙන හටගත්තේය. (උඩට ඔසවන අර්ථයෙන්) 'කේතු' නම් පත් මානය ගෙවා හළ විමල කොණ්ඩඤ්ඤ, (කුශලධර්මයන්හි උද්ගතාර්ථයෙන්) කේතු නම් ලත් ප්‍රඥායෙන්ම 'මහාකෙතු' නම් ලත් මාරයාගේ බලය මැඩලීය" ආයුෂ්මත් විමල කොණ්ඩඤ්ඤ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. උක්ඛෙපකට වච්ඡ ථෙරගාථා:-** "උක්ඛෙපකට වච්ඡයා විසින් බොහෝ හවුරුදු ගණනෙකින් (ළෙහිදරා) එකතුකොට ගන්නාලද යම් බුද්ධ වචනයක් වේද, ධර්මයෙහි මනාසේ පිහිටා හුන්, (ඒ සමාපත්ති වශයෙන් හා ධර්මදෙශනා වශයෙන්) උපන් උදාර ප්‍රීති ඇති වච්ඡතෙමේ ඒ ධර්මය ගිහියනට දෙශනා කෙරෙයි." ආයුෂ්මත් උක්ඛෙපකට වච්ඡ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. මෙඝිය ථෙරගාථා:-** "සියලු දතයුතු ධර්මයන්ගේ පරතෙරට පත් මහා වීරයන්වහන්සේ අනුශාසනා කළසේක. මේ උන්වහන්සේගේ ධර්මය අසා සිහියෙන් යුක්තව ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි වාසය කෙළෙමි. මා විසින් ත්‍රිවිද්‍යාවෝ අනුක්‍රමයෙන් පැමිණෙන ලදහ. බුදුහුගේ අනුශාසනය කරනලදී." ආයුෂ්මත් මෙඝිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. එකධම්ම සවණිය ථෙරගාථා:-** "මා විසින් රාගාදී ක්ලේශයෝ දවනලදහ. සියලු කාමාදී භවයෝ නසන ලදහ. ජාති දුක් ප්‍රධානකොට ඇති සසර විශෙෂයෙන් ගෙවා හරින ලදී. දැන් මතුභවයෙහි ඉපදීමෙක් මට නැත්තේය." ආයුෂ්මත් එකධම්ම සවණිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**8. එකුදානිය ථෙරගාථා:-** "උතුම් අර්හත්ඵල චිත්තයෙන් යුක්තවූ නොපමාවන්නාවූ අර්හත් මාර්ගඥාන ප්‍රතිලාභයට උපායවූ සත්තිස් බොධිපාක්ෂික ධර්මයෙහි හික්මෙන්නාවූ අටලෝ දහම්හි කම්පා නොවූ රාගාදී ක්ලේශ තැවිලි නැති බැවින් සන්සිඳුනාවූ සියලු කල්හි සිහියෙන් යුක්තවූ ක්ෂීණාශ්‍රව

මුනිහට ඉෂ්ට වියොගාදී වස්තුක ශෝකයෝ නොවෙති.” ආයුෂ්මත් එකුදානිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**9. ඡන්න ථෙරගාථා:-** “භාග්‍යවතුන් වහන්සේගේ මහා රසවත්වූ උත්තම සර්වඥතාඥානයෙන් පරිපූර්ණ බුදුහු විසින් දෙශනාකරණලද ධර්මය අසා නිවන් පැමිණෙනු පිණිස ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිළිපැද්දෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ සතර යෝගයන්ගෙන් උපද්‍රව නැති නිර්වාණ මාර්ගයෙහි දක්ෂ වනසේක.” ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙම මේ ගාථාව වදාළහ.

**10. පුණ්ණ ථෙර ගාථා:-** “මේ ශාසනයෙහි ශීලයම අග්‍රවේ. ඥාණ සම්පන්න පුද්ගලතෙමේ උතුම්වේ. මිනිසුන් විෂයෙහිද, දෙවියන් විෂයෙහිද, ශීලය හා ප්‍රඥාව හේතුකොට ගෙන ප්‍රතිපාක්ෂිකයන් පරදවා ජයගැන්මවේ.” ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 8 වන වර්ගය

**1. වච්ඡපාල ථෙරගාථා:-** “සියුම්වූ නිපුණවූ පටිච්ච සමුප්පාදාදී අර්ථයන් ලක්ෂණ ත්‍රයයට නගා දක්නාසුළුවූ ප්‍රඥා විෂයෙහි දක්ෂවූ සබ්‍රම්සරුන් කෙරේ යටත් පැවතුම් ඇති සෙවුනාලද වෘද්ධ ස්වභාව ඇති නොහොත් සෙවුනාලද වෘද්ධශීලීන් ඇත්තාවූ ඒ යොගාවචරයා විසින් නිවන් දුකසේ ලැබියයුතු නොවේ.” ආයුෂ්මත් වච්ඡපාල තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. ආතුම ථෙරගාථා:-** “යම්සේ මොනවට වැඩීගිය ආශා ඇති හටගත් ලොකු කුඩා අතු ඇති හුණ කිළිලතෙමේ හුණ පඳුරෙන් බැහැරලන්නට නොහැකිවේද, බිරින්දක් ගෙන ආකල මමද එසේ ගෘහවාසයෙන් නික්මගත නොහෙන්නෙමි. මම දැන් පැවිදිවීමි. මට දැන් අනුදතමැනවි.” ආයුෂ්මත් ආතුම තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. මාණව ථෙරගාථා:-** “ජරායෙන් මඩනාලද එකක්හුද දුකටපත් හටගත් වෘද්ධි ඇති එකක්හුද, ආයුෂයාගේ පිරිහීමට

පැමිණ මළඑකකක්හුද, දැක ඒ හේතුවෙන් සංවේගප්‍රාප්තවූ මම සිත්කලුවූ පඤ්චකාමයන් හැරපියා ගිහිගෙන් නික්ම පැවිදිවීමි.” ආයුෂ්මත් මාණව තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

4. **සුයාම ථෙරගාථා:-** “රහත් භික්ෂුවක්හට පඤ්චකාම ගුණික රාගයයි කියනලද කාමච්ඡන්දයද, නවවිධ ආඝාත වස්තූන් මුල්කොට උපදනා ක්‍රොධයයි කියනලද ව්‍යාපාදයද චිත්ත-කාය දෙදෙනාගේ ලොඩගතියවූ ථීනමිද්ධයද, චිත්තයාගේ නොසන්සුන් ස්වභාවූ උද්ධච්චයද, බුද්ධාදී වස්තුවිෂයෙහි සැකකිරීම ලක්ෂණකොට ඇති විචිකිච්ඡාවද, නිරවශෙෂ වශයෙන්ම නැත්තේය.” ආයුෂ්මත් සුයාම තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

5. **සුසාරද ථෙරගාථා:-** (ශීලාදී ගුණයෙන් යහපත්ව සංවරණය කළ අත්බැව් ඇති පරානුකම්පායෙන් යහපත්ව කළ දහම් දෙසුන් ඇති) “ආර්යයන්ගේ දර්ශනය යහපත් වෙයි (කුමක් හෙයින්දයත්? ඔවුන්ගේ දැකීම් ඇතිකල) සැක සිඳීයන්නීය. ලෞකික-ලොකොත්තර ප්‍රඥාව වැඩෙන්නීය. ඒ ආර්යයෝ බාලයාද පණ්ඩිතයකු කෙරෙති, එහෙයින් සත්පුරුෂයන්ගේ සමාගමය යහපත් වන්නේය.” ආයුෂ්මත් සුසාරද තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

6. **පියඤ්ජහ ථෙරගාථා:-** “සත්වයන් මානාදියෙන් තමන් උසස්කොට හඟනා කල්හි යටත් පැවතුම් ඇතියෙක් වන්නේය. හීන අදහස් ඇති බැවින්ද කුසීත භාවයෙන්ද ගුණයෙන්ද පහත්වනකල්හි තෙමේ ප්‍රණීත අදහස්වලින්ද ගුණයෙන්ද උසස් වන්නේය. නොහොත් කෙලෙසුන් නැගී සිටින කල්හි නොඋපදනා සැටියෙන් ඒවා සිඳහරනේය. (සත්වයන්) මාර්ගබ්‍රහ්මචරිය වාසයද අරියවාසයද නොවසන කල්හි, තෙමේ ඒ උත්තම වාසයන්හි යෙදී වසන්නේය. (සත්වයන්) කාමගුණරතියෙන් හා කෙලෙස් රතියෙන් ඇලෙන කල්හි තෙමේ එසේ නොඇලෙන්නේය.” ආයුෂ්මත් පියඤ්ජහ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

පටුන



7. **හත්ථාරොහකපුත්ත ථෙරගාථා:-** "මේ සිත (නිග්‍රහ කාලයෙන්) පෙර රමණයට සුදුසු යම් යම් අරමුණු වශයෙන් කැමති පරිදි සුව පරිදි සැරිසරා ගියේය. ඒ සිත මෙකල්හි මතැතක්හු දමාලන හස්ත්‍යාචාර්යයකු මෙන් උපාය මනස්කාරයෙන් මැඩලන්නෙමි." හත්ථාරෝහකපුත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

8. **මෙණ්ඩසිර ථෙරගාථා:-** "නොයෙක් ජාති ශතසහශ්‍රයෙන් යුත් සසරවට මුළුල්ලෙහි භවගති නවතාලන අර්හත් මාර්ග ඥානය නොලබනු මේ නොවිඳින්නේ චුති-උත්පත්ති වශයෙන්) දිව ඇවිද්දෙමි. හටගත් දුක් ඇති ඒ මාගේ දුක් රැස (දැන්) ගිලිහී පහව ගියේය." ආයුෂ්මත් මෙණ්ඩසිර තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

9. **රක්ඛිත ථෙරගාථා:-** "කාමරාගාදී ප්‍රභෙද ගත සියලුම රාගය මා විසින් ප්‍රහීණ කරනලදී. සියලුම ව්‍යාපාද එසෙයින්ම නැසිණ, මා විසින් සියලු මොහය (අර්හත් මාර්ග ඥානයෙන්) පහකරනලදී. සිහිල්බවට පැමිණියෙමි. නිවී ගියෙමි." ආයුෂ්මත් රක්ඛිත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **උග්ග ථෙරගාථා:-** "මා විසින් කරනලද අල්පවූ හෝ බොහෝ වූ හෝ යම් කුශලාකුශලකර්මයෙක් වීද, ඒ සියලු කර්මය හාත්පසින් ක්ෂයව ගියේය. මතු බවෙහි ඉපදීමෙක් මට නැත්තේය." ආයුෂ්මත් උග්ගතෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 9. වන වර්ගය.

1. **සමිතිගුත්ත ථෙර ගාථා:-** "මා විසින් මෙයට පෙර අන්‍ය ජාතීන්හි කළ යම් පවෙක් වේද, ඒ පාපය මේ ආත්මභාවයෙහි පමණක් වින්ද යුතුය. ඒ කර්මයාගේ විපාකයට අවසර ලත් අන්‍ය ස්කන්ධ ප්‍රබන්ධයෙක් නැත්තේය." ආයුෂ්මත් සමිතිගුත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. කස්සප ථෙර ගාථා**:- "යම් මේ දිශා භාගයෙක්හි යහපත්වූ නිර්භයවූ පිඬු සුලබ රටවල් වේද්ද, සුරතල් දරුව එහි යව, ශොකයෙන් මඩනා ලද්දෙක් නොවෙව-" ආයුෂ්මත් කස්සප තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. සීහ ථෙර ගාථා**:- "සීහය, දිවා රෑ දෙක්හි නොමැළිව නොපමාව වාසය කරන්න සමථ විදර්ශනාදී කුශල ධර්මය වඩන්න ආත්මභාවය වහා හැරලන්න." ආයුෂ්මත් සීහ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. නීත ථෙර ගාථා**:- "මුළු රැය නිදා පියා දහවල් තිරශ්චීන කථායුත් කය තර කිරීමෙහි යෙදුණු භික්ෂු සාමණෙරයන් සමග මුසුව විසීමෙහි ඇලුණු අඥාන තැනැත්තේ කවර නම් කලෙක සසර දුක කෙළවර කරන්නේද?" ආයුෂ්මත් නීත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. සුනාග ථෙර ගාථා**:- "භාවනා චිත්තය පිළිබඳ නිමිත්ත ග්‍රහණයෙහි දක්ෂවූ යොගාවචර තෙමේ උත්තම විවෙක රසය හැඳිනගෙන ධ්‍යාන වඩන්නේ කමටහන්ගෙන හැසිරීමෙහි දක්ෂවූයේ පැමිණ සිටි සිහි ඇත්තේ නිරාමිසවූ නිර්වාණ සුඛඵල සුඛයනට පැමිණෙන්නේය." ආයුෂ්මත් සුනාග තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. නාගිත ථෙර ගාථා**:- "මේ ශාසනය කෙරෙන් පිටත නානා තීර්ථකයන්ගේ සමයයන්හි 'මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය නැති නිවන් වදනා මඟෙක් නැත්තේය"යි භාග්‍යවත්වූ ශාස්තෲන් වහන්සේ බික් සඟනට අත්ලෙහි තුබූ මිණිරුවනක් සෙයින් පැහැදිලිකොට දක්වමින් අනුශාසනා කරනසේක." ආයුෂ්මත් නාගිත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. පවිට්ඨ ථෙර ගාථා**:- "මා විසින් පඤ්චස්කන්ධයෝ විදර්ශනා ප්‍රඥා සහිත මාර්ග ප්‍රඥායෙන් අවිපරීත කොට දක්නා ලදහ, හැම භවයෝ මාර්ග ඥාන නැමැති පොරොවින් පලා පියන ලද්දාහ. ජාතිදුක් මුල්කොට පවත්නා සසර වෙසෙසින් ක්ෂය කරන ලද්දේය. දැන් මතු භවයෙහි උපැද්මෙක් මට නැත්තේය." ආයුෂ්මත් පවිට්ඨ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**8. අජ්ජුන ථෙර ගාථා**:- "මහත් දිය වතුරෙක්හි පා කොට ගෙනයනු ලබන්නකු වැනිවූ මම සසර නැමැති දියවරින් නිවන් නමැති ගොඩබිමට තමා නගා ගන්නට හැකි වීමි. විස්මයෙකි, මම සතර සත්‍යයන් දැන ගතිමි." ආයුෂ්මත් අජ්ජුන තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**9. දෙවසභ ථෙර ගාථා**:- "කාම රාග නමැති ප්‍රකෘති මඩද අඹුසැමි ආදීන් විෂයෙහි පවත්නා බලවත් රාග නමැති ගෝරු මඩද මා විසින් එතෙර කරන ලද්දාහ. දෙසැට දෘෂ්ටි නමැති පාතාලයෝ දුරුකරන ලද්දාහ. කාමාදී සතර සැඩ වතුරෙන්ද අභිජ්ඣාදි සතර ගැටවලින්ද මිදුනෙමි. නවවිධ මානයෝ වෙසෙසින් නසාපියන ලදහ." ආයුෂ්මත් දෙවසභ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**10. සාමිදත්ත ථෙර ගාථා**:- "මා විසින් පංචස්කන්ධයෝ ලක්ෂණ රසාදි වශයෙන්ද අනිත්‍යාදි වශයෙන්ද පිරිසිඳ දන්නා ලදහ. (ඔවුහු) සිඳීගිය තෘෂ්ණා නමැති මුල් ඇත්තාහු සිටිනාහ. ජාතිදුක් මුල්කොට පවත්නා සසර වෙසෙසින් ක්ෂය කරන ලද්දේය. දැන් මතු බවෙහි ඉපදීමෙක් මට නැත්තේයි." ආයුෂ්මත් සාමිදත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 10 වන වර්ගය

**1. පරිපුණ්ණක ථෙර ගාථා**:- "සියල්ල දක්නාසුලුවූ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් දෙශනාකරන ලද යම් නිර්වාණ ධර්මයක් වේද, මෙකල මා විසින් යම් නිවන් රසයෙක් වළඳන ලද්දේද රාජ කාලයෙහි වැළඳූ සතරස භෝජනය හෝ දිව්‍යාත්මභාවයෙහි වැළඳූ දිව්‍යාහාරය හෝ එසේ සම්භාවිත වූයේ නොවන්නේය." ආයුෂ්මත් පරිපුණ්ණක තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. විජය ථෙර ගාථා**:- "යම් උත්තම පුද්ගලයෙකුගේ කාමාදී ආශ්‍රවයෝ හාත්පසින් ගෙවී ගියාහුද යමෙක් ආහාර විෂයෙහි තෘෂ්ණා දෘෂ්ටි නිශ්‍රය නැත්තේ වේද, ශූන්‍යතා විමොක්ෂ නම්

වූද, අනිමිත්ත විමොක්ෂ නම්වූද නිර්වාණය යමක්හුගේ විෂය වේද, අහස යන පක්ෂීන්ගේ පිය නොදත හෙන්නාසේ ඒ ක්ෂිණාශ්‍රවයා ආශ්‍රය කරණ ලද පද වාරයෙක් නොදත හැක්කේය." ආයුෂ්මත් විජය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. එරක ථෙර ගාථා:-** "එරකය, කාමයෝ දුක් වන්නාහ. එරකය, කාමයෝ සැප නොවන්නාහ. එරකය, යමෙක් කාමයන් කැමැතිවේනම් හේ දුක කැමැතිවේ. එරකය යමෙක් කාමයන් නොකැමැති වේද, එරකය, හේ දුක නොකැමැතිවේ." ආයුෂ්මත් එරක තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. මෙත්තජි ථෙර ගාථා:-** "ශාක්‍ය පුත්‍රවූ ශ්‍රීමත් ඒ භගවත්හට නමස්කාරය වේවා. අග්‍රප්‍රාප්තවූ උන්වහන්සේ විසින් මේ අග්‍රවූ නවවිධ ලොකොත්තර ධර්මය දෙසන ලදී." ආයුෂ්මත් මෙත්තජි තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**5. චක්ඛුපාල ථෙර ගාථා:-** "මම අන්ධයෙමි. විනාශ ඇස් ඇතියෙමි. කාන්තාරයක් බඳු වෙනෙහි දික් මඟට ආයෙමි. මෙහිම වැද හෝ නෙම් නමුදු පාපීවූ යහළුවකු සමග නොයන්නෙමි." ආයුෂ්මත් චක්ඛුපාල තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. ඛණ්ඩ සුමන ථෙර ගාථා:-** "එක් මලක් පුදා හවුරුදු අසූකෙළක් මුළුල්ලෙහි ස්වර්ගයන්හි රූපාදී මනාප අරමුණු විෂයෙහි ඉඳුරන් හසුරුවා දෙව්සරන් ලවා මෙහෙකරවා පියා ඒ කුශලයාගේම ඉතිරිව සිටි විපාකයෙන් කෙලෙස් පිරිනිවනින් නිවී ගියෙමි." ආයුෂ්මත් ඛණ්ඩ සුමන තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. තිස්ස ථෙර ගාථා:-** "සිය පලමක් පමණවූ ස්වර්ණමයවූ සියගණන් හිරි ඇති භොජන පාත්‍රය (රන්තලිය) හැරපියා මැටි පාත්‍රයක් මම ගත්තෙමි. මාගේ මේ පැවිදි බවට පැමිණ දෙවන අභිෂෙකය වේ." ආයුෂ්මත් තිස්ස තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**8. අභය ථෙර ගාථා:-** "සිත්කලු රුවක් දැක ප්‍රිය නිමිත්තක් කොට මෙනෙහි කරන්නාවූ මාගේ සිහිය මුළාවී ගියේය. බලවත්

රාගයෙන් ඇලී ගිය තැනැත්තේ ඒ ඉෂ්ටාලම්බනයම රසවිඳීම කෙරෙයි. ඒ අරමුණම ගිලගෙන සිටී. සසරට මුල්ව සිටි සසර කරා පමුණුවන සුලු කාමාදි කල්ගත කෙලෙස් ඕහට වැඩෙන්නාහ.” ආයුෂ්මත් අභය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**9. උත්තිය ථෙර ගාථා:-** “සිත්කලුවූ ශබ්දයක් අසා ප්‍රිය නිමිත්තක් කොට මෙනෙහි කරන්නාවූ මාගේ සිහිය මුළාව යාගත. බලවත් ලෙස රාගයෙන් ඇලීගිය තැනැත්තේ ඒ ඉෂ්ටාලම්බනය ආස්වාදය කෙරෙයි. ඒ ඉෂ්ටාලම්බනය ගිලගෙන සිටී. සසරට පමුණුවන සුලු කාමාදී ආශ්‍රවයෝ ඕහට වැඩෙන්නාහ.” ආයුෂ්මත් උත්තිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**10. දෙවසභ ථෙර ගාථා:-** “සතර සම්‍යක් ප්‍රධානයන් ගෙන් සම්පූර්ණවූ සතර සතිපට්ඨානයන් නිත්‍ය සෙවිත ස්ථාන කොට ඇති පංචවිධ විමුක්ති නමැති පුෂ්පයන්ගෙන් විභූෂිතවූ මහණතෙම කාමාදි චතුරාශ්‍රව රහිතවූයේ සඋපාදිශෙෂවූද නිරුපධිශෙෂවූද නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන්නේයි.” ආයුෂ්මත් දෙවසභ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 11 වන වර්ගය.

**1. බෙලට්ඨානික ථෙර ගාථා:-** “ගිහි බැව් හැරපියා පැවිදිව මහණක්හු විසින් කටයුතු දැය නොනිමි ස්වභාව ඇත්තාවූ (නගුලෙන් පොළොව කනක්හු සෙයින් රළු පරළු බසින් අනුන් ගටා තමන් ගුණ සාරණ හෙයින්) මුව නැමැති නගුල් ඇත්තාවූ උදර පොෂණයෙහි ඇලී ගත්තාවූ අලසවූ අඥාන තැනැත්තේ කෑමෙන් පොෂිතවූ මහත් හුරක්හු සෙයින් නැවත නැවතත් මවුකුසයට පැමිණේ.” ආයුෂ්මත් බෙලට්ඨානික තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. සෙතුච්ඡ ථෙර ගාථා:-** “මානයෙන් වඤ්චිතවූද, (ආධ්‍යාත්මික බාහ්‍ය චක්ෂුරාදිවූත් රූපාදීවූත්) සංස්කාර විෂයෙහි තෘෂ්ණා-දෘෂ්ටි මාන විසින් කිලිටි වන්නාවූද ලාභ අලාභ දෙකින්

මිරිකී ගියාවූද, අඥානයෝ සමථ-විදර්ශනා වශයෙන් ලැබිය යුතු ලෞකික ලොකොත්තර සමාධියකට නොපැමිණෙන්නාහ.” ආයුෂ්මත් සෙතුච්ඡ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**3. බන්ධුර ථෙර ගාථා**:- “මම මේ ආමිස ලාභයෙන් ප්‍රයෝජන ඇත්තෙක් නොවෙමි. දහම් රසයෙන් හටගත් සුව ඇත්තෙක් වෙමි. පිනා ගියෙමි. රසයෙන් අග්‍ර උතුම් දහම් රසය පානය කොට විෂක් සමග හෙවත් විෂක් වැනි ආමිසය සමග එකතු බවක් නොකරන්නෙමි.” ආයුෂ්මත් බන්ධුර තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**4. ඛිතක ථෙර ගාථා**:- “විස්මයෙකි, මාගේ රූපකය හැල්ලුව ගියේය. මහත්වූ ප්‍රීති සහිත සුඛයෙන් පහස්නා ලද්දේවේ. සුළඟින්, මෙහෙයන ලද පුළුන් රොදක් මෙන් මාගේ කය ඉපිලනුයේ අහසට නගිනුයේම වේ.” ආයුෂ්මත් ඛිතක තෙරණුවෝ මේ ගථාව වදාළහ.

**5. මලිතවම්භ ථෙර ගාථා**:- “භොජන සප්පායයාගේ හෙවත් හිත පථ්‍ය ආහාරයන්ගේ නොලැබීමෙන් හටගත් උකටලී බැව් ඇත්තෙම් නමුදු වෙසෙම්මය. (හිත පථ්‍යාහාර ලාභයෙන් යම් දවසෙක) සිත් අලවන්නෙම් නමුදු සෙසු සප්පායයන්ගේ නොලැබීමෙන් එයින් නික්මයෙමි. නුවණැති පුද්ගල තෙමේ අවැඩ ඇසුරුකොට ඇති වාසයෙක් නොම වසන්නේය.” ආයුෂ්මත් මලිතවම්භ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**6. සුහෙමන්ත ථෙර ගාථා**:- “අඥාන තැනැත්තේ සිය ගණන් ලක්ෂණ දරන්නාවූ අර්ථයාගේ එක් ලක්ෂණ මාත්‍රයක්ම දක්නා සුලුවෙයි. ප්‍රාඥ තැනැත්තේ වනාහි සියගණන් ලිංග ලක්ෂණයන් දක්නේයි.” ආයුෂ්මත් සුහෙමන්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**7. ධම්මසව ථෙර ගාථා**:- (ගෙයි විසීමෙහි දොසයද පැවිද්දෙහි අනුසස්ද නුවණින්) “කිරා මැන බලා ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙමි. මා විසින් විද්‍යාවෝ පැමිණෙන ලදහ. බුදුහුගේ අනුශාසනය කරනලදී.” ආයුෂ්මත් ධම්මසව තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**8. ධම්මසව පිතු ථෙර ගාථා:-** "එක්සිය විසි වයස් ඇති ඒ මම පැවිද්දට පැමිණියෙමි. මා විසින් ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. බුදුහුගේ ශාසනය කරන ලදී." ආයුෂ්මත් ධම්මසව පිතු තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**9. සංඝරක්ඛිත ථෙර ගාථා:-** "මේ මහණ තෙම රහසිගතව සිටගෙන අතිශයින් සත්වයනට අනුකම්පාකරන සුළු භගවත්හුගේ ප්‍රතිපත්ති ශාසනය ගණන් ගනිතැයි නොහඟිමි. ඒ එසේමැයි මේ මහණ තෙම වෙනෙහි තරුණ ස්වභාවය ඇති මුව දෙනක මෙන් ස්වභාවයෙහි පිහිටි ඉන්ද්‍රියයන් ඇත්තේ වාසය කෙරෙයි" ආයුෂ්මත් සංඝරක්ඛිත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**10. උසභ ථෙර ගාථා:-** "කඳු මුදුන්වල අලුත හටගත් මහත් වූ මෙඝ ජලයෙන් තෙමීගිය නාගාදී වෘක්ෂයෝ යහපත්ව වැඩී ගියාහු විවේකය රිසිවන අරණ්‍යගත සංඥා ඇති උසභ මහණ හට මතු මතුයෙහි ආරොග්‍ය හෙවත් සිත පිළිබඳ භාවනා විෂයෙහි යොග්‍ය බව උපදවන්නාහ." ආයුෂ්මත් උසභ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

---

## 12 වන වර්ගය

**1. ජෙන්ත ථෙර ගාථා:-** "ගිහි සැපත් හැරපියා පැවිදිවනු ඒකාන්තයෙන් දුෂ්කරය, ගෘහයෝ දුකසේ විසිය යුත්තාහ. පැවිදිව පිරිය යුතු ධර්මය ගැඹුරුය. භොගයෝ දුකසේ ලැබිය යුත්තාහ. මේ බුදුසසුන්හි ලත් පරිදි පසයෙන් අපගේ දිවි පැවතුමුදු දුකය. නිරතුරු අනිත්‍යභාවය සිතන්නට යුතුමය." ආයුෂ්මත් ජෙන්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**2. වච්ඡගොත්ත ථෙර ගාථා:-** "මම පූර්වෙනිවාසානුස්මෘති ඥානාදි ත්‍රිවිද්‍යාවන් ලදුයෙම් වෙමි. මහත්වූ ධ්‍යාන ඇත්තෙම් වෙමි. චිත්ත සමථයෙහි දක්ෂයෙමි. මා විසින් ස්වාර්ථය නම් අර්හත්වය අනුක්‍රමයෙන් පැමිණෙන ලද්දේය. බුදුහුගේ සසුන්

කරණ ලදී.” ආයුෂ්මත් වච්ඡගොත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

3. **වනවච්ඡ ථෙර ගාථා:-** “පහන්දිය ඇත්තාවූ පුළුල් ගල් ඇත්තාවූ වඳුරු ආදී මෘගයන්ගෙන් ගැවසීගත් දිය සෙවෙලින් වැසීගියාවූ (මා විසූ පෙදෙස්හි) ඒ පර්වතයෝ මා සිත් අලවන්නාහ.” ආයුෂ්මත් වනවච්ඡතෙරණුවෝ මේ ගාථාව වදාළහ.

4. **අධිමුත්ත ථෙර ගාථා:-** කුඩාඇළ දියත්තක් මෙන් ජීවිතය ගෙවීයන්නාහාම කය දැඩිකොටලීම බහුල කොට ඇති (ප්‍රණීත ආහාරාදීන්) ශාරීරික සුඛයෙන් ගිජු බවට පැමිණි ශ්‍රමණයාහට ශොභන ශ්‍රමණ භාවයෙක් කොයින්ද?” ආයුෂ්මත් අධිමුත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

5. **මහානාම ථෙර ගාථා:-** “හටගත් බොහෝ කෙළිඳ ඉඳුසල් රුක් ඇත්තාවූ බෙහෙත් ආදී වස්තූන් ලැබිය හැකි පර්වත ගුණයන්ගෙන් යශස්වීවූ නන්නත් රුක් ලියයෙන් වැසී ගියාවූ නොහොත් වෙසෙන තැන්වූ බැවින් තට උපකරණවූ “නොසාදක” නම් පර්වතයෙන් ඒ තෝ පිරිහෙන්නෙහිය.” ආයුෂ්මත් මහානාම තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

6. **පාරාසරිය ථෙර ගාථා:-** “චක්ෂුරාදි ආයතන සය පිළිබඳ කෙළෙස් ප්‍රහාණ වශයෙන් හැරපියා රක්නා ලද සදොර ඇත්තෙම් වෙමි. කායාදීන් යහපත් පාපයෙන් වැළක ගියෙමි. සංසාරදුකට මුල්ව සිටි අවිද්‍යා භව තෘෂ්ණා මූලය ආර්ය මාර්ගයෙන් වමාරා පියා මා විසින් කලක් පැවති කෙලෙස් නැති කිරීම නම්වූ නිර්වාණයට පැමිණෙන ලදී.” ආයුෂ්මත් පාරාසරිය තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

7. **යස ථෙර ගාථා:-** (මම පෙර ගිහිව සිටි සෙමෙහි) “ශොභමානවූ කොකුම් සඳුන් විලවුනෙන් යහපත් සේ ගල්වන ලදුයෙමි. මහඟු කසීවත් වස්ත්‍ර කොට ඇතියෙම් වීමි. සියලු ආභරණයන්ගෙන් අලංකෘතවීමි. (දැන්) ත්‍රිවිද්‍යාවන්ට පැමිණ ගතිමි. බුදුන්ගේ ශාසනය මා විසින් කරණලදී.” ආයුෂ්මත් යස තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

8. **කිම්බිල ථේර ගාථා:-** "බාල්‍ය - යෞවනාදි වයස (තෝ වහා යවයි) දෙවියන් විසින් අණවන ලද්දක්හු මෙන් අඩුවෙමින් විනාශයට පැමිණෙමින් දිවෙයි. ස්වකීය ස්වභාවයෙන් සිටගත් මේ රූපය අනෙකක් මෙන් මට වැටහේ, ඒ මා ගැතිවූම, වියොග වාස විරහිතවූම මාගේ ආත්මභාවය අනෙකක්හුගේ මෙන් සිහි කෙරෙමි." ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

9. **වජ්ජිපුත්ත ථේර ගාථා:-** "ගෞතමයෙනි, රුක්මුල ලැහැබකට පැමිණ නිවන සිත්හි තබාගෙන විදසුන් සහිත මග වඩාලන්න. අධිකුශල ධර්මයන්හි පමා නොවන්න. බිලි, බිලි, ක්‍රියාව "බිලි බිලි" යන ශබ්දය තොපට කුමක් කරන්නීද?" ආයුෂ්මත් වජ්ජපුත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

10. **ඉසිදත්ත ථේර ගාථා:-** "මා විසින් සියලුම පංචස්කන්ධයෝ විදර්ශනා ඥාන සහිත මාර්ග ප්‍රඥායෙන් පිරිසිඳ දන්නා ලද්දාහු අවිජ්ජා-තණ්හා නම්වූ සිඳ හල මුල් ඇත්තාහු සිටිනාහ. දුක්ඛක්ඛය නම්වූ නිර්වාණය මා විසින් ලබන ලද්දේය. ආසවක්ඛය නම්වූ නිර්වාණය මා විසින් පැමිණෙන ලදී." ආයුෂ්මත් ඉසිදත්ත තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

**(එක නිපාතය නිමි.)**

---

# දුක නිපාතය

## 1 වන වර්ගය

1. **උත්තර ථේර ගාථා:-** "නිත්‍යවූ කිසි භවයක් නැත. සදාකාලිකවූ සංස්කාරයෝ හෝ නැත්තාහ. ඒ සම්බන්ධ කෙනෙක් ඔබමොබ උපදින්නාහුද චුතවන්නාහුද වෙත්.

2. "මේ දෝෂය දැක භවය වුවමනා නොවූවෙක් වූවෙමි. සියළු කාමයන් අත්හළෙමි. මා විසින් කෙලෙස් නැතිකිරීම ලබනලදී." ආයුෂ්මත් උත්තර තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

3. **පිණ්ඩොලභාරද්වාජ ථෙර ගාථා**:- 1. මේ ජීවිතය අයහපතින් නොපිනවමි. ආහාරය සිතයට යහපත ගෙන නොදේ. ශරීරය ආහාරය නිසා පවත්නේය. මෙසේ දැක ආහාර සෙවීම කරමි.

2. කුලයන්හි යම් මේ වැඳීමක් පිදීමක් ඇද්ද, එය ක්ලේශ මඩකැයි කීවාහුය. සියුම් උල ඇදීම පහසු නොවේ. නින්දිත පුරුෂයා විසින් සත්කාරය දුරුනොකළ හැකිය. ආයුෂ්මත් පිණ්ඩොල භාරද්වාජ තෙරණුවෝ මේ ගාථාව වදාළහ.

3. **වල්ලිය ථෙර ගාථා**:- 1. "වඳුරෙකු මෙන් දොරටු පසක් ඇති ගෘහයට ඇතුල්ව ක්ෂණයක් ක්ෂණයක් පාසා ස්පර්ශ කරමින් දොරින් දොර කරකැවේද,

2. "සිත් නමැති වඳුර සිටින්න. නොදුවන්න. තොපට ඒ දිවීම පෙර සේ නැත නුවණින් පෙළුවෙහිය. ඈතට නොම යන්නෙහිය." ආයුෂ්මත් වල්ලිය තෙරණුවෝ මෙසේ මේ ගාථාවන් කීහ.

4. **ගංගාතීරිය ථෙර ගාථා**:- 1. "මා විසින් තල්කොළ තුනකින් ගංගානම් ගඟ අද්දර කුටියක් කරණලද්දේය. මාගේ පාත්‍රයද මළවුන්ට දිය ඉසින බඳුනක් වැන්න. සිවුරද පාංශුකූලයකි.

2. "වස් දෙකක් අතරෙහි මා විසින් එකම වචනයක් කියනලද්දීය. තුන්වෙනි වස් කාලයෙහි අවිද්‍යාව පලනලදී." ආයුෂ්මත් ගංගාතීරිය තෙරණුවෝ මෙසේ මේ ගාථාව කීහ.

5. **අජිත ථෙර ගාථා**:- 1. "ඉදින් ත්‍රිවිද්‍යා දන්නේද, මරණය දුරුකෙළේද, ආශ්‍රව රහිතවූයේද, අප්‍රකටයයි බාලයෝ ඔහුට අවමන් කෙරෙත්.

2. "මේ ලොකයෙහි යම් පුද්ගලයෙක් ආහාරපාන ලබන්නෙක්වේද, ඉදින් පවිටු ස්වභාව ඇත්තේද ඔවුන් විසින් හෙතෙම සත්කාර කරණලද්දේවේ. "ආයුෂ්මත් අජිත තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

6. **මෙලජින ථෙර ගාථා**:- 1. "යම්කලෙක්හි මම ශාස්තෘන්වහන්සේ විසින් කියන්නාවූ ධර්මය ඇසූයෙම්ද,

කෙලෙසුන් විසින් නොපරදවනලද සර්වඥයන්ට සැකයක් මට නොවෙයි.” ආයුෂ්මත් මෙලජින තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

7. රාධ ථෙර ගාථාः- 1. “හොඳින් සෙවෙලි නොකළ ගෙයකට වර්ෂාව වදීද එසේම නොවැඩූ සිත රාගයෙන් යට කොට ගනියි.

2. “යහපත්කොට සෙවෙලි කරණලද ගෙයට වර්ෂාව නොවදීද, එසේම පුරුදුකළ සිත රාගය යටකොට නොගනියි.” ආයුෂ්මත් රාධ තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

8. සුරාධ ථෙර ගාථාः- 1. “මාගේ උත්පත්තිය ක්ෂයවිය මාර්ගබ්‍රහ්මචර්යාව වැස නිමවූයෙමි. දැලක් හා සමාන දෘෂ්ටිය හා අවිද්‍යාව නැතිවිය. නසනලදිමි.

2. “යමෙක් නිසා ගිහිගෙන් නික්ම ගෙයක් නැතැයි කියනලද ශාසනයෙහි පැවිදිවූයෙම්ද සියළු බැමි කැඩීමෙන් මා විසින් ඒ යහපතට පැමිණියෙමි. ආයුෂ්මත් සුරාධ තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

9. ගොතම ථෙර ගාථාः- 1. “හැමකල්හි ඒකාන්තයෙන් රැකිය යුතු යම් තැනැත්තියන් කෙරෙහි සත්‍යය දුර්ලභද, ඒ ස්ත්‍රීන් කෙරෙහි මුනීහු නොබැඳෙත්, සැපසේ හොවිත්.

2. “එම්බල කාමය, නුඹගේ කරදරය අවසන් කෙළෙමි තොපට දැන් ණයක් නැත. යම් තැනකට ගොස් ශොක නොකරම්ද, දැන් ඒ නිවනට යමු.” ආයුෂ්මත් ගොතම තෙරණුවෝ මෙසේ කීහ.

10. වසභ ථෙර ගාථාः- 1. “(කුහකතෙමේ) තමා මුලින් නසයි. පසුව හෙතෙම අනුන් නසයි. වැදිතෙමේ විතංස (අත්තටු කැපූ) පක්ෂියාගෙන් මෙන් තමා විශේෂයෙන් නසී.

2. “පිටත පෙනීමෙන් බ්‍රාහ්මණයෙක් නොවේ. ඇතුළත පිරිසිදුකමින් බ්‍රාහ්මණයෙක් වේ. යමකු කෙරෙහි පවුකම් පෙණේද, සුජම්පතිය, හෙතෙම හීනපුද්ගලයෙකි.” ආයුෂ්මත් වසභ තෙරණුවෝ මේ ගාථා මෙසේ කීහ.

---

# 2 වෙනි වර්ගය

1. **මහාචුන්ද ථෙර ගාථා**:- 1. "ඇසීමෙන් උගත්දෙය වැඩෙන්නේය, උගත්දෙය නුවණෙ 'වැඩීමයි. නුවණින් යහපත දැනගනියි. දන්නාලද යහපත සැප පිණිසවේ.

2. "විවේක සෙනසුන් ආශ්‍රය කරව්. බැම්වලින් මිදුනු සිත් ඇතිව හැසිරෙව්, ඉදින් එහි ඇලීමකට නොපැමිණෙන්නේද, රක්නාලද සිත් ඇත්තන්වී සිහි ඇතිව සංඝයා වෙත වසව්." ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ මේ ගාථාව කීහ.

2. **ජොතිදාස ථෙර ගාථා**:- 1. "දරුණු වැඩ කරණ මනුෂ්‍යයෝ සමපටින් හිස බැඳීමෙන්ද, නොයෙක් අනුන් නසන ක්‍රමවලින් මිනිසුන් පෙළත්ද,

2. ඔව්හුද ඒ කර්මයෙහි වැටෙත්. කර්මය නම් විපාක නොදී පහනොවෙයි. මනුෂ්‍යතෙමේ යහපත් හෝ අයහපත් හෝ යම් කර්මයක් කරයිද, යමක් කරයිද, ඊට ඒ ඒ කර්මයේ ඵල යන්නේ වේ." ආයුෂ්මත් ජොතිදාස තෙරණුවෝ මේ ගාථාව කීහ.

3. **හෙරඤ්ඤකානි ථෙර ගාථා**:- 1. "රෑ දවල් දෙක වහවහා ඉක්මෙයි. ප්‍රාණයද ක්ෂණික මරණයෙන් මැරෙයි. පරමායුෂ අඩුවෙයි. කුඩා ගංගාවල ජලය මෙනි.

2. "එහෙයින් පව්කරණ මෝඩයා විපාකය නොදනී. පසුව ඔහුට දුකක්මවේ. විපාකය නම් පවිටුය." ආයුෂ්මත් හෙරඤ්ඤඤකානි තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

4. **සොමදත්ත ථෙර ගාථා**:- 1. "කුඩා දරකඩකට නැගී මහමුහුදෙහි යම්සේ ගිලේද එසේ කම්මැලියා වෙත පැමිණ යහපත්ව ජීවත්වන්නේද ගිලේ, එහෙයින් කම්මැලිවූ වීර්යය නැති ඔහු දුරුකරන්නේය.

2. "කාය විවේකයෙන් යුක්තවූ හා කෙලෙසුන්ගෙන් වෙන්වූ නිවන්වෙත යොමුකළ ජීවිත ඇති ධ්‍යානකරණ නිතර පටන්ගන්නා ලද වීර්යය ඇති පණ්ඩිතයන් හා වාසය

කරන්නේය. ආයුෂ්මත් සෝමදත්ත තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

5. **සබ්බමිත්ත ථෙර ගාථා:-** 1. "මෝඩ මනුෂ්‍යතෙමේ අන්මනුෂ්‍යයෙකු සමග ආශාවෙන් බැඳෙනලදී. මනුෂ්‍යයාම මනුෂ්‍යයා ඇසුරුකොට සිටී. මනුෂ්‍යයා මනුෂ්‍යයෙකු විසින් පෙළනු ලබයි. මනුෂ්‍යයා මනුෂ්‍යයාට බාධා කරයි.

2. "මනුෂ්‍යයෙකුට මනුෂ්‍යයෙකු විසින් පීඩා කිරීමෙන් කිනම් ප්‍රයෝජනද? මවුපියන්වී ඉපදීමෙන් ඇති එල කවරේද? බොහෝ ජනයා පෙළාසිටි තෘෂ්ණාව හැරදමා ජනයා හැර යන්නෙමි." ආයුෂ්මත් සබ්බමිත්ත තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

6. **මහාකාල ථෙර ගාථා:-** 1. "කපුටු පැහැ ඇති මහත් ශරීර ඇති කාලී නම් ස්ත්‍රීතොමෝ මළසිරුරක කලවය බිඳ, අනික් කලවයද බිඳ, අතද බිඳ, අනික් අතද බිඳ හිසද බිඳ මිදුනු කිරි සැළියක් මෙන් හිස් මිදුළු වගුරුවා,

2. "නැවත සම්බන්ධකොට සිටියාය. නොදන්නා යම්කෙනෙක් ඒකාන්තයෙන් කෙලෙස් උපදවයිද, නැවත නැවත දුකට පමුණුවයි. එසේහෙයින් දන්නා තැනැත්තේ කෙලෙස් රැස් නොකරන්නේය. නැවත මා හිස සුන් මළකඳක්ව වාසය නොකරන්නෙමි." ආයුෂ්මත් මහාකාල තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

7. **තිස්ස ථෙර ගාථා:-** 1. "ආහාරපාන වස්ත්‍ර සෙනසුන් බොහෝ ලබන සිවුරු දරණ හිස මුඩුකළ තැනැත්තේ සතුරන් ලබයි.

2. "මෙසේ මහා බයක්වූ සත්කාරයන්හි මහත් දොෂය දැන ලාභ නැති තෘෂ්ණාව අත්හැරී මහණ සිහි ඇතිව පිරිනිවන් පාන්නේය." ආයුෂ්මත් මහාකාල තෙරණුවෝ මෙසේ මේ ගාථාව කීහ.

8. **කිම්බිල ථෙර ගාථා:-** 1. "ප්‍රාචීනවංශ නම් වනයෙහි යහළු ශාක්‍යපුත්‍රයෝ නොයෙක් වස්තු අත්හැර සිඟීමෙන් පාත්‍රයෙහිවූ දෙයකින් යැපුනාහ.

2. "පටන්ගත් වීර්යය ඇති, නිවණට යැවූ සිත් ඇති, නිතර නොපසුබට උත්සාහය ඇති, තෝ ලෞකික ඇල්ම අත්හැර ලෝකෝත්තර ඇල්මෙහි ඇලෙව" ආයුෂ්මත් මහාකිම්බිල තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

1. **නන්ද ථෙර ගාථා:-** "නොවුවමනා පරිදි මෙනෙහි කිරීමෙන් අලංකාරයට ඇලුනෙමි. කාමාශාවෙන් පීඩාවූයේ සන්නොසිඳුන සිත් ඇත්තෙක්ද ඇලෙන්නෙක්ද වීමි.

2. "උපායෙහි දක්ෂවූ සූර්ය වංශයට ඥාතිවූ බුදුන් විසින් නුවණින් කටයුතු කරවූ මම භවයෙහි සිත අත්හළෙමි." ආයුෂ්මත් නන්ද තෙරණුවෝ මේ ගාථා වදාළහ.

10. **සිරිම ථෙර ගාථා:-** 1. බාලයෝ ඉදින් තමන් අසංවරව අන්‍යයන්ට ප්‍රසංසා කරත්. තමන් අසංවර බාලයන් කරණුයේ හිස් ප්‍රශංසාවකි.

2. "ඉදින් තමා සංවරවුවත් ඔහුට බාලයෝ ගරහත්." ඉදින් තමා සංවර නම් බාලයෝ හිස් ගැරහීමක් කරත්. ආයුෂ්මත් සිරිම තෙරණුවෝ මේ ගාථා වදාළහ.

---

## 3 වෙනි වර්ගය.

1. **උත්තර ථෙර ගාථා:-** 1. "මා විසින් පඤ්චස්කන්ධයන් පිරිසිඳ දන්නා ලදී. මා විසින් තෘෂ්ණාව නසන ලදී. මා විසින් බොජ්ක්ධංග වඩන ලදී. මා විසින් ආශ්‍රවක්ෂයට (රහත් බවට) පැමිණෙන ලදී.

2. "ඒ මම ස්කන්ධයන් විශෙෂයෙන් දැන තෘෂ්ණාව උදුරා බොජ්ක්ධංග වඩා කෙලෙස් නැතිව නිවෙන්නෙමි." ආයුෂ්මත් උත්තර තෙරණුවෝ මේ ගාථාව කීහ.

2. **භද්දජි ථෙර ගාථා:-** 1. "යමෙකුගේ ප්‍රාසාදය රනින් නිමියේද සරසින් ඊ වේග දහසක්වේද, උඩින් කාමර දහසක් උසද (විසිපස් යොදුනක් වේද එබඳු) පනාද නම් රජෙක් විය.

**2.** "තට්ටු දාහක් වේද, සිය සිය ගණන් කෙත් ඇත්තේද, එහි කොඩි ඇත්තේද, රනින් කළේද, එහි නැටුම් කරුවන් සත් තැනක නැටුවාහුද, (එබඳු පනාද නම් රජෙක් විය.)" ආයුෂ්මත් භද්දජි තෙරණුවෝ මෙසේ මේ ගාථාව කීහ.

**3. සොභිත ථෙර ගාථා:-** 1. "සිහි ඇත්තාවූ, නුවණ ඇති, ශ්‍රද්ධාදී බල හා සම්‍යක් ප්‍රධාන වීර්ය ඇති භික්ෂුවක් වීමි. මම පන්දහසක් කල්ප එක් රාත්‍රියක සිහි කෙළෙමි.

**2.** "සතර සතිපට්ඨානද සප්ත බොධ්‍යංගද ආර්ය අෂ්ටාංගික මාර්ගයද වැඩීම් හෙතුවෙන් පන්දහසක් කල්ප එක් රාත්‍රියක සිහි කෙළෙමි." ආයුෂ්මත් ශොභිත තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**4. වල්ලිය ථෙර ගාථා:-** 1. "දැඩි වීර්යයෙන් යමක් කටයුතුද, අවබොධ කරනු කැමැත්තන් විසින් යමක් කටයුතුද එය කරන්නෙමි. ධර්මය නොවරද්දන්නෙමි. යහපත් වෑයම බලන්න.

**2.** "ඔබද මට ඍජුවූ නිවණට පමුණුවන මාර්ගය කියන්නෙහිය. ගඟ සැඩපහරක් සාගරයට මෙන් මාර්ග ප්‍රඥාවෙන් නිවන දකිමි." ආයුෂ්මත් වල්ලිය තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**5. වීතාසොක ථෙර ගාථා:-** 1. "මාගේ කෙස් කපන්නෙමියි කපුවා (කරනවෑමියා) ආවේය. ඉක්බිති කන්නාඩියක් රැගෙන ශරීරය බැළුවෙමි.

**2.** "ශරීරය හිස්බව දුටුවෙමි. අන්ධකාරයක් ඇතිවිය. සියලු කෙලෙස් මුල සුන් කරණ ලදී. නැවත ඉපදීමක් දැන් නැත." ආයුෂ්මත් වීතාසොක තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**6. පුණ්ණමාස ථෙර ගාථා:-** 1. "නිවනට පැමිණීමට පඤ්චනීවරණ ධර්ම අත් හැර විදර්ශනා නුවණ නැමැති තමන්ගේ ධර්ම කන්නාඩිය ගෙන,

**2.** "ඇතුලතවූද පිටතවූද මේ සියලු ශරීර බැලුවෙමි. ඇතුළතද පිටතද හිස් ශරීරය දුටුවෙමි." ආයුෂ්මත් පුණ්ණ මාස තෙරුණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**7. නන්දක ථෙර ගාථා**:- 1. "යහපත් ආජානීය ඇත් රජ යම්සේ හැපී නවතීද බොහෝසේ සංවෙගයට පැමිණි සිත ශක්තිමත් කොට බර උසුලාද?

2. "එසේ මා මාර්ග ඥානයෙන් යුත් බුද්ධශ්‍රාවකවූ බුදුන්ගේ ඖරස පුත්‍රවූ මා ඇතෙකු කොට දරව්." ආයුෂ්මත් නන්දක තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**8. භරත ථෙර ගාථා**:- 1. "නන්දකය එනු මැනව, උපාධ්‍යායවූ බුදුන් වෙත යමු. බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ ලඟ සිංහනාද කරමු.

2. "යම් කරුණක් පිණිස අපට අනුකම්පාවෙන් බුදුන් වහන්සේ අප පැවිදි කළ සේක්ද සියලු රැහැන් කැඩීමෙන් අපි ඒ අදහසට පැමිණියෙමු." ආයුෂ්මත් භරත තෙරණුවෝ මේ ගාථාව කීහ.

**9. භාරද්වාජ ථෙර ගාථා**:- 1. "පර්වත ගුහාවෙහි සිංහයන් මෙන් නුවණ ඇති දිනනලද කෙලෙස් යුද්ධ ඇති වීරයෝ සෙනා සහිත මාරයා නසා සිංහනාද කරත්.

2. "මට ශාස්තෘන් වහන්සේ පුරුදුය, මා විසින් ධර්මයද සංඝයාද පුදන ලදී. කෙලෙස් නැති පුත්‍රයෙකු දැක මමද වස්තු සහිතවූයේ සතුටුවූයේ වෙමි." භාරද්වාජ තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**10. කණ්හදින්න ථෙර ගාථා**:- 1. "සත්පුරුෂයන් ආශ්‍රය කරණලදී. ධර්මය නිතර ඇසීමි. නිවන පිහිටීම්කොට ඇති ආර්ය අෂ්ටාංගික මාර්ගය අසා පිළිපදින්නෙමි.

2. "මා විසින් භවරාගය නැසුයේම මට භවරාගය නැවත නූපදී. ඒ භවරාගය නොවීමි. මට නොවන්නේය. දැනුදු විද්‍යමාන නොවේ." ආයුෂ්මත් කණ්හදින්න තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4 වෙනි වර්ගය

1. **මිගසිර ථෙර ගාථා:-** 1. යම් දවසක සිට මම බුද්ධ ශාසනයෙහි පැවිදිවූයෙම්ද, මිදෙමින් නැගිටින්නේ කාම ධාතුව ඉක්ම වීමි.

2. "බ්‍රහ්ම නමැති බුදුන් දක්නාවූ මාගේ සිත සියළු කෙලෙසුන්ගෙන් මිදුනේය. සියලු සංයොජනයන් ක්ෂයවීමෙන් මාගේ සිතේ මිදීම බාධා නොවීය." ආයුෂ්මත් මිගසිර තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ."

2. **සීවක ථෙර ගාථා:-** 1. "ඒ ඒ භවයන්හි නිතර නිතර ඉපදීම් නැමැති ගෙවල් අනිත්‍යය. ඒ ගෙවල් ගනිමින් ගෙවල් හදන වඩුරාළ නමැති තෘෂ්ණාව සොයමින් හැසුරුනෙමි.

2. "ගෙවල් හදන්නා දක්නාලදී. නැත ගෙවල් නොහදන්නෙහිය, ඔබගේ සියලු පරාල බිඳින ලදී. ගෙයි කර්නිකාව (කැණිමඬල) පලන ලදී. මගේ සිත නැත නූපදින තත්ත්වයට පැමිණිවූයෙමි. මේ ආත්මභාවයෙහිම නැති කරන්නේය." ආයුෂ්මත් සීවක තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

3. **උපවාන ථෙර ගාථා:-** 1. "ලොකයෙහි අර්හත්වූ යහපත් ගමන් ඇති මුනිතෙමේ වාතයන් කිපීමෙන් ලෙඩ වූයේය. බමුණ, ඉදින් උණුපැන් ඇත්නම් බුදුන්ට දෙව.

2. "පුදනු ලබන්නන්ගේ පූජ්‍යවූ සත්කාර කරන්නන්ගේ සත්කාරයට යොග්‍යවූ සැළකිළි කරන්නන්ගේ සැළකිල්ලට භාජනවූ උන්වහන්සේගේ අසනීපය වෙනුවෙන් යන්නට කැමැත්තෙමි." ආයුෂ්මත් උපවාන තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ,

4. **ඉසිදින්න ථෙර ගාථා:-** 1. "මැණික් කුණ්ඩලාභරණයන්හි බලවත් රාගයෙන් ඇලුනාවූද, අඹුදරුවන් කෙරෙහි ආශා ඇත්තාවූද කාමයන් අනිත්‍යයයි කියන්නාවූ ධර්මධර උපාසකයෝ මා විසින් දක්නා ලදී.

2. "ඒකාන්තයෙන් ඒ උපාසකයෝ කාමයන් අනිත්‍යයයි කීවාහුද, ඔව්හු ඒකාන්තයෙන් මේ බුද්ධශාසනයෙහි ධර්මයවූ පරිදි නොදනිත්. ඔවුන්ට රාගය සිඳින්නට ශක්තියක් නැත එහෙයින් අඹුදරුවන්ද ධනයද ඇසුරු කළාහ." ආයුෂ්මත් ඉසිදින්න තෙරුන්ණුවෝ මේ ගාථා කීහ.

**5. සම්බුල කච්චාන ථෙර ගාථා**:- 1. "වර්ෂාව වසියි. වර්ෂාව "ගල ගල" යන නාදය පතුරුවයි. භයජනක ගුහාවෙහි තනිව වසමි.

2. "තනිව භයජනක ගුහාවෙහි වසන ඒ මට බියක්වත් තැතිගැන්මක්වත්, ලොම් කෙලින් සිටීමක්වත්, නැත තනිව භයජනක ගුහාවෙහි වසන මට බයක්වත් තැතිගැන්මක්වත් ලොම් කෙලින් සිටීමක්වත් නැත්තේද, මේ මාගේ ස්වභාවයි." ආයුෂ්මත් සම්බුල කච්චාන තෙරණුවෝ මේ ගාථා කීහ.

**6. ඛිතක ථෙර ගාථා**:- 1. "ස්ථිරභාවයට පත්වූ යමෙකුගේ ගලක් වැනිවූ, සිත කම්පා නොවේද? ආර්යමාර්ගයෙන් ඇලුම් කටයුතු ධර්මයන්හි නොඇලුනේද, කෝප විය යුතු දෙයෙහි නොකිපේද, මෙසේ යමෙකුගේ සිත වඩන ලද්දේද, ඔහු කොයින් දුකක් විඳිනේද?

2. "ස්ථිරවූ මගේ ගලක් වැනිවූ සිත කම්පා නොවේද, ඇලුම් කටයුතු ආර්ය මාර්ගයෙහි නොඇලේද, කොප විය යුතු දෙයෙහි නොකිපේද, මෙසේ මාගේ සිත වඩනලදී. මට කොයින් දුකක් පැමිණේද?" ආයුෂ්මත් ඛිතක තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**7. සෙලිස්සරිය ථෙර ගාථා**:- 1. "මේ නැකත් තරු මාලාවෙන් යුත් රාත්‍රියකි. මේ රාත්‍රියෙහි නිදීම සුදුසු නොවේ. ඥාණවන්තයා විසින් මේ රාත්‍රියෙහි තමා රකින්නට සුදුසුමය.

2. "ඉදින් ඇත් කඳින් වැටුනාවූ තැනැත්තා ඇතු විසින් පාගා මරාද, පැරදී ජීවත්වීමට වඩා මට යුද්ධයෙහිදී මරණය ශ්‍රෙෂ්ඨය." ආයුෂ්මත් සෙලිස්සරිය තෙර මෙසේ මේ ගාථා කීයේය.

**8. නිසභ ථෙර ගාථා**:- 1. "ප්‍රියවූ සිත් අලවන පස්කම් සැප හැර ශ්‍රද්ධාවෙන් නික්මී දුක් කෙළවර කරන්නෙක් වෙව.

2. "මරණයට බිය නොවෙමි. ජීවිතයට ප්‍රිය නොවෙමි. සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව සිහි ඇතිව පිරිනිවන් පාන කාලයද සිහිකරමි." ආයුෂ්මත් නිසභ තෙර මෙසේ මේ ගාථා කීයේය.

**9. උසභ ථෙර ගාථා:-** 1. (පෙර) "ඇතෙකු පිට සිට අඹ දළු සමාන පබළු පාට ඇති සිවුර අංශයකින් දරා ගමෙහි පිඬු පිණිස හැසුරුණෙමි.

2. "එකල්හි ඇතුපිටින් බැස කලකිරීමට පැමිණියෙමි. ඒ මම එකල්හි බැබලුණේ ශාන්තවූයේ මා විසින් කෙලෙස් ක්ෂයකිරීමට පමුණුවන ලදී." ආයුෂ්මත් උසභ තෙර මෙසේ මේ ගාථා කීයේය.

**10. කප්පටකුර ථෙර ගාථා:-** 1. "කප්පටකුර තෙමේ මේ මාගේ වස්ත්‍ර කැබැල්ලයයි ඇඳගන ඉතා බර බැවින් මාගේ ධර්මය ඒ ඒ තැන දෙශනා කරන කල්හි යම්තම් භාවනාවක් කරණ ලද්දේ, ධ්‍යාන භාවනා කරන්නට කරණ ලද, උත්සාහය ඇතිව සිටි ඔහුට චොදනාකොට,

2. "කප්පටකුරය, නුඹ නොනිදව. තොපගේ කණ සමීපයෙහි නොතලන්නෙමි. කප්පටය, සංඝයා මැද නිදන නුඹ කාලයේ වටිනාකම නොදන්නෙහිය" ආයුෂ්මත් කප්පටකුර තෙමේ මෙසේ මේ ගාථා කීයේය.

---

## 5 වෙනි වර්ගය

**1. කුමාර කස්සප ථෙර ගාථා:-** 1. "යම් තැනෙක මෙබඳු ධර්මයක් ශ්‍රාවකතෙමේ අත්දකීද? බුදුවරු ආශ්චර්යයි, ධර්මයෝ ආශ්චර්යයි. අපගේ ශාස්තෲන්වහන්සේගේ දශබලාදී සම්පත්ති ආශ්චර්යයි.

2. "අසංඛ්‍ය ගණන් කල්පයන්හි පඤ්චස්කන්ධය ලැබුවාහු ද, ඔවුන් අතරින් මේ අන්තිමයයි. මේ අන්තිම ශරීරයයි. සංසාරය ඉපදීම මරණය සහිතයි, දැන් නැවත ඉපදීමක් නැත." ආයුෂ්මත් කුමාරකාශ්‍යප තෙර මෙසේ මේ ගාථා කීයේය.

**2. ධම්මපාල ථෙර ගාථා:-** 1. "යම්කිසි තරුණ භික්ෂුවක් බුද්ධශාසනයෙහි ඇත්තෙන් ඇලේද, නිදාසිටින්නවුන් අතරෙහි අවදිව සිටියේද, ඔහුගේ ජීවිතය හිස් නැත.

2. "එහෙයින් බුදුන්ගේ අවවාදය සිහිකරන ඤාණවන්තයා ශ්‍රද්ධාවද, ශීලයද, පැහැදීමද, චතුරාර්යසත්‍ය ධර්මය දැකීමද, යන මෙහි යෙදෙව්." ආයුෂ්මත් ධර්මපාල තෙර මෙසේ මේ ගාථා කීයේය.

**3. බ්‍රහ්මාලි ථෙර ගාථා:-** 1. "අස්ගොව්වා විසින් යහපත්ව දමනයකළ අශ්වයන් මෙන් යමෙකුගේ ඉන්ද්‍රියයෝ සන්සිඳීමට පැමිණියාහුද, මානය ප්‍රහීන කළ කෙළෙස් නැත්තාවූ නොසැලෙන උත්වහන්සේට දෙවියෝ ද ප්‍රශංසා කරත්.

3. "අස්ගොව්වා විසින් යහපත්ව දමනය කළ අශ්වයන් මෙන් මගේ ඉන්ද්‍රියයෝ සංසිඳීමට ගියාහුද, මානය ප්‍රහීන කළ කෙලෙස් නැති නොසැලෙන මට දෙවියෝද, ස්තුති කරත්." ආයුෂ්මත් බ්‍රහ්මාලී තෙර මෙසේ මේ ගාථා කීයේය.

**4. මොඝරාජ ථෙර ගාථා:-** "අපවිත්‍ර සමක් ඇති යහපත් සිතක් ඇති නිතර භාවනා කරණ සිත් ඇති මොඝරාජය, සීත කාලයෙහි හිම වැටෙන රාත්‍රීහු පැමිණේ, මහණ, නුඹ කෙසේ ධ්‍යාන කරන්නෙහිද?

2. "මුළු මගධ රට ධාන්‍යයෙන් පිරුණේයයි මා විසින් අසනලදී. යම් අනික් මහණ කෙනෙක් සැපසේ ජීවත් වේද, පිදුරු ගොඩකින් වසාගෙන සයනය කරන්නෙමි" ආයුෂ්මත් මොඝරාජ තෙර මෙසේ මේ ගාථා කීයේය.

**5. විශාඛ ථෙර ගාථා:-** 1. "තමා උසස්කොට නොසිතයි. අනුන් පහත් නොකරයි. පරතෙරට ගියහුට ක්‍රොධයෙන් හිංසා නොකරන්නේය. පිරිස්හි තමාගේ ගුණය ප්‍රකාශ නොකරන්නේය. නොසන්සුන්කමින් දුරුවූයේ ප්‍රමාණවත් වචන ඇත්තේ යහපත් සිරිත් ඇත්තෙක් වන්නේය.

2. "අතිශයින් සියුම් අර්ථ දැනීමෙහි දක්ෂවූ යටත් පැවතුම් ඇති ඉතා දක්ෂ වැඩිමහල්ලන් ආශ්‍රයකොට පුරුද්දක් ඇති

ඔහුට නිවනට පැමිණීම පහසුය." ආයුෂ්මත් විශාඛ තෙර මෙසේ මේ ගාථා කීයේය.

**6. චූලක ථෙර ගාථා:-** 1. "යහපත් කුඩුම්බියක් ඇති, යහපත් පිල් කළඹක් ඇති, නිල් බෙල්ලක් ඇති, යහපත් මූණක් ඇති, යහපත් නාදයක් ඇති, මොණරු නාද කරත්. මේ මහපොළව නිල්තණින් වැසුණේය. වස්නා ලද ජලය ඇත්තේය. අහස වලාකුලින් ගැවසීගත්තේය.

2. "ධ්‍යාන කරන්නාවූ යහපත් සිත් ඇත්තාහට යහපත් ස්වභාවයක් ඇත්තේය. යහපත් බුද්ධශාසනයෙහි යහපත් හික්මීමක් වන්නේ යහපති. අතිශයින් සුදුවූ සියුම්වූ දැකීමට නොහැකිවූ ඒ උතුම් නිවන් පදවිය ස්පර්ශකරව," ආයුෂ්මත් චූලකතෙර මෙසේ මේ ගාථා කීයේය.

**7. අනූපම ථෙර ගාථා:-** 1. "දුක් නැමැති උලෙහි සිටි සතුටුවෙමින් ආවාවූ මේ සිත තණ්හා නැමැති හුල යම් තැනකද ඒ පව් සිතින්ම ආවේය.

2. "මම ඒ සිතේ කාලකණ්ණිකමයයි කියමි. එය සිතේ ද්‍රෝහිකමයයි කියමි. තොප විසින් ශාස්තෘන් වහන්සේ දුකසේ ලබනලදී. මේ ශරීරය අනර්ථයෙහි නොයොදව." ආයුෂ්මත් අනූපමතෙර මේ ගාථා මෙසේ කීවේය.

**8. වජ්ජිත ථෙර ගාථා:-** 1. "දීර්ඝකාලයක් සැරි සරනා අන්ධයන් වැනි පෘථග්ජනයා ආර්ය සත්‍යයන් නොදක්නේ සුගති දුර්ගතීන්හි හැසිරෙන්නේය.

2. "අප්‍රමාදවූ ඒ මගේ සංසාරය මුල්සුන් කරණලදී. සියලු ඉපදීම් සිඳිනලදී. නැවත ඉපදීමක් නැත." ආයුෂ්මත් වජ්ජිත තෙර මේ ගාථා මෙසේ කීයේය.

**9. සන්ධිත ථෙර ගාථා:-** 1. "හොඳට වැඩුණු නිල් පැහැයෙන් බබලන ඇසතු රැක්මුල සිහි ඇත්තේ බුදුන් අරමුණුකොට එකම සිහිය ලැබූවෙමි.

2. "මින් තිස්එක්වන කල්පයෙහි යම් හැඟීමක් ලබන ලද්දේද, ඒ සංඥාවගේ වාසනාවෙන් ආශ්‍රවක්ෂයට පැමිණියෙමි." ආයුෂ්මත් සන්ධිත තෙර මෙසේ මේ ගාථා කීයේය.

(දුක නිපාතය නිමි)

---

# 3. තික නිපාතය

1. **අංගාණික භාරද්වාජ ථෙර ගාථා:-** 1. "නුවණ නැතිව පිරිසිදුකම බලාපොරොත්තුවෙන් වනයෙහි ගිනි දෙවියා පිදීමි. නිවණට මග නොදන්නේ ශරීරයට දුක්දීම කෙළෙමි.

2. "ඒ නිවන් සැප මම ශරීරයට දුක්නොදී සුවසේ ලබාගතිමි. ධර්මයේ යහපත් බව බලන්න. ත්‍රිවිද්‍යාවන්ට ක්‍රමයෙන් පැමුණුනෙමි. බුදුන්ගේ අවවාදය කරණ ලදී.

3. "ජාති මාත්‍රයෙන් බ්‍රහ්මයයි කියන බ්‍රහ්ම බන්ධුවූයෙමි. දැන් පරමාර්ථ බ්‍රාහ්මණයෙක්වීමි. ත්‍රිවිද්‍යා ඇත්තෙකු වී දැන් පරමාර්ථ වශයෙන් ත්‍රිවිද්‍යා ඇත්තෙක්වීමි. සංඥා මාත්‍රයෙන් නෑවාවූ කෙනෙක් වී දැන් පරමාර්ථයෙන් නෑවෙක්වීමි. දැන් පරමාර්ථවේද දත් සොත්ථි" (බ්‍රාහ්මණයෙක්) වීමි." ආයුෂ්මත් අංගාණික භාරද්වාජ තෙමේ මේ ගාථා කීයේය.

2. **පච්චය ථෙර ගාථා:-** 1. "ශෛක්ෂවූ (රහත්වීම සම්පූර්ණ නොකළ) රහත් බවට නොපැමිණි පැවිදිවී පස්දිනක් ඇති මම මගේ වාසස්ථානයට ගියේ සිතේ මෙවැනි අදහසක් විය.

2. "මගේ හෘදයෙහි තණ්හා හුල නැති නොවනතුරු නොකන්නෙමි නොබොන්නෙමි. පන්සලෙන් පිට නොවන්නෙමි. පැත්තකින් නොනිදන්නෙමි.

3. "මෙසේ වාසය කරන්නාවූ මගේ තද උත්සාහය බලන්න. ත්‍රිවිද්‍යාවන් ලද්දෙමි. බුදුන්ගේ අවවාදය කරණ ලදී." ආයුෂ්මත් පච්චය තෙර මෙසේ මේ ගාථා කීයේය.

3. **බක්කුල ථෙර ගාථා:-** 1. "ජරාවට පත්වීමට පෙර යමක් කළයුතුද එය ඔහු පසුව කරන්නට කැමතිවේද, හෙතෙම සැපයෙන් පහවේ. පසුවද තැවෙයි.

2. "යමක් කරන්නේද එය කියන්නේය. යමක් නොකරන්නේද එය නොකියන්නේය. පණ්ඩිතයෝ කියන්නාවූ දෙය නොකරන්නාහු විශෙෂයෙන් දැනගනිත්.

3. "යම්තැනක දුක නැතිවේද, බුදුන් විසින් වදාරණ ලද ශොක නැති, කෙලෙස් නැති, නිර්භය නිවන අතිශයින් සැපය." ආයුෂ්මත් බක්කුල තෙර මෙසේ මේ ගාථා කීයේය.

4. **ධනිය ථෙර ගාථා**:- 1. "මහණකමට ආශාවෙන් ඉදින් සැපසේ ජීවත්වනු කැමැත්තේ නම් සාංඝික සිවුරුද ගිලන්පසද ආහාරද නොඉක්මවා නොසිතන්නේය.

2. "මහණකමට ආශාවෙන් ඉදින් සැපසේ ජීවත් වන්නේ නම් සර්පයා මීගුලෙහි මෙන් සෙනාසනවල වසන්නේය.

3. මහණකමට ආශාවෙන් ඉදින් සැපසේ ජීවත්වනු කැමැත්තේ නම් අප්‍රමාදවූ එකම ධර්මය වඩමින් ලදදෙයින් සතුටුව වසන්නේය." ආයුෂ්මත් ධනිය තෙර මෙසේ මේ ගාථා කීයේය.

5. **මාතංග පුත්‍ර ථෙර ගාථා**:- 1. "මේ වේලාව බොහෝ සීතලය. මේ ඉතා උෂ්ණය දැන් ඉතා සවස්යයි මෙසේ හරණලද වැඩ ඇති මානවකයන්ට අවස්ථාව වැරදීයයි.

2. "මේ ලොකයෙහි යම් කෙනෙක් සීතලද උෂ්ණයද තණකොළයකට වඩා ගණන් නොගනීද, පුරුෂ වීර්ය කරණ හෙතෙම සැපයෙන් ඈත්නොවෙයි.

3. "දබ්බනම් තණකොළද, කුශතණද, කටු සහිත ගස්ද, සැවැන්දරාද, මුදුතණ හා බබුස්තණද, විවේකය වඩන මම ලයින් ඉවසන්නෙමි." ආයුෂ්මත් මාතංග පුත්‍ර තෙර තෙමේ මෙසේ මේ ගාථා කීයේය.

6. **ඛුජ්ජසොභිත ථෙර ගාථා**:- 1. "පැළලුප් නුවර වැසි විසිතුරු ධර්ම කථා ඇති, බොහෝ උගත් ශ්‍රමණයෝ වෙත්ද, ඔවුන් අතරින් කෙනෙකුවූ දීර්ඝායුෂ ඇති ඛුජ්ජසොභිතවූ ආයුෂ්මත් තෙමේ දොරකඩ සිටියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "පැළලුප් නුවරවැසි විසිතුරු ධර්ම කථා ඇති බොහෝ උගත් ශ්‍රමණයෝ වෙත්ද, ඔවුන් අතරින් කෙනෙකුවූ වාතයෙහි ගමන් කරන ආයුෂ්මත් තෙමේ දොරකඩ සිටියි.

3. "කෙලෙස් යුද්ධයෙන් ධර්මය පිදීමෙන්, කෙලෙස් පැරදවීමෙන් බ්‍රහ්මචර්ය පුරුදු කිරීමෙන් මෙසේ මේ සැපට පැමිණේ." ආයුෂ්මත් බුජ්ජසොභිත තෙර මෙසේ මේ ගාථා කීයේය.

7. **වාරණ ථෙර ගාථා**:- 1. "මේ ලොකයෙහි මනුෂ්‍යයන් අතුරෙහි යම් කෙනෙක් සතුන් මරාද මෙලොවින්ද පරලොවින්ද යන දෙලොවින් ඒ මනුෂ්‍යතෙමේ පිරිහෙයි.

2. "මෛත්‍රී සිතින් යම් කෙනෙක් සියලු ප්‍රාණීන්ට අනුකම්පාකරයිද, ඒ කරණකොටගෙන එබඳු මනුෂ්‍යතෙම බොහෝ පින් රැස්කරයි.

3. "සුභාෂිතයෙහිත්, ශ්‍රමණයන් ආශ්‍රය කිරීමෙහිත්, තනිව එක ආසනයෙහි සිටීමේත්, සිත සංසිඳවීමෙත් හික්මෙව්." ආයුෂ්මත් වාරණ තෙර මෙසේ මේ ගාථා කීයේය.

8. **පස්සික ථෙර ගාථා**:- 1. "ශ්‍රද්ධාවත්වූ ඤාණවන්තවූ ධර්මිෂ්ඨවූ සිල්වත්වූ ඒ එක් තැනැත්තා නමුත් ශ්‍රද්ධාව නැති මේ ඥාතිවූ දන්නාවූ හිතවතුන්ට වඩා යහපත් වේ.

2. "ඥාති බන්ධු ආශාවෙන් භික්ෂූන් අතර ක්‍රියාකොට මා විසින් නිග්‍රහ කිරීමෙන් හා අනුග්‍රහ කිරීමෙන් ඥාතීන්ට චොදනා කරණලදී.

3. "ඉක්මගියාවූ කළුරිය කළ ඔව්හු දිව්‍යසම්පත්තියට පැමිණියාහුය. මගේ සහෝදරවරුද මවුද කැමති දේ ලැබ සතුටුවෙත්." ආයුෂ්මත් පස්සික තෙර මෙසේ මේ ගාථා කීයේය.

9. **යසොජ ථෙර ගාථා**:- 1. "දන්තිලතා නම් වැලක පුරුකක් වැනි කෙට්ටුවූ නහර මතුවීගිය, ආහාරපානයන්හි පමණ දන්නාවූ කම්මැලි නැති ස්වභාව ඇති පුරුෂ තෙමේ,

2. "කැලේ මහවනයෙහි ඩැහැලේ බොන මැස්සන්ගෙන් හා, මදුරුවන්ගෙන් ස්පර්ශ කරණ ලද්දේ යුද පෙරමුණක ඇතෙකු මෙන් සිහි ඇතිව එහිම ඉවසන්නේය.

2. "බ්‍රහ්මයා යම්සේද එසේම තනියම හැසිරෙන්නේ සැපය. දෙවියන්ට සේ දෙදෙනෙකුවූ විට සිතේ කිපීම වන්නේය. තුන්දෙනෙකුගේ වාසය ගමේ විසීමක් මෙනි. තුන්දෙනෙකුට වඩා සිටින තැන කෝලාහලයකි." ආයුෂ්මත් යසොජ තෙර මෙසේ මේ ගාථා කීයේය.

10. **සාටිමත්තිය ථෙර ගාථාः-** 1. "තොපට පෙර ශ්‍රද්ධාවක් විය. ඒ ශ්‍රද්ධාව අද තොපට නැත. යමක් තොපගේද එය තොපගේමය. මගේ දුශ්චරිතයක් නැත.

2. "ශ්‍රද්ධාව අනිත්‍යය, සෙලවේ. මෙසේ මා විසින් දක්නාලදී. ඇලීමද නොඇලීමදවේ. එවැන්නක් සමග ඇලුණත් නොඇලුණත් ප්‍රව්‍රජිතයාට කිනම් පාඩුවක්ද,

3. "ගෙයක් ගෙයක් පාසා ප්‍රව්‍රජිතයාට බත් පිසියි. මගේ පාවල ශක්තිය ඇත. පිඬු පිණිස හැසිරෙන්නෙමි." ආයුෂ්මත් සාටිමත්තිය තෙර මෙසේ මේ ගාථා කීයේය.

11. **උපාලි ථෙර ගාථාः-** 1. "ශ්‍රද්ධාවෙන් ගෙන් නික්ම අළුත පැවිදිවූ නවක තෙමේ පිරිසිදු ජීවිකාව ඇති, කම්මැලි නොවූ යහපත් මිත්‍රයන් ආශ්‍රය කරන්නේය.

2. "ශ්‍රද්ධාවෙන් ගෙන් නික්ම අළුත පැවිදිවූ නවක තෙමේ සංඝයා කෙරෙහි වාසය කරණ ඤාණවන්ත මහණ තෙමේ විනයෙහි හික්මෙන්නේය.

3. "ශ්‍රද්ධාවෙන් ගෙන් නික්ම අළුත පැවිදිවූ නවක තෙමේ තෘෂ්ණාදිය පෙරටු නොකොට කැප ඇකැපයෙහි දක්ෂව හැසිරෙන්නේය." ආයුෂ්මත් උපාලි තෙර මේ ගාථා මෙසේ කීයේය.

12. **උත්තරපාල ථෙර ගාථාः-** 1. "අර්ථ කල්පනා කිරීමට සමර්ථවූ පණ්ඩිතවූ මා ලොකයෙහි පස්කම් රසය තෙමේ මුලාවට දැම්මේය.

2. "ඇනුණු තද හුලක් සමානව මාරයාගේ වසඟයට දුවන්නේ මර රජහුගේ තොණ්ඩුවෙන් බේරෙන්නට නොහැකිවිය.

3. "මාගේ සියලු කාමයෝ ප්‍රහීනය. සියලු භවයෝ ලිහා දමන ලද්දාහ. ජාතියෙන් ජාති ඉපදීම්යයි කියනලද පුනර්භවය දැන් නැත." ආයුෂ්මත් උත්තරපාල තෙර මේ ගාථා මෙසේ කීයේය.

13. **අභිභූත ථෙර ගාථා**:- 1. "යම්තාක් මෙහි රැස්වූ සියලු ඥාතීහු අසව්. තොපට ධර්මය දෙසන්නෙමි. නැවත නැවත ඉපදීම දුක්වෙයි.

2. "බුද්ධශාසනයෙහි ප්‍රථම වීර්යය කරව්. ඉන්වඩාත් වීර්ය කරව්. ශ්‍රෙෂ්ඨශීල ශ්‍රෙෂ්ඨ ශික්ෂාවෙහි යෙදෙව්. ඇතා හුණවනයක් මෙන් මාරසේනාව කම්පා කරව්.

3. "යමෙක් මේ ධර්ම විනයෙහි අප්‍රමාදව වසන්නේද උත්පත්තිය නමැති සසර හැර දුක්කෙළවර කරන්නේය." ආයුෂ්මත් අභිභූත තෙර මේ ගාථා මෙසේ කීයේය.

14. **ගොතම ථෙර ගාථා**:- 1. "හැසිරෙන්නේ නිරයට ගියෙමි. නැවත නැවත ප්‍රේත ලොකයට ගියෙමි. තිරිසන් යොනියෙහි දුකට ගියෙමි. නොයෙක් ප්‍රකාරයෙන් මෙතැන්හි බොහෝ කලක් මා විසින් වසනලදී.

2. "මා විසින් මනුෂ්‍යභවයද අමාරුවෙන් ලබන ලද්දේය. එක්වරක් දෙවරක් ස්වර්ග සම්පත්තියට පැමුණුනෙමි. රූපලොකයෙහිද අරූපලොකයෙහිද සංඥාව ඇති නැති තැන්හිද සංඥාව නැති තැනද උපන්නෙමි.

3. "හෙතු ප්‍රත්‍යයෙන් හටගත්දෙය, හරයක් නැති ලෙස දන්නාලදී. සංස්කාරයෝ ස්ථිරනොවූහ. බිඳෙන සුළුය තමන්ට අයත්වූ එය දැන සිහි ඇත්තේ නිවනම ලබන්නේය." ආයුෂ්මත් ගොතම තෙර මෙසේ මේ ගාථා කීයේය.

15. **හාරිත ථෙර ගාථා**:- (තිකනිපාතයේ 3 බක්කුල ථෙර ගාථා මෙනි.) ආයුෂ්මත් හාරිත තෙර මෙසේ මේ ගාථා කීයේය.

16. **විමල ථෙර ගාථා**:- 1. "පාපමිත්‍රයන් දුරුකොට උතුම් පුද්ගලයන් ආශ්‍රය කරන්නේය. නොසෙල් වෙන සැපය පතමින් ඒ උතුම් පුද්ගලයාගේ අවවාදයෙහි සිටින්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2 - 3 (දුකනිපාතයේ දෙවෙනි වර්ගයේ 4 ගාථාව මෙනි.) ආයුෂ්මත් විමලතෙර මෙසේ මේ ගාථා කීයේය.

---

# 4. චතුක්ක නිපාතය.

1. **නාගසමාල ථෙර ගාථා**:- 1. "අලංකාරවූ යහපත්ව ඇන්දාවූ මල් දරණ සඳුන් ගෑ ශරීර ඇති නැටුම් දත් ස්ත්‍රියක් තූර්ය ගසන කල මහමග මැද නටයි.

2. "මම පිඬු පිණිස හැසිරෙන්නේ අලංකාරවූ යහපත්ව ඇන්දාවූ දමන ලද මරු තොණ්ඩුවක් වැනි ඈ දුටුවෙමි.

3. "ඉක්බිති මාගේ මනසට සිතිවිල්ලක් පහළ විය. දොස් දැක්ම පහළ විය. කළකිරීම පැමිණ සිටියේය.

4. "ඉක්බිති මාගේ සිත කෙලෙසුන්ගෙන් මිදුණේය. ධර්මයෙහි යහපත් බව බලව. ත්‍රිවිද්‍යාවන්ට පැමුණුනෙමි. බුදුන්ගේ අනුශාසනය කරණ ලදී." ආයුෂ්මත් නාගසමාල තෙර මෙසේ මේ ගාථා කීයේය.

2. **භගු ථෙර ගාථා**:- 1. "මම නිදිබර ස්වභාව ඇත්තේ විහාරයෙන් නික්මුනෙමි. සක්මනට බසින්නේ එහිම බිම වැටුනෙමි.

2. "අත් පා අතගා නැවත සක්මනට බැස්සෙමි. ඒ මම ඇතුළත සන්සුන්ව සක්මනෙහි සක්මන් කෙළෙමි.

3-4 (මේ ඡෙද චතුක්ක නිපාතයේ 1 ගාථාවල 3-4 ඡෙද මෙනි.) ආයුෂ්මත් භගු තෙර මෙසේ මේ ගාථා කීයේය.

3. **සභිය ථෙර ගාථා**:- 1. "අන්‍යයෝ අපි මෙහි මාරයා සමීපයට යමුයයි නොදනිත්. යම් කෙනෙක් එහි යන බව දනිත් නම් ඉන් කෝලාහල සන්සිඳෙත්.

2. "නොදන්නාහු යම් කලෙක්හි නොමැරෙන්නවුන් මෙන් ඉරියව් පවත්වත්ද යම් කෙනෙක් ධර්මය දනිත්ද ඔව්හු ලෙඩුන් අතරෙහි ලෙඩ නැතිව වසත්.

3. "ලිහිල් කළ යම් කර්මයක් වේද කිලිටිවූ යම් ව්‍රතයක් ඇත්තේද සැකයෙන් සිහි කටයුතු හැසිරීමක් වේද එය මහත් ඵල නොවේ.

4. "යමෙකුට සමාන සිල් ඇත්තන් කෙරෙහි ගෞරවයක් නොලැබේද, අහසට පොළොව මෙන් ධර්මයෙන් ඈත්වේ." ආයුෂ්මත් සභිය තෙර මෙසේ මේ ගාථා කීයේය.

4. **නන්දක ථෙර ගාථා**:- 1. "අශුචියෙන් පිරුණාවූ දුර්ගන්ධවූ මාරයාගේ පක්ෂයෙහිවූ කුණු වැගිරෙන ශරීරයට නින්දා වේවා. තොපගේ ශරීරයෙහි යමක් නිතර ගලා බසිත්ද, ඒ සිදුරු නවයකි.

2. "පැරණි මට ඇතිවූ අදහස් නොසිතනු මැනවි. තථාගතයන් වහන්සේ අවමන් නොකරන්නෙහිය. ඒ ශ්‍රාවකයෝ දිව්‍ය ලොකයෙහිත් ඇලෙන්නාහුය. මනුෂ්‍ය ලොකය ගැන කියනුම කවරේද?

3. "බාලවූ ප්‍රඥාව නැති නපුරු සිතිවිලි සිතන මොහයෙන් වැසුනාවූ එවැන්නෝ මාරයා විසින් දමන ලද බැම්මෙහි බැඳෙත්.

4. "යම් කෙනෙකුන් විසින් රාගයද ද්වෙෂයද නොදැනීමද සිඳින ලද්දේද නොසෙල්වෙන බැමි ඇති සර්වඥ පුත්‍රයෝ එහි නොඇලෙත්." ආයුෂ්මත් නන්දක තෙර මෙසේ මේ ගාථා කීයේය.

5. **ජම්බුක ථෙර ගාථා**:- 1. "පස් පනස් වසක් ධූලි හා අශුචි දැරුවෙමි. මසකට වරක් ආහාර දිවගා බලමින් අළු ඉසීමෙන් බුරුල්වූ කෙස් අතින් උගුල්ලන්නේ විය.

2. "එක් පයකින් සිටියෙමි. ආසන දුරු කෙළෙමි. වේලුණු අශුචි කෑවෙමි. ආරාධනා නොඉවසීමි.

3. "මෙබඳු බොහෝ අපායට යන දේ කොට අපායට යන්නේ බුදුන් සරණ ගියෙමි.

4. සරණයාම බලව. ධර්මයෙහි යහපත් බව බලව, ත්‍රිවිද්‍යාවන්ට පැමිණියෙමි. බුදුන්ගේ ශාසනය කරණලදී." ආයුෂ්මත් ජම්බුක තෙර මෙසේ මේ ගාථා කීයේය.

**6. සොනක ථෙර ගාථා**:- 1. "ගයාවෙහි මැදින් මස පොහොය දිනයෙහි ඒකාන්තයෙන් මට යහපත් පැමිණීමක් වේවා. උතුම්වූ ධර්මය දෙශනා කරණ බුදුන් දුටුවෙම්ද එහෙයිනි.

2. "මහත් ආලොක ඇති පිරිසට නායකවූ ශ්‍රෙෂ්ඨත්වයට පැමිණි තමහට වඩා ශ්‍රෙෂ්ඨයක නැති බුදුන් දෙවියන් සහිත ලොකයාට ශ්‍රෙෂ්ඨ දැකීමකි.

3. "මහත් ඇතෙකු වැනිවූ මහාවීරයෙකුවූ මහා ආලොකයක් ඇති, කෙලෙස් නැති, සියලු කෙලෙස් නැති කළාවූ කිසිතැනක බියක් නැත්තාවූ ශාස්තෘන් වහන්සේ යම් හෙයකින් දැක්කේද එය මගේ යහපත් දැකීමකි.

4. "ඒකාන්තයෙන්ම වැරදි විශ්වාස නමැති බැම්මෙන් බඳිනු ලදුව මා බොහෝ කාලයක් කිලිටිවූයේද, ඒ භාග්‍යවතුන් වහන්සේ සියළු ගැටවලින් සෝනක තෙරුන් මිදෙව්වේය." ආයුෂ්මත් සෝනක තෙර මෙසේ මේ ගාථා කීයේය.

**7. සම්භූත ථෙර ගාථා**:- 1. "යමෙක් තෙමේ සැක සහිත කාලයෙහි වෑයම් කරයිද එතර වියයුතු කාලය හිස් කරයිද, නුවණ නැති බව හෙතුකොට බාලයා දුකට පැමිණෙයි.

2. "එබඳු පුද්ගලයාගේ මේ ආත්මයෙහිවූ අභිවෘද්ධිය කළුවර පක්ෂයෙහි හඳ මෙන් පිරිහෙත්. අයසටද පැමිණෙයි. මිත්‍රයන් සමගද විරුද්ධ වේ.

3. "යමෙක් සැක කළයුතු කාලයෙහි සැක කරයිද එතර විය යුතු කාලයෙහි එතරවේද නුවණින් යුක්තවීමෙන් පණ්ඩිතතෙමේ සැපයට පැමිණෙයි.

4. "ඔහුගේ අභිවෘද්ධිය සඳ මෙන් පිරෙයි. යසසටද කීර්තියටද පැමිණෙයි. මිත්‍රයන් හා විරුද්ධ නොවේ. ආයුෂ්මත් සම්භූත ස්ථවිරතෙමේ මෙසේ මේ ගාථා කීයේය.

**8. රාහුල ථෙර ගාථා**:- 1. "දෙපැත්තෙන් යහපත්වූ සොඳුරු රාහුලයයි මට කීහ. යම් මම බුදුන්ගේ පුත්‍රද, යම් මම ධර්මයන්හි ඇස් ඇත්තෙමි.

2. "මා විසින් යම් පව් දුරු කළාහුද, යම් නැවත ඉපදීමක් මට නැද්ද දක්ෂිණාවට සුදුසු රහත් කෙනෙක්මි. නිවන පෙනෙන ත්‍රිවිද්‍යා ඇත්තෙකි.

3. "කෙමින් කටෙහි අසුවූ මසුන් මෙන් කාමයන්හි අන්ධය. දැලින් වැසෙන ලදී. ආශා නැමැති පියස්සෙන් වසනලදී. ප්‍රමාදවවන්ගේ නෑවූ මාරයා විසින් බඳින ලදී.

4. "ඒ කාමය මම උදුරා මාරයාගේ බැම් සිඳ මුල් සහිත තෘෂ්ණාව උදුරා සිහිල් වූයෙමි. නිවුණෙමි." ආයුෂ්මත් රාහුල තෙර මෙසේ මේ ගාථා කීයේය.

**9. චන්දන ථෙර ගාථා**:- 1. "රනින් වැසුණු ආභරණ පැළඳි දාසී සමූහයා විසින් පෙරටු කරණ ලද්දේ, පුත්‍රයා ඇකයෙන් ගෙන භාර්යාව මාවෙත පැමිණියාය,

2. "අලංකාරවූ යහපත්ව ඇන්දාවූ දැමූ මරු පාසයක් වැනි තම පුත්‍රයාගේ මව දැක

3. "ඉක්බිති මට නුවණින් යුතු සිතක් උපන්නේය. දොෂය පෙනුණේය. කලකිරීම එළඹ සිටියේය.

4. "ඉක්බිති සිත කෙලෙසුන්ගෙන් මිදුනේය. ධර්මයෙහි යහපත් බව බලව. ත්‍රිවිද්‍යාවට පැමිණියෙමි. බුදුන්ගේ අවවාදය කරණලදී. ආයුෂ්මත් චන්දන තෙර මෙසේ මේ ගාථා කීයේය.

**10. ධම්මික ථෙර ගාථා**:- 1. "දශකුශල ධර්මය ඒකාන්තයෙන් ධර්මචාරී පුද්ගලයා රකියි. යහපත්කොට පුරුදු කළ ධර්මය සැප ගෙනදෙයි. පුරුදු කළ ධර්මයෙහි මේ ආනිසංසය ධර්මචාරී පුද්ගලයා දුගතියකට නොයවයි.

2. "ධර්මය අධර්මය යන දෙක සමාන විපාක දෙන්නේ නොවේ. අධර්මය අපායට යවයි. ධර්මය නිවනට යවයි.

3. "එසේ හෙයින් ධර්මයෙහි ආශාව කරන්නේය. නොසෙල්වෙන බුදුන් කෙරෙහි සතුටුවන්නේ ධර්මයෙහි ආශාව කරන්නේය. ධර්මයෙහි සිටියාවූ ශ්‍රෙෂ්ඨ පිහිට අනුව යන ප්‍රඥාවන්තයෝ නිවනට පමුණුවත්.

4. "අවිද්‍යාව දුරුකරණලදී. තෘෂ්ණා දැල නසනලදී. ඒ මම ක්ෂය කළ සංසාරය ඇත්තෙම් දොස් නැති කලා සම්පූර්ණ සඳ මෙන් ක්ෂය කළ සංසාරය ඇත්තේ රාගාදී ක්ලේශයන් නැත්තෙක්වීමි." ආයුෂ්මත් ධම්මික තෙර මෙසේ මේ ගාථාව කීයේය.

11. **සප්පක ථෙර ගාථා**:- 1. පිරිසිදු සුදුපාට පියාපත් ඇති පක්ෂීහු යම් කලෙක්හි කළු පැහැ ඇති වලාකුලට බියෙන් තැතිගත්තාහු තමාගේ කූඩුව සොයා යති. එකල්හි අජකරණී නදිය මගේ සිත සතුටු කරයි.

2. "පිරිසිදු සුදුපාට පියාපත් ඇති පක්ෂීහු යම් කලෙක්හි කළු පැහැති වලාකුලට බියෙන් තැතිගත්තාහු සැඟවීමට තැනක් නැතිව ලෙනක් සොයත්ද, එකල්හි අජකරණී නම් නදිය මගේ සිත සතුටුකරයි.

3. එහි දෙපසෙහි දඹ ගස් කවරෙකුගේ සිත් නො අලවත්ද, මගේ ලෙන පිටිපස ගං ඉවුර අලංකාර කරත්.

4. "ඒ මැඩියෝ සර්ප සමූහයාගෙන් දුරුවූ ඒ ස්ථානයෙහි මිහිරි හඬින් නාදකරත්. අද පර්වතය නදීන්ගෙන් ඈත් විය යුතු දිනයක් නොවේ. බිය නැති අජකරණී නදිය ඉතා යහපත්ය." ආයුෂ්මත් සප්පක තෙර මෙසේ මේ ගාථා කීයේය.

12. **මුදිත ථෙර ගාථා**:- 1. "මම ජීවිකාව පිණිස පැවිදිවීමි. උපසම්පදාව ලබා ඊටත් වඩා ශ්‍රද්ධාව ලැබුවෙමි. තද වීර්ය ඇතිව භාවනා කෙළෙමි.

2. "ඒකාන්තයෙන් මේ ශරීරය බිඳේවා, මේ වීර්යයෙන් ශරීරයෙහි මස්පිඬු විසිරේවා, දනසන්ධි දෙකින් කෙණ්ඩා කැඩී වැටෙත්වා.

2-4 (3 වෙන නිපාතයේ 2 ගාථාවල 2, 3 ඡෙද මෙනි.)" ආයුෂ්මත් මුදිත තෙර මෙසේ මේ ගාථා කීයේය.

# 5 පඤ්චක නිපාතය

1. **රාජදත්ත ථෙර ගාථා**:- 1. "මහණතෙම සොහොනට ගොස් සොහොනෙහි හැරදමනලද පණුවන් වටවී කන ස්ත්‍රියකු දුටුයේය.

2. "යම්හෙයකින් නින්දිතවූ මළහු දැක ඇතැම් කෙනෙක් පිළිකුල් කරත්ද, මට කාම ආශාව පහළවිය. අශුචි වැගිරෙන ශරීරයෙහි අන්ධයෙකු මෙන් වීමි.

3. "බතක් පැසෙන කාලයටත් අඩු කාලයක් ඒ ස්ථානයෙන් බැහැරවූයෙමි. මම සිහි ඇතිව යහපත් නුවණින් යුක්තව එක්පැත්තකට ගියෙමි.

4-5 (4 නිපාතයේ 9 ගාථාවල 2-3 ඡෙද මෙනි)" ආයුෂ්මත් රාජදත්ත තෙර මෙසේ මේ ගාථා කීයේය.

2. **සුභූති ථෙර ගාථා**:- 1. "තම යහපතද අනුන්ගේ යහපතද බලාපොරොත්තුවන පුරුෂතෙම තමා නොයෙදිය යුතු දෙයෙහි යෙදෙන්නේද හිත සැපයට නොපැමිණෙන්නේය. එය මගේ අවාසනාවකැයි සිතයි.

2. "රාග නමැති දුකට පැමිණි සංසාර නමැති රට වනසා නොදමා භාවනා නමැති දෙවැන්නා නැතිව තනිවම අත්හරින්නේද, එය පාපයක් වන්නේය. නිවන් මෝරවන ගුණධර්ම සියල්ල අත්හරින්නේය. සම විෂම නොදක්නා බැවින් අන්ධයෙක්ම වන්නේය.

3. (3 වෙනි නිපාතයේ (18 පිටුව) 8 ගාථාවල 2 ඡෙදය මෙනි.)

4-5 (මේ ඡෙද 20 පොතේ ධම්පදයේ 4 පුෂ්ප වර්ගයේ 8, 9 ඡෙද මෙනි) "ආයුෂ්මත් සුභූති තෙර මෙසේ මේ ගාථා කීයේය.

3. **ගිරිමානන්ද ථෙර ගාථා**:- 1. "මෙඝය වලාකුලේ ගීතයට අනුව වසීද, මාගේ කුටිය සෙවෙලිකරණ ලදී. සැපය පහසුය. එහි සංසිඳී වාසය කරමි, වැස්ස ඉදින් ඔබට වුවමනානම් වර්ෂා කරන්න.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. (මේ ගාථාවේම 1 ඡේදය සංසිඳී යන්නට සන්සුන් සිත් ඇත්තේ කියා වෙනස්කර යොදාගත යුතුයි.)

3. (මෙහිම 1 ඡේදය සංසිඳී යන්නට පහවූ රාග ඇතිව කියා වෙනස් කර යොදාගත යුතුයි.)

4. (මෙහිම 1 ඡේදය සංසිඳී යන්නට පහවූ ද්වෙෂ ඇතිව කියා වෙනස්කර යොදාගත යුතුයි.)

5. (මෙහිම 1 ඡේදය සංසිඳී යන්නට පහවූ මෝහ ඇතිව කියා වෙනස්කර යොදාගත යුතුයි.)" ආයුෂ්මත් ගිරිමානන්ද තෙර මේ ගාථා මෙසේ කීයේය.

**4. සුමන ථෙර ගාථා:-** 1. "නිවැරදි ධර්මයන්ගෙන් යම් ධර්මයක් මට ලැබේවායි බලාපොරොත්තුවන උපාධ්‍යායතෙමේ අමෘත මහා නිර්වාණය බලාපොරොත්තුවෙන් මට අනුකම්පා කළේය. මා විසින් කළ යුතු වැඩ අවසන් කරණලදී.

2. "උපද්‍රව නැති ධර්මයට පැමිණියෙමි. තෙමේම ප්‍රත්‍යක්ෂ කරණලදී. ඔබගේ සමීපයෙහි පිරිසිදු නුවණ ඇත්තේ සැක නැත්තේ ප්‍රකාශ කරමි.

3. "පෙර විසූ පරිදි දනිමි. දිවඇස පිරිසිදු කරණලදී. මා විසින් තමාගේ යහපතට පැමිණෙනලදී. බුදුන්ගේ අනුශාසනය කරණලදී.

4. "අප්‍රමාදවූ මට ඔබවහන්සේගේ සස්නෙහි හික්මීම අස්වනලදී. මා විසින් සියලු ආශ්‍රවයෝ ක්ෂය කරණ ලද්දාහ. දැන් නැවත ඉපදීමක් නැත.

5. "පිරිසිදු ශීලාදී වත් සමාදානයෙන් මට අනුශාසනා කරණලදී. අනුකම්පා කරණලදී. අනුග්‍රහකරණලදී. අතවැස්සා කෙරෙහි හික්මවනලද අවවාදය හිස්නොවීය." ආයුෂ්මත් සුමනතෙර මේ ගාථා මෙසේ කීයේය.

**5. වඩ්ඪ ථෙර ගාථා:-** 1. "මව මට අවවාද නමැති කෙවිටක් එල්ලකරන්නේද, යහපත්ය. මව විසින් අවවාද කරණලද මම යමෙකුගේ වචන අසා,

2. "පටන්ගන්නාලද වීර්ය ඇත්තේ රහත්වූයේ උතුම් බුද්ධත්වයට පැමිණියෙමි. ත්‍රිවිද්‍යා දත් නිවන් ප්‍රත්‍යක්ෂකරණලද දීමට සුදුසු රහත් කෙනෙක්මි.

3. "මාරසේනාව සිඳ කෙලෙස් නැතිව වසමි. ඇතුළතද පිටතද, යම් කෙලෙස් කෙනෙක් වූවාහුද,

4. "සියල්ලෝ ඉතිරි නැතිව සින්දාහ. නැවත නූපදී. ධර්මය නිපුන නැගනිතොමෝ මේ කරුණ කීවාය.

5. "ඒකාන්තයෙන් මා කෙරෙහිද තොපගේ පුත්‍රයා කෙරෙහිද සබඳකම් නැතැයි සිතමි. අවිද්‍යාදී කැලෑවක් තොප කෙරෙහි නැත. දුක කෙළවර කරණලදී. මේ අන්තිම ඉපදීමය. දැන් නැවත ඉපදීම යයි කියනලද උත්පත්තියක් මරණයක් සසරක් නැත." ආයුෂ්මත් වඩ්ඪතෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**6. නදී කාශ්‍යප ථෙර ගාථා:-** 1. "බුදුරජතෙම ඒකාන්තයෙන් මගේ යහපත පිණිස නෙරංජරානදිය වෙත ගියේය. මම යමෙකුගේ ධර්මය අසා වැරදි විශ්වාසය අත්හලේද ඒ බුදුන් වහන්සේය."

2. "අන්ධයෙකු මෙන් වූයේ පෘථග්ජනයෙක්වූයේ මෙය සුද්ධියයයි සිතමින් උස් පහත් යාග කෙළෙමි. මම එහි ගිනි දෙවියා පිදීමි.

3. "අන්ධයෙකු මෙන් නුවණ නැතිව දෘෂ්ටීන් වෙත දිව්වෙමි. තදින් ගැනීම් සංඛ්‍යාත අල්වා ගැනීමෙන් මුළා වූයේ අපිරිසිදු දෙය පිරිසිදු යයි සිතුවෙමි.

4. මාගේ වැරදි වැටහීම සියලු භව පලන ලදී. දීමට සුදුසු ගින්නෙහි පුදමි, තථාගතයන් වඳින්නෙමි.

5. "මාගේ සියලු මොහයෝ නැතිවූහ. භව ආශාව පලන ලදී. ඉපදීම් නමැති සසර ක්ෂයවිය. දැන් නැවත ඉපදීමක් නැත." නදී කාශ්‍යප තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**7. ගයා කාශ්‍යප ථෙර ගාථා:-** 1. "ඒ මම දවසට තුන් වරක් උදෑසනද මද්දහනද සවසද උපවාස කාලයෙහි ගයාවෙහි දියට බැස්සෙමි.

2. "පෙර නොදන්නා කාලයෙහි මා විසින් යම් පාප කර්මයක් කරණ ලද්දේද එය දැන් මෙහි පා කර හරිමි. පෙර මෙබඳු දෘෂ්ටියක් විය.

3. "ධර්මයෙන් හා වැදගත් පදයන්ගෙන් යුත් යහපත් වචන අසා ඒ තත්වූ පරිදි තේරුම්ගෙන නුවණින් සිතුවෙමි.

4. "සෝදාහරණලද සියලු පව් ඇත්තෙමි. නිර්මලවෙමි. පරිශුද්ධවෙමි. සෝදන ලද්දේවෙමි. පිරිසිදුවූයේ පිරිසිදු වස්තු අයිති බුදුන්ගේ ළෙහි වැඩුණු පුත්‍රයෙක් වූයෙමි.

5. "අංග අටකින් යුත් මාර්ගයට බැස සියලු පව් පා කර හැරියෙමි. ත්‍රිවිද්‍යාවන් ලැබුවෙමි. බුදුන්ගේ අවවාදය කෙළෙමි." ආයුෂ්මත් ගයා කාශ්‍යප තෙරණුවෝ මේ ගාථා මෙසේ කීහ.

8. **වක්කලී ථෙර ගාථා**:- 1. "වාත ලෙඩකින් පෙළුනු මහා වනයෙහි වාසය කරන්නාවූ ප්‍රත්‍ය පහසු නැති මහණ ඔබ කෙසේ වාසය කරන්නෙහිද?"

2. "මහත්වූ ප්‍රීති සැපයෙන් ශරීරය පතුරුවමින් රළුවුවද ඉවසමින් වනයෙහි වාසය කරන්නෙමි.

3. "සතිපට්ඨානයන්ද, ඉන්ද්‍රියයන්ද, බල ධර්මද දියුණු කරමින් බොජ්ක්ධංගද වඩමින් වනයෙහි වාසය කරන්නෙමි.

14. "පටන් ගන්නාලද වීර්ය ඇති නිවන වෙත යොමු කළ සිත් ඇති නිතර දෘඪ වීර්යයෙන් යුක්තව සමගිවූ සමානයන් දැක වනයෙහි වාසය කරමි.

5. "ශ්‍රෙෂ්ඨවූ හික්මුනාවූ එකඟවූ සිත් ඇති බුදුන් සිහි කරමින් කම්මැලි නැතිව රෑ දාවල් වනයෙහි වාසය කරන්නෙමි." ආයුෂ්මත් වක්කලී තෙරණුවෝ මේ ගාථා කීහ.

9. **විජිතසෙන ථෙර ගාථා**:- 1. "චිත්තය තොපගේ මාර්ගය කුඩා දොරටුවකින් ඇතෙකු මෙන් වලක්වන්නෙමි. මාර දැලක්වූ සිත, තෝ පාපයෙහි නොයොදවන්නෙමි.

2. "දොරටුවක් නොලැබෙන ඇතෙකු මෙන් තෝ වැලැක්කේ නොයන්නෙහිය. සිත නැමැති කාලකණ්නිය, නැවත නැවත වලක්වන්නේ පාපයෙහි ඇලුනෙක් නොවන්නෙහිය.

3. "ඇත්ගොව්වා අලුත අල්වා ගත් නොහික්මුණු ඇතෙකු යම්සේ නොකැමැති පරිද්දෙන් නවත්වයිද, මෙසේ තොප නවත් වන්නෙමි.

4. "ශ්‍රෙෂ්ඨ අසුන් දමනය කිරීමෙහි දක්ෂවූ උතුම් අස්ගොව්වෙක් ආජානීය අශ්වරාජයෙකු දමනය කරයිද, ශ්‍රද්ධාදී පඤ්චබලයෙහි පිහිටා තොප මෙසේ දමනය කරන්නෙමි.

5. "තොප සිහියෙන් බඳින්නෙමි. පිරිසිදුවූයේ චොදනා කරන්නෙමි. වීර්යය නමැති වියගහෙන් කම්පා කෙළේ සිතමින් ඈතට නොයන්නේය." ආයුෂ්මත් විජිතසෙන තෙරණුවෝ මේ ගාථා මෙසේ කීහ.

**10. යසදත්ත ථෙර ගාථා**:- 1. "දොෂාරොපන කරණ අදහසින් මෝඩයා බුද්ධාවවාද අසයිද අහසට පොළොව මෙන් සද්ධර්මයෙන් ඈත්වූයේවේ.

2. "දොෂාරොපන කරණ අදහසින් මෝඩයා බුද්ධාවවාද අසයිද කළුවර පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් සද්ධර්මයෙන් පිරිහෙයි.

3. "දොෂාරොපන කරණ අදහසින් මෝඩයා බුද්ධාවවාද අසයිද දිය නැති විල්හි මසෙකු මෙන් සද්ධර්මයෙන් පිරිහේ."

4. "දොෂාරොපන කරණ අදහසින් මෝඩයා බුද්ධාවවාද අසයිද කුඹුරෙහි කුණුවූ බීජ මෙන් සද්ධර්මයෙහි නොවැඩේ.

5. "යමෙක් සතුටු සිතින් බුද්ධාවවාදය අසයිද, සියලු පව් නසා රහත් බව ප්‍රත්‍යක්ෂකොට පරම ශාන්තියට පැමිණ කෙලෙස් රහිතව පිරිනිවන්පායි." ආයුෂ්මත් යස දන්ත තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ.

**11. සොණකුටිකණ්ණ ථෙර ගාථා**:- 1. "මා විසින් උපසම්පදාව ලද්දේය. කෙලෙස් මිදීමෙන් මිදුනෙමි. කාමාශාදියෙන් තොරවූවෙමි. ඒ මා විසින් නුදුටු බුදුහු දක්නා ලදී විහාරයෙහි එකට විසීමි.

2. "භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියෙන් වැඩිහරියක් එලිමහනෙහි විසූසේක. විසීම්වල දක්ෂ බුදුහු ඊට පසු ගඳකිළියට ඇතුල්වූහ.

3. "නැති කළ බිය හා භයානක අරමුණු ඇති බුදුහු සඟල සිවුර අතුරා ගල්ගුහාවක සිංහයකු මෙන් සයනය කළ සේක.

4. "යහපත් වචන ඇති බුද්ධ ශ්‍රාවකවූ සොණතෙමේ බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සද්ධර්මය කීයේය.

5. "ස්කන්ධ පඤ්චකය දැන මාර්ග වඩා පරම ශාන්තියට පැමිණ කෙළෙස් රහිතව පිරිනිවන් පාත්." ආයුෂ්මත් සොණ කුටි කණ්ණ තෙරණුවෝ මේ ගාථා මෙසේ කීහ.

12. **කොසිය ථෙර ගාථා**:- 1. "යම් ඥාණවන්තයෙක් ඒකාන්තයෙන් ගුරුන්ගේ වචන දන්නේද උන්වහන්සේලාගේ වසඟයෙහි සිටීද ගෞරව උපදවාද ඒ පණ්ඩිත තෙමේ භක්ති ඇත්තේවේ. ධර්මයන් දැන විශෙෂ ගුණ උපදවන්නේය.

2. "මහත්වූ යම් විපත්තීහු පහළවූවාහුද, කම්පා නොවී ඉවසන්නේද, ඒ පණ්ඩිත තෙමෙ ශක්තිමත් නම් වේ. ධර්මය දැන විශෙෂයට පැමිණෙන්නේය.

3. "ගැඹුරු මුහුද යම්සේ කම්පා නොවේද, ගැඹුරු ප්‍රඥා ඇති අර්ථයෙහි දක්ෂ පණ්ඩිතයා නොබෙදිය හැකිවේ. දැන ධර්මයන්හි විශෙෂ ගුණ උපදවන්නේයි.

4. "බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මය අනුව හැසිරෙන එබඳු පණ්ඩිතතෙමෙ ධර්මයන් දැන විශෙෂ පුද්ගලයෙක් වන්නේය.

5. "යමෙක් බුද්ධ වචනයාගේ අර්ථය දනීද අර්ථය දැන එසේ කරයිද, හෙතෙම අර්ථ දත් පමණකින් පණ්ඩිත වේ. ධර්මයන් දැන විශෙෂ පුද්ගලයෙක් වන්නේය." ආයුෂ්මත් කොසිය තෙරණුවෝ මේ ගාථා මෙසේ කීහ.

**(පස් වැනි නිපාතය නිමි.)**

---

# ඡක්ක නිපාතය

**උරුවෙල කස්සප ථෙර ගාථා**:- 1. "පතළාවූ කීර්ති ඇති ගෞතම බුදුන්ගේ ප්‍රාතිහාර්ය දැකද, ඊර්ෂ්‍යා මානයෙන් වඤ්චා කරණලද බැවින් මම උන්වහන්සේට නොවැන්දෙමි.

2. "මගේ වැරදි කල්පනාව නිසා පුරිසදම්ම සාරථීවූ බුදුන්ට චොදනා කෙළෙමි. එහෙයින් මට අද්භූතවූද, ලොමෝද්ගතවූද, සංවේගයක් උපන.

3. "පෙර තාපසයෙක්ව සිටි මට සවල්පමාත්‍රවූ ලාභසත්කාරමය ඉර්ධියක්වීද මම එය හැරදමා සර්වඥ ශාසනයෙහි පැවිදිවීමි.

4. "පෙර යාග නම් වූ යැදීමෙන් සතුටුවූයේ කාම සුගතිය පිළිබඳ ආශාව ඇත්තෙක්ව විසුවෙමි. පසුව රාග, දොෂ, මෝහ, මාර්ග පිළිවෙළින් නැසුවෙමි.

5. "(ඒ මම) පෙර විසූ කඳ පිළිවෙල දන්නා නුවණද, දිව ඇසද, දිව කණද, ඉර්ධි බලයද පිරිසිදු කෙළෙමි.

6. "යම් අර්ථයක් නිසා ගිහි ගෙයින් පැවිදි බවට පැමිණියේද, සියලුම සංයෝජන ධර්මයන් නැති කිරීමෙන් ඒ අර්ථය සිද්ධකර ගතිමි." ආයුෂ්මත් උරුවෙල කාශ්‍යප තෙරණුවෝ මෙසේ මේ ගාථා කීහ. (ථෙර ගාථා අවසානය දක්වාම ගාථා කී ඒ ඒ තෙරුන් වහන්සේලාගේ නම යොදා මේ ඡෙදය අගට යොදා ගත යුතුයි.)

2. **තෙකිච්ඡකානි ථෙර ගාථා**:- 1. "වී හාල් ආදී ධාන්‍ය වර්ග ගෙවලත් ගම්වලත් පිරී ඇති කල්හි භික්ෂා මාත්‍රයක් නොමලදිමි, ඒ මම කෙසේ කෘෂිකර්මයෙහි යෙදෙම්ද?

2. "අපරිමාණ ගුණ ඇති බුද්ධ, ධර්ම, සංඝ යන තෙරුවන් සිහිකර පැහැදුනේ උසස් ප්‍රීතියෙන් යුක්තව සාපිපාසා දෙකින් නොමඩනා ලදුව විසුවෙමි.

3. "ලනලද දොර අගුල් ඇති සෙනසුන්හි විසීම සැපයට හේතුවක්කොට සිතා, සීතලෙන් යුක්තවූ හිම වැටෙන රාත්‍රිවල

එළිමහන් ස්ථානයන්හි විසුවෙමි. එසේ සීතලෙන් මඩනා ලදුයේ වෙහෙසට නොපැමිණියෙමි.

4. "සතර බ්‍රහ්ම විහරණ සමාපත්තීන්ට සමවදිමින් විසුවෙමි. එයින්ම සැපයට පැමිණියේ සතර ඉරියව් පැවැත්වීමි. සීතාදී උපද්‍රව නැතිව සිත නොකැළඹීමෙන් විසුවෙමි."

3. **මහානාග ථෙර ගාථා**:- 1. "යමෙකු සබ්‍රම්සරුන් කෙරෙහි ගරු කිරීමක් නැත්තේද, හෙතෙම සද්ධර්මයෙන් පිරිහෙයි. ඒ කෙසේදයත්, දියසිඳුන වළක වසන මත්ස්‍යයා මෙනි.

2. "යමෙකු සබ්‍රම්සරුන් කෙරෙහි ගරු කිරීමක් නොමැත්තේද හෙතෙම සදහම්හි දියුණුවක් නොලබයි. කෙතෙහි වපුල කුණු බිජු වටක් මෙනි.

3. "යමෙකු සබ්‍රම්සරුන් කෙරෙහි ගරු කිරීමක් නොමැත්තේද හෙතෙම සර්වඥ ශාසනයෙහි දැක්වෙන නිවනට කිට්ටු නොවෙයි.

4. "යමෙකු සබ්‍රම්සරුන් කෙරෙහි ගරු කෙරේද හෙතෙම සදහමින් නොපිරිහෙයි. දිය පිරී තිබෙන වළක වෙසෙන මත්ස්‍යයා මෙනි.

5. "යමෙකු සබ්‍රම්සරුන් කෙරෙහි ගරු කෙරේද, හෙතෙම සද්ධර්මයෙහි දියුණුවට පැමිණේ. කෙතෙහි වපුළ යහපත් ධාන්‍ය වැඩෙන්නාක් මෙනි.

6. "යමෙකු සබ්‍රම්සරුන් කෙරෙහි ගරු කෙරේද, හෙතෙම බුද්ධ ශාසනයෙහි පෙන්නුම් කළ නුවණට කිට්ටුවූ තැනැත්තෙක් වෙයි."

4. **කුල්ල ථෙර ගාථා**:- 1. කුල්ල ස්ථවිරයන් වහන්සේ සොහොනට ගොස් උඩුකුරුව හෝනා පණුවන් විසින් කනු ලබන ස්ත්‍රියක් පිළිබඳ මෘත ශරීරයක් දුටුයේය.

2. "බාලයන්ගේ සතුටට හේතුවූ උඩ වන මුඛයන්ගෙන් හා පහත වන මුඛයන්ගෙන් අශුචි වැගිරෙන්නාවූද, දුගඳ හමන්නාවූද, දුකෙන් පෙළෙන්නාවූද ශරීරය කුල්ල ස්ථවිරයෙනි බලව.

3. "ඤාණය පහළකර ගැණීමට ධර්ම නැමැති කණ්ණාඩිය ගෙණ ඇතුළතත්, පිටතත් පිළිකුල්වූ මේ ශරීරය ඤාණයෙන් සිහිකොට බැලීමි.

4. "මේ ශරීරය යම්සේද අන්‍ය ශරීරත් එසේමැයි අන්‍ය ශරීර යම්සේද මේ ශරීරයත් එසේමැයි. යට කොටස යම්සේද උඩ කොටසත් එසේමැයි. උඩ කොටස යම්සේද යට කොටසත් එසේමැයි.

5. "දහවල් යම්සේද රාත්‍රියත් එසේමැයි. රාත්‍රිය යම්සේද, දහවලත් එසේමැයි බාල තරුණ කාලවල යම්සේද මහළු කලත් එසේමැයි. මහළු කල යම්සේද බාල තරුණ කලත් එසේමැයි.

6. "එකඟවූ සිතින් ධර්මය බලන්නහුට ඇතිවන රතිය (ආශාව) පඤ්චාංගික තූර්ය නාදයෙන්ද ඇති නොවේ."

5. මාලුංක්‍යපුත්ත ථෙර ගාථා:- 1. "ප්‍රමාද විහරණයෙන් යුක්ත සත්වයා මාලුවා නැමැති වැල වැඩෙන්නාක් මෙන් තණ්හාවෙන් වැඩේ. හෙතෙම වනයෙහි වසන ඵල (ගෙඩි) කැමැති වඳුරෙක් මෙන් භවයෙන් භවයට දිවේ.

2. "යම් පුද්ගලයෙක් ලාමක තණ්හාවෙන් වැඩේද හෙතෙම එම තෘෂ්ණාව දුරුනොකට හැකිව ඊටම යටපත්ව වෙසේ. ඔහු කරා වැටෙන ශෝකයෝ සැවැන්න පඳුරෙහි වැටෙන ජල බින්දු මෙන් එකතුව සිටිති.

3. "යහපත්වූ තොපට කියමි. තොප විසින් මෙහි එක් රැස්ව තෘෂ්ණාවේ මුල සිඳිව්. කෙසේදයත් සැවැන්න පඳුරක් ගලවන්නාක් මෙනි.

4. "තද දිය පාරකින් ගඟබඩ බට පඳුරු විනාශ කරන්නාක් මෙන් ක්ලෙශ මාරයාගේ පහරට අසු නොවව්. බුදුන්ගේ වචනය ඉෂ්ට කරව්. දුර්ලභව ලැබූ මේ ක්ෂණ සම්පත්තිය පැහැර නොහරිව්. ක්ෂණ සම්පත්තිය පැහැර හැරියාහු නරකයන්හි දක්නා ලැබේ.

5. "ප්‍රමාද දොෂය (රජස්) දූවිල්ලක් වැනිය. රාගාදී (රජස්) දූවිලි ප්‍රමාදය නිසා උපදී. අප්‍රමාදයෙනුත් මාර්ග විද්‍යාවෙනුත් රාගාදී හුල් (උල්) උදුරා දමව්."

**6. සප්පදාස ථෙර ගාථා:-** 1. "මම විසිපස් අවුරුද්දක් පැවිදිව සිටියේද අසුරුසනක් ගසන කාලය පමණකුදු චිත්ත ශාන්තියක් නොලදිමි.

2. "සිතේ එකඟ බවක් නොලැබ කාම රාගයෙන් පීඩිතව දෙඅත් බැඳගෙණ අඬමින් විහාරයෙන් නික්ම"

3. "ආයුධයක් ගෙනෙමි. මගේ ජීවිතය කවර ප්‍රයෝජනයක්ද? ශික්ෂාව හැර කාලක්‍රියා කරන්නේ කෙසේද?

4. "ඒ මම ආයුධය ගෙණ ඇඳෙහි හුන්නෙමි. ගෙල සිඳීමට ආයුධය බෙල්ලෙහි තැබුවෙමි.

5. "ඉක්බිති සීලය මෙනෙහි කරණ කල්හි නුවණ පහළ විය. මාර්ගඵල ප්‍රත්‍යවේක්ෂා කරණ ඥාණයද පහළ විය.

6. "මගේ සිත කෙලෙසුන්ගෙන් මිදුනේය. ධර්මයෙහි ඇති යහපත් බව බලව, ත්‍රිවිද්‍යාවද ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද කරණ ලදී."

**7. කාතියාන ථෙර ගාථා:-** 1. "කාතියාන ස්ථවිරයෙනි උට්ඨාන වීර්යය කරව, සිහියෙන් යුක්තව හිඳගනුව, නිදි බහුලව නොසිට නිදි වර්ජිත කිරීමෙන් යුක්තවව්. අලසවුව හොත් මාරයා උපක්‍රමයෙන් යටපත් කෙරේ.

2. "කෙසේදයත් මහා සමුද්‍රයාගේ රළ වේගයකින් යටපත් කරණ පුරුෂයෙකු මෙන් ජාති ජරාදී දුකින් යටපත් කරයි. තොපි අර්හත් ඵල නම්වූ ප්‍රදීපය ආලොක කරව්, තොපට වෙන පිළිසරණක් නැත්තේය.

3. "ශාස්තෲන් වහන්සේ වනාහි මේ මාර්ගය ජය ගත් සේක. උන්වහන්සේ විසින් ජාති ජරාදිය ඉක්මවන ලදී. පූර්ව අපර යාමයන්හි අප්‍රමාදව භාවනාවෙහි යෙදෙව්.

4. "කාතියාන ස්ථවිරයෙනි, කාමගුණ බන්ධනයෝ දුරු කරව, හිස මුඩු කරන ලද්දේ භික්ෂාචාරය ගනුව, ක්‍රීඩාවෙහිද නිදීමෙහිද යන කරණුවල නොයෙදී ධ්‍යානයෙහි යෙදෙව.

5. "කාතියාන ස්ථවිරයෙනි, ධ්‍යාන වැඩීමෙන් ජයගනුව. බොධිපාක්ෂික ධර්මයන්හි දක්ෂවව, නිරුත්තරවූ පිරිසිදු බවට

පැමිණ ජලයෙන් ගිනි කඳක් නිවන්නාක් මෙන් පරිනිර්වාණය කරව.

**6.** ලපටි වැලක් මලානික වන්නාක්මෙන් ස්වල්ප මාත්‍ර ආලොකයක් ඇති පහන සුළඟින් නිවීයේද, එපරිද්දෙන් ඉන්ද්‍රගොත්‍ර මාරසේනාව විනාශ කරව, සියලු වේදනාවන්හි දුරුකරන ලද්දේ සිහිල්වූ තමාගේ පරිනිර්වාණ කාලය බලාපොරොත්තුවව.”

**8. මිගජාල ථෙර ගාථා:-** 1. “සූර්ය වංසයෙහි උපන්නා වූද, පසැස් ඇත්තාවූද, බුදුරජාණන් වහන්සේ විසින් මනා කොට දේශනා කරනලද ධර්මය සියලුම සංයෝජනයන් ඉක්මවීමෙන් සියලු සසරදුක නැසුවෙහිය.

**2.** “තෘෂ්ණාමූලය වියලවා සත්වයන්ගේ ඇතිවීමට හා නැතිවීමට හේතුවවූ කර්මක්ලෙශයන් සිඳ එතරවූයේ නෛයර්යාණික නිවනට පැමිණියෙහිය.

**3.** “භව චක්‍රය නසන්නා වූද, ආත්ම භාව නම්වූ යන්ත්‍රය නැතිකරන්නාවූද, ඥාණ නැමති වජ්රායුධය හෙළමින්,

**4.** “ත්‍රිවිධ වේදනාවන් දුක් වශයෙන් සලකා උපාදානයන්ගෙන් මිදුනෝ කාමභව ආදී නවවිධ භවය ගිනිගෙණ දිලිසෙන අගුරු වළක්සේ ඥාණයෙන් ප්‍රත්‍යවෙක්ෂා කොට,

**5.** “මහ සැපතක් වැනිවූද ගැඹුරක් වැනිවූද, ජරාමරණ වළකන්නාවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය දුක් සමනය කරණ ක්ෂේමස්ථානයක් වැනිය.

**6.** “කර්මය කර්මය හැටියටත් විපාකය විපාකය හැටියටත් දැන පටිච්චසමුප්පාද ධර්මයන්ගේ යම්බඳු ආලොකයක් ඇද්ද, ඒ ආලොකය දිටිමි. ශාන්තවූ නිර්වාණය අවසාන යහපතසේ දිටිමි.”

**9. ජෙන්ත ථෙර ගාථා:-** 1. “මම භොග මද, ජාතී මද, ඓශ්චර්ය මද ආදියෙන් මත්වූයේ ආරොහපරිනාහ (අංග ප්‍රත්‍යංග ශොභන තාවය) සම්පත්තියෙන් මදයට පැමිණියේ හැසුරුනෙමි.

2. "බාල බැවින් හා අතිමානයෙන් තද වූයේ නොනැමෙන ස්වභාව ඇත්තේ කිසිවෙකු උසස්කොටද, සමකොටද නොසිතුවෙමි.

3. "ගරුකළ යුත්තාට ගරු නොකොට මානයෙන් තද වූයේ කිසිවෙකුට ආදර නැතුව මවුපියන් ආදී ගරුකටයුත්තන්ට නොවැන්දෙමි.

4. "උත්තම පුරිස දම්ම සාරථීවූද, සූර්යයාමෙන් බබළන භික්ෂූන් වහන්සේගෙන් පිරිවරා ගන්නාලද අග්‍රවූද නායකවූද බුදුරජාණන් වහන්සේ දැක,

5. "මානයයත්, මදයත් හැර දමා පැහැදුනාවූ සිතින් සියලුම සත්වයින්ට උත්තමවූ බුදුරජාණන් වහන්සේට මස්තකයෙන් නමස්කාර කරෙමි. (ඔලුව බිම තබා වැන්දෙමි.)

6. "අතිමානයත් හීන මානයත් දෙක ප්‍රහීණ කෙළෙමි. සිත එකඟ කෙළෙමි. මමය මාගේය යන මානය සිඳින ලදී සියලුම මානයෝ නැති කෙළෙමි."

10. **සුමන ථෙර ගාථා**:- 1. "යම් කලෙක්හි සත් හැවිරිදි වයස් ඇති අළුත් පැවිද්දෙක්ව ඉර්ධි උපදවා බල සම්පන්න නාග රාජයෙකු දමනය කොට

2. "අනොතත්ත විලින් ජලය රැගෙණ උපාධ්‍යායන් වහන්සේට දුනිමි. ඒ දැක බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක.

3. "සාරිපුත්‍රය, අග්‍රඵල සමාපත්තියෙන් සිත තැන්පත් කළාවූ දිය කළයක් රැගෙන එන කුමාරයා බලව.

4. "බලන්නවුන්ට ප්‍රශාදය ඇතිකරන ආචාරවතින්ද යහපත් ඉරියව්වෙන්ද, අනුරුද්ධ ස්ථවිරයන් වැනි විශාරද ඉර්ධියෙන්ද යුක්තවූ සාමණේරයෙක්වේද, හෙතෙම

5. "උත්පත්තියෙන් සත් අවුරුදු වයස් ඇති අළුත් පැවිද්දෙක්ව ඉර්ධි බලයෙන් බලසම්පන්නවූ නාගරාජයෙකු පරදවා ජයගෙණ

6. "ශ්‍රේෂ්ඨ පුරුෂයෙකු වශයෙන් උත්තමවූයේ යහපත් බවට පැමිණියේ හික්මුණේ කළ කටයුතු ඇති අනුරුද්ධ ස්ථවිරයන් විසින් හික්මවන ලද්දේ හෙතෙම,

7. "චිත්ත විමුක්තිය උත්තමකොට ඇති පරම ශාන්ති සැපයට පැමිණි ඒ සුමන සාමණෙර නම්වූ මම රහත් කෙනෙක් හැටියට කිසිවෙක් දැනගනුවයි නොසිතුවෙමි."

11. **නහාතකමුනි ථෙර ගාථාః-** 1. "වාත රෝගයෙන් මඩනා ලද්දේ මහ වනයෙහි වාසය කරන්නේ ප්‍රත්‍ය දුර්ලභවූ වාත රෝගයට අහිතවූ ස්ථානයෙහි මහණ තොප කුමක් කරන්නෙහිද?

2. "මහත්වූ ප්‍රීති සැපයෙන් මුළු ශරීරයම සැපවත් කොට අරණ්‍ය වාසයෙහි සැහැල්ලු පැවතුම් ඇතුව සියල්ල ඉවසා වනයෙහි වාසය කෙළෙමි.

3. "සතිපට්ඨාන ඉන්ද්‍රිය බල බොඣ්ජංග ධර්මයන් වඩමින් කෙලෙස් නැතිව වාසය කරමි.

4. "සියලු කෙලෙසුන්ගෙන් වෙන්ව පිරිසිදු සිතක් ඇතිව නොකැළඹුනාවූ අදහසින් නිතර නුවණින් සිහි කරමින් ආශ්‍රව ධර්ම රහිතව වාසය කෙළෙමි.

5. "ආධ්‍යාත්මික බාහිර වශයෙන් පැවති සියලුම ක්ලේශයෝ මතුනූපදනා පරිද්දෙන් විනාශකර දැමීමි.

6. "ස්කන්ධ පංචකය පිරිසිඳීමෙන් සියලු මුල් සිඳ දුක් නැතිකළ බවට පැමිණියෙමි. මින්මතු නැවත ඉපදීමක් මට නැත."

12. **බ්‍රහ්මදත්ත ථෙර ගාථාః-** 1. "උත්තම දමනයෙන් දමනයවූ කය සමනය කළ මනාකොට දැන කෙළෙසුන්ගෙන් මිදුනාවූ උපශාන්ත ගුණයෙන් අටලෝ දහමෙහි කම්පා නොවන ගුණයෙනුත් යුක්තවූ ක්‍රොධ නොකරන මට ක්‍රොධයක් කොයින්ද?

2. "යමෙක් කිපෙන්නෙකුට කිපේද, ඔහුට එයින් පව් ඇතිවේ. කිපෙන්නාට නොකිපෙන තැනැත්තා දිනිය නොහැකි යුද්ධයකින් ජය ගත්තෙක් මෙති.

3. "අනුන් කිපි බව දැන තමා සංසිඳී නොකිපී සිටියොත් තමාටත් අනුන්ටත් කියන දෙපක්ෂයටම ඔහු යහපතක් කළ කෙනෙකි.

4. "තමාගේත් අනුන්ගේත් යහපතට හේතුවන ක්‍රොධ නොකිරීමේ ප්‍රතිකර්මය කළ තැනැත්තා ධර්මය නූගත් අඥාන ජනයා මෝඩයෙක්කොට සලකයි.

5. "ඉදින් ක්‍රොධය උපදීනම් කියතෙහි උපමා අවවාදය සිහිපත්කරව, රස තෘෂ්ණාව උපදී නම් පුත්‍රමාංශොපමාව සිහිකරව.

6. "ඉදින් සිත කාම සැප භව සැප යනාදියෙහි දිවේද, සිහිය උපදවා ඒ සිතට නිග්‍රහ කළයුතුය. කුළු ගොනෙක් කණුවක බැඳ හික්මවන්නාක් මෙනි."

13. **සිරිමන්ද** ථෙර ගාථා:- 1. "(දුශ්චරිත) වැසීමෙන් කෙලෙස් වැඩිවෙයි. නොවැසීමෙන් කෙලෙස් අඩුවෙයි. ඒ නිසා නොවසා විවෘත කරව. එසේ කල්හි කෙලෙස් වැඩි නොවේ.

2. "මේ සත්ව ලොකය මරණයෙන් යටපත් කෙරේ. ජරාවෙන් පිරිවරණ ලද්දේවෙයි. තෘෂ්ණා නම් වූ හුලෙන් ඇතුළත විදින ලද්දේවෙයි. හැමකල්හි අරමුණ කැමැත්තේ දුම් දැමීමක් වෙයි.

2. "සත්වලොකය මරුවා විසින් යටපත් කරනලදුව, ජරාවෙන් පිරිවරණ ලදුව, අසරණව අපරාධ කළ සොරෙක් රාජ දඬුවම් ලබා තැවෙන්නාක් මෙන් තැවීමට පත්වෙයි.

4. "වනයෙහි හටගත් ලැව්ගින්නක් මෙන් ජරා ව්‍යාධි මරණ යන තුන අභිභවනය කරන්ට නොහැකිය. ජය ලබා පලායාමටද නොහැකිය.

5. "විදර්ශනා භාවනාවෙන් තොරව දවස් නොහරිව්, ස්වල්පමාත්‍ර කාලයකුදු හිස් නොකොට බොහෝ වශයෙන්ම භාවනාදියෙහි යෙදුනේ රෑ දවල් හිස්නොකොට ගත කෙරේ නම් ඔහුගේ ජීවිතය හිස් නොවේ.

6. "යාම, හිඳීම, සිටීම, සයනය කිරීම යන සතර ඉරියව්වෙහිම කාලය හිස් නොකොට අප්‍රමාද විහරණයෙන් යුක්තව වසව."

**14. සබ්බකාමී ථෙර ගාථා**:- 1. "දුගඳ හමන්නාවූ මේ දෙපා ඇති ශරීරය නොයෙක් කුණපයෙන් පිරුණේ නව දොරින් වැගිරෙන දුගඳ ඇත්තේ සුවඳවත් කිරීමට නොහැකිය.

2. "වැද්දා කොළඅතු ආදියෙන් මුවාව සිට මුවන් ගන්නාක් මෙන්ද, බිලියෙන් මසුන් ගන්නාක් මෙන්ද, ලාටුවෙන් වඳුරන් ගන්නාක් මෙන්ද, පෘථග්ජනයා පෙළයි.

3. "රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන රමණීය පංචකාම ගුණයෝ ස්ත්‍රී රූපයෙහි දක්නා ලැබේ.

4. "රාගයෙන් මත්වූ පෘථග්ජන සත්වයෝ මේ කාම වස්තු සේවනය කෙරෙද්ද, ඔව්හු ජාති ජරාදී දුක් සමූහයත් නිරායාදී අපාය භයත් සංසාර දුකත් නැවත නැවත ලබයි.

5. "යමෙක් මේ කාම වස්තූහු සර්ප ඔලුවක් දුටු කලෙක මෙන් දුරුකෙරේද, ඔහු විෂ සංඛ්‍යාතවූ ලොකයෙහි සිහියෙන් යුක්තව කල් යවයි.

6. "කාමයෙහි දොෂයත්, පැවිදිවීමෙහි ආනිසංසයත් දැක සියලුම කාමයන්ගෙන් වෙන්වූ මම කෙලෙස් නැති කිරීමෙන් රහත් බවට පැමිණියෙමි."

---

# සත්තක නිපාතය.

**1. සුන්දර සමුද්ද ථෙර ගාථා**:- 1. "මනාකොට වැසීමෙන් අලංකාර කරනලද සිනිඳු මල්දම්වලින්ද සරසන ලදුව ලාකඩ රසයෙන් ලක්ෂණ කළ පා දෙකින් යුක්තවූ ස්වර්ණමය පාවහන් ඇති වෙශ්‍යා තොමෝ

2. "පාවහන් ගලවා ඉදිරිපිට ඇඳිලි බැඳගෙණ (ඕ තොමෝ) මට මධුරවූ වචනයෙන් මෙසේ කීවාය.

3. "තෝ බාල වියෙහිදීම පැවිදිවූවෙහිය. මාගේ වචනය කරන්නෙහි නම් මානුෂික කාමයන් පරිභොග කරව. ඒ පිණිස මගේ සිත ඔබට දෙමි.

4. "ඔබ විසින් මෙය ඇත්තක්කොට පිළිගනුව. ඒ අදහන්නහු නම් ගිනි ඉදිරිපිට තබා දිවුරා කියනු.

5. "අප දෙදෙනාම සැරයටිය පිහිටකොට පවත්නා කල්හි පැවිදි වන්නමු නම් දෙපැත්තෙන්ම ජයගත්තේවේ. වෙශ්‍යාංගනාව විසින් ඇදිලි බැඳ කළ මේ ආයාචනය දැකීමෙන්,

6. "මාරයා විසින් ඔසවනලද පාසයක් (උගුලක්) බඳුවූ අලංකෘත වස්ත්‍රාභරණ සහිත වෙශ්‍යාව දැකීමෙන් මට සිහිනුවණ උපණ.

7. "දොෂයන් ප්‍රකටව පෙණින, කලකිරීමද ලබනලදී. එයින්ම සිත පස්වැදෑරුම් විමුක්තියෙන් මිදුණි. ධර්මයාගේ යහපත් බව ලබව. ත්‍රිවිද්‍යාව ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද කරන ලදී.

**2. ලකුණ්ඨක භද්දිය ථෙර ගාථා:-** 1. "ශ්‍රෙෂ්ඨවූ අම්බට්ඨ කාරාමයෙහිවූ වන ලැහැබෙහි භද්දිය ස්ථවිරයන් වහන්සේ අවිද්‍යා සහිත තෘෂ්ණාව නසා එහිම සීලාදී ගුණයන්ගෙන් යහපත් බවට පැමිණි කෘත්‍යය ඇත්තේ මේ ආත්මයෙහිම ධ්‍යාන සමාපත්ති සැපයෙන් විසුවෙමි.

2. "මිහිඟුබෙර, වීණා, පනා බෙර යන නෘත්‍ය භාණ්ඩ විශෙෂයන්ගෙන් ඇතැම් කාමභොගී සත්වයෝ සතුටුවෙති. මමද ගස්මුල්වල බුදුන්ගේ අනුශාසනාව කරමින් සතුටුවෙමි.

3. "බුදුරජාණන් වහන්සේ මට වර දෙන ලද්දේද, ඒ වරය මම ලබාගතිමි. සියලු ලෝකයාට කායගතාසති කර්මස්ථානය වඩන පිණිසයි.

4. "ලාමකවූ ජනයා විසින් මගේ නිහීණ රූපය පිළිකුල් කොටද, පහත්කොටද, සිතුවාහුය, සමහර සත්වයෝ ගරු කිරීම් වශයෙන් මට බුහුමන් කළාහුය. ඒ දෙකොටසම ඡන්ද රාගයෙන් යුක්තවූවාහුය. මම ඡන්දරාගය නැත්තෙකු බව ඔව්හු නොදනිති.

**5.** "ආධ්‍යාත්මික තත්ත්වය නොදැක පිටස්තර තත්ත්වය දකීනම් හෙතෙම පිටස්තර බලය දැක්කාවූ ඔහු අනුන්ගේ කියමන් අනුවයේ.

**6.** "යමෙක් ආධ්‍යාත්මික තත්ත්වය දැන, බාහිර තත්ත්වයන් බලානම් යහපත් හැසිරීම් සහිත ඒ පුද්ගලයා අනුන්ගේ කියමනට නොනැමෙයි."

**3. භද්ද ථෙර ගාථා:-** 1. "මම බොහෝවූ ව්‍රත චරියාවෙන් හා ආයාචනාවලින්ද, මවුපියන් විසින් දුකසේ ලැබගත් එකම ප්‍රිය පුත්‍රයෙක්වීමි.

**2.** "යහපත කැමැති හිතෛෂිවූ ඒ මවුපිය දෙදෙනා මට අනුකම්පා උපදවා බුදුන්ට මා භාරකළහ.

**3.** "සැපසේ වැඩුවාවූද සුඛුමාලවූද දුකසේ ලැබගත් අපගේ පුත්‍රයා නාථ වූ බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේට පවරා දෙමි.

**4.** "ශාස්තෲන් වහන්සේද මා පිළිගෙණ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළහ. 'මොහු වහා පැවිදි කරව, මෙතෙම ප්‍රධාන පුරුෂයෙක්ය.'

**5.** "මා පැවිදි කරවා ශාස්තෲන් වහන්සේ විහාරයට පිවිසිසේක. හිර නොබැසි කල්හිම මගේ සිත කෙලෙසුන්ගෙන් මිදුනෙමි. රහත් බවද ලදිමි.

**6.** "ඉන්පසුව ශාස්තෲන් වහන්සේ ඵල සමවතින් නැගිට 'භද්ද එව' යන වචනයෙන්ම මගේ උපසම්පදාව සිදුවිය.

**7.** "උත්පත්තියෙන් සත්වෙනි හවුරුද්දෙහි මම උපසම්පදාව ලදිමි. ත්‍රිවිද්‍යාවද ලදිමි. ධර්මයක යහපත් බව ආශ්චර්යයි."

**4. සොපාක ථෙර ගාථා:-** 1. "ගඳකිළි සෙවනේදී සක්මන් කරන, මිනිසුන්ට උතුම්වූ බුදුරජාණන් වහන්සේ දැක එතැනට එළඹ උන්වහන්සේට වැන්දෙමි.

**2.** "සිවුර ඒකාංශකොට දෙඅත් එකතුකොට වීතරාගීවූ සියලුම සත්වයින්ට උතුම් බුදුන්ට අනුව මමද සක්මන් කෙළෙමි.

3. "ඉක්බිති සියල්ල දත් බුදුරජාණන් වහන්සේ මගෙන් ප්‍රශ්න ඇසීය. මමද බියක් හා තැතිගැණීමක් නැතිව ශාස්තෲන් වහන්සේට උත්තර දුනිමි.

4. "ප්‍රශ්න විසඳූ කල්හි තථාගතයන් වහන්සේ අනුමෝදන් විය. ඉක්බිති භික්ෂු සංඝයා බලා මේ කාරණය වදාළහ.

5. "අඟු මගධ දෙරට වැස්සන්ට ලොකු ලාභයෙකි. කුමක් හෙයින්ද ඔවුන්ගේ චීවර පිණ්ඩපාත සයනාසනාදී ප්‍රත්‍යය සොපාක ස්ථවිරයන් වහන්සේ පරිභොග කරන හෙයිනි.

6. "පෙර ගමන් කිරීම, පවන්සැලීමාදී ක්‍රියාවන්ගෙන්ද ඔවුන්ටවූයේ ලාභයක්යයි කියමි. අද පටන් සොපාක ස්ථවිරයන් වහන්සේ දැකීමට එළඹෙන්නෙහිය. සොපාකය, තොපට මේ ප්‍රශ්න ව්‍යාකරණය උපසම්පදාව වූවෙහිය.

7. "මම සත්වෙනි හවුරුද්දේදී උපසම්පදාව ලැබ අන්තිම ශරීරයද දරමි. ධර්මයාගේ යහපත් බව ආශ්චර්යයි."

**සරභංග ථෙර ගාථා:-** 1. "පෙර මම අතින් සිඳින තණ කුටියක් කොට එහි හොත්තෙමි. එයින් මට සරභංගයයි නාම සම්මුතිය විය.

2. "මා අද පටන් තෘණකුටි බැඳීම නොවටී. කුමක් හෙයින්දයත් කීර්තිමත් බුදුරජාණන් වහන්සේ විසින් ශික්ෂාපද පනවනලද හෙයිනි.

3. "සියල්ල ශෙෂනොකොට රෝගයන්ට හේතුවූ පඤ්චස්කන්ධය පෙර නොදැක්කෙමි. ඒ මම බුදුන්ගේ අවවාද අනුව කටයුතු කිරීම නිසා පඤ්චස්කන්ධ නම් වූ රෝගය නිසා විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් දැක්කෙමි.

4. "යම් මාර්ගයකින් විපස්සී බුදුරජාණන් වහන්සේ ගියෙහිද, යම් මාර්ගයකින් සිඛී, කකුසඳ, කොණාගම කාශ්‍යප යන බුදුවරු ගියෝද, ඒ ආර්යමාර්ගයෙන්ම ගෞතම බුදුරජාණන් වහන්සේත් ගියසේක.

5. "පහකළ තෘෂ්ණාව ඇති ප්‍රතිසන්ධිය නැතිකළ සත් බුදුවරයෝ නිවන් ලැබුවාහුය. ඒ සත්බුදුවරයන් විසින් ශාසන

ධර්මය ප්‍රකාශ කරන ලදහ. ධර්ම ස්වභාවයෙන්ම තාදීගුණ ඇත්තෝවූහ.

6. "දුක්ඛසත්‍යය, සමුදය, නිරොධ, මාර්ග යන දුක් නසන චතුරාර්ය සත්‍යධර්මය සත්වයින්ට අනුකම්පාවෙන් දෙශනා කරන ලදහ.

7. "නිවන ලැබූ කල්හි අනන්ත සංසාර දුක් නවතී. බිඳෙන මේ කය හා ජීවිත පරම්පරාව නවතී. නැවත ඉපදීමක් නැත. සියලු භවයන්ගෙන් මිදුනෙමි."

**සත්තක නිපාතය නිමි.**

---

# අට්ඨක නිපාතය.

1. **මහා කච්චාන ථෙර ගාථා:-** "මහා නව කර්මාන්ත නොකළ යුතුයි. ඇසුරු කිරීමෙන් කුසල් දහම් පිරිහීමට හේතු වන පුද්ගලයෝ දුරුකළ යුතුයි. කුලයාට සංග්‍රහ කිරීමට උත්සාහ නොකළ යුතුයි. මක්නිසාද? රසයෙහි ගිජුවූ හෙතෙම කුලයට උනන්දුවක් දක්වන හෙයිනි. සැපය බලාපොරොත්තුවන ඒ පුද්ගලයා අර්ථය හිස් කරයි.

2. "කුලයා විසින් කරන යම්බඳු වැඳුම් පිදුම් ඇද්ද, ඒ බුද්ධාදී උතුමෝ දියසෙවෙල් සහිත මඩක් කොට පෙන්නුම්කර වදාළහ. එයම දුරුකළ නොහැකි සියුම් ආයුධයක් හා සමානය. ලාභසත්කාරය නරක අදහස් ඇති පුද්ගලයාට දුරු නොකළ හැකිය.

3. "අන්‍යයාට වධබන්ධනාදිය අනුන් ලවා නොකර විය යුතුය. තමා විසින්ද, ඒ පව්කම් නොකළ යුතුයි. මක්නිසාද? සත්වයෝ කර්මය දායාද කොට ඇති හෙයිනි.

4. "තමන් සොරකම් නොකොට අනුන්ගේ වචන මාත්‍රයෙන් සොරෙකු නොවේ අනුන්ගේ වචනයෙන් මුනිවරයකුද නොවේ. තමාගේ පිරිසිදුකම හෝ අපිරිසිදුකම තමාම දන්නේය. පර සිත් දන්නා දෙවියෝද, ඒ බව දනිත්.

5. "කුසලාකුසල ඵල විපාක නොදන්නාවූ අන්‍යයෝ මෙලොවම සිටිනු මිස මැරෙන බව හා පරලොව යන බව නොදනිති. යම්බදු පණ්ඩිතයෝ වෙත්නම් ඔව්හු පමණක් මැරෙණ බව හා පරලොව යන බව දනිති. ඒ දන්නාවූ තැනැත්තෝ අනුන්ට හිංසා කිරීම් ආදිය නොකරත්.

6. "ප්‍රඥාවන්තතෙම වස්තුව විනාශවූ කල්හිත් ජීවිකාව පිණිස වැරදි නොකරයි. නුවණ නැති පුද්ගලයා මෙලොව පරලොව වරදවා වස්තුව ඇති කල්හිත් සැප නොලබයි.

7. "සියල්ල කණින් අසත්. සියල්ල ඇසින් දකිත්. ප්‍රඥාවන්ත පුද්ගලයා දිට්ඨ, සුත, මුතාදී, අරමුණු විෂයෙහි ඇලීම හා කිපීම ඇතිකර නොගනියි.

8. "දැකීමෙහි අන්ධයෙක් මෙන්ද, ඇසීමෙහි බිහිරෙක් මෙන්ද, දැකීමෙහි මෝඩයෙක් මෙන්ද, බලවත් බැව්හි දුර්වලයෙක් මෙන්ද, වෙයි. කළයුතු කටයුතු ඇති කල්හි මරඇඳෙහි සිටියද, ඒ කළ යුතුය. නොකටයුත්තෙහිදී මරනින්ද ලැබූවෙකු මෙන් නිසොල්මන් විය යුතුයි.

2. **සිරි මිත්ත ථෙර ගාථා**:- 1. "නොකිපෙන්නාවූද, බද්ධවෛරයෙන් තොරවූද, රැවටිලි නැත්තාවූද, පිසුණුබස් කීමෙන් තොරවූවාවූද, භික්ෂුතෙමේ පරලොව ශෝක නොකරයි.

2. "නොකිපෙන්නාවූද, බද්ධ වෛරයෙන් තොරවූද, රැවටිලි නැත්තාවූද, පිසුණුබස් කීමෙන් තොරවූද, භික්ෂු තෙමේ හැමකල්හිම වසන ලද දොරටු ඇත්තේ එසේම පරලොව ශෝක නොකරයි.

3. "නොකිපෙන්නාවූද, බද්ධවෛරයෙන් තොරවූද, රැවටිලි නැත්තාවූද, පිසුණුබස් කීමෙන් තොරවූද, පිරිසිදු සිල් ඇති ඒ භික්ෂුතෙමේ එසේම ශෝක නොකරයි.

4. "නොකිපෙන්නාවූද, බද්ධ වෛරයෙන් තොරවූද, රැවටිලි නැත්තාවූද, පිසුණුබස් කීමෙන් තොරවූද, කල්‍යාණ මිත්‍රයන් ඇති ඒ භික්ෂුතෙමෙ එසේම ශෝක නොකරයි.

5. "නොකිපෙන්නාවූද, බද්ධ වෛරයෙන් තොරවූද, රැවටිලි නැත්තාවූද, පිසුණුබස් කීමෙන් තොරවූද, යහපත් ප්‍රඥාව ඇති ඒ භික්ෂුතෙම එසේම ශෝක නොකරයි.

6. "යමෙකුට බුදුන්කෙරෙහි අචලවූද, මනාකොට පිහිටියාවූද, ශ්‍රද්ධාවක්වේද, යමෙකුට ආර්යයන් විසින් කැමතිවන ලදද, ප්‍රශංසනීයවූද, සීලයකුත් වේද

7. "එසේම යමෙක්හට සංඝයා කෙරෙහි ප්‍රසාදයක්වේද, ඍජුවූ දැකීමකුත් වේද, ඒ පුද්ගලයා දිළින්දෙක් නොවේ. ඔහුගේ ජීවිතය හිස් නොවේ.

8. "ඒ නිසා බුදුන්ගේ අනුශාසනාව සිහිකරන්නාවූද, ඤාණවන්ත පුද්ගලයා ශ්‍රද්ධාවෙහිද, සීලයෙහිද, ප්‍රසාදයෙහිද, ධර්ම දර්ශනයෙහිද, යෙදිය යුතුයි.

3. **මහාපන්ථක ථෙර ගාථාः-** 1. "යම්කලෙක්හි පළමුකොට නිර්භයවූ, ශාස්තෘන්වහන්සේ දැකී නම් පුරිසොත්තමවූ උන්වහන්සේ දැක සංවේගයක් උපණ.

2. "යමෙකු කරා ආවාවූ ඓශ්චර්ය සම්පත් අත්වලින් ගසා හැර දමද්ද, ඓශ්චර්යයක් බඳුවූ ශාස්තෘන් වහන්සේ කරා පැමිණ අවවාද පැහැර හැරීම නොකරමි.

3. "ඉක්බිති මම අඹුදරුවන්ද, ධනධාන්‍යයද, හැර දැමීමි. කෙස් රැවුල් සිඳ අනගාරික ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවීමි.

4. "ශික්ෂා සහිත ආජීවයෙන් යුක්තවූයේ ඉන්ද්‍රිය සංවර ඇතිව බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමින් අපරාජිතව (නොපැරදී) පසුවෙමි.

5. "එහෙයින් මගේ සිත පිළිබඳ කෙබඳු සිතක් ඇති පුද්ගලයෙක්ද යන බව කියතොත් තෘෂ්ණා නැමැති හුල ඇනීමෙන් මොහොතකුදු සැනසීමක් නොලබන්නෙකු වැනිය.

6. "එබඳු විහරණයක් ඇතුව සිටි මට වීර්ය පරාක්‍රමය නිසාවූ යහපත බලව, ත්‍රිවිද්‍යාවද ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි.

7. "පෙර කඳ පිළිවෙල දැනීමේ නුවණ (පූර්වෙනිවාසානුස්මෘති ඥානය) ලදිමි. දිව ඇස පිරිසිදු කෙළෙමි. රහත්වූ දක්ෂිණාර්හයෙක් වූයෙමි. කෙලෙසුන්ගෙන් මිදී උපධි රහිත නිර්වාණය ලදිමි.

8. "ඉක්බිති රාත්‍රිය ගතවීමෙන් හිර පායන කල්හි සියලුම තෘෂ්ණාව වියලවා පළඟ බැඳ හුන්නෙමි.

(අටවෙනි නිපාතය නිමි.)

---

# නවක නිපාතය.

**භූතත්ථෙර ගාථාඃ-** 1. "දිරීම හා මරණය අඥානවූ පෘථග්ජනයා දුකක්කොට නොදැන, එහිම ඇලී වෙසෙයි. පණ්ඩිත පුරුෂයා දුක පිරිසිඳ දැන සිහියෙන් ධ්‍යාන වඩයි හෙතෙම ඊටවඩා උත්ත මරතියක් (මාර්ගඵල රතිය) නොදනියි.

2. "යම්තාක් දුකට හේතුවූ විසත්තිකා නම්වූ රාගමානාදී වශයෙන් පවතින ප්‍රපඤ්ච ධර්මයෝද ඊටම අනුව පවතී. ඒ තෘෂ්ණාව පහකොට සිහියෙන් ධ්‍යාන කෙරේද, හෙතෙම ඊට වඩා උතුම් රතියක් නොවිඳියි.

3. "ක්ෂෙමභාවය පිණිස පවතින සියලු කෙලෙසුන් ශොධනය කරන ආර්ය අෂ්ටාංගික මාර්ගය යම්කලෙක්හි ප්‍රඥාවෙන් දැක සිහියෙන් ධ්‍යාන කෙරේද, හෙතෙම ඊට වඩා උත්තම රතියක් නොවිඳියි.

4. "ශෝක නැති, කෙලෙස් රජස් නැති හේතුවකින් නූපන් සියලු කෙලෙස් ශෝධනය කරන සංයෝජන බැඳුම් සිඳින යම් නිර්වාණ පදයක් වඩාද හෙතෙම ඊට වඩා උත්තම රතියක් නොවිඳියි.

5. "යම්සේ අහස්තලය සෑම තැන මේඝ ගර්ජනා වැසි ධාරාවෝ පවතිද්ද, එසේම භික්ෂුවක් පර්වත ගුහාවලට ගොස් ධ්‍යාන කරයි. එහෙයින් ඒ භික්ෂුතෙම උත්තම ඊට වඩා රතියක් නොවිඳියි.

**6.** "මලින් ගැවසීගත් (ගංගාවක් මෙන්ද, වනමලින් ගැවසීගත් වනයක් මෙන්ද, කොට සලකා යහපත්වූ සිත් ඇත්තේ ධ්‍යාන කෙරෙයි. හෙතෙම ඊට වඩා උත්තම රතියක් නොවිඳියි.

**7.** "ජනයාගෙන් වෙන්වූ වනයෙන් සිංහ ව්‍යාඝ්‍රාදී සත්වයෝ සතුටින් වෙසෙත්ද, එසේම භික්ෂුවද පර්වත ගුහාවෙහි ධ්‍යාන කෙරෙයි. හෙතෙම ඊට වඩා උත්තම රතියක් නොවිඳියි.

**8.** "කාම විතර්ක ආදී මිච්ඡා විතර්ක වළක්වා පර්වත අතර පිහිටි පර්වත ගුහාවන් ඇසුරුකොට කෙලෙස් වඩා දුරුකිරීමෙන් ප්‍රහීනවූ සිත්හි තද බැව් පහකොට ධ්‍යාන සැපයෙන් සැපවත්වූයේ වෙසෙයි. හෙතෙම ඊට වඩා උත්තම රතියක් නොවිඳියි.

**9.** "යම්හෙයකින් රාගාදී මලයෝද සිත්හි තද බැව්ද, ඥාති ශොකාදිය පහකොටද, අවිද්‍යාව හා තෘෂ්ණාවත් නසා සියලු ආශ්‍රවයන් ක්ෂයකොට ධ්‍යාන කෙරේද, ඔහු ඊට වඩා උත්තම රතියක් නොවිඳියි."

**(නවවෙනි නිපාතය නිමි.)**

---

# දසක නිපාතය.

**1. කාළුදායී ථෙර ගාථා:-** 1. "පින්වතුන් වහන්ස, ඵල කැමැත්තහුට පරණ පත් සිඳීයාමෙන් අළුත් පත් හා ගෙඩි ඇති, ගින්නක් මෙන් බබලන වෘක්ෂයෝ වෙත්ද මහාවීරයන් වහන්ස, මේ අවස්ථාව එබඳු අවස්ථාවකි.

**2.** "වීරයන් වහන්ස, හාත්පස සියලු දිශාවන්හිම පිපුණු මල් ඇති වෘක්ෂයෝ වෙත්. ඵල නෙලාගනු කැමැත්තවුන්ට ඉතා සුදුසු කාලයෙකි. ඒ නිසා ඔබවහන්සේගේ වැඩමවීමට ඉතා සුදුසුය.

**3.** "පින්වතුන් වහන්ස, ඒකාන්තයෙන්ම අති ශීතත් නොවූ, අති උෂ්ණත් නොවූ සැපදායක ඍතු ගුණයක් පවතී. ඒ මඟ රෝහිණී ගංගාව පසුමුබකොට වඩින්නාවූ ඔබවහන්සේට ශාක්‍ය කොළිය රජදරුවෝද දැක්ක හැකිය.

4. "ගොවියෝ ආශාවෙන් සී සාත්. ආශාවෙන් බිජු වපුරති. ධන ලබනු කැමැත්තහු සමුද්‍රය තරණයකොට වෙළඳාම් කරත් මමද ඔබවහන්සේගේ කපිලවස්තුපුර ගමන බලාපොරොත්තුවෙන් මෙහි සිටිමි. මගේ ආශාවද සමෘද්ධ වේවා.

5. "ගොවියෝ නැවත නැවතත් බිජු වපුරත්. වස්ස වලාහකතෙම වර්ෂාව නැවත නැවත පවත්වයි. සීසාන්නෝ නැවත නැවතත් සී සාත්. මිනිසුන් විසින් උපදවනලද ධාන්‍ය රටවලට යවත්.

6. "යාචකයෝ නැවත නැවත කුලයන්හි හැසිරෙත්. දානපතියෝ නැවත නැවතත් දන්දෙත්. දානපතියෝ නැවත නැවත දීමෙන් නැවත නැවත දෙව් සැප ලබත්. එහෙයින් මමද නැවත නැවත යාඥා කරමි. මගේ අදහසද ඉටුවේවා.

7. "වීර්යවන්තවූද, මහාප්‍රඥා ඇත්තාවූද පුරුෂයෙක් යම් කුලයෙක්හි උපදී නම් සත් පරපුරක් සම්‍යක් ප්‍රතිපත්තියෙන් පිරිසිදු කරයි. දේවාතිදේවවූ මුනිවරයෙක් හැටියට උපන් ඔබවහන්සේ සත්වයින්ට ඒකාන්ත හිතභාවය පිණිස පවතින නිසා එහි වැඩමවීම මම බලාපොරොත්තු වෙමි.

8. "මහර්ෂිවූ ඔබවහන්සේගේ පියා සුද්ධොදන රජුය. බෝධිසත්වවූ ඔබවහන්සේගේ කුසින් පරිහරණය කළ යම් මවක් වේනම් ඒ මහාමායා බිසව මරණින් මතු තුසිත දෙව් ලොව සතුටින් සිටින්නීය.

9. "ඒ ගෞතම ගෝත්‍රයෙහි උපන්නාවූ ඕතොමෝ මෙයින් චුතව දිව්‍යමයවූ කාමයෙන් යුක්තව දිව්‍ය සමූහයා විසින් පිරිවරණලදුව පස්කම් සැප විඳී.

10. "අනිකෙකු විසින් අභිභවනය කළ නොහැකි අනුපමෙය්‍යවූ (උපමා කළ නොහැකි) අඟපසඟින් ආලෝකය නික්මෙන්නාවූ තාදී ගුණයෙන් යුක්තවූ බුදුරජාණන් වහන්සේගේ මම පුත්‍රයෙක් වෙමි. ගෞතම ගොත්‍රයෙහි උපන් ශාක්‍ය රජතුමනි, තොපගේ පුත්‍රවූ බුදුරජාණන් වහන්සේ මගේ පියා වන්නේය. ස්වභාව වශයෙන් උන්වහන්සේ තොපටද පියා වන්නේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2. එකවිහාරිය ථෙර ගාථා**:- 1. "තනිව වනයෙහි වසන්නා ඉදිරිපිට හා පසුපාර්ශවයෙහි අනිකෙක් නොමැති බැවින් බොහෝවූ චිත්ත සුඛයක් (සතුටක්) ඇතිව වෙසෙයි.

**2.** "බුදුන් විසින් වර්ණනා කරනලද වනයට මම තනිව යමි. නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති තනිවූ භික්ෂුවට සැප විහරණයක් ඇතිවිය.

**3.** "යෝගීන්ට ප්‍රීතිකරවූද, රම්‍යවූද මත් ඇතුන් හැසිරෙන්නාවූද, වනයක් වේ නම් ශ්‍රමණ ධර්මය පිණිස එහි වහා පිවිසෙමි.

**4.** "මනාකොට පිපියාවූ ගස් ඇති කඳු අතර සිහිල් ජලය ඇති ස්ථානයන්හි ස්නානයකොට හුදකලාව හැසිරෙමි.

**5.** "සහායවූ දෙවැන්නෙක් නැතුව රමණීය මහවනයෙහි ආශ්‍රව රහිතව කරණලද කිස ඇතුව මම කවදා වසම්ද?

**6.** "අරණ්‍යගතව භාවනා කරන්නහුට අදහස් සම්පූර්ණ වේද, මම ඒ අදහස මුල්කොට කටයුතු කරමි. අනිකෙකුට කරන අනිකෙක් නැත්තේය.

**7.** "ඒ මම වීර්යය නම්වූ සන්නාහය බඳිමි. වනයට පිවිසියෙමි. ආශ්‍රව දුරුනොකොට ඒ වනයෙන් නොනික්මෙන්නෙමි.

8. "සිහිල් වාතය හා සුවඳ හමන්නාවූ වනයෙහි වෙසෙමින් එහිම හුන්නේ අවිද්‍යාව නසමි.

**9.** "මලින් ගැවසීගත්තාවූද, සිහිල් පර්වත ඇත්තාවූද, පර්වත වලින් වටකරන ලද්දාවූද, වනයෙහි විමුක්ති සැපයෙන් වෙසෙමි.

**10.** "ඒ මම සම්පූර්ණ චන්ද්‍රයා මෙන් පරිපූර්ණ චිත්ත සංකල්පනා ඇතිව සියලු කෙලෙසුන් නසා සැපසේ වෙසෙමි. මට නැවත ඉපදීමක් නැත්තේය."

**3. මහාකප්පින ථෙර ගාථා**:- 1. "යමෙක් තමා කරා නොපැමිණි හිත අහිත යන දෙක පළමුකොට දකීද, ඕහට අමිත්‍රයෝ හා මිත්‍රයෝ දොස් සොයන්නවුන් මෙන් දකී. එබඳු පුද්ගලයා නිවැරදි පුද්ගලයෙකි.

2. "යමෙකුට ආනාපානසති භාවනාව පරිපූර්ණද මනාකොට වඩන ලදද, බුදුන් විසින් දෙශනා කරනලද ඒ භාවනාව පිළිවෙළින් පුරුදුකරන ලද්දේද, ඒ යෝගාවචර තෙම උපක්ලේශ රහිත චන්ද්‍රයා මෙන් ලෝකය බබුලුවයි.

3. "මාගේ සිත නීවරණ නමැති මල නැතිවීමෙන් පිරිසිදුය. අප්‍රමාණ නීවරණ ධර්ම ප්‍රත්‍යක්ෂ කෙළෙමි. සියලු කෙලෙසුන් නැසුවෙමි. සියලු දිසාවන් බබුලුවන්නෙමි.

4. "වස්තුව නැතිකල්හිද ප්‍රඥාව ඇති පුද්ගලයා නිරවද්‍ය වූ ජීවිකාවෙන් සන්තොෂවේ. වස්තුව ඇතිකල්හිද ප්‍රඥාව නැති පුද්ගලයා සැපවත් ජීවිතයක් නොලබයි.

5. "ඇසුනාවූ කරුණු විනිශ්චය කරන යම් ප්‍රඥාවක් වේද, කීර්ති ප්‍රශංසා ලබන ප්‍රඥාවකුත්වේද; ඒ ප්‍රඥාවන්ගෙන් යුක්තවූ පුද්ගලයා ඒකාන්ත දුක් ඇති ස්කන්ධාදියෙන් යුක්තවුවද සම්‍යක් ප්‍රතිපත්තිය නිසා සැප ලබයි.

6. "සත්වයින්ගේ දිරීම මැරීම් ආදී ස්වභාව ධර්මයක් වේද, එය අළුත් දෙයක් නොවේ. ආශ්චර්ය අද්භූත දෙයක්ද නොවේ. ඒ කුමක් නිසා අද්භූත වන්නේද

7. "උපන්නාවූ තැනැත්තාට ජීවිතයට අනතුරුව මරණය ඒකාන්තයි. මෙහි උපදින උපදිනු ලබන්නාහු මරණයට පැමිණෙති. සත්වයින්ට මේ ධර්මය ඒකාන්තයි.

8. "යම්බඳුවූ අනුන්ගේ ජීවිත මළහුගේ ප්‍රයෝජනයට නොපැමිණෙයි. මැරුණු කල්හි ඇඩීමෙන් ප්‍රයෝජනයක් නොවේ. එයින් මළ තැනැත්තා යස ඓශ්චර්ය සම්පත්තියක්ද නොලබයි. එමනිසා මහණ බමුණෝ ඇඬීම් ආදිය හොඳයයි වර්ණනා නොකරති.

9. "අඬන්නාවූ පුද්ගලයාගේ ඇස් හා ශරීරය වෙහෙසට පැමිණෙයි. ශරීර වර්ණය හා බලයද, ප්‍රඥාවද පිරිහෙයි. විරුද්ධකාරයෝ සතුටු වෙති. හිතෛෂීහු දුකට පත්වෙති. ඔහුට ඒ කිසිවකින් සැපතක් සිදුනොවෙයි.

10. "එම නිසා කුලයෙහි වසන බහුශ්‍රැත ඥාණවන්ත පුද්ගලයා මහොඝයෙන් (ජලය අධික වීමෙන්) පිරුණාවූ නදියෙහි නැවත තරණය කරන්නාක්මෙන් ප්‍රඥාවෙන් තමාගේ කටයුතු කිරීමට කැමැති වෙයි."

**5. චූලපන්ථක ථෙර ගාථා:-** 1. "මෝඩ ගතිය නිසා මම මුල් අවස්ථාවෙහි නින්දා ලැබුවෙමි. තොප ගෙදර යව කියා සහෝදරයාද පිටමන් කෙළේය.

2. "සහෝදරයා විසින් පිටමන් කරණලද ඒ මම සංඝාරාම දොරකඩ සමීපයෙහි දොම්නසින් ශාසන අපෙක්ෂාව ඇතුව සිටියෙමි.

3. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ මා කරා පැමිණි සේක. මගේ හිසද උන්වහන්සේ විසින් පිරිමදිනලදී. අතින් අල්ලා මා රැගෙන සංඝාරාමයට පිවිසිසේක.

4. "මට ශාස්තෘන් වහන්සේ අනුකම්පාකොට රෙදි කැබෙල්ලක් දුන්සේක. එකත්පස්ව සිට මෙහි පිරිසිදුකම අධිෂ්ඨාන කරව්.

5. "මම උන්වහන්සේගේ වචනය අසා ශාසනයෙහි ඇල්ම ඇත්තෙක්ව උත්තමාර්ථය පිණිස පවතින සමාධිය ඉපදවීමි.

6. "පෙර විසූ කඳ පිළිවෙළ දැනගතිමි. දිවැස පිරිසිදු කෙළෙමි. ත්‍රිවිද්‍යාව ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද සම්පූර්ණ කෙළෙමි.

7. "පන්ථක ස්ථවිරතෙමේ තමා දහස්දෙනෙක් කොට මවා කල් පැමිණෙනතුරු රම්‍යවූ අඹවනයෙහි හුන්නේය.

8. "කල් දැන ශාස්තෘන් වහන්සේ මා කරා දූතයෙකු එවූසේක. මමද කල් දැන අහසින් එහි ගියෙමි.

9. "මම ශාස්තෘන් වහන්සේගේ පාද වන්දනාකොට එකත්පසෙක සිටියෙමි. එසේ සිටියාවූ මා ශාස්තෘන් වහන්සේ විසින් පිළිගන්නාලදී.

10. "සියලු ලෝකයා විසින් පිං බලාපොරොත්තුවෙන් දෙනුලබන දක්ෂිණාව පිංකෙතක්ව සිට මමද පිළිගතිමි."

**5. කප්ප ථෙර ගාථා**:- 1. "නානාවිධ අසුන් කොට්ඨාශයන්ගෙන් යුක්තවද මහ වැසිකිළි වලක් හා සමානවූද, පැසෙන ගවරවලක් වැනිවූද, මහ ගඬුවක් වැනිවූද, මහ වනයක් වැනිවූද මේ ශරීරය.

2. "ලේ සැරවින් හා අශුචියෙන් පිරුණේ හැමකල්හි වැගිරෙන ස්වභාව ඇත්තේ මේ ශරීරය පිළිකුල් බවට පත්වෙයි.

3. "මහා නහරවැල් වලින් බඳනාලද්දේ මාංශාලේපයෙන් අලවන ලද්දේ සමින් වසනාලද්දේ නිරර්ථකවූ මේ කුණුකය,

4. "ඇටකෝටුවලින් ගටනාලද්දේ සුලු නහරවැල්වලින් බඳනාලද්දේ යන්ත්‍රයක් මෙන් ඉරියව් පවත්වයි.

5. "මරණය කරා ගමන්කරනුයේ මරහුගේ සමීපයෙහිම සිටිනුයේ මොහු තමාගේ ශරීරය හැර අන් තැනකට පැමිණේ.

6. "මේ ශරීරය අවිද්‍යාවෙන් වසනලදුව සතර ආකාර ගැට වලින් ගැටගසනුලැබූ සතර සැඩවතුරෙන් ගසායනලදුව අනුසය දැලින් යටපත්කරන ලදුව,

7. "පඤ්චනීවරණ ධර්මයන්ගෙන් යුක්තව කාමවිතර්කාදියෙන් යුක්තව තෘෂ්ණා නමැති භවමූලයෙන් බඳිනලදුව මෝහ වැස්මෙන් වසනලදුව මේ ශරීරය පවතී.

8. 'කර්ම නමැති යන්ත්‍රයෙන් සම්පත්ති විපත්ති ආදී නානා භව වලට පැමිණේ.

9. "යම්බඳුවූ අන්ධ බාල පෘථග්ජනයෝ මෙම ශරීරයට මමත්වය කෙරේද, කටසී නම්වූ සංසාරය වඩත්. නැවත නැවත උපදිත්.

10. "යමෙක් ගූථගත සර්පයෙකු මෙන් මේ ශරීරය දුරු කෙරේද, ඔහු අවිද්‍යා තෘෂ්ණා දෙක හැරදමා කෙලෙස් නැති වීමෙන් පිරිනිවන් පාන්නාහුය."

**6. උපසෙන ථෙර ගාථා**:- 1. "ජනයාගෙන් වෙන්වූ, නිශ්ශබ්දවූ, වල්සතුන් විසින් සෙවුනාලද සෙනසුන භික්ෂුව විසින් හිත මනාකොට පිහිටුවා ගැණීමට සේවනය කටයුතුය.

2. "කසල ස්ථානයෙන් හෝ සොහොන් පිට්ටනියෙන් හෝ වෙන අන් තැනකින් හෝ ගනුලබන රෙදි කැබලිවලින් මසාගන්නාලද රූක්ෂ චීවරයක් දැරිය යුතුයි.

3. "නිහතමාන සිතින් යුක්තව පිළිවෙළින් භික්ෂුතෙමේ වසනලද සදොර ඇතුව මනා සංවරයෙන් යුක්තව පිඬු පිණිස හැසිරිය යුතුය.

4. "ස්වල්පවූ දෙයින්ද සතුටු වියයුතුය. අන්‍යවූ මිහිරි බොහෝ දේවල් බලාපොරොත්තු නොවිය යුතුය. රසයෙහි ගිජුවූ පුද්ගලයාගේ සිත ධ්‍යානයෙහි නොඇලේ.

5. "ඥානවන්ත පුද්ගලයා ස්වල්ප ආශා ගුණයෙන්ද, යථාලාභාදී වශයෙන් පවත්නා සන්තොෂ ගුණයෙන්ද, හුදකලා වාසයෙන්ද වෙසෙයි. ඒ ඥානවන්ත පුද්ගලයා ගිහියන් හා පැවිද්දන් සමගත් එකතුවීම් නැති වූයේ වෙසෙයි.

6. "තමා ගොළු බිහිරි නොවූයේම, ගොළු බිහිරි භාවය පෙන්නුම් කළ යුතුය. පණ්ඩිතතෙම සංඝයා සමගද මද පමණට බිණියයුතුය.

7. "කියනලද පිළිවෙතින් යුක්තවූ භික්ෂුව කිසිවෙක්හට අපවාද නොකටයුතුය. කයින් වෙහෙසීමද නොකළයුතුය. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවිය යුතුය. ඔහු විසින් භොජනයෙහිද පමණ දැනගත යුතුය.

8. "මනාකොට ගන්නාලද නිමිති ඇත්තෙක්ව යහපත් සිතිවිලි ඉපදවීමෙහි දක්ෂයෙක්ව සමථ භාවනාවෙහි යෙදිය යුතුය. සුදුසු කාලයෙහි විදර්ශනා භාවනාද වැඩිය යුතුය.

9. "ඒ පණ්ඩිත භික්ෂුව නිතර පවත්නා වීර්යයෙන් යුක්තව හැමකල්හි භාවනානුයෝගීව විසිය යුතුය. දුක් කෙළවර නොකොට විශ්වාසයකට නොපැමිණිය යුතුය.

10. "මෙසේ විවේක සෙනසුන්හි වාසය කරන්නාවූද, ඥානදර්ශන විශුද්ධිය කැමැත්තාවූද, භික්ෂුවගේ සියලු ආශ්‍රවයෝ ක්ෂය බවට යෙත්. (නැතිවෙයි) හෙතෙම දෙයාකාරවූ නිවනටම පැමිණෙයි."

**7. ගොතම ථෙර ගාථා**:- 1. "ඥානවන්ත පුද්ගලයා විසින් තමන්ගේ යහපත දැනගතයුතුය. බුදුන් විසින් වදාරණලද වචනයද බැලිය යුතුය. පැවිදිබවට පැමිණියාවූ කුලපුත්‍රයා එහිම සුදුස්සෙක්ව විසිය යුතුයි.

**2.** "මෙහි කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් ශික්ෂා සමාදානය ලැබ ගුරුන්ට කීකරුව වෙසේ නම් මෙය ශ්‍රමණයාට සුදුසු වෙයි.

**3.** "බුදුනට ගරුකරන්නෙක්ද, ධර්මයට ගරුකරන්නෙක්ද සංඝයාට සම්මානකරන්නෙක්ද පිළිවෙලින් විය යුතුය. මෙය ශ්‍රමණයාට සුදුසුවෙයි.

**4.** "අගොචරය දුරුකොට ගෝචර සම්පන්නව පිරිසිදු ජීවිකාවෙන් යුක්තව ඥානවන්තයන්ගෙන් ගැරහීම් නොලබන්නෙක්ව සිත මනාකොට පිහිටුවා වෙසේ නම් මෙය ශ්‍රමණයාට සුදුසුයි.

**5.** "චාරිත්‍ර සීලයෙන් හා වාරිත්‍ර සීලයෙන් යුක්තව පැහැදීම ඇති කරන ඉරියා පථයෙන්ද යුක්තව සමථ විදර්ශනා භාවනා කළයුතුය. මෙය ශ්‍රමණයාට සුදුසුයි.

**6.** "ඥානවන්තයා විසින් විවේක වූද, ශබ්ද නැත්තාවූද වන සෙනසුන් ඇසුරුකළ යුතුය. මෙය ශ්‍රමණයාට සුදුසුයි.

**7.** "සිල්වත් බව හා බහුශ්‍රැතබව ඇතිව රූප අරූප ධර්ම තත්වූ පරිදි විමසා නම් සත්‍යාවබෝධයවේ. මෙය ශ්‍රමණයාට සුදුසුයි.

**8.** "සියලු සංස්කාරයන්ගේ අනිත්‍ය බව හා අසුභබවද පුරුදු කළ යුතුය. ලෝක වස්තු පිළිබඳ නොඇලීමද පුරුදුකළ යුතුය. මෙය ශ්‍රමණයාට සුදුසුයි.

**9.** "බෝධ්‍යංග ධර්මයෝද, ඉර්ධිපාද ධර්මයෝද ඉන්ද්‍රිය ධර්මයෝද, බාල ධර්මයෝද, ආර්යඅෂ්ටාංගික මාර්ගයෝද වැඩිය යුතුය. මෙය ශ්‍රමණයාට සුදුසුයි.

**10.** "ඥානවන්තයා සියලුම තෘෂ්ණාව සිඳදැමිය යුතුය. සියලුම ආශ්‍රවයෝ මුල් සහිතව සිඳිය යුතුය. කෙලෙසුන්ගෙන්

මිදුනාවූ ඒ පුද්ගලයා නිවන් අරමුණුකොට වාසය කරන්නේය. මෙය ශ්‍රමණයාට සුදුසුයි.”

---

# ඒකාදසක නිපාතය

**සංකිච්ච ථෙර ගාථා:-** 1. “දරුව, ඔබවහන්සේට මේ වෙනෙහි විසීමෙන් කවර ප්‍රයෝජනයක්ද? උජ්ජුවාන පර්වතය වේරම්බ වාතය නිසා රමණීයයි ඔබවහන්සේට එහි ධ්‍යාන කළ හැකියි.

2. “වළාකුල් වේරම්බ වාතය උපදවා නම් මගේ සිත විවේකයටම ඇදෙයි.

3. “කාලවර්ණවූද බිජුවටින් උපන්නාවූද කාකතෙම සුසානස්ථානයෙහිම ස්වකීය නිවාසස්ථානය කොට වෙසේද, එසේම මමද ශරීරය අනුව බලන සිහියෙන් යුක්තව වෙසෙමි.

4. “යම් පැවිද්දෙක් සේවකාදී අනිකෙකු විසින් නො රකීද, එසේම අන්‍යයෝද පළිබෝධ අවස්ථාවන්හිදී නොරකී. ඉදින් භික්ෂුව කාමයන්හි අනපේක්ෂකවූයේ නම් සැපසේ වෙසෙයි.

5. “සිහිල්වූ ගල්ද, ගෝන මුවාදී සතුන්ද, දිය සෙවෙලින් යුක්තවූ ජලයද, ඇති ඒ වනයෝ මට ප්‍රිය කරයි.

6. “මම පෙර වනයන්හිද, කඳු ගුහාවලද, වල් සතුන් ඇසුරු කළ ප්‍රාන්ත සෙනසුන්වලද, විසුවෙමි.

7. “මොවුන් විනාශයට පැමිණෙත්වා. දුකට පැමිණෙත්වා, වධයට පැමිණෙත්වා, යන අනාර්යවූ දොස් සහිතවූ කල්පනාවෝ මම නොදනිමි.

8. “මා විසින් ශාස්තෘන්වහන්සේ ඇසුරු කොට පුරුදු කරනලද ධර්මය ඇත්තෙක්ව බුදුන්ගේ අනුශාසනාවට අනුව කටයුතු කරනල දී. ගරුකවූ පඤ්චස්කන්ධ බර බහා තැබීමි. භවයාගේ කෙළවර විනාශ කෙළෙමි.

9. “යම් අර්ථයක් නිසා ගිහිගෙයින් නික්ම ප්‍රව්‍රජ්‍යාවට පැමිණියේද, මා විසින් සියලු සංයෝජන නසා ඒ අර්ථය සිදු කෙළේය.

10. 'මම ජීවිතයද මරණයද කැමති නොවෙමි. කර්මාන්ත කරන්නෙක් ඒ කර්මාන්තය අවසන් කළා සේ පිරිනිවන්පාන කාලය බලාපොරොත්තුවෙමි.

11. "මම ජීවිතයද මරණයද බලාපොරොත්තු නොවෙමි. නුවණිනුත් සිහියෙනුත් යුක්තව පිරිනිවන් කාලය බලාපොරොත්තු වෙමි."

---

# ද්වාදසක නිපාතය.

1. **සීලව ථෙර ගාථා:-** 1. "මේ ලොකයෙහි සීලයට අනුවම හික්මිය යුතුයි. මනාකොට හික්මුනාවූ සිල් ඇති තැනැත්තාට මේ ලෝකයෙහි සියලු සම්පත් පමුණුවයි.

2. "ප්‍රශංසාවත්, වස්තු ලාභයත්, පරලොව සැපයත් යන තුන් ආකාර සැපයක් පතන්නාවූ ප්‍රඥාවන්තයා විසින් සීලයම රැකිය යුතුයි.

3. "සිල් ඇති තැනැත්තේ වනාහි සීලයෙන් හික්මීම නිසා බොහෝ මිත්‍රයන් ලබයි. දුශ්ශීල පුද්ගලයා නරක හැසිරීම නිසා යහපත් මිත්‍රයන්ගෙන් පිරිහෙයි.

4. "දුශ්ශීල මනුෂ්‍යයා නින්දා හා අපකීර්තිය ලබයි. සිල්වත් පුද්ගලයා හැමකල්හි ගුණ වර්ණනා හා ප්‍රශංසා ලබයි.

5. "සීලය කුශල ධර්මයන්ට ප්‍රමුඛ වෙයි. සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන්ට පැමිණීමද වෙයි. සමථ විදර්ශනා ආදී ධර්මයන්ද උපදනේ වෙයි. ඒ නිසා සියලු ධර්මයන්ට මූලිකව පවත්නා සීලය පිරිසිදු කළ යුතුයි.

6. "කාය දුශ්චරිතාදිය වළකන නිසා සීලසංවරය සීමාවක් බඳුය. එසේම සිත සන්තොෂ කරන්නේය. සියලු බුදුවරයන්ගේ තොටක් (එතරවන ස්ථානයක්) වැනිය. ඒ නිසා සීලයම පිරිසිදු කළයුතුය.

7. "සීලය අසමාන බලයක් වැනිය. සීලය උතුම් ආයුධයක් වැනිය. සීලය උතුම් ආභරණයක් වැනිය. සීලය පුදුමවූ යුද ඇඳුමක් බඳුය.

8. "සීලය මහත් බල ඇති සේතුවක් (ඒදණ්ඩක්) වැනිය. සීලය ඉතා උතුම් සුවඳක් වැනිය. දිශානු දිශාවන්ට පැතිරී යන සුවඳ විලේපනයක් වැනිය.

9. "සීලය අග්‍රවූ බත් මුලක් වැනිය. සීලය උතුම්වූ මාර්ගෝපකරණයක් වැනිය. යම් තැනකට යනු කැමැත්තහුට ශ්‍රෙෂ්ඨ වාහනයක් වැනිය.

10. "සීලයෙන් නොහික්මුණු අඥාන පුද්ගලයා මෙලොවද නින්දා ලබයි. පරලොවද නොසතුටු සිත් ඇත්තෙක්ව වෙසෙයි. හැම තැනම නොසතුටෙන් වෙසෙයි.

11. "සීලයට අනුව හික්මුණු පුද්ගලයා මේ ලොකයෙහි දීම කීර්තිය ලබයි. පරලොව ස්වර්ගසැපයෙන් සතුටුවෙයි. හැම තැනදීම ඒ ධෛර්යසම්පන්න පුද්ගලයා සතුටින් වෙසෙයි.

12. "මෙහි සීලයම අග්‍රයි. ප්‍රඥාවද උතුම් වෙයි. මනුෂ්‍ය හා දිව්‍යලොකයෙහිත් සීල ප්‍රඥා දෙකට ජය ලැබෙයි.

2. **සුනීත ථෙර ගාථාඃ-** 1. "මම නීච කුලයෙහි උපන්නේ ස්වල්ප ආහාර ඇති දිළින්දෙක් වීමි. පරමල් අස්කරන පහත් කර්මාන්තයකද යෙදී සිටියෙමි.

2. "මිනිසුන් විසින් පිළිකුල් කරන ලද්දෙක්වද, අවමන් කරන ලද්දෙක්වද සටනා ලද්දෙක්වද විසුවෙමි. එකල්හිද හිස පහත්කොට බොහෝ ජනයා විසින් වඳිනු ලබන්නාවූ

3. "උතුම්වූ මගධපුරයට පිවිසෙන්නාවූ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්දාවූ බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවෙහි දුටුවෙමි.

4. "කද බහා තබා උන්වහන්සේට වැඳීමට පැමිණියෙමි. මට අනුකම්පාකොට පුරුෂොත්තමවූ බුදුරජාණන් වහන්සේ වැඩ සිටිසේක.

5. "ශාස්තෲන් වහන්සේගේ පාද වන්දනාකොට එකත් පසෙක සිටියේ සියලුම සත්වයන්ට උතුම්වූ පැවිද්ද මම ඉල්ලුවෙමි.

6\. "ඉක්බිති කාරුණිකවූ සියලු ලෝවැස්සන්ට අනුකම්පාකරන්නාවූ ශාස්තෘන් වහන්සේ මට "භික්ෂුව, මෙහි එවයි' වදාළ සේක. එයින්ම මට උපසම්පදාවද විය.

7\. "ඒ මම තනිවම වනයෙහි තෘෂ්ණාවෙන් තොරව වාසය කරන්නේ මට යම් අවවාදයක් දුන්නේද, ඒ ශාස්තෘන් වහන්සේගේ වචනයට අනුව කටයුතු කෙළෙමි.

8\. "රාත්‍රිය පිළිබඳ ප්‍රථම යාමයෙහි පෙරවිසූ කඳ පිළිවෙල සිහිකරන ඤාණය ලදිමි. රාත්‍රිය පිළිබඳ මධ්‍යම යාමයෙහි දිව ඇසද පිරිසිදු කෙළෙමි.

9\. "රාත්‍රිය පිළිබඳ අළුයම් කාලයෙහි අවිද්‍යාන්ධකාරයද දුරු කෙළෙමි. රාත්‍රිය ගෙවී හිරු උදාවීම ඇතිවූ කල්හි,

10\. "උත්තම පුරුෂය ඔබට නමස්කර වේවා" කියා සක්දෙව් රජද මහා බ්‍රහ්මයාද පැමිණ මට නමස්කාර කළාහුය.

11\. "නිදුකාණන් වහන්ස, ඔබවහන්සේගේ යම්බඳු ආශ්‍රවයෝ වෙත් නම්, ඒ කෙළෙස් ක්ෂයවී ගියාහ. ඔබ වහන්සේ දක්ෂිණාර්හයෙක් වූයෙහිය. ඉක්බිති දෙවියන් විසින් පිරිවරණ ලද ශාස්තෘන් වහන්සේ මා දැක සිනා පහළකොට මේ කාරණය වදාළහ.

12\. "ඉන්ද්‍රිය සංවරයෙන්ද, සීලයෙන්ද, ප්‍රඥාවෙන්ද, ශ්‍රේෂ්ඨ හැසිරීමෙන්ද යන මෙකී ගුණයන්ගෙන් බ්‍රාහ්මණයෙක් වෙයි. ඒ නිසා මොහු උත්තම බ්‍රාහ්මණයෙකි."

---

# තෙරසක නිපාතය

1\. **සොණකොළිවිස ථෙර ගාථාඃ-** 1. "යමෙක් ශ්‍රේෂ්ඨවූ අඟු රටට අධිපති බිම්බිසාර රජහුගේ රටෙහි කෙළෙඹියෙක් වීද, ඒ සෝණතෙමේ අද ලොකෝත්තර ධර්මයන්ගෙන් උසස් බවට පැමිණියේ විය. සියලු දුක් කෙළවර කෙළේය.

2. "ධර්ම පසක් සිඳ දැමුවාවූද, ධර්ම පසක් දුරු කළාවූද, ධර්ම පසක් වැඩුවාවූද, ඇලීම් පසක් ඉක්මෙව්වාවූද, භික්ෂු තෙමේ චතුරොඝය තරණය කළාහුයයි කියනු ලැබේ.

3. "උඩටනැගි මාන නල ඇත්තාවූද, ප්‍රමාද දොෂයෙන් යුක්තවූවාවූද, කාමාශාව දුරු නොකළාවූ භික්ෂුවට සීල සමාධි ප්‍රඥා යන ධර්මයෝ සම්පූර්ණ බවට නොපැමිණෙති.

4. "යම් හෙයකින් කෘත්‍ය වශයෙන් තමා අයත් දෙය හැරදමා, නොකටයුතු කෙරෙයිද, උද්ගත මාන නල ඇති ප්‍රමාද දොෂයෙන් යුක්තවූනාවූ ඔවුන්ට ආශ්‍රවයෝ වැඩෙත්.

5. "යමෙකුන් විසින් මනාකොට පටන්ගන්නාලද කායගතාසති භාවනාව වඩාද, ඔහු නොකටයුතු සේවනය නොකරයි. කටයුතුවල නිතර යෙදී වාසය කරයි. ස්මෘතියෙන් හා ප්‍රඥාවෙන් යුක්තව කටයුතු කරන තැනැත්තා කෙරෙන් ආශ්‍රව ධර්මයෝ ක්ෂය බවට යෙත්.

6. "කියන ලද ඍජු මාර්ගයෙහිම නොනවත්වාම ගමන් කරව, තමහට තමාම චොදනා කරගනිමින් පටන්ගන්නා ලද වීර්‍ය ඇතිව නිවන් කරාම පැමිණිය යුතුය.

7. "ලොකයෙහි පසැස් ඇති නිරුත්තරවූ ශාස්තෘන් වහන්සේ වීණොපමාවෙන් මට ධර්මය දේශනා කළ සේක.

8. "මම උන්වහන්සේගේ ධර්මය අසා ශාසනයෙහි ඇලුනේ උත්තමාර්ථයට පැමිණීම පිණිස සමථ විදර්ශනා වැඩුවෙමි.

9. 'ත්‍රිවිද්‍යාවද ලැබුවෙමි. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි. නිරවද්‍ය ධර්මයන්හි යෙදුනහුට සිත පිළිබඳ විවේකයද,

10. "නිදුක් සුවයද ලදිමි. දැඩිව අල්ලාගැනීම් ධර්මයන් නැති කිරීමෙන් තෘෂ්ණාවද ක්ෂය කෙළෙමි. සිත පිළිබඳ මූලාගතියද ලදිමි. ආයතන ධර්මයන්ගේ ක්ෂණ ක්ෂණයෙහි ඉපදීම මාර්ග ප්‍රඥාවෙන් දැක සිත මනාකොට මිදුනේය.

11. "කෙලෙසුන්ගෙන් සිත මිදුනාවූ ශාන්තවූ සිතක් ඇති ඒ ක්ෂීණාශ්‍රව භික්ෂුවට කුසල් අකුසල් ඇතිවීමක් නැත. කළයුතු දෙයක්ද නොමැතියි.

12. "ඒකඝන ගල් පර්වතයක් සුළඟින් කම්පා නොවේද, එසේම රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු විෂයෙහි භික්ෂුවගේ කම්පාවීමක් නැත.

13. "අටලෝ දහමින් කම්පා නොවන ගුණයෙන් යුක්තවූනාවූ උන්වහන්සේ ඉටු අනිටු අරමුණුවලට නොසෙල්වී සිටී. සියලු යෝගයන්ගෙන් වෙන්වූනාවූ ස්ථිර සිතක් ඇති උන්වහන්සේ සියල්ල වෙනස්වීම අනුව බලමින් වාසය කරයි."

---

# චතුද්දසක නිපාතය.

1. රෙවත ථෙර ගාථා:- 1. "යම් කලෙක මම ගිහිගෙයින් නොගිහි බැව් නම්වූ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූයෙම්ද එතැන් පටන් අනාර්යවූද, දොෂ සහිතවූද, චිත්ත සංකල්පනාවෝ ඇති කළ බව නොදනිමි.

2. "මේ දීර්ඝ කාලය ඇතුළත මොව්හු (මේ සත්වයෝ) නැසෙත්වා කියාද, දුකට පැමිණෙත්වා කියාද චිත්ත සංකල්පනා වශයෙන් ඇතිකළ බවක් නොමදනිමි."

3. "මෛත්‍රී ආදී සතර බ්‍රහ්ම විහරණ භාවනාව වැඩූ බව දනිමි. අප්‍රමාණ සතුන් අරමුණුකොට වඩන්නාවූ ඒ භාවනාව මනාකොටම වැඩුවෙමි. බුදුන් යම් පරිද්දකින් දෙශනා කරන ලදද එපරිද්දෙන් පිළිවෙලින් වැඩුවෙමි.

4. "හැමකල්හි සියලු සත්වයන්ට හිත සැප කැමැතිවනු ලබන්නේ සියල්ලෝ මිත්‍රයන් කොටද, යහළුවන් කොටද සලකා සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇතිව මෛත්‍රී සිත වැඩුවෙමි.

5. "ආසන්නවූ විරුද්ධකාරයෙකුවූ රාගයට ඇදිය නොහැකි පරිද්දෙන්ද දුරසිටින විරුද්ධකාරයින්ට ප්‍රකොප නොකළ හැකි පරිද්දෙන්ද මෛත්‍රී සිත මම සතුටින් වැඩුවෙමි. එසේම නීච ජනයන් විසින් නොසෙවුනාවූද බුද්ධාදීන් විසින් සෙවුනා ලද්දාවූද බ්‍රහ්ම විහරණ භාවනාව වැඩුවෙමි.

6. "බුද්ධ ශ්‍රාවකයෙකුවූ මම ද්විතීය ධ්‍යාන සමාපත්තියට පැමිණියේ ආර්ය තුෂ්ණිම් භාවයෙන්ද යුක්තවූවෙක් වීමි.

7. "යම් පරිද්දකින් ගල් පර්වතය නොසෙල්වන ස්වභාවයෙන් යුක්තව මනාකොට පිහිටියේද එපරිද්දෙන්ම මෝහය දුරුකළ භික්ෂූන් වහන්සේ පර්වතයක් මෙන් නොසෙල්වී සිටී.

8. "රාගාදී කෙලෙස් රහිතවූද නිතර පිරිසිදු බව සොයන්නාවූද සත්පුරුෂයාට කෙසඟක් පමණවූ අල්පමාත්‍ර පාපයද බොහෝ ලොකු දෙයක් මෙන් වැටහේ.

9. "යම්සේ පිටිසරබද නගරයක් ඇතුළත පිටත ප්‍රාකාර ආදිය දැමීමෙන් ආරක්ෂා කෙරේද, එසේම තෙපිද ආධ්‍යාත්මික සදොර වැසීමෙන් ආරක්ෂාව ඇතිකර ගනිව්, තොප විසින් ක්ෂණ සම්පත්තිය හැර නොදමව්.

10. "මරණයටද කැමති නොවෙමි. ජීවිතයට කැමති නොවෙමි. කුලියට වැඩ කරන්නෙක් මෙන් කාලය අපේක්ෂා කරමි.

11. "මරණයටද කැමති නොවෙමි. ජීවිතයටද කැමති නොවෙමි. නුවණිනුත් සිහියෙනුත් යුක්තව කාලය අපේක්ෂා කරමි.

12. "මා විසින් ශාස්තෲන්වහන්සේ ඇසුරු කරන ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි. මහත් බර බහා තැබුවෙමි. භවයාගේ කෙළවර සිඳ දැමුවෙමි.

13. "යම් අර්ථයක් නිසා ගිහි ගෙයින් නොගිහි බැව් නම්වූ ප්‍රව්‍රජ්‍යාවට පැමිණියෙම්ද, මා විසින් ඒ අර්ථය සිද්ධ කර ගතිමි. සියලු සංයෝජන ධර්මයන්ද දුරු කෙළෙමි.

14. "අප්‍රමාදයෙන් සම්පාදනය කරව්. මේ වනාහි මාගේ අනුශාසනාවයි. ක්ලෙශයන්ගෙන් මිදුනාවූ මම පරිනිර්වාණය කරමි."

2. **ගොදත්ත ථෙර ගාථාඃ-** 1. "යම්සේ කරත්තයේ බැඳි ඉසිලීමට සමත්වූ ශ්‍රේෂ්ඨවූ ගවයා මහත් බරින් මඩනා ලද්දේද කරත්තයේ බැඳීම අත්නොහරියි.

2. "එසේම ජලයෙන් සමුද්‍රය තෘප්තිමත් නොවන්නාක් මෙන් ලෞකික ලොකොත්තර ප්‍රඥාවෙන් තෘප්තිමත් නොවන්නාවූ පුද්ගලයාද අනුන් පහත්කොට නොසලකයි. සත්වයින්ට ආර්ය ධර්මය සැප පිණිස පවතී.

3. "සුභික්ෂ කාලය හා දුර්භික්ෂ කාලයට පැමිණියාවූද, දියුණුවට හා පරිහාණියට පැමිණියාවූද මනුෂ්‍යයෝ දුකට පැමිණෙත්. මේ ලෝකයෙහි ඒ මනුෂ්‍යයෝ ශෝක කරත්.

4. "සැප හේතුන් නිසා උසස් භාවයටද දුක් හේතුන් නිසා පහත් භාවයටද යන කරුණු දෙකෙන් අඥාන සත්වයෝ තත්වූ පරිදි නොදැනීමෙන් වෙහෙසට පත්වෙයි.

5. "යම්බඳුවූ ආර්යයෝ වෙත්ද, සැපදුක් දෙකෙහිදීම මධ්‍යස්ථව සිටීමෙන් නුවර දොර සිටවූ ශක්තිමත් කණුවක් මෙන් නොසැලී සිටී. ඒ උත්තමයෝ උසස් බවට හා පහත් බවට නොපැමිණෙත්.

6. "එසේම ලාභයෙහිද, අලාභයෙහිද කීර්තියෙහිද අපකීර්තියෙහිද නින්දාවෙහිද, ප්‍රශංසාවෙහිද, සැපයෙහිද, දුකයෙහිද, වෙනස් නොවෙයි.

7. "ඒ රහතුන් වහන්සේලා රූපාදී සියලු විෂයයන්හි නොඇලෙත්. නෙළුම් කොළෙයෙහි දිය නොරැඳෙන්නාක් මෙනි. ඒ වීරවරයෝ සෑමතන්හිම සුවපත්වද සෑම තන්හිම නොපැරදීද වෙසෙත්.

8. "ධර්මයෙන් ලබන අලාභයත්, අධර්මයෙන් ලබන ලාභයත් යන දෙකින් ධාර්මික අලාභය ශ්‍රේෂ්ඨ වශයෙන් සලකයි. අධර්මයෙන් ලබන ලාභය ශ්‍රේෂ්ඨකොට නොසලකයි.

9. "අඥානයින්ගෙන් ලබන කීර්තියක් වේද, ඥානවන්තයින්ගෙන් ලබන අපකීර්තියක්වේද, ඒ දෙකින් ඥානවන්තයින්ගේ අපකීර්තිය ශ්‍රේෂ්ඨ වශයෙන් සලකයි. අඥානයින්ගෙන් ලබන කීර්තිය ශ්‍රේෂ්ඨකොට නොසලකයි.

10. "මෝඩයින්ගෙන් ප්‍රශංසාවකුත්වේද, ඥානවන්තයින්ගෙන් ලබන ගර්හාවකුත්වේද, ඒ දෙකෙන්

ඥාණවන්තයින්ගෙන් ලබන ගර්හාව ශ්‍රෙෂ්ඨකොට සලකයි. අඥානයින්ගෙන් ලබන ප්‍රශංසාව ශ්‍රෙෂ්ඨකොට නොසලකයි.

11. "කාමවස්තු නිසා සැපයකුත්වේද, විවේකය නිසා ලබන දුකකුත්වේද, ඒ දෙකින් කාමයෙන් ලබන සැපයට වඩා විවේකයෙන් ලබන දුක ශ්‍රෙෂ්ඨකොට සලකයි.

12. "අධර්මයෙන් ලබන ජීවිකාවකුත්වේද, ධර්මයෙන් ලබන මරණයකුත් වේද, ඒ දෙකෙන් අධර්මයෙන් කරන ජීවිකාවට වඩා ධර්මයෙන් ලබන මරණය ශ්‍රෙෂ්ඨකොට සලකයි.

13. "අනුරොධ, විරොධ දුරුකිරීමෙන් ශාන්තවූ සිත් ඇති ක්ලෙශ පරිඩාහයෙන් දුරුවූ ආර්යයන් වහන්සේලා තෘෂ්ණා දෘෂ්ටි දෙකෙන් තොරව ලොකයෙහි හැසිරෙත්. උන්වහන්සේලාට ප්‍රිය වස්තු හා අප්‍රිය වස්තුන්ද නැත.

14. "බොජ්ක්ධංග ධර්මයන්ද, ඉන්ද්‍රිය ධර්මයන්ද, බල ධර්මයන්ද, වඩා පරම ශාන්තියට පැමිණ ආශ්‍රව නැති කළ ආර්යයන් වහන්සේලා පරිනිර්වාණය කරන්නාහුය."

---

## සොළසක නිපාතය

1. **අඤ්ඤාකොණ්ඩඤ්ඤ ථෙර ගාථාඃ-** 1. "ඒ රූපාදී කිසිවක් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගන්නාවූ විරාගය මුල් කොට දේශනා කරනලද යම් ධර්මයක්වේද, මහා රසයෙන් යුක්තවූ ඒ ධර්මය අසා බොහෝකොට පැහැදුනෙමි.

2. "මේ මිනිස් ලොව ඇතුළු සියලු ලෝකයන්හි විචිත්‍ර විලාශයෙන් පවත්නා බොහෝවූ අරමුණුවෙත්ද, ඒ අරමුණු නිසා ශුභාදි වශයෙන් ඇතිවෙන මිථ්‍යා සංකල්පනාවෝ මර්දනය කළාක් මෙන් සිටියහ.

3. "වාතයෙන් උඩට නගින්නාවූ රජස් මහා මේඝයෙන් සමනය වන්නේද, එසේම ආර්ය ශ්‍රාවකතෙම සියලු වැරදි කල්පනාවෝ ප්‍රඥාවෙන් දැකීම නිසා නිවැරදි කල්පනාවෙන් සමනය කරයි.

4. "සියලුම සංස්කාරයෝ අනිත්‍යයයි විදර්ශනා ප්‍රඥාවෙන් දකීද, එකල්හි සසර දුකෙහි කලකිරෙයි. විශුද්ධිය පිණිස එයම මාර්ගයද වෙයි.

5. "සියලුම සංස්කාරයෝ දුකයයි විදර්ශනා ප්‍රඥාවෙන් දකීද, එකල්හි සසර දුකෙහි කලකිරෙයි. විශුද්ධිය පිණිස එයම මාර්ගයද වෙයි.

6. "සියලුම භූමිතුනට අයත් ධර්මයෝ අනාත්මයයි විදර්ශනා ප්‍රඥාවෙන් දකීද, එකල්හි සසර දුකෙහි කලකිරෙයි. විශුද්ධිය පිණිස එයම මාර්ගයද වෙයි.

7. "බුදුන්ට අනුව අවබොධකළාවූද, දැඩි වීර්ය ඇත්තාවූද ඉපදීම හා මරණය දුරුකළාවූද, යම් කොණ්ඩඤ්ඤ ස්ථවිර නමක් වේ නම් උන්වහන්සේ මාර්ග බ්‍රහ්මචරියාව සම්පූර්ණ කළහ.

8. "යම්රාග පාසයකුත්වේද, (දැල) පැලීමට දුෂ්කරවූ පර්වතයක් මෙන් පවතින සිතට උල් ධර්මයකුත්වේද, ඒ දෙවැදෑරුම් ධර්මයන්ම සිඳ දමා අඥානකම නැමැති පර්වතය විදුරු නුවණින් බිඳදමා එතරවූනාවූද ධ්‍යානකරන්නාවූද ඒ පුද්ගලයා මාරබන්ධනයෙන් මිදුනේය.

9. "උඩඟු බැව් ඇත්තාවුද චපල බැව් ඇත්තාවූද, පාපමිත්‍රයන් ඇත්තාවූද, භික්ෂුව දිය රැළින් යටපත්කොට මහවතුරෙහි ගොඩවීමට නොහැකිව සිටියි.

10. "උඩඟු බැව් නැත්තාවූද, චපල බැව් නැත්තාවූද, කල්‍යාණ මිත්‍රයන් ඇත්තාවූද, සංවරකළ ඉඳුරන් ඇත්තාවූද, ප්‍රඥාවෙන් යුක්තවූවාවූද භික්ෂුව දුක් කෙළවර කරයි.

11. "කළුපුරුක් වැළකට බඳුවූ අවයව ඇතිව කෘශවූයේ. ඉපිලී ගිය නහරවැල් ඇත්තේ ආහාරයෙහි පමණ දැනගන්නා සුලුවූයේ කුසීත නොවූ සිත් ඇත්තේ පුරුෂයෙක් වූයෙහිය.

12. "මහාවනයෙහි මැසි මදුරු උවදුරු ලබමින් යුද්ධ භූමියකට එළඹි හස්තියෙක් මෙන් සිහියෙන් යුක්තව එහිම විසීමි.

13. "බ්‍රහ්මයා යම්බඳුවූ ධ්‍යාන සැපයකින් වාසය කෙරේද, එසේම භික්ෂුවද විවේක සැපයෙන් වාසය කරයි. දෙවියෝ යම්බඳුවූ වාසයක යෙදේද භික්ෂුවද එබඳුවූ සහවාසයක යෙදෙයි. එසේම තුන්දෙනෙකුන් සමග විසීම ග්‍රාමවාසය වෙයි. ඊට වැඩිදෙනෙකුන් සමග වසනුයේ ජනසන්නිපාතයක් බඳුයි.

14. "මරණයටද සතුටු නොවෙමි. ජීවත්වීමටද සතුටු නොවෙමි. මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන ලදී. උන්වහන්සේගේ අනුශාසනාවද සම්පූර්ණ කෙළෙමි.

15. "යම් අර්ථයක් නිසා ගිහිගෙයින් නොගිහි බැව් නම්වූ ප්‍රව්‍රජාවට පැමිණියෙම්ද, මා විසින් සියලු සංයෝජනයන් නසා ඒ අර්ථය සිද්ධකරන ලදී."

2. **උදායි ථෙර ගාථා**:- 1. "මනුෂ්‍යයෙක්වූද ආත්ම දමනයෙන් යුක්තවූද එකඟවූ සිත් ඇත්තාවූද ශ්‍රෙෂ්ඨ විහරණ ඇත්තාවූද නිවනෙහි ඇලුනාවූද යම් බුදුවරයෙක් වේද?

2. "සියලු ධර්මයන්ගේ පරතෙරට පැමුණුනාවූ ඒ බුදුරජාණන් වහන්සේට මනුෂ්‍යයෝ නමස්කාර කරත්. උන් වහන්සේට දෙවියෝද නමස්කාර කරත්. මේ වනාහි මම රහතුන්ගෙන් ඇසුවෙමි.

3. "සියලු සංයෝජනයන් ඉක්මෙව්වාවූද කෙලෙස් වනයෙන් නිවනට පැමිණියාවූද, කාමයෙන් නික්ම නෛෂ් ක්‍රම්‍යයෙහි ඇලුනාවූද පර්වතයෙන් වෙන්කොට ගත් රන්රුවනක් හා සමාන විය.

4. "නාගයෙක් සමානවූ බුදුරජාණන් වහන්සේ තමන්ගේ කැමැත්තට අනුවම ශොභාවත් විය. අන් පර්වත අභිභවනය කොට බබලන හිමාල පර්වතය මෙනි. නාගනාමය ඇති සියල්ලන්ටම වඩා සත්‍යවූ නාගනාමය ඇත්තේ නිරුත්තරවූ බුදුරජාණන් වහන්සේටය.

5. "තොපට නාගයා පෙන්නුම්කර දෙමි. පව් නොකරනුයේ හෙතෙම නාග නම් වේ. සීලයත් කරුණාවත් දෙක ඒ නාගයාගේ ප්‍රථම පාදයෝය.

6. "සිහියත්, ප්‍රඥාවත් ඒ නාගයාගේ චරණයෝය. (පසු පාදයෝය.) නිවැරදි ධර්ම ගැණීමෙහි ශ්‍රද්ධා හස්තයක්ද, උපෙක්ෂා නමැති සුදු දළද වෙත්.

7. "සිහි නමැති ග්‍රීවාද, ප්‍රඥා නමැති සිරසද, කුශල් දහම් විමසන සිතීමේ ශක්තියද සමථ විදර්ශනා නම් දහම් කුසද, ඒ බුද්ධ නාගයාගේ උපධි විවේකය වාලධියද වෙයි.

8. "හෙතෙම ධ්‍යාන කරණසුලු වූයේ නිවනෙහි ඇලුණේ ඵල සමාපත්තියෙන් සමාහිතවූයේ ඒ නාගයා ගමනෙහිද සිටීමෙහිද සන්සුන් ස්වභාවය දක්වයි.

9. "ඒ සංසුන්වූ නාගයා හිඳින කල්හිද, නිදන කල්හිද, සංසුන්ව හිඳියි. නාගයා සියලු තන්හිම සංවරව වෙසෙයි. මේ වනාහි නාගයාගේ සම්පත්ති ගුණය වෙයි.

10. "වැරදි සහිත දේ නුබුදියි. නිවැරදි දේ වළඳයි. බඩගිනි නිවාගැණීම උතුම් කොට ඇත්තේ රැස්කිරීම නොකරයි.

11. "කුඩාවූද, මහත්වූද, සියලු සංයෝජන බන්ධනයන් සිඳ දමා යම් යම් තැනකට යේ නම් බලාපොරොත්තුවක් නැතුවම ගමන් කරයි.

12. "සුවඳ ඇති මනොරම්‍යවූ දියෙහි හටගත් පියුම දියෙහි තැවරීමක් නැතුව යම්සේ වැඩේද?

13. "එසේම ලෝකයෙහි උපන්නාවූ බුදුන්වහන්සේද ලෝකයා සමග නොගැටී වෙසෙයි. දියෙහි වැඩුන පියුමක් වැනිය.

14. "මහ ගින්න වුවද උපකරණ නොලැබීමෙන් සංසිඳෙයි. අඟුරු නිවිකල්හි නිවීමද වෙයි.

15. "මේ අර්ථය දැනගැණීමට උපමාවකි. ඥානවන්තවූ බුදුන් විසින් දේශනා කරන ලද ධර්මය, ඥානවන්තයෝම දැන ගනිති. තථාගත මහා නාගයා ඇසුරු කරන්නේද, ක්ෂීණාශ්‍රවවූම නාගයෝය.

**19.** "පහකළ රාගය ඇත්තාවූද පහකළ ද්වෙෂය ඇත්තාවූද, පහකළ මෝහය ඇත්තාවූද, ආශ්‍රවයෝ ක්ෂය කළාවූද, ක්ෂීණාශ්‍රව නාගතෙම් ශරීරය හරිනුයේ පරිනිර්වාණය කරන්නාහුය.

---

# වීසති නිපාතය

**1. අධිමුත්තක ථෙර ගාථාː-** 1. "යාග හෝමාදිය පිණිස ධන පැහැර ගැනීම් පිණිස හෝ අපි මට පළමුවෙන් යමෙක් නැසුවාහු නම් ඒ සියල්ලෝම බියපත් වූවාහුය. එසේම වෙවුළුවාහුය. එසේම වැලපුනාහුය.

**2.** "ඔබවහන්සේට භයකුත් නැත්තේය. ඔබවහන්සේගේ ශරීර වර්ණයද පැහැපත් විය. මෙබඳුවූ භයට හේතුවූ අවස්ථාවෙහි කුමක් හෙයින් නොහඬනාහුද?

**3.** "තෘෂ්ණාවෙන් ඇතිකරන අපේක්ෂාව නැති බැවින් සිත පිළිබඳ දුකක් නැත්තේය. සංයෝජන ධර්මයන් ක්ෂය කළාවූ මම සියලු භය නැති කෙළෙම්.

**4.** "තත්වූ පරිද්දෙන් චතුස්සත්‍යාවබොධ කොට භවයාගේ කෙළවර සිඳදමන ලද බැවින් බර බහා තැබීම කළ මරණයෙහි භයක් නැත.

**5.** "ශාසන බ්‍රහ්මචරියාවද පුරුදු කෙළෙමි. ආර්ය මාර්ගයද මනාකොට වැඩුවෙමි. රොගයකින් සුවවූවෙකුට මෙන් මට මරණයෙහි භයක් නැත.

**6.** "මා විසින් ශාසන බ්‍රහ්මචරියාව පුරුදු කරණ ලදී. ආර්ය මාර්ගයද මනාකොට වැඩුවෙමි. භවයාගේ නිසරුකමද දැක්කෙමි. ප්‍රයෝගයකින් හරණා ජීවිතයක් මෙන් මරණයෙහි භයක් නැත.

**7.** "මරණයෙන් නිදහස ලැබූ සොරෙකු මෙන් සසරින් එතරට පැමිණියාවූද කොට නිමවන ලද කටයුතු ඇත්තාවූද කිසිවක් තෘෂ්ණා දෘෂ්ටි දෙකින් නොගන්නාවූද කෙලෙස්

නැත්තාවූද මම ආයුෂයාගේ කෙළවර වන මරණය සතුටින් බලාපොරොත්තු වෙමි.

8. "ධර්ම ස්වභාවය දැකීමෙන් අර්හත්වයට පැමිණියාවූද සියලු ලෝකයෙහි අපේක්ෂාව දුරුකළාවූද මම ගිනිගත් ගෙයකින් පිටවූවෙකුමෙන් මරණයෙහි ශෝක නොකරමි.

9. "ලෝකයෙහි ප්‍රත්‍යයෙන් උපන් යම්කිසිවක් වේද සත්ව නිකායයන්හි ලබන උත්පත්ති භාවයකුත් වේද, ඒ සියල්ලම ප්‍රධාන බවට හේතු නොවන බව මහර්ෂීවූ බුදුන් විසින් කියන ලද බැවින් මරණයෙහි ශොක නොකරමි.

10. "යම් කිසිවෙකු විසින් බුදුන් දේශනා කරනලද ධර්මය එපරිද්දෙන්ම දනී නම් ගිනි ගත් ලෝගුලියක් අතින් නොගන්නාක්මෙන් කිසි භවයක් නොගනී.

11. "අතීතයෙහි මම මෙයාකාරයෙන් සිටියේයයි කියාද, අනාගතයෙහි මෙබන්දෙක් වන්නෙමියි කියාද අදහස් නොකරමි. ප්‍රත්‍ය බලයෙන් පවත්නාවූ සංස්කාරයෝ විනාශයට පැමිණෙත්. මෙසේ දක්නාවූ මට කවර හැඬීමක්ද?

12. "ආත්ම සාරයෙන් තොරවූද, ප්‍රත්‍යයෙන් හටගත්තා වූද, ක්ලෙශාදී වශයෙන් බැඳී පවත්නාවූද, සංස්කාර තත්ත්වය තත්වූ පරිදි දක්නාවූ මට භයක් නැත්තේය.

13. "තණ හා දර අනිකෙකු විසින් ගනු ලබන කල්හි මා පිළිබඳ දෙයක් ගන්නේයයි අදහස් නොවේද, එසේම තණ හා දර සමවූ ලෝකය ප්‍රඥාවෙන් දකීනම් කිසිවකට මමත්වයක් නොකරයි. මේ දේ මට තිබී නැතිවීයයි. ශොක නොකරයි.

14. "ශරීරය කෙරෙහි කලකිරුනෙමි. භවයෙන්ද මට ප්‍රයෝජනයක් නැත. මේ ශරීරයද බිඳෙයි. මට අනික් කයක් මත්තෙහි ඇති නොවෙයි.

15. "මේ ශරීරයෙන් තොපට යමක් කැමැත්තාහුද ඒ කරව්. කරන කල්හිත් නොකරන කල්හිත් මට අනුකූල බව හෝ ක්‍රොධය යන දෙකම ඇති නොවේ.

16. "ඒ අධිමුත්ත ස්ථවිරයන්ගේ අද්භූතවූද, රෝමෝද් ගතවූද, වචන අසා ඒ හොරු ආයුධ බිමහෙලා උන්වහන්සේට මෙසේ සැළ කළහ.

17. "පිංවතුන් වහන්ස, කවර ආචාර්ය වරයෙකුගේ අවවාදයක් නිසා කෙබඳු තපස් කිරීමක් කොට කවරකුගේ ශාසනයකට පැමිණ මරණ අවස්ථාවෙහි ශෝක නොකිරීම ඔබවහන්සේ විසින් ලබන ලදද?

18. "සියල්ල දක්නාවූද, සියල්ල දන්නාවූද, ජයගත්තා වූද, මහා කාරුණිකවූද, කෙලෙස් රෝගයන්ට පිළියම් කරන්නාවූද, බුදුන් වන්සේ මාගේ ශාස්තෘවරයාණෝය.

19. "නිරුත්තරවූද නිර්වාණගාමීවූද ධර්මය ඒ බුදුන් වහන්සේ විසින් දේශනා කරණ ලදී. උන්වහන්සේගේ ශාසනයට පැමිණ ශොක නොකරන බැව් ලැබ ගතිමි.

20. "චෞරයෝ ඒ අධිමුත්තක ස්ථවිරයන්ගේ යහපත් වචන අසා ආයුධාදිය බිම දමා සමහර කෙනෙක් ඒ සොරකම් කිරීමෙන් වැළකුණාහුය. සමහරෙක් ප්‍රව්‍රජ්‍යාව ලැබ ගත්තාහුය.

21. "බුදු සස්නෙහි පැවිදි බව ලැබූ ඔවුහු බොජ්ඣංග ධර්ම වඩා ප්‍රීතියෙන් යුක්ත සිත් ඇතිව සොම්නසට පැමිණ අසංඛත නම්වූ නිර්වාණ පදය ලැබුවාහුය."

2. "**පාරාසරිය ථෙර ගාථාඃ-** 1. "කාය විවේකයෙන් හා චිත්ත විවේකයෙන් යුක්තව ධ්‍යාන කරන්නාවූ පරාසර ගොත්‍රයෙහි උපන්නාවූ භික්ෂුවට ධර්ම චින්තාවක් විය.

2. "පුරුෂයා පළමුකොට කුමක් කළයුතුද කවර ශීලයක් අනුව හැසිරිය යුතුද තමහට කෘත්‍ය පිණිස පවතින කටයුතු කරන පුද්ගලයා අනුන්ට වෙහෙසීමක් නොකළ යුතුය.

3. "මිනිසුන්ට ඉන්ද්‍රියයෝ හිත පිණිසද අහිත පිණිසද වෙත්. නොරක්නා ලද ඉඳුරෝ අහිත පිණිසත්, රක්නා ලද ඉඳුරෝ හිත පිණිසත් පවතී.

4. "සිහියෙන් යුක්තව ආරක්ෂා කරන ඉන්ද්‍රියයෝ වෙත්ද, තමහට යහපත පිණිසම පවතී. අන්කිසිවෙකුට වෙහෙසක් පිණිස නොපවතී.

5. "රූපයන් කරා යනු ලබන ඇස නමැති ඉන්ද්‍රිය නොවලක්කා ලබන්නාවූද ආදීනව නොදක්නාවූද හෙතෙම දුකින් නොමිදේ,

6. "ශබ්ද අරමුණු කරා ගමන් කරන්නාවූ කණ නමැති ඉන්ද්‍රිය නොවලක්නාවූද ආදීනව නොදක්නාවූද හෙතෙම දුකින් නොමිදේ.

7. "ආදීනව නොදැකීමෙන් සුවඳ සේවනය කෙරේද, සුවඳෙහි මුසපත්වූ ඒ පුද්ගලයා දුකින් නොමිදේ.

8. "ඇඹුල් මිහිරි තිත්ත ආදී රසයන් පිළිබඳ මෙනෙහි කරනුයේ රස තෘෂ්ණාවෙන් බැඳුනාහූ දුක් කෙළවර කෙරෙමියි අදහසක් නොසිතයි.

9. "සුන්දරවූද මනොරම්‍යවූද ස්පර්ශ සිහිපත් කරනුයේ රාගයෙන් රත්වූයේ නානා ප්‍රකාර දුක් ලබයි.

10. "කියනලද පස්වැදෑරුම් ධර්මයන්ගෙන් හා ධර්මාරම්මණයන්ගෙනුත් හිත ගැටීමට යමෙකුට නොහැකිවූයේ නම් ඒ සෑම අරමුණකින්ම ඔහුට දුක් ඇතිවෙයි.

11. "ලේ සැරවින් පිරුණාවූද කුණපයන්ගෙන් පිරුණාවූද කරනලද සිතියමක් මෙන් ඔපමට්ටම්වූ මේ ශරීරය බාල ජනයන් විසින් මුලාවෙන් ගනී.

12. "කටුක දුක්වලට හේතුවන්නාවූද මිහිරි බවක් පෙන්නුම් කරන්නාවූද එහෙයින්ම ප්‍රිය භාවයෙන් බැඳෙන්නාවූද මේ ශරීරයෙහි ගිජු බව සිතාගත් පුද්ගලයා දැලි පිහි මූණත ලෙවකන්නකුමෙන් සැපයක් නොවිඳ දුකටම පත්වෙයි.

13. "ස්ත්‍රී රූපයෙහිද ස්ත්‍රී ස්වරයෙහිද ස්ත්‍රී ගන්ධයෙහිද ඇලුනාවූ විවිධ දුක් විඳිති.

14. "ස්ත්‍රියගෙන් වැගිරෙන්නාවූ තෘෂ්ණා දියපහරවල් පුරුෂයාගේ පංචද්වාරයෙහිම පවතී. ඒ සංවරණය කරන්ට හැකි පුද්ගලයෙක්වේ නම් ඔහු වීර්යවන්තයෙකි.

15. "යමෙක් පංචකාම රතියෙහි ඇලුනේවේද අර්ථයත් ධර්මයත් නොහැර ස්වකීය කටයුතු කෙරේ නම් හෙතෙම මේ ලෝකයෙහි අර්ථයෙන් යුක්තවූද ධර්මයෙන් යුක්තවූද දක්ෂයෙක් හා විචක්ෂණ පුද්ගලයෙක් වෙයි.

16. "යම්කිසිවෙක් මෙලොව අර්ථය පමණක් ගෙණ පරලොව හැරදමා නම් ඒ කෘත්‍යය හැරදමන්නාවූ පුද්ගලයා අප්‍රමාදී විචක්ෂණ පුද්ගලයෙක් නොවෙයි.

17. "යමක් අර්ථයෙන් යුක්ත නම් ධර්මයෙනුත් යුක්ත නම් එය මනාකොට කරව්. හේ උත්තම රතිය නම් වේ.

18. "නොයෙක් ආකාර උපායයන්ගෙන් අනුන් සන්තකදේ ගැණීමට කැමැතිවේද, මරා හෝ සැහැසිකම් කොට හෝ ශෝකයට පමුණුවා ගනු ලබන දෙයින් රතියක් ඇති නොවෙයි.

19. "කාය බලාදියෙන් යුක්තවූ වඩු තෙමේ ලොකු ඇණය ගසා කුඩා ඇණය ගලවද්ද, එසේම දක්ෂවූ භික්ෂුව චක්ෂුරාදී ඉන්ද්‍රියයන් විදර්ශනා බලයෙන් දමනය කරයි.

20. "සද්ධා, විරිය, සති, සමාධි ප්‍රඥා යන ධර්ම පස වඩමින් කෙලෙස් උපදවන චක්ෂුරාදි ඉන්ද්‍රියයන් පස නැති කොට නිදුක්වූයේ බ්‍රාහ්මණයෙක්වූ ඒ උත්තමයා නිවනට පැමිණෙයි.

21. "යථොක්ත පුද්ගලයා උත්තමාර්ථයෙන් යුක්තවූයේ ධර්මයෙහිම සිටියේ බුදුන්ගේ අනුශාසනාවට අනුව පිළිපැද නිවන් සැප ලබන්නේය."

3. **තෙලකානි ථෙර ගාථා**:- 1. "බොහෝ කාලයක් මුළුල්ලෙහි වීර්යවන්තව ධර්මය සොයමින් ඇවිද්දෙමි. නොයෙක් මහණ බමුණන්ගෙන් විචාළේ නමුදු සිත සංසිඳුවන ආර්ය ධර්මය නොලදිමි.

2. "ලෝකයෙහි කවරෙක් පරතෙරට ගියාහුද නිවනට පැමිණියාහු කවරහුද, උත්තම අර්ථය දන්නාහු කවරහුද කියා සෙව්වෙමි.

3. "හෘදයගත කෙලෙස් ඇදයෙන් යුක්තවූවෙමි. කෙසේද, ඇමක් ගිලින මත්ස්‍යයෙක් මෙන් දුකට පත්වීමි. ශක්‍රයාගේ පාසයෙන් වේපචිත්ති අසුරේන්ද්‍රයා මෙන් දුකට පත්වීමි.

4. "පාසගත මුවෙක් මිදීමට නොදන්නේ ඇදීමෙන් බන්ධනය තදකරගණීද එසේම මමද ක්ලේශ බන්ධනයෙන් මිදිය නොහැකිව කවරෙක් මට මිදීමේ උපාය කියන්නේදැයි සෙවීමි.

5. "කෙලෙස් බිඳ හරින්නාවූ ධර්මය ප්‍රකාශ කරන ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කවරහුද ජරාමරණ නැතිකරන කවර ධර්මයක් පිළිපදිමුද කියායි.

6. "විචිකිච්ඡා නම්වූ සැකයෙන් බැඳුනාවූද එකට එක කිරීමෙන් යුක්තවුනාවූද ක්‍රොධමානයෙන් තද බවට පැමිණියාහුද කැමති සේ ලැබීමේ අපේක්ෂාවෙන් තෘෂ්ණාවෙන් යුක්ත වුනාවූද,

7. "පපුවෙහි දැඩිකොට ඇති පවත්නා තණ්හා හුලද තිසක් පමණවූ ප්‍රභෙදගත දෘෂ්ටි හුල්ද බලව.

8. "ප්‍රහීණ නොවූ ආත්ම දෘෂ්ටියද උත්සාහවත් කරණ ලද මිථ්‍යා සංකල්පනාවෝද නිසා සුළඟින් වැනෙන කොළ මෙන් කම්පාවෙන් පවතී.

9. "ආත්ම භාවයෙහිම හටගෙණ සීඝ්‍රතරව දරාද සයාකාර ස්පර්ශ අරමුණු කෙරෙහි සෑම කල්හිම පවතී.

10. "නානාප්‍රකාර ආයුධ යොදා මන්ත්‍ර ප්‍රයෝගයකින් හෝ මාගේ ශරීරගත කෙලෙස් හුල් උදුරාදමා පිළියම් කිරීමට හැකි වෛද්‍යවරයෙක් නොදැක්කෙමි.

11. "ආයුධ නොයොදා තුවාලද නොකොට පීඩාවකුත් නොමකොට ශරීරාභ්‍යන්තරයෙහි පවත්නා මේ හුල් උදුරා දැමීමට හැකි පුද්ගලයා කවරෙක්ද?

12. "රාගාදී කෙලෙස් සුංකරන්නාවූ යම්කිසි ධර්ම නිමිත්තක්වේද, එයම ශ්‍රෙෂ්ඨයි. ගැඹුරුවූ සංසාර මහොසයෙහි පතිතවූ මට නිර්වාණ කාලය පෙන්නුම් කරන්නේද ඒ පුද්ගලයා ශ්‍රෙෂ්ඨයි.

13. "යම්බඳුවූ ගිහිගේ නම් මඩින් යුක්තවූ ජලාශයක්වේද, එහි පතිතව මායාව, ඊර්ෂ්‍යාව, එකට එක කිරීම ථිනමිද්ධය යන මෙයින් යුත්තව විසීම.

14. "උද්ධච්ච නැමැති වැසි ධාරාවෙන් හා සංයෝජන නැමැති වලාවෙන් යුක්තව රාග නිශ්‍රිත සංකල්පනා නැමැති දියපාර ඇතිව අපාය නැමැති සමුද්‍රයට අදිමින් සිටියෙමි.

15. "තණ්හා සොත දෘෂ්ටි සොතාදි ලතාවෙන් වැළඳ ගන්නාලද්දේද ඒ ලතාව කවරෙක් සිඳ දමන්නේද?

16. "දියපහරින් වැළැක්වීමට ඒදණ්ඩක් කළ යුතුයි. තොපගේ මනෝමයවූ තෘෂ්ණා දියපහරින් ගං ඉවුරෙක පිහිටි ගසක් ඉදිරී වැටෙන්නාක් මෙන් ඇද වැටේ.

17. "මෙසේ සසර හටගත් භය ඇති මට ඒ භයින් මිදීමට නිවන සොයන්නේ ආරක්ෂා ස්ථානය වශයෙන් ප්‍රඥා යුධය ඇති ආර්ය සංඝයා විසින් පිරිවරණලද ශාස්තෘන් වහන්සේ හේතුවිය.

18. "මනාකොට කරන ලද්දාවූද උප ක්ලේශ විරහිතවූද ශ්‍රද්ධා ප්‍රඥාදී සාරයෙන් යුත්වූද මේ විදර්ශනා නැමැති හිණිමග ගසාගෙණ යනු ලබන මට ශාස්තෘන් වහන්සේ දුන්සේක. භය නොවේයයි කීහ.

19. "සතිපට්ඨානය නැමැති ප්‍රාසාදයට නැගී චතුරාර්ය සත්‍යය මාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කෙළෙමි. එසේ කළ මට මමය මාගේයයි යන දෘෂ්ටිගත් තීර්ථකාදී පිරිස පහත්කොට සිතුවෙමි.

20. "ආර්ය මාර්ග නැමැති නැවට නැගීමේ උපාය වශයෙන් විදර්ශනා මාර්ගය දැක්කෙමි. ඒ සියලු මාර්ගයන්ට වඩා උත්තම මාර්ගය හැටියට දැක්කෙමි.

**21.** "මමය මාගේය යන තෘෂ්ණා හුල්වෙත්ද ඒ පාප ධර්මයන්ගේ නොපැවැත්මට ශ්‍රෙෂ්ඨ ආර්ය මාර්ගය දෙසූසේක.

**22.** "බොහෝ කාලයක් සන්තානගතව සයනය කරන ලද ක්ලේශ දෝෂයෝ බුදුන්ගේ දේශනානුභාවයෙන් ඉතුරු නොකොට ප්‍රහීණ කෙළෙමි."

**4. රට්ඨපාල ථෙර ගාථා:-** 1.වස්ත්‍රාභරණාදියෙන් විසිතුරු කරනලද නවමුඛයකින් අසූචි වැගිරෙන තුන්සීයක් ඇට කෝටු ඇති නිතර ගිලන් ස්වභාවයෙන් යුක්තවූ බාල ජනයන් විසින් වරදවා කල්පනා කරන ස්ථිර භාවයක් නැති බිඳෙන ස්වභාවයෙන් යුක්තවූ මේ ශරීරය බලව.

**2.** "මාණික්‍යාදි ආභරණ විශෙෂයන්ගෙන් විසිතුරු කරන ලද්දාවූද ඇට සහ සමෙනුත් යුක්තවූද වස්ත්‍රයන්ගෙන් ශොභා සම්පන්න මේ ශරීරය බලව.

**3.** "ලාකඩ වතුර රැඳවූ විලේපනවලින් ඔපකරන ලද මුඛයක් ඇති මේ ශරීරය අඥාන පුද්ගලයාගේ මුලාවට හේතු වෙයි. නිවන් සොයන්නහුට මුලාවට කාරණයක් නොවේ.

**4.** "අෂ්ටපදාකාරයෙන් කරනලද කෙස් ඇත්තාවූද, අඳුන් තැවරූ ඇස් ඇත්තාවූද මේ ශරීරය අඥානයාගේ මුලාවට හේතුයි. නිවන් සොයන්නහුගේ මුලාවට හේතුවක් නොවේ.

**5.** "අලංකාර කරනලද මේ කුණු කය මාලාකර්ම දන්තාදියෙන් විසිතුරුය. ඒ බාලයාගේ මුලාවට හේතුවක් වෙයි.

**6.** "වැද්දා මුවා මැරීමට උගුල අටවා කෑම දමාතැබුවේද, දක්ෂ මුවෙක්වූ මම මිගබන්ධකයන් හඬද්දී පලාගියෙමි.

**7.** "වැද්දාගේ පාසය සිඳ දමනලදී. රන් රුවන්ද, ස්ත්‍රී සමූහයාද නමැති ඒ පාසයට අසුනොවීමි. පාසය ළඟ තැබූ කෑම පමණක් ගෙන මිගලුද්දකයන් හඬද්දීම ගියෙමි.

**8.** "ලෝකයෙහි මෝහයෙන් ධන රැස්කොට අනුන්ට නොදෙන්නාවූ ධනවත් මනුෂ්‍යයන් දැක්කෙමි. ඔව්හු ධන රැස්කොට බොහෝ සෙයින් කාම සැප පතන්නාහුය.

**9.** "රජවරුද වංශානුගත පෘථිවිය ජයගෙණ සාගරය කෙළවරකොට ලැබුවත් එයින් සෑහීමකට නොපැමිණ මුහුදෙන් එතර රටවල්ද බලාපොරොත්තු වෙති.

**10.** "රජවරුද අවශෙෂ මනුෂ්‍යයෝද තෘෂ්ණා දුරු නොකොට මරණයට පැමිණෙත්. සම්පූර්ණ නොවූ සිත් ඇත්තෝව ශරීරය හැර දමත්. ලෝකයෙහි කාමවස්තූන් පිළිබඳ තෘප්තියක් නැත්තේය.

**11.** "නෑදෑයෝ මළ පුරුෂයා උදෙසා කෙස් කඩාදා හඬත්. අපේ නෑයා දෙව්වන්නේද කියත්. වස්ත්‍රයෙන් ඔතා චිතකය කරා ගෙණ ගොස් දමත්.

**12.** "ඒ මළ සත්වයා දවන්නවුන් විසින් හුල්වලින් ඇණ දවන්නාහුය. භොගයන් සියල්ල වෙනුවට එක් වස්ත්‍රයක් ඇතිව දවනුලබන්නාවූ ඔහුගේ ආරක්ෂාවට ඥාති මිත්‍රාදි කිසිවෙක් නැත්තාහ.

**13.** "ඔහුගේ ධනය උරුමක්කාරයෝ ගනිත්. ඒ සත්වයා කර්මය අනුව ගියේය. අඹුදරුවෝද, ධනයද, රටද යන කිසිවක් මැරෙණ පුද්ගලයා අනුව නොයයි.

**14.** "ධනය නිසා දීර්ඝායුෂ නොලබයි. ජරාවද, නොවලක්වයි. අස්ථිරවූද වෙනස්වන ස්වභාව ඇත්තාවූද, ජීවිතය ප්‍රාඥයෝ ස්වල්ප දෙයක්කොට සලකති.

**15.** "ධනවන්තයෝද, දිළින්දෝද, ඉෂ්ටානිෂ්ට ස්පර්ශයන් ලබත්. බාලයෝද, ඥාණවන්තයෝද, එසේම ලබත්. බාලයෝ වනාහි බාල්‍යතාවය නිසා පීඩාවෙන් වෙසෙත්. පණ්ඩිතයෝ ඉෂ්ටානිෂ්ට දෙකෙහි කම්පා නොවෙත්.

**16.** "ඒ නිසා ධනයට වඩා ප්‍රඥාව ශ්‍රෙෂ්ඨයි. ප්‍රඥාවෙන් භවය කෙළවර කරයි. අවසාන නිෂ්ටාව නොලැබුවාහු ලොකු කුඩා භවයන්හි මෝහයෙන් පව්කම් කරත්.

**17.** "එසේ පව්කම්කොට සසරට වැද ගර්භසෙයයාව හා ලෝකෝත්පත්තිය යන දෙකින් නොමිදෙත්. අඥානවූ පුද්ගලයා පරලොවද ගර්භසෙයයාවද ආදී දුක් ලබයි.

18. "ආරක්ෂක පුරුෂයන් විසින් ගනු ලබන සොරෙක් රාජපුරුෂයන් විසින් බඳිනලදුව කසවලින් තලමින් වෙහෙසට පත්කරත්ද, එසේම පාප ධර්මයන්ගෙන් යුක්තවූනාවූ සත්වයෝ පරලොවදී වෙහෙසට පැමිණෙත්.

19. "කාමයෝ වනාහි විචිත්‍රය, මධුරය, මනෝරම්‍යය, අනේකවිධ ස්වරූපයෙන් සිත නොමගට ගෙණ පෙළත්. මේ දෝෂයෝ කාම වස්තුවල ඇති බව දැන මහරජ මම පැවිදිබවට පත්වූවෙමි.

20. "පැසුනාවූද, නොපැසුනාවූද, ගෙඩි වැටෙත්. එසේම බාලයෝද, වෘද්ධයෝද, ශරීර භේදයෙන් මරණයට පත්වෙත්. මේ බවද දැක මහරජ මම පැවිදිබවට පත්වූවෙමි. අවිරුද්ධ ශ්‍රමණ භාවයම ශ්‍රේෂ්ඨයි.

21. "මම ශ්‍රද්ධාවෙන් බුදුන්ගේ ශාසනයෙහි පැවිදිබව ලැබූයේ මගේ පැවිද්ද හිස්නොවීය. රහත්බැව් ලබනලද බැවින් හිස්නොවීය. කෙලෙස් නැතිව ස්වාමිභාවයෙන් ප්‍රත්‍යය පරිභොග කරමි.

22. "වස්තුකාම, ක්ලේශ කාමයන් එකොළොස් ගින්නකින් ඇවිලෙනබව දැක කළ නොකළ සියලුම රන් රිදී රත්න විශෙෂයෝ අනර්ථ පිණිස පවතින බවද සියලු සසර පැවැත්ම දුකක් බවද නරකයන්හි මහත් භය ඇති බවද නුවණින් දුටුවෙමි.

23. "මේ ආදීනව දැන සංවේගය ලදිමි. ගිහි අවස්ථාවෙහි රාගාදී හුල්වලින් විදිනාලදුව පැවිදිබවට පැමිණ කෙලෙස් ශාන්තබවට පැමිණියෙමි.

24. "මා විසින් ශාස්තෘන් වහන්සේ අසුරු කරණලදී. බුදුන්ගේ අනුශාසනාවට අනුව කටයුතු කෙළෙමි. ගරුභාරය බහාතැබීමි. ගවයාගේ කෙළවරද බිඳ දැමූවෙමි.

25. "යම් අර්ථයක් නිසා ගිහිගෙයින් නොගිහි බැව් නම්වූ ප්‍රව්‍රජ්‍යාවට පැමිණියෙම්ද, සියලු සංයෝජනයන් නසා මා විසින් ඒ අර්ථය සිද්ධකරනලදී."

**5. මාලුංක්‍ය ථෙර ගාථා:-** 1. "ඇසින් රූපය දැක ශුභ නිමිති වශයෙන් මෙනෙහි කරන්නාවූ මගේ සිහිය මුලාවිය. රාගයෙන් රත්වූ සිත් ඇත්තේ ඒ රූපාරම්මණයෙහිම බැසගන්නා ලද්දේ සැපය යන හැඟීම ඇති විය.

**2.** "නොයෙක් රූපයන් නිසා සැප වේදනාව වැඩෙත්ම ලෝභ, ද්වේෂ දෙකෙන්ද සිත මඩනාලද්දීය. මෙසේ රසවිඳීම කරනු ලබන්නේ සංසාර දුක පවතී. ඔහුට නිවන ඉතා දුරවේ.

**3.** "කණින් ශබ්ද අසා ඒ ශබ්දාරමුණු ප්‍රිය වශයෙන් මෙනෙහිකරන්නාවූ පුද්ගලයාගේ සිහිය මුලාවේ. රාගයෙන් මඩනාලද සිත් ඇතුව එහිම බැසගත් පුද්ගලයාට නොයෙක් වේදනාවෝ ලැබෙත්.

**4.** "නොයෙක් ශබ්දාරමුණුවලින් වේදනාව වැඩෙන්නාවූ ඔහුට ලෝභයත්, ක්‍රෝධයත් නිසා ගැටීම ඇතිවේ. ඒ ඒ වෙදනාවන්ගේ රැස්වීමෙන් සංසාර දුක පවතී. නිවන ඔහුට ඈත්වේ.

**5.** නාසයෙන් ගන්ධාරමුණු ලැබ ඒ ප්‍රිය වශයෙන් මෙනෙහි කරන්නහුගේ සිහිය මුලාවෙයි. රාගයෙන් රත්වූ සිත් ඇති ඔහු එහිම බැසගන්නාලදුව නොයෙක් වේදනා විඳියි.

**6.** "නොයෙක් ගන්ධ අරමුණු නිසා ඇතිවෙන වේදනාවන් වැඩෙනුයේ ලෝභය, ක්‍රෝධය ඔහුගේ සිත මැඩගනියි. මෙසේ රැස්කරන්නාවූ කර්ම චෙතනා නිසා ඔහුට සංසාරදුක පවතී. නිවන බොහෝ ඈත්වේ.

**7.** "දිවෙන් රස ලබා එය සුභවශයෙන් මෙනෙහි කරන්නාවූ පුද්ගලයාගේ සිහිය මුලාවෙයි. රාගයෙන් රත්වූ සිත් ඇති එහිම බැසගන්නාලද ඔහුට නොයෙක් වේදනාවෝ ඇතිවෙත්.

**8.** "නොයෙක් වෙදනාවන් නිසා ඇතිවනු ලබන වේදනාවෝ වැඩෙත්ද, ලෝභය හා ක්‍රෝධය ඔහුගේ සිත මැඩගනියි. මෙසේ රැස්කරන කර්ම ඇති පුද්ගලයාට සංසාර දුක පවතී. නිර්වාණය ඔහුට ඈත්වේ.

**9.** "ශරීරයෙන් ස්පර්ශ අරමුණු ලැබ එය සුභ වශයෙන් මෙනෙහි කරනුලබන පුද්ගලයාගේ සිහිමුලාවෙයි. රාගයෙන්

රත්වූ සිත් ඇති එහිම බැසගෙණ සිටින්නාවූ ඔහුට නොයෙක් වේදනාවෝ ඇතිවෙත්.

10. "අනේකවූ ස්පර්ශාරම්මණයන් නිසා ඔහුට වේදනාවන් ඇතිවෙත්. එය පිළිබඳ ලෝභයද ක්‍රෝධයද, ඔහුගේ සිත මැඩගනී. මෙසේ කර්ම රැස්කරන ඒ පුද්ගලයාට සංසාර දුක පවතී. නිර්වාණය ඔහුට ඈත්වේ.

11. "සිතින් ධර්ම අරමුණු ලැබ සුභ නිමිති මෙනෙහි කරන්නාවූ පුද්ගලයාගේ සිහිය මුලාවේ. රාගයෙන් රත්වූ සිත් ඇති එහිම බැසගන්නාලද ඔහුට නොයෙක් වේදනාවෝ ඇතිවෙත්.

12. "අනේකවූ ධර්ම අරමුණු නිසා ඔහුට නොයෙක් වේදනාවන් වැඩෙත්. ලෝභයද ක්‍රෝධයද ඔහුගේ සිත මැඩගනියි. මෙසේ කර්ම රැස්කරන පුද්ගලයාට සසර දුක පවතී. නිවන ඔහුට ඈත්වේ.

13. "රූප අරමුණු දැක ඒ ප්‍රඥාවෙන් බලන්නාවූ පුද්ගලයාගේ සිත රූපයෙහි නොඇලෙයි. නොඇලුනාවූ සිත් ඇති ඔහු එහි නොබැසගන්නාලද්දේ වේදනා නොලබයි.

14. "තත්වූ පරිද්දෙන් රූප අරමුණු දකින්නාවූද, සේවනය කරන්නාවූද ඔහුගේ වේදනාවන් ක්ෂයබවටයෙත්. ඔහු සිහියෙන් යුක්තව හැසිරෙයි. මෙසේ දුක් නැතිකරන ඔහුට නිර්වාණය කිට්ටුවෙයි.

15. "හෙතෙම කණින් ශබ්දඅසා ශබ්ද අරමුණෙහි නොඇලේද, නොඇලුනාවූ සිත් ඇති ඔහු එහි බැසනොගනියි.

16. "කණින් ශබ්ද අසන්නාවූ ඔහුට ඇතිවන වේදනාවෝ ක්ෂය බවට පැමිණෙත්. කර්ම රැස්නොකරන ඔහු සිහියෙන් හැසිරෙයි. මෙසේ දුක් පහකොට නිවන් ලැබිය හැකිය.

17. "නාසයෙන් ගන්ධ අරමුණු ලැබ එය නුවණින් නොඇලීසිටීද, නොඇලුනාවූ සිත් ඇති එහි නොබැසගත් ඔහුට යම්බඳු වේදනාවෝ වෙත්ද,

18. "ගන්ධ අරමුණු නිසා ඇතිවන වේදනාවෝ ක්ෂය බවට පැමිණෙත්. සිහියෙන් යුක්තව හැසිරෙන ඔහු කර්ම රැස්නොකරයි. මෙසේ රැස් නොකරන කර්ම ඇති ඔහු දුක් නසයි. නිවන ඔහුට ආසන්න වෙයි.

19. "දිවෙන් රස අරමුණු ලැබ සිහියෙන් යුක්තව එහි නොඇලී සිටීද, නොඇලුනාවූ සිත් ඇති එහි නොබැසගන්නා ලද වේදනාවෝ වෙත්ද,

20. "රසයෙහි ගිජුනොවී වේදනා නොලබන ඔහු කෙලෙස් ක්ෂය කරයි. හෙතෙම සිහියෙන් යුක්තව හැසිරෙයි. එසේ කර්ම රැස්නොකරන ඔහු දුක් නසයි. නිවන ඔහුගේ සමීපයෙහිය.

21. "කයින් ස්පර්ශ අරමුණු ලැබ සිහියෙන් යුක්තව නොඇලී සිටී නම් නොඇලුනාවූ සිත් ඇති එහි නොබැසගත්තාවූ ඔහුගේ වේදනාවෝ වෙත්ද,

22. "ස්පර්ශ අරමුණු ලැබීමෙන් එබඳු වේදනා ඇති පුද්ගලයා කෙලෙස් ක්ෂය කරයි. ඔහු සිහියෙන් යුක්තව හැසිරෙයි. ඔහු දුක් කෙළවර කරයි. නිවන් ඔහුගේ සමීපයෙහිය.

23. "සිතින් ධර්ම අරමුණු ලැබ සිහියෙන් යුක්තව එහි නොඇලී සිටින්නාවූ පුද්ගලයා නොඇලුනාවූ සිතින් යුක්තව එහි නොබැසගන්නාලදුව වේදනාවක් විඳීද,

24. "ධර්ම අරමුණු සේවනය කිරීමෙන් වේදනා ලැබූ ඔහු කෙලෙස් ක්ෂයකරයි. කර්ම රැස්නොකරන ඒ පුද්ගලයා සිහියෙන් යුක්තව හැසිරෙයි. කර්ම රැස්නොකරන ඒ පුද්ගලයාට දුක් නැසියහැකිය. නිවන ඔහු සමීපයෙහිය."

**6. සෙල ථෙර ගාථා:-** (සුත්තනිපාතයේ 33 සේල සූත්‍රයේ 1-20 ඡෙද හා 1-4 ඡෙද මෙහි යොදාගත යුතුයි.)

**7. භද්දිය ථෙර ගාථා:-** 1. "මම මීට පළමුව ඇත්කඳ පිට සිට ගමන් කෙළෙමි. සියුම් කසී වස්ත්‍ර හැන්දෙමි. පවිත්‍රවූ මාංශයෙන් සෙවුනා ලද හැල් සාලින් පිසූ බත් අනුභව කෙළෙමි.

2. "කාලිගොධා නම්වූ ස්ත්‍රියගේ පුත්‍රවූ භද්දිය වන මම අද සිල්ගුණයෙන් යුක්තවූයේ, ශ්‍රමණ ධර්මයෙහි නිතර යෙදුනේ පිණ්ඩියාලොප භෝජනයෙන් යුක්තවූයේ ධ්‍යාන කරමින් සතුටින් වෙසෙමි.

3. "කාලිගොධා බැමිණියගේ පුත්‍රවූ භද්දිය ස්ථවිරයන් පාංශුකූලිකාංගය සමාදන් වීමෙන් හා පිණ්ඩපාතිකාංගය සමාදන් වීමෙන් කිසිවක් තෘෂ්ණාදෘෂ්ටියෙන් නොගෙණ ධ්‍යාන කරමින් වාසය කරයි.

4. එසේම පිණ්ඩපාතිකාංගය සමාදන් වීමෙන්ද, තෙචීවරිකාංගය සමාදන්වීමෙන්ද, සපදානචාරිකාවෙන්ද, යුක්තව එකාසනිකාංගයෙන් යුක්තව සතුටින් වාසය කරමි.

5. එසේම පත්තපිණ්ඩිකාංගයෙන් යුක්තවද, ඛලුපච්ඡා භත්තිකාංගයෙන් යුක්තවද, ආරණ්‍යකාංගයෙන් යුක්තවද වෘක්ෂමූලිකාංගයෙන් යුක්තවද, සතුටින් වෙසෙමි.

6. අබ්භොකාසිකාංගයෙන් යුක්තවද, සොසානිකාංගයෙන් යුක්තවද, යථාසන්තිතිකාංගයෙන් යුත්වද, නේසජ්ජිකාංගයෙන් යුක්තවද, සතුටින් වාසය කරමි.

7. කාලිගොධා බැමිණියගේ පුත්‍රවූ භද්දිය ස්ථවිරයන් වහන්සේ පටන්ගත්තා ලද වීර්යය ඇත්තෙක්ව සතුටින් වෙසෙයි.

8. ස්වර්ණමයවූ රැස් විහිදෙන්නාවූ රන්තලිය හැර මැටි පාත්‍රය ගත්තෙමි. මේ දෙවන සේවනය වෙයි.

9. ප්‍රාකාරවලින් වටකරනලද ස්ථිරවූ දොර අගුළුවලින් යුක්ත මතුමහල් තලයෙහි කඩුගත් අත් ඇති පුරුෂයන් විසින් රකිනාලදුව ත්‍රාශ සහිතව මම පළමුව විසුවෙමි.

10. "කාලිගොධා බැමිණියගේ පුත්‍රවූ භද්දිය වන මම අද ත්‍රාශයන් නැතිව භය හා භයට හේතු දේ දුරුකොට වනයෙහි ධ්‍යාන කරමින් සතුටින් වෙසෙමි.

11. සීලස්ඛන්ධයෙහි පිහිටා ඵල සමාපත්ති නිරොධ සමාපත්ති වඩමින් පිළිවෙලින් සියලු සංයෝජන ධර්මයන් ක්ෂයකොට නිවන් සැපයට පැමිණියෙමි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. **අංගුලිමාල ථෙර ගාථා:-** 1. "ශ්‍රමණය, ඔබ යන්නේම සිටියෙමියි කියයි මමද සිටියේ නොසිටියෙමියි කියන්නෙමි. ශ්‍රමණය මේ අර්ථය මම විචාරමි. ඔබ කෙසේ සිටියෙහිද මම කෙසේ නොසිටියෙම්ද?

2. "අංගුලිමාලය, මම සියලු සත්වයන් කෙරෙහි දඬු මුගුරු බහා තබා සැමකල්හි සිටියේ වෙමි. තෝ සත්වයන් කෙරෙහි අකරුණාවන්තව වසන්නෙහිය. එහෙයින් මම සිටියෙමි. තෝ නොසිටියේ වෙහි.

3. "මට අනුකම්පා පිණිස ලෝකයා විසින් පුදනු ලබන්නාවූ මහර්ෂිවූ ශ්‍රමණයන්වහන්සේ මෙහි වැඩිසේක. ඒ මම උන් වහන්සේගේ ධර්මයෙන් යුක්තවූ ගාථා ඇසුවෙමි. ඒ අසා බොහෝ කලක් පුරුදු කරන ලද පාප සහශ්‍රයන් දුරුකර හැරීමි.

4. "ඊට අනතුරුව අගුමල් සොරතෙමේ කඩුව හා සෙසු ආයුධත් ප්‍රපාතවූ විවරස්ථානයක හෙලුවේය. ඉක්බිති අගුල් මල් සොරතෙමේ සුගත්වූ බුදුන් වහන්සේගේ පාද වැන්දේය. එහිදීම ප්‍රව්‍රජ්‍යාවද ඉල්ලීය.

5. "දෙවියන් සහිත සත්ව ලෝකයට මහා කාරුණිකවූද මහර්ෂිවූද බුදුන් වහන්සේ 'එව භික්ෂුවයි' කියා වදාළහ. ඔහුට එයම එහි භික්ෂුභාව ප්‍රව්‍රජ්‍යාවට හේතු විය.

6. "යමෙක් පළමුව ප්‍රමාදවිහරණයෙන් යෙදී, පසුව අප්‍රමාදයෙන් යුක්ත වේද, උපක්ලේශ රහිත චන්ද්‍රයා නේ හෙතෙම මේ ලෝකය බබුළුවයි.

7. "යමෙක් කරන ලද පාපකර්ම, කුශල්වලින් වසාද, ඔහු උපක්ලේශ රහිත චන්ද්‍රයා මෙන් මේ ලෝකය බබුළුවයි.

8. "යම් භික්ෂුවක් තරුණවූද බුදුසසුන්හි යෙදුනේ නම් උපක්ලේශ රහිත චන්ද්‍රයා මෙන් මේ ලෝකය බබුළුවයි.

9. "මගේ විරුද්ධකාරයෝද, ධර්මය අසත්වා, මගේ විරුද්ධකාරයෝද බුද්ධශාසනයෙහි යෙදෙත්වා, මගේ විරුද්ධකාරයෝද සත්පුරුෂයන් ඇසුරු කරත්වා. සත්පුරුෂයෝ වනාහි යහපත් ධර්මවල පිහිටුවත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10. "මගේ විරුද්ධකාරයන් විසින් ශාන්තිය කියන්නාවූ මෛත්‍රියට ප්‍රශංසා කරන්නාවූ ධර්මය සුදුසු කාලයෙහි අසත්වා, එයම ඉගෙණ ඊට අනුව කටයුතු කෙරෙත්වා,

11. "විරුද්ධකාරයෝ මට හිංසා නොකරත්වා, අන්කිසිවෙකුටත් හිංසා නොකරත්වා, පරමශාන්තියට පැමිණ චංචල වූද, නිශ්චලවූද, සත්වයන් ආරක්ෂා ලබත්වා,

1. "දිය ගෙනයන්නෝ කැමති තැන්වලට ගෙණයත්. හී වඩුවෝ ඍජුකොට ඊතල සාදා ගනිත්. වඩුවෝ කැමැති පරිදි දැව ඇද හැර සැස ගනිත්. එසේම පණ්ඩිතයෝ තමන් දමනය කර ගනිත්.

13. "සමහරු දඬුවලින්ද, දමනය කර ගනිත්. සමහරු අංකුසයෙන්ද (හෙණ්ඩුවෙන්) සමහරු කසයෙන්ද දමනය කරත්. මම වනාහි එබඳුවූ දඬු නැතිවද, ආයුධ නැතිවද දමනය වීමි.

14. "පළමුවෙන් මම හිංසකයකුවූයේම අහිංසක නාමය ලදිමි. අද සත්‍යවශයෙන්ම මම අහිංසක වූයෙමි. කිසිවෙකුට මම හිංසා නොකරමි.

15. "මම මීට පළමුව මිනිසුන් මරණ සොරෙකු වීමි. කාමෝඝයෙන් ගසාගිය මම බුදුන් සරණ ගියෙමි. මම ලේ පෙරෙන අංගුලිමාල නමින් විසුවෙමි. පසුව සරණාගමනයට පැමිණ භවය සුන්කළ හැටි බලව.

16. "එබඳුවූ අගතිගාමී බොහෝ අකුසල කර්ම කොට ප්‍රහීනකරන ලද කර්මවිපාක ඇත්තේ, කෙලෙස් ක්ෂය කරන ලද්දේ, සිවුපසය වළඳමි.

17. "දුශ්ප්‍රාඥවූ අඥාන පුද්ගලයෝ ප්‍රමාදයෙන් කල්ගත කරත්. ඥානවන්තයෝ අප්‍රමාදය ශ්‍රෙෂ්ඨ ධනයක් මෙන් රකිත්.

18. "ප්‍රමාදයෙහි නොයෙදෙව්. කාමරති සන්ථවයද, නොකරව්. අප්‍රමාදව ධ්‍යාන කරන පුද්ගලයෝ උතුම් සැපයට පැමිණෙත්.

19. "මගේ ඊම යහපත් ඊමක් විය. නොආයේ නම් නපුරුය. පැවිදිවෙමියි සිතීමද, යහපත් සිතීමෙකි. එය නොසිතුවේ නම්

නපුරෙකි. සාවද්‍ය අනවද්‍ය ධර්මයන් කෙරෙහි යම් නිර්වාණයක් ශ්‍රේෂ්ඨවේද, එයට පැමිණියෙමි.

20. "මගේ ඊර්ම යහපත් විය. නොඊර්ම නපුරුය. මගේ සිතීම යහපත්ය. නොසිතීම නපුරුය. ත්‍රිවිද්‍යාවද ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද, කෙළෙමි.

21. "කැලයෙහිද, රුක් මුල්හිද, පර්වතයන්හිද, ගුහාවන්හිද, යන යම් යම් තැනෙක සිටියේ නම් පළමුව දුකෙන් විසුවෙමි. දැන් වනාහි ඒ ස්ථානවල සැපසේ වෙසෙමි.

22. "සැපයේ සයනය කරමි. සැපසේ සිටිමි. සැපසේ දිවි පවත්වමි. මාරයාට ගොදුරු නොවී සිටිමි. ශාස්තෘන්වහන්සේගේ අනුකම්පාව නිසයි. අහෝ! ඒ ආශ්චර්යවත්ය.

23. "පෙර බ්‍රහ්මයා විසින් දෙන ලද උසස් කුලයක ඉපදීමි. ඒ මම අද ධර්මරාජන්වූද, සුගතවූද, ශාස්තෘන් වහන්සේගේ පුත්‍රයෙකු වෙමි.

24. "දුරු කරන ලද තෘෂ්ණාව ඇතිව කිසිවක් තෘෂ්ණා දෘෂ්ටි දෙකින් නොගෙන චක්ෂුරාදී ඉඳුරන් සංවරකොට දුක් මුල් නසා මා විසින් කෙලෙස් නැති කරන ලදී.

25. "මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදී. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි. ගරුභාරයද බහා තැබුවෙමි. භවයාගේ කෙළවරද නැති කෙළෙමි."

9. අනුරුද්ධ ථෙර ගාථාඃ- 1. "මවුපියන්ද, සහෝදර සහෝදරීන්ද, නෑ පිරිසද, හැර පඤ්චකාමයෙන් තොරව අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ධ්‍යාන කරයි.

2. "නෘත්‍ය ගීතාදියෙන් යුක්තව සුන්දර තාලශබ්දයෙන් ප්‍රබොධවනුයේ විසුවෙමි. මාරවිෂයෙහි ඇලුනේ එයින් ශුද්ධියක් නොවන බව දැන,

3. "එයද හැරදමා බුද්ධශාසනයෙහි ඇලුනේ සියලු සැඩ වතුර ඉක්මවා අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ධ්‍යාන කරයි.

4. "මනෝරම්‍යවූ රූපයෝද, ශබ්දයෝද, ගන්ධයෝද රසයෝද, ස්පර්ශයෝද යන මේ සියල්ලම හැරදමා අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ධ්‍යානකරයි.

5. "පිඬු සිඟීමෙන් නැවතුනේ තනිවූයේ තෘෂ්ණාව නැත්තේ ඥාණවන්තවූයේ පාංශුකූල චීවරයන් සොයනුයේ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ධ්‍යාන කරයි.

6. "සෙවීමෙන් පිළිකුල්කොට ගනුලබනුයේ එය ධොවනයකොට හා රජනයකොට (සෝදා පඬුපොවා) ඒ පාංශුකූල චීවරයම කැපකොට පොරවා අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ කෙලෙස් නැතිව වෙසෙයි.

7. "බොහෝ දෙයක් කැමතිවීමද, ස්වල්පදෙයකින් සතුටු නොවීමද, ගිහි පැවිද්දන් හා සංසර්ග වීමද උඩගුබවද, යන මේ කරුණු ලාමක කෙලෙසීම බවට හේතුවන ධර්මයෝය.

8. "යමෙක් සිහියෙන් යුක්තවේද, අල්පෙච්ඡ ගුණයෙන් යුක්තවේද, සන්තෝෂ ගුණයෙන් යුක්තවේද, සිත එකඟ ගුණයෙන් යුක්තවේද, විවේක ගුණයෙන් යුක්තවේද, පටන් ගන්නාලද වීර්ය ඇත්තේද,

9. "ඒ පුද්ගලයාට මේ කියන යහපත් බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද; හෙතෙම අනාශ්‍රවද වෙයි. මහර්ෂීවූ බුදුරජාණන් වහන්සේ මේ බව වදාළහ.

10. "මගේ චිත්ත සංකල්පනාවෝ දැන ලෝකයෙහි නිරුත්තරවූ ශාස්තෲන් වහන්සේ මනෝමය ඉර්ධියෙන් යුක්ත කයින් මා කරා පැමිණිසේක.

11. "යම්කලෙක මට චිත්ත සංකල්පනාවෝ වූවාහුද එයින් මත්තෙහි සම්පූර්ණ කිරීම් වශයෙන් උන්වහන්සේ දෙසූසේක. ප්‍රමාදකරවන ධර්මයන්හි නො ඇලුනාවූ බුදුන් වහන්සේ ප්‍රමාද නොවන ධර්මය දෙසූසේක.

12. "මම උන්වහන්සේගේ ධර්මය දැන ශාසනයෙහි ඇලී විසුවෙමි. ත්‍රිවිද්‍යාවද ලදිමි. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි.

13. "මම පස් පණස් හවුරුද්දක් නේසජ්ජිකාංගය විසුවෙමි. විසිපස් හවුරුද්දක් නිදි වර්ජිතව විසුවෙමි.

14. "චතුර්ථධ්‍යානයෙහි නැවති සිත් ඇත්තාවූද තාදී ගුණයෙන් යුක්තවූද, තෘෂ්ණාව නැත්තාවූද, පසැස්ඇත්තාවූ බුදුරජාණන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නැත්තාහුය උන්වහන්සේ නිවන් අරහයා පිරිනිවන් පෑසේක.

15. "කුසීත නොවූ සිතින් යුක්තව මරණාන්තික වේදනාව ඉවසූසේක. පහනක් නිවීගියාක්මෙන් සිත විමොක්ෂ භාවයට පත්විය.

16. "මුනීන්ද්‍රයන් වහන්සේගේ ස්පර්ශය පස්වෙනිකොට පවත්නාවූ රූපාදී ධර්මයෝ අවසන් වූවාහුය. පිරිනිවන් පෑ බුදුන් කෙරෙහි අන්‍ය ධර්මයෝද ඇතිනොවෙත්.

17. "යම්කිසි දේව නිකායක හටගැණීමක් හෝ නොවෙයි. ජාති සංසාරය ක්ෂය කරණලදහ. පුනර්භවයක් නැත්තේය.

18. යම් ක්ෂීණාශ්‍රව භික්ෂුවකට මොහොතකින් බඹලොව ඇතුළුව සියලු ලොකධාතුව දතහැක්කේද, එබඳු ඍද්ධිගුණ ඇත්තාවූද, චුති උත්පත්ති දෙක දක්නාවූද, ඒ භික්ෂුව දෙවියෝ දකිත්.

19. "මම පෙර කලෙක අන්නභාර නම් බැළමෙහෙකොට ජීවත්වූ දිළින්දෙක් වීමි. එකල්හි කීර්තිමත් උපරිට්ඨ නම් පසේබුදුවරයන් වහන්සේට දානයක් දුන්නෙමි.

20. "ඒ කුශලයෙන් මම ශාක්‍යකුලයෙහි උපන්නේ නෘත්‍ය ගීතාදියෙන් යුක්තවූයේ යහපත් තාල ශබ්දයෙන් ප්‍රබෝධවනුයේ අනුරුද්ධ නම් විය.

21. "ඒ මම ශාස්තෘවූ පහවූ භය ඇති සම්බුදුන් වහන්සේ දුටුවෙමි. උන්වහන්සේ කෙරෙහි සිත පහදවා අනගාරික නම්වූ ප්‍රව්‍රජ්‍යාවට පැමිණියෙමි.

22. "මම පළමුව යම් තැනක විසුයේද, පෙර පසු තැන් දන්නා නුවණින් ඒ ස්ථාන දනිමි. තව්තිසා දෙව්ලොවද, ශක්‍ර ජාතියෙහිද සිටියෙමි.

23. "ජම්බුද්වීපයට ප්‍රධානවූ මේ සතරමහා දිවයින් ජය ගත්තේ සියලු මනුෂ්‍යයන්ට ප්‍රධානවූයේ සත්වරක් සක්විති රජකම් කෙළෙමි. ඒ කාලයෙහි දඬුවලින් හා ආයුධවලින් තොරව ධර්මයෙන් අනුශාසනා කෙළෙමි.

24. "මේ මිනිස්ලොවින් චුතව දෙව්ලොවට අධිපතිභාවය සත්වරක්ද ඒ දෙව්ලොවින් චුතව මනුෂ්‍යලෝකයෙහි සක්විති රජ බව සත්වරක්ද, යන භවාන්තර දහසතරක් සැරිසැරුවෙමි.

25. "දිව්‍යලෝකයේ සිටියේම පෙරකඳ පිළිවෙළ දන්නා නුවණ ලදිමි. පසඟින් යුත් සමාධියද, ශාන්තභාවයද එකඟකමද, කෙලෙස් සිඳදැමීමද කොට දිව්‍යචක්ෂුර්භිඥානය පිරිසිදු කෙළෙමි.

26. "මනුෂ්‍යයින්ගේ ආගිය තැන්ද, අවශෙෂ තිරිසන් ගත සත්වයින්ගේත් ඉපදීමට පෙර සිටිතැන්ද, පඤ්චාංගික ධ්‍යානයේ සිටියේ චුතිඋත්පත්ති දෙක දන්නා ඥාන බලයෙන් දනිමි.

27. "මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරුකරනලදී. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි. ගරුභාරයද බහාතැබුවෙමි. භවයාගේ කෙළවරට පැමිණියෙමි.

28. "මම අව්‍යාන මොහොතෙහිදී වජ්ජීන්ගේ වෙළුව නම් ගමෙහි උණපඳුරක් යට ආශ්‍රව රහිතව පිරිනිවන්පාමි."

10. පාරාපරිය ථෙර ගාථාː- 1. "පුරුෂොත්තමවූද ලෝකනාථවූද, බුදුන්වහන්සේ ජීවමානව වැඩසිටින කල්හි භික්ෂූන්ගේ ඉරියව් පැවැත්ම අන්පරිද්දෙකින් විය. දැන් වනාහි ඊට වඩා වෙනස් ආකාරයකින් පෙණේ.

2. "ඒ අවස්ථාවෙහිද සීත සුළඟින් ආරක්ෂාවීම පිණිසත් ලජ්ජා ස්ථාන වැසීම පිණිසත් සිවුරු පරිභොග කෙළෙමි. ප්‍රත්‍ය සන්තොෂයෙන් යුක්තවද වැළඳුවෙමි.

3. "ප්‍රණීතවූ හෝ අප්‍රණීතවූ හෝ ස්වල්පවූ හෝ බොහෝවූ හෝ ප්‍රත්‍යලැබීමෙහිදී ගිජුබැව් නොකොට එහි නොඇලී යැපෙන පමණක් ගෙණ වැළඳුවෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "දිවි පැවැත්මට හේතුවන බෙහෙත් පිරිකර ආදියෙහිද දැඩිඋනන්දුවක් නොදැක්වූවාහුය. ආශ්‍රව ධර්මයන් ක්ෂය කිරීමෙහිම උත්සාහවන්තවිය.

5. "කැලෑවද, රුක්මුල්හිද, කඳුවලද, ගුහාවලද විවේකයෙන් යුක්තව භාවනා කරනුයේ විවේකයම උතුම් කොට සැලකුවාහුය.

6. "යටහත් පැවතුම් ඇත්තේ, ශ්‍රද්ධා ඇත්තේ, පහසු පෝෂණයෙන් යුක්තවූයේ මෘදු බැව් ඇත්තේ, තද නොවූ සිත් ඇත්තේ සිහියෙන් යුක්තවූයේ මුබර නොවූයේ යහපත කැමැති සිත් ඇත්තේ එහිම ඇලී විසීය.

7. "එහෙයින් ප්‍රසාදබවට පැමිණියේ කාය වාග්ප්‍රයෝග යොදා ප්‍රත්‍ය පරිභෝගයෝද ගෝචරාකාරයෙන් පැවතුනේ විය. ඉරියාපථයවනාහි සිනිඳු තෙල් ධාරාවක් ගලන්නාක් මෙන් විය.

8. "මහත්වූ ධ්‍යාන ඇත්තේද, මහත්වූ සිතින් යුක්ත වූයේද සියලු ආශ්‍රව ධර්මයන් ප්‍රහීණ කරනලද්දේ පිරිනිවන් පෑවාහුය. දැන් වනාහි එබඳු ගුණ ඇති ස්ථවිරයන්වහන්සේලා ස්වල්පයහ.

9. "කුශල ධර්මයන්ගේ හා ප්‍රඥාවගේ පිරිහීමෙන් සියලු ආකාරයන් ගෙන් උතුම්වූ සර්වඥශාසනය වැනසෙයි.

10. "පාප ධර්මයන්ගෙන් හා ක්ලේශයන්ගෙන් යුක්ත වූ කාලය පැමිණියාහුය. එබැවින් විවේකය දියුණුකොට ධාර්මික ප්‍රතිපත්තිය සිද්ධකර ගැනීමට නොහැකිවිය.

11. "කෙලෙස්වලින් වැඩෙන්නාවූ අන්ධ බාල ජනයන් අනුව හැසිරෙත්. උමතු රාක්ෂසයන්ගේ ක්‍රීඩා පරවශව බාලයන් මෙන් හැසිරෙත්.

12. "ක්ලේශයන්ගෙන් මඩනාලද සිත් ඇතිව ඒ ඒ තැන්හි දුවනුලබන්නාවූ ක්ලේශ වස්තුන්හිම ඇලී රන් රුවන් විසුරුවාගනුවයි කී කල්හි කැමැති කැමැති හැටියට ගනුලබන්නාක් මෙන් විය.

13. "සද්ධර්මය බැහැරකොට දෘෂ්ටීන්ට බැසගන්නා ලදුව මෙයම ශ්‍රේෂ්ඨයයි ඔවුනොවුන් කලහ කරත්. පුත්‍රයෝද ධනයද

භාර්යාවද හැරදමා එයින් නික්මී බත් සැන්දක් පමණකට නොකටයුතු කරත්.

14. "බඩ පිරෙනතුරු කා උඩුකුරුව හොවිත්. නැගිටීමෙන් පසුව බුදුන් විසින් ගරහනලද තිරිසන් කථාවන් කථා කරත්.

15. "කුඩා තල් අතු ආදී හස්ත ශිල්පයෝද සකස්කොට කිරීමෙන් නොහික්මී නොසන්සුන් සිත් ඇතිව ශ්‍රමණභාවය ඉක්මවත්.

16. "මැටි තෙල් සුණු යනාදියද, දිය භෝජන ආසන යනාදියද, වැඩියක් කැමැතිබැව් ඇතිව ගිහීන්ට දෙත්.

17. "දැහැටි දඬුද, දිවුල්ද, මල්ද, පිණ්ඩපාතයෙන් ලැබුණු කැවිලිද අඹ නෙල්ලි යනාදි ගෙඩිද වැඩිදෙයක් කැමැතිව ගිහියන්ට දෙත්.

18. "වෙදුන් මෙන් බෙහෙත් කිරීමෙහි යෙදෙයි. ගිහියන්ගේ ලොකු කුඩා කටයුතුවලදී ගිහියන්මෙන් කටයුතු කරයි. ශරීරය සැරසීමෙහි වෙසෙඟනන් මෙන් කටයුතු කරයි. ඓශ්වර්යයෙහි ක්ෂත්‍රියයන් මෙන් වැඩකරත්.

19. "රන් නොරන් ආදී වශයෙන් පෙන්වා කරණ විජ්ජාවලින්ද කූටමානාදී වශයෙන් කරන වංචනික ක්‍රියාවන්ගෙන්ද යන බොහෝ වැරදි ජීවිකාවන්ගෙන් ආමිෂ පරිභොගය කරයි.

20. "කැප යෙදීම්වල නොයෙදී අකැප වශයෙන් දිවි පවත්වන්නාහු බොහෝ ධනයද රැස්කරත්.

21. "ධර්මයෙන් තොරව නොමගින් පිරිසට සංග්‍රහකරත්. ධර්මය දෙශනා කරන්නේද, යහපත පිණිස නොව ලාභය පිණිසමයි.

22. "සංඝ ගතියෙන් බාහිරවූවාහු සංඝ ලාභයට කෝලාහල කරත්. අනුන්ගේ ලාභයෙන් ජීවත්වන්නාහු විලිබිය දෙකින් තොරව වාසය කරත්.

23. "ශ්‍රමණ ධර්මයන්හි නොයෙදී හිස මුඩුකොට සිවුරු දරා ලාභ සත්කාරයෙහි මුසපත්ව ගරු සැලකිල්ල ඉවසීමෙහි කැමැති වෙත්.

24. "නොලැබූ ධ්‍යාන විදර්ශනා ලැබීමට කිරීම හෝ රැකීමට නොහැකිව නොයෙක් බාහිර දෙය කරත්.

25. "පාවහන් නොමැතිව කටුස්ථානවල හැසිරෙන්නාක් මෙන් සිහියෙන් යුක්තව ඤාණවන්තයෝ ගමෙහි හැසිරෙන්නාහ.

26. "පූර්වයෝගීන් සිහිකරමින් ධර්මයට අනුව පිළිපදිමින් විදර්ශනා උපදවා නිවන් ලබාගත යුතුය.

27. "මඩනාලද ඉඳුරන් ඇති ඒ ශ්‍රමණයන් වහන්සේ මෙසේ කියා පිරිනිවන් පෑසේක. ඒ බ්‍රාහ්මණයා නැවත ඉපදීම ක්ෂයකරණලදී."

---

# තිංස නිපාතය

1. ඵුස්ස ථෙර ගාථා:- 1. "අනාගත කාලයෙහි ක්‍රොධකරන්නාවූද බද්ධ වෛරයෙන් යුක්තවූනාවූද ගුණමකු බැව් ඇත්තාවූද තද බැව් ඇත්තාවූද කෛරාටික ගති ඇත්තාවූද ඊර්ෂ්‍යා කරන්නාවූද කළහකාරීවූද බොහෝ අය ඇතිවන්නාහ.

2. "ධර්මය නොදැනම මාන්නයෙන් යුක්තව අගෝචරයෙහි වෙසෙමින් චපලගති ඇතිව ගෞරව නැතිව වෙසෙත්.

3. "අනාගතයෙහි නොයෙක් දෝෂයෝ සත්වලෝකයෙහි ඇතිවන්නාහ. මනාකොට දේශනා කරනලද සද්ධර්මය මෝඩයෝ කෙලෙසත්.

4. "ගුණයෙන් හීන පුද්ගලයෝද සංඝයා මැද විනිශ්චය කරන අවස්ථාවෙහිදී නිර්භයව බලවන්තව රළුවචන ඇත්තෝව ඒ අසා ධර්මය අධර්මය කොට පෙන්වත්.

5. "ගුණ ඇත්තෝද සංඝයා මැද අර්ථානුකූලව පෙන්වනු ලබන කල්හි දුර්වලයෝව සිටිත්. ලජ්ජා ඇත්තෝව තුෂ්ණිම්භූත වෙත්.

6. "අනාගත කාලයෙහි රන්රිදීද, කෙත්වතුද, එළු බැටළු ආදී සතුන්ද, දැසිදසුන්ද, මෝඩ පුද්ගලයෝ පිළිගනිත්.

7. "අනුන් වෙහෙසනු කැමැත්තාවූ අඥානයෝ සිල් ගුණයක් නැතිව ඔසවනලද මාන්නයෙන් යුක්තව කලහ කරනු කැමැති මෘගයන් මෙන් හැසිරෙත්.

8. "උඩගු ගතියෙන් යුක්තව අකැපවූ සිවුරු පොරවා කුහක ගතිවලින්ද, තද ගතියෙන්ද, කුහක වචනවලින්ද අන් හා සමාන ප්‍රකට ක්ලේශයන්ගෙන් යුක්තව හැසිරෙන්නාහුය.

9. "තෙලින් තෙමූ කෙසින් යුක්තව චපලගති ඇතිව අඳුන්වලින් අලංකාර කළ ඇස් ඇතිව ලා රතින් යුක්තව සිවුරු පොරවා රථවල නැගී හැසිරෙත්.

10. "ආර්යයන් විසින් පිළිකුල් නොකරනලද අර්හත් ධජය සුදට හුරු සිවුර නිසා පිළිකුල් කරත්.

11. "කුසීතවූද, හරණලද වීර්ය ඇත්තාවූද, ඔවුන් ලාභයටම කැමති වෙත්. ඔවුන් වනයෙහි විසීමට අකැමැතිව ගම් සෙනසුන්වලම වෙසෙත්.

12. "යම් කලෙක මිච්ඡා ජීවිතයෙහිම ඇලී යම් යම් ලාභ ලබත්ද, ඒ ඒ පුද්ගලයින්ට අනුවම අසංවරව හැසිරෙත්.

13. "යම් යම් ලාභ නොලැබීමෙන් අලාභවලින් යුක්තවූ පූජ්‍ය ගුණ ඇති අය අනාගතයෙහි ඇති නොවෙත්. ධෛර්ය සම්පන්න ප්‍රිය දැකුම් ඇති භික්ෂූහුද, ඒ කාලයෙහි ලාභ කැමතිවම වෙසෙත්.

14. "කාලයට සුදුසු පඬු පෙවීමෙන් යුක්තවූ ස්වකීය රතු සිවුරට ගරහා තීර්ථකයින්ගේ සුදු සිව්ර දරාගනිත්. අනාගතයෙහි ගිහියෝද කසාවතට අගෞරව කරත්. භික්ෂූහුද ප්‍රත්‍යවෙක්ෂාවෙන් තොරව කසාවත් දරාගනිත්.

15. "භීයෙන් විදුනාලදුව දුකෙන් පෙළෙමින් ශරීර පීඩාවට පත් මහා ඡද්දන්ත හස්තිරාජයාද මහා සොරවූයේ නමුදු,

16. "අර්හත් ධජය දැක ඒ ඡද්දන්තහස්තියා විසින් අර්ථයෙන් යුක්ත මේ ගාථාවන් එකෙනෙහිම ප්‍රකාශ කරනලදී.

17. "යමෙක් ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් ශක්තියෙන් තොරව කසාවත් දරත්ද හෙතෙම කසාවතට නොහොබී.

18. "යමෙක් වනාහි කෙලෙස් කසට දුරුකොට සීලයෙන් යුක්තවූයේ ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් ශක්තියෙන් යුක්තවූයේවේද හෙතෙම කසාවතට සුදුසුය.

19. "සිල් බිඳුනාවූද, නුවණමදවූද, ප්‍රකට ඉඳුරන් ඇත්තාවූද, කැමති කැමති පරිදි හැසිරෙන්නාවූද, රූපාදී විෂයයන්හි විසුරුණාවූ සිත් ඇත්තාවූද, හිරිඔතප් නැත්තාවූද ඒ පුද්ගලයා කසාවතට නොහොබී.

20. "යමෙක් සීලයෙන් යුක්තද, රාගය දුරුකළේද, එකඟවූ සිත් ඇත්තේද පිරිසිදුවූ කල්පනා ඇත්තේද ඔහු කසාවතට සුදුසුය.

21. "යමෙකුන්ට සීලයක් නැත්තේද, උඩඟුවූද, මාන්නය ඇත්තාවූද, අඥානවූද, ඒ පුද්ගලයින්ට කසාවතින් කවර ප්‍රයෝජනයක්ද?

22. "දූෂිත සිත් ඇත්තාවූද, ආදර නැත්තාවූද භික්ෂූහුද, භික්ෂුණියෝද අනාගතයෙහි මෛත්‍රී සිත් ඇති යහපත් අයට නිග්‍රහ කරත්.

23. "මහතෙරුන් විසින් සිවුරු පෙරවීම් ආදී ලොකු කුඩා කටයුතුවල හික්මවන්නාහුද අඥානවූ ප්‍රකට ඉඳුරන් ඇති තමා කැමැතිදේම කරන්නාවූ මෝඩවූ ඒ පුද්ගලයෝ ඒ උතුම් අවවාද නොඅසත්.

24. "ආචාර්ය උපාධ්‍යායයන් විසින් හික්මවනු ලබන්නා වූ ඒ අඥාන පුද්ගලයෝ ඔවුනොවුන් කෙරෙහි ආදර නැතිව දුෂ්ට අසුන් මෙන් හැසිරෙත්.

25. "අනාගතයෙහි ඇතිවන භික්ෂු භික්ෂුණීන්ගේ ප්‍රතිපත්තිය එබඳුවන්නේය පසුකාලයක ඇතිවන වෙනස අමුතු ආකාරයකින් ඇතිවන්නේය.

26. "ඒ අනාගතයෙහි ඇතිවන මහාභයට පළමුව තොප විසින් සුවචව ඔවුනොවුන් කෙරෙහි ගෞරව ඇත්තෝව වාසය කරව්.

27. "මෛත්‍රී සිත් ඇත්තෝව, කාරුණිකයෝව සීල සංවරයෙන් යුක්තව වීර්‍ය ඇතිව නිවන් සොයන්නෝව සියලු කල්හි ස්ථිර වීර්‍යයෙන් යුක්තව වසව්.

28. "ප්‍රමාදය භය වශයෙන්ද අප්‍රමාදය ක්ෂෙම වශයෙන්ද දැන ආර්‍ය අෂ්ටාංගික මාර්ගය වඩව්. එසේ කල්හි නිර්වාණය ස්පර්ශ කරන්නාහුය."

**2. සාරිපුත්ත ථෙර ගාථා:-** 1. "සීල සම්පන්නවූද, ශාන්තවූද සිහියෙන් යුක්තවූද භවයෙන් නික්මීමේ කල්පනා ඇතිව ධ්‍යාන කරන්නාවූද අප්‍රමාද විහරණයෙන් යුක්තවූද, කර්ම ස්ථානභාවනාවෙහි ඇලුනාවූද, එකඟවූ සිත් ඇත්තාවූද විවේකය වඩන්නාවූද ප්‍රත්‍යයාදී සන්තොෂයෙන් යුක්තවූද, යම් පුද්ගලයෙක් වේ නම් ඔහු භික්ෂුයයි කියනු ලැබේ.

2. "සිනිඳුවූද, රළුවූද අහර බුදිනු ලබන්නේ බොහෝ කොට නුබුදීද ස්වල්පවූ ආහාරයෙන් නොපිරුණු බඩ ඇතිව සිහියෙන් යුක්තව වාසය කරන්නේය.

3. "සතර පස් පිඩකට ඉඩ තබා පැන්බොන්නේවේද, නිවනට මෙහෙයවූ සිත් ඇති භික්ෂුවගේ එය සැප විහරණය පිණිස වෙයි.

4. "සීතාදියෙන් වළකාසිටීමාදී ප්‍රයෝජන සලකා සැප සිවුරෙන් ශරීරය වසාද නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති භික්ෂුවගේ එය සැප විහරණය පිණිස වෙයි.

5. "එරමිණියා ගොතාහුන්නහුට වැස්සෙන් දෙදණ නොතෙමීසිටිය හැකිවේද, නිවන් පිණිස මෙහෙයවූ සිත් ඇති භික්ෂුවගේ එය සැප විහරණය පිණිස වෙයි.

6. "යමෙක් සුඛවේදනාව වෙනස්වන දුක් ඇති දෙයකැයි දකීද, දුක්වේදනා වනාහි හුල් වශයෙන් දකීද, මධ්‍යස්ථ වේදනාවෙහි මමය මාගේයයි යන හැඟිරීමක් නැත්තේද, ලෝකයෙහි කිසිවක් නැති පුද්ගලයා ඔහු වන්නේය.

7. "යමෙක් පාපිච්ඡවේද, කුසීතවේද, වීර්‍ය අඩුකෙනෙක් වේද, අල්පශෘතයෙක්වේද, අනාදරයෙක්වේද, එබඳුවූ ලාමක පුද්ගලයා කිසිකලෙකත් මා කෙරෙහි නොවේවා.

8. "බහුශ්‍රැතවේද, ප්‍රඥාව ඇත්තාවූද, සීලයෙහි පිහිටියාවූද, සිත තැන්පත් කළාවූද පුද්ගලතෙම මාගේ මස්තකයෙහි සිටීවා.

9. "තෘෂ්ණාදී ප්‍රපංච ධර්මයන්ගෙන් යුක්තවූද ඒ ප්‍රපංච ධර්ම විෂයෙහිම ඇලුනාවූද, යම් පුද්ගලයෙක් මෘගයෙක් හා සමානවේද, ඒ පුද්ගලයා නිරුත්තරවූ යොගක්ෂෙම නම්වූ නිවණ නොලබයි.

10. "යම් පුද්ගලයෙක් තෘෂ්ණා ප්‍රමාද හැර පමා බවක් නැති නිවනෙහි ඇලුනේද ඒ පුද්ගලයා නිරුත්තරවූ යොගක්ෂෙම නම්වූ නිවන ලබයි.

11. "ගමෙහි හෝ අරණ්‍යයෙහි හෝ පහත් ස්ථානයෙහි ගොඩ තැන යන යම් ස්ථානයක රහතුන් වෙසෙත් නම් ඒ ස්ථානය රමණීය ස්ථානයක්වේ.

12. "යම් තැනක රමණීය වනයෝ වෙත්ද, ජනයා නොඇලෙන ඒ වනාන්තරවල වීතරාගී උතුමෝ ඇලෙත්. කාමය සොයන පුද්ගලයෝ නොඇලෙත්.

13. "යම් පුද්ගලයෙක් වරද දක්වන්නේ නම් ඔහු නිධාන් දක්වන්නෙක් වැනිය. නිග්‍රහ මුඛයෙන් කියන්නාට ප්‍රඥාව ඇති එබඳුවූ පණ්ඩිතයෝ භජනය කළයුතුය. එබන්දන් සේවනය කරන්නහුට ශ්‍රෙෂ්ඨ භාවය ඇතිවෙයි. ලාමක බවක් ඇති නොවෙයි.

14. "එම නිසා අවවාද කළයුතුයි. අනුශාසනා කළ යුතුයි. අසභ්‍ය භාවයෙන්ද වැළකිය යුතයි. එබඳු පුද්ගලයෝ සත්පුරුෂයන්ට ප්‍රියයි. අසත්පුරුෂයන්ට අප්‍රියයි.

15. "පසැස් ඇති බුදුරජාණන් වහන්සේ අනිකෙකුට යම් ධර්මයක් දේශනා කෙළේද ඒ ධර්මය දේශනා කරන කල්හි කන් නමා සිටියෙමි.

16. "මගේ ඒ ඇසීම් හිස්නොවූයේය. ආශ්‍රව රහිතව කෙලෙසුන්ගෙන් මිදුනෙමි. මගේ සිත පෙරවිසූ පිළිවෙල දැනීම පිළිබඳ නොවේ. දිවැස් ලැබීම පිණිසද නොවේ.

17. "මාගේ ප්‍රාර්ථනාව වනාහි චුති උත්පත්ති දැනීමේ ඍද්ධිය පිළිබඳව හෝ දිව්‍යවූ කන් ලැබීම පිණිස හෝ නොවේ.

18. "හිස මුඩුකරන ලද්දේ සඟල සිවුර දැරුවේ රුක් මුල් ඇසුරුකොට ප්‍රඥාවෙන් උත්තම බවට පැමිණියේ උප තිස්සත්ථෙර නමින් ධ්‍යාන කරන්නෙහිය.

19. "සම්බුද්ධ ශ්‍රාවකවූ මම එකෙණෙහිම චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැදී ආර්ය තුෂ්ණිම් භාවයෙන් යුක්තව සිටියෙමි.

20. "යම්සේ පර්වතය යහපත්ව පිහිටියේ නොසෙල්වේද එසේම මෝහය දුරුකළ භික්ෂුවද පර්වතයක් මෙන් නොසෙල්වෙයි.

21. "පිරිසිදුකම කැමැති කෙලෙස් රහිත පුද්ගලයාට ස්වල්පමාත්‍ර පාපයද මහත්කොට වැටහෙයි.

22. "ජීවිතයද කැමති නොවෙමි. මරණයද කැමති නොවෙමි. සිහියෙන් හා ප්‍රඥාවෙන් යුක්තව මේ ශරීරය බහා තබමි.

23. "මරණයටද කැමති නොවෙමි. ජීවිතයට කැමැති නොවෙමි. නිලයෙන් පහ කළ භටයෙක් මෙන් කාලය අපේක්ෂා කරමි.

24. "පෙරවරු පස්වරු යනාදී උභය කාලයන් අතර මරණය සිදුවේමය. නොමැරීමක් නම් නැත. එම නිසා ප්‍රතිපත්තිය පුරව. අපා දුකෙන් විනාශ නොවෙව. ක්ෂණ සම්පත්තිය නොයික්මවව.

**25.** "ඇතුළත හා පිටත ආරක්ෂාකරන ප්‍රත්‍යන්ත නගරයක් මෙන් ආත්ම භාවය ආරක්ෂා කරව. ක්ෂණ සම්පත්තිය පැහැර නොහරිව්. ඒ පැහැර හැරියේ නම් නිරයේ දුකට පත්වෙයි.

**26.** "ශාන්ත ගුණයෙන් යුක්තවූද එහිම ඇලුනාවූද ස්වල්ප බස් ඇත්තාවූද උඩඟු නොවූවාවූද පුද්ගලයා සුළඟින් ගසක කොළ හෙළන්නාක් මෙන් පාප ධර්මයන් බැහැර කරයි.

**27.** (මෙය 26 ඡේදය මෙනි. "බැහැර කරයි." යන්න වෙනුවට "අළුත පහකළේය" යනු යොදාගත යුතුයි.)

**28.** "ශාන්ත ගුණයෙන් යුක්තවූයේ ක්ලේශ දුක් නැත්තේ පිරිසිදුවූයේ නොකැළඹුනේ යහපත් සිල් ඇත්තේ ප්‍රඥාවෙන් යුක්තවූවෙක්වේද හෙතෙම දුක් නැතිකරයි.

**29.** "අගාරියවූද අනගාරියවූද එකද පෘථග්ජනයෙකු කෙරෙහිවත් විශ්වාසය නොකටයුතුය. මක්නිසාදයත් යහපත් තැනැත්තෙක්ව අයහපත් තැනැත්තෙක්ද වෙයි. අයහපත් වූවෙක්ව යහපත්වූවෙක්ද වෙයි.

**30.** "කාමාශාවද ක්‍රොධයද ථිනමිද්ධයද නොසන්සුන් බවද සැකයද යන මේ පස භික්ෂුවගේ සිත කෙලෙසයි.

**31.** "යමෙක්හට සත්කාරයෙහිද අසත්කාරයෙහිද සිත වෙනස් නොවේ. තම අප්‍රමාදී විහරණයෙන් යුක්තවූ

**32.** "ඒ පුද්ගලයා නිතර ධ්‍යාන කරන්නේවේද විදර්ශනා වැඩීමෙන් උපාදානයන් ක්ෂය කිරීමේ ඇලුනාවූ ඔහු සත්පුරුෂයෙක් නොවේ.

**33.** "උත්තම මිදීමෙන් යුක්තවූ බුදුන් හා මහා සමුද්‍රයද පෘථිවියද පර්වතයෝද ආකාශයද සමකළ හැකිය.

**34.** "ශාස්තෘන් විසින් දෙසනලද ධර්මයට අනුව ඒ ධර්මය පවත්වන්නාවූ මහා ඥාණයක් ඇති එකගවූ සිත් ඇති උන්වහන්සේ ඉෂ්ටානිෂ්ටාදි අරමුණු විෂයෙහි නොඇලෙයි. දූෂ්‍යද නොවෙයි.

**35.** "ශ්‍රාවක ඥානයෙහි පරතෙරට පත්වුනාවූද මහා බුද්ධියක් ඇත්තාවූද, මහා ප්‍රඥාවක් ඇත්තාවූද උන්වහන්සේ ගොළු නොවූයේ ගොළුවෙක් මෙන් අඟවන තැනැත්තෙක්ව වෙසෙයි.

**36.** "මා විසින් ශාස්තෲන් ඇසුරු කරන ලදී. බුදුන්ගේ අනුශාසනාවට අනුව කටයුතු කෙළෙමි. ගරු භාරය බහා තැබීමි. දැන් මට පුනර්භවයක් නැත්තේය.

**37.** "අප්‍රමාදයෙන් සම්පාදනය කරව්. මේ මාගේ අනුශාසනාව වන්නේය. මම සියල්ලෙන් මිදුනෙකුව පරිනිර්වාණය කරන්නෙමි."

**3. ආනන්ද ථෙර ගාථා:-** 1. "පිසුණු බස් කීමෙන්ද කිපෙන ගතියෙන්ද මසුරු කමින්ද විනාශය කැමතිවීමෙන්ද යුක්තවූ පුද්ගලයන් සමග සංසර්ග නොකටයුතුය. පණ්ඩිතයා ලාමකයන් සමග නොවෙයි.

**2.** "අදහන්නාවූද සීලයෙන් යුක්තවූද ප්‍රඥාව ඇත්තාවූද බහුශ්‍රැතවූද පුද්ගලයින් හා සහාය භාවය ඇතිකර ගතයුතුය. යහපත් ගුණ ඇත්තේ සත්පුරුෂයන් සමග එක්වෙත්.

3-9 (මේ ඡේද 20 නිපාතයේ 4 රට්ඨපාල ථෙර ගාථාවල 3-9 ඡේද මෙනි.)

**10.** "බහුශ්‍රැතයෙක්වද විසිතුරු කථිකයෙක්වද බුදුන්ට උපස්ථාන කරන්නෙක්වද සියලු යෝගයන්ගෙන් වෙන්ව බහා තබන ලද බර ඇත්තේ සයනය කරන්නෙමි.

**11.** "නැති කරන ලද ආශ්‍රව ඇත්තේ රාගාදී ඇලීම් ඉක්මවන ලද්දේ ක්ලේශ පරිඩාහයන් දුරුකරන ලද්දේ සිහිල්වූයේ ජාති මරණ ඉක්මවන ලද්දේ අන්තිම ශරීරය දරමි.

**12.** "සූර්යවංශයෙහි උපන් බුදුන්ගේ යම්බඳුවූ ධර්මයක පිහිටියේද ඒ නිර්වාණ ධර්මයෙහි මම පිහිටා සිටිමි.

**13.** "දෙ අසූදාහක් අධිකකොට ඇති සූ අසූ දහසක් ධර්මයෝ බුදුන්ගෙන් මම දැනගතිමි. ඒ ධර්මයෝ මා ලග පවතින්නාහ.

**14.** "අල්පශ්‍රැත පුද්ගලයා ගවයෙකු මෙන් ජීවත්වෙයි. ඔහුගේ ශරීරය මස් වලින් වැඩෙයි. ප්‍රඥාවෙන් නොවැඩෙයි.

15. "යම් බහුශ්‍රැත පුද්ගලයෙක් අල්පශ්‍රැත පුද්ගලයෙකු අවමන් කොට සිතයිද හෙතෙම පහනක් දරන්නාවූ අන්ධයෙක් මෙන් වැටහෙයි.

16. "බහුශ්‍රැත පුද්ගලයෝ සෙවිය යුතුය. ශ්‍රැතවත්භාවය නොනැසිය යුතුය. ඒ බ්‍රහ්මචර්යාවට මුලවන්නේය. එහෙයින් ධර්මධරයෙක්ම විය යුතුය.

17. "පෙර අපර අර්ථ දන්නාවූ නිරුක්ති පදයන්හි දක්ෂවූ පුද්ගලයා ධර්මය මනාකොට ගණියි. අර්ථද විමංසනය කරයි.

18. "විදර්ශනාවෙහි හටගත් ඡන්දය ඇත්තේ උත්සාහයෙන් ත්‍රි ලක්ෂණයට ආරොපණයකොට තීරණය කරයි. එසේ බලන්නාවූ හෙතෙම සිත එකඟ කෙලෙස් දුරුකරයි.

19. "බහුශ්‍රැතවූද සප්‍රාඥවූද බුද්ධශ්‍රාවකයන් සෙවිය යුතුය. එබඳුවූ උතුමන් සෙවීමෙන් මනාකොට ධර්මය දත හැකිය.

20. "බහුශ්‍රැතවූද ධර්ම ගබඩාව ධර්ම කොෂය ආරක්ෂා කරන්නාවූද පුද්ගලයා ලොවට ඇසක් බඳුය. බහුශ්‍රැතයන් විසින් පුදනලද්දෙක්ද වේ.

21. "ධර්මය අරමුණකොට ඇත්තාවූද ධර්මයෙහි ඇලුනාවූද ධර්මයට අනුව සිතන්නාවූද ධර්මය සිහිකරන්නාවූද භික්ෂුව සද්ධර්මයෙන් නොපිරිහෙයි.

22. "කාය මමත්වයෙහි ඇලී කිසිවක් නොකරන තැනැත්තා පිරිහෙනුයේ උට්ඨාන වීර්යයෙන් තොරව ශරීර සැපයෙහිම ඇලී වෙසේ නම් ඔහුට ශ්‍රමණ සැපය කොයින්ද?

23. "සියලු දිශාවන් නොපෙනෙන්නාක් මෙන් ධර්මය නොපෙනේද කල්‍යාණ මිත්‍රයා ගිය කල්හි අන්ධකාරයක් මෙන් වැටහෙයි.

24. "කල්‍යාණ මිත්‍රයන් නැත්තාවූද බුදුන් පිරිනිවියාවූද කල්හි කායගතා සති භාවනාව හා සමවූ කල්‍යාණ මිත්‍රයෙක් නැත්තේය.

25. "පුරාණ මිතුරන් නැත්තේ මගේ සිත එකඟ නොවනුයේ කැදැල්ලට පැමිණි පක්ෂියෙකු මෙන් හුදකලාව සිතිවිලි සිතයි.

26. "මගේ දැකීම නැතිකල්හි නොයෙක් දිශාවලින් පැමිණෙන්නෝ නොවලක්වව. අසනු කැමැත්තන්ට මගේ ධර්මය පෙන්නුම් කරත්වා.

27. "දකින්ට නැතිකල්හි නොයෙක් රාජ්‍යවලින් පැමිණි බොහෝ දෙනාට අවකාශ ඇති කරවා ශාස්තෘන් වහන්සේ ඔවුන් නොවළක්වයි.

28. "පස්විසි හවුරුද්දක් හික්මෙන භූමියෙහි සිටි මට කාමසංඥාවෝ ඇති නොවීය. ධර්මයාගේ යහපත් බව බලව.

29. "පස්විසි හවුරුද්දක් හික්මෙන භූමියෙහි සිටි මට ද්වෙෂ සහගත හැඟීම් ඇති නොවීය. ධර්මයාගේ යහපත් බව බලව.

30. "පස්විසි හවුරුද්දක් අනුව පවතින ඡායාවක් මෙන් මෛත්‍රී කායකර්මයෙන් යුක්තව භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කෙළෙමි.

31. "පස්විසි හවුරුද්දක් අනුව පවතින ඡායාව මෙන් මෛත්‍රී වාක් කර්මයෙන් යුක්තව භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කෙළෙමි.

32. "පස්විසි හවුරුද්දක් අනුව යන ඡායාවමෙන් මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් යුක්තව භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කෙළෙමි.

33. "බුදුන් වඩින්නාවූ මග මමද පසුපසින් ගියෙමි. උන්වහන්සේ දහම් දෙසන කල්හි මට ඥාණය පහළවිය.

34. "මම කටයුතු ඇත්තෙක්වීමි. නොලත් රහත් බැව් ඇත්තේද වීමි. ශාස්තෘන් වහන්සේගේ පරිනිර්වාණයද එළඹිය ඒ අවස්ථාවෙහිද මට බුදුහු අනුකම්පා කළසේක.

35. "බුදුන් පිරිනිවිකල්හි බියජනකවූ රෝමෝද්ගමනය ඇතිකරන්නාවූ පෘථිවි කම්පාදිය සිදුවිය.

36. "මහර්ෂීවූ බුදුන්වහන්සේගේ ධර්මභාණ්ඩාගාරය ආරක්ෂා කළ බහුශ්‍රැත ධර්මධර සියලු ලෝකයාගේ ඇසක් බඳුවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ පිරිනිවන් පෑසේක.

37. "මහර්ෂිවූ බුදුන්ගේ ධර්මය ආරක්ෂා කළ බහුශ්‍රැත ධර්මධර ඇසක් බඳුවූ ආනන්ද ස්ථවිරයන්ගේ පිරිනිවන්පෑම ලෝකයෙහි අන්ධකාරයට හේතුවිය.

38. "ඥාන ගතියෙන් යුක්තවූද ස්මෘති ප්‍රඥාවෙන් යුක්ත වූද ධෛර්යවත්වූද යම් ඍෂිවරයෙක් සද්ධර්මය දැරුවේනම් ඒ ආනන්ද ස්ථවිරයන් වහන්සේ රත්නාකාරයක් බඳුය.

39. "මා විසින් බුදුන් ඇසුරුකරන ලදී. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි. ගරු භාරය බහා තැබීමි. පුනර්භවයක් මට නැත්තේය."

---

# චත්තාළීස නිපාතය

**1. මහා කස්සප ථෙර ගාථා:-** 1. "භික්ෂුගණයා පිරිවරණ ලදුව නොවිසිය යුතුය. පිරිස් පරිහරණය කරන්නහුගේ සිත වික්ෂිප්තවේ. ඔහුට සමාධිය දුර්ලභයි. නානාප්‍රකාර ජනයාට සංග්‍රහ කිරීමද දුක් පිණිස වේ. මේ දැක ගණවාසය නො කැමැතිය.

2. "පැවිදිතෙම කුලයන් හා කුළුපග නොවිය යුතුය. කුමක් නිසාද සිත වික්ෂිප්ත වන හෙයිනි. ඔහුට සමෘද්ධියද දුර්ලභයි. කුලයා කෙරෙහි උත්සාහවත් බවට පැමිණියේ රසයට ගිජුවූයේ තමහට සැප පිණිස පවතින යම් අර්ථයක් වේද ඒ අර්ථය දුරුකරයි.

3. "යම්බඳුවූ වැඳුම් පිදුම් ආදී වශයෙන් කුලයන්හි ලබන සත්කාරයක් වේද ඒ හීනවූ මඩගොහොරුවක් කොට ප්‍රකාශ කරන ලදහ. සියුම්වූ හුලක් දුරුනොකළ හැකිවා මෙන් සත්කාරය පිළිකුල් කටයුතු පුද්ගලයා විසින් දුරුනොකළ හැක්කකි.

4. "සේනාසනයෙන් බැස නගරයට පිඬු පිණිස පිවිසියෙමි. අනුභව කරන කුෂ්ටරෝගී පුරුෂයා සකස්කොට උපස්ථාන කළේය.

5. "කුෂ්ට රෝගයෙන් යුක්තවූ අතින් පිණ්ඩියාලෝපය බෙදන ලදී. ආහාර බෙදන්නහුගේ ඇඟිල්ලක්ද එහි පතිතවිය.

6. "ගෘහ බිත්තියක් සමීපයේ සිට ඒ ආලොපය අනුභව කෙළෙමි. කන කල්හි හා කෑ කල්හි මට පිළිකුල් බවක් නොවීය.

7. "ආහාර වශයෙන් මිශ්‍ර ආහාරයද ඖෂධ වශයෙන් ගෝමූත්‍ර පානයද සේනාසන වශයෙන් රුක්මුල්ද චීවර වශයෙන් පාංශුකූල චීවරයද යන මේ සතර ප්‍රියකොට පරිභොග කෙරේද, ඒ පුද්ගලයා චතුද්දිශා යොග්‍ය පුද්ගලයෙක් වේ.

8. "පර්වතයට නගින්නාවූ ඇතැම් අය පශ්චිම වයසෙහි ශරීර ක්ලාන්තයෙන් දුකට පැමිණේ. ඒ ජරා දුර්වල කාලයෙහිද බුදුන්ගේ දායාදය උතුම්කොට සලකා නුවණින් යුක්තව ඉර්ධි බලයෙහි උපකාරයෙන් කාශ්‍යපස්ථවිරයන් වහන්සේ පර්වතයට නගියි.

9. "කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පිණ්ඩපාතයෙන් වැළැක්වේද පර්වතයට නැග කිසිවක් තෘෂ්ණා දෘෂ්ටිදෙකෙන් නොගෙණ භය හා භයට හේතුව දුරුකිරීමෙන් ධ්‍යාන කරයි.

10. "පර්වතාරූඪවූ කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පිණ්ඩපාතයෙන් වැලකුනේද කිසිවක් නොගෙණ රාගාදී ගිනිවලින් දැවෙන සත්වයන් අතර සිහිල් බවට ධ්‍යාන කරයි.

11. "පර්වතාරූඪවූ කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පිණ්ඩපාතයෙන් වැලකුනේද කරන ලද කෘත්‍ය ඇතිව ආශ්‍රව ධර්මයන් නසා කිසිවක් නොගෙණ ධ්‍යාන කරයි.

12. "වරුණ රුක් පංක්තියෙන් යුක්තවූනාවූ මනෝ රම්‍ය භූමිභාග ඇත්තාවූද එසේම රම්‍යවූ හස්ති නාද ඇසෙන්නාවූද ඒ පර්වතයෝ මට රම්‍යයි.

13. "නිල්වන් වළාකුළුවලින් ඇදහෙලන පිරිසිදු ජලය ඇත්තාවූද ඉන්දගෝපකයන් විසින් ගැවසීගත්තාවූද ඒ පර්වතයෝ මට රම්‍යයි.

14. "කූටාගාරවලට සමානවූ නිල්වළාකුල් ඇත්තාවූද හස්තීන් විසින් ගැවසීගත්තාවූද ඒ පර්වතයෝ මට රම්‍යයි.

15. "මහා මේඝයෙන් දූවිලි සිඳදැමූ රම්‍ය තලාවක් ඇති ශෛලමය පර්වතයෝ ඍෂීන් විසින් සෙවුනාලදහ. මිහිරි නාදයෙන් යුක්තවූ ඒ පර්වතයෝ මට රම්‍යයි.

16. "නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ස්මෘතිමත්වූ ධ්‍යාන කැමැත්තහුට මේ ප්‍රමාණවෙයි. නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති අර්ථකාමී භික්ෂුවටද මෙයම ප්‍රමාණයි.

17. "නිවණට මෙහෙයූ සිත් ඇත්තාවූද සැප කැමැත්තා වූද භික්ෂුවට මෙයම ප්‍රමාණයි. නිවන් පිණිස මෙහෙයූ සිත් ඇත්තාවූද යෝගකාමීවූද තාදී ගුණයෙන් යුක්තවූද මට මේ ප්‍රමාණයි.

18. "උම්මා කුසුමයන්ට සමාන කාලමේඝයෙන් නීලවර්ණවූ අහස ඇත්තාවූද නොයෙක් පක්ෂි සමූහයන්ගෙන් ගැවසීගත්තාවූද ඒ පර්වතයෝ මට රම්‍යයි.

19. "ගිහියන්ගෙන් නොගැවසුනාවූද මෘග සමූහයාගෙන් ගැවසීගත්තාවූද නොයෙක් පක්ෂි සමූහයාගෙන් ආකීර්ණවූද ඒ පර්වතයෝ මට රම්‍යයි.

20. "අතිශයින් සීතලවූද ගල් ඇත්තාවූද ගෝන මුව සමූහයාගෙන් යුක්තවුනාවූද දියසෙවෙල්වලින් ගැවසුනා වූද ඒ පර්වතයෝ මට රම්‍යයි.

21. "පසඟතුරු ගොසින්ද ඇතිනොවන ඇල්මක් එකඟවූ සිතින් යුක්තව මනාකොට ධර්මය බලන්නාවූ මට ඇති වන්නේය.

22. "බොහෝ කටයුතු නොකළ යුතුය. කල්‍යාණ මිත්‍ර නොවූ ජනයා දුරුකළ යුතුය. ප්‍රත්‍ය සොයාගැනීමට හා ගණ බන්ධනාදී වශයෙන් උත්සාහවත් නොවිය යුතුය. ඊට උත්සාහවත් වීමෙන් රසයට ගිජුවූයේ ඒ සැප කැමති පුද්ගලයා අර්ථයෙන් පිරිහෙයි.

23. "බොහෝ කටයුතු නොකළ යුතුය. නවකර්මාන්තාදියෙහි යෙදීම දුරුකළ යුතුය. එයින් ශරීරය දුකට හා ක්ලාන්තයට පැමිණේ. එහෙයින් චිත්ත සමථය නොවිඳී.

24. "සජ්ක්ධායනා කිරීම් මාත්‍රයෙන් ප්‍රත්‍යක්ෂ අර්ථය නොදතහැකිය. මම ශ්‍රෙෂ්ඨමියි යන මානයයෙන් යුක්තව යකඩ කුරක් ගිල්ලෙකු මෙන් නොනැමිය හැකි ග්‍රීවයක් ඇතිව හැසිරෙයි.

25. "අඥාන පුද්ගලයා ශ්‍රෙෂ්ඨ වශයෙන්ද සමාන වශයෙන්ද හීන වශයෙන්ද තෙමේ අදහස් කරයි. එය ඤාණවන්තයෝ ප්‍රශංසා නොකරත්. පහත් කළ සිතක් ඇති බැවිනි.

26. "පණ්ඩිතයෝ වනාහි ශ්‍රෙෂ්ඨ වශයෙන්ද සමාන වශයෙන්ද හීන වශයෙන්ද අදහස් නොකරත්. ඒ සමාන කොට්ඨාශයන්හි කම්පා බවට නොපැමිණෙත්.

27. "ප්‍රඥාවන්තවූද සීලයෙහි පිහිටියාවූද සිත එකඟ කළාවූද තාදී ගුණ ඇත්තාවුද චිත්ත සමථය ලැබුවාවූද උතුමන්ට පණ්ඩිතයෝ පසසත්.

28. "යමෙකුට සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව නැත්තේද ඔහු සද්ධර්මයෙන් ඈත්වේ. අහසින් පොළොව වෙන්වූවාක් මෙනි.

29. "යමෙකුන්ට හිරිඔතප් ඇත්තේද හැමකල්හි පැමිණි සිහි ඇත්තේද බ්‍රහ්මචරියාවෙන් දියුණුවට පත්වූයේද ඔවුන් විසින් පුනර්භවය ක්ෂය කරන ලදී.

30. "නොසන්සුන් බවෙන්ද චපලබවෙන්ද යුක්ත භික්ෂුව පාංශුකූල චීවරය පොරවන ලද්දේ නමුදු සිංහ සම පොරවන ලද වඳුරාමෙන් නොහොබනාහුය.

31. "උද්ධත නොවූද චපල නොවූද ප්‍රඥාව ඇත්තාවූද ඉඳුරන් සංවරකළාවූද පුද්ගලයා පාංශුකූල චීවරයෙන් ශෝභාවත්වේ. පර්වත ගුහාවෙහි සිංහරාජයෙක් මෙනි.

32. "ඉර්ධි ඇත්තාවූද පිරිස් ඇත්තාවූද දහසක් පමණවූ ඒ සියලු දේවතාවෝම බ්‍රහ්මකායිකයෝ නම් වෙති.

33. "මහාවීරවූද ධ්‍යානකරන්නාවූද සමාධිගතවූද ධර්ම සේනාපතිවූද ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ඇඳිලිබැඳ නමස්කාර කරමින් ඒ දෙවියෝ සිටින්නාහ.

**34.** "ශ්‍රේෂ්ඨ පුරුෂයාණන් වහන්ස, ඔබට නමස්කාර වේවා, උත්තම පුරුෂයාණන් වහන්ස ඔබට නමස්කාරවේවා, යමක් නිසා ඔබ ධ්‍යාන කරන්නේද, අපි එය නොදනිමු.

**35.** "බුදුන්ගේ ස්වකීය ගෝචරයද ආශ්චර්යද වෙයි. ගම්භීරද වෙයි. වාලවේධි ධනුර්ධරයන්ගේ විදීමක් මෙන් සියුම්ද වෙයි. එය අපි නොදන්නමෝ වෙමු.

**36.** "එපරිද්දෙන් දෙව් සමූහයා විසින් පුදන ලද පූජාර්හවූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දැක ඒ අවස්ථාවෙහි මහාකප්පින ස්ථවිරයන් වහන්සේට සිනහවක් විය.

**37.** "බුද්ධක්ෂෙත්‍රයෙහි මහාමුනිවූ බුදුරජාණන් වහන්සේ හැර යම් පමණ ශ්‍රාවකයෝ වෙත් නම් ධුතාංග ගුණ ඇති සියල්ලන්ටම විශිෂ්ටවූ පුද්ගලයා මම වෙමි. මට සමාන වෙන කෙනෙක් නැත්තේය.

**38.** "මා විසින් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන ලදී. බුදුන්ගේ අනුශාසනාවද කෙළෙමි. ගරු භාරයද බහාතැබීමි. පුනර්භවයක්ද මට නැත.

**39.** "ගෞතම බුදුරජාණන් වහන්සේ අනන්ත ගුණ ඇත්තේ නිල්මහනෙල් මල් දිය හා නොතැවරී සිටින්නාක් මෙන් චීවර සයනාසන භොජනාදියෙහි නොඇලී අභිනිෂ්ක්‍රමණයෙන් භවයෙන් නික්මුනේ වෙයි.

**40.** "ඒ මහාමුනීන්ද්‍රයන් වහන්සේ සතිපට්ඨාන නැමැති ග්‍රීවයක් ඇත්තේ ශ්‍රද්ධා නැමති හස්තයක් ඇත්තේ, ප්‍රඥා නැමති හිසක් ඇත්තේ මහා ඥාණයක් ඇතිව හැමකල්හි නිවීයාවූ සිහිල්වූ ගුණ ඇතිව හැසිරෙති."

---

# පඤ්ඤාස නිපාතය

**1.** **තාලපුට ථෙර ගාථා:-** 1. "මම කවදා නම් පර්වත කඳුරැළිවල හුදකලා වාසයෙන් තෘෂ්ණාවෙන් තොරව වාසය කරන්නෙම්ද, සියලු භවය අනිත්‍ය වශයෙන් කවදානම්

දකින්නෙම්ද, මාගේ මේ අදහස් කවදා නම් සම්පූර්ණකර ගනිම්ද?

2. "මම කවදා නම් පැව්ද්දෙක්ව භින්න වස්ත්‍ර දරා කසී වතින් හඳනා ලද්දේ කුලයා කෙරෙහිත් ගණයා කෙරෙහිත් නොඇලී කිසි අරමුණක් බලාපොරොත්තු නොවී රාගයත් ද්වෙෂයත් මෝහයත් නසා වනගතව සැපසේ වෙසෙම්ද?

3. "අනිත්‍යවූද රෝගයට හා මරණයට භාජනවූද ජරාමරණ උපද්‍රවයන්ගෙන් යුක්තවුනාවූද මේ ශරීරය කවර කලෙක මනාකොට දකිමින් වනයෙහි එකලාව වසන්නෙම්ද?

4. "මම කවදානම් භය ඇතිකරන්නාවූද දුකට හේතුවූද භවයටම අදින තෘෂ්ණලතාව ශ්‍රද්ධා හස්තයෙන් ප්‍රඥාමය කඩුවගෙන එය සිඳ දමා කවදානම් වාසය කරම්ද?

5. "කවදානම් තියුණු තේජස් ඇතිව ඍෂිවරයින්ගේ ප්‍රඥා නමැති ආයුධය ගෙන ක්ලෙශ සේනාව යුක්ත මාරයා විනාශකොට සිංහාසනාරූඪ වන්නෙම්ද?

6. "මම කවදානම් ධර්ම ගෞරවය ඇත්තාවූද තාදී ගුණයන්ගෙන් යුක්තවූ නැවත දිනන ලද ඉඳුරන් ඇත්තාවූද බුද්ධාදී සත්පුරුෂ සමාගමයට පැමින ප්‍රධන්වීර්ය කිරීමෙන් යුක්තව වාසය කරන්නෙම්ද?

7. "කවදා නම් අලස බවද සාපිසාදී දුක්වූද අවු සුළං ආදියද මැසි මදුරු ආදී උවදුරුද ධ්‍යානයෙන් මැඩ පවත්වා පර්වත කඳුරැලි ආදියෙහි ස්වකීයාර්ථය සිද්ධ කර ගනිමින් වසන්නෙම්ද?

8. "කවදානම් මහර්ෂිවූ බුදුන් විසින් අවබෝධ කරනලද දැකීමට දුෂ්කරවූ (චතුශ්සත්‍ය ධර්මය සිහිය හා ප්‍රඥාව ඇති එකඟ සිතින් යුක්තව කවදානම් අවබෝධ කරගන්නෙම්ද?

9. "කවදානම් නුවණින් නොදක්නාලද රූපයෙහිද ශබ්දයෙහිද ගන්ධයෙහිද රසයෙහිද ස්පර්ශයෙහිද ධර්මයෙහිද එකොළොස් ගින්නකින් ඇවිලෙමින් පවත්නේ සමථයෙන් යුක්තවූ ප්‍රඥාවෙන් මම කවදානම් දකින්නෙම්ද?

10. "මම කවදානම් නපුරු වචන වලින් සටනා ලද්දේ දොම්නසට නොපැමිනෙම්ද, එසේම ප්‍රශංසා කරන ලද්දේත් ඒ නිමිතිකොට සතුරු නොවන්නේත්වෙම්ද? මේ තත්වය කවදා නම් මට ඇතිවන්නේද?

11. "කවදානම් දරකඬෙහිද තෘෂ්ණාලතාවෙහිද ස්කන්ධයෙහිද එයින් අන්‍යවූ රූපධර්මයන්හිද යන අධ්‍යාත්මිකවූද බාහිරවූද සෑමදෙයක අනිත්‍යාදි ස්වභාවය දකින්නෙම්ද?

12. "කවදානම් වර්ෂා කාලයෙහි වනගතව තෙමුණු සිරුරු ඇතිව බුද්ධාදී මහාර්ෂීන් විසින් පිළිපදිනලද මාර්ගයෙහි හැසිරෙම්ද?

13. "කවදානම් වනයෙහි පිල් ඇත්තාවූද මොනර සමූහයාගේ හඬ අසා අවදිවීමෙන් නිවන් පිණිස පවතින භවයෙහි අනිත්‍යාදී ස්වභාවය සිහිකරමින් වෙසෙම්ද?

14. "කවදානම් ගංගා යමුනා සරස්වතී යන ගංගාවෝ පාතාලගතව මහා සමුද්‍රයට පිවිසීමෙන් සුළිබවට පැමිණේද ඒ භයානක අවස්ථාවෙහි පස් ඉර්ධිබලයෙන් යුක්තව බිය නොවී වාසය කෙරෙම්ද,

15. "දැඩිවූ වැටක් බිඳහෙලා යකඩ දම්වැල් කඩා වනයට පිවිස තනිව වෙසේද එසේම මමත් කාම වස්තූන්හි ආශාව නැතිකොට කලකිරී සියලු ශුභ නිමිති හැරදමා ධ්‍යානයෙන් යුක්තව කවදානම් වාසය කරන්නෙම්ද?

16. "දිළින්දෙක් ණය බරින් කරදරවූයේ නිධානයක් ලැබ ණය ගෙවා සතුටින් වාසය කෙර්ද, එසේම මමත් කවදානම් ණය හා සමාන කාමච්ඡන්දය දුරුකොට ආර්ය ධනයෙන් යුක්ත බුදුන්ගේ ශාසනයට පැමිණ කවදානම් සතුටින් වාසය කරන්නෙම්ද,

17. "එම්බා චිත්තය, තා විසින් බොහෝ අවුරුදු ගණන් ගිහිගෙයි වැසීමෙන් බොහෝ දේ ඉල්ලන්නෙක් වූයෙහිය. දැන් වනාහි මම පැවිදි බවට පත්වූයේ කුමක් හෙයින් එහි නොයෙදී වසන්නෙම්ද,

18. "එම්බල චිත්තය, මම වනාහි තා විසින් යාචිතවූයේ විසුවෙමි. වනයෙහි වසන මයුරයන් මේඝගර්ජනාවෙන් සන්තොෂයට පත්වන්නෙක් මෙන් ධ්‍යානයෙන් සන්තොෂයට පැමිණ වනයෙහි වෙසෙම්ද,

19. "ඥාතිකුලාදී කුලයෝද මිත්‍රයෝද ප්‍රියයෝද කාම ක්‍රීඩාවෝද යන ලෝකයට අයිති දේ හැරදමා පැවිදි බවට පත්වූයේ චිත්තසන්තොෂයෙන් යුක්තව වාසය නොකරන්නෙම්ද,

20. "එම්බල චිත්තය, තෝ වනාහී මගේද අනිකෙක් නොවන්නෙහිද භාවනා කලයුතු කාලයෙහි හැඬීමෙන් කවර ප්‍රයෝජනද ත්‍රෛභූමික සංස්කාරයන් අස්ථිර බව පැණැසින් බලන්නේ නිවන් සොයන්නෙමි.

21. "අවීත රාගීන් විසින් නොවැලක්විය හැකිවූ වඳුරෙකුට සමාන කළ හැකි චපල සිත දෙපා ඇත්තවුන් අතුරෙන් අග්‍රවූ නරදම්මසාරථීවූ බුදුන් වහන්සේ විසින් මනාකොට පෙන්වන ලදී.

22. "කාමයන් විසිතුරුය, මධුරය, මනොරම්‍යය, අවිද්‍යාවෙන් යුක්තවූ පෘථග්ජනයෝ එහි ඇලී පුනර්භවයන්හි සිත විසින් පමුණුවන ලදුව නිරාදුකට පත්වන්නාහුය.

23. "වනයෙහි මොනර කොස්වාලිහිණි ආදී සත්වයෝද දිවියන් හා ව්‍යාඝ්‍රයෝද මෛත්‍රියෙන් වෙසෙත්ද, එසේම තා විසින්ද කායාපෙක්ෂාව හැරදමා මෛත්‍රියෙන් යුක්තව නවවෙනි ක්ෂණ සම්පත්තිය නොවරදවා වසව,

24. "ධ්‍යානයෝද ඉන්ද්‍රියයෝද, බලයෝද, බොජ්ක්ධංගයෝද සමාධි භාවනාවෝද වඩව්, ත්‍රිවිද්‍යාවෝද ස්පර්ශකරව, බුදුසසුන්හි පිහිටා කටයුතු කරව,

25. "නිවන් පිණිස පවතින්නාවූද සියලු දුක් නැති කරන්නාවූද සියලු කෙලෙසුන් නසන්නාවූද ආර්‍ය අෂ්ටාංගික මාර්ගය නිවන් පිණිස භාවනා වශයෙන් වඩව. මගේ සිත එහිම පෙරටු කොට යේවා.

26. "උපාදාන ස්කන්ධයන්හි නුවණින් බලව. දුකට හේතුවූ සමුදය නම්වූ තෘෂ්ණාව දුරුකරව. මෙහිම දුක් කෙළවර කරව මගේ සිත මෙහිම පෙරටු කොට යේවා.

27. "විදර්ශනා ඥානයෝ සියල්ල අනිත්‍ය වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද සූන්‍ය වශයෙන්ද මද වශයෙන්ද බලා එහි ඇති ඡන්ද රාගය දුරුකරව. මගේ සිත එහිම පෙරටු කොට යෙත්වා.

28. "හිස මුඩුකරන ලදුව වෙනස් වර්ණයට පැමිණියේ පාත්‍රය ගත් අත් ඇතිව කුලයන් කරා පිඬු පිණිස හැසිරේද, මහර්ෂීවූ ශාස්තෘන් වහන්සේගේ වචනය පිරිදි එහිම සිත පෙරටු කොට වසව.

29. "මනා සංවරයෙන් යුක්තව ප්‍රීතිමාර්ගයෙහි හැසිරෙන්නේ කුලයා කෙරෙහිද කාමයෙහිද නොඇලී සිත් ඇත්තේ පහවූ දොස් ඇති චන්ද්‍රයාමෙන් ප්‍රශාදජනකව එහිම සිත පෙරටු කොට හැසිරෙව,

30. "ආරඤ්ඤිකවද, පිණ්ඩපාතිකවද, සේනාසනිකවද පාංශුකූලිකවද නේසජ්ජිකවද, යන ධූතාංගවල ඇලීමෙහිම සිත පෙරටු කොට වාසය කරව.

31. "ඵල කැමති පුරුෂයෙක් රුකක් රෝපනය කොට ඵල හටගත් කල්හි ඒ රුක සිඳ දැමීමට කැමැත්තෙහිද එසේම පැවිදි බවට පත්වූ තොපි එහි ඵල නොගෙන ජීවිතය සිඳ දමන්නෙහිද?

32. "අරූපවූද ධූතාංගධරවූද ඒකචාරීවූද චිත්තය ශාස්තෘහුගේ වචනය නොකරන්නෙහිද කාමයෝ වනාහි කටුකවූද බියට හේතුවූද දුක් උපදවන්නාවූද වන්නාහුය, එම නිසා නිවන් අරභයාම සිත යොමු කරව.

33. "මම වනාහි කාලකණ්ණි තත්වයෙන් හෝ ලජ්ජා නැතිකමින් චිත්ත වසිකයෙක්ව අකීකරු භාවයෙන් ජීවිතය නිසා පැවිදි බවට නොපැමිණියෙමි. පැවිදිවූ තැන් සිට මගේ වසඟයෙහි සිත පැවතිය යුතුය.

34. "බුද්ධාදී සත්පුරුෂයන් විසින් ආශා අඩුවීමේ ගුණය වර්ණනා කළහ. මකුබව පහකිරීම දුක් සංසිඳුවීමකි. මගේ සිත එහිම සිටියි. තෝ වනාහි පෙර පුරුදු කළ දෙයටම සිත යොදන්නෙහිද?

35. "තෘෂ්ණාවද අවිද්‍යාවද අනුව පැවතීම හා විරුද්ධකමද සුභ රූපයෝද සැප වේදනාවෝද සිත තුටුකරන කාමයෝද පහරන ලදහ. ඒ පහකළ වස්තූන් නැවත හටගැනීමට උත්සාහ නොකරමි.

36. "එම්බල චිත්තය, මා විසින් හැම භවයකද හැම ජාතියකද තොපගේ වචනය කඩනොකොට කෙළෙහිය. ඒ කළගුණ සලකන මට බොහෝ කලක් සසර දුක් තා විසින් ඇතිකරන ලද්දේය.

37. "එම්බා චිත්තය, තා විසින්ම බ්‍රාහ්මණයෙක්ද කරන්නෙහිය. ක්ෂත්‍රියයෙක්ද කරන්නෙහිය. වෛශ්‍යයෙක්ද කරන්නෙහිය. ක්ෂුද්‍රයෙක්ද කරන්නෙහිය. ඇතැම් කලෙක රජෙක්ද කරන්නෙහිය දෙවිබවටද පමුණු වන්නෙහිය.

38. "තෝම මුල්වී අසුරයෙක්ද කරන්නෙහිය නරකයටද පත්කරන්නෙහිය තිරිසන් බවටද පත් කරන්නෙහිය ප්‍රේතගතියටද හෙළන්නේය.

39. "එම්බල චිත්තය, තේ වනාහි මට නැවත නැවතත් වැරද්දෙහිය. අලංකාර දර්ශන ඇතිකිරීමෙන් උම්මත්තකයෙක් කොට මා පොළඹවන ලදී. තොපට මම කළ විරුද්ධකම කවරේද?

40. "මේ සිත මීට පළමුව කැමති කැමැති අරමුණු ලබා සැපසේ විසුවෙහිය. අද මා විසින් ඒ සිතට නිග්‍රහකොට මදයෙන් මත් අලියෙක් හෙණ්ඩුව ගෙන දමනය කරන්නාක් මෙන් යෝනිසෝ මනසිකාරයෙන් දමනය කරන්නෙමි.

41. "මගේ ශාස්තෘන් වහන්සේ සියලු ලෝකය අනිත්‍ය වශයෙන්ද අස්ථිර වශයෙන්ද අසාර වශයෙන්ද දැන වදාළසේක. එම්බල චිත්තය, ඒ ජිනසාසනයට බැස එතර කිරීමට දුෂ්කරවූ චතුරොඝය තරණය කරව.

42. "එම්බල චිත්තය, මේ පරණවූ ආත්මභාව නමැති ගෘහය තාගේ නොවෙයි. තාගේ වශයෙන් එය පැවැත්වීමට නොහැකිය. මහර්ෂිවූ බුදුන්ගේ ශාසනයෙහි පැවිදිව විනයධර පැවිද්දෝව වෙසෙත්.

43. "සියලු පර්වතයෝද සමුද්‍රයෝද ගංගාවෝද පෘථිවියද දිශාවෝද අනුදිශාවෝද උඩයට දිශාවෝද මේ සියල්ලක්ම අනිත්‍යයහ. උපද්‍රව ඇත්තාහ. කොතනට ගොස් සැප ලබන්නෙහිද?

44. "ස්ථිරව සිටියාවූ එම්බල චිත්තය, තෝ කුමක් කරන්නෙහිද මා සෙල්විය නොහැකිය. නව මුඛයකින් කුණු වැගිරෙන්නාවූ බඳිනාලද මුඛ දෙකක් ඇති කුණු ශරීරය පයින් ස්පර්ශකිරීමටද නොකට හැක්කේය මේ ශරීරයට නින්දා වේවා.

45. "ඇතැම් මිණිමුවන් ආදි සතුන්ගෙන් ගැවසී ගත්තාවූද පර්වත ශිඛරයන්ගෙන් සෙවුනා ලද්දාවූද වැසි වතුරෙන් මඳක් තෙමුනාවූද වනගත පොළොවෙහි සිවුපාවෝ සතුටින් වසන්නාක් මෙන් ගෘහ නම්වූ ශරීරයෙහිද භාවනා රතියෙන් වාසය කරව.

46. "නිල්වන් ග්‍රීවයෙන් යුක්ත මයුරයෝද විචිත්‍ර පියාපත්වලින් යුක්තවූ මීමැස්සෝද මිහිරි ගී ගැයීමෙන් යුක්තව වනයෙහි හැසිරීම් කරති.

47. "වර්ෂාව නිසා සතරඟුල් පර්වත උස්ව වැසිමලින් යුක්තවූ තෘණයෝවෙත්ද පර්වතාන්තරයෙහි පිහිටි ඒ තෘණ මත මම සයනය කරන්නෙමි. එය මොලොක් සැප ස්පර්ශ ඇති පුලුන් ඇතිරියක් මෙනි.

48. "යම්සේ ඓශ්වර්ය සම්පන්න මනුෂ්‍යයෝ දාසාදීන් ස්වකීය වසයෙහි පවත්වද්ද, එම්බල චිත්තය, මමද තොපි එසේ කරමි. ලැබෙන ප්‍රමාණය මට ඇත. තෘෂ්ණා සහගත වඩා දේ බලාපොරොත්තු නොවෙමි. කලකින් ආහාරයක් ලත් බළලාට එය ප්‍රමාණවත් වන්නාක් මෙනි.

49. "ඓශ්වර්ය සම්පන්න මනුෂ්‍යයෙක් අශ්වයෙකු තම වසඟයට පමුණුවන්නාක් මෙන් එම්බල චිත්තය, තාද වීර්යයෙන්

මම වසඟ කෙළෙහිය. කෙසේදයත් ඇත් ගොව්වෙක් හෙන්ඩුව ගෙන මත්ත හස්තියෙකු දමනය කළාක් මෙනි.

50. "විදර්ශනාවට අනුව දමනය කොට තොපට අසුන් දමනය කරන්නෙක් අසෙකු යහපත් බවට පමුණු වන්නාක් මෙන් නිර්වාණගාමි ප්‍රතිපදාවට පැමිණිය හැකිය. හැමකල්හිම උතුමන් සිත රැකීමෙන් ආර්ය මාර්ගය සෙවුනාලදහ.

51. "ඇතෙක් කනුවෙහි දැඩිකොට බඳින්නාක් මෙන් සිතද අරමුණෙහි බැඳිය යුතුය සිහියෙන් මනාකොට වඩනා කල්හි ඒ සිත භවයන්හි තෘෂ්ණා වසඟයට පැමිණෙයි.

52. "ආයතනයන් කරා ඇදීයන සිත ප්‍රඥාවෙන් වලක්වා විදර්ශනා භාවනා නම්වූ යෝගයෙන් නිග්‍රහකොට නියම මාර්ගයෙහි පිහිටවත්ද, ඔහු ඇතිවීම නැතිවීම දෙක දැකීමෙන් බුදුන්ගේ ඖරස පුත්‍රයෙක් වන්නේය.

53. "සතර ආකාර වෙනස්වීම් මනාකොට දැන ගම් දරුවෙකු මෙන් ඒ මේ අතට ඇද සංයෝජන බන්ධනයෙන් සිඳ දැමුවාවූ කාරුණික බුදුන් ඒකාන්තයෙන්ම සේවනය කළයුතුයි.

54. "නිදැල්ලේ හැසිරෙන මුවා රම්‍යවූ පර්වත හා මල් ඇති වනාන්තරයෙහි සිත් අලවා වෙසෙත්ද, මමද එසේ තනිව වාසය කරන්නෙමි.

55. "ඡන්දයෙන් වසඟයට පැමිණ වසන ස්ත්‍රී පුරුෂයන් මෙන් සම්බන්ධවූ තොපි එසේ වසඟ වන්නාහු භවයටම ඇදී යති. මාර වසඟයට පැමිණේ. බුදුන්ගේ ශ්‍රාවකයෝ සිතට වුමනාසේ නොහැසිරෙන්නාහුයි."

---

# සට්ඨි නිපාතය

1. **මහාමොග්ගල්ලාන ථෙර ගාථා:-** 1. "ආරණ්‍යකවූද පිණ්ඩපාතිකවූද ගෙපිළිවලින් පිඬු සිඟීමෙහි ඇලුනාවූ අප විසින් ආධ්‍යාත්මය තැන්පත්කොට මාරසේනාව සිඳිමු.

2. “ආරණ්‍යකවූද පිණ්ඩපාතිකවූද ගෙපිළිවෙලින් පිඬු සිඟීමෙහි ඇලුනා අපි ඇතෙක් බටකොළ සෙවිලි කරන ගෙයක් විනාශ කරන්නාක් මෙන් මාරසේනාව සිඳිමු.

3. “වෘක්ෂමූලිකවූද භාවනාවෙහි වීර්යවන්තවූද පඤ්චචරියාවෙහි ඇලුනාවූද අපි ඇතෙක් බටකොළ ගෙයක් විනාශ කරන්නාක් මෙන් මරසෙනග විනාශ කරමු.

4. “ඇටසැකිලි කුටියක් බඳුවූද නහරවැල්වලින් වෙලන ලද්දාවූද දුගඳ හමන අසූචියෙන් පිරුණාවූද තොපට ගර්හා වේවා. අනුන් පිළිබඳ ශරීරයෙහිද මෙබඳු තත්ත්වයක් පවත්නා නිසා කවර මම බයක්ද?

5. “අසූචි ඇති අතක් හා සමානවූද සමින් වසන ලද්දාවූද පිසාචයෙක් බඳුවූද තොපගේ ශරීරයෙහි හැමකල්හි නව දොරකින් වැහෙන කුණු ඇත්තේය.

6. “දිය පහරවල් නවයක් ඇත්තාවූද දුගඳහමන්නාවූද සමින් බඳනාලද්දාවූද ශරීරය පිරිසිදුබව කැමැත්තෙක් කුණක් දැක පිළිකුල් කරන්නාක් මෙන් භික්ෂුව විසින් දුරුකට යුතුය.

7. “අසූචි ගොඩක්වූ මේ ශරීරය මා දන්නාක් මෙන් මහජනයාත් දකිත් නම් දුරින්ම දුරුකරන්නේය. අපිරිසිදු අසූචිවලක් දුරුකරන්නාක් මෙනි.

8. “ශ්‍රමණයන්වහන්ස, ඔබ යමක් කියන්නෙහි නම් එය එසේමය. ඇතැමෙක් මෙහි වාසය කෙරෙත්ද මඩගොහොරුවක එරීගිය මහළු ගවයෙකු මෙන් විපතට පත් වන්නේය.

9. “යමෙක් අහසෙහි ලාක්ෂා රසයෙන් සිතියම් කරන්නෙමියි අදහස් කරන්නේද ඒ වෙහෙසක් පිණිසම පවතී.

10. “ඒ ආකාසය සමවූ සිත මනාකොට හික්මවාගන්නා ලද්දේ පාපයෙන් වලක්වා ගන්නා ලද්දේ නොවේ නම් ගින්නකින් මෙන් අනර්ථයක් නොවන්නේය.

11. “අසූචි වැගිරෙන මේ ශරීරය සිතින් සිතියම් කරන ලද්දක් මෙන් පවතින නමුත් නොයෙක් රෝග ව්‍යසනයන්ට ගොදුරු වන්නේය. මෙහි ස්ථිර බවක්ද නැත.

12. "ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි අනේක ප්‍රකාරවූ බිය ජනකවූද රෝමෝද්ගමනය වන්නාවූද ආරම්මන ඇතිවූවාහුය.

13. "ඒකාන්තයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. ඉපදීම හා මැරීම ස්වභාවකොට ඇත්තාහුය. ඉපිද නැති වෙත්. ඔවුන්ගේ සංසිඳීම සැපයි.

14. "රාත්‍රියෙහි විදුලි එළියෙන් අස්ලොමකට විදින්නාක් මෙන් තමාගේද අනුන්ගේද පඤ්චස්කන්ධය සියුම් වශයෙන් අවබොධ කටයුතුය.

15. "යමෙක් වනාහි තමාගේද අනුන්ගේද නොවන්නාවූ සංස්කාර ධර්මයන් තත්වූ පරිදි අවබොධකොට දකීද, ඒ දැකීම විදුලි එළියෙන් අස්ලොමක් දකින්නාක් වැනි සියුම්ය.

16. "ආයුධයකින් ගසන ලද පහරින් සිදිනු ලබන හිසක් මෙන් කාමරාගය දුරුකිරීමට භික්ෂුව සිහියෙන් උත්සාහවත් වියයුතුය.

17. "ආයුධයකින් ගැසූ පහරක් ඇති සිඳිනු ලබන හිසක් මෙන් සිහියෙන් යුක්තව භික්ෂුව භවරාග නැති කිරීමට උත්සාහ කළයුතුය.

18. "භාවිතවූ අන්තිම ශරීරය දරන්නාවූ බුදුන් විසින් චොදනා කරනු ලැබ මිගාරමාතු පාසාදය පාදංගුලියෙන් කම්පනය කරන ලදහ.

19. "වීර්යය සිහිල් නොකොට ස්වල්පවූ වීර්යයකින් සියලු ගැට මුදන නිර්වාණාධිගමය නොකොට හැකිය.

20. "මේ ළදරු භික්ෂුව උත්තම පුරුෂයෙක් වන්නේය. මාරසේනාව සිඳ දමා අන්තිම ශරීරයද සිඳදමයි.

21. "වෛභාරව, පාණ්ඩව යන පර්වත විවරයන්ගෙන් පතිත වන විදුලියක් මෙන් බබළන සමානයකු නැති තාදී ගුණයෙන් යුක්තවූ බුද්ධ පුත්‍රතෙම පර්වත විවරයන්හි ධ්‍යාන කරයි.

22. "උපශාන්ත ගුණයන්ගෙන් යුක්තවුනාවූද එහිම ඇලුනාවූද ඤාණවන්තයා බුදුන්ගේ දායාදයක් බඳුවූ සුදුසු සේනාසනය ලැබ බ්‍රහ්මයාගෙන්ද නමස්කාර ගනිමින් වෙසෙයි.

23. "උපශාන්ත ගුණයන්ගෙන් යුක්තවුනාවූද එහිම ඇලුනාවූද ඤාණවන්තවූද කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ බුද්ධදායාදයක්වූ සුදුසු සෙනසුන ලැබ වෙසෙයි. බ්‍රාහ්මණය, උන්වහන්සේට වඳුව.

24. "යමෙක් මනුෂ්‍යයන් අතර නැවත නැවතත් ජාති සියයක් ලැබුවේද, ඒ සියලුම ජාතිවල ඤාණසම්පන්නවූ සොත්‍රීය නම් බ්‍රාහ්මණ කුලයන්හිම උපන්නේය.

25. "ත්‍රිවේදයෙහි පරතෙරට පැමිණි අජ්ක්ධායවූ (ත්‍රිවේද දරණ) ඒ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කරනු ලබන වන්දනාවක් වේද එය සොළොස් කලාවක් අගනේ වන්නේය.

26. "උන්වහන්සේ වනාහි ධ්‍යාන විමොක්ෂයන්ට සමවැදීමෙන් පෙර බත් කාලයෙහි ඒ ධ්‍යානයෙන් නැගිට පිඬු පිණිස යයි.

27. "එබඳු ගුණ ඇති භික්ෂුව නොගටව, ආර්ය උපවාදයෙන් කුශල ධර්මයන් නොසිඳව, තාදී ගුණයන්ගෙන් යුක්තවූ ඒ රහතුන් කෙරෙහි සිත පහදා ගනුව. වහා ඇඳිලි බැඳ වඳුව. ඒ අපරාධයෙන් හිස නොපැළීම පිණිසයි.

28. "හෙතෙම සද්ධර්මය නොදකියි. සංසාර බන්ධන පෙරටු කොට අපායෙහි උපදනා හෙයිනි. මායාදී වශයෙන් පවතින මිථ්‍යා මාර්ගයෙහිම පෙරළෙයි.

29. "සංස්කාරයන්හිම ඇලුනේ අසූචි තැවරුණාක් මෙන් ලාභ සත්කාරයෙහිම බැසගත්තේ ඒ පෝටිලතෙම ශික්ෂාවෙන් අසාරවූයේ වෙසෙයි.

30. "සුන්දර දැකීමක් ඇති කෙලෙසුන්ගෙන් මනාකොට මිදුනාවූ තැන්පත් කරනලද සිතක් ඇති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දකුව.

31. "රාග හුල් ආදිය නැති නිසා විසල්ලවූද කාමයෝගාදිය නැති නිසා වීණා සංයෝගවූද, ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූද, මරුන් බියගන්වන්නාවූද මනුෂ්‍යයින්ගේ උත්තම පින්කෙතක් වන නිසා දක්ෂිණාර්හවූද උන්වහන්සේ බලව.

32. "ඉර්ධිමත්වූද, පිරිවර ඇත්තාවූද, බ්‍රහ්ම පුරෝහිතවූද, දසදහසක් පමණවූ සියලුම දේවතාවෝ මුගලන් රහතන් වහන්සේට ඇදිලි බැඳ නමස්කාර කරමින් සිටියි.

33. "ශ්‍රේෂ්ඨ පුරුෂයාණන් වහන්ස, ඔබට නමස්කාර වේවා. උත්තම පුරුෂය, ඔබට නමස්කාර වේවා. නිදුකාණන් වහන්ස, ඔබ විසින් කෙලෙස් නසනලදද, එයින් දක්ෂිණාර්හයෙක් වූයෙහිය.

34. "ලොව ඉපිද මරණය යටපත්කොට දෙවිමිනිසුන් විසින් පුදන ලදුව දියනා මිශ්‍ර නොවී සිටින පියුමක් මෙන් සංසාරයන්හි නොඇලී සිටී.

35. "මහා බ්‍රහ්මයා හා සමවූද මොහොතකින් දහසක් ලෝකධාතුව දතහැකිවූද ඉර්ධි ගුණයන් ඇත්තාවූද දෙවියන්ගේ චුතුප්පත්තිය දකින්නාවූ උන්වහන්සේ මහානුභාව සම්පන්නයහ.

36. "ප්‍රඥාවෙන්ද සීලව්‍යපසමනයෙන්ද පරතෙරට පැමිණි යම් භික්ෂුවක්වේද, ඒ සියලුදෙනා අතුරෙන් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේම ශ්‍රේෂ්ඨයි.

37. "මමද මනෝමය ඉර්ධිය ආදිකොට ඇති සියලු ඉර්ධීන්ගේ වශීභාවයට පත්වූයේ ක්ෂණයකින් ආත්මභාව කෙළලක්ෂයක් නිර්මිත කිරීමටද හැකිවෙමි.

38. "ශාස්තෘන් වහන්සේගේ ශාසනයෙහි ගුණයන්ගෙන් උසස්වූයේ මොග්ගල්ලාන ගොත්‍රයෙහි උපන්නේ සමාධි විද්‍යාවන්හි කෙළපැමිණියේ සමනය කළ ඉඳුරන් ඇත්තේ ඇතෙක් පුස්වැල් බන්ධනයක් සිඳින්නාක් මෙන් ක්ලේශ බන්ධනය සිඳ දැමීමි.

39. "මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදී. බුදුන්ගේ අනුශාසනාවද කරන ලදී. ගරු භාරයද සිඳදැමීමි. භව කෙළවරද විනාශ කෙළෙමි.

**40.** "යම් අර්ථයක් නිසා ගිහිගෙයින් නික්ම පැවිදි බවට පත්වූයේද, ඒ අර්ථය සියලු සංයෝජනයන් නැතිකිරීමෙන් ලැබ ගතිමි.

**41.** "කකුසඳ බුදුන්ගේ ශ්‍රාවකයෙක්වූ විදුර නම් මහා රහතන්වහන්සේට ගටා දූසී නම් මාරතෙමේ කෙබඳුව පැසුනේද?

**42.** "කකුසඳ අග්‍රශ්‍රාවක විදුර මහරහතන් වහන්සේ ගටා තුන්ගව් පමණ ආත්මභාවයක් ලැබ තල්ගස් පමණවූ ගිනිගෙණ දිළිහෙන යකඩ හුල්වලින් අනිනුලබන කල්හි ඇති වෙන වේදනාවෙන් යුක්තවූ මෙබඳු නිරයක පැසුනේය.

**43.** "යම් බුද්ධශ්‍රාවකයෙක් මෙය දනී නම් එබඳු භික්ෂුවකට ගටා දුකට පත්නොවන්නේය.

**44.** "මහා සමුද්‍රය මැද කල්පස්ථායි විමානයෝ වෙත්ද, වෛඩූර්ය වර්ණයෙන් යුක්තවූ ගිනි කඳු මෙන් බබළන්නාවූ ඒ විමන්වල නානා ප්‍රකාර වර්ණයෙන් යුක්තවූ අප්සරාවෝ නටමින් සිටිති.

**45.** (මෙයද 43 ඡේදය මෙනි.)

**46.** "භික්ෂු සංඝයා දක්නාවූ බුදුන් වහන්සේ විසින් යොදවන ලද්දේ මිගාරමාතු ප්‍රාසාදය පාදාංගුලියෙන් කම්පා කෙළේය.

**47.** (මෙයද 43 ඡේදය මෙනි.)

**48.** "ඉර්ධි බලයෙන් උත්සාහවත්වූයේ වෛජයන්ත ප්‍රාසාදයද කම්පා කෙළේය. දෙවියෝ සංවේගයට පැමිණියාහුය.

**49.** (මෙයද 43 වන ඡේදය මෙනි.)

**50.** "තණ්හක්ඛය විමුක්තිය විචාරණ ලද්දේ වෛජයන්ත ප්‍රාසාදය කම්පාකොට විචාළේය. එකල්හි ශක්‍රතෙම තත්වූ පරිද්දෙන් විසඳන ලදී.

**51.** (මෙහි 43 ඡේදය යොදාගත යුතුයි.)

52. "සුධර්මා නම් සභාවේ සිටියේ පෙර ඇති කළ දෘෂ්ටිය අදත් පවතින්නේදැයි මහා බ්‍රහ්මයා විචාළේය.

53. "ප්‍රභාස්වරවූ බඹලොව බොහෝ කාලයක් විසීමෙන් ඒ දෘෂ්ටිය ඇතිවිය. ඇසූ ප්‍රශ්නයට බ්‍රහ්මයාද උත්තර ප්‍රකාශ කෙළේය.

54. "නිදුකාණන් වහන්ස, මට පළමු දෘෂ්ටියක් ඇතිවී නම් ඒ දෘෂ්ටිය දැන් නැත්තේය. මම නිත්‍යය, ශාස්වතය යනාදීන් ඇතිවූ දෘෂ්ටි බොහෝකල් විසීම නිසා ඇතිවූවෙකි.

55. (මෙහි 43 වන ඡේදය යොදාගත යුතුයි)

56. "යමෙක් මහාමේරු පර්වතය දක්නේද එසේම ජම්බුදීපයද, පූර්වවිදේහයද, උතුරුකුරු දිවයිනද යන සියලු ස්ථානයන්හි මනුෂ්‍යයෝ දක්නේ නම් -

57. (මෙහි 43 වන ඡේදය යොදාගත යුතුයි.)

58. "බාලයා මම දවනු ලැබුවේයයි ගින්න ගැණ නොසිතාද එසේ නොදැන බාලතෙම ගිනි ස්පර්ශකොට දැවෙයි.

59. "මාරය, තෝද එසේම තථාගතයන් වහන්සේ ගටා ගිනි ස්පර්ශ කිරීමෙන් බාලයා දැමුනාක් මෙන් තෝ දැවෙන්නෙහිද?

60. "මාරය, තථාගතයන් ගටා අකුසල් රැස්කෙරෙහිය. කිමෙක්ද? මාරය, පාපයක විපාක නැත්තේයයි සිතන්නෙහිද?

61. "මාරය, බොහෝ කාලයක් පව්රැස්කොට දුකට පත්වන්නෙහිද? බුදුන් කෙරෙහිත් භික්ෂූන් කෙරෙහිත් නොගටා වාසය කරව.

62. "භෙසකලා වනයෙහිදී මහාමොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ මාරයාට තර්ජනය කළහ. ඉක්බිති දුකට පත් සිත් ඇති මාරතෙම අන්තර්ධාන විය."

---

# මහානිපාතය.

1. වංගීස ථෙර ගාථා:- 1. "ගිහිගෙයින් නික්ම පැවිදිවූ මට පාප විෂයෙහි පවත්නා චිත්ත සංකල්පයෝ ඇතිවන්නාහුය.

2. "එකල්හි ධනුශ්ශිල්පයෙහි මනාකොට හික්මුණාවූ ධනුර්ධරයන් විසින් විදිනුලබන්නාවූ හී තල ස්වකීය පාද මූලයෙහි හෙලන්නේ යම්සේද,

3. "එසේම බොහෝකොට එනු ලබන ස්ත්‍රීන් නිසා ඇතිවන රූපාදී පංචශරයන් ධර්මයෙහි පිහිටි මම නොපෙළෙනාකාරයෙන් හෙළමි.

4. "ආදිච්ච බන්ධුවූ බුදුරජාණන් වහන්සේ විසින් පෙන්නුම්කරන ලද නිර්වාන මාර්ගයක්වේද, එහි මගේ සිත පිහිටියේ වෙයි.

5. "එසේ වාසය කරන්නාවූ මා කරා මාරය, තෝ පැමිණෙන්නෙහිද? මා ගිය මාර්ගය නොදක්නා පරිද්දෙන් මාරය, තොපට මම කරන්නෙමි.

6. "අධි කුශලයෙහි නොයෙදීමද, පංචකාමයෙහි යෙදීමද, දුරුකොට සියලු මිථ්‍යා විතර්කයන් හැර තෘෂ්ණාව නොකරන පරිද්දෙන් භික්ෂුව තණ්හා නැතිකරයි.

7. "ප්‍රීතිවිගතවූද, අහස්හිවූද, ලෝකය පිළිබඳ පවත්නා සියලුම රූපාදී අරමුණු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බලා ඥාණවන්තයෝ වාසය කෙරෙත්.

8. "දිට්ඨ සුත මුත ආදී උපධීන්හි අන්ධ බාල පෘථග්ජනයෝ ඇලී වාසයකෙරෙත්ද, ඥාණවන්තයෝ එය දුරුකොට දමා නොඇලී වාසය කරත්.

9. "දෙසැටක් මිථ්‍යාගතවූ අධර්ම විතර්කයෝ පෘථග්ජනයන් විසින් ඇතිකරනලදද භික්ෂුව වනාහි ඒ මිථ්‍යා විතර්කයන් නොගන්නාහුය.

10. "පණ්ඩිත ස්වභාව ඇති පුද්ගලයා බොහෝ කලක පටන් සමාහිතවූයේ කුහකකමින්ද, කෛරාටික කමින්ද තොරව

දක්ෂවූයේ තෘෂ්ණාව නැත්තේ ශාන්තිපදයට පැමිණ පරිනිර්වාණය කරයි. අනුපධිෂෙශ නිර්වාණකාලය බලාපොරොත්තු වෙයි.

11. "ගෞතමය, ශ්‍රෙෂ්ඨයාට ශ්‍රෙෂ්ඨ වෙමියි ආදී නවාකාර මානය දුරුකරව, මානපථ නම්වූ අයොනිසොමනසිකාරයද දුරුකරව, එසේ දුරුකළ කල්හි විපිළිසරවීමක් නොවේ.

12. "මකු ගුණයෙන් වඩනාලද්දාවූද මාන්නයෙන් නසනලද ගුණ ඇත්තාවූද සත්වයෝ නරකයට පැමිණෙත්. ඒ ගුණ නසාගත්තාවූ පුද්ගලයෝ නරකයට පැමිණියාහු බොහෝ කලක් ශෝක කරත්.

13. "සම්‍යක් ප්‍රතිපත්තියෙන් මාර්ගය දිනුවාවූ භික්ෂුව කිසිකලෙකත් ශෝක නොකරයි. ධර්මය දක්කාවූ ඒ පණ්ඩිත තෙම කීර්තියද, සැපයද අනුභව කරයි.

14. "ඒ නිසා අන්‍යදෘෂ්ටි නමැති උල් නොමැතිව යහපත් වීර්යයෙන් යුක්තවී පිරිසිදු සිත් ඇතිව මානය දුරුකොට කෙලෙස් සමනය කිරීමෙන් ත්‍රිවිද්‍යාව ලබව.

15. "ගෞතමයන් වහන්ස, මගේ සිත කාම රාගයන්ගෙන් දැවෙයි. විශෙෂයෙන්ම දැවෙයි. අනුකම්පාකොට එය නිවීමට ධර්මයක් ප්‍රකාශකරනු මැනව.

16. "සංඥා විපර්යාසය නිසා තොපගේ සිත දැවෙන්නේය ශුභ වශයෙන් ගත් රාග නිශ්‍රිත අරමුණ දුරුකරව.

17. "සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන්ද, දුක් වශයෙන්ද, අනාත්ම වශයෙන්ද බලව. එසේ බලා රාගය නිවාගනුව. නැවත නැවත නොදැවෙව.

18. "එකඟවුනාවූ සිතින් යුක්තව අසුභ භාවනාව වඩව. සිහිය කයෙහි පිහිටුවා ගනිමින් කලකිරීම බහුලකොට වසව.

19. "අනිච්චානුපස්සනාවද වඩව, මානානුසය දුරුකරව, එසේ දුරුකිරීමෙන් උපශාන්තව හැසිරෙව.

20. "යම් වචනයක් නිසා තමන්ට තැවීමක් නැත්තේද අනුන්ට හිංසාවකුත් නැත්තේද, එබඳු වචනම කිවයුතුය. ඒ සුභාෂිත වචන නම් වෙති.

21. "පිළිගතහැකි ප්‍රිය වචනම කියයුතුය. අනුන්ට වරදක්වන වචන නොකිය යුතුයි.

22. "සත්‍ය වචන වනාහි අමෘත වචන නම් වෙති. මේ ධර්මය පෞරාණිකයි. සත්‍යයෙහිද, අර්ථයෙහිද, ධර්මයෙහිද පිහිටියාහු සත්පුරුෂයෝ නම් වෙත්.

23. "දුක් නැතිකිරීමට හා නිවන් ලැබීමට හේතුවන බුදුන් විසින් දෙශනා කරණලද යම් වචනයක්වේද, වචනයන් අතුරෙන් එය උත්තම වන්නේය.

24. "ගැඹුරුවූ ප්‍රඥාවක් ඇත්තාවූද මග නොමග දැනීමෙහි සමර්ථවූද, මහාප්‍රාඥ ශාරිපුත්ත ස්ථවිරයන්වහන්සේ භික්ෂූන්ට ධර්මය දෙශනා කරයි.

25. "වැටහීමේ ශක්තිය ඇති උන්වහන්සේ කෝකිල නාදයෙන් යුක්තව සංක්ෂෙප වශයෙන්ද, විස්තර වශයෙන්ද ධර්මය දේශනාකරයි.

26. "මෙසේ දේශනා කරනු ලබන්නාවූ උන්වහන්සේගේ මිහිරිවූද, කමණීයවූද, කර්ණරසායනවූද, මනෝහරවූද, ධර්මය භික්ෂූහු කන් නතුකොට ප්‍රීතියෙන් අසත්.

27. "බුදුන්වහන්සේ අද පසළොස්වක දවසෙහි සියලු සංයෝජනයන් නැසුනාවූද, දුක් නැතිකළාවූද, පුනර්භවය ක්ෂය කළාවූද, පිරිසිදුවූ භික්ෂූන් පන්සියයක් පිරිවරනලදුව වැඩහිඳිනාසේක.

28. "කෙසේදයත්, සාගරය කෙළවරකොට ඇති මේ මහා පොළොව හාත්පස චාරිකාවෙහි යෙදීමෙන් පසු ඇමති සමූහයා විසින් පිරිවරණ ලදුව සක්විති මහ රජකෙනෙක් හිඳින්නාක් මෙනි.

29. "දිනනලද කෙලෙස් සතුරන් ඇති සත්වයන් සසර කතරින් එතරකරන බුදුන් වහන්සේ මරුන් බියගන්වන

ත්‍රිවිද්‍යාවෙන් යුක්ත ශ්‍රාවකයන් විසින් පිරිවරා ගන්නාලදුව වැඩහිඳියි.

30. "මේ සියලුම භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍රයෝය. ශීල සාරයක් නොමැති භික්ෂූන් මෙහි නොමැත. තෘෂ්ණා හුල උදුරා දැමූ සූර්යවංශිකවූ බුදුරජාණන් වහන්සේ මම වඳිමි.

31. "දෙදහස් පන්සීයක් පමණ භික්ෂූන් විසින් පිරිවරණ ලදුව විරජවූද, පහකරණලද භය ඇත්තාවූද නිර්වාණ ධර්මය දෙශනා කරමින් වැඩහිඳියි.

32. "බුදුන් විසින් දේශනාකරණලද පිරිසිදු ධර්මය භික්ෂූහු මනාකොට අසත්. භික්ෂු සංඝයා විසින් පිරිවරණලද සම්බුදුන් වහන්සේ ඒකාන්තයෙන් ශොභාසම්පන්නයහ.

33. "සියලුම ඍෂීන්ට උත්තමවූද, විපස්සී බුදුන්ගේ පටන් සත් වෙනි ඉර්ෂිවූ නාග නම්වූ බුදුරජාණන් වහන්සේ මහා මේඝයක් මෙන් වී භික්ෂූන්ට ධර්මය වර්ෂා කරයි.

34. "බුදුන් දැකීමේ කැමැත්තෙන් දිවා විහරණයෙන් නික්ම වංගීස නම්වූ ශ්‍රාවකතෙම ඇවැත් මහාවීරයන් වහන්ස ඔබගේ පාද වන්දනා කරයි.

35. "මාරයාගේ කෙලෙස් උපදවන මාර්ගය සිඳදමා බන්ධනයන්ගෙන් මිදී රාගාදී උල් දුරුකොට තෘෂ්ණානිශ්‍රිත නොව ධර්මය බෙදා දේශනා කරන්නාවූ බුදුන් වහන්සේ බලව.

36. "සතර සැඩවතුරෙන් එතරවීම පිණිස නොයෙක් ප්‍රකාරයෙන් මාර්ගය පෙන්නුම් කරන අමෘතය ගෙන දෙන්නාවූ ධර්ම මාර්ගය පෙන්නූසේක. ඒ ධර්මයෙහි පිහිටියාහු නිවන් දක්නාහුය.

37. "සියලු විඥානස්ථිතීන් ඉක්මවා පවතින ආලෝකවත් ධර්ම දැනද, ප්‍රත්‍යක්ෂකොට පස්වග භික්ෂූන්ට ඒ අග්‍ර ධර්මය දෙසූසේක.

38. "මෙසේ ධර්මයෙහි පවත්නා සුදේසිතභාවය දන්නාවූ කවරෙක් ප්‍රමාදවන්නහුද, ඒ නිසා ඒ බුදුන්ගේ ශාසන ධර්මයෙහි හැමකල්හිම නමස්කාරපූර්වකව, අප්‍රමාදව ඉක්මිය යුතුයි.

**39.** "බුදුන්ට අනුව අවබොධකළාවූ දැඩි වීර්‍ය ඇති යම් කොණ්ඩඤ්ඤ ස්ථවිර කෙනෙක්වේද, උන්වහන්සේ සැප විහරණය තකා නිතර විවේකයෙන් කල්ගත කළහ.

**40.** "ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාව කරන්නාවූ ශ්‍රාවකයෙකු විසින් යමකට පැමිණියයුතු නම් අප්‍රමාදයෙන් හික්මීම නිසා ඒ සියල්ලටම පැමිණිය යුතුය.

**41.** "මහත් ආනුභාව ඇත්තාවූද, ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූද සිත දැනීමේ දක්ෂවූද බුද්ධ දායාදය ලද කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ පාද වන්දනා කරයි.

**42.** "ඉසිගිලි පර්වත පාර්ශවයෙහි හුන්නාවූ දුක් කෙළවර කළාවූ මරුන් බියගන්වන ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ මුනිතුමන් ශ්‍රාවකයෝ ඇසුරු කරත්.

**43.** "මහා ඍද්ධි ඇති මුගලන් මහතෙරුන් වහන්සේ කෙලෙසුන්ගෙන් මිදුනාවූද, කෙලෙස්නැත්තාවූද, ඒ භික්ෂූන්ගේ සිත් තම සිතින් බලයි.

**44.** "මෙසේ සියලු අංගයන්ගෙන් යුක්තවූද, දුක් කෙළවර කළාවූද සියලු ගුණයන්ගෙන් යුක්තවූද, ගෞතම මුනින්ද්‍රයන් වහන්සේ ශ්‍රාවකයෝ ඇසුරුකරත්.

**45.** "පහවූ වළාකුල් ඇති අහසෙහි චන්ද්‍රයාද එසේම උපක්ලේශ රහිත අහසෙහි සූර්යයාද බබළන්නේ යම්සේද, එසේම අංගීරස මහාමුනීන්ද්‍රයන් වහන්ස, ඔබවහන්සේද දෙවියන් සහිත ලෝකයෙහි අතිශයින් බබළයි.

**46.** "මම මින්පෙර ගමින් ගමටද, පුරයෙන් පුරයටද ඇවිදින කල්හි හටගත් ස්වභාවික ගුණොපෙත සියලු ධර්මයන්ගේ පරතෙරට පැමිණි බුදුන් වහන්සේ දැක්කෙමි.

**47.** "ඒ දුක් කෙළවර කළ මුනීන්ද්‍රයන් වහන්සේ මට ධර්මය දෙසූසේක. මම ධර්මය අසා පැහැදියෙමි. ත්‍රිවිධරත්නය අපට උපකාරවීයයි අදහස් කෙළෙමි.

**48.** "මම උන්වහන්සේගේ ධර්මය අසා ස්කන්ධධාතු ආයතන අනිත්‍යාදීවශයෙන් දැන ශාසනයෙහි පැවිදිවීමි.

ශාසනයට අනුව කටයුතු කරන බොහෝවූ ස්ත්‍රී පුරුෂයන්ගේ යහපත පිණිස තථාගතයන් වහන්සේලා උපන්නාහුය.

49. "අධිගම නියමය ඇති භික්ෂූන්ගේද භික්ෂුණීන්ගේද, යහපත පිණිස මුනීන්ද්‍රයන් වහන්සේ චතුශ්සත්‍යාවබොධ කළහ.

50. "පසැස් ඇති සූර්යබන්ධුවූ බුදුරජාණන් වහන්සේ සත්වයින්ට අනුකම්පා පිණිස චතුරාර්යසත්‍ය ධර්මය මනාකොට දෙශනා කරණලදහ.

51. "දුක්ඛ සත්‍යයද, සමුදය සත්‍යයද, නිරොධ සත්‍යයද ඉක්මවා කෙළවර කරන මාර්ග සත්‍යයද උන්වහන්සේ දෙසූහ.

52. "මෙසේ ශාස්තෲන්වහන්සේ විසින් කියනලද ඒ ධර්මය මමද දිටිමි. මා විසින් අර්හත්වය ප්‍රත්‍යක්ෂ කෙළෙමි. බුදුන්ගේ අවවාදයෙහි පිහිටියෙමි.

53. "මම බුදුන්ගේ හමුවෙහි යම්බඳුවූ බෙදා පෙන්නුම් කරනලද ශ්‍රෙෂ්ඨ ධර්මයකට පැමිණියේද, මගේ පැමිණීම යහපත් පැමිණීමක් විය.

54. "ෂඩභිඥාවන්ටද පැමිණියෙමි. සොත ධාතුවද, පිරිසිදු කෙළෙමි. ත්‍රිවිද්‍යාවද ලැබුවෙමි. සිත පිරිසිඳ බැලීමේ දක්ෂවූයේ ඍද්ධි බැව් ඇත්තෙක්ද වීමි.

55. "උසස් ප්‍රඥාවෙන් යුක්තවූ ශාස්තෲන්වහන්ස, ඔබවහන්සේගෙන් විචාරමි. අග්ගාලව නම් චෛත්‍යයෙහි භික්ෂුවක් කාලක්‍රියා කෙරේද, උන්වහන්සේ මෙලොවදීම සැකයන් දුරුකොට හිටියාවූ තැනැත්තෙක්ව කළුරිය කෙළේද,

56. "භාග්‍යවතුන් වහන්ස, උන්වහන්සේගේ නාමය ඔබවහන්සේ විසින් තබනලද නිග්‍රොධ කප්ප යන නාමයයි. බ්‍රාහ්මණ කුලයෙන් පැවිදිවූ උන්වහන්සේට මම නමස්කාර කරමින් විසුවෙමි. වීර්ය ඇති උන්වහන්සේ නිවනෙහි පිහිටියේද,

57. "ශාක්‍යපුරයෙහි උපන් බුදුරජාණන් වහන්ස, අවශෙෂ පිරිසද මමද ඒ ශ්‍රාවකයන් වහන්සේ දැන ගැනීමට කැමැත්තෙමි. මේ පැණය ඇසීමට අපි සියල්ලෝම බලාපොරොත්තුවෙමු. ඔබවහන්සේ වනාහි අපගේ උත්තම ශාස්තෲහුය.

58. "මේ සැකයට හේතුවූ කාරණාව මහාප්‍රාඥවූ ඔබ වහන්සේ විසින් වදාළ මැනව. දෙවියන් මැද සිටින දහසක් නෙත් ඇති ශක්‍රයා දෙවියන්ගේ සැක දුරුකරන්නාක් මෙන් ඔබවහන්සේද අපට වදාළ මැනව.

59. "මෝහ මාර්ගයෙහිවූ අඥානකම හා විචිකිච්ඡාව ඇති කරන අවිද්‍යාදී ග්‍රන්ථයෝ වෙත්ද තථාගත දේශනා බලයෙන් එය විද්වංශනය කරත්ද, එහෙයින් තථාගතයන් වහන්සේ උතුම්වූ ප්‍රඥාචක්ෂුසය ඇති උත්තමයා වන්නේය.

60. "භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම ප්‍රඥා ලෝකයෙන් යුත් නිසා වාතයෙන් වැසි කළු දුරුකරන්නාක් මෙන් සත්වයන්ගේ ක්ලේශාන්ධකාරය දුරුකරන්නාහ.

61. "පණ්ඩිත පුරුෂයෝද ප්‍රඥාලෝකය උපදවත්. ඒ නිසා වීර්යයෙන් යුක්තවූ භාග්‍යවතුන් වහන්ස, සියලු දේ දන්නා ඔබවහන්සේ කරා පැමිණි අපට නිග්‍රොධ ස්ථවිරයන් වහන්සේ පිළිබඳ කරුණු ප්‍රකාශ කළ මැනව.

62. "මිහිරි වචන ඇත්තාවූද, ස්වර්ණ හංසයෙකුට බඳුවූ සුන්දරතරවූද, ඔබවහන්සේගේ වචන විපිළිසර නොවූ සිතින් යුක්තවූ අපි අසන්නෙමු.

63. "ඉපදීම හා මරණය ශෙෂ නොකොට සියලු පව් නසා ප්‍රතිවෙධ කළ ධර්මය පෘථග්ජනයන්ට තත්වූ පරිද්දෙන් නොදත හැකිය. ප්‍රඥාපූර්වංගම තථාගතයන් වහන්සේට ඒ ධර්මය දැකීමටත් කීමටත් හැකිය.

64. "තොපගේ භාග්‍යවතුන් වහන්සේ ඍජුවූ ප්‍රඥාවෙන්ද, ව්‍යාකරණ සම්පන්නතාවයෙන්ද, යුක්තවූයේ සියල්ලම අව පරීතව දක්නා ලද්දේය. ඔබවහන්සේට මාගේ ප්‍රණාමය වේවා. අලාමක ප්‍රඥාවෙන් යුක්තවූ බුදුරජාණන් වහන්සේ ඒ ධර්මය නොකීමෙන් මුලාවන්නේය.

65. "ලෞකික ලොකොත්තර වශයෙන් චතුරාර්ය සත්‍යය දැන සියලු දතයුතු ධර්මයන් දක්නේ වීරයන් වහන්ස ග්‍රීෂ්ම කාලයෙහි ජලය වුවමනා කරන්නාක් මෙන් ඔබගේ වචනය බලාපොරොත්තුවෙමි. ඒනිසා ධර්ම වර්ෂාව ඇතිකරන සේක්වා.

**66.** "කප්පායන ස්ථවිරයන් වහන්සේ සේඛද? අසේඛද උන්වහන්සේ කුමක් සඳහා බ්‍රහ්මචරියාව පිරුවෙහිද? උන්වහන්සේගේ පිරිනිවීම සොපාදිශෙෂද? අනුපාදිශේෂද?

**67.** "භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. ඒ නිග්‍රොධකප්පතෙම මේ නාමරූප සංඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි අනුසය නම් තෘෂ්ණාව සිඳින ලද්දේය. ජරාමරණ නැතිකෙළේය. ශ්‍රෙෂ්ඨවූ බුදුන් වහන්සේ මේ බව වදාළහ.

**68.** "ඒ අසා පැහැදුනෙමි. මගේ ප්‍රශ්න කිරිම හිස් නොවීය. ඒ පින්වත් බ්‍රාහ්මණතෙමේ මා නොරැවටීය.

**69.** "කියන පරිද්දෙන් කරන්නාවූද, කරන පරිද්දෙන් කියන්නාවූද, බුදුන්ගේ ශ්‍රාවකයෙක් විය. මාරයාගේ තණ්හා නමැති දැල සිඳින ලද්දේය. දැඩිවූ බහුමානයටද සුදුසුවිය.

**70.** "උපාදානයන්ට මුල්වූ අවිද්‍යා තෘෂ්ණාදී කරුණු ඥාණ චක්ෂුසයෙන් දැක ඒ කප්පායන ස්ථවිරතෙමේ එතර කිරීමට දුෂ්කරවූ මාරයාට යටත් පෙදෙස නම්වූ ත්‍රෛභූමක වෘත්තය ඉක්ම විය.

**71.** "දේවාති දේවවූද, දිපදොත්තමවූද භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේගේ අනුජාත පුත්‍රවූ නිග්‍රොධකප්ප ස්ථවිරයන් වහන්සේ වඳිමි."

**(ථෙරගාථා නිමි.)**

---

# 9. ථෙරීගාථා

## එකක නිපාතය

1. අඤ්ඤතරා (ථෙරිකා) ථෙරී ගාථාඃ- 1. "ථෙරිකාවෙනි, ගින්නෙන් වළඳෙහි මැලවෙන පලා මැල්ලුමක් මෙන් තොපගේ කාමාශාව අනාගාමි මාර්ගයෙන් මැලවුනේද, ඉතිරි කෙලෙස් රහත් මාර්ගයෙන් දවා පාංශුකූල වස්ත්‍ර හැඳ පොරවා සැපසේ

ඉරියව් පවත්වව, අප්‍රසිද්ධ එක් භික්ෂුණියක් මෙසේ මේ ගාථාව කීවාය.” (සෑම ථෙරී ගාථාවකම අවසානයේ තැනට නියමිත නම යොදා මේ ඡේදය යොදාගත යුතුයි.)

**2. මුත්තා ථෙරී ගාථා:-** 2. “මුත්තා වෙනි, චන්ද්‍රයා රාහුගෙන් මිදෙන්නාසේ කාමාදී යොග සතරින් මිදෙව, ආර්ය මාර්ගයෙන් සම්පූර්ණයෙන් මිදුනු සිතින් ආහාර ණය නැතිව අනුභව කරව, භාග්‍යවතුන් වහන්සේ මුත්තා නම් හික්මෙන භික්ෂුණියට මෙසේ මේ ගාථාවම නිතර වදාළසේක.”

**3. පුණ්ණාථෙරී ගාථා:-** “පුණ්ණා වෙනි, පුරපස ළොස්වක්හි සඳමෙන් ධර්මයන්ගෙන් සම්පූර්ණ වෙව. සම්පූර්ණවූ රහත් මාර්ග ඤාණයෙන් නොදැනීම් රාශිය බිඳදමව.”

**4. තිස්සාථෙරී ගාථා:-** “තිස්සාවෙනි, තුන් වැදෑරුම් හික්මීමෙහි හික්මෙව. යහපත් උත්පත්තිය හිස් නොකරන්න. සියලු ආශා නමැති රැහැන් කඩා පඤ්චස්කන්ධ ලොකයෙහි කෙලෙස් නැතිව වසන්න.”

**5. අඤ්ඤතරාතිස්සා ථෙරී ගාථා:-** “තිස්සාවෙනි, ධර්මයන්හි යෙදෙව යහපත් උත්පත්තිය නොඉක්මවව. යහපත් උත්පත්තිය ඉක්මවූවෝ අපායෙහි දුක් විඳිත්

**6. ධීරා ථෙරී ගාථා:-** “ධීරාවෙනි, කෙලෙස් නැසීම ස්පර්ශ කරව. රාගාදී පාප අදහස් සංසිඳවීම ඇති කාමාදී රැහැන් සතරින් නිදහස්වූ ශ්‍රේෂ්ඨ නිර්වාණය අත්පත් කරව.”

**7. වීරා ථෙරී ගාථා:-** “වීරාවෙනි, වීරවූ ආර්ය ධර්මයන්ගෙන් දියුණු කරණලද, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇති භික්ෂුණියක්වූ නුඹ පිරිවර සහිත කෙලෙස් මාරයා පරදවා අන්තිම ශරීරය දරව.”

**8. මිත්තා ථෙරී ගාථා:-** “මිත්තාවෙනි ශ්‍රද්ධාවෙන් පැවිදිව කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි සත්කාර කිරීමෙහි ඇලෙව. නිවන් ලැබීමට කුසල්වූ ආර්ය මාර්ගයන් දියුණු කරව.”

**9. භද්‍රා ථෙරී ගාථා:-** “භද්‍රාවෙනි, ශ්‍රද්ධාවෙන් පැවිදිව යහපතෙහි යහපත්ව ඇලෙන්නෙක් වෙව. කාමාදි රැහැන් වලින් නිර්භයවූ නිවන්යාමට කුසල් දියුණු කරව.”

**10. උපසමා ථෙරී ගාථා:-** "උපසමාවෙනි, මාරයාට අයත් එගොඩවන්නට නොහැකි කාමාදී සතර මහවතුර එතර කරව. සේනා සහිත මාරයා නසා අන්තිම ශරීරය දරන්නියක් වෙව."

**11. මුත්තා ථෙරී ගාථා:-** "වංගෙඩිය, මොහොළ ස්වකීය කුදු ස්වාමියා, යන කුද තුනින් මිදුනෙම් මනාකොට මිදුනෙමි. භවාශාව නසා ජාති මරණ දෙකින් මිදුනෙමි."

**12. ධම්මදින්නා ථෙරී ගාථා:-** "රහත්වීමට තද ආශාව ඇති අවසානය සොයන්නාවූ ඕතොමෝ සෝවාන් ආදී මාර්ගයන් තුනින් නිවන ස්පර්ශ කළාය. කාමයන්හි නොබැඳුන සිත් ඇත්තේ අවිහයෙ සිට අකනිටාවට යන්නීය."

**13. විශාඛා ථෙරී ගාථා:-** "යමක්කොට අපායයෙහි නොතැවේද ඒ බුද්ධාවවාදයට අනුව ක්‍රියා කරව. ඉක්මනට දෙපා සෝදා එකපැත්තක හිඳගනුව."

**14. සුමනා ථෙරී ගාථා:-** "ඇස් කන් ආදී ධාතූහු දුක් වශයෙන් දැක නැවත උත්පත්තියකට නොපැමිණෙව, කාමාදී භවයන්හි ඇල්ම අත්හැර ශාන්තව හැසිරෙන්නෙහිය."

**15. උත්තරා ථෙරී ගාථා:-** "ශරීරයේ වචනයේ හා සිතේ සංවරයෙන් යුක්තවෙව. මුල් සහිත තෘෂ්ණාව උදුරා දමා කෙලෙස් නැති කළේ වෙමි. නිවුනේ වෙමි."

**16. (මහළුව පැවිදිවූ) සුමනා ථෙරී ගාථා:-** "සුමනාවෙනි, මහළුවූ ඔබ පාංශුකූල වස්ත්‍ර හැඳ පොරවා සුවසේ වසව. තොපගේ රාගය සංසිඳුනේය. සිහිල්විය, නිවුනේය."

**17. ධම්මා ථෙරී ගාථා:-** "සැරයටියෙහි ආධාරයෙන් පිඬු පිණිස නුවර හැසිරී වෙවුලන ශරීරයෙන් යුක්තව එහිම බිම වැටුනෙමි. ශරීරයෙහි දොෂය දැක මාගේ සිත කෙළෙසුන්ගෙන් මිදුනේය."

**18. සංඝා ථෙරී ගාථා:-** "ප්‍රියවූ ගෙයද පුත්‍රයන්ද, ගව මහිෂාදීන්ද, අත්හැර රාගයද ද්වෙෂයද අත්හැර, අවිද්‍යාවන් පරදවා මුල් සහිත තෘෂ්ණාව උගුල්ලා දමා සන්සිඳුනෙමි. නිවුනෙමි."

---

# දුක නිපාතය

1. **අභිරූප (ඉතා රූමත්) නන්දා ථෙරී ගාථා:-** "නන්දාවෙනි, ජරාවෙන් ලෙඩවූ කුණුවලින් අපවිත්‍රවූ කුණුවූ මේ ශරීරය බලව."

2. රාගාදී වශයෙන් නොගෙන භාවනා කරව. ඉතිරි සහිත මානය දුරුකරව. එසේ මානය නැතිකිරීමෙන් සන්සුන්ව හැසිරෙව. භාග්‍යවතුන් වහන්සේ නන්දා නම් භික්මෙන භික්ෂුණියට මේ ගාථාවලින් නිතර අවවාද කරති."

2. **ජෙන්තී ථෙරී ගාථා:-** "නිවන් දැකීමට මාර්ගයවූ යම් මේ බොජ්ක්ධංග හතක් වෙත්ද, බුදුන් වදාළ පරිදි ඒ ධර්මයෝ මා විසින් පුරුදු කරණ ලදහ."

3. මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නා ලදී. මේ අන්තිම ශරීරයය. පුනරුත්පත්තිය ක්ෂය විය. නැවත ඉපදීමක් නැත."

3. **සුමංගල මාතා ථෙරී ගාථා:-** "යහපත්ව කෙලෙසුන්ගෙන් මිදුනු තැනැත්තිය මොහොලින් වී කෙටීමෙන්ද ලජ්ජා භය නැති ස්වාමියාගෙන්ද පිළිකුල් බට කර්මාන්තයෙන්ද, පිළුණු ගඳ ගහන මගේ සැළියෙන්ද මිදුනෙමි.

2. මම රාගයද ද්වෙෂයද චිච්චිට චිච්චිට යන අනුකරණයෙන්ම නසමි. ඒ මම ගසමුලට පැමිණ අහෝ සැපයයි සැප වශයෙන් භාවනා කරමි."

4. **අඩ්ඪකාසී ථෙරී ගාථා:-** 1. "කසී රටින් ලැබෙන බද්ද යම්තරම් වීද මට ලැබෙන පඩිය එපමණ විය. නියම ගම් වැසි මහජනතෙමේ වටිනා මා අඩකින් සීමා කළේය.

2. "නැවත මම රූපයෙහි කලකිරුනෙමි. එහි නොඇලුනෙමි. නැවත සසර සැරීමක් නැත. ත්‍රිවිද්‍යාවන්ට පැමිණෙන ලදී. බුද්ධාවවාදය කෙළෙමි."

5. **චිත්තා ථෙරී ගාථා:-** 1. "ඉදින් මම ජරාවෙන් දිරා කෘශවීමි. ලෙඩව ඉතා දුර්වලව සැරයටියේ ආධාරයෙන් ඔබ මොබ යමි.

8. දෙපට සිවුර හා පාත්‍ර පසෙක තබා පර්වතයෙහි හිඳ ආත්මභාවය යටපත් කෙළෙමි. මොහ රාශියද දුරු කළෙමි."

**6. මෙත්තිකා ථෙරී ගාථා:-** "ඉදින් මම දුක් ඇතිව, දුර්වලව, ඉක්මගිය තරුණ වයස ඇතිව, සැරයටියේ ආධාරයෙන් යෙම්ද?

**2.** "පර්වතයට නැගී දෙපට සිවුර පසෙක තබා පාත්‍රයද තබා පර්වතයෙහි හුන්නෙමි. ඉක්බිති මාගේ සිත කෙලෙසුන්ගෙන් මිදුනේය. ත්‍රිවිද්‍යාවන්ට පැමිණියෙමි. බුද්ධාවවාදය කරණ ලදී."

**7. මෙත්තා ථෙරී ගාථා:-** 1. "පක්ෂය පිළිබඳ තුදුස්වක් දිනද, පසළොස්වක් දිනද, අටවක් දිනද, ප්‍රාතිහාර්ය කාලයෙහිද, දිව්‍ය සමූහයා සතුටු වන අටසිල් සමාදන්වීමි.

**2.** "ඒ මම බත් බුදින කාලය පමණ ස්වල්ප වේලාවක් හිස මුඩුකොට දෙපට සිවුර පෙරවීමි. හිතේ කෙලෙස් පිපාසය සන්සිඳුවා දිව්‍ය සැපය ප්‍රාර්ථනා නොකරමි."

**8. අභය මාතා ථෙරී ගාථා:-** 1. "මෑණියෙනි, පත්ලෙන් උඩ හිසකේ වැටියෙන් යට මේ ශරීරය අපවිත්‍ර වශයෙන් කුණු ගඳගහන්නක් වශයෙන් කල්පනා කරව.

**2.** "මෙසේ වාසය කරන්නාවූ මාගේ සියලු රාගය නැති විය. දැවිල්ල සන්සිඳුනේය. සිහිල්ව නිවුනෙමි."

**9. අභයා ථෙරී ගාථා:-** 1. "අභයාවෙනි, පෘථග්ජනයා යම් තැනක ඇලේද මේ ශරීරය වහා බිඳෙන සුළුය. යහපත් නුවණ හා සිහි ඇතිව මේ ශරීරයට ආශා දුරලමි.

**2.** බොහෝ දුකින් පෙළෙන අප්‍රමාදයෙහි ඇලුණු මගේ තෘෂ්ණාව පහවිය. බුදුන්ගේ අවවාදය කළෙමි."

**10. සාමා ථෙරී ගාථා:-** 1. "වීර්යයේ සමාන බවක් නැති හෙයින් සිතට සහනයක් නොලැබ නව වරක් විහාරයෙන් පිටතට ගියෙමි. ඒ මම අටවෙනි රාත්‍රියෙහි තෘෂ්ණාව නැසීමි.

**2.** "ප්‍රමාද නොවීමෙහි ඇලුනාවූ මට බොහෝ දුක් ස්වභාවයන්ගෙන් තණ්හා නැතිකරන්නට හැකිවිය. බුදුන්ගේ අවවාදය පිළිපදින ලදී."

---

# තික නිපාතය

1. **අඤ්ඤතරා (අප්‍රකට) සාමා ථෙරී ගාථා:-** "පැවිදිවී විසිපස් වසක් වනතෙක් මා සිතට සන්සිඳීමක් ලැබුණු බවෙක් නම් කිසි කලෙක නොදනිමි.

2. එසේ සිත සැනසීමක් නොලැබ සිත වසඟ නොවූවා බුදුබණ සිහිකර ඉන් කලකිරීමට පැමිණියෙමි.

3. බොහෝ දුකින් මිරිකෙමින් වීර්යයෙහි ඇළුණු මට නිවන් ලැබිණ. බුද්ධාවවාදය කෙළෙමි. තණ්හාව වියලා අදට සත්දවසක් විය.

4. සිත සැනසීම නොලැබ සිත එකඟ නොවූවා නව වරක් වෙහෙරෙන් පිටවීමි."

2. "**උත්තමා ථෙරී ගාථා:-** "මා විසින් ඇදහිය යුතු වචන ඇති පටාචාරා නම් රහත් භික්ෂුණියක් වීද, ඈ වෙතට පැමිණීමි. ඕතොම ස්කන්ධායතන ධාතූන් ගැන මට දහම් දෙසුවාය.

2. "මට ඇය අනුශාසනා කළ පරිදි ඇගේ ධර්මය අසා සත් දවසක් එක අරමිණියෙන් සිටියෙමි. අටවෙනි දිනයෙහි අඳුරු නසා පය දිග හැරියෙමි."

3. **(අප්‍රකට) උත්තමා ථෙරී ගාථා:-** 1. "යම් මේ අවබෝධයේ අංග සතක් වේද බුදුන් දෙසූසේ ඒ සියල්ල මා විසින් වඩන ලදහ.

2. ශූන්‍යතා අනිමිත්ත යන සමාපත්ති දෙක කැමතිසේ ලබන්නාවූ නිවනෙහි ඇලුනු බුදුන්ගේ උරෙහි වැඩුන දුවක් වීමි.

3. දෙව් මිනිස් සියළු කාමයෝ සිඳින ලදහ. උපදනා සසර ගෙවිණි. මින් මතු නැත වීමක් නැත."

4. **දන්තිකා ථෙරී ගාථා:-** 1. "දවල් විවේකයෙන් නැගිටියේ ගිජුකුළු පව්වෙහි දියෙහි ගැලී ගොඩනැගුණු ඇතෙකු ගංතෙර දිටිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. පුරුෂයෙක් අකුස්ස ගෙන පිටට නැගීමට පය දෙවයි ඉල්ලයි. එවිට හස්තියා පය දිගු කෙළේය. ඉන් ඔහු පිටට නැගිණි.

3. "නොදැමුනාවූ, පසුව හික්මවනලද, මිනිසුන් වසයට ගිය ඌ දැක ඉන්පසුව සිත එකමුතු කෙළෙමි."

**5. උබ්බරී ථෙරී ගාථාඃ-** 1. "උබ්බරිය, දුව ජීව, කියා වනමැද හිඳ හඬන්නෙහිය, තමන් ගැන තේරුම් ගනුව. ජීව නම් සුවාසූ දහසක් සියළු දූවරු මේ සොහොනෙහිම දවන ලදහ. ඔවුන් අතුරෙන් කවරක උදෙසා දුක්වෙහිද?

2. හදවත ඇසුරු කළ දැකීමට නොහැකි හුලක්වූ ශෝකය ඒකාන්තයෙන් ඇද දැමීය. යම් හෙයකින් ශෝකයෙන් යුත් මගේ අනිත්‍ය ශොකය පහ කෙළේය.

3. "එහෙයින් ඒ මම උපුටා හල හුල් ඇත්තී, ශොක නැත්තී පිරිනිවියා වෙමි. මුනිවරය, බුදුන් දහම් සඟුන් සරණ කොට යමි."

**6. සුක්කා ථෙරී ගාථාඃ-** 1. "බුදුබණ දෙසන සුක්කා භික්ෂුණිය වෙතට යමෙක් නොපැමිණෙත්ද, ඒ මේ රජගහවැසියෝ මී බීවන් මෙන් හිඳිති.

2. නෛයාර්නිකවූ අමෘත රසය වගුරුවන ඕජාවත්වූ එයද මගීහු වැහි දිය මෙන්, නුවණැත්තෝ ඉතා ආදරයෙන් බොත්.

3. "සුක්කාවෙනි, පවිත්‍ර ධර්මයෙන් යුක්තව ඇළුම් නැතිව එකඟ සිත්ව සේනා සහිත කෙලෙස් මරු දිනා මේ අන්තිම ශරීරය උසුලව."

**7. සේලා ථෙරී ගාථාඃ-** 1. "ලෝකයෙහි මිදීමක් නම් නැත. විවේකයෙන් කුමක් කෙරේද? කාම රුචීන් අනුභව කරව. පසුව පසුතැවිලි නොවෙව.

2. කාමයෝ ශරීර කොටන ආයුධයක් හා හුලක් වැනියහ. තා කියනා ඒ කාමරතිය මට නම් දැන් අරතියෙකි.

3. සියල්ලෙහි තෘෂ්ණාව වනසන ලදී. මෝහ රාශිය පළන ලදී. මාරය, මෙසේ දනුව, පාපිය, තෝ නැසුණෙහිය."

**8. සෝමා ථෙරී ගාථා:-** 1. "බුද්ධාදීන් විසින් ලැබිය යුතු ස්ථානයවූ, ලැබීමට දුෂ්කරවූ, යම් ස්ථානයක් වේද, එය දෑඟිලි නුවණ ඇති ස්ත්‍රියක විසින් ලැබිය නොහැකියි.

2. සිත එකමුතු කළ ඥාණය පවත්නා සමයෙහි මනා කොට ධර්මයන් දක්නාවූ අපට ස්ත්‍රී බව කුමක් කෙරේද?

3. සියල්ලෙහි තෘෂ්ණාව වනසන ලදී. මෝහ රාශිය පළන ලදී. ලාමකය, මෙසේ දනුව, මාරය, තෝ නැසුණෙහිය."

---

# චතුක්ක නිපාතය.

**1. භද්‍රාකාපිලානී ථෙරී ගාථා:-** 1. "සර්වඥයන් වහන්සේගේ පුත්‍රවූ, ආර්ය දායාදය ඇත්තාවූ සමාධිගත සිත් ඇති පෙර විසූ කඳ පිළිවෙළ දන්නාවූ දෙව්ලොව අපාය දක්නාවූ නොඉපදීම නම්වූ අර්හත්වයට පැමිණියාවූ විශිෂ්ට ඥානයෙන් ධර්මයන් දක්නාවූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ නිශ්ශබ්දතා ගුණයෙන් යුක්ත මේ ත්‍රිවිද්‍යාවෙන් යුත් බ්‍රාහ්මණයෙකි. (පව් දුරැ කෙළේයි.)

2. "එසේම තුන් නුවණ ඇති පිරිස් සහිත මාරපරාජය කළාවූ භද්‍රාකාපිලානීද අන්තිම ශරීරය දරයි.

3. "ලෝකයෙහි ඇති දොෂ සලකා පැවිදි වීමු. ඒ අපි දැමුනෝ වෙමු. පව් ගෙවීමු. සිහිල්වූවෝ වෙමු. නිවුනෝවෙමු."

---

# පංචක නිපාතය

**1. අඩ්ඪකාසි ථෙරී ගාථා:-** "යම්හෙයකින් පැවිදිව විසිපස් වසක් මුළුල්ලෙහි අසුරු ගසන පමණකුදු සිතේ සන්සුන් කමක් නොලදිමි.

2. "මම, එසේ සිත සන්සුන් වීමක් නොලැබ කාම ආශාවෙන් තෙත්ව හිස අත බැඳ හඬමින් විහාරයට ගියෙමි.

3. "මා විසින් ඇදහියයුතු ඒ ධම්මදින්නා නම් භික්ෂුණිය වෙතට පැමිණියෙමි. ඕතොම ස්කන්ධායතන ධාතූන් ප්‍රකාශිත ධර්මය මට දේශනා කළාය.

4. "එම භික්ෂුණියගේ ධර්ම කථාව අසා එකත්පසෙක හුනිමි. පෙර ජාති දනිමි. දිවැස පිරිසිදු කරණ ලදී.

5. "පරසිත් දැනීමේ නුවණද, දිව කණද පිරිසිදු කරණ ලදී. මා විසින් පෙළහර පෑමේ නුවණ අත් දක්නා ලදී. මාගේ පව් ගෙවීයාම විය. විශෙෂ දැනීම් සය අත් දක්නා ලදී. බුද්ධාවවාදය කරණ ලදී."

**2. විමලා (පුරාණ ගණිකා) ථෙරී ගාථාः-** 1. "ශරීර පැහැයෙන්ද, රූපයෙන්ද, සැපතින්ද, යසසින්ද, තරුණ කමින්ද මත්වූවා තදවූවා අන්‍ය ස්ත්‍රීන් ඉක්මවා සිතමි.

2. "මෝඩයන් කථාකරණ මේ කය විසිතුරු කොට සරසා, වැද්දා මළපුඩුව හෙලා බලාසිටින සේ වෙශ්‍යාගෘහයෙහි සිටියෙමි.

3. "ආභරණ හැප්පීමෙන් බොහෝ රහස් තැන් දැක්වීමෙන්, මහජනයාට සිනාසෙමින් නොයෙක් රුවටීම් කෙළෙමි.

4. ඒ මම අද හිස මුඩුකොට දෙපොට සිවුරු පොරවා පිඬු පිණිස හැසිර ද්විතියධ්‍යානය පටන් අර්හත්වය ලබා ගස් මුලෙක හුන්නී වෙමි.

5. "දෙව් මිනිසුන් ඒ සියළු බැඳුම් සිඳ සියලු පව් ගෙවා සිහිල් වීමි. නිවුනෙමි."

**3. සීහා ථෙරී ගාථාः-** 1. "පෙර මා සිත වසඟ නැති කල්හි නුනුවණින් කල්පනා කිරීමෙන් කාමරාගයෙන් මැඩී ඇවිසුණු සිත් ඇත්තී වීමි.

2. "කෙලෙසුන්ගෙන් මඩනා ලද්දී, රූපාදීන්හි ශුභ හැඟීම් අනුව පවත්නා සුළුවූවා. රාග සිතට වසඟව සිතේ සන්සිඳුමක් නොලදිමි.

3. "කෙට්ටුවී, සුදුමැලිව, අවලක්ෂණව සත්වසක් මුළුල්ලෙහි හැසුරුනෙමි. රෑ දාවල දෙක්හිම පැමිණියා සැපයක් නම් නොවින්දෙමි.

4. නැවත ගිහි බවට පැමිණ හැසිරීමට වඩා ගෙල වැල් ලා මිය යාම හොඳය කියා රැහැණක් ගෙණ වනය තුලට පිවිසියෙමි.

5. මලය දැඩි කොට ගස අත්තක බැඳ එහි ගෙල ඇතුලු කෙළෙමි. එකෙණෙහි මා සිත මිදුනේය."

4. **සුන්දරී නන්දා ථෙරී ගාථා:-** 1. "නන්දාවෙනි, ගිලන්වූ අපවිත්‍රවූ කුණුවූ මේ ශරීරය බලව. එකඟව සිත මනාව අරමුණෙහි පිහිටුවා සිත අශුභ භාවනාවෙන් වඩව.

2. දුගඳවූ, සැරව වැහෙන, මෝඩයන් සතුටු කරණ මෙය යම්සේද, තීගේ මේ සිරුරත් එසේමයි. එය යම්සේද මෙයත් එසේය.

3. රෑ දාවල අනලසව මෙසේ මේ දකිමින් පසුව ස්වකීය ප්‍රඥාවෙන් කලකිරීම දිටිමි.

4. අප්‍රමාදව නුවණින් සලකන්නාවූ ඒ මා විසින් මේ කය තම ඇතුළත පිටත වශයෙන් තතුසේ දක්නා ලදී.

5. "එසේ ඇති කල්හි මම ශරීරයෙහි කලකිරුණෙමි. ඇතුළු කයෙහිද නොඇලුනෙමි. අප්‍රමාදව, සියලු බැඳුම් වලින් සන්සිඳුනෙමි නිවුනෙමි."

5. **නන්දුත්තරා ථෙරී ගාථා:-** 1. "ගින්නද සඳද, හිරුද දෙවියන්ද මම නමස්කාර කෙළෙමි. ගං තොටුපලවලට ගොස් දියට බසිමි.

2. බොහෝවත් සමාදානයෙන් අඩක් හිස මුඩුකෙළෙමි. ඇතිරිලි නැති බිම නිදාගනිමි. රෑ අහරින් වැළකුණෙමි.

3. සැරසීමෙන්ද, පැළඳීමෙන්ද, නෑමෙන් හා ඇඟ ඉලීමෙන්ද කාමරාගයෙන් පීඩිතව මේ කය නැගිටුවෙමි.

4. එයින් පසු ශ්‍රද්ධා ඇතිවැ සස්නෙහි පැවිදිවීමි. මේ ශරීරය තතුසේ දැක කාමරාගය ඉගිලවීමි.

5. ආශාවද, ප්‍රාර්ථනාවද, සියලු උත්පත්තීද සිඳින ලදී. සියලු කාමාදී යෝගයන්ගෙන් වෙන්ව සිත සන්සිඳීමට පැමිණියෙමි.”

**6. මිත්තාකාලී ථෙරී ගාථා:-** 1. “මම ගිහිගෙයින් සස්නෙහි ශ්‍රද්ධාවෙන් පැවිදිව එතැන මෙතැන ලාභ සත්කාරවල ඇලී හැසුරුනෙමි.

2. උතුම් අදහස ඉවතලා හීනාර්ථය සෙවීමි. කෙලෙසුන් වසයට පැමිණ මහණකමේ අදහස නොදනිමි.

3. පන්සලෙහි උන්නාවූ ඒ මට තෘෂ්ණාවට වසඟව නොමගට ගියෙමියි සංවේගයක් විය.

4. මාගේ ජීවිතය ඉතා ස්වල්පයි. ඒ ද ජරාව හා ලෙඩ මිරිකයි. කය ජරාවට පැමිණ බිඳේ. මට පමාවීමට දැන් කල් නොවෙයි.

5. “ස්කන්ධයන්ගේ ඇතිවීම නැතිවීම තතුසේ සලකන්නී මිදුනු සිත් ඇතිව නැඟී සිටියෙමි. බුද්ධ වචනයට අනුව ක්‍රියා කෙළෙමි.”

**7. සකුලා ථෙරී ගාථා:-** 1. “ගිහි ගෙය වසන මම භික්ෂූන් වහන්සේ නමකගෙන් බණ අසා රාගාදීන් තොරවූ නොමැරෙන නිර්වාණයට යන දහම දිටිමි.

2. “ඒ මම පුතාද දුවද ධන සම්පත්ද හැර කෙහෙ සිඳුවා ශාසනයෙහි පැවිදි වීමි.

3. “හික්මෙන්නකුවූ මම මතු මග වඩන්නී එයින් නැසියයුතු කෙලෙසුන්ද කාමය හා කොපයද දුරු කෙළෙමි.

4. “උපසපන් මෙහෙණියක්ව පූර්ව ජාතිය සිහිකිරීමි. පිරිසිදුව මනාව වඩන ලද දිවැස පිරිසිදු කෙළෙමි.

5. “හේතුවෙන් හටගත් වහා බිඳෙන සංස්කාරයන් සතුරු වශයෙන් දැක සියලු පව් දුරු කෙළෙමි. සිහිල් වීමි. නිවුනෙමි.”

**8. සොණා ථෙරී ගාථා:-** 1. “මේ රූප කායයෙන් දරුවන් දසදෙනෙකු වදා, දුර්වලවූවා, මහලු වූවා, භික්ෂුණියක් වෙතට ගියෙමි.

2. ඕතොම මට ස්කන්ධ ආයතන ධාතූන් ගැන ධර්ම දේශනා කළාය. ඇගේ ධර්මය අසා කෙහෙ සිඳ පැවිදිවීමි.

3. "හික්මෙන්නාවූ ඒ මාගේ දිවැස පිරිසිදු විය. මා විසූ පෙර ජාති දනිමි.

4. "එකඟව, මනාව සිත එකමුතු වූවා අනිමිත්ත භාවනාව වැඩීමි. තෘෂ්ණා වශයෙන් නොගෙණ නිවී, අනතුරුව මිදුනා වීමි.

5. "මුල් කැපූ, නුවණින් දන්නා ලද පංචස්කන්ධයෝ පවතිත්. ලාමකවූ දිරූ තිගේ ශරීරයට නින්දා වේවා. නැවත වීමක් දැන් නැත."

9. **භද්‍රා කුණ්ඩලකෙසී ථෙරී ගාථාඃ**- 1. "ඉගුලූ හිසකෙහෙ ඇති, දත් මල දරන්නාවූ එක් සළුවක්ම හඳනා පොරෝණා කොට ඇත්තී, නිවැරැද්දෙහි වරදයයි කල්පනා ඇතිව, වරද නිවරදයයි කල්පනා ඇතිව පෙර හැසුරුනෙමි.

2. "ගිජුකුළු පව්වෙහි දවල් විවේකයෙන් නික්මුණ මම භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද රාග නැති සර්වඥයන් වහන්සේ දිටිමි.

3. "වෙතට ගොස් දෙදණ බිම හැන දොහොත් මුදුන්දී වැන්දෙමි. භාග්‍යවතුන් වහන්සේ එව පින්වතියයි වදාළ සේක. එය මගේ උපසම්පදාව විය.

4. "අංග, මගධ, වජ්ජී කාසි, කෝසල යන ජනපද ඇසුරුවිය. ණය රහිතවීමි. පණස් වසක් රට වැසියන් දුන් පිණ්ඩාහාරය අනුභව කෙළෙමි.

5. "යමෙක් තෙම රහත්වූ භද්‍රාවට සිවුරක් දුන්නේද ඒ මේ නුවණැති උපාසක තෙම ඒකාන්තයෙන් බොහෝ පින් රැස් කර ගති."

10. **පටාචාරා ථෙරී ගාථාඃ**- 1. "මිනිස්සු නගුලින් කෙත සා බිම බිජු වපුරා ඉන් අඹුදරුවන් පෝෂ්‍ය කරමින් ධනයද ලබති.

2. "සීල සම්පන්නවූ ශාස්තෘ වචනය කරන්නාවූ කුසීත නොවූ, උඩගු නොවූ මම කිම නිර්වාණය නොලබම්ද?

3. "පා සෝදා සිට උස් බිමින් මිටි බිමට ගලා ආ පා සේදූ දිය දැකැ ඒ ජලය කෙරෙහි භාවනා කෙළෙමි.

4. "අසරුවකු ආජානීය අශ්වයා දමනය කරන්නා සේ සිත සන්සුන් කෙළෙමි. ඉක්බිති මම පහනක් ගෙන පන්සලට ගියෙමි.

5. "යහන බලා සිහි ඇඳෙහි වැද ගතිමි. ඉන්පසු ඉද්ද ගෙන පහන් තිරය ඇද්දෙමි. එකෙණෙහිම පහන නිවුනාක් මෙන් සිත නිවුනේය."

11. **තිංසමත්තා ථෙරී ගාථා**:- 1. "මනුෂ්‍යයෝ මොහොල් ගෙන වී කොටා අඹු දරුවන් පොෂ්‍ය කරමින් ධනවත්ද වෙති.

2. "යමක් කොට පසුව නොතැවේද ඒ බුද්ධ ශාසනය කරව. වහා පා සෝදා එකත්පසෙක හිඳිව්. සිත සන්සිඳවීමෙහි යෙදී බුද්ධාවවාදය කරව්.

3. "ඒ භික්ෂුණීහු පටාචාරා තෙරණියගේ දේශනාව අසා පා සෝදා එක පසෙක හුන්නාහුය. සිත සන්සුන් කිරීමෙහි යෙදී බුද්ධ නියමය කළහ.

4. "රෑ මුල් යාමයෙහි පෙරවිසූ කඳ පිළිවෙළ සිහි කරණ දැනීම ලැබූහ. රාත්‍රි මධ්‍යම යාමයෙහි දිවැස පිරිසිදු කළහ. රෑ පසුයම අඳුරු කඳ නැසූහ.

5. "නැගිට පා වැඳ ඔබගේ අනුශාසනය කෙළෙමු. යුද්ධයෙන් දිනූ සක්දෙව් රජු පිරිවරා සිටි තව්තිසා දෙවියන් මෙන් ඔබ පිරිවරා හැසිරෙමු. තුන් දැනීම් ඇත්තමු. පව් නැත්තමු."

12. **චන්ද්‍රා ථෙරී ගාථා**:- 1. "පෙර නෑදෑ මිත්‍රයින්ගෙන් තොරවූ වැන්දඹුවූ පුත්‍රයන් නැත්තාවූ බතක් වතකුදු නොලබන දිළිඳු තැනැත්තියක් වීමි.

2. "මැටි බඳුනක්ද, සැරයටියක්ද ගෙන ගෙන්ගෙට සිඟා යමින් ශීතයෙන් උෂ්ණයෙන් මිරිකෙමින් මම සත් අවුරුද්දක් හැසුරුනෙමි.

3. "ආහාර පාන ලබන භික්ෂුණියක දැක වෙතට පැමිණ ශාසනයෙහි පැවිදි කරවයි කීමි.

4. "ඒ පටාචාරාවද අනුකම්පාවෙන් මා පැවිදි කළාය. අනතුරුව මට අවවාද කොට පරමාර්ථයෙහි යෙදීය.

5. "මම ඇගේ වචනය අසා අනුශාසනා කෙළෙමි. ආර්යාවගේ අවවාදය සඵල විය. ත්‍රිවිද්‍යාලාභී වීමි. පව් නැත්තියක වීමි."

---

# ඡක්ක නිපාතය.

1. **පඤ්ච සත ථෙරී ගාථා:-** 1. "මෙහි ආවාවූද, මින් ගියාවූද යමකුගේ මාර්ගය නොදනියිද? කොයින්දෝ ආවකුම මගේ පුතයි හඬති.

2. "මෙහි ආවාවූද, මින් ගියාවූද ඔහුගේ ගමන් මග දනු නම් ඔහුට ශොක නොකරව. සතුන්ගේ ස්වභාවය මෙසේය.

3. "නොඉල්ලන ලදුව එයින් මෙහි ආය. එසේම නොදන්වා කොහේදෝ සිට අවුත් කීප දවසක් මෙහි වැසමින් ගියේය.

4. "මෙයිනුත් අන්භවයකට ගියේය. ඉනුත් අන් තැනකට යෙයි. මළ තැනැත්තේ මනුෂ්‍යාදී රූපයෙන් ඔබ මොබ හැසිරෙමින් යන්නේය. මෙහි ආලෙසම එසේ ගියේය. එහි කවර නම් වැලපීමක්ද?

5. "මගේ හෘදය ඇසුරු කළ දුකසේ දැක්කයුතු දුක් උල ඉගිලවීය. ශෝකයෙන් පීඩිත මගේ ඒ දුහිතෘ ශොකය දුරු කෙළේය.

6. "ඒ මම උපුටා කළ හුල් ඇත්තී, තෘප්තියට පැමිණියා සපුරා නිවුනෙම්ද මුනින්වහන්ස අද බුදුන් දහම් සඟුන් සරණ කොට යමි."

2. **වාසෙට්ඨී ථෙරී ගාථා:-** 1. "පුත්‍ර ශෝකයෙන් පීඩිතවූවා අවුල් සිත් ඇත්තී එයින්ම පිරිසිදු සිහිනැත්තී නිර්වස්ත්‍රවූවා විසිරුණු කෙස් ඇත්තී මම තැනින් තැන හැසුරුණෙමි.

2. "කසල ගොඩවලද, සොහොනෙහිද, වීථිවලද විසීමි. බඩසා පවසින් පෙළෙමින් තෙවසක් හැසුරුණෙමි.

3. "නොදැමුණාවුන් දමනය කරවා සියල්ල දත් කිසිවකින් භයක් නැත්තාවූ, ශොභන ගමන් ඇත්තාවූ මිපීලාව බලා වඩින්නාවූ බුදුන් දුටිමි.

4. "ප්‍රකෘති සිහිකල්පනා ලැබ වැඳ උන්වහන්සේ වෙතට පැමිණියෙමි. ඒ ගෞතමයන් වහන්සේ අනුකම්පාවෙන් මට දහම් දෙසූසේක.

5. "උන්වහන්සේගේ ධර්මය අසා ශාසනයෙහි මහණවීමි. බුදුන්ගේ වචනයෙහි යෙදී නිර්වාණ පදය අත්කෙළෙමි.

6. "මේ අන්තකොට ඇත්තාවූ සියළු ශෝකයෝ සිඳින ලදහ. යමෙකින් ශොකයන්ගේ පහළවීම වේද, ඒ වස්තුව මා විසින් පිරිසිඳ දන්නාලදී."

3. **ඛෙමා ථෙරී ගාථා:-** 1. "නුඹත් රූමත් තරුණියෙකි. මම ඒ එසේම පැහැපත් තරුණයෙකි. පසඟතුරු වැයුමෙන් යුක්තව සිත් අලවමු. ඛෙමාවෙනි එන්න.

2. "ලෙඩවූ වහා බිඳෙනසුළුවූ කුණු කය කරණකොට ගෙන පීඩාවෙමි. ලජ්ජාවෙමි. කාම තෘෂ්ණාව නසනලදී.

3. "කාමයෝ ශරීරයන් බිඳීමට සැතක් හා හුලක් වැනියහ. තා කියන කාමරතිය මට නම් දැන් අරතියෙකි.

4. "සියල්ලෙහි තෘෂ්ණාව වනසන ලදී. මෝහ රාශිය පලන ලදී. වාමකය, තෝ නසනුලැබීය. මෙසේ දනුව.

5. "අඥාණයෝ චන්ද්‍ර සූර්යාදී තාරකාවන්ට වඳිමින් වනයෙහි ගිනි දෙවියන් පුදමින් තත්වාකාරය නොදැන සුද්ධිය නොදනිත්.

6. "මමද පුරුෂොත්තමවූ සම්බුදුන් වඳිමින් සියලු දුකින් මිදුනෙමි. ශාස්තෘ ශාසනය කරන්නියක් වීමි."

4. **සුජාතා ථෙරී ගාථා:-** 1. "අලංකාරව, මහඟු වස්ත්‍ර හැඳ, මල්දම් පැළඳ, සඳුන් හා සියළු ආභරණයන් ගවසා දාසී සමූහයා පිරිවරණ ලදුව,

2. "බොහෝ ආහාරද, ඛාද්‍යයද භොජ්‍යයද ගෙන්වා ගෙණ ගෙයින් නික්ම උයනට පැමිණියෙමි.

3. "ඒ උයනෙහි සිත් අලවා, සෙල්ලම්කර සිය ගෙට එන්නී. සාකේත නුවර අඤ්ජන වන විහාරය බලන්නට පිවිසියෙමි.

4. "එහි වැඩහුන් ලොවට පහනක්වූ සර්වඥයන් වහන්සේ දැක වැඳ උන්වහන්සේ වෙතට පැමිණියේය. ඒ ඇස් ඇති සර්වඥයන් වහන්සේ අනුකම්පාවෙන් මට ධර්ම දේශනා කළසේක.

5. "මහර්ෂිවූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා සත්‍යයන් තේරුම් ගතිමි. එහිදීම පහවූ රාග රජස් ඇති නිර්වාණ පදය ස්පර්ශ කෙළෙමි.

6. "ඉන්පසු දහම්දත් මම සර්වඥ ශාසනයෙහි පැවිදිවීමි. තුන් දැකීමට පැමිණියා, සර්වඥ ශාසනය නොසිස්කොට දකිමි.

**5. අනොපමා ථෙරී ගාථා:-** 1. "බොහෝ සම්පත් ඇති මහත් ධන ඇති උසස්වූ කුලයෙක උපන්නෙමි. පැහැයෙන් රූපයෙන් සම්පූර්ණවූ මම මේඝ නම් සිටුහට දුවක් වීමි.

2. "රාජපුත්‍රයන් විසින් පතනලදුව, සිටුපුත්‍රයන් විසින් කැමතිව මට අනොපමාව රඳවයි කියා මපියාණන් වෙතට දූතයන් එවූහ. ඔබේ දූ වූ මේ අනොපමාව යම් පමණකට කිරා බැලීමෙන් බරද, ඉන් අටගුණයක් රන් මැණික් දෙමි.

3. "ඒ මම ලොවට උසස්වූ අත්‍යුත්තම බුදුන් දැක ඒ බුදුන්ගේ සිරි පතුල් වැඳ එකත්පසෙක හුන්නෙමි.

4. "ඒ ගෞතම සර්වඥයන් වහන්සේ අනුකම්පාවෙන් මට දහම් දෙසූ සේක. හුනස්නෙහිම අනාගාමී ඵලය ලදිමි.

5. "ඉන්පසු ඉස කෙස් කපාහැර සස්නෙහි පැවිදිවීමි යමකින් තෘෂ්ණාව වියලා අද මේ සත්වන රැය වෙයි."

**6. මහා ප්‍රජාපතීගොතමී ථෙරී ගාථා:-** 1. "යමෙක් මා සසර දුකින් මිදූද, අන්‍ය සත්වයිනුත් සසර දුකින් මිදූද, සියළු සත්වයන්ට උතුම්වූ බුද්ධ වීරයන්වහන්ස, ඒ ඔබට නම ස්කාරය වේවා,

2. "සියළු දුක මා දැනිණි, සසරට හේතුවූ තෘෂ්ණාව වියලනලදී. ආර්ය අෂ්ටාංගිකමාර්ගවූ නිවන ස්පර්ශ කළාය.

3. "පෙර මවුව, පුත්ව, පියාව, සහෝදරයාව පසුව මිත්තණියද විය. මෙලෙස ඇත්ත නොදැන නොලැබ සසර සැරීමි.

4. "මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නාලදී. මේ අන්තිම ශරීරයයි. ඉපදෙමින් හැසිරීම ක්ෂය විය. දැන් මතු ඉපදීමක් නැත.

5. "පටන්ගත් වීර්ය ඇති. කර්ම ක්ෂය කළ දැඩි පැරකුම් ඇති සමගිවූ ශ්‍රාවක සමූහයා දක්නෙම්ද, මේ බුදුවරයන්ට කරණ වන්දනාය.

6. "මහාමායා දේවීතොම බොහෝදෙනාට ඒකාන්ත වැඩ පිණිස ගෞතමයන් ඉපදවී, උන්වහන්සේ ව්‍යාධි මරණ වෙළුණවුන්ගේ දුක්ඛ රාශිය දුරුකළසේක.

7. **ගුත්තා ථෙරී ගාථා**:- 1. "ගුත්තාවෙනි, දරුවන්ද, ඥාති සමූහයා, සම්පත්ද, හැර යමක් පිණිස පැවිදිවූයේද, ඒ වඩව සිතට වසඟ නොවව්.

2. "සිතින් රැවටුනු සත්වයෝ මාරවිෂයෙහි ඇළුනාහු නොයෙක් ඉපදීම් ඇති සසර දිව ඇවිදිත්.

3. "කාමයෙහි රුචියද ක්‍රොධයද ආත්මදෘෂ්ටියද ශීලව්‍රත පරාමර්ශනයද විචිකිත්සාවද යන,

4. "මෙතෙරට ගෙනෙන මේ බැඳුම් නසා, භික්ෂුණිය මෙයට නැවත නොපැමිණෙව.

5. "ඇල්ම, මානය, උඩඟුව, මුලාව යන බැඳුම් සිඳ දුක් කෙළවර කරන්නෙහිය.

6. "සසර හැසිරීම නිමවා, නැවත ඉපදීම දැන මේ දිවියේම සැහී සන්සුන්ව වාසය කරව."

8. **විජයා ථෙරී ගාථා**:- 1. "සිත වසඟ නොවන කල්හි සිත එකමුතුවක් නොලැබ, නවවරක් විහාරයෙන් බැහැර ගියෙමි.

2. "භික්ෂුණිය, වෙතට පැමිණ සකසා ධර්මය විචාළෙමි. ඕතොම ධාතු ආයතන යුතු ධර්මය මට දෙශනා කළාය.

3. "ඇගේ වචනය අසා ඒ අනුශාසනාව කරන්නී රෑ මුල් යාමයෙහි පෙර ජාති සිහි කෙළෙමි. රාත්‍රි මධ්‍යම යාමයෙහි දිවැස ලදිමි. පශ්චිම යාමයෙහි අඳුරු කඳ නැසීමි.

4. "එකල්හි ප්‍රීති සැපය ශරීරය පුරා පතුරවා වාසය කෙළෙමි. අඳුර නසා සත්වැනි දවස පය දිගහැරියෙමි."

---

# 7 සත්තක නිපාතය

1. **උත්තරා ථෙරී ගාථා**:- 1. "මේ මනුෂ්‍යයෝ මොහොල් ගෙණ ධාන්‍ය කොටති. අඹුදරුවන් වඩමින් ධනයද රැස්කරති.

2. "යමක්කොට පසු නොතැවේද ඒ බුද්ධ වචනයෙහි උත්සාහ කරව්. පා සෝදා එකත්පසෙක හිඳිව්.

3. "එකඟවූ ඉතා සන්සුන්වූ සිත නඟා වස්තූන් ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් පිළිවෙළින් සිහිකරව්.

4. "මම ඒ පටාචාරා තෙරණියගේ අනුශාසනා වචනය අසා පා සෝදා එකත්පසෙක සිටියෙමි.

5. "රාත්‍රි ප්‍රථම යාමයෙහි පෙර ජාති දැනීම ලදිමි. මැදි රෑ දිවැස ලදිමි.

6. "අළුයම අඳුරු කඳ නැසීමි. තුන් නුවණ ලබා නැඟී සිටියෙමි. ඔබගේ අනුශාසනාව කරණලදී.

7. "තව්තිසා වැසි දෙවියෝ යුද්ධයෙන් දිනූ සක්රජ පිරිවරා සිටින්නාක් මෙන් ඔබ පිරිවරා සිටිමි. තුන් නුවණ ඇත්තී වෙමි. පව් දුරලීමි."

2. **චාලා ථෙරී ගාථා**:- 1. "සිහිය මනාව පිහිටුවා වඩනලද ඉන්ද්‍රිය ඇත්තාවූ භික්ෂුණීතොම සියළු සංස්කාරයන් සන්සිඳුනු සැපවූ නිවන් පදය අත්කෙළේය.

2. "කවරකු උදෙසා කෙස් මුඩු කෙළෙහිද? මෙහෙණියක මෙන් පෙණෙහිද, පාසාණ්ඩයන් රුචි නොකෙරෙහිද, මේ කුමකට මුළාව හැසිරෙහිද?

3. "මින් බැහැරවූ පාසාණ්ඩවයෝ දෘෂ්ටීන් ඇසුරු කරති. ඔහු ධර්මය නොදනිති. ධර්මයෙහිත් දක්ෂයෝ නොවෙති.

4-5. "ශාක්‍ය වංශයෙහි උපන් කෙනෙකු හා සම නොවන බුදුවරයෙක් ඇත. හේ සියළු දෘෂ්ටීන් ඉක්මවන දුක්ය. දුක් හටගැන්මය දුක් නැතිකිරීමය. දුක් නැතිකිරීමේ උපායවූ ආර්ය අෂ්ටාංගික මාර්ගයද යන ධර්මය මට දෙසූහ.

6. "ඒ මම උන්වහන්සේගේ වචනය අසා සස්නෙහි ඇලී වාසය කෙළෙමි. තුන් නුවණ ලබනලදී. සර්වඥ ශාසනය කරණලදී.

7. "සියල්ලෙහි තෘෂ්ණාව නසනලදී. අඳුරු රැසද පලන ලදී. මාරය එසේ දනුව, මාරය, තෝ නසන ලද්දෙහිය."

3. **උපචාලා ථෙරී ගාථා:-** 1. "සිහියෙන් යුක්තවූ නුවණ ඇස ඇත්තාවූ මඩනලද ඉන්ද්‍රියයන් ඇත්තාවූ, භික්ෂුණීතොම මහා පුරුෂයන් විසින් සෙව්නා ලද නිර්වාණපදය අවබෝධ කෙළේයි.

2. "කුමක් හෙයින් ඉපදීම රුචි නොකෙළෙහිද? උපන්නේ පස්කම් සැප අනුභව කෙරෙයි. කාමරතීන් අනුභව කරව. පසුතැවිලි නොවෙව.

3. "උපන්නාට මරණය වෙයි. උපන්නේ අත් පා කන් නාසාදිය කැපීමවූ වධදීම්, සිර කිරීම්, ගහට යුත් දුකට පැමිණෙයි.

4. "ශාක්‍ය කුලයෙහි උපන් නොපරදවන ලද්දාවූ සම්බුද්ධ කෙනෙක් ඇත. උන්වහන්සේ මට ජාතිය ඉක්මවන දුක්ය, දුක් හටගැනීමය. දුක් ඉක්මවීමය. දුක් නසන මෑදුවූ ආර්යඅෂ්ටාංගික මාර්ගය යන ධර්මය දෙසූසේක.

5. "මම උන්වහන්සේගේ ධර්ම කථාව අසා සස්නෙහි ඇලීවාසය කෙළෙමි. තුන් නුවණ ලබන ලදී. සර්වඥ වචනය කරණලදී.

6. "සියල්ලෙහි තෘෂ්ණාව නසනලදී. අඳුරු කඳ දුරලන ලදී. මාරය, එසේ දනුව, මාරය, තෝ නසන ලද්දෙහිය."

---

# 8. අට්ඨක නිපාතය.

1. **සීසූපචාලා ථෙරී ගාථා**:- 1. "ශීලයෙන් යුත් සංවරවූ ඉඳුරන් ඇති භික්ෂුණිතොම ස්වභාවයෙන් මධුරවූ, නිර්වාණ පදයට පැමිණෙයි.

2. "නුඹ පෙර විසූ තාවතිංස, යාම, තුසිත, නිර්මාණරතී පරනිර්මිත නම්

3. "දිව්‍ය භවනයක්වේද, එහි සිත පිහිටුවව.

4. "තාවතිංස, යාම, තුසි, නිර්මාණරතී, පරනිර්මිත යන දෙව්ලෝ වැසි යම් දෙවියෝ විය.

5. "සිය කයෙහි පිහිටවූවාහු සිය කය නොඉක්මවූවාහු ඔහු කලින් කල භවයට පැමිණීමෙන් ජාති මරණයට පැමිණීමෙනි.

6. "සියළු ලෝකය ඇවිලගත්තේය. සියළු ලොව තදින් ඇවිල ගත්තේය. සියල්ල තදින් ඇවිල සිටියි. සියළු ලෝකය තදින් කම්පා වෙයි.

7. "සෙලැවිය නොහැකි අසමානවූ, පෘථග්ජන නොවූවන් සේවනය කළ ධර්මයක් බුදුහු දෙසූද එහි මා සිත ඇළුනේය.

8. "මම උන්වහන්සේගේ වචනය අසා සස්නෙහි ඇලී විසීමි. තුන් නුවණ ලබනලදී. බුද්ධානුශාසනය කරණලදී.

9. "සියල්ලෙහි තෘෂ්ණාව නසනලදී. අඳුරුකඳ පළන ලදී. මාරය, එසේ දනුව. මාරය, තෝ නසන ලද්දෙහිය."

---

# 9. නවක නිපාතය

1. **වඩ්ඪමාතා ථෙරී ගාථා**:- 1. "වඩ්ඪය, ලෝකයෙහි තෘෂ්ණාව තට නොවේවා. පුත්‍රය, නැවත නැවත දුකෙහි කොටස් කරුවෙක් නොවේවා.

2. "වඩ්ඪය, තෘෂ්ණා නැති සැක නැති සිහිල්වූ දමනයවූ පව්හළ මුනිහු සැපසේ වෙසෙති.

3. "වඩ්ඪය, නුඹ ඒ ඍෂීන් විසින් පුරුදු කළ මග දැකීම් පිණිසද දුක් කෙළවර කිරීම් පිණිසද වඩව.

4. "මාගේ මෑණියතොම නිර්භය සේ මේ අවවාදය කියයි. මා කෙරෙහි තව ඇළුම් මාත්‍රයකුත් නැතැයි ඒකාන්තයෙන් සිතමි.

5. "වඩ්ඪය, හීන, උසස්, මැදි ස්වල්පමාත්‍රවූද සංස්කාරයකුත් මට නැත. ස්වල්පවූද තෘෂ්ණාවක් මට නැත.

6. "අලස නොව ධ්‍යාන කරන්නාවූ මාගේ සියළු පව් ගෙවිණ. තුන් නුවණ ලබන ලදී. බුද්ධාවවාදය කෙළෙමි.

7. "අනුකම්පා ඇති මාගේ මෑණියතොම පරමාර්ථ සහිත ගාථා නමැති කෝටුවෙන් සිහි ගැන්විය.

8. "මම ඒ මවගේ අවවාද වචන අසා නිර්වාණය ලැබීම පිණිස ධර්ම සංවේගයට පැමිණියෙමි.

9. "මව විසින් මෙහෙයන ලද ඒ මම රෑ දවල්හි නොඅලස්ව වීර්ය කිරීමෙහිදු සිත් ඇතිව උතුම් ශාන්තිය ස්පර්ශ කෙළෙමි."

---

# 10. ඒකාදසක නිපාතය

1. **කිසාගොතමී ථෙරී ගාථා**:- 1. "කල්‍යාණ මිත්‍ර භාවය සර්වඥයන් වහන්සේ විසින් ලෝකයා උදෙසා වර්ණනා කරණ ලදී. කළණ මිතුරන් සෙවුනේ මෝඩ වුවද පණ්ඩිතවන්නේය.

2. "බුද්ධාදී සත්පුරුෂයන් සේවනය කටයුතුයි. එසේ සේවනය කරන්නවුන්ගේ ප්‍රඥාව වැඩෙයි. සත්පුරුෂයන් සේවනය කරණ තැනැත්තේ සියළුම දුකින් මිදෙයි.

3. "දුකද, දුක ඇතිවීමද, නිවීමද, මාර්ගයද යන උතුම් ඇත්ත සතර දැනගනියි.

4. "සතුන් හික්මවන භාග්‍යවතුන් වහන්සේ විසින් ස්ත්‍රී බව දුකකැයි වදාරණ ලදී. අඹුවන් කීපදෙනෙකු අතර එක් අඹුවක වීමද දුකෙක. වරක් වැදූ ස්ත්‍රීහු-

5. "ගෙලද සිඳ ගනිති. සියුමැලි ශරීර ඇති ඔහු වස කති. ඉපදීම මරණය අතර වූවාහු දෙදෙනාම මහත් පීඩා විඳිති.

6. "වැදීමට යමින් සිය ගෙදරට නොපැමිණ, මගදී වදා හිමියන් මළ තැනැත්තිය දුටිමි.

7. "කාලකන්නියගේ පුත්‍රයන් දෙදෙනාද කළුරිය කළහ. සැමියාද මග මළේය. එක් දරසෑයක මවුපියන්ද සොහොයුරුද දැවෙත්.

8. "දුප්පත් පහත් කුලයන්හි ඉපිද නුඹ විසින් විඳිනා ලද දුක අප්‍රමාණයි. නොයෙක් දහස් ගණන් ජාතීන්හි තිට කඳුළුද පැවතිණි.

9. "සොහොන් මැද විසීමි. එසේම සිය පුත්‍ර මාංශයද කන ලදී. සියල්ලන් විසින් නින්දා කළ කුලවංශ නැසුණු වැන්දඹුවූ මිතොම නිවණට පැමිණියාය.

10. "මා විසින් නිවන් යන ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන ලදී. මම දහම් කැඩපත පැතීමි. නිවන ඇසින් දක්නා ලදී.

11. "ඉගුළු හුල් ඇති බහා තුබූ බර ඇති කළ යුත්ත කළ රහත්වූ කිසාගොතමී ථෙරීවූ මම මෙය කීවේ වෙමි."

---

# 11 ද්වාදසක නිපාතය

1. **උප්පලවණ්ණා ථෙරී ගාථා:-** 1. 'මව් දූ යන අපි දෙදෙන එකකුට භාර්යාවීමු. පෙර නුවූ ලොමුදැහැගන්වන මහත් සංවේගයක් මට පහළ විය.

2. "කාමයෝ අපවිත්‍රය. දුගඳය. කටු සහිතය. යමක ගැලී මවු දූ දෙදෙනවූ අපි පුතුට සමාන භාර්යා වීද ඒ කාමයට නින්දාවේවා.

3. "ඒ මම කාමයෙහි දොස් දැක නිර්භයවූ නිර්වාණය දැක්මට රජගහ නුවරදී ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමි.

4. "පෙර ජාති දනිමි. දිවැස පිරිසිදු කෙළෙමි. පරසිත් දැකීමද දිව කණද පිරිසිදු කරණ ලදී.

5. "මා විසින් ඍද්ධි විධි නුවණ ප්‍රත්‍යක්ෂ කරණ ලදී. පව් ගෙවීමට පැමිණියාය. උසස් දැනුම් සය අත්දුටුවාය. බුද්ධාවවාදය කරණ ලදී.

6. "මම අසුන් සතරදෙනකු යෙදූ රථයක් ඍද්ධියෙන් මවාගෙණ ලොවට පිහිටවූ නොසෙල්වෙන බුදුන්ගේ සිරිපා වැඳ සිටියෙමි.

7. "තෝ අග දක්වා මනාව මල්පිපි රුකක් වෙතට පැමිණ තනිව සිටියෙහිය. නුඹට කිසිදු දෙවැනියක් නැත. ළද බොළඳ නුඹ සල්ලාලයන්ට බිය නොවෙහිද?

8. "සල්ලාලයෝ ලක්ෂයක් එක්ව ආවාහුද? මෙවැනි වන්නාහුය. ලෝමයකුත් නොසැලෙයි, නොවෙව්ලයි මාරය, නුඹ තනිව මට කුමක් කෙරෙහිද?

9. "ඒ මම අතුරු දහන් වෙමි. නුඹේ කුසට හෝ පිවිසියෙමි. බැම අතර හෝ සිටිමි. එසේ සිටින මා නොදක්නෙහිය.

10. "මම වසඟ කරගත් සිත් ඇත්තෙමි. සතර දියුණුව යහපත්ව වඩන ලදී. සිය දැනීම අත්දක්නා ලදී. බුදුන්ගේ ශාසනය කරණ ලදී.

11. "කාමයෝ ස්කන්ධයන් කෙටීමට සැත් උල් වැනිය. තා කියන ඒ කාම ඇල්ම මට නම් දැන් නොඇල්මකි.

12. "සියල්ලෙහි තෘෂ්ණාව වනසන ලදී. අඳුරු කඳ පළන ලදී. මාරය, මෙසේ දැනුව, පාපිය තෝ නැසුනේ වෙහි කීවාය."

---

# 12. සොළස නිපාතය

**පුණ්ණා ථෙරී ගාථාඃ-** 1. "ස්වාමීන්ගේ දඬුවමට බියෙන්ද, ආක්‍රොශයට බියෙන්ද තැතිගත්තී සීත කාලයෙහි දිය ගෙණෙමි. හැමවිට දියට බසිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "බ්‍රාහ්මණය, නුඹ කාට බියවූයේ හැමදාම දියට බස්නෙහිද? වෙවුලන සිරුරු ඇතිව අතිශයින් සිත දුක විඳිනෙහිය.

3. "පින්වත් පුණ්ණාවෙනි. කළ පව් වළකන, කුසල් කරණ මා නුඹ දැනම පිළිවිසිහි.

4. "යම්කිසි මහල්ලෙක් හෝ තරුණයෙක් හෝ පාප කර්මයක් කෙරේද? හේ දිය නෑමෙන් පාප කර්මයෙන් මිදෙයි.

5. "නොදන්නාවූ නුඹට කවර නම් අඥානයෙක් දිය නෑමෙන් පාප කර්මයෙන් මිදේයයි යන මෙය කීයේද?

6. "දියෙහි හැසිරෙන ඒ අනෙක් මැඩි, කැසුබු, මෝරු, කිඹුල් මත්සයාදීහුත් ඒකාන්තයෙන් ස්වර්ගයට යන්නාහු යයි සිතමි.

7. "එළුවන් මරන්නෝද, හූරන් මරන්නෝද, කෙවුලෝද මුව වැද්දෝද ඒ අනෙක් සොරුද වධ ඝාතකයෝද පව් කාරයෝද ස්වර්ගයට යන්නාහ.

8. "ඔහුද දියෙහි ගිලීමෙන් පාපකර්මයෙන් මිදෙත් නම් ඉදින් මේ ගංගාවෝ ඔවුන්ගේ පෙර කළ පාපකර්මය ඉසිලූහ.

9. "බ්‍රාහ්මණය, යමකට බිය වූයේ සැම විට දියෙහි ගිලේද නුඹේ පුණ්‍යයෝද ඒ දියෙහිම පාවෙති. එවිට නුඹ පුණ්‍යයෙන් තොරවූවෙක්ය.

10. "බ්‍රාහ්මණය, එයම නොකරව. ශීත නුඹේ සම නොපෙළාවා. නොමඟට පිළිපන් මා ආර්ය මාර්ගයට පැමිණවී.

11. "එසේ දියේ ගැලීමෙන් මා වැළකූ පින්වතිය. නුඹට මේ සළුව දෙමි. සළුව නුඹටම වේවා. මම සළුව නොකැමැත්තෙමි.

12. "ඉදින් නුඹ දුකට බියවන්නෙහි නම් නුඹට දුක අප්‍රිය නම් එළියේද රහසේද පව්කම් නොකරව.

13. "ඉදින් නුඹ පව් කම් කෙරෙහිද, කරන්නෙහිද, අහසට නැග පලායන්නාවූද නුඹට එයින් මිදීමෙක් නැත.

14. "ඉදින් දුකට බියවන්නෙහි නම්, දුක ප්‍රිය නොවේ නම් නොසැලෙන බුදුන් දහම් සඟුන් සරණ කොට යව. ශීලයන් සමාදන් වෙව. එය නුඹට වැඩ පිණිස වන්නේය.

15. "නුඹ කීලෙස මට වැඩක් වේනම් මෙතැන් පටන් නොසැලෙන බුදුන් දහම් සඟුන් සරණ කොට යෙමි.

16. "පෙර බ්‍රාහ්මණ වීමි. අද ඇත්ත වශයෙන් බ්‍රාහ්මණ වෙමි. එසේ ත්‍රිවිද්‍යා ඇත්තෙමි. වේද සහිත වෙමි. යහපත් බ්‍රාහ්මණ වෙමි නෑවේ වෙමි."

---

# 13. විසති නිපාතය

**අම්බපාලී ථෙරී ගාථා:-** 1. "මගේ කෙස් බමරුන්සේ කළුවිය. කෙළවර කැරකී නැවී ගියේය. ඔහු දැන් ජරාව හණ නූල් මෙන් වෙයි. සත්‍යවාදීන්ගේ වචනය එසේමැයි.

2. "සුවඳ කරවන ලද සුවඳ කරඬුවක් වැනිවූ මල් පුරවන ලද මාගේ කේශ සමූහය දැන් ජරාවෙන් එළු ලොම් ගඳ හමයි. සත්‍යවාදී වචනය සේ අනිකක් නොවීය.

3. "මනාව වැවූ උයනක් වැනිවූ කොස්සෙන් හා රන් පනාවෙන් අවුල් හළ අගින් සැරසුණු ඒ කේශ සමූහය ජරාවෙන් තන්හි තන්හි ගැලවී වැටී තුනීවිය. සත්‍යවාදී වචනය එසේමැයි.

4. "ගෙතූ හිසකේ වැටිවලින් හොබවනලද රන්කමින් සරසන ලද එය පෙර ශොභමානය, එය ජරායෙන් ගිලිහී වැටී පෑතැටිවිය. සත්‍යවාදී වචනය සේ විය.

5. "දක්ෂ චිත්‍ර ශිල්පියකු විසින් මනාව කළ රේඛා මෙන් මා බැම සඟල පෙර බැබලූහ. දැන් දිරීමෙන් රැලි එල්බ සිටියි.

6. "ප්‍රභාශ්වරවූ ඉතා සිත්කළු නිල්වන් දික්වූ නේත්‍රයෝ මැණික් මෙන් බැබලූහ. දැන් ඔහු ජරාවෙන් මැඩී නොහොබිති.

7. "සිලුටුවූ උස්වූ මනාව පෙනෙන නාසිකාව තරුණ වියට සුදුසු පරිදි හෙබීය. දැන් ඒ ජරාවෙන් ඇකිලී පවතී.

8. "මනා කොට නිමවන ලද රන් වළලු මෙන් මාගේ කන්පෙති බැබලූහ. දැන් ඔහු රැලියෙන් යුක්තව එල්බෙති.

9. "කොඳ මල් කැකුළු වැනි මගේ යහපත් දන්තයෝ පෙර හෙබූහ. දැන් ජරානුභාවයෙන් සෙලැවී කහවිය.

10. "වනලැහැබ්හි හැසිරෙන කෙවිලියක් මෙන් මිහිරි කොට දෙඩූයෙමි. දැන් ජරාවෙන් ඒ ඒ තැන දත් වැටුනේය.

11. "මාගේ යහපත් ශ්‍රීවය මනාව ඔප දැමූ සියුම් රන් සකක් මෙන් පෙර බබළාමය. දැන් එය ජරාවෙන් බිඳී නැවී සිටිසේය.

12. "පෙර මගේ දෙඅත් වටවූ අගුලු දඬු මෙන් ඉතා බබළයි. ඔහු පැළුණු පළොල් අතු මෙන් ජරාය.

13. "සිළුටු මුදු හා රනින් සැරසූ මගේ හස්තයෝ පෙර මනාව හෙබූහ. ඔහු ජරාවෙන් මුලපලා අල මෙන් වෙයි.

14. "පිරී වටව එකට ගැටී උස්වූ මගේ පියකරු පියයුරු පෙර බබළයි. වතුර නැති පෙරහන්කඩ මෙන් එල්බ සිටියි.

15. "මගේ මනා ශරීරය මනාව පිරිමැදි රන්පුවරුවක් මෙන් හොබියි. සියුම් ඇඟ රැළියෙන් ගැවසීය.

16. "පෙර මගේ යහපත් කලවා යුවළ ඇත් සොඬමෙන් බබළයි. ඔහු ජරාවෙන් මඩනාලද්දාවූ උණ පුරුක් මෙන් වෙති.

17. "සිනිඳු රත්රන් පා වළලු වලින් හෙබියාවූ මගේ බබළන ඒ කෙණ්ඩා යුවළ ජරාවෙන් තල දඬුමෙන් වේ.

18. "පෙර මාගේ පතුල් ඉඹුල් පුළුනින් පිරුණාසේ මනාව පැවැත්තාහ. දැන් ජරාවෙන් පැලී රැලි වැටී තිබෙයි.

19. "මේ ශරීරය එබඳු විය. දැදුරුවිය. බොහෝ දුක්ඛයන්ට වාසස්ථාන විය. ඒ ආලේප මැටි ගැලවී වැටුණු ජරපත් ගෙයක්ය. සත්‍යවාදී වචනය එසේම වෙයි."

2. **රොහිණී ථෙරී ගාථා:-** 1. "පින්වතිය, නුඹ ශ්‍රමණයයි කියා නිදනෙහිය. ශ්‍රමණයයි කියා පුබුදිනෙහිය. ශ්‍රමණයන් ගැනම වර්ණනා කරන්නෙහිය. නුඹ ශ්‍රමණියක් වන්නෙහිය.

2. "බොහෝ ආහාර පාන ශ්‍රමණයන්ට දෙන්නෙහිය. රෝහිණිය, කවර හෙයකින් නුඹට ඒ ශ්‍රමණයන් ප්‍රිය දැයි දැන් නුඹ විචාරමි.

3. "නොකටයුතු කැමතිවූ, කුසීතවූ, අනුන් දුන් දෙයින් ජීවත්වන බලා බලා සිටින, මිහිරි දෙයම කැමැත්තාවූ ඒ ශ්‍රමණයෝ නුඹට කවර හෙයින් ප්‍රියද?

4. "පියාණෙනි, නුඹ බොහෝ කලකින් ශ්‍රමණයන් ගැන මා අතින් විචාළෙහිය. නුඹට උන්වහන්සේලාගේ නුවණ, සිල්, වැයම කියන්නෙමි.

5. "කටයුතු කැමැත්තාවූ, අනලස්වූ, ශ්‍රෙෂ්ඨ ක්‍රියාවන් කරන්නාවූ උන්වහන්සේලා ඇල්ම තරහ දුරු කෙරෙත්ද එහෙයින් ශ්‍රමණයින් වහන්සේලා මට ප්‍රියයි.

6. "පිරිසිදු ක්‍රියා කරන්නාවූ තුන් අකුසල් මුල් නසත්. උන්වහන්සේලාගේ සියළු පව් ගෙවිණ. එහෙයින් ශ්‍රමණයින් වහන්සේලා මට ප්‍රියය.

7. "ඔවුන්ගේ කයේ කටයුතු පිරිසුදුය. වචනයේ කටයුතුද එසේය. ඔවුන්ගේ සිතේ කටයුතුද පිරිසිදුය එහෙයින් මට මහණහු ප්‍රියය.

8. "පිරිසුදු සක් මෙන්ද මුතු මෙන්ද, ඇතුළත පිටත දෙක පිරිසුදුය. ශුද්ධ ධර්මයන්ගෙන් සම්පූර්ණය. එහෙයින්,

9. "බොහෝ ඇසූ, ධර්මය දරණ, ධර්මයෙන් ජීවත්වන ආර්යයෝ අර්ථයද ධර්මයද ප්‍රකාශ කෙරෙත්. එහෙයින්-

10. "බොහෝ ඇසූ ධර්මය දරණ, ධර්මයෙන් ජීවත් වන ආර්යයෝ එකඟ සිත් හා පැමිණ සිටි සිහි ඇත්තෝ වෙති. එහෙයින්-

11. "දුර ගමන් කරණ යහපත් සිහි ඇත්තාවූ පමණ දැන කථා කරන්නාවූ, උඩඟු නැති ඔහු දුකෙහි කෙළවර දනිත්.

12. "යම් ගමෙකින් බැහැර යෙත්ද, එහි කිසිවක් නොබලත්. අපෙක්ෂා නොකොට යත්.

13. "උන්වහන්සේලා කොටු ගුල්වල ලා නොරකිත්. කළයෙහිද සැලෙහිද නොතබත්. අනුන් නිසා පිළියෙලවූ ආහාරය සොයන්නාහුය.

14. "උන්වහන්සේලා අමු රන් නොපිළිගනිත්. රත්රන් නොපිළිගනිති. රිදී නොපිලිගනිත්. ඒ වේලාවෙහි උපන් පරිදි යැපෙති.

15. "නොයෙක් දනව්වෙන් නොයෙක් කුලයෙන් පැවිදි වූවෝ ඔවුනොවුන් ප්‍රිය කරති.

16. "පින්වත් රොහිණිය බුදුන් දහම් සඟුන් අදහන තද ගෞරව ඇති ඔබ සැබවින් අපට හිත පිණිස කුලයෙහි උපන්නීවෙහි.

17. "නුඹ වනාහි ඉතා උතුම් පින්කෙත දන්නෙහිය. අපගේ දන් ඒ ශ්‍රමණයෝ පිළිගනිද්ද.

18. "මෙහි පිහිටුවන ලද බලිය අපට මහත් ඵල වන්නේය. ඉදින් දුකින් බිය වන්නෙහි නම් දුක තට අප්‍රිය නම්,

19. "බුදුන් දහම් සඟුන් සරණකොට යව ශීලයන් සමාදන්වෙව. එය නුඹට වැඩ පිණිස වෙයි.

20. "එයින් මට වැඩක් වේනම් නොසැලීම් ඇති බුදුන් දහම් සඟුන් සරණකොට යෙමි.

21. "පෙර මම බ්‍රහ්මගේ නෑයෙක් වෙමි. දැන් බ්‍රාහ්මණ වෙමි. තුන් නුවණ ඇති පිරිසිදු සතර මාර්ගයට පැමිණි පව් සෝදා හැරියෙක් වෙමි."

3. චාපා ථෙරී ගාථාः- 1. "අතීතයෙහි සැරයටියක් අතේ ඇත්තේ විය. දැන් මුව වැද්දෙකි. තෘෂ්ණාව හේතුකොට ගෙන රළුවූ ගෝරු මඩින් පරතෙර ඒ මට නොහැකිවිය.

2. "චාපාතොම මා කාමයෙහි අතිශයින් මත්වූවෙකැයි සිතා පුතු නලවයි. එහෙයින් මම චාපාවගේ බැම්ම සිඳ නැවතද පැවිදි වන්නෙමි.

3. "මහා වීරය මට නොකිපෙව, මහාමුනිය මට නොකිපෙව, ක්‍රොධයෙන් යුක්තයාහට ශුද්ධියක් නැත්මය, තපසක් කොයින්ද,

4. "නාලා නම් ගමින් නික්ම පැවිදිවීමි. දැන් කවරෙක් මේ නාලාගම වෙසේද, දැහැමින් කල් යවන ශ්‍රමණයන් ස්ත්‍රීහු රූපයෙන් බඳිති.

5. "කාලය එව, නවතුව, පෙරසේ කාමයන් අනුභව කරව, මමද මගේ ඒ අන්‍ය ඤාතීහුද නුඹ වසඟ කරණ ලදහ.

6. "චාපාවෙනි, තී දැනට වඩා සතර ගුණයකින් ප්‍රියව හැසිරෙමියි කියහිද, තී කෙරෙහි ඇලුණු පුරුෂයෙකුට නම් එය මහත් වෙයි.

7. "කාලය, පර්වතයක් මුදුනෙහි පිපි තිටිග රුකක් වැනිවූ මනාව සුපිපි මල් ඇති දෙළුම් ගසක් බඳුවූ දූපතක් මැද පළොල් ගසක් සමවූ ශරීරාවයව ඇති-

8. "රත් සඳුන් තැවරූ සිරුරු ඇති, උතුම් කසී සළු සඳනාවූ රූපවත් ඒ මා කාට හැර දමායෙහිද?

9. "යම්සේ ලිහිණි වැද්දෙක් ලිහිණියෙකු බඳින්නට කැමතිවේද, එලෙසින් සකස් කළ රූපයෙන් නුඹ මා පෙළන්නෙහිය.

10. "කාලය, නුඹ විසින් උපදවන ලද මේ පුත්‍රඵලයද පුත්‍රයා ඇති මාද කාට හැර දමා යන්නෙහිද?

11. "නුවණැති මහා වීර පුරුෂයෝ පුත්‍රයන්ද ඤාතීන්ද, ධනයද අත් හරිත්. බැඳුම සිඳින ඇතා මෙන් නික්ම පැවිදි වෙත්.

12. "දැන් නුඹගේ මේ පුත්‍රයා දණ්ඩකින් ගසා හෝ සිරියෙන් ඇන හේ බිම දමා හෝ පෙළන්නෙමි. පුත්‍ර ශොකයෙන්වත් නොයෙහි.

13. "ඉදින් පුත්‍රයා බළු සිවල් ආදීන්ට දෙන්නෙහිද, ලාමක තැනැත්තිය පුත්‍රයා නිසා මා නොනවත්වන්නෙහිය.

14. "පින්වත, නුඹ එසේනම් දැන් ගම් නියම්ගම් රජ දනව් ආදී කොතැන කල් යවන්නෙහිද?

15. "පෙරගණ දෙටුවූ මහණුනැයි සිතන අපි ශ්‍රමණයෝ වීමු. ගමින් ගම නුවරවල රජ දහන්හි හැසුරුනෙමු.

16. "මේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නෙරඤ්ජරා ගංතෙර සියළු දුක් නැසීම පිණිස සත්වයන්ට දහම් දෙසන සේක.

17. "මම උන්වහන්සේ සමීපයට යන්නේ උන්වහන්සේ මාගේ ශාස්තෘ වන්නේයයි දැන් අනුත්තර ලොකස්වාමීවූ බුදුන් වන්දනා කරව.

18. "පැදකුණු කොට මට පින් දෙන්නෙහිය. නුඹ මට යම්සේ කියහිද, අප විසින් වනාහි ඒ ලැබිය හැකියි.

19. "නුඹගේ වචනයෙන් ලෝකෝත්තම උත්තර කෙනෙකු නැති බුදුන් වඳිමි. පැදකුණු කොට නුඹට පින් දෙන්නෙමි.

20. "ඉක්බිති කාලතෙම නෙරඤ්ජරා ගංතෙර බලා ගියේය. හෙතෙම දුකද, දුක ඉපදීමද, දුක ඉක්මීමද දුක ඉක්මීමට යායුතු මගවූ උතුම් අටග මගද යන නිවන් පදය බුදුන් දිටී.

21. "මම උන්වහන්සේගේ සිරිපා වැඳ, පැදකුණුකොට චාපාවට කරුණු කියා සස්නෙහි පැවිදි වීමි. තුන් දැනීම ලබන ලදී. සර්වඥ ශාසනය කරණ ලදී.

4. **සුන්දරී ථෙරී ගාථා**:- 1. "පින්වතිය, නුඹ පෙර මියගිය පුත්‍රයන් කමින් රෑ දාවල් දෙක්හි අතිශයින්ම තැවුනෙහිය.

2. "වාසෙට්ඨී බැමිණිය, අද සිය ගණන් දරුවන් කා දමා කවර කාරණයකින් දැඩිසේ ශෝක නොකෙරෙහිද?

3. "බමුණ පෙර නුඹ විසින්ද මා විසින්ද බොහෝ සිය ගණන් දරුවෝද බොහෝ ඥාති වර්ගයාද කා දමන ලදහ.

4. "ඒ මම ඉපදීමෙන් හා මරණයෙන් බේරීම දැන ශොක නොකරමි. නාඬමි. නැවත නොතැවෙමි.

5. "වාසෙට්ඨිය, නුඹ ඒකාන්තයෙන් මෙබඳු පුදුම වචනයක් කීයෙහි. නුඹ කාගේ ධර්මක් දැන ස්ථිරව මෙසේ කියනෙහිද?

6. "බ්‍රාහ්මණය මේ සර්වඥයන් වහන්සේ මිථිලා නුවර සියළු දුක් දුරු කිරීම පිණිස සත්වයින්ට ධර්ම දෙශනා කරණ සේක.

7. "බ්‍රාහ්මණය, අර්හත්වූ ඔබගේ නිදුක්වූ ධර්මය අසා තේරුම් ගත් චතුරාර්ය සත්‍ය ධර්ම ඇත්තී පුත්‍ර ශොකය දුරු කෙළෙමි.

8. "ඒ මමද මිථිලා නගරය බලා යමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මාද සියළු දුකින් මුදවන්නේ නම් ඉතා යෙහෙක.

9. "බ්‍රාහ්මණ තෙම සම්පූර්ණයෙන් මිදුණාවූ උපධි රහිත වූ සර්වඥයන් වහන්සේ දුටුයේය. දුක ඉක්මවූ ඒ සර්වඥයන් වහන්සේ ඕහට-

10. "දුකය, දුක් හටගැන්මය, දුක් නැසීමය, දුක් නැසීමේ මගය, යන දුක් නසන ක්‍රමයවූ චතුරාර්ය සත්‍ය ධර්මය දෙශනා කළසේක.

11. "එහි දක්නා ලද බුදු දහම් ඇතියේ ප්‍රව්‍රජ්ජාව රුචි කෙළේය. සුජාතතෙම තුන් රැයකින් තුන් නුවණ ලැබ රහත් විය.

12-14. "එව රියැදුර, යව, මේ රිය පාවාදී යව. බැමිණියට නිරෝගී බව කියව. දැන් සුජාත බමුණා පැවිදි විය. රෑ තුනින් තුන් නුවණ ලැබීයයි කියව. ඉන්පසු රියැදුරා රියත් මසු දහසත් ගෙන දැන් සුජාත බ්‍රාහ්මණයා පැවිදි විය. රෑ තුනින් තුන් නුවණ ලැබීයයි බ්‍රාහ්මණියට නිරොගී බව කීය.

15. "බ්‍රාහ්මණීය, අශ්ව රථයත් මසු දහසත් නුඹටම වේවා. මමද උතුම් සර්වඥයන් වහන්සේ වෙත පැවිදි වෙමි.

16. "ඇත් ගව අසුන්ද, සිත්කළු මිණි කොඩොල්ද පිරුණු ගෘහ සම්පත්තියද හැර ඔබේ පියා පැවිදි විය. සුන්දරිය, නුඹ මේ සම්පත් අනුභව කරව. නුඹ කුල දායාද ඇත්තීය.

17. "ඇත් ගව අසුන්ද, මැණික් තෝඩුද තවත් මේ ගෙයි සිත්කළු සැපද හැර පුත්‍ර ශොකයෙන් පෙළුනු මපියා පැවිදිවිය. සොහොයුරු ශොකයෙන් මිරිකුනු මමද පැවිදිවෙමි.

18-19-20 "සුන්දරිය, නුඹ යමක් පතන්නෙහි නම් නුඹේ අදහස සමෘද්ධ වේවා. පිණ්ඩපාත ආහාරයද, සිඟීමද, පාංශුකූල වස්ත්‍රයද යන මේ ලබමින් පරලොවට පව් නැත්තී වෙව.

මෙහෙණි සමූහයා බබුළුවන ආර්යාවෙනි, හික්මෙන්නකවූ මා විසින් දිවැස පිරිසිදු කරණ ලදී. මා විසින් පෙර විසූ තැන් දක්නා ලදී.

**21.** "තුන් නුවණ ලබන ලදී. බුද්ධ වචනය කරණලදී. ආර්යාවෙනි, බුදුන් දක්නට සැවැත් නුවර යනු කැමැත්තෙමි. එය දත මැනව.

**22.** "බුද්ධොත්තමයා සමීපයෙහි සිංහ නාදය පවත්වන්නෙමි. සුන්දරිය, රන්වන්, රන්බඳු සිවි ඇති, නොහික්මුණවුන් හික්මවන, කොයි කරුණකින්වත් බිය නැති, ශාස්තෘවූ සම්බුදුන් බලව.

**23.** "කෙලෙසුන්ගෙන් මිදුනාවූ උපධි රහිතවූ, පහවූ රාග ඇති බැඳුම් නැති, කටයුතු කළාවූ, පව් රහිතවූ සමීපයට එන සුන්දරිය බලා වදාළ මැනවි. බරණැසින් නික්ම නුඹ වහන්සේ කරා ආවාවූ,

**24-25** "ශ්‍රාවිකාවූ සුන්දරිතොම, මහාවීරයන් වහන්ස, ඔබවහන්සේගේ ශ්‍රීපාදය වදියි. බ්‍රාහ්මණයන් වහන්ස, නුඹ වහන්සේ සියල්ල දත්සේක. ලෝකයාට අනුශාසනා කරණ සේක. මම කළයුතු කටයුතු කළ, පව් නැති, ළයේ වැඩුණු මුඛයෙන් උපන් ඔබේ දුවණියක් වෙමි. පින්වතිය, නුදුරින් ආ ඒ නුඹට යහපත් ගමනක් වේවා.

**90.** "දැමුනාවූ, සර්වඥ ශ්‍රී පාදයන් වඳනා කැමති, කෙලෙසුන්ගෙන් වෙන්වූ, බැඳුම් නැති, තීමවූ, පව් නැති ශ්‍රාවිකාවෝ මෙසේම එති."

**2. කම්මාරධීතා සුභා ථෙරී ගාථාඃ-** 1. පෙර පිරිසිදුවූ, වස්ත්‍රයෙන් සැරසුනාවූ, බාලවූ මම යම් ධර්මයක් ඇසූයෙම්ද ඒ නොපමාවූ මට චතුරාර්ය සත්‍යාවබෝධ විය.

**2.** "එතැන් පටන් මම සියළු කාමයන්හි මහත් කලකිරීමට පැමිණියෙමි. සිය කයෙහි භය දැක පැවිදි වීමම කැමති වීමි.

**3.** "මම වනාහි ඥාති සමූහයාද, දැසි දස් කම්කරුවන්ද පිරුණු සිත්කළුවූ මන වඩන ගම් කුඹුරුද හැර-

4. "මට මේ සුදුසු නොවෙයි. කිසිත් නැති බවම පතමි. යමෙක් රන් රිදී හැරදමා අවුත් නැවත පිළිගන්නේද,

5. "රන් රිදී ආදිය මාර්ගාවබොධයට හෝ නිර්වාණය දැනීමට කරුණු නොවෙයි. ශාන්තිය පිණිස කරුණු නොවේ. මහණකමට සුදුසු නොවෙයි. මෙය ආර්ය ධනයකුත් නොවෙයි.

6. "ලෝභ උපදවන්නාවූ මදය එළවන්නාවූ, මුළා කරවන්නාවූ, කෙළෙස් වඩන, සැක උපදවන්නාවූ පරිශ්‍රම ඇති මෙහි ස්ථිර පැවැත්මක් නැත.

7. "මෙහි ඇලුනාවූ, පමාවූ කිලිටි සිත් ඇති මනුෂ්‍යයෝ ඔවුනොවුන් විරුද්ධවූවාහු කලහ වැඩි කෙරෙත්.

8. "කාමයෙහි ඇලුනවුන්ට වධයද, බැඳීමද, පීඩාද, ධන හානියද, ශොක කිරීම හා හැඬීමද පෙනේ.

9. "මාගේ නෑවූ තොපි කුමක් හෙයින් ඒ මා සතුරන් මෙන් කාමයෙහි යොදවාද? කාමයන්හි බිය දක්නා මා පැවිදි වූවකැයි දනුව.

10. "කාමයෝ අමිත්‍රයහ. වධකයෝය, වෛරීහුය. හුල් ඇනීම්ය. අමු රනින් රත්රනින් පව් නොගෙවෙත්.

11. "මාගේ නෑයෝවූ තොපි සතුරන් මෙන් කුමට ඒ මා කාමයෙහි යොදවාද? හිස මුඩුකළ, සඟල සිවුරු දැරූ මා පැවිද්දෙකැයි දනුව.

12. "පිණ්ඩපාතාහාරයද, පිඬු සිඟීමෙහි යාමද, පැවිද්දන්ට සුදුසු පාංශුකුල වස්ත්‍රද යන මේ මට සුදුසුයි.

13. "මහර්ෂීන් විසින් දිව්‍ය මානුෂික කාමයෝ වමාරණ ලදහ. උන්වහන්සේලා නිර්වාණය නිමිති කොට සම්පූර්ණයෙන් මිදුනාහ. නිශ්චල සැපයට පැමිණියාහ.

14. ගමෙක රැකීමක් නැත්ද එබඳු කාමයන් හා මම එක් නොවෙමි. කාමයෝ වනාහි සතුරුය. වධකරුවෝය. ගිනි කඳන් වැනිය. දුක්ය.

15. "ඒ කාමය වනාහි උවදුරු සහිතය. බිය දෙයි. සිත තළයි කටු සහිතය. ගිජු බවට හේතුය. ඉතා විෂමය. ලාටුවකි. මුළාවේ දොරටුවය.

16. "මෝඩ අන්ධ පෘථග්ජනයෝ යමක් ඉතා ප්‍රිය කෙරෙත්ද, ඒ කාමයෝ මහත් උවදුරු සහිතයහ. සර්ප හිසක් වැනිය. භය සහිතය.

17. "ලෝකයෙහි කාම නමැති මඩෙහි ගැලුනු බොහෝ මූඪයෝ ඉපදීමේද, මරණයේද කෙළවර නොදනිති.

18. "මනුෂ්‍යයෝ වනාහි තමහට බොහෝ රෝග ගෙන දෙන කාමය හේතුකොට ඇති, නරකයට යන මාර්ගයට පිළිපදිත්.

19. "සතුරන් උපදවන්නාවූ, තැවීම කරන්නාවූ, ඉතා කෙලෙසන්නාවූ ලෝකයාගේ ඇම වූ බැඳෙන්නාවූ කාමයෝ වනාහි පා බඳනාහ.

20. "කාමයෝ වනාහි උමතු කරවන්නාහ. උස්කොට කියවන්නාහ, සිත පෙළන්නාහ, සත්වයන් කෙලෙසීම සඳහා මරු විසින් අටවනලද පාසයෙකි.

21. "කාමයෝ වනාහි කෙළවරක් නැති දොස් ඇත්තාහ. බොහෝ දුක් ඇත්තාහ. ඝොර විෂයහ. ස්වල්ප රස ඇත්තාහ. කෙලෙස් වඩන්නාහ. කුසල ධර්මය වියලවන්නාහ.

22. "හැමවිටම නිර්වාණයෙහි ඇලුනු සිත් ඇති, ඒ මම මෙසේ සලකා කාම හේතුවෙන් හටගන්නා ඒ ව්‍යසනයට නැවත නොඑන්නෙමි.

23. "කෙලෙස් තරණයකොට කාමයන්ගේ සිසිල කැමතිවන යම ඒ බැඳුම් නැසීමට අප්‍රමාදව වාසය කරන්නෙමි.

24. "යමෙකින් බුද්ධාදී මහර්ෂීහු එතර වූවාහුද ශොක රහිතවූ රාගාදී රජස් නැති, නිර්භයවූ, අවංකවූ ආර්ය අෂ්ටාංගික මාර්ගයවූ ඒ මාර්ගයෙහි යමි.

25. "තෘෂ්ණා නැතිකිරීමට පැමිණ රුකක් මුල ධ්‍යාන කරණ කඹුරු දියණියකවූ සුභා නම් මැය දහමින් හොබනාවූ ශ්‍රද්ධා

ඇත්තාවූ උත්පලවර්ණාව විසින් හික්මවන ලද තුන් දැනීම ඇති මරු පරයා සිටි මෝතොම පැවිදිව අදට අට දවසකි.

26. "නිදහස්වූ ණය නැත්තාවූ වඩනලද ඉන්ද්‍රියයන් ඇති සියළු බැඳුමින් වෙන්වූ කටයුතු නිමි මෝ පව් නැත්තියකි.

27. "සත්වයින්ට අධිපති සක්දෙව් රජ තව්තිසා වැසිදෙව් පිරිස සමග කඹුරු දියණියවූ ශුභා නම් මෙහෙණිය වෙතට ඍද්ධියෙන් පැමිණ නමස්කාර කරයි."

---

# 14 තිංස නිපාතය

**(සුභා) ජීවකම්බවනිකා ථෙරී ගාථා:-** 1. "එක් සල්ලාලයෙක් ජීවකගේ සිත්කළු අඹ උයනට යන සුභාව වැලැක්විය. සුභාව ඔහුට මෙසේ කීය.

2. "නුඹ මා අවුරා සිටියෙහි. ඒ නුඹට මා විසින් අපරාධයක් කෙළේද? ඇවැත්නි, පුරුෂයෙක් මෙහෙණියක ස්පර්ශකිරීම නුසුදුසුය.

3. "ගරුකටයුතුවූ බුදු සස්නෙහි ඒ සර්වඥයන් වහන්සේ විසින් මට යම් ශික්ෂාපදයක් වදාරණලදද, සම්පූර්ණ පිරිසිදු කිලිටි රහිතවූ මා කුමකට අවුරා සිටීද?

4. "කැලඹුනු සිත් ඇත්තාවූ, කෙලෙස් සහිතවූ නුඹ නොකැලඹුණු සිත් ඇත්තාවූ පහවූ රජස් ඇති පව් නැති, සියළු තන්හි සිත මිදුනාවූ මා කුමකට අවුරා සිටීද?

5. "තී තරුණ වෙහිය. පින්වත් වෙහි. එබඳු තීට කවර ප්‍රව්‍රජ්ජාවෙක්ද, එහෙයින් කසාවත් ඉවත දමව, එව මල් පිපියාවූ මේ වෙනෙහි සිත් අලවමු.

6. "හැම දෙයින් සුවඳවත් සුළං හමයි. වෘක්ෂයෝ මල් රේණුවෙන් හටගත්තාක් මෙන් වෙත්. සැප ඇති වසන්ත ඍතුවෙහි පළමු මස පවතියි. එය රමණීය වෙනෙහි සිත් අලවමු.

7. "සුළඟින් සොළවන ලද, මුදුනෙහි පිපි මල් ඇති ගස් අපට ස්තුති කරමින් සිටිනු වැන්න. ඉදින් තනිව වන වදින්නෙහි නම් නුඹට කවර නම් ඇලීමක් වන්නේද?

8. "චණ්ඩමෘග සමූහයා විසින් සෙවිතවූ ඇතුන් හා මත් ඇතින්නන් විසින් කළඹන ලද ජනශූන්‍ය, බිහිසුණු මහ වනයට යෙහෙලියක් නැතිව යනු කැමති වෙහිද?

9. "උපමා නැත්තිය, රනින් කළ (පෙතැල්ලක්) බෝනික්කෙක් වැනි මිත්‍ර රථ නම් දෙව උයනෙහි හැසිරෙන අප්සරාවක් බඳු නුඹ මනහර සියුම් කසීවතින් හොබනෙහිය.

8. "කිඳුරිය, ලද බොළඳ ඇස් ඇත්තීය, ඉදින් මේ වන තුරෙහි සිත් අලවා වෙසෙමු නම් මම නුඹට වසඟය. නුඹට වඩා ප්‍රියවූ අන් සත්වයෙක් මට නැත.

9. "ඉදින් මාගේ වචනය කරන්නෙහි නම් සුවපත් වූවා එව, ගිහිගෙයි වෙසෙව, ප්‍රාසාදයන්හි නොසුළඟේ වාසය කරන ස්ත්‍රීහු නුඹට වතාවත් කෙරෙති.

12. "සියුම් කසීසළු දරව. සුවඳ විලවුන් දරව. නුඹට බොහෝ රන් මුතු මිණි ඔබ්බනලද නොයෙක් අබරණ කරදෙමි.

14. "දූවිලි මනාව සේදූ තිර ඇති, දික් ලොම් පලස් හා අළුත් කොඳු පලස් අතුළ, ඉතා වටිනා සඳුන් හරයෙන් ගත් සුවඳ යොදා සුවඳවූ, මහඟු යහනට නඟුව.

14. "අමනුෂ්‍යයන් අධිගෘහිත දියෙන් නැඟුණු උපුලක් මෙන් බ්‍රහ්මචර්යාව ඇති නුඹද ස්වකීය ශරීරයෙහි දිරීමට පැමිණෙන්නෙහිය.

15. "යමක් දැක නුඹ නොසතුටු සිත්ව බලනෙහිද, ඒ නුඹට දෙතිස් කුණපයෙන් පිරුණු සොහොන්බිම උස්කරණ සුළු බිඳෙනසුළු මේ ශරීරයෙහි කුමක් සාරසේ පෙනේද?

16. "ඇස් මුව දෙනකගේ වැනිය. පර්වත කුක්ෂියක කිඳුරු ලියකගේ වැනිය. තිගේ ඇස් නරඹන මට කාමරතිය වැඩියක් වැඩෙයි.

17. "තිගේ පිරිසිදු රන්වන් මුහුණෙහි උපුල් මල් මුදුන වැනි ඇස් නරඹන මට අතිශයින් කාමරාගය වැඩෙයි.

18. "කිඳුරුලිය බොළඳ නෙත් ඇත්තිය, නොපෙණෙන දුරකට ගියේ නමුත්, දික්වූ ගෝල ඇති පිරිසිදු නේත්‍රයන්ම සිහිකරමි. තිගේ නේත්‍රයට වඩා ප්‍රියවූවක් මට නම් නැත.

19. "නොමගින් යනු කැමැත්තෙහිද? සඳ කෙළිබඩුවක් කොට සොයහිද? මෙර ඉක්මවීමට කැමැත්තෙහිද? ඒ ඔබ බුදුන්ගේ දුවක් පතන්නෙහිය.

20. "යමෙක මා සිත ඇලේද, දෙවියන් සහිත ලෝකයෙහි එබඳු අරමුණක් නැත්මය. එය කෙබඳුදැයි නොදනිමි. එබැවින් රාගය මාර්ගයෙන් මුල් සහිතව නසන ලදී.

21. "ගිනි අඟුරු වළෙක දැමුවා මෙන්ද, විෂට පැමිණියා මෙන්ද, සහමුලින් විනාශකරණ ලදී. දැන් එය කෙබඳුද කියාත් නොදනිමි.

22. "යම් ස්ත්‍රියක් විසින් මේ වූ සැටියෙන් නොසලකන ලද ද, ශාස්තෲන් වහන්සේ ආශ්‍රය නොකරණ ලදද, එබඳු ස්ත්‍රියක් නුඹ පොළඹවා ඒ නුඹ මෙය දන්නිය පෙළහි.

23. "බැණීමෙහිද, වැඳීමෙහිද, සුවදුක් දෙකෙහිදී ද මට වනාහි සිහිය එළඹ සිටියාය. සංස්කාරය අශුචියැයි දැන සියල්ලෙහි සිත නොඇලෙයි.

24. "බුද්ධශ්‍රාවිකාවූ ඒ මම ආර්යෂ්ටාංගික මාර්ග රථයෙන් යන්නියක්ම උපුටාලූ හුල් ඇති, පව් නැතිවූ මම ශුන්‍යාගාරයට පැමිණ සිත් අලවමි.

25. "මනාව සිතියම් කළාවූ පෙතළි රූද, (බෝනික්කෝ) දඬු රූකඩද, නූලින් කොකුවල බඳනා ලද්දාවූ නොයෙක් ලෙස නෘත්‍ය කරන්නාහු මා විසින් දක්නා ලදහ.

26. "එහි නූල් හා කොකු ඉවත්කළ කල්හි අත්හළ, විකලවූ හැරදැමූ විසිරවූ කල්හි එය නොලැබෙයි. කුමක සිත යොදවයිද?

**27.** "මාගේ අඟපසඟ එවැනිය. ඒ කරුණුවලින් වෙන්ව එය නොපවතිත්. ඒ අවයවයන්ගෙන් තොරව නොපවතියි. කුමක සිත යොදවම්ද?

**28.** "බිත්තියක හිරියලින් මනාව සිතියම් කළ ස්ත්‍රියක් දුටුයේද? එහි නුඹේ විපර්යාසය දැකීම වෙයි. මනුෂ්‍ය ස්ත්‍රියකැයි හැඟීම නිරර්ථකය.

**29.** "අඥානය, ඉදිරියෙහි කළ විජ්ජාවක් බඳුවූ සීනෙන් දුටු රන් රුකක් වැනිවූ ජනයා මධ්‍යයෙහි තුබූ විජ්ජාවෙන් කළ රිදී රූපයක් බඳුවූ ඉතාම හිස්වූවක් මෙන් දන්නෙහිය.

**30.** "ගස් බිලෙක ලාටු ගුලියක්බඳුවූ, මැද කඳුළු සහිතවූ දිය බුබුලක් බඳු දුගඳ හමන කබ උපදිති. නොයෙක් ඇස් කොටස්වල එක්වීමයි.

**31.** "මනහර දැකුම් ඇති නොඇළුනු ඕතොමෝ ඇස කෙරෙහි නො ඇලුනිය. ඒකාන්තයෙන් මේ ඇස තා සතුටු තෙනෙක ගෙන යවයි උපුටා එකෙණෙහි ඒ මිනිසාට දින.

**32.** "ඔහුගේ රාගය එකෙණෙහි සංසිඳිනි. එහිදීම ඇය කමා කරවී. බඹසර රකින්නිය, නුඹට මතු මෙබන්දක් නො වේද, එසේ නිරෝගී වේවා.

**33.** "දිලිසෙන ගිනි කඳක් වැළඳ විෂ ඇති සර්පයෙකු රැගෙන මෙබඳු වීතරාගී ජනයා අල්ලා කෙසේ යහපතක්වේද, තොපට ක්ෂමා කරමි.

**34.** "ඔහුගෙන් මිදුනු භික්ෂුණීතොම බුදුරදුන් සමීපයට ගියාය. උතුම් පුණ්‍ය ලක්ෂණ යුත් බුද්ධශරීරය දැක පෙර මෙන් ඇස ප්‍රකෘතිවිය."

---

## 15 චත්තාළීස නිපාතය.

**1. ඉසිදාසී ථෙරී ගාථා:-** 1. "පොළවට ආභරණයක් වූ කුසුම නම් වූ පැළලුප් නුවර ශාක්‍ය පුත්‍රයන් වහන්සේගෙන් කුලවත්වූ, ගුණවත්වූ භික්ෂුණීහු දෙදෙනෙක් වෙසෙති.

2. "ඉන් එක් නමක් ඉසිදාසී නම්. දෙවැන්නි සිල්වත් බෝධිථෙරී නම් ධ්‍යාන කිරීමෙහි ඇලුණාහු බොහෝ දැන උගත්තාහු පහකළ කෙළෙස් ඇත්තාහු වූ.

3. "ඔහු පිණ්ඩපාතයෙහි හැසිර බත් කිස ගනිවා, පාත්‍රා සෝධා තබා ජනයාගෙන් තොරව සැපසේ හිඳ මේ ගාථාවෙන් කීහු.

4. "ආර්‍යා ඉසිදාසිය, පැහැ විහිදෙන රූ ඇත්තෙහිය. නුඹේ වයසද නො පිරිහුණේය. ගිහිගෙයි කවර දෝෂයක් දැක පැවිද්දට නික්මුණෙහිද?

5. "මෙසේ ශූන්‍ය ස්ථානයෙහිදී යෙදුනු ධර්ම දේශනාවෙහි දක්ෂවූ ඒ ඉසිදාසී භික්ෂුණීතොම "බෝධිය මා පැවිදි වූයේ කෙසේදැයි අසවයි මේ වචන කීය.

6. "උදේනි නුවර සිල්වත් සිටුතෙම මගේ පියාය. ඔහුට මම ප්‍රියවූ, මන වඩන, දයාවත් එකම දුවණිය වූවාය.

7. "ඉක්බිති සාකේත නුවරින් උතුම් කුලවත් මා ඉල්ලන්නෝ ආවාහුය. මහත් ධන ඇති සිටුකෙනෙක් වෙයි. ඔහුට ලේලියකොට මා පාවාදිනි.

8. "උදේ සවස නැදිමයිලන් වෙත වැඳීමට ගොස් දෙපය හිස තබමි. වඳිමි. අවවාදය එසේ පිළිපදින්නක් වෙමි.

9. "මගේ හිමියාගේ යම් සහෝදරියෝ වෙත්ද, සොහොයුරෝ වෙත්ද, පිරිවරවේද, මුන් අතුරෙන් එකම වල්ලභයකු දැක තැතිගත්තාව අසුන් දෙමි.

10. "එහි සැදූ ආහාර පාන වලින් යමකුට සුදුසු යමක් ඇද්ද එයින් පවරමි. එළවමි. දෙමි.

11. "සුදුසු කාලයෙහි උපස්ථාන කොට, එලිපත සමීපයේදී පිළිගනිමි. අත් පා සෝදවා ඇඳිලි බැඳගෙන ස්වාමියා වෙතට පැමිණියෙමි.

12. "හිස පීරණ කොස්සද, විලවුන්ද, කැඩපතද ගෙණ වැඩකාරියක මෙන් තොමෝම සිය හිමියා සරසමි.

13. "තොමෝම බත් පිසයි. තොමෝම බඳුන් සෝදයි. එක් පුතකු ඇති මවක මෙන් එවිට හිමියාට උපස්ථාන කරමි.

14. "මෙසේ බැල මෙහෙ ඇති ඇලුණු, කටයුතු කරණ, උඩඟු නොවූ, අලස නොවූ, සිල්වත් උපස්ථායිකාවූ මට හිමියා කෝප කරයි.

15. "ඉසිදාසිය හා එක ගෙයි එක්ව නොවසන්නෙමි. මම විචාරා යන්නෙමියි' හෙතෙම මවුපියන්ට කියයි.

16. "පුත්‍රය, එසේ නොකියව, ඉසිදාසිය නුවණැති දක්ෂ අලස නැති උපස්ථායිකාවකි. කුමක් හෙයින් නුඹට රුචි නොවේද?"

17. "මට කිසි හිංසාවක්ද නොකෙරෙයි. මම ඈ හා නොවසන්නෙමි. මට කෝප උපදවයි. මට ප්‍රයෝජනයක් නැත. නොවිචාරාම යම් තැනක යන්නෙමි."

18. "ඔහුගේ වචනය අසා නැදිමයිල්හු 'තෝ කවර වරදක් කෙළෙහිද? නිසැකව කියව'යි මා විචාළෝය.

19. "ආර්යාවෙනි. මම කිසි වරදක් නොකෙළෙමි. හිංසාවක් නොකෙළෙමි. නොබිණිමි. මා හිමියා කෝප වන කවර බැණීමක් කරන්නට හැකිවේද?

20. "ඔහු පුතු රකින්නාහු රූපවත් ශ්‍රී දේවියගෙන් පිරිහුනෙමුයි නොසතුටුව මා පිය කුලයට ආපසු පැමිණවූහ.

21. "අනතුරුව පියතෙම එයින් අර්ධයක් දායාද සමග දෙවන ධනවත් කුලවතකුට මා පාවා දිනි. සිටුතෙම එපරිද්දෙන් මා විදියි.

22. "ඔහුගේ ගෙයිද මාසයක් විසීමි. දාසියක් මෙන් සලකන ද්‍රොහි නොවන සිල්වත් මා හෙතෙමේද ප්‍රතික්ෂේප කෙළේය.

23. "හික්මුණ, දැමුණු ආහාර සොයා බුදින සිඟන්නකු දැක මපියතෙම නුඹ මා බැණා වන්නෙහිය. වස්ත්‍ර කැබෙල්ලත් පාත්‍රයත් දමවයි කීය.

**24.** "ඔහුද මා හා අඩමසක් වැස යන්නේ "නැවතත් සිඟා යන්නෙමි. රෙදි කඩත් පාත්‍රයත් මාලාවත් දෙවයි" මපියහට කියයි.

**25.** "අනතුරුව පියාද මවුද මගේ අන්‍ය සියළු නෑ සමූහයාද නුඹට මෙහි කුමක් නොකෙරේද? එසියල්ල කරවන්නෙමු. වහාම කියවයි කියයි.

**26.** "මෙසේ කියන ලද ඔහු මට නිදහස්ව විසිය හැකිය. ඉසිදාසියගෙන් කම් නැත. එක ගෙයි එක්ව නොවසන්නෙමියි කියයි."

**27.** "හරණ ලද ඔහු ගියේය. මමද හුදකලාව සිතීමි. නොවිචාරා මැරෙන්නට හෝ යමි. පැවිදි හෝ වන්නෙමි.

**28.** "මෙසේ බොහෝ දත් විනයධර සිල්වත් ජිනදත්තා ආර්යා තෙමේ පියාගේ ගෙදරට පිඬු පිණිස වැඩියාය.

**29.** "අප ගෙදරට ආ මෙහෙණිය දැක වහා නැගිට අස්නක් පැනවීමි. හුන්නියගේ පා වැඳ අහරද පිළිගැන්වීමි.

**30.** "එහි තැබූ ආහාර පාන කැවිල්ලෙන් සතපා ආර්යාවෙනි, පැවිදිවනු කැමැත්තෙමියි' කීමි.

**31.** "ඉක්බිති පියතෙම මට මෙසේ කීය. 'දුව මෙහිම ඒ ධර්මය පුරව. ආහාර පානයෙන් මහණ බමුණන් සතපව'

**32.** "අනතුරුව මම ඇඳිලි බැඳ වැඳ අඬමින් පියාට කියමි. 'පෙර මා කළ ඒ පාපය දිරවන්නෙමි.'

**33.** "යලිත් පියතෙම 'දෙපා ඇත්තවුන්ට අග්‍රවූ සර්වඥයන් වහන්සේ යමක් ප්‍රත්‍යක්ෂ කළසේක්ද, ඒ බෝධියටද අග්‍ර ධර්මයටද පැමිණෙව, නිර්වාණයද ලබවයි' කියායි.

**34.** "මවු පියන්ද, සියළු නෑයන්ද වැඳ පැවිදිව සත් දවස තුළ තුන් නුවණ ලැබීමි.

**35.** "යමෙක මේ විපාකයෙක් වීද ඒ මගේ ජාති සතක් දනිමි. එය නුඹට කියන්නෙමි. ඒ එක සිතින් අසව.

36. "ඒ මම එරකච්ඡ නුවර මහත් ධන ඇති රන්කරුවෙක් වීමි. තරුණ මදයෙන් මත්ව පරදාර සේවනය කෙළෙමි.

37. "ඒ මම ඉන් චුතව බොහෝ කලක් නිරයෙහි පැසුනෙමි. එසේ පැසී ඉන් නැඟී වැඳිරියක කුස උපන්නෙමි.

38. "රැළට නායක මහ වඳුරුතෙම උපන් සත් දවසක්වූ මාගේ බිජුවට නැසීය. පරදාර ගිය මේ එහි කර්ම විපාකයයි.

39. "ඒ මම ඉන් චුතව සින්ධවාරණ්‍යයෙහි කණවූ කුදුවූ එළු දෙනක කුස උපන්නෙමි.

40. "එහිදී බීජොත්පාටනය කළ මම දොළොස් වසක් මුළුල්ලෙහි දරුවන් උසුලමින්, පරදාරයෙහි ගිය පවින් පණුවන් ගෙන් ආකූලව ගිලන් වූයේ වෙමි.

41. "ඒ මම ඉන් චුතව ගෙරි වෙළෙඳකුගේ දෙනකගෙන් ලාකඩසේ රතු වස්සෙක්ව දොළොස්වැනි මස බීජොද්ධරණය කරන ලද්දෙමි.

42. "මම නඟුලද උසුළා ගැලද දරමි. පසුව පරදාරයට ගිය පවින් අන්ධව ගිලන්වීමි.

43. "ඒ මම ඉන් චුතව නුවර වීථියෙක දාසියක ගෙයි, පරදාරයට ගිය පවින් ස්ත්‍රී නොවූ පුරුෂ නොවූ නපුංසකවීමි.

44. "තිස්වෙනි වසෙහි මළේ, දුප්පත්, දිළිඳු බොහෝ ණය හිමියන් විසින් මඩනා ලද, ගැල්කරු කුලයෙක දැරියක්ව උපන්නෙමි.

45. "ඉක්බිති ගැල්කරුතෙම ණය පොළිය උස්ව වැඩුණු කල්හි ඒ මා හඬද්දී කුල ගෙයින් ඇද පෙළයි.

46. "ඉක්බිතිව සොළොස්වැනි වස යොවුන් බවට පැමිණි මා දැක ගිරිදාස නම් රියැදුරකුගේ පුත්‍රයෙක් මා භාර්යා කෙළේය.

47. "ඔහුට සිල්වත්, ගුණවත්, ප්‍රසිද්ධ, හිමියාට ඇළුණු අනෙක් භාර්යාවක් ඇත. මම ඇයට හිමියා සමග විරුද්ධවන මන්ත්‍ර ගුරුකමක් කෙළෙමි.

48. "දාසියක් මෙන් උවටැන් කරණ මා හැර දමා යෙත්ද මෙය එහි විපාකයයි. ඒ කර්මයද මා විසින් කෙළවර කරණලදී."

---

# 16. මහානිපාතය

1. සුමෙධා ථෙරී ගාථාඃ- 1. "මන්තාවතී නුවර කොඤ්ච නම් රජුගේ අගමෙහෙසියගේ සුමේධා නම් දුවවීමි. ආර්යයන් විසින් පහදවන ලදිමි.

2. "සිල්වත්, විසිතුරු කථා ඇති, බොහෝ දත් බුද්ධ ශාසනයෙහි භික්මුණු ඕ මවුපියන් වෙතට එළඹ මා කථාව දෙදෙනම අසව්යයි කියයි.

3. "මම නිවනට ඇළුනෙමි. භවයට ඇතුළත් දිව්‍යමය වුවත් සියල්ල අස්ථිරය. කාමයෝ වනාහී හිස්වූ නීරස බොහෝ වෙහෙස ඇති කරන්නෝය.

4. "කාමයෝ කටුකය. සර්පයන් වැනිය. මෝඩයෝ එහි මුළාව නිරයෙහි වැටී දීර්ඝ කාලයක් දුක් විඳිමින් නැසෙත්.

5. "හැමවිට කය වචන සිත නොවසා, පව්කළාහු පාප කර්මයෙන් නරකයෙහි ශොක කෙරෙති.

6. "නුවණ නැති, අමනවූ, දුක්වූ, තෘෂ්ණාවෙන් වටවූවෝ ආර්ය සත්‍යයන් දෙසන කල්හි නොදන්නාහු අවබෝධ නොකරත්.

7. "මෑණියෙනි, බුද්ධොත්තමයන් විසින් දේශනා කළ සත්‍යයන් නොදන්නාවූ ඒ බොහෝ දෙන සසර දෙයට සතුටුවෙති. දෙව්ලෝ ඉපදීම පතත්.

8. "සසර සියල්ල අනිත්‍ය කල්හි දෙව්ලොව ඉපදීම සදාකාලික නොවේ. නැවත නැවත ඉපදිය යුත්තට අඥානයෝ සංවේග නොවෙත්.

9. "සතර අපායද දෙව්මිනිස් දෙගතියද කෙසේ හෝ ලබති. නරකයෙහි ඇද වැටුනවුනට පැවිදි වීමෙක් නොවේ.

10. "දසබලහුගේ ශාසනයෙහි පැවිදි වන්නට දෙදෙනාටම අනුදනිව්. ජාති මරණ නැසීම පිණිස තැත් කරන්නෙමි.

11. "කය උවදුරු වලින් අසාරවූ සසර කවර සතුටු වීමෙක්ද? පැවිදි වන්නෙමි. සසර ඇල්ම නැසීමට අනුදනිම්.

12. "නපුරු (කාල) ක්ෂණ වලින් තොර බුදුන් උපදනා ක්ෂණය ලදී. සීලයද බඹසරද දිවි ඇතිතෙක් කඩ නොකරමි.

13. "ගෘහස්ථව අහර නොගනිමි. මැරෙන්නක සේ වන්නෙමි. මෙසේ සුමේධා තොමෝ මවු පියන්ට කියයි.

14. "ඇගේ මවු තොම දුක් ඇතිව හඬයි. දුකට පත් පියාද පහයෙහි බිම වැටී හුන්නියට ගිහිසැප හොඳයයි හඟවන්නට උත්සාහ කරයි.

15. "දරුව, නැගී සිටුව, ශොක කිරීමෙන් කිම? වාරණවති නුවරැ අණිකදත්ත රජතෙම විශිෂ්ට රූ ඇත්තේය. ඔහුට තී පාවා දෙන ලද්දෙහිය.

16. "අණිකදත්ත රජුට භාර්යාවවූ අගමෙහෙසිය වන්නෙහිය. දුව සිල් රැකීම බඹසර හැසිරීම පැවිදිවීම ඉතා දුෂ්කරය.

17. "රජයෙහි තොප ආඥාවය. ධන සම්පත්තිය සැපවත්ය. ළදරුවෙහිය, එහෙයින් කාම සම්පත් අනුභව කරව. දුව, නුඹේ විවාහයද වේවා.

18. මෙබඳු සංසාර ගත අසාරයක් මට නොවේවා. පැවිදි හෝ වන්නෙමි. නැතහොත් මැරෙන්නෙමි. විවාහයක් නම් නැත්මය.

19. පණුවකුසේ කුණුවූ, අපවිත්‍රවූ, දුගඳවූ වැගිරෙන නොයෙක් අශුචියෙන් සම් පසුම්බියක්වූ කුණපවූ මේ කුණු කයට සාරයයි කෙසේ ඇතුළත් වන්නෙම්ද?

20. "මම අතිශයින් පිළිකුල් මස් ලෙයින් තැවරුණු මෙය පණුසමූහ මෙන් දැන් සිටිමි. පණුවන්ට වාසවූ පක්ෂීන්ට ගොදුරුවූ ශරීරය කාට දෙනු ලැබේද?

21. "පිළිකුල් කරණ ඤාතීන් විසින් ඉවත ලූ නිශ්චල දර කැබැල්ලක් මෙන් පහවූ සිත ඇති මේ ශරීරය නොබෝ කලකින් සොහොනට පමුණුවා දවයි.

22. "අනුන්ට ගොදුරුවූ එය සොහොනෙහි දමා පිළිකුල් කරමින් වතුර නාති. මවුපියෝ ඒකාන්තයෙන් පිළිකුල් කරති. මධ්‍යස්ථ ජනයා කිම?

23. "අඥාණයෝ ඇට නහර සමූහ යුත් කෙළ කඳුළු මල මුත්‍රයෙන් පිරුණු නිශ්ශාර කුණු ගොඩවූ කයෙහි ඇතුළත් වූවෝය.

24. "යමෙක් මෙය බෙදා ඇතුළ පිටට හරවන්නේ නම් ගඳ නොඉවසිය හැකිව සිය මවද පිළිකුල් කරන්නේය.

25. "ජාතිය මුල්වූ ස්කන්ධ ධාතු ආයතන යන ද්‍රව්‍යය දුකයයි නුවණින් සලකන්නී කාහට විවාහයක් කැමති වන්නෙම්ද?

26. "සසර දුක කෙළවර වේනම් දිනපතා අළුත් අළුත්වූ ආයුධ තුන් සියය බැගින් ශරීරයේ වැටේ නම් මෙසේ සියක් වසක් මේ පහර සැපයෙකි.

27. "යමෙක් මෙසේ බුද්ධ වචනය දැන වෙහෙසීමට පැමිණේද, නැවත නැවත පෙළෙන ඔවුන්ගේ සසර ඉතා දීර්ඝය.

28. "දෙව්ලොවද, මිනිස් ලොවද, තිරිසන් යෝනියෙහිද, අසුර නිකායෙහිද, ප්‍රේතාත්ම භාවයෙහිද පීඩා අපමණ දක්නා ලැබෙති.

29. "නරකයන්හි වැටී පෙළෙන්නවුන්හට පීඩාවෝ බොහෝ වෙත්. දිව්‍යාත්ම භාවයෙහිද රැකීමක් නැති. නිවන් සැපයට වඩා අනික් සැපයක් නම් නැත.

30. "යමෙක් බුද්ධ වචනයෙහි යෙදුනේද, ඔහු නිර්වාණයට පැමිණියාහුමය. ඔහු ඉපදීම මරණ නැතිකිරීමට තැත් කෙරෙති.

31. "පියාණෙනි, මට කාමයෝ නොඇලෙති. වමනයක් මෙනි. තල් සිදීමක් මෙන් කරන ලදී. අසාර භෝගයෙන් කවර ප්‍රයෝජනද? අදම මහණ වෙමි.

32. "ඕ ද පියාට මෙසේ කියයි. යමෙකුට ඒ මම දෙන ලද්දෙමිද? ඒ අණීක දත්ත රජතෙමේද වාරණවතී නුවර විවාහයට සුදුසු කල්හි පැමිණියේය.

32. ඉක්බිති සුමේධා තොම නිල්වන් ගෙතු මොළොක් කෙශ කලාපය කඩුවෙන් සිඳ ප්‍රාසාදය වසා ප්‍රථමධ්‍යානයට සමවනි.

34. "ඕතොමෝද එහි සමවනි. අණීකදත්ත රජ තෙමේද නුවරට ආය. සුමේධා තොම පහයෙහිදීම අනිත්‍යය යන වැටහීම වඩයි.

35. "ඕ ද මෙනෙහි කරයි. අණීකදත්ත රජතෙමේ වහා පහයට නැංගේය. රන් රුවනින් සැරසුණු කළ ඇදිලි ඇති ඔහු සුමේධාවට යදියි.

36. "රාජ්‍යයෙහි අධිපති බවද ධනයද, ඓශ්චර්යද, කාම සම්පත්ද, ලබව. ලෝකයෙහි පස්කම් සැප දුෂ්කරය.

37. "රාජ්‍යය නුඹට දෙන ලදී. සම්පත් අනුභව කරව. දන්දෙව. සතුටුවව, තීගේ මවුපියෝ දුකට පත්ය."

38. "ඔහුට සුමේධාතොම මෙය කියයි. 'කාමයෙන් ප්‍රයෝජන නැත්තියක්මි. මුළාව නැත්තියක්මි. කාමයන්හි නොඇලෙව. කාමයන්හි දෝෂ බලව.

39. "සතර දිවයින් ඇති කාම භෝගීන්ට අග්‍රවූ මහා මන්ධාතු නම් රජෙක් විය. ඔහුට ආශාව නොපිරුණේය. නොසෑහී කාලක්‍රියා කෙළේය.

40. "මේඝය දසදිග හාත්පස සත් රුවන් වසීද එය ලබාත් කාමයන්ගේ තෘප්තියෙක් නැත. මනුෂ්‍යයෝ ඇති නොවී මැරෙති.

41. "කාමයෝ කඩුව හා මස් තබා කපන කොටය බඳුයහ සර්ප හිසක් බඳුය. ඇට සැකිල්ලක් බඳුය. ගිනි හුල් මෙන් දවත්.

42. "කාමයෝ එකසේ නොවෙත්. ස්ථිර නොවෙත්. බොහෝ දුක් ඇත්තාහ. මහත් විෂයහ. ගිනියම් කළ යකඩ ගුලියක් බඳුය. උවදුරු මුල්ය. දුක් ඵල දෙයි.

43. "කාමයෝ වෘක්ෂ ඵල බඳුයහ. මස් පිඬු බඳුය. දුක් ඇත්තාහ. සිනයක් මෙන් රැවටිලිය. ඉල්වා ගත් දෙයක් වැනිය.

44. "කාමයෝ ආයුධ හා හුලක් බඳුය. රෝගයකි ගඩකි. දුක් උපදවයි. මරණ දුක් දෙයි. ගිනි අඟුරු වලක් බඳුය. දුකට මුල්ය. බිය දෙයි, වධකයෙකි.

45. "මෙසේ කාමයෝ බොහෝ දුක්ය. අන්තරාය කරයයි කියන ලද්දාහ. සංසාරගත කිසිවක මාගේ යයි මට කිසි විශ්වාසයෙක් නැත.

46. "මා හිස ඇවිල දනවිට අනිකෙක් කුමක් කරයිද? ජරා මරණයන් ලුහු බඳන කල්හි එය නැසීමට වෑයම් කටයුතුයි.

47. "මම දොරහැර දෙමව්පියන්ද, අණිකදත්ත රජුද, දැක බිම හුන් හඬන ඔවුනට මෙය කීමි.

48. "පියාගේ මරණය, සොහොයුරු මරණය, තම හිංසාව යනාදිය උදෙසා නැවත නැවත හඬන්නාවූ බාලයන්ට සංසාරය ඉතා දීර්ඝමයි.

49. "සසර සැරිසරණ සතුන්ගේ කඳුළුද, බී කිරිද ලේ ද, අප්‍රමාණය. ඇට රාශියද සිහි කරව.

50. "එක් කපක කඳුළු, කිරි, ලේ සිවු සයුරෙහි ජලයට අධිකයි. ඇටගොඩ වෙපුල්ල පර්වතයට සමය.

51. "දඹදිව මුළු පොළොව ඩෙබර ගෙඩි පමණට කළ ගුලි අග මුල් නැති සසර මළ මවුවරුන්ට මඳ වෙතියි සිහි කරව.

52. "තණ දර අතු කොළ සතර ගුල් පමණට කැපූ කැබැලි අග මුල් නැති සසර පියවරුන්ට මඳ වෙතියි සිතව.

53. පෙරදිග මුහුදෙහි අපර දිගටද කැරකෙන වියා සිදුරෙන් අහස දකින කණකැස්බා සිහි කරව. ඔහුගේ අහස දැකීමද මිනිසත් බව ලැබීමේ උපමාවද සිහි කරව.

54. "පෙණ පිඩක් බඳුවූ අසාර කාය නම්වූ රූපය සිහි කරව. අනිත්‍යවූ ස්කන්ධයන් දකුව. නරකයෙහි බොහෝ දුක් සිහි කරව.

55. "නැවත නැවත ඒ ජාතීන්හි සොහොන් උස් කරන්නන් සිහි කරව. කිඹුල් බියද සිහි කරව. චතුරාර්ය සත්‍යයන්ද සිහි කරව.

56. නිවන ඇති කල්හි පිරුණු පස් කටුකයෙන් කිම? සියළු කාම රතීහු පංච කටුකයට වඩා අතිශයින් කටුකය.

57. "නිවන ඇති කල්හි පංචකාමයෝ ඔබට කිම? සියළු කාම රතීහු ඇවිල ගත්තාහ. කැකෑරුනාහ. කම්පිතය, තැවුණේය.

58. "සතුරන් නැති කල්හි බොහෝ සතුරන් ඇති කාමයෙන් කිම? කාමයෝ වනාහි රජ ගිනි සොර දිය අප්‍රිය දායාදින්ට සාධාරණයහ. බොහෝ සතුරෝ වෙති.

59. "මිදීම ඇති කල්හි යමෙක්හි වධ බන්ධනය වේද එබඳු කාමයෙන් ඔබට කිම? කාමයෝ නම් ලාමකයහ. වධ බන්ධන දුක්බයන් විඳිති.

60. "ඇවිලගත් තණ සුල අල්ලන්නහුගේ අත දවයි. මුදන්නා නම් නොදවයි. තණ සුලකට බඳු කාමයෝ අල්වා ගත්තවුන් දවති. නොමුදත්.

61. "ස්වල්ප කාම සැපය නිසා මහත්වූ සැපය නොහරුව ඇම ගිලි මහා මත්ස්‍යයා මෙන් පසුව නොවැනසෙව.

62. "පළමුව ඒකාන්තයෙන් කාමයන්හි හික්මෙව. බලු දමින් බඳනා ලද සුනඛයකු කවුරු නසත්ද? කාමයෝ සැඩොල්හු සුනඛයන් මෙන් ඇලුණාහු නසත්.

63. "කාමයෙහි යෙදුනු තැනැත්තේ අප්‍රමාණ දුකද බොහෝ සිත දොම්නස් ද ලබයි. අස්ථිර කාමයන් පහකරව.

64. "නොදිරීම ඇති කල්හි දිරීමට යන නුඹගේ කාමයෙන් කිම? සියළු තන්හි සියලුම ජාතීහු මරණ රෝගවලින් මඩනා ලදහ.

**65.** "මේ නිවන දිරීම් රහිතය, මරණ රහිතයි. අජරාමර නම්. ශොක රහිතයි සතුරු හිරිහැරයෙන් තොරය. නිර්භයය. තැවීම රහිතය.

**66.** "මේ බොහෝදෙනකු විසින් ලබන ලදී. යමෙක් නුවණින් තැත් කරයිද අදද මේ අමාව ලැබිය හැකිය. උත්සාහ නොකරන්නහු විසින් නොහැකිය.

**67.** "සංස්කාරයන් කෙරෙහි ඇල්මක් නොලබා අණික දත්ත රජු හික්මවමින් සුමේධාව මෙසේ කියයි. 'කැපූ හිසකේ බිම හෙළීය.'

**68.** "ඒ අණික දත්ත තෙම නැගිට ඇගේ පියාට ඇඳිලි බැඳ මෙසේ ඉල්ලයි. 'මිදීමේ ඇත්ත දක්නාවූ සුමේධාව පැවිදි වීමට හරුව.'

**69.** "මවුපියන් විසින් හරණලද්දී ශොකයෙන් භයින් බිය වූවා පැවිදි විය. හික්මෙන්නිය විසින් දැනීම් සයද, රහත් ඵලයද, ලැබීය.

**70.** "ඒ රාජ කන්‍යාවට ආශ්චර්ය අද්භූතවූ ඒ නිවන වීය, අන්තිම කාලයෙහි පූර්වෙනිවාස චරිතය කීයේ මෙසේය.

**71.** "කෝණාගමන බුදුන් සමයෙහි තුන්යෙහෙලියෝවූ අපි නව ගෙවල් සහිත සංඝාරාමයක් කරවා විහාර දානයක් දුනිමු.

**72.** "දස වරක්ද, සියක් වරක්ද, දස දහස් වරක්ද, කෝටි වරක්ද, දෙව්ලොව උපනිම්. මිනිස් ලොව උපන් වාර කියනු කිම?

**73.** "දෙවියන් අතර මහත් ඍද්ධි ඇතිවීම්. මිනිසත් බැව්හි කියනු කිම? සක්විති රජහට මෙහෙසියවූ ස්ත්‍රීරත්නය මම වීම්.

**74.** "එය හේතුය එය හටගැන්මය. මූලය විය. එයම ශාසනයෙහි සැනසීම විය. එයම පළමුවන එක්වීම විය. ධර්මයෙහි ඇළුනු මට එයම නිවීම විය.

75. "යමෙක් මෙසේ කරත්ද? අලාමක ප්‍රඥා ඇත්තහුගේ වචනය අදහත්ද, සංස්කාරයෙහි කලකිරෙති. කලකිරී නොඇලෙති."

ථෙරී ගාථා නිමි

---

# 10 ජාතක

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## 1 ඒකක නිපාතය.

### 1 අපණ්ණක වර්ගය.

1. **අපණ්ණක ජාතකය**:- 1. බොධිසත්ව ආදී ඇතැම් පණ්ඩිත මනුෂ්‍යයෝ අවිරුද්ධවූ කාරණය කීවාහුය. තර්ක කොට ගන්නාහු විරුද්ධවූ දෙවෙනි කාරණය කියති.

නුවණැත්තේ විරුද්ධවූද අවිරුද්ධවූද මේ කාරණය දැක යමක් අවිරුද්ධ නම් එය ගන්නේයයි (වදාළහ.)

2. **වණ්ණු පථ ජාතකය**:- 1. කුසීත බැවින් දුරුවූ පටන් ගන්නාලද වීර්ය ඇති උත්තමයෝ මිනිසුන් හැසිරෙන භූමි ප්‍රදෙශ ඇති වැලි සහිත මාර්ගයෙහි බිම කණින්නාහු එහි පියයුතුවූ ජලය ලැබුවාහුය. මෙපරිද්දෙන් වීර්යයෙන් හා කායබල ඥාණ බලයෙන් යුක්තවූ කුසීත බැවින් තොරවූ වීර්ය ඇති තපස්වීතෙම සිතටද හෘදය වස්තුවටද ශීතල භාවය කරණ හෙයින් ශාන්ති නම්වූ ධ්‍යාන විදර්ශනා අභිඥා අර්හත්මාර්ග නමැති ආර්ය ධර්මය ලබන්නේයයි වදාළහ.

3. **සේරිවාණිජ ජාතකය**:- 1. සද්ධර්මයට නියමිතවූ ඒ සෝවාන් මාර්ගය යම්හෙයකින් මෙහි වීර්යය නොකිරීමෙන් වැරද වූයෙහි නම් නුඹ බොහෝ කලක් ශොක කිරීම ආදී වශයෙන් තැවෙන්නෙහිය. කවරෙකු මෙන්දයත්? සේරිවාණිජ නම් මේ වෙළෙන්ඳ මෙනි.

**4. චුල්ලසෙට්ඨි ජාතකය:-** 1. වෙළඳාමෙහි දක්ෂවූ නුවණැත්තේ ස්වල්පවූද, බඩු මිළයෙන් තමන් නගාසිටුවයි. ඒ කෙසේදයත්? මුඛ වාතයෙන් පිඹ දල්වන්නාවූ මදවූ ගින්නක්මෙනි.

**5. තණ්ඩුල නාළි ජාතකය:-** 1. රජ්ජුරුවන් වහන්ස, පන්සියයක් අසුන්ගේ මිළ පිණිස සහල් නැළියක්ම අගීද, කිව මැනවැයි. (අස්වෙළඳතෙම රජහට කීය. රජහු විසින් විචාරණුලැබූ බඩු මිළ නියම කරන්නා) මේ සහල් නැළිය ඇතුළත පිටත සහිතවූ සියලු බරණැස් රාජ්‍යය වටීයයි කීයේය.

**6. දෙවධර්ම ජාතකය:-** හිරි ඔතප් දෙකින් යුක්තවූ (හෙවත්) කාය දුශ්චරිතාදියට ලජ්ජාභය ඇති කුශල ධර්මයන්ගෙන් සමන්විතවූ ශාන්තවූ සත් පුරුෂයෝ සත්ව ලෝකයෙහි ත්‍රිවිධවූ දෙවියන්ගේ ධර්මයෝයයි (නොයෙක්) දෙවධර්මයෙන් යුක්තවූවෝයයි කියනු ලැබෙත්.

**7. කට්ඨහාරි ජාතකය:-** "මහරජ මම ඔබගේ පුත්‍රයෙමි. ජනාධිපතිය නුඹ මා පොෂණය කරව. දෙව තෙමේ සෙස්සන්ද පොෂණය කරයි. කුමක් හෙයින් ස්වකීය පුත්‍රවූ මා පොෂණය නොකරන්නේදැයි" කීයේය.

**8. ගාමිණි ජාතකය:-** "ඉක්මන් නොව කටයුතු කරන්නවුන්ටද බලාපොරොත්තු ආශාව (නොහොත්) ආශා ඵලය සමෘද්ධ වේමය සතර සංග්‍රහ වස්තුවයයි කියනලද මුහුකුරා ගියාවූ බ්‍රහ්මචරියා ඇත්තේවෙමි. ග්‍රාමණිය මෙසේ දැන ගණුවයි" කීයේය.

**9. මඛාදෙව ජාතකය:-** "මාගේ හිසෙහි හටගන්නා හෙයින් උත්තමංග රුහනම්වූ වයස් පැහැර ගන්නාවූ මේ පැසුණු කෙස් හටගත්හ. දේවදූතයෝ පහළවූහ. එහෙයින් මාගේ ප්‍රව්‍රජ්‍යාවට සුදුසු කාලය වේයයි" කීයේය.

## 2 සීල වර්ගය

**10. සුඛවිහාරි ජාතකය:-** යම් පුද්ගලයෙකු සෙසු බොහෝ පුද්ගලයෝ රක්ෂා නොකෙරෙත්ද, යමෙක් සෙසු බොහෝ

පුද්ගලයන් රක්ෂා නොකෙරේද, මහරජ, ඒ පුද්ගල තෙම වස්තුකාම ක්ලේශකාමයන්හි අපේක්ෂාවක් නැත්තේ ඒකාන්තයෙන් සුවසේ වාසය කෙරේයයි" වදාළහ.

11. **ලක්ෂණ මෘග ජාතකයː-** සිල්වත්වූ පිළිසඳර පැවතුම් ඇත්තවුන්ට අභිවෘද්ධියවේ. නෑ සමූහයා විසින් පිරිවරණලද එන්නාවූ ලක්ෂණ නම් මෘගයා බලව. තවද නෑයන්ගෙන් පිරිහීගියාවූම මේ කාළ නම් මෘගයා බලවයි" වදාළහ.

12. **නිග්‍රොධ මිගජාතකයː-** නිග්‍රොධ මුවරජහුම සේවනය කරන්නේය. ශාඛනම් මුවරජ කරා නො එළඹෙන්නේය. ශාඛනම් මුවරජ සමීපයෙහි ජීවත්වීමට වඩා නිග්‍රොධ මුව රජුවෙත මියයාම උතුම් වන්නේයයි" කීයේය.

13. **කණ්ඩින ජාතකයː-** "කණ්ඩින නම් ඇති ඇතුල්වීම් අර්ථයෙන් ශල්‍යනම්වූ ඊතලය ඇති දැඩිකොට විදිනාවූ පුරුෂයාට නින්දා වේවා යම් ජනපදයෙක්හි ස්ත්‍රියක් තොමෝ ඓශ්වර්යයෙහි සිට සංවිධාන කරන්නීද ඒ ජනපදයට නින්දාවේවා යමක්හු ස්ත්‍රීන්ගේ වසඟයට ගියාහුද ඒ සත්වයෝද නින්දා කටයුත්තාහුයයි.'

14. **වාතමෘග ජාතකයː-** "ආවාසයෙහිද මිත්‍ර සන්ථවයෙහිද ඇල්ම ලාමකය. ඒ දෙකට වඩා රසයෙහි ඇල්ම ලාමකවේ. ඊට වඩා අධිකවූ ඇල්මක් නොම ඇත්තේය. ඒ එසේමැයි. වන ලැහැබ ඇසුරුකළාවූ වාත මෘගයා සඤ්ජය නම් උද්‍යානපාල තෙම රසයන්ගෙන් තමා වසඟයට පැමිණවීයයි."

15. **ඛරාදිය ජාතකයː-** "ඛාරාදිය නම් තැනත්තිය කුර අටක් ඇත්තාවූ මුලින් වක්වූ අගින් ඉතා වක්වූ අං ඇති අවවාද ඉගෙණීම් හතෙන් ඉක්මුනු ඒ මෘගයාට අවවාද කරන්ට උත්සාහ නොකරන්නෙමියි" කීයේය.

16. **තිපල්ලත්ථ මිග ජාතකයː-** "දෙඇළයෙන් හා ඍජුවදැයි තුන් ආකාරයකින් සයනය කරන්නාවූ බොහෝ මායාවන් දත් කුර අටක් ඇති මධ්‍යම රාත්‍රියෙහි පැන් බොන්නාවූ මාගේ බෑණනුවූ මෘගයාට මනාකොට ඉගැන්වීමි. ඒ කෙසේදයත් යටවූ එක් නාස් පුඩුවකින් පොළොවට ආශ්වාස කරන්නේ ඉගෙණීම්

සයකින් මාගේ බෑණනුතෙම වැද්දා මැඩ පවත්වයි (නොහොත්) පින්වතිය මාගේ බෑණනු තෙම කලා සයකින් වැද්දා රවටායයි" කීයේය.

**17. මාලුත ජාතකයඃ-** "කරුවල පක්ෂයෙහිද (නොහොත්) පුර පක්ෂයෙහිද යන මේ දෙපක්ෂයෙහි යම් කලෙක් හී වාතය හමාද, එකල්හි ශීතවේ කුමක් හෙයින්දයත්, යම්හෙයකින් ශීතයෝ වාතයෙන් හටගත්තාවූ වෙද්ද, එහෙයින් මෙහිලා සිංහ ව්‍යාඝ්‍ර යන තෙපි දෙදෙනම නොපැරදුනාහුයි."

**18. මතක භත්ත ජාතකයඃ-** "මේ ඒ ඒ තැන්හි උත්පත්තියද, වැඩීමද, දුකයයි ඉදින් මෙසේ සත්වයෝ දන්නාහු නම් පණ ඇති සතෙක් පණ ඇති සතක්හු නොනසන්නේය. කුමක් හෙයින්දයත්, යම්හෙයකින් ප්‍රාණඝාතකරන්නේ නරකාදියෙහි ශොක කරන්නේද, එහෙයිනැයි" වදාළහ.

**19. ආයාචිත භත්ත ජාතකයඃ-** "ඉදින් මිදෙනු කැමැත්තෙහි නම් පරලොාව දුකෙන් මිදෙව, ප්‍රාණඝාත ආදී දුශ්චරිතකොට දැන් මිදෙන්නෙහිද, මතු පාප කර්මයෙන් බැඳෙන්නෙහිය. නුවණැත්තෝ මෙපරිද්දෙන් නොමිදෙත්, අඥානයාගේ ප්‍රාණඝාතකොට මෙලොාව මිදීම බැඳීමයයි' වදාළේය.

**20. නළපාන ජාතකයඃ-** "ගොඩට නැංගාවූ පියවර නොදැක දියට බැස්සාවූ පියවරද දැක බට නළයකින් ජලය පානය කරන්නෙමු. තෝ මා නොම වධකරන්නෙහි යයි" කීයේය.

## 3 කුරුංග වර්ගය

**21. කුරුංග මෘග ජාතකයඃ-** "එම්බා ඇද්දෙමට ගස, තෝ යම්හෙයකින් ඉදිරියෙහි පල විසුරුවන්නේහිද, මේ කාරණය කුරුංග මෘගවූ මට ප්‍රකටය. නොහොත් කුරුංග මෘගයා විසින් දන්නාලදී. (එහෙයින්) අනෙක් ඇද්දෙමට ගසක් ලඟට යන්නෙමි. තාගේ ජලය මට රුචි නොවෙය'යි (මෙසේ ගසක් මෙන් සිටි වැද්දාහට කියා ගස යටට නොපැමිණ මගට බැස ගියේය යනු අභිප්‍රායයි.)

**22. කුක්කුර ජාතකය:-** "වර්ණයෙන් හා කාය බලයෙන් යුක්තවූ, රාජකුලයෙහි උපන්නාවූ, රජ ගෙදර වැඩුණාවූ යම් බලු කෙනෙක් ඇද්ද, ඒ මේ බල්ලෝ වධයට සුදුස්සෝ නොවෙති. අස්වාමිකවූ අපි වධයට සුදුස්සෝවූම්හ. මේ වධය ප්‍රබලයනගේ වධයක් නම් නොවේ. මේ වධය දුර්වලයන්ගේ වධය නම් වේයයි" කීයේය.

**23. භොජාජානීය ජාතකය:-** "ඊතල වලින් විදිනා ලද එහෙයින්ම එක පාර්ශ්වයෙන් ශයනය කරන්නාවූද, භොජාජානීයවූ අශ්ව තෙමේම කොටලුවාට වඩා උතුම්වේ. රථාචාර්යය, මාම යොදවයි" කීයේය.

**24. ආජඤ්ඤ ජාතකය:-** "පෙරවරු ආදී යම් යම් කලෙක්හි හෝ ග්‍රාමාදීවූ යම් තැනෙක්හි හෝ යම් මොහොතක හෝ යම් යම් යුද්ධ භූමියක හෝ යම් යම් කලෙක්හි ආජානීය නම් උතුම් අශ්ව තෙමේම ව්‍යායාමය කෙරේද, (එහෙයින්) එහිලා උතුම් අශ්වයෝ පිරිහෙත්." (එහෙයින් මාම යොදව යනු අභිප්‍රායයි.)

**25. තිර්ථ ජාතකය:-** "රථාචාර්යය, අනෙක් අනෙක් තොටුපලකින් අශ්වයා පැන් පොවව. පුරුෂතෙමේ අධික කොට කෑම කරණකොට ගෙන මධුරවූ කිරිබතින්ද තෘප්තියට පැමිණේයයි" කීයේය.

**26. මහිලා මුඛ ජාතකය:-** "මහිලා මුඛ නම් හස්තිතෙමේ පැරණි සොරුන්ගේ නපුරු බස් අසා ඊට අනුව හැසිරෙන්නේ කෝපයෙන් යුක්තව පහර දෙන්නේ මනා සංවර ඇත්තවුන්ගේ වචනයන් මනාකොට අසා උතුම් ඇත්තෙමේ පළමු තමාගේ පැවති සියලු ගුණයන්හි පිහිටියේයි."

**27. අභිණ්හ ජාතකය:-** "පළමුකොට දෙන කටුක ආහාරය ගන්නට අසමර්ථය, පිඩු කොට දුන් බතද ගන්නට අසමර්ථය. තෘණයන්ද අනුභව කරන්ට නොපොහොසත. නැහැවීමෙහි ඇඟ ඉලීමටද නොහැක. නිතර දැකීමෙන් ඇත්තෙමේ බල්ලා කෙරෙහි ආදරය කෙළේයයි" හඟිමි. (එහෙයින් ඒ ප්‍රේම කළ බල්ලා ගෙන්වා ශොක පහකරව යනු අභිප්‍රායයි.)

**28. නන්දිවිශාල ජාතකයඃ-** "මනහර වචනයක්ම කියන්නේය. කිසිකලෙකත් අමනොඥ වූවක් නොකියන්නේය. එයින් කවර ප්‍රයෝජනයක්ද? මනොඥ කොට කියන්නාහට ගැල් සියයක් පමණ වූ මහත් බර තුබූ තැනින් ඉදිරිය. ඒ බමුණාට ධනයද ලැබෙව්වේය. එහෙයින් සතුටු සිත් ඇත්තෙක්ද වූයේයි."

**29. කණ්හ ජාතකයඃ-** "යම් යම් තැනෙක්හි වියගස බරවේද, යම් තැනෙක්හි ගැඹුරුවූ මාර්ගය වේද, එකල්හි කණ්හ නම් වෘෂභයා යොදත්. හෙතෙමේ ඒ බර උසුලන්නේයි."

**30. මුනික ජාතකයඃ-** "මුණික නම් සූකරයාගේ භොජනය නොකැමති වෙව. කුමක් හෙයින්ද යත්? ඒ මුණික තෙමේ මරණාහාරයන් අනුභව කරයි. මධුරාහාරයට උත්සාහ නොකොට තමා ලත් තෘණපත් කව. මෙය දීර්ඝායුෂ්ක වීමේ ලක්ෂණයයි."

## 4 කුළාවක වර්ගය

**31. කුළාවක ජාතකයඃ-** "මාතලී දිව්‍ය පුත්‍රය, හිඹුල් වනයෙහි සුපර්ණ පෝතකයෝ (හෙවත්) ගුරුළු පැටව් වසන කූඩු රථ ශීර්ෂයෙන් දුරුකරව. අසුරයන් කෙරෙහි ඒකාන්තයෙන්ම අපගේ ප්‍රාණය හරිමු. මේ ගුරුළු පැටව් පහවූ කූඩුවක ඇත්තෝ නොවෙත්වායි."

**32. නච්ච ජාතකයඃ-** "මයුරය තොපගේ ශබ්දය මනොඥය, පිටද සිත්කළුය, ග්‍රීවයද වෛඩූර්ය මාණික්‍යයෙහි වර්ණය හා සමානය. පිල් සමූහයද බඹයක් පමණ විහිදී ඇත්තේය. මෙසේ වුවද භය ලජ්ජා නැති නැටීම නිසා තට මාගේ දුව නොදෙමියි" කීයේය.

**33. සම්මොද මාන ජාතකයඃ-** "වටු පක්ෂීහු සමගියෙන් සතුටුවූවාහු දැල නඟාගෙණ යෙති. ඒ පක්ෂීහු යම්කලෙක විරුද්ධ වාද කරන්නාහු වෙද්ද? එකල්හි මාගේ වසඟයට එන්නාහුයයි" කීයේය.

**34. මච්ඡ ජාතකයඃ-** "මට ශීතය පීඩා නොකරයි, මට උෂ්ණය පීඩා නොකරයි, මා දැළෙහි බැඳීමද පීඩාවක් නොකරයි.

යළි පීඩා නම් කිමද යත්? යම්බඳුවූ මා නොදක්නාවූ මත්ස්‍ය ධෙනු තොමෝ ඒ මාගේ ස්වාමියා අන් මත්ස්‍ය ධෙනුවක ළඟට කාමාශාවෙන් ගියේයයි සිතාද?" (හේ මේ සියලු දුකට වඩා මට පීඩා කෙරෙහි යනු අභිප්‍රායයි.)

35. **වට්ටක ජාතකය:-** "මාගේ පියාපත් ඇත්තාහ. අහසින් යන්ට නොහැක්කාහ, පාදයෝ ඇත්තාහ, පියවර නගා යන්ට නොහැක්කාහ, මාගේ මව්පියෝද මාහැර ගියහ. ජාත වේදය (හෙවත්) මේ ගින්න පහව යවයි" කීයේය.

36. **සකුණ ජාතකය:-** "යම් වෘක්ෂයක් පක්ෂීහු ඇසුරු කළාහුද, ඒ මේ වෘක්ෂයතෙම ගිනි හරනේය. වක්වූ අවයව ඇති හෙයින් වක්කංග නම් වූ පක්ෂීණි, දිශාවන් භජනය කරව්. පිහිට ඇති තැනින් භය උපන්නේයයි' කීයේය.

37. **තිත්තිර ජාතකය:-** "වැඩිහිටියන් පිදීමෙහි දක්ෂවූ යමෙක් තුමූ ගුණයෙන් වයසින් වැඩිහිටියන්ට පූජාකෙරෙද්ද ඔව්හු මේ ආත්මභාවයේ හිම පැසසිය යුත්තාහ.පරලෙව්හිද සුගතිය වන්නේයයි" කීයේය.

38. **බකජාතකය:-** "කපටි නුවණැත්තේ තමාගේම කපටිකමින් ඒකාන්තයෙන් සුවය නොවඩන්නේය. (හෙවත්) කිසි සුවයෙක්හි නොපිහිටයි. කෛරාටික නුවණින් යුත් පුරුෂතෙම තමාට භය පමුණුවන්නේය. කෙසේදයත්? කකුළුවා කෙරෙන් ගෙළ සිඳුම්ලත් කොකා මෙනැයි" කීයේය.

39. **නන්ද ජාතකය:-** "කුලජාත දාසියගේ පුත්වූ නන්දක නම්වූ දාසතෙම යම් තැනෙක්හි සිටියේ මහත්වූ පරුෂ වචන කියා බෙණේද? ස්වර්ණ රජත ආදී රත්න සමූහයද ස්වර්ණ මාලාද මෙතැන්හියයි හඟිමියි" කීයේය.

40. **ඛදිරංගාර ජාතකය:-** "උඩුකුරුවූ පා ඇත්තෙම් යටිකුරුවූ හිස් ඇත්තෙම් ඒකාන්තයෙන් නරකයෙහි (හෙවත්) මේ අඟුරු වළෙහි පතිතවෙමි. එතකුදු වුවත් ආර්යයන් විසින් නොකරණ ලද නොදීම නොකරන්නෙමි. එබැවින් මේ පිණ්ඩය (හෙවත්) බත පිළිගනු මැනවැයි" කීයේය.

# 5 අත්තකාම වර්ගය

**41. ලෝසක ජාතකය:-** "අභිවෘද්ධි කැමැත්තාවූ හිතයෙන් අනුකම්පා කරන්නහුගේ අනුශාසනය අවවාද කරණු ලබන්නාවූ යමෙක් තෙම නොකෙරේද? හෙතෙම එළුදෙනගේ පය එල්බගෙණ (ශොකකළාවූ) මිත්ත වින්දකයා මෙන් ශොක කරන්නේයයි" කීයේය.

**42. කපෝත ජාතකය:-** "අභිවෘද්ධි කැමැත්තාවූ හිතානුකම්පා ඇත්තහුගේ අනුශාසනය අවවාද කරණු ලබන්නාවූ යමෙක් තෙම නොකෙරේද, හෙතෙම කපෝතකයාගේ වචනය නොකොට අමිත්‍රවූ අරක්කැමියාගේ අතට අසුවූ කාකයා මෙන් ව්‍යසනයට පැමිණ හෝනේයයි" කීයේය.

**43. වේළුක ජාතකය:-** "අභිවෘද්ධි කැමැත්තාවූ හිතානුකම්පා ඇත්තහුගේ අනුශාසනය අවවාද කරණු ලබන්නාවූ යම් පුරුෂයෙක් නොකෙරේද, හෙතෙම වේළුක නම් සර්පයාගේ පියතෙම යම්සේද, එපරිද්දෙන් නෂ්ටවූයේ සයනය කෙරේයයි" කීයේය.

**44. මකස ජාතකය:-** "ප්‍රඥාවෙන් යුක්තවූ සතුරුතෙම උතුම්වේ. ප්‍රඥාවෙන් තොරවූ මිත්‍රතෙම නොම උතුම්. කුමක් හෙයින්ද යත්? මෝඩවූ පුත්‍රතෙම මදුරුවා මරන්නෙමියි පියාගේ හිස පැළීය. එහෙයිනි."

**45. රෝහිණී ජාතකය:-** "අනුකම්පා ඇත්තාවූ යම්බඳු බාලයෙක් ඇද්ද, ඔහුට වඩා නුවණැත්තාවූ සතුරුතෙමේ උතුම් වන්නේය. බාලවූ රෝහිණී නම් අඥාන තැනැත්තිය බලව" (මැස්සන් මරමියි) මව මොහොල්පහරින් මරා ශොක කරන්නීමැයි

**46. ආරාම දූෂක ජාතකය:-** "අනර්ථයෙහි දක්ෂයා විසින් කරණ ලද අර්ථචර්යා තොමෝ ඒකාන්තයෙන් සුවඑලවන්නී නොවේ. නුවණ නැත්තේ වැඩ පිරිහෙලයි. කවරක්හු මෙන්ද යත්? ආරාමයෙහිවූ වඳුරා මෙනියි" කීයේය.

**47. වාරුණී ජාතකයः-** "අනර්ථයෙහි දක්ෂයා විසින් කරණ ලද අර්ථචර්යා තොමෝ ඒකාන්තයෙන් සුව එලවන්නී නොවේ. නුවණ නැත්තේ වැඩ පිරිහෙලයි. කවරක්හු මෙන්ද යත්? (ලුනු ලා) සුරාව නැසූ කොණ්ඩඤ්ඤ නම් මානවකයා මෙනියි" කීයේය.

**48. වෙදබ්භ ජාතකයः-** "යමෙක් අනුපායයෙන් අභිවෘද්ධිය කැමති වේද, හෙතෙම වැනසේ. චේතිය නම් රටවැසි චෞරයෝ (වෛදර්භ නම් මන්ත්‍රය නිසා) වේදබ්භ නම්වූ බ්‍රාහ්මණයා නැසූහ. ඒ සියල්ලෝද වයසනයට පැමිණියාහුයි."

**49. නක්ඛත්ත ජාතකයः-** "නැකැත් බලන්නාවූ අඥානයාගේ අර්ථය තෙමේ ඉක්මයේ. අර්ථයට තමා කැමති අර්ථය ලැබීමම නැකත නමි. තාරකා රූපයෝ කිනම් අර්ථයක් සිද්ධකෙරෙත්ද?" (සිද්ධ නොකෙරෙති යනු භාවයි.)

**50. දුම්මෙධ ජාතකයः-** "දුෂ්ප්‍රාඥවූ මිනිසුන් දහසකින් යාගය තෙමේ මා විසින් ආරාධනා කරණ ලදී. දැන් වනාහි මම යාග කරන්නෙමි. කුමක් හෙයින්ද? (ප්‍රාණඝාතාදියෙහි යෙදුනාවූ) අධාර්මිකවූ ජනතෙමේ බොහෝ වෙයි." (එහෙයින් ඔවුන් ගෙණ යාග කරමියි සේයි.)

## 6 ආසිංස වර්ගය

**51. මහා සීලව ජාතකයः-** "පුරුෂතෙමේ පටන් ගත් කටයුත්ත නිමවීම කැමති වන්නේමැයි. පණ්ඩිත තෙමේ 'මෙහි නිමාවට නොගිය හැක්කෙමි'යි නොකළකිරෙන්නේය. මම වනාහි තමා දකිමි. යම්සේ කැමතිවීම්ද එසේම වීයයි" කීයේය.

**52. චූල ජනක ජාතකයः-** "පුරුෂතෙමේ ව්‍යායාම් කෙරේමය. ප්‍රාඥ පුරුෂ තෙමේ 'මෙය කළ හැකිදැ'යි නොකළකිරෙන්නේය. දියෙන් ගොඩට නැංගාවූ මම, තමා බලමියි" කීයේය.

**53. පුණ්ණපාති ජාතකයः-** "සුරාභාජනයෝ මා යන කල මෙන්ම පිරුණාහ. යම් මේ සුරා පිළිබඳ කථාවක් පවතීද,

ඕතොමෝ අතික්කම්මය. ආකාරයෙන් දනිමි. ඒකාන්තයෙන් මේ සුරාව යහපත් නොවන්නීයයි" කීයේය.

**54. ඵල ජාතකය:-** "මේ වෘක්ෂය තෙමේ නැගීමට දුෂ්කර නොවේ. ගමින් දුරුවූයේද නොවේ. මේ ගස යහපත් ගෙඩි ඇත්තේ නොවෙයි කියා මේ ආකාරයෙන් දනිමියි" කීයේය.

**55. පඤ්චායුධ ජාතකය:-** "යොගක්ෂෙම නම්වූ නිර්වාණ සම්පත්තියට පැමිණීම පිණිස උදාරවූ අදස් ඇති යම් මනුෂ්‍යයෙක් නොපසුබස්නාවූ සිතින් කුශල ධර්මයන් වඩාද, හෙතෙමේ පිළිවෙලින් සියලු සංයෝජනයන්ගේ ක්ෂයවීම ඇත්තාවූ අර්හත් ඵලයට පැමිණෙන්නේයයි" කීයේය.

**56. කඤ්චනක්ඛන්ධ ජාතකය:-** "යොගක්ෂෙම නම්වූ නිර්වාණයට පැමිණෙනු පිණිස දුරුකළාවූ නීවරණයන් ඇති සිතින් එසේම පහවූ නීවරණයන් ඇති හෙයින් නිර්මලවූ සිත් ඇති යම් මනුෂ්‍යයෙක් නිරාමිසාර්ථයෙන් කුසල නම්වූ බොධිපාක්ෂික ධර්මය වඩාද, හෙතෙමේ සියලු සංයෝජනයන්ගේ නැසීමට පිළිවෙලින් පැමිණෙන්නේයයි" කීයේය.

**57. වානරින්ද ජාතකය:-** "වානරේන්ද්‍රය, සත්‍ය වචනයද පරීක්ෂණ බුද්ධියද නැතිනොවන ධෛර්යද ත්‍යාගයද යන මේ ධර්මයෝ සතරදෙන තොපට මෙන් යමෙකුට විද්‍යමාන වේද්ද හෙතෙම පසමිතුරා ඉක්මවා පවතීයයි" කීයේය.

**58. තයොධම්ම ජාතකය:-** "වඳුරු රජ උතුම් වීර්යයයි කියනලද දක්ෂභාවයද, ශූරභාවයද, උපාය, ප්‍රඥාවද යන මේ ධර්මයෝ තිදෙන තොපට මෙන් යමෙකුට ඇත්තාහුද, හෙතෙම සතුරා ඉක්ම පවතීයයි" කීයේය.

**59. භෙරිවාද ජාතකය:-** "බෙර ගසන්නේය කල් ඉක්මවා වැඩියක් නොගසන්නේය. කුමක්හෙයින්දයත්, එසේ ඉක්මවා බෙර ගැසීම වනාහි ලාමකය. බෙර ගසන්නහු විසින් කහවණු සියයක් ලබනලදී. එය කල් ඉක්මවා බෙරගසන්නහු විසින් නසනලද්දේයයි" කීයේය.

**60. සංඛධමන ජාතකයः-** "සක් පිඹින්නේය. කල් ඉක්මවා වැඩියක් නොපිඹින්නේය. අධිකකොට පිඹීම වනාහි ලාමකය. කුමක්හෙයින්දයත්, සක් පිඹින්නහු විසින් සම්පත් ලබනලදහ. ඒ සම්පත් නැවත නැවත සක් පිඹින්නාවූ පියතෙම විනාශ කෙළේයයි" කීයේය.

# 7 ඉත්ථී වර්ගය

**61. අසාතමන්ත ජාතකයः-** "ලෝකයෙහි ස්ත්‍රීහු නම් ලාමකයහ. (නොහොත්) සාතයයි කියනලද සැපය මොවුන් කෙරෙහි නැත්දැයි අසාත නම් වෙත්. ඒ ස්ත්‍රීන්ගේ ක්ලේෂොත්පත්ති නිවාරණයට සීමාවක් නැත. ඔව්හු විශෙෂයෙන් ඇළුනාහුද, හික්මීමක් නැත්තාහුද හොඳ, නරක සියල්ල අනුභවකරණ ගිනි වැන්නාහ. ඔවුන් හැර විවේකය වඩන්නෙම පැවිදි වන්නෙමියි" කීයේය.

**62. අණ්ඩභූත ජාතකයः-** "බමුණුතෙම යම් කාරණයකින් ඝන වස්ත්‍රයකින් මුහුණ සමග වෙළනලද්දේ වීණාව වාදනය කෙළේද, ඒ බැමිණිය බිජ භූත (හෙවත්) මව්කුසින් නොනික්මී කල්හිම ගෙණාවාවූ (නොහොත්) මව්කුසෙහිදීම රක්ෂාකළාවූ භාර්යාව වේ. එබඳු භාර්යාවන් කෙරෙහි කවරෙක් ඒකාන්තයෙන් විශ්වාස කරන්නේද?" (නොකරන්නේය යනු භාවයි.)

**63. තක්ක ජාතකයः-** "ස්ත්‍රීහු නම් ක්‍රොධ ඇත්තාහ. කළ ගුණ නොදන්නාහුද වෙති. කේලාම් කියන්නහුද වෙති. ඔවුනොවුන් භෙද කරන්නාහුද වෙති. මහණ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙව ඒ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන තෝ ධ්‍යානාදී සුවය නොහරින්නෙහි යයි' වදාළේය.

**64. දුරාජාන ජාතකයः-** "මේ ස්ත්‍රී මා කැමැත්තීයයි සතුටු නොවෙව. මා නොකැමැත්තීයයි ශොක නොකරව ස්ත්‍රීන්ගේ භාවය හෙවත් අදහස නොදත හැක්කේය. කුමක් මෙන්ද? දියෙහි මත්ස්‍යයාගේ ගමන මෙනැයි" කීයේය.

**65. අනභිරති ජාතකයः-** "ගංගාවද මාර්ගයද සුරාපාන ශාලාවද සභා ශාලාවද පැන් මඩුවද යන මොහු යම් සේ

(සියල්ලන්ට සාධාරණ වෙද්ද) ලෝකයෙහි ස්ත්‍රීහුද එසේමැයි එහෙයින් පණ්ඩිත ජනයෝ මේ ස්ත්‍රීන්ට නොකිපෙත්ය”යි කීයේය.

**66. මුදු ලක්ඛණ ජාතකයඃ-** “මුදු ලක්ඛණාව නොලදින් පෙර එක් තෘෂ්ණාවක් විය. විශාල නෙත්‍ර ඇත්තී යම් තැනක පටන් ලබන ලද්දීද. ඒ තෘෂ්ණාතොමෝ ගෘහොපකරණාදියෙහි අනෙක් තෘෂ්ණාවක් ඉපදවීයයි” කීයේය.

**67. උච්ඡංග ජාතකයඃ-** “දෙවයන් වහන්ස, පුත්‍ර තෙමේ මාගේ ඇකයෙහිමය. ස්වාමිතෙමේ හුදකලාව මඟ යන්නාවූ මට සුලභය. යම් දෙශයකින් සහෝදරයකු ගෙණ එම්ද, ඒ මාතෘකුක්ෂි නම් දෙශය නොදක්නෙමි”යි (එහෙයින් මාගේ සහෝදරයා දෙවයි ඉල්වූ.)

**68. සාකෙත ජාතකයඃ-** “යම් පුද්ගලයෙකු කෙරෙහි සිත පිහිටාද, සිතත් දුටු පමණෙකින් පහදීද, නුදුටු විරූදවූ ඒ පුරුෂයා කෙරෙහි එකාන්තයෙන් විශ්වාස කරන්නේයයි” කීයේය.

**69. විෂවන්ත ජාතකයඃ-** “යම් විෂයක් හරණ ලදද ඒ වමනය කළ විෂය මම ජීවිත හේතුවෙන් නැවත හැරගනිම්ද, එයට නින්දා වේවා, මාගේ ජීවත් වීමට වඩා (විෂය උරා නොගෙන ගින්නට වැද) මිය යෑමම උතුම්යයි” කීයේය.

**70. කුද්දාල ජාතකයඃ-** “යම් රටක් දිනන ලද්දේ නැවත සතුරන් විසින් පරදවනු ලැබේද, නොහොත් සතුරන් මැඩ ලැබූ යම් ජයක් නැවත සතුරන් විසින් පරදවනු ලැබේද, ඒ දිනුම මනාකොට දිනන ලද්දක් නොවේ. යමක් සතුරන් මැඩ දිනන ලදද නොහොත්, යම් ජයක් සතුරන් විසින් නොපරදවනු ලැබේද, ඒ දිනීම වනාහි යහපත් කොට දිනුවා නම් වේයයි” කීයේය.

## 8 වරණ වර්ගය

**71. වරණ ජාතකයඃ-** “යමෙක් තෙමේ පළමු කටයුතුදෑ පසුව කරන්නට කැමැතිවේද, හෙතෙමේ එණු වරණ දඬු බිඳි ශිෂ්‍යයා මෙනි. එබඳු පුද්ගලතෙමේ පසුව තැවේ යයි” කීයේය.

**72. සීලව නාගරාජ ජාතකය:-** "කළගුණ නොදන්නාවූ නිරන්තරයෙන් අනුන්ගේ සිදුරු සොයන්නාවූ පුරුෂයාහට ඉදින් සියලු පොළොව දුන්නේ වී නමුත් ඔහු සතුටු කළ නොහැක්කේයයි" කීයේය.

**73. සච්චංකිර ජාතකය:-** "ගඟ දියෙහි යන්නාවූ දරදඬු නඟා ගොඩ තබන ලද්දේ උතුම් වේ. කළගුණ නොදන්නා සමහර පුරුෂයෙක් උතුම් නොවේ මැයි මේ ලෝකයෙහි සමහර පණ්ඩිත මනුෂ්‍යයෝ සැබවක්ම කීවේලුයි" කීයේය.

**74. රුක්ඛධම්ම ජාතකය:-** "බොහෝවූ එක්වසිටි නෑයෝ යහපත්හ. වනයෙහි හටගත්තාවූ වෘක්ෂයෝද, ඝනව සිටි හෙයින් ශොභනයහ. තනිව සිටියාවූ මහත්වූද වන දෙටු රුක වාතයතෙමේ උදුරා දමායයි" කීයේය.

**75. මච්ඡ ජාතකය:-** "මේඝය ගර්ජනා කරව. කවුඩු සමූහයාගේ මත්ස්‍ය නිධානය නසව. කපුටු සමූහයා ශොකය පිණිස රඳවව, මාද ශොකයෙන් මුදවවයි" කීයේය.

**76. අසංකිය ජාතකය:-** "ගමෙහිද, සැකනැත්තේ වෙමි. අරණ්‍යයෙහිද මට කිසි භයක් නැත්තේය. මෛත්‍රියෙන්ද කරුණාවෙන්ද ඍජුවූ බ්‍රහ්මලොකගාමී මාර්ගයට ආරූඪ වූයෙමි. නොහොත් සිල්වත්බව හේතුකොටගෙණ කාම ද්වාරාදියෙන් අකුටිල හෙයින් ඍජුවූ දිව්‍යලෝක ගාමී මාර්ගයට නැංගේ වෙමියි" කීයේය.

**77. මහා සුපින ජාතකය:-** "ලබු කබල් ගැලෙති පාෂාණයෝ ඉල්පෙති. මැඩි පැටියෝ කෘෂ්ණ සර්පයන් ගිලිති. කවුඩෙකු ස්වර්ණහංසයෝ පිරිවරති. එළුවන්ට භයින් වෘකයෝ තැතිගනිති. විපර්යාසයෙක් පවතී. මේ කාලයෙහි මේ ස්වප්නයන්ගේ නිෂ්පත්ති නැත්තේය"යි කීයේය.

**78. ඉල්ලීස ජාතකය:-** "දෙදෙනම ලුහුඬු පා ඇත්තාහ. දෙදෙනම කුණ්ඨවූ අත් ඇත්තාහ. (දණින් වැලමිටෙන් පාත ලුහුඬු පුරුක් ඇත්තාහ.) දෙදෙනම විසමවූ ඇස් ඇත්තාහ. හෙවත් වපරයහ. දෙදෙනාගේම හිසෙහි පිළිකාවෝ හටගත්හ. මම ඉල්ලීසයා නොදකිමියි" කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**79. ඛරස්සර ජාතකයඃ-** "යම් කලෙක්හි ගවයෝ පැහැරගෙණ යන ලද්දාහුද, නසන ලද්දාහුද, ගෘහයෝ දවන ලද්දාහුද ජනතෙමේද තිර කොට බැඳගෙණ යන ලදද එකල්හි නැසුනු පුත්‍රයන් ඇත්තියගේ පුත්‍රතෙමේ අමධුරවූ ශබ්ද ඇති පටහ බෙරය වාදනය කරමින් ආයේයයි" කීයේය.

**80. භීමසේන ජාතකයඃ-** "භීමසේනය, තා විසින් යමක් කියන ලදද නැවත පසුව තාගේ කුණුව වැහෙන හෙයින් පූතිසර නම් වූ ශරීර මළ ධාරාවෝ වෑහෙත්. තාගේ යුද්ධ කථාවද මේ පීඩාවද යන දෙක සම නොවේයයි" කීයේය.

## 9 අපායිම්හ වර්ගය

**81. සුරාපාන ජාතකයඃ-** "සුරා පීම්හ, නැටුවෙමු, ගායනා කෙළෙමු. (නැවත ඒ නුසුදුසුය කියා හැඬීම්.) සිහි මුලාකරණ සුරාව පානයකොට යම් හෙයකින් වඳුරෝ නොවූයෙමුද එයම යෙහෙකැයි මෙසේ තමන්ගේ නුගුණ කීහු."

**82. මිත්තවින්ද ජාතකයඃ-** "පළිඟු ප්‍රාසාදයද රජත ප්‍රාසාදයද, මාණික්‍ය ප්‍රාසාදයද ඉක්ම ඒ තෝ පාෂාණමයවූ උර චක්‍රයෙන් මඩනා ලද්දෙහි යම් හෙයකින් වූයේද, එහෙයින් ජීවත්වනතාක් උරචක්‍රයෙන් තෝ නොමිදෙන්නෙහියයි" කීයේය.

**83. කාලකණ්ණි ජාතකයඃ-** "ඒකාන්තයෙන් සත්පියවරක් එක්ව ගමන් කිරීමෙන් මිත්‍රවේ. දොළොස් දිනක් එක්ව විසීමෙන් වනාහි සහායයාවේ. "මසකින්ද, අඩ මසකින්ද, නෑයෙකු හා සමවේ. ඉන් වැඩිකලක් එක්ව විසීමෙන් ආත්ම සමානයෙක්ද වේ. ඒ මම ආත්ම සුඛය හේතුකොටගෙණ බොහෝ කලක් වැස පුරුදුවූ කාලකණ්ණි නම්වූ යහළුවා කෙසේ හැර පියම් දැයි" කීයේය.

**84. අත්ථස්සද්වාර ජාතකයඃ-** "නිරෝගි බව නම්වූ උතුම්වූ ලාභයද ආචාරශීලයද, ගුණයෙන් වැඩිහිටියන්ගේ අනුමතියද (හෙවත්) අවවාදයද, බහුශ්‍රැත බවද, සුචරිත ධර්මයන්ට අනුව පැවැත්මද, නොපසුබටවූ සිත් ඇති බවද කැමති වන්නේය.

මේ සදෙන අභිවෘද්ධියට ප්‍රධානවූ ද්වාරයෝ (හෙවත් උපායයෝ) වෙතියි" කීය.

**85. කිම්පක්ක ජාතකය:-** "මත්තෙහි වන දෝෂ නොදැක යමෙක් කම්සැප සේවනය කෙරේද, ඒ කාමයෝ ඔහු විපාකාන්තයෙහි (නරකාදියෙහි උපන්නාහු) නසත්, කුමක් මෙන්ද යත්? අනුභව කරණ ලද කිම්පක්ක නම්වූ විෂ ඵලය මෙනි."

**86. ශීලවිමංස ජාතකය:-** "ශීලයම යහපත්වේ. ලෝකයෙහි ශීලය උතුම්ය. බලව, ඝොරවූ විෂ ඇති සර්පතෙම සිල්වත් වෙමියි අනුන්ට හිංසාවක් නොකෙරේයයි" කීයේය.

**87. මංගල ජාතකය:-** "යම් රහත්කෙනෙකුගේ දිට්ඨාදී මංගලයෝ මනාකොට නසන ලද්දාහුද, චන්ද්‍රග්‍රහණාදී උත්පාදයෝද, ශුභවූ ස්වප්නයෝද, සුභග, දූර්භගාදී ලක්ෂණයෝද යන මේ දෘෂ්ටිස්ථානයෝ මනාකොට නසන ලද්දාහුද, මංගල දොෂයෙන් ඉක්ම පැවැත්තේද, ක්‍රොධ උපනාහ. ආදීවශයෙන් ගන්නාවූ තරඟයන්ද, කාමයෝගාදීවූ යෝග ධර්මයන්ද මැඩපවත්වා සිටියේද, ඒ ක්ෂීණාශ්‍රවතෙම කිසි කලෙකත් ප්‍රතිසන්ධිවශයෙන් මෙලොවට නොඑන්නේයයි" වදාළේය.

**88. සාරම්භ ජාතකය:-** "යහපත්වූ වචනයක්ම කියන්නේය ලාමකවූ තෙපුලක් නොකියන්නේය. යහපත් වචනයාගේ මෝක්ෂය හෙවත් බිණීම ප්‍රශස්තය. ලාමකවූ තෙපුල මුදා හෙවත් කියා මෙලොව පරලොව තැවෙන්නේ යයි" වදාළේය.

**89. කුහක ජාතකය:-** "මෘදුවූ බස් කියන්නාවූ තොපගේ වචනයම සිළුටුවී තණ ගසක් පමණෙක කුකුස් කරමින් ඇළුනෙහිය. නිෂ්ක (කලං 25 ක රන්) සියයක් ගෙණයන්නෙහි නොඇළුනෙහිද වීයයි" කීයේය.

**90. අකතඤ්ඤු ජාතකය:-** "යමෙක් පෙර අනුන් විසින් කරණලද උපකාර ඇත්තේ නිෂ්පාදිත කෘත්‍ය ඇත්තේ එය නොදනීද, පසුව කටයුත්තක් පැමිණිකල්හි එයට කිසිවක්හු නොලබායයි" කීයේය.

# 10 ලිත්ත වර්ගය.

**91. ලිත්ත ජාතකයා:-** "උතුම්වූ තේජස් ඇති විෂ තැවරුණාවූ පස ඇටය ගිලින්නාවූ පුරුෂතෙම විෂ තැවරූ බව නොදනී. කොල ගිලව, පාපීවූ අක්ෂධූර්තය පස ඇටය ගිලව. පසුව තට මෙහි නොමිහිරි බව වන්නේ යයි" කීයේය.

**92. මහාසාර ජාතකයා:-** "යුද්ධය ලංව ඇතිකල්හි ශූරවූ පුරුෂයා කැමතිවෙති. මන්ත්‍රණය කරණ කල්හි කළ මන්ත්‍රණය ප්‍රකාශ නොකරණ හෙයින් අකුතුහල පුරුෂයා කැමතිවෙති. ආහාරපාන එළවූකල්හි හෝ ප්‍රියවූවහුද කැමති වෙති. ප්‍රශ්න විසර්ජනාදීවූ අර්ථයක් උපන් කල්හි පණ්ඩිතයා කැමතිවෙත් යයි" කීයේය.

**93. විශ්වාසභොජන ජාතකයා:-** "පෙර විශ්වාසව පසුව අවිශ්වාසවූවහු කෙරෙහි විශ්වාස නොකරන්නේය. පෙර අවිශ්වාසව පසුව විශ්වාසවූවහු කෙරෙහිද, විශ්වාස නොකරන්නේය. කුමක්හෙයින්ද යත්? ඒ දෙදෙනා කෙරෙහිම විශ්වාසය හේතුකොටගෙණ භය පැමිණේ. කුමක් මෙන්ද යත් මීවින්න කෙරෙන් භය පැමිණි සිංහයාමෙනි. (නොහොත්) විශ්වාස වශයෙන් සිංහයා කරා පැමිණි මීවින්න මෙනැයි' කීයේය.

**94. ලෝමහංස ජාතකයා:-** "සූර්යතාපයෙන් විශෙෂයෙන් තැවුනෙමි, හිම ජලයෙන් විශෙෂයෙන් ශීතල වූයෙමි. භයානකවූ වනලැහැබ්හි හුදකළාවූයෙමි, නිර්වස්ත්‍රවූයෙම් ගිනි ලංව නොහිඳිනෙමි, බඹසර සෙවීමෙහි යෙදුනෙමි, මුනි නම් වී මියි" කීයේය.

**95. මහාසුදස්සන ජාතකයා:-** "සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපිද නස්නා ස්වභාව ඇත්තාහ. ඉපිද නිරුද්ධ වෙත්. ඒ සංස්කාර ධර්මයන්ගේ සංසිඳීමයයි කියන ලද නිර්වාණයම සැපයයි" වදාළේය.

**96. තෙලපත්ත ජාතකයා:-** "මුවවිට දක්වා පිරුණාවූ නොවැගිරෙන්නාවූ, තලතෙල් පාත්‍රය යම්සේ ගෙණයන්නේද

එසේම නොගියවිරූ දිශාවවූ නිවන පතන්නේ ස්වකීයවූ සිත රක්නේයයි" වදාළේය.

**97. නාමසිද්ධි ජාතකයː-** "ජීවකයාද මළහු දැක ධනපාලියද දුප්පත්වූවා දැක පන්ථකයාද වනයෙහි මං මුළාවූවහු දැක පාපකයා නැවත ආයේයයි" කීයේය.

**98. කූටවාණිජ ජාතකයː-** "පණ්ඩිතයා නම් යහපත්වේ. නාම මාත්‍රයෙන් අතිපණ්ඩිත නම්වූ තැනැත්තේ උතුම් නොවේමැයි අතිපණ්ඩිතවූ පුත්‍රයා විසින් ඇසිල්ලකින් දවන ලද්දේ වීමියි" කීයේය.

**99. පරොසහස්ස ජාතකයː-** "රැස්වූවන් අතුරෙන් දහසකටත් වැඩිවූ ප්‍රඥා රහිතවූ ඔව්හු අවුරුදු සියයකුදු හඬන්නාහු නමුදු යමෙක් කියනලද වචනයාගේ අර්ථය දනීද, සප්‍රාඥවූ ඒ පුරුෂතෙමේම හුදකලාවූයේද, උතුම් වේයයි" කීයේය.

**100. අසාතරූප ජාතකයː-** "නොමිහිරි දෙය මිහිරි ස්වරූපයෙන්ද, අප්‍රිය වස්තුව ප්‍රිය ස්වරූපයෙන්ද දුක සැපය වශයෙන්ද ප්‍රමාදවූ පුරුෂයා ඉක්මවා පවතීයයි" වදාළේය.

## 11 පරොසහස්ස වර්ගය.

**101. පරොසත ජාතකයː-** 'රැස්වූවන් අතුරෙහි සියයකට අධිකවූද, ප්‍රඥා රහිතවූ ඔව්හු අවුරුදු සියයක් සිතා බලන්නාහු නමුදු යමෙක් කියනලද වචනයාගේ අර්ථය දනීද, ප්‍රඥා සහිතවූ හෙතෙම එකලාවූයේම උතුම් වේ යයි කීයේය.

**102. පණ්ණික ජාතකයː-** "යමෙක් දුක් ඇති තැනැත්තියට ආරක්ෂාස්ථානය වන්නේද, මාගේ ඒ පියතෙම වනයෙහි මිත්‍රද්‍රෝහි කර්මය කෙරෙයි. වනය මැද ඒ මම කවරෙකුට හඬා කියම්ද? යමෙක් ආරක්ෂාකරන්නේද, හෙතෙම බලාත්කාරකම් කෙරේයයි" කීයේය.

**103. වේරී ජාතකයː-** "යම් තැනක වෛර ඇති පුද්ගලතෙම වෙසේද, එතන්හි නුවණැත්තේ නොවසන්නේයි කුමක්

හෙයින්දයත්? වෛර ඇත්තවුන් අතුරෙහි එක් දවසක් හෝ දෙදවසක් හෝ දුකසේ වාසය කෙරේයයි" කීයේය.

104. **මිත්තවින්ද ජාතකයः-** "සතර දෙනෙකුන්ගෙන් නොසතුටුව අටදෙනෙකු ළඟට ගියේය. අට දෙනෙකුගෙන් නොසතුටුව සොළොස් දෙනෙකු ළඟට ගියේය. සොළොස් දෙනෙකුගෙන්ද නොසතුටුව දෙතිස් දෙනෙකු ළඟට ගියේය. වැඩි වැඩියක් පතන්නේ උරචක්‍රයට ලංවීය. තෘෂ්ණාවෙන් නසනලද පුරුෂයාගේ මස්තකයෙහි උරචක්‍රය භ්‍රමණය වේයයි" කීයේය.

105. **දුබ්බලකට්ඨි ජාතකයः-** "වනයෙහි බොහෝ වූ දුර්වලවූ යම් මේ දරකඩක් සුළඟ බිඳීද, ඒ දර බිඳීමට හස්තිය, ඉදින් බිය වෙහි නම් ඒකාන්තයෙන් තෝ කෘශවූයෙක් වන්නෙහියයි" කීයේය.

106. **උදඤ්චනී ජාතකයः-** "ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වන්නාවූ මා තවන්නාවූ නොහොත් කැමති කැමතිදෑ පිසන්නාවූ සැළින් හෝ ලිඳෙන් පැන් ගන්නා කිනිස්සක් නොහොත් කුඩා භාජනයක් මෙන් අනුන්ගෙන් වස්තුව හැර ගන්නාසේ දන්නාවූ අඹුවය යන නමින් සොර ස්ත්‍රියක් තෙල්ද, ලුණුද, යන කැමති කැමතිදෑ ඉල්වායයි" කීයේය.

107. **සාලිත්ත ජාතකයः-** "යම් කෙබඳුවූද ශිල්පයක් ඉතා යහපත එළුබෙටි විදීමෙන් සතර දිග්හි වූ ගම් ලබන ලද්දාහුයයි" කීයේය.

108. **බාහිය ජාතකයः-** "හික්මීමට සුදුසුවූ ශිල්පයන් ඉගෙණ ගන්නේය. ප්‍රයෝජන කිමදයත්, ඒ ඒ ශිල්පයෙහි කැමතිවූ ජනයෝ ඇත්තාහ.

යම්හෙයකින් ජනපදයෙන් පිටත්හි උපන්නාවූ ස්ත්‍රීතොමෝ මනාකොට කළ මළපහකිරීමෙන් (හෙවත්) හිරිඔතප් ඇතුව විළියෙන් මුවාව කළ මළ පහකිරීමෙන් රජහු සතුටුකරවීද, එහෙයිනැයි" කීයේය.

**109. කුණ්ඩපූව ජාතකයː-** "පුරුෂතෙම යම්බඳු ආහාරයක් ඇත්තේවේද, ඔහුගේ දේවතාවාද එබඳු ආහාරයක් ඇත්තී වේ. මේ කුඩු කැවුම ගෙණෙව. මාගේ කොටස නොනසවයි" කීයේය.

**110. සබ්බ සංහාර ජාතකයː-** සියල්ල එකතුවූ සුවඳක් නැත. අමිශ්‍ර හෙයින් පිරිසුදුවූ පුවගු මල්ද සුවඳ විහිදෙයි. මේ ධූර්ත තැනැත්තිය බොරු කියයි. මැහැල්ලී තොමෝ සැබවක් කීවායයි" කීයේය.

## 12 හංස වර්ගය.

**111. ගද්‍රභ පඤ්හ ජාතකයː-** "ඉදින් රාජොත්තමය, නුඹ පුතුට වඩා පියා උතුම් යයි මෙසේ හඟින්නෙහි නම් එබැවින් ඔබගේ අශ්ව තරයාට වඩා මේ ගද්‍රභයා උතුම් වේ. එයට කරුණු කිමයත්? අශ්වතරයාට වනාහි කොටළුතෙම පියා වේයයි" කීයේය.

**112. අමරාදේවී පඤ්හ ජාතකයː-** "යම් තැනෙක්හි හත්සුණු බත් තබා විකුණන කාඩි තබා විකුණන කඩ පිළෙක් ඇත්ද, යම් තැනෙක්හි පිපුනාවූ කොබෝලීල ගසක් ඇද්ද, යම් අතකින් කම්ද, ඒ අත දිශාවෙන් මග කියමි. යම් අතකින් නොකම්ද, ඒ අත දිශාවෙන් නොකියමි. යව මැදුම්ගම පිහිටි අපගේ ගෙට මාර්ගය වේ. මේ සඟවා කී මාර්ගය හෙවත්, කාරණය දැන ගණුවයි" කීයේය.

**113. සිඟාල ජාතකයː-** "බමුණ රා බොනලද සිවළාගේ වචනය අදහන්නෙහිද, ඔහුට බෙල්ලන් සියයකුදු නැත, කහවණු දෙසියයක් කොයින් දැයි" කීයේය.

**114. මිත චින්තී ජාතකයː-** "බහු චින්තී නම්වූ මත්ස්‍යයාද, අල්ප චින්තී නම් මත්ස්‍යයාද යන දෙදෙන දැළෙහි බැඳුනාහ. ප්‍රමාණවත් සිතිවිලි ඇති හෙයින් මිත චින්තී නම්වූ මත්ස්‍යතෙම දැළෙන් මිදීය. ඒ (බොහෝ සිතන) (ටිකක් සිතන) යන දෙදෙන ඒ ජලයෙහි මිත චින්තී නම් මත්ස්‍යයා හා එක්වූවාහුයයි කීයේය.

**115. අනුශාසික ජාතකයː-** "යමක්තොමෝ ලොල්වූ හැසුරුම් ඇත්තී අනුන්ට අනුශාසනා කරන්නීද, ඒ මේ

ශාරිකාතොමෝ චක්‍රයෙන් නසන ලද්දී පහවූ පක්ෂ ඇත්තී මාර්ගයෙහි සයනය කෙරේයයි” කීයේය.

116. **දුබ්බච ජාතකයః-** “ආචාර්යය අධිකවූ ක්‍රියාවක් කෙළෙහිය නුඹගේ ශිෂ්‍යවූ මටද මේ කාරණය රුචි නොවේ. සතර වන ශස්ත්‍රය (හෙවත්) ආයුධය පැන පස්වන ආයුධයෙහි ඇවිණියේ වෙහියයි” කීයේය.

117. **තිත්තිර ජාතකයః-** ඉතා ශබ්දවූ බොහෝ බල ස්වභාව ඇත්තාවූ කල් ඉක්මවා කියනලද වචනය නුවණ නැත්තහු නසයි. කුමක් මෙන්ද යත්? පමණ ඉක්මවා හැඬූ වටුවා මෙනි. (යම්සේ වටුවා නිතර ශබ්දකිරීමෙන් විනාශයට ගියේද, එසේම දොඩමළු තැනැත්තේ විනාශයට පැමිණේ.”)

118. **වට්ටක ජාතකයః-** “පුරුෂතෙම නොසිතන්නේ හෙවත් දුකට පැමිණ මේ උපායෙන් මේ දුකෙන් මිදෙමියි. කරුණු නොසළකන්නේ විශෙෂයට නොපැමිණේ සිතන ලද කර්මයාගේ ප්‍රයෝජනය බලව, වධ බන්ධනයෙන් මිදුනේ වෙමියි” කීයේය.

119. **අකාල රාවි ජාතකයః-** “මව්පිය දෙදෙනා කෙරෙහි නොවැඩුනාවූ ඇදුරු කුලයෙහි නොවිසූ මේ කුකුළා හැඬීමට සුදුසු කාලය හෝ නුසුදුසු කාලය නොදනීයයි” කීයේය.

120. **බන්ධන මොක්ඛ ජාතකයః-** “යම් තැනෙක්හි අඥානයෝ කථා කෙරෙද්ද, එතැන්හි බන්ධනයට නුවණැත්තෝ කථා කෙරෙද්ද, එහි බන්ධනයට සුදුස්සෝද මිදෙත් යයි” කීයේය.

---

## 13 කුසනාළි වර්ගය.

121. **කුසනාළි ජාතකයః-** “ජාත්‍යාදීන් සමාන වූයේද මිත්‍ර ධර්මය කරන්නේය. නොහොත් ජාත්‍යාදියෙන් ශ්‍රෙෂ්ඨ වූයේද මිත්‍ර ධර්මය කරන්නේය. ජාත්‍යාදියෙන් හීනවූද එකෙක් මිත්‍ර ධර්මය කරන්නේය. ඒ මිත්‍රයෝ ව්‍යසනයෙහිදී උත්තමවූ අර්ථයක් කරන්නාහුය. කවරෙකු මෙන්ද යත්? බුරුත ගස උපන්

(මහෙශාක්‍ය දෙවතාවූ) මමත් (දිය බෙරලිය ගස උපන් අල්පෙශාක්‍ය දෙවතාවූ) කුස නාලිත් යම්සේද එමෙනි.”

122. **දුම්මෙධ ජාතකය:-** “නුවණ නැත්තේ යසස් ලැබ තමහට අනර්ථයක් කෙරේ. තමහටද අන්‍යයන්ටද හිංසා පිණිස පිළිපදී යයි” කීයේය.

123. **නංගලීස ජාතකය:-** “අඥානතෙම සියලු තන්හි නොකියයුතු යුතු වචනය හැම තැන්හී කියයි. මෙතෙම මිදුනු කිරිද නොදන්නේය. නඟුලිසද නොදන්නේය. කුමක් හෙයින්ද යත්? මෙතෙම මිදුනු කිරිද නඟුලිස යයි සිතාද, එහෙයිනි.”

124. **අම්බ ජාතකය:-** “නුවණැති පුරුෂතෙම උත්සාහ කරන්නේමැයි නොකලකිරෙන්නේය. ව්‍යායාමයාගේ ප්‍රයෝජනය බලව, ඒ කවරේද යත්? මෙසේද මෙසේද වීයයි ශ්‍රැති වශයෙන් නොව ප්‍රත්‍යක්ෂ වශයෙන්ම අඹ බොහෝ තපස්වීන් විසින් අනුභව කරණ ලදහයි කීයේය.”

125. **කටාහක ජාතකය:-** “ඒ පුරුෂතෙම තමාගේ තොරතුරු නොදන්නා අන් ජනපදයකට ගියේ බොහෝ කොටද පරිභව වචනාදීන් කියන්නේය. තම ස්වාමිතෙම නැවත අවුත් දූෂණය කරන්නේය. කටාහකය, සම්පත් අනුභව කරවයි” කීයේය.

126. **අසිලක්ඛණ ජාතකය:-** “එකෙකුට එසේම යහපත් වෙයි. එකෙකුට එසේම අයහපත් වෙයි. එහෙයින් සියල්ලම යහපත් නොවෙයි. සියල්ලම අයහපත් නොවේ යයි කීයේය. (සමහරුන්ට ඉෂ්ටදායකවූ කටයුත්ත සමහරුන්ට අනිෂ්ට දායකමය, යනුයි.”

127. **කලණ්ඩුක ජාතකය:-** “ඒ දේශයෝය. ඔහු වස්තූහුය වනය ගොචරකොට ඇත්තාවූ මමද දනිමි. ස්වාමිහු තා දැනගෙණ හැරගන්නාහුය. කලණ්ඩුකය, කිරිබීම් කරවයි කීයේය.”

128. **බිළාරවත ජාතකය:-** “යමෙක් ඒකාන්තයෙන් දශකුශල ධර්මයන් ද්වජයක් කොට ගෙණ සත්වයන් විශ්වාසකොට ගෙණ සැඟවුනේ පාපයෙහි හැසිරේද, ඔහුගේ ඒ ව්‍රතය බිළාල ව්‍රත නම් වේ.”

**129. අග්ගික ජාතකය:-** "මේ මුදුන පිං පිණිස නොවෙයි. මේ මුදුන කෑම පිණිසවේ. ඇඟිලි ගණනට මූසික වර්ගයා නොපැමිණේ. අග්ගිකය, තාගේ මීයන් ගණන් කිරීම ප්‍රමාණයක් වේවායි" කීයේය.

**130. කෝසිය ජාතකය:-** "කෝසියාව, ලෙඩෙමි යන කීම පරිද්දෙන්ම ලෙඩට සුදුසු බෙහෙත් අනුභවකරව, තී අනුභව කළ ප්‍රණීත ආහාරවූ පරිද්දෙන්ම කියව, තීගේ කීමද වැදීමද යන මේ දෙක සම නොවේයයි" කීයේය.

---

## 14 අසම්පදාන වර්ගය.

**131. අසම්පදාන ජාතකය:-** "යම්කිසි හීනවූද, උත්තම වූද, වස්තුවක්හුගේ නොගැන්මෙන් අඥානයාගේ මිත්‍රයෝ කිළුටුවූවාහු වෙත්, (හෙවත්) බිඳෙත්. එහෙයින් මිත්‍රයා විසින් දෙනලද බොල් කුරුණි සතර ගණිමියි, මාගේ මිත්‍රභාවය පිරිහීමට නොයේවා. මේ මිත්‍රත්වය කලක් නොපවතීවායි" කීයේය.

**132. පඤ්චගරු ජාතකය:-** "දක්ෂවූ පසේබුදුවරයන්ගේ අවවාදයෙහි දැඩිවූ ධෛර්යයෙන්ද, සිත් තැතිගැණිමද, ශරීරය කම්පාකරණ මහත් භය ඇති බවද, හේතුකොට ගෙණ නොනැවතිහෙයින්ද, යකින්නන්ගේ වශඟබවට නොපැමිණියෙමු. මට මහත්වූ භයින් ඒ සෙත්බව වූයේය."

**133. ඝතාසන ජාතකය:-** "යම් තැනෙක්හි නිර්භයද, එතන්හී සතුරා නැගීසිටියේය. ජලය මැද ඝතාසන නම්වූ ගින්න දිළිහේ. පොළොවෙහිවූ ගසෙහි අද අපට වාසයෙක් නැත. නොයෙක් දිශාවන් සේවනය කරව්. අද අපට පිහිටවූ තැනින් භය උපන්නේයයි" කීයේය.

**134. ඣානසොධන ජාතකය:-** "යම් සචිත්තක සත්වකෙනෙක් ඇද්ද ඔවුහූද දුගීහ. අසංඥ භවයෙහි උපන්නාවූ යම් අචිත්තක සත්ව කෙනෙක් ඇද්ද ඔවුහුද (නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය නොලැබීමෙන්) දුර්ගතයහ. මේ

(සංඥී භාවයද, අසංඥී භාවයද යන) දෙක දුරු කරව. ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති සැපය නිර්දොෂ වේයයි” කීයේය.

**135.** චන්දාභ ජාතකයඃ- “චන්ද්‍රයා වැනිවූ ඔදාත කසිනයද, සූර්යයා වැනිවූ පීත කසිනයද යමෙක් මෙහිලා නුවණින් අරමුණු කොට ඇතුළුවේද, හෙවත් එහි පිහිටාද, නොහොත් චන්ද්‍රප්‍රභාව යම් තැනෙක පතලේද සූර්යප්‍රභාවයම තැනෙක පතලේද ඒ තන්හි ප්‍රතිභාග කසිනය වඩා ඒ අරමුණු කොට ධ්‍යානය උපදවන්නේය. මෙසේ දෙවැදෑරුම් ආලොකය ප්‍රඥාවෙන් වඩාද, මෙසේ වැඩූ විතර්ක රහිතවූ ද්විතීය ධ්‍යානයෙන් ආභශ්වර බ්‍රහ්ම ලෝකයට පැමිණියේ වේයයි” කීයේය.”

**136. සුවණ්ණ හංස ජාතකයඃ-** “යමක් ලබන ලදද එයින් සතුටු විය යුතුයි. අධිකවූ ලෝභය වනාහි ලාමකවේ. හංසරාජයා ගෙණ ස්වර්ණයෙන් පිරිහුණේයයි කීයේය.

**137. බබ්බුක ජාතකයඃ-** “යම් තැනෙක්හි එක් බළලෙක් (මූෂිකාදි කිසි ගොදුරක්) ලබාද එතැන්හි දෙවෙනි බළලෙක් උපදී. තුන්වෙනි බළලෙක්ද, සතරවෙනි බළලෙක්ද, උපදී. තීගේ මේ පළිගු බිලය බබ්බුකා බිල නම් වේ.

**138. ගොධ ජාතකයඃ-** “මෝඩය, තට ජටායෙන් කවර ප්‍රයෝජනද? තට අඳුන් දිවි සමින් කවර ප්‍රයෝජනද? තාගේ හෘදය රාගාදියෙන් ගහනය. පිටත තපස් වෙස් දැරීමෙන් පිරිමදනෙහියයි” කීයේය.

**139. උභතොභට්ඨ ජාතකයඃ-** “ඇස් දෙක බිඳුනහ. ගොඩ තිබූ වස්ත්‍රයද නැති විය. යෙහෙළිය හා ගෙහි අඹුවගේ කලහයවිය. දියෙහිද, ගොඩෙහිද යන දෙතන්හි අවුලට පැමිණි වැඩ ඇත්තේ වෙහියයි” කීයේය.

**140. කාක ජාතකයඃ-** “නිරන්තරයෙන් බියපත්වූ සිත් ඇත්තාහ. සියලු ලෝකයා වෙහෙසන්නාහ. එහෙයින් අපගේ නෑයන්වූ ඒ කවුඩන්ගේ වුරුණු තෙල් නැත්තේ යයි” කීයේය.

---

# 15 කකණ්ටක වර්ගය.

**141. ගොධා (ii) ජාතකය:-** "ලාමක ජනයා සේවනය කරන්නා ඒකාන්තයෙන් සැපය නොලබයි. කුමක් මෙන්ද යත්? ගොධා කුලයේ කටුස්සා මෙන් තමා විනාශයට පමුණුවා යයි" කීයේය.

**142. සිගාල ජාතකය:-** "යම් හෙයකින් මළහු මෙන් හෝනෙහිද, තාගේ මේ කාරය දැනගත නොහැකිය. දඬු කෙළවර ගෙණ අදිනු ලබන්නාවූ යම් බඳුවූ තාගේ අතින් මුගුරු දණ්ඩ නොමිදේද, එහෙයිනැයි" කීයේය.

**143. විරොචන ජාතකය:-** "තාගේ හිස් මුල්ද නික්මුණහ. මස්තකයද පළන ලදී. තාගේ සියලු පරාළ පතු හෙවත් ඉල ඇට බිඳුනහ. අද වනාහි තෝ බබළන්නෙහියයි" කීයේය.

**144. නංගුට්ඨ ජාතකය:-** "අසත්පුරුෂවූ වහ්නි දෙවතාවෙනි, යම් බඳුවූ තා වාලධියෙන් පුදමු. මෙපමණකුදු බොහෝයයි සිතව මාංශානුභවයට සුදුසුවූ තට අද මස් නැත. පින්වත් තෙමේ නගුටද පිළිගණීවා"යි කීයේය.

**145. රාධ ජාතකය:-** "රාධය, තෝ අර්ධ රාත්‍රිය නොපැමිණි කල්හි (මෙතෙක් දෙන අඩුයයි) නොදන්නෙහිය අව්‍යක්තවූ විලාපයක් කියන්නෙහිය. බ්‍රාහ්මණයා කෙරෙහි බැමිණි නොඇළුණි වේයයි කීයේය.

**146. කාක ජාතකය:-** අපගේ වනාහි හකුදෙක ශාන්තයහ. මුඛයද වියලෙහි වීර්ය කරම්හයි දිය අදුම්හ. වීර්ය කොට කෙළවරකට නොයා හැක්කම්හ. සමුද්‍රය ඉඩ පමණින් පිරේම යැයි" කීයේය.

**147. පුප්ඵ රත්ත ජාතකය:-** "කවුඩු තෙමේ මට අනියි යන යමක් ඇද්ද මේ දුක් නොවෙයි. සාමාව වනුක් මලින් රැඳූ වස්ත්‍රයෙන් යුක්තවී ඉල්මාසයෙහි වාරොත්සවය නොවිඳින්නේය යන යමක් ඇද්ද මේ දුක් වේයයි" කීයේය.

**148. සිඟාල ජාතකය:-** "මම නැවත, නැවතද හස්ති ශරීරයට ඇතුළු නොවන්නෙමි. ඒ එසේමැයි භයින් තැති ගත්තේවෙමියි" කීයේය.

**149. එක පණ්ණ ජාතකය:-** "මේ ගස දෙ පැත්තෙහි එක එක පත්‍ර ඇත්තේය. භූමියෙන් සතරඟුලක් පමණ වැසියේත් නොවෙයි. හලාහල විෂයකට බඳු ඵලයෙන් යුක්තවූ මේ ගස මහත්ව වැඩියේ නම් කුමක් වන්නේදැයි" කීයේය.

**150. සඤ්ජීව ජාතකය:-** "යමෙක් අසත්පුරුෂයාට උපකාර කෙරේද, අසත්පුරුෂයා සෙවනය හෝ කෙරේද, ඔහුම ආහාරය කරන්නේය. කුමක් මෙන්ද, යත්, ව්‍යාඝ්‍ර සඤ්ජීවක දෙදෙනා මෙනියි" කීයේය.

**(එකක නිපාතය නිමි)**

---

# දුක නිපාතය

## 16 දළ්හ වර්ගය

**151. රාජෝවාද ජාතකය:-** 1. මල්ලික නම් රජ දැඩි තැනැත්තාට දැඩිපහරවල් දෙයි. මෘදුවූ පුද්ගලයා මෘදු බැවින් දිනයි. සත්පුරුෂයාද සත්පුරුෂ බැවින් දිනයි. අසත් පුරුෂයාද අසත් පුරුෂ බැවින් දිනයි. මේ රජතෙම මෙබඳු ගුණ ඇත්තේවෙයි. එබැවින් රථාචාර්යයා මාර්ගයෙන් පහවෙවයි" කීයේය. (මල්ලිකා නම් රජහුගේ රථාචාර්යයා බරණැස් රජහුගේ රථාචාර්යයාට මෙසේ කීය.)

2. "ක්‍රොධ ඇත්තහු ක්‍රොධ නොකිරීමෙන් දිනන්නේය. අයහපත් පුද්ගලයා යහපත් බැවින් දිනන්නේය. තද මසුරා දීමෙන් දිනන්නේය. බොරු කියන්නහු සත්‍ය වචනයෙන් දිනන්නේය. මේ රජතෙම මෙබඳු ගණ ඇත්තේවෙයි. එබැවින් සාරථිය මාර්ගයෙන් පහ වෙවයි." කීයේය.

**152. සිඟාල ජාතකය:-** 1. "මනාකොට පරීක්ෂා නොකොට කරණලද කර්මාන්ත ඇති සිතූ කටයුත්තෙහි නොවිචාරා වහා

පටන් ගන්නා තැනැත්තහු මුඛයෙහි තබන ලද උෂ්ණ භෝජනයක් මෙන් ඒ ස්වකීය කර්මාන්තයෝ තවත්.

2. "සිංහ තෙමේද සිංහ නාදයෙන් රිදී පර්වතය ඒකනාද කෙළේය. සිවල්තෙම පළිගු මිශ්‍රවූ රිදී පර්වතයෙහි වසන්නේ සිංහයාගේ නාදය අසා බියපත් වූයේ තැතිගැන්මට පැමිණියේය. ඔහුගේ හෘදයද පැළුනේයයි කීයේය."

**153. ශූකර ජාතකයඃ-** 1. "යහළුව, මම සිව්පායෙමි. යහළුව නුඹද සිව්පායෙහි, සිංහය, මෙසේ එව. නවතුව, බියපත්වූයේ කුමකට පලා යෙහිද?"

2. "අපවිත්‍රවූ කුණුවූ රෝම ඇත්තේවෙහිය. දුර්ගන්ධය හමන්නෙහිය. ශූකරය ඉඳින් මා හා යුදකරණු කැමැත්තෙහි නම් යහළුව තොපට ජයදෙමියි" කීයේය.

**154. උරග ජාතකයඃ-** 1. "පිහිටක් කැමැත්තාවූ සර්පරාජතෙම ගල්සේ වර්ණයෙන් මේ වල්කලාවට ප්‍රවිෂ්ට වූයේය. ශ්‍රේෂ්ඨවූ වර්ණයද පුදන්නෙමි කනු කැමැත්තෙමුදු කන්ට නොපොහොසත් වෙමි.

2. "උත්තමවූ වර්ණය පුදන්නාවූ කනු කැමතිවූද, යමෙක් කන්ට නොපොහොසත් වෙහිද, ඒ තෝ බ්‍රහ්මයා විසින් රක්ෂාකරණ ලද්දේ බොහෝ කලක්ම ජීවත්වෙව, තොපට දිව්‍යවූ ආහාරයෝ පහළ වෙත්වායි" කීයේය.

**155. ගග්ග ජාතකයඃ-** 1. "ගර්ගය, වර්ෂ සියයක් ජීවත්වෙව, අනික් විසි හවුරුද්දක්ද ජීවත් වෙව, මා පිසාචයෝ නොකත්වා තෝ අවුරුදු සියයක් ජීවත් වෙව"

2. "තෝද අවුරුදු සියයක් ජීවත්වෙව, අනික් අවුරුදු විස්සද ජීවත්වෙව, පිසාචයෝ හලාහළ විෂය කත්වා, තෝ අවුරුදු සියයක් ජීවත් වෙවයි," කීයේය.

**156. අලීන චිත්ත ජාතකයඃ-** 1. අලීන චිත්ත කුමාරයා ආශ්‍රය කොට ඉතා සතුටුවූ මහත්වූ සේනාතොමෝ ස්වකීයවූ රාජ්‍යයෙන් අසන්තුෂ්ටවූ කොසොල් රජ දිවි තොර නොකොට අල්වා ගත්තීද,

**2.** මෙසේ ආශ්‍රය සම්පන්නවූ චතුර්විධ යෝගයාගේ ක්ෂෙමයට හෙවත් නිවනට පැමිණෙනු පිණිස කුශල ධර්මය වඩන්නාවූ පටන්ගන්නාලද වීර්යය ඇති මහණතෙම පිළිවෙළින් සියලු සංයෝජනයන් ක්ෂය කිරීමට පැමිණෙන්නේයයි" වදාළේය.

**157. ගුණ ජාතකයː-** 1. "මෘගරාජය, උන්නතවූ දළ ඇත්තෙහිය, ඊශ්වරතෙම යම් දිග්භාගයකින් සේවකයා පහකරණු කැමතිද, ඒ දිශාභාගයෙන් ඒකාන්තයෙන් පහ කරයි. බලවතුන්ගේ ස්වභාව ධර්මය මෙසේ දැනගණුව. (නොහොත්) සිංහධෙනුව උස්වූ නාද ඇත්තී යම් කාරණයකින් ඒකාන්තයෙන් හිංසා කෙරේද, ඒ පරිදි තීද දණුව, සරණව සිටි තොප කෙරෙන් භය උපන්නේය.

2. "ඉදින් දුර්වලවුද මිත්‍රතෙම මිත්‍ර ධර්මයන්හී පිහිටියේ නම් හෙතෙම නෑයාදවේ. බන්ධුදවේ. හෙතෙම මිත්‍රයාදවේ. හෙතෙම මාගේ යහළුවාද වෙයි. සිංහය, ඉක්මවා නොසිතව, (හෙවත්) නින්දා නොකරව, හිවල්තෙම මාගේ ප්‍රාණය දුන් මිත්‍රයායයි" කීයේය.

**158. සුහනු ජාතකයː-** 1. "සුහණු නම් අශ්වතෙම සෝන නම් අශ්වයා සමග යම් ප්‍රේමයක් කෙරේද, මේ ප්‍රේමය තමාගේ විෂම ස්වභාවයෙන් නොවේ. යම් සුහණු නම් අශ්වයෙක් සෝනනම් අශ්වයා හාසමාන ගෝචර ඇත්තේද, සුහණු නම් අශ්වයාද එබඳු මැයි.

2. "අශ්වයන් මත්තට දුවන ස්වභාවයෙන් හික්මීම නැති නිතර පටිය හෝ ලණුව කන ස්වභාව ඇති නරක අශ්වයා හා පවිටු බව සමවන්නේය. අසත් පුරුෂයා අසත් පුරුෂයා හා සම වන්නේයයි" කීයේය.

**159. මොර ජාතකයː-** 1. "ඇස් ඇත්තාවූ ඒක රාජවූ (හෙවත්) මුළු සක්වලට ශ්‍රෙෂ්ඨවූ ස්වර්ණ වර්ණවූ පෘථිවිය බබුළුවන්නාවූ මේ සූර්යතෙම නැගෙණහිර දිගින් උදාවෙයි. එහෙයින් රත්රන් බඳු පැහැ ඇතිපොළොව බබුළුවන්නාවූ ඒ සූර්යයාට නමස්කාර

කරමි. ඒ සූර්යයා විසින් අද රක්ෂා කරණලද්දෙමු. දවල් දවස වාසය කරමු.

2. "සියලු ධර්මයන් නුවණින් දැන පරතෙරට ගියාවූ යම් ශුද්ධ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද, ඔව්හු මාගේ නමස්කාරය පිළිගණිත්වා

3. "ඒ බුද්ධාදීහුද මා රක්ෂා කෙරෙත්වා. අතීතයෙහිවූ බුදුවරුන්ට නමස්කාරවේවා. ඒ බුදුවරුන්ගේ බෝධියටද නමස්කාර වේවා අර්හත් ඵල විමුක්තීන් මිදුනවුන්ටද නමස්කාර වේවා, තදංග විමුක්ති ආදී පඤ්චවිධ විමුක්තියටද නමස්කාර වේවා. ඒ මයුරයා මේ පිරිත තොට ගොදුරු සෙවීම පිණිස හැසිරේයයි" වදාළේය.

**160. විනීල ජාතකයඃ-** 1. "කාරණා කාරණා දන්නාවූ හංසයෝ යම් සේ විනීලකවූ මා උසුලත්ද එපරිද්දෙන්ම වේදේහ නම්වූ මියුළු නුවර වටකොට වසන්නාවූ රජුන්ගේ අශ්වයෝ උසුලන්නාහුය"යි සිතමි.

2. "විනීලය පර්වත දුර්ගය සේවනය කරන්නෙහිය. පුත්‍රයා තට භූමි නොවූ පර්වත විෂමස්ථානය සේවනය කෙරෙහිය. ග්‍රාමාන්තයෙහිවූ අපවිත්‍ර තැන් තාගේ මවට වාසස්ථානය මේ වාසස්ථානය සේවනය කරවයි" කීයේය.

---

## 17 සන්ථව වර්ගය.

**161. ඉන්දසමාන ගොත්ත ජාතකයඃ-** 1. "අර්ථය දන්නාවූ ආචාර ආර්යවූ පුද්ගලතෙමේ අනාර්යවූ හෙවත් නිර්ලජ්ජවූ නින්දිතවූ පුද්ගලයා හා වශයෙන් එක්වීමක් වේවයි යහළු කමක් වේවයි නොකරන්නේය. කුමක් හෙයින්ද යත්? බොහෝ කලක් එක්ව විසූයේද, එය නොසලකා පාප ක්‍රියාවක් කරන්නේය. කුමක් මෙන්ද යත්? ඉන්ද්‍රසමාන ගොත්‍ර නම් තපස්වීහු (කළ්‍යාණ මිත්‍ර කම නොසලකා මැරූ) හස්තියා මෙනි.

2. "සීලයෙන්ද ප්‍රඥාවෙන්ද ශ්‍රැතයෙන් දැයි මා හා සමානයයි යමක්හු වනාහි දන්නේද ඔහු හා සමගම මිත්‍රත්වය

කරන්නේය. කුමක් හෙයින්ද යත්? සත්පුරුෂයා හා සංගමය සුව එලවන්නේයයි" කීයේය.

**162. සන්ථව ජාතකයඃ-** 1. "නින්දිත පුරුෂයා හා යම් එක්වීමක් වේද, ඒ එක්වීමට වඩා අධිකවූ ලාමක කමෙක් නැත්තේය. කුමක් හෙයින්ද යත්? ගිතෙලින්ද කිරිබතින්ද සන්තර්පණය කරණලද වහ්නි දෙවතාවා දුකසේ කරණලද පර්ණකුටිය (පන්සල) දැවීද, එහෙයිනි.

2. "සත්පුරුෂයා හා යම් එක් වීමෙක්වේද, ඒ මිත්‍ර සමාගමයට වඩා අධිකවූ ශ්‍රෙෂ්ඨ කමෙක් නැත්තේය. කුමක් හෙයින්ද යත්? සාමාවූ මුවදෙන සිංහයෙකුගේද ව්‍යාඝ්‍රයෙකුගේද දිවියෙකුගේද මුහුණ මිත්‍ර සම්බන්ධයෙන් ලොවීයයි" කීයේය.

**163. සුසීම ජාතකයඃ-** 1. සුදුවූ දළ ඇති රන් දැලින් ගැවසීගත් සියයකටද වැඩිවූ තොපගේ මේ මුවෝ කෘෂ්ණ මෘගයහ. තොපගේ මේ හස්තීන් සුසීමය. පිය මුතුන් සම්බන්ධව සිහි කරමින් දෙමියි කීයෙහිද?

2. "සුදුවූ දළ ඇති රන් දැලින් වැසුනාවූ මාගේ මේ මෘගයෝ කෘෂ්ණ මෘගයහ. මාණවකය, ඒ මේ තොපගේ මේ ඇතුන් පියමුතුන් සම්බන්ධව සිහි කරන්නෙම් දෙමියි කියමියි" කීයේය.

**164. ගිජ්ඣ ජාතකයඃ-** 1. "ගිජුලිහිණිතෙමේ යොදුන් සියයක් ඉක්මවා සිටියාවූද කුණපයන් බලයි යන යමක්වේද, කුමක් හෙයින් දැලටත් පාසයටත් හෙවත් පුඩුවටත් පැමිණ ද දැන නොගත්තෙහිද,

2. "ජීවිත විනාශය යම් කලෙක්හි වේද එකල්හි සත්ව තෙමේ දැලටද පාපයටද පැමිණෙත් (ජීවිත විනාශ කරණය) නොදනීය"යි කීයේය.

**165. නකුළ ජාතකයඃ-** 1. "ජලාබුජය, අමිත්‍රවූ අණ්ඩජයා හා සමග මිත්‍ර භාවය කොට දළ විවෘත කොට ශයනය කෙරෙහිය. තොපට භය කොයින් ආයේද? (මුගටියන් දලබුවෙන් උපදනා හෙයින් ජලාබුජයයි ආමන්ත්‍රණය කොට සර්පයන් බිජුවටින් උපදනා හෙයින් අණ්ඩජ යයි කීහ.)

2. "අමිත්‍රයා කෙරෙහිදු සැක කරන්නේමය. මිත්‍රයා කෙරෙහිද විශ්වාසය නොකරන්නේය. කුමක් හෙයින්ද යත්? (මොහු කෙරෙන් භය නූපදනේ යයි නිශ්චය කළ මිත්‍රවූ) අභය ස්ථානයෙන් උපන්නාවූ භය මූලයන්ද කපයි. හෙවත් සර්වප්‍රකාරයෙන් විනාශ කරන්නේයයි" කීයේය.

**166. උපසාළ්හක ජාතකයː-** 1. "උපසාළ්හක නම් ඇත්තවුන්ගේ සහස්‍රයෝ තුදුස් දෙනෙක් හෙවත් දහහතර දහසක් මේ ප්‍රදෙශයෙහි දවන ලදහ. ලෝකයෙහි නොමළ තැනක් නැත්තේය.

2. "යම් පුද්ගලයෙකු කෙරෙහි චතුස්සත්‍ය වස්තුකවූ පූර්ව භාග සත්‍ය නාමයද, ලොකොත්තර ධර්මයද, අවිහිංසාවද, ශීල සංයමයද, ඉන්ද්‍රිය දමනයද යන මේ ගුණ විශෙෂයෝ ඇද්ද, බුද්ධාදී ආර්යයෝ මෙය සේවනය කෙරෙත්ද, ලෝකයෙහි මේ ගුණ සමූහය අමෘත භාවය සාධක හෙයින් අමෘත ස්ථාන නම් වේයයි" වදාළේය.

**167. සමිද්ධි ජාතකයː-** 1. "මහණ, යෞවන අවස්ථාවේ කාමානුභව නොකොට ශික්ෂායෙහි හැසිරෙහි. කාමානුභාවය කොට භික්ෂායෙහි හැසිරෙන්නෙහි නොවේද? මහණ, තරුණ කාලයෙහි පඤ්චකාමය අනුභව කොට මහලු කල්හි භික්ෂායෙහි හැසිරෙව. පඤ්චකාමානුභාවයට සුදුසු යෞවන කාලය තෙමේ ඔබ ඉක්මවා නොයේවා."

2. "මම කාලය නොදනිමි. කාලය තෙමේ සැඟවුනේ නොදක්නා ලැබේ. එහෙයින් කාමානුභවය නොකොට හැසිරෙමි. මා තපස් කාලය ඉක්ම නොයේවායි" කීයේය.

168. සකුණග්ඝි ජාතකයː- 1. "ශක්තියෙන් ගමන් කරන්නාවූ උකුසුතෙමේ නොහොත් දිය වවුල් ගොචරයෙහි සිටියාවූ කිරිල්ල කරා වහා පැමිණියේම ඒ ශීඝ්‍ර ගමනින් මරණයට පැමිණියේය.

2. "නීතියෙන් සමෘද්ධවූ පිය පරපුරෙන් ආ ගොචරයෙහි ඇලුනේ තමහට අර්ථයක් බලන්නේ පහවූ සතුරා ඇති ඒ මම සතුටුවෙමියි" කීයේය.

**169. අරක ජාතකය**:- 1. "යමෙක් ඒකාන්තයෙන් අප්‍රමාණවූ මෛත්‍රීවූ සිතින් උඩින්ද යටින්ද සරසින් දැයි සර්ව ප්‍රකාරයෙන් සියලු ලෝකයාට අනුකම්පා කරන්නේ වේද,

**2.** අප්‍රමාණ කොට එකග සිත් ඇතිව හිතවූ මෛත්‍රී චිත්තය මනාකොට වඩන ලදද, ප්‍රමාණ කරණ ලද්දාවූ යම් කාමාවචරකුශල කර්මයක් ඇද්ද, ඒ කර්මය ඒ අර්පණා නම් අවස්ථාවට පැමිණි මෛත්‍රී චිත්තයෙහි නොම සිටින්නේ යයි" කීයේය.

**170. කකණ්ටක ජාතකය**:- 1. "පෙර තොරණ අග මේ කටුසුතෙමේ උඩඟු නොවෙයි. මහෞෂධය දනුව, කකණ්ටක තෙමේ කුමක් හෙයින් උඩඟුවූ යේද,

**2.** "කටුසු තෙමේ නොලද විරූ අඩමස්සක් ලැබ මියුළු නුවර අධිපති ඇති වේදෙහ නම් රජහු ඉක්මවා සිතායයි" කීයේය.

---

## 18 කළ්‍යාණ ධර්ම වර්ගය.

**171. කළ්‍යාණ ධම්ම ජාතකය**:- 1. "ජනෙන්ද්‍රය, ලෝකයෙහි යම් කලෙක්හි කල්‍යාණ ධර්ම ඇත්තේ යයි පැනවීමක් වීද, ඒ පැනවීමෙන් ප්‍රඥා සහිතවූ මනුෂ්‍යතෙමේ නොපිරිහෙන්නේය. අධ්‍යාත්මිකවූ ලජ්ජාවෙන්ද පුරුෂයෝ ප්‍රව්‍රජ්ජ්‍යා ධුරය ගනිත්,

**2.** "ජනප්‍රධානය, ලෝකයෙහි කළ්‍යාණ ධර්ම යයි යමක් ඇද්ද, ඒ මේ පැනවීම මෙහිලා මා විසින් අද පැමිණෙන ලදී. ඒ පැනවීමය මම බලන්නෙම් මෙහිලා පැවිදිවන්නෙමි. මෙහිලා කාම අනුභවයෙහි මාගේ කැමැත්ත නැත්තේයයි" කීයේය.

**172. දද්දර ජාතකය**:- 1. "මෘගරාජය, රජත පර්වතය කවරෙක් මහත්වූ ශබ්දයෙන් ගුගුරුවාද සිංහයෝ කුමකට ප්‍රතිනාද නොකෙරෙද්ද, මෙතෙම කිනම් එකෙක්ද?

**2.** "පුත්‍රය, මෘග ජාතීන්ගෙන් ඉතා පහත්වූ හිවලා හඬයි. මොහුගේ ජාතිය පිළිකුල් කරන්නාවූ සිංහයෝ නිශ්ශබ්දව හිඳිත් යයි" කීයේය.

**173. මක්කටක ජාතකය:-** 1. "පියාණෙනි, මේ මිනිසෙක් තල්ගස මුල ආශ්‍රය කොට සිටියේය. මේ ගෘහයද ඇත. එබැවින් මොහුට මේ ගෙය දෙමු.'

2. "පුතනුවෙනි, ඔහු නොකැඳවව, අපගේ ගෘහය දූෂණය කරන්නේය. සුශීලවූ බ්‍රාහ්මණයෙකුගේ මෙබඳුවූ මුහුණක් නොවේයයි" කීයේය.

**174. දුතිය මක්කටක ජාතකය:-** 1. "ග්‍රීෂ්මයෙන් පීඩිත වූ පිපාසා ඇත්තාවූ තට බොහෝවූ ජලය දුනිමු. ඒ තෝ ජලය බී දැන් වඳුරු මුහුණු කොටගෙණ කිකිං යන ශබ්ද කෙරෙහිය. පවිටු ජනයා හා (හෙවත්) කෙළෙහිගුණ නොදන්නා ජනයා හා එක් නොවීම උතුම් වේ.

2. "කවර නම් වඳුරෙක් සිල්වත් යයි තා විසින් අසන ලද්දේද? දක්නා ලද්දේ හෝ වේද? දැන් වනාහී තා හිස වර්චස් සළා කිලුටු කෙරෙමි. අප වඳුරන්ගේ මෝතොමෝ ධර්මතා යයි" කීයේය.

**175. ආදිච්චුපට්ඨාන ජාතකය:-** 1. "සියළු සත්වයන් කෙරෙහි ශීලයෙන් යුක්තවූවෝ විද්‍යමාන වෙත්ලු. හීනවූ වඳුරා බලව, හිරු වඳිමින් සිටිනේය යනුයි.")

2. "මොහුගේ ශීලයක් දැන නොගණිව්. නොදැන ප්‍රශංසා කරන්නාහුය. ගිනි පුදන කෙනෙස්සද වර්චස් ලා කිළුටු කරණලදී. කෙණ්ඩි දෙකක්ද මොහු විසින් බිඳින ලදහයි' කීයේය.

**176. 1. කලායමුට්ඨි ජාතකය:-** 1. "ජනෙශ්වරය, ගස්වල අතු ගොදුරුකොට ඇති හෙවත්) සඤ්චාර ස්ථාන කොට ඇති මේ වඳුරා ඒකාන්තයෙන් අඥානය. මොහුගේ ප්‍රඥාව නැත. හුදෙක් (හෙවත්) කඩල මිටක් විසුරුවා බිම වැටුණු කඩල ඇටය සොයයි.

2. "එපරිද්දෙන්ම, රජ්ජුරුවෙනි, අපිද ඉතා ලොභොබිවූ යම් අනික් කෙනෙක් දැයි, මේ සියල්ලම කඩල ඇටයෙන් වඳුරා මෙන් මදදෙය නිසා බොහෝවූ දෙයින් පිරිහෙමුයි" කීයේය.

**177. තින්දුක ජාතකය**:- 1. "දුනු හියවුරු ගත් අත් ඇත්තවුන් විසින්ද, උතුම් කඩු දරන්නවුන් විසින්ද, හාත්පසින් පිරිවරණ ලද්දෙමු. කෙසේනම් මෙයින් මිදීමෙක් වන්නේද?

2. "බොහෝ කටයුතු ඇත්තවුන්ට කිසි අර්ථයෙක් උපන්නේවී නම් යෙහෙක. තිඹිරි ගසේ නොවැටුනු ගෙඩි ඇති තැන් ඇත. තිඹිරි කෑමටම ලැබේවායි" කීයේය.

**178. කච්ඡප ජාතකය**:- 1. "මාගේ උපන් තැනයයි කියාද, මා වැඩුනු තැනයයි කියාද, මෙසේ මඩෙහි වැදහොත්තෙමි. මා ඒ මඩ දුර්වලයෙකු යම්සේද, එසේම විනාශයට පැමිණ විය. කුම්භකාරය, එහෙයින් තට කියමි. මාගේ වචනය අසව ගමෙහි හෝ (නොහොත්) වනයෙහි හෝ යම් තැනක සුවයට පැමිණේද?

2. "එසේවූ ස්ථානය කාරණා කාරණා දන්නාවූ පුරුෂයාට උපන් ස්ථානය නමුදු වැඩුනු ස්ථානය නමුදුවේ. යම් තැනෙක්හි ජීවත් වන්නේද, එතනටම යන්නේය. වාසස්ථානයෙන් නැසුනේ නොවන්නේයයි' කීයේය.

**179. සතධම්ම ජාතකය**:- 1. "එයද ස්වල්පය ඒ මද බතද ඉඳුල්ය. ඒ මදවූ ඉඳුල් බතද අපට දුකසේ දුන්නේය. ඒ මම පිරිසිදුවූ බ්‍රාහ්මණ ජාති ඇත්තෙමි. යම් බතක් මා විසින් අනුභව කරණ ලදද එයද ලේ හා මිශ්‍රකොට වමාරණ ලදී.

2. "මෙසේ (ආජීව පාරිශුද්ධිශීල නම්වූ) ධර්මය දුරු කොට අධර්මයෙන් යම් මහණෙක් ජීවත් වේද, හෙතෙම ශත ධර්ම නම් බ්‍රාහ්මණ පුත්‍රයාමෙන් ලැබූ ලාභයෙන්ද, සතුටු නොවේයයි" වදාළේය.

**180. දුද්දක ජාතකය**:- 1. (අඥානයන් විසින් දෙන්නට නොපිළිවන් හෙයින්) දුද්දද නම්වූ දානය දෙන්නවුන්ගේ දුෂ්කරවූ කර්මය කරන්නවුන්ගේ අසත්පුරුෂයෝ අනුක්‍රියා කරන්නෝ නොවෙති. ඒ එසේමැයි සත් පුරුෂයන්ගේ ධර්මය නොදතහැකිවේ (නොහොත්) පැමිණෙන්ට නොපිළිවනි.

2. "එහෙයින් සත්පුරුෂයන්ගේද, අසත් පුරුෂයන්ගේද, මෙලොවින් පරලොව ගතිය වෙන වෙන වන්නේයි. එසේමැයි

දානශීලාදියෙහි නොහැසිරෙන අපණ්ඩිත ජනයෝ නරකයට යෙති. දානශීලාදී ක්‍රියාවන්හි යුක්ත සත්පුරුෂ ජනයෝ ස්වර්ග පරායණකොට ඇත්තෝ වෙත්. (හෙවත්) මහත්වූ ස්වර්ග සුවය අනුභව කෙරෙතියි" කීයේය.

---

## 19 අසදෘශ වර්ගය.

181. **අසදිස ජාතකය**:- 1. "මහත්වූ බල ඇති ඊසැර දුර හෙළන්නාවූ ඉලක්කය නොවරදවා විදින සුළුවූ මහත් වූ සම්පට ආදීන් වීදාරණය කරන්නාවූ ධනුර්ධරවූ අසදෘශ නම් රාජ පුත්‍රතෙම

2. "සියලු සතුරන් යුද්ධකොට පළවා කිසිකුත් නොපෙළීය (හෙවත්) ප්‍රාණඝාත නොකෙළේය. කුමක් කෙළේද යත්? බාලසොහොයුරා සුවපත් කොට ශීල සංයමයට පැමිණියේයයි" කීයේය.

182. **සංගාමවචර ජාතකය**:- 1. "යුද්ධ භූමියෙහි හැසිරෙන්නාවූ ශූරවූ බල ඇත්තෙකැයි ප්‍රසිද්ධවූයෙහිය. හස්තිය වාසල් දොරට පැමිණ කුමක් හෙයින් පසුබස්නෙහිද?

2. නුවර යතුරු අගුළ වහා මර්දනය කරව. උළුවහු කණුද උදුරව හස්තිරාජය වාසල දොරවල් මැඩ වහා නුවරට ඇතුල් වෙවයි" කීයේය.

183. **වාලෝදක ජාතකය**:- 1. "අල්ප රසවූ හීණ රස ඇත්තාවූ නියඟ වල්ලෙන් පෙරූ හෙවත් නියඟ වලින් කළ පෙරහනින් පෙරූ ජලය පානයකොට කොටළුවන්ට මදය හට ගණියි. ප්‍රණීතවූද මේ රසය පානයකොට අශ්වයන්ට මදය නොවඩන්නේය. කාරණා කිම්දැයි, විචාළෝ,

2. "ජනශ්‍රෙෂ්ඨය, ලාමක ජාති ඇත්තේ එයින් පුෂ්ට වූයේ රශයෙන් මඳවූද ජලය, පාණය කොට මත්වේ. බර උසුලන ස්වභාව ඇත්තාවූ උතුම් කුලයෙහි උපන් අශ්ව තෙමේ අග්‍රවූ මිදි රසය පානයකොට මත් නොවේයයි" කීයේය.

**184. ගිරිදත්ත ජාතකයඃ-** 1. "සාමනම් රජහුගේ පණ්ඩව නම්වූ අශ්වතෙම ගිරිදත්ත නම් කොරවූ අස් ගොව්වා විසින් දූෂණය කරණ ලද්දේ පුරාතනවූ ප්‍රකෘතිය හැර ඒ අස්ගොව්වාගේ ප්‍රකෘතියම අනුගමනය කෙරේ.

2. "ඉදින් ඔහුට අනුජාතවූ සුන්දරවූ ආකාරයෙන් කපනලද හිසරැවුල් ඇති පුරුෂයෙක් ඒ අශ්වයා කටකලියාවෙහි පටියෙන් අල්වාගෙණ අශ්ව මණ්ඩලයෙහි පරිවර්තනය කෙළේ වී නම් වහාම ඒ කොරබැව්හැර ඒ අස් ගොව්වාගේ ප්‍රකෘතියම අනුව ගමන් කෙරේයයි" කීයේය.

**185. අනභිරති ජාතකයඃ-** 1. "යම්සේ කැළඹුනාවූ අප්‍රසන්නවූ ජලයෙහි රන්වන් බෙල්ලන්ද වටබෙල්ලන්ද මත්ස්‍ය වර්ගයාද නොදක්නේද, එපරිද්දෙන් සිත රාගාදීන් කැළඹුනු කල්හි ආත්මාර්ථයද පරාර්ථයද නොදකී.

2. "යම්සේ නොකැළඹුනාවූ ප්‍රසන්නවූ ජලයෙහි රන්වන් බෙල්ලන්ද මත්ස්‍ය සමූහයාද, හෙතෙම දක්නේද, එපරිද්දෙන් සිත ලෝභාදීන් නොඇලුණු කල්හී ආත්මාර්ථයද පරාර්ථයද ඒ පුරුෂතෙම දකියි" කීයේය.

**186. දධිවාහණ ජාතකයඃ-** 1. "මේ අඹගස පෙර වර්ණයෙන් සුගන්ධයෙන්ද, මිහිරි රසයෙන්ද, යුක්තවිය. ඒ පෙර කරණ පූජාවම ලබන්නාවූ අඹගස කවර හෙතුවකින් තිත්තවූ ගෙඩි ඇත්තේවීද?

2. "දධිවාහණ නම් දෙවයෙනි, තොපගේ අඹගස කොසඹගස් පිරිවර කොට ඇත්තේ මී, අඹ මුල කොසොඹ මුල් එක්ව සිටියේය. අඹ අතු කොසොඹ අතුවලින් සෙවුනාහ. ඒ අමිහිරිවූ කොසොඹ වෘක්ෂයන්ගේ එක්ව වාසයෙන් මේ අඹ ගස අමිහිරි පල ඇත්තේ වී යයි" කීවේය.

**187. චතුමට්ට ජාතකයඃ-** 1. "උස්වූ ගසෙහි නැගී රහසිගතව මන්ත්‍රණය කරහුය බැස පහත් තන්හී සිට මන්ත්‍රණය කරව්. මෘග රාජයාද අසයි.

2. "යම්හෙයකින් සුපර්ණනම්වූ හංසාය සුපර්ණයකු හා දෙවතාත්මවූ හංසයා දෙවතාත්මවූ හංසයකු හා මන්ත්‍රණය

කෙරේද, ඒ මන්ත්‍රණයෙහි කරුණු සතරකින් (හෙවත්) සතර ගුණයෙන් හීණවූ තට කවර ප්‍රයෝජනයෙක්ද, ජම්බුකය, බිලයට ඇතුළු වෙවයි," කීයේය.

188. **සීහ කොත්ථු ජාතකය:-** 1. "සිංහයන්ට බඳුවූ ඇඟිලි ඇති. සිංහයන්ට බඳුවූ නිය ඇති. සිංහ පාදයෙහි පිහිටි ඒ සිංහතෙම සිංහ සමූහයෙහි අන්‍යයන් හා අසමානව අන් පරිද්දකින් නාද කෙරේ හෙවත් සිවල් හඬින් හඬයි.

2. "සිංහරාජයාගේ පුත්‍රය, තෝ නාදනොකරව, නිශ්ශබ්දව වනයෙහි සිංහයන් අතර වාසය කරව. ස්වරයෙන් වනාහී තා දැන ගත්තාහුය. තට පියා සතු ස්වරය නැත්තේයයි" කීයේය.

189. **සීහ චම්ම ජාතකය:-** 1. "මෙය සිංහයෙකුගේ නාදය නොවෙයි. ව්‍යාඝ්‍රයෙකුගේ නාදය නොවෙයි දිවියෙකුගේ නාදය නොවෙයි සිංහ සමකින් පොරොවණලද ලාමකවූ කොටළුවෙක් නාද කෙරෙයි.

2. "කොටළුවා සිංහ සමින් පොරවන ලද්දේ, නිල්වූ යව බොහෝ කලක්ම කන්නේය, කොටළු හඬින් හඬන්නේම දූෂ්‍ය වූයේ යයි" කීයේය.

190. **ශීලානිශංස ජාතකය:-** 1. "ශ්‍රද්ධාවගේද, ශීලයාගේද, පරිත්‍යාගයාගේ ද මේ ආනිශංස ඵලය බලව, දිව්‍ය නාගතෙම නැවක ආකාරයෙන් ශ්‍රද්ධාව ඇති උපාසකයා උසුලයි.

2. "සත්පුරුෂයන් හා සමග එක්ව වාසය කරන්නේය. සත්පුරුෂයන් හා මිත්‍ර සන්ථවය කරන්නේය. ප්‍රයෝජන කිමදයත්? සත්පුරුෂයන්ගේ වනාහි එක්ව වාසයෙන් කරනැවැමිවූ අසත්පුරුෂයා පවා සුවසේ යන්නේ යයි" කීයේය.

## 20 රුහක වර්ගය

191. **රුහක ජාතකය:-** "රුහකය, සිඳී ගියාවූද දුනුදිය තොමෝ නැවත ගළපනු ලබාද එපරිද්දෙන් තෝද පැරණි අඹුව හා සමගිවෙව, ක්‍රොධයාගේ වසඟයට නොයව,

2. "දුනුදිය සාදන්නවුන් විද්‍යමාන කල්හි අනික් දුනුදියක් කරන්නෙමුද, එමෙන් පැරණි අඹුවගෙන් කම් නැත්තේමයයි" කීයේය.

**192. සිරිකාලකන්නි ජාතකයඃ-** 1. "ස්ත්‍රීතොමෝ රූ ඇත්තී වන්නීය. ඕතොමෝද ආචාරශීලී වන්නීය. පුරුෂයෙක් ඇය නොකැමැති වන්නේය. මහෞෂධයෙනි, එය අදහන්නෙහිදැයි" රජ විචාළේය.

2. "මහරජ අදහමි. පුරුෂතෙම පිංනැත්තේ වන්නේ නම් ශ්‍රී තොමෝද කාලකන්නීද යන දෙදෙන කිසිකලෙකත් එක්ව නොවෙසෙත්යයි" පණ්ඩිතතෙම කීයේය.

**193. චුල්ලපදුම ජාතකයඃ-** "ඕතොමෝ මෝමය. අනික් තැනැත්තියක් නොවෙයි. මමද හෙතෙමේමය. අනිකෙක් නොවෙමි. ඒ අත් සිඳිනලද කොටාද මේ තෙමේමය. අනිකෙක් නොවේ. මාගේ කුමාර කලම ලද ස්වාමියයි යමක් තොමෝ කීද, (ඕතොමෝ මැය) ස්ත්‍රීහු නම් වධ කරන්නට සුදුස්සහ. ස්ත්‍රීන් කෙරෙහි සැබවක් නැත්තේය.

2. "රෞද්‍රවූ ගුණ නැතිබැවින් මළමිණියක් වැනිවූ පරදාරාවන් සේවනය කරන්නාවූ මේ කොටාද මොහොලෙන් තළා ලාමකවූ පතිව්‍රතා ඇති ජීවත්වන්නාවූම මැගේද කන් හා නාස් සිඳව්යයි" කීයේය.

**194. මණිචොර ජාතකයඃ-** 1. "සිල්වතුන් රක්ෂා කරන්නාවූ දෙවතාවෝ නැතැයි හඟිමි. එබඳු කටයුත්තකදී බැහැරට යෙතියි සිතමි.

2. "මේ ලෝකයෙහි ලෝකපාලක දේවතාවෝත් නොම ඇතැයි හඟිමි. වහා බලාත්කාරකම් කරන්නාවූ සංයම නැත්තවුන්ගේ සැහැසිකම් වළක්වන්නෝ නොම ඇත්තාහයි සිතමි.

3. ඒ අධාර්මික රජහුගේ විජිතයෙහි නොකල්හි වැසි වසියි. ඔහුගේ රාජ්‍යයෙහි උවමනා කාලයෙහි නොවසියි. ස්වර්ග සංඛ්‍යාත ස්ථානයෙන්ද ඒ අධර්මිෂ්ට රජ පහවේ. හෙතෙම මෙපමණකින් නෂ්ටවූයේ නොවේදැයි" කීයේය.

**195. පබ්බතූපත්ථර ජාතකය:-** 1. "සිත්කළුවූ හිමාලය පර්වතයට සමීපව පැතිරසිටි භූමියෙහි සිහිල් දියෙන් පිරුණාවූ පොකුණක් හෙවත් ගංගාවක් ඇතිවූවාය. සිංහයෙකු විසින් රක්නාලද ඒ පොකුණ හිවලෙක් එය දන්නේම එහි වැද පැන් බීවේය.

2. "මහරජ, ඒකාන්තයෙන් දිවි ආදිවූ සියලු සිව්පාවෝ මහගඟ පැන් බොත්මය. එහෙයින් ගංගා නොවූයේ නොවෙයි.

3. "තට ඉදින් තොප අඹු ප්‍රියවීනම් ක්ෂමාකරව, හෙවත් ඉවසවයි" කීයේය.

**196. වලාහස්ස ජාතකය:-** 1. "යම් මනුෂ්‍ය කෙනෙක් බුදුන් විසින් දෙශනා කරණලද අවවාදය නොකෙරෙද්ද, ඔව්හු තුමූ රකුසයන්ගේ රැවටිල්ලෙන් බලවත් විනාශයට පැමිණියාවූ වෙළෙන්දන් මෙන් ව්‍යසනයට පැමිණෙන්නාහ.

2. "යම් මනුෂ්‍ය කෙනෙකුන් බුදුන් විසින් දෙශනා කරණලද අවවාදය කෙරෙද්ද, ඔව්හු වළාහක අශ්වරාජයා නිසා කැමති තැනට පැමිණියාවූ වෙළෙන්දන් මෙන් සුවසේ පරතෙරට හෙවත් නිවනට පැමිණෙන්නාහුයයි" වදාළේය.

**197. මිත්තාමිත්ත ජාතකය:-** 1. "ඔහු දැක සිනහ නොවෙයි. ඔහුගේ වචනය අසා සතුටු නොවෙයි. මේ ද්වෙෂ ඇත්තහුට ඇස් නොදෙයි. හෙවත් ඍජුව ඔහු දෙස නොබලයි. විරුද්ධවද පවත්නේයි.

2. "මෙකී ආකාරයෝ සතුරා කෙරෙහි පිහිටියාහු වෙත්. නුවණැත්තේ යම් කරුණෙකින් දැකද අසාද සතුරා ඇඳින ගන්නේද ඔහුගේ මේ ආකාරයෝය යනු අභිප්‍රායයි.

**198. රාධ ජාතකය:-** 1. "පුත්‍රය, දැන් පිටත සිට ආයෙමි. කලක්ගතවූයේ නොවෙමි පුත්‍රය, තාගේ මව කිමෙක්ද? අනිකෙකු සේවනය කෙරේදැයි" විචාළේය.

2. "සත්‍යයෙන් යුක්තවූ මේ වචනය මනාකොට කිය හැකි නොවේ. (ඉදින් වූ පරිදි කීයෙම් නම්) උණු හළුයෙහි දවා හොවන ලද පොට්ඨපාද ගිරවා මෙන් හෝනේයයි" කීයේය.

**199. ගහපති ජාතකය:-** 1. "කොටුවට බැස්සාවූ යම් මේ (පවිටු තැනත්තියක්) නොදකිමියි කියාද, ඒ කාරණයෙන් ගම්පතිය තට කියමි. ඉතා දුක්වූ ස්වල්පවූ ජීවිතය පවත්නා කල්හි මාංශය අපට දෙන්නේ කෙට්ටුවූ මහළු ගොණා දෙමසක් කල් නියමකොට ඒ කාලය නොපැමිණි කල්හි ඉල්වන්නෙහිය.

2. "එයද මට රුචි නොවෙයි. මට (වී නැති බව දැන දැන නොදකිමියි කියන ලාමක ස්ත්‍රියගේ වචනයද නො පැමිණි කල්හි මස් මිළ ඉල්ලීමද යන මේ දෙක නොවැටහේ මට මෙකී කරුණු දෙක රුචි නොවේයයි" කීයේය.

**200. සාධු ශීල ජාතකය:-** 1. "එකෙකුගේ ශරීරයෙහි අභිරූප භාවය ඇත. එකෙකුගේ වෘද්ධි භාවය ඇත. එකෙකුගේ සුජාත භාවය හෙවත් කුලවත්බව ඇත. එකෙකුගේ සුශීලභාවය ඇත. බමුණ තොපම විචාරමු. ඒ සතර දෙනා අතුරෙන් කවරක්හු කැමැති වෙමුද? (නොහොත්) කවරක්හට දෙමුද අභිරූප ශරීරයෙහි අභිවෘද්ධියෙක් ඇත්තේය. වෘද්ධි භාවයට නමස්කාර කරන්නේය. කුලවත් පුරුෂයා කෙරෙහි වැඩෙක් ඇත. අපට නම් ආචාරාදී ශීලය රුචිවේයයි" කීයේය.

---

## 21 නතංදළ්හ වර්ගය.

**201. බන්ධනාගාර ජාතකය:-** 1. "යකඩ මාංචුවද දාරුමයවූ බන්ධනයද, වැහැරි ආදීන් කළ බැම්ද යන යම් මේ බන්ධනයක් ඇද්ද, එය දෘඪවූ බන්ධනයයි නුවණැත්තෝ නොකීහ. වැලි කුමක්ද යත්, මැණිකෙහිද කුණ්ඩලාභරණයන්හිද අතිශයින් ඇළුණාවූ ඇල්මද පුතුන් කෙරෙහිද අඹුවන් කෙරෙහිද යම් අපේක්ෂාවකුත් ඇද්ද,

2. "මේ බන්ධනය දැඩියයි ප්‍රාඥයෝ කියති. ඔබ මොබ ඇද පහත හෙළන්නාවූ ලිහිල්වූ දුරලිය නොහැක්කාවූ යම් ක්ලෙශ බන්ධනයක් ඇද්ද, මෙයද ප්‍රඥා කඩුවෙන් සිඳ කාමයන්හි අපේක්ෂා නැත්තාවූ නුවණැත්තෝ පස්කම් සුවය හැරදමා තපසට යෙතියි" වදාළේය.

**202. කෙළිශීල ජාතකය:-** 1. "හංසයෝද, කොස් ලිහිණියෝද, මොණරුද, ඇත්තුද, එළුවෝද, අවශෙෂ මෘගයෝද යන මේ සියල්ලෝ සිංහයාට බියවෙත්. ශරීරයෙහි සමාන බවක් නැත්තේය.

2. "එපරිද්දෙන්ම මිනිසුන් අතරෙහි ඉදින් වයසින් බාළවූයේද, නුවණැත්තේ නම් හෙතෙමේම එහි මහත්වේ. මහත් ශරීර ඇත්තේද අඥාන තෙමේ මහත් නම් නොවේ යයි" කීයේය.

**203. ඛන්ධවත්ත ජාතකය:-** 1. "විරූපාක්ෂ නම් නාග රාජ කුලය හා සමග මාගේ මෛත්‍රිය ඒරාපථ නම් නා කුලය හා සමග මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්ත නම් නා කුලය හා සමග මාගේ මෛත්‍රිය කෘෂ්ණා ගෝතමකයන් හා සමග මාගේ මෛත්‍රිය.

2. "පාද රහිතයන් හා මාගේ මෛත්‍රිය ද්විපාදයන් හා මාගේ මෛත්‍රිය චතුෂ්පාදයන් හා මාගේ මෛත්‍රිය බහුප්පාදයන් හා මාගේ මෛත්‍රිය,

3. "මා අපාදකයෙක් හිංසා නොකෙරේවා මා ද්විපාදයෙක් හිංසා නොකෙරේවා මා චතුප්පාදයෙක් හිංසා නොකෙරේවා මා බහුප්පාදයෙක් හිංසා නොකෙරේවා.

4. සියලු සත්වයෝද, සියලු ප්‍රාණීහුද, සියලු භූතයෝද හුදෙක් සියල්ලෝ යහපතක්ම දකිත්වා, කිසි සත්වයෙකු කරා දුකක් නොපැමිණේවා.

5. "සර්වඥයෝ අප්‍රමාණ ගුණයෙන් යුක්තයහ. නව ලොව්තුරා ධර්මයද අප්‍රමාණයහ. අෂ්ටාර්ය පුද්ගල සංඝයාද ගුණයෙන් අප්‍රමාණයහ. සියලු දීර්ඝ ජාති සර්පයෝද, නයිද, ගෝණුස්සෝද, පත්තෑයෝද, මකුළුවෝද, සිකනැල්ලුද, මීයෝද, ප්‍රමාණ වත්හ. මා විසින් ආරක්ෂාතොමෝ කරණ ලද්දීය මා විසින් පිරිත්ද කරණ ලදී. භූතයෝ පහවෙත්වා. (මෙසේ කරණ ලද ආරක්ෂා ඇති) ඒ මම නමස්කාර කෙරෙමි. සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී ආදිවූ සත් බුදුවරුන්ට නමස්කාර වේවා."

**204. වීරක ජාතකය:-** 1. "වීරකය, මියුරු කොට හඬන්නාවූ මොණර කරකට බඳු පැහැඇති සවිට්ඨක නම්වූ මාගේ වල්ලභවූ සකුණයා හෙවත් කවුඩා දැක්කෙහි දැයි" ඇසීය.

**2.** "දියෙහිද ගොඩද හැසිරෙන්නාවූ නිරන්තරයෙන් අමු මසුන් බුදින්නාවූ ඒ පක්ෂිහට හෙවත් මෙසේවූ මට අනුව කරන්නාවූ තී සැමි සවිය්ඨික නම්වූ කවුඩා සෙවෙලින් හාත්පසින් වෙළුනේ මළේ යයි" කීයේය.

**205. ගංගෙය්‍ය ජාතකයඃ-** 1. "ගංගානම් ගඟෙහි උපන් මත්ස්‍යයාද හොබනේය. තවද යමුනා නම් ගඟෙහි උපන් මත්ස්‍යයාද හොබනේය. නුගරුකකට බඳුවූ වට ඇති රථ හිසක්සේ දික්වූ ග්‍රීවාද ඇති චතුෂ්පාදවූ මේ පුරුෂතෙම තොප සියල්ලක්ම ඉක්මවා බබළයි.

**2.** "යමක් විචාරණ ලද්දේද, එය නොකීයෙහිය. විචාරණ ලද්දේ අනිකක් කීයෙහිය. ආත්ම ප්‍රසංසා කරණ මේ පුරුෂතෙම අපට රුචි නොවේයයි" කීයේය.

**206. කුරුංගමිග ජාතකයඃ-** 1. "ඉදිබුව, එබැවින් වරපටින් ඇඹරූ පුඩු මලය දත්වලින් කපව, වැද්දා යම්සේ නොඑන්නේද, එසේම මම කරන්නෙමි.

**2.** "කච්ඡපයා ජලයට ප්‍රවිෂ්ට විය. කුරුංගමෘගයා වනයට වැදුනේය. ශත පත්‍රනම් ලිහිණි තමාහුන් ගස මුදුනින් දුරට දරුවන් ගෙණ ගියේයයි" කීයේය.

**207. අශ්වක ජාතකයඃ-** "ඔහු කැමැත්තාවූ මා විසින් කැමතිවූ ප්‍රියවූ ස්වාමිවූ අශ්වක නම් රජු හා සමග මේ උයන් පෙදෙස හැසිරෙන ලදී.

**2.** "අළුත්වූ සුවඳුක් දෙකින් පැරණිවූ සුවඳුක් මුවාකරණු ලැබේ. එහෙයින් අශ්වක නම් රජුට වඩා මේ ගොම පණුවාම මට ඉතා ප්‍රිය වේයයි" කීයේය.

**208. සුංසුමාර ජාතකයඃ-** 1. "සමුද්‍රයාගේ හෙවත් ගංගාවගේ එතෙර යම් අඹ ආදි ඵල කෙනෙක් දක්නා ලද්දාහුද, ඒ තා විසින් දැක කියනලද අඹවලින්ද, දඹවලින්ද වැළ වරකා වලින්ද කම් නැත. මාගේ අට්ටික්කා ගසම උතුම් වේ.

**2.** "සුංසුමාරය, තාගේ ශරීරය ඒකාන්තයෙන් මහත්ය. ඒ ශරීරයට සුදුසු ප්‍රඥාව නැත. මා විසින් තෝ වංචාකරණ ලද්දෙහිය. දැන් සැපසේ යවයි කීයේය."

**209. කක්කර ජාතකයඃ-** 1. "මා විසින් වනයෙහි අශ්ව කර්ණ නම් වූද, හෙවත් හෙළ මුරුත නම් වූද, බුළු නම් වූද, යම් වෘක්ෂ කෙනෙක් දක්නාලද්දාහුද, ඒ වෘක්ෂයෝ වෘක්ෂය. යම්සේ තෝ ඔබමොබ යාහැක්කෙහිද, එපරිද්දෙන් ඇවිදින්ට නොහැකි වෙත්.

2. "මැදිරිය බිඳගෙණ ආවාවූ මේ පුරාතනවූ කර්කරයා වාලයෙන් ඇඹරූ පාසයෙන් ගැලවීමෙහි දක්ෂවූයේ පළායන්නේයයි" කියයි.

**210. කන්දගල ජාතකයඃ-** 1. "පිංවත, කුඩා පත්‍ර ඇති කටු සහිතවූ මේ ගස කිනම්වේද? යම් ගසෙක්හි එක පහරින් මස්තකය බිඳී ගියේදැයි" (විචාළේය)

2. "හර නැත්තාවූ කාෂ්ට අවයව ඇති හිඹුල් එරබඳු ආදීවූ ගස්වලට විදින්නාවූ මේ කන්ද ගලකයා පුරුදු ඇත්තෙක පසුව යම් ගසෙක්හි පක්ෂිතෙම මස්තකය පැලී ගියේද, එසේවූ හටගත් හර ඇති කිහිරිගසට පැමිණියේයයි" කීයේය.

---

## 27 බීරණත්ථම්භක වර්ගය.

**211. සොමදත්ත ජාතකයඃ-** 1. "බීරණත්ථම්භක නම් සොහොණෙහිදී අවුරුද්දක් අප්‍රමාදව ඒකාන්තයෙන් සරඹය කෙළේය. පිරිසට බැස ඒ සංඥාව වැරදි වූයේය ඒ එසේමැයි. ඒසාමහත් ශක්තිය නුවණ නැත්තහු රක්ෂා නොකෙරේ.

2. "පුත සෝමදත්තය, ඉල්වන තැනැත්තේ අලාභයකට වේවයි, ධනලාභයකට වේවයි, මෙසේ වූ දෙකකට පැමිණේ එසේමැයි. යාඥාවෝ නම් මෙබඳු ස්වභාව ඇත්තාහුම යයි" කීයේය.

**212. උච්ඡිට්ඨභත්ත ජාතකයඃ-** 1. "ආහාරයාගේ මතු මත්තෙහිවූ ආකාරය අනිකෙක යටවූ ආකාරය අනිකෙක්මය බැමිණිය, තීම විචාරමි. යට කිනම් බතෙක්ද, මතුයෙහි කිනම් බතෙක්දැයි" ඇසීය.

2. "තොපට වැඩෙක් වේවයි, (හෙවත්) පින්වත මම නටන්නෙක් වෙමි. ආහාර සොයන්නේ මෙහි ආයේ වෙමි. ඒ ඇගේ සොර සැමියා වනාහි කොටුවට බැසගත්තේය. යමෙකු නුඹ සොයන්නෙහිද, ඒ මේතෙමේ යයි" කීයේය.

**213. භරු ජාතකය**:- 1. "භරුනම් රජ තපස්වීන්ට අන්තරායකොට රටවැස්සන් සමග මුල්සිඳුනේය. ඒ රජ විනාශයට ගියේයයි මා විසින් අසනලදී.

2. "එසේ හෙයින් ඡන්දයෙන් අගතියට යාම නුවණැත්තෝ ප්‍රශංසා නොකෙරෙත්. දුෂ්ටනොවූ සිත් ඇත්තේ සත්‍යයෙන් යුක්තවූ වචනය කියන්නේයයි" කීයේය.

**214. පුණ්ණනදී ජාතකය**:- 1. "පිරුණාවූ ගඟ යමෙකු විසින් බොන්නට යුතුයයි කියත්ද, හටගත් යව ධාන්‍ය යමෙකු නිසා සැඟවිය යුතුයයි කියත්ද, දුරට ගියහු යමෙකු කරණකොට ගෙණ එන්නේයයි කියත්ද, හෙතෙම තට ගෙණෙනලදී. එබැවින් බමුණ, අනුභව කරව."

2. "රජතෙම කාක මාංශයකුදු එවනු පිණිස යම් හෙයකින් මා සිහිකෙරේද, එහෙයින් හංසයෝය. කොස් ලිහිණිය මොණරුය යන මොවුන් ලදකල්හිම කුමැයි සිහි නොකෙරේද්ද, එසේමැයි සිහි නොකිරීමම ලාමක වේයයි" කීයේය.

**215. කච්ඡප ජාතකය**:- 1. "ඉදිබුවා කථාකරන්නේ තමන් ඒකාන්තයෙන් නැසීය. මුඛයෙන් මනාකොට ගන්නා ලද දඬුයෙහි ස්වකීයවූ වචනයෙන් තෙමේම තමා නැසීය.

2. "නරවීරයන් කෙරෙහි ශ්‍රේෂ්ඨය මෙයද දැක නිදොස්ව කථා කරන්නේය. සීමාව ඉක්මවා කථානොකරන්නේය ඉදිබුවා බොහෝකොට බිණීමෙන් ව්‍යසනයට හෙවත් බිම වැටී මරණයට පැමිණියහු දක්නෙහිදැයි" කීයේය.

**216. මච්ඡජාතකය**:- 1. "මේ ගින්න මා නොතවයි මනාකොට සස්නාලද හුලද මා නොතවයි. යම්බඳුවූ මා මත්ස්‍ය ධෙනුතොමෝ ඒ මාගේ මත්ස්‍යයා අනික් මත්ස්‍ය ධෙනුවක්

ලඟට කාමාසාවෙන් ගියේයයි සිතාද, ඇගේ ඒ සිතිවිල්ල මා තවායයි" කීයේය.

**2.** "ඒ රාග ගින්න මා දවයි. සිතද, මා තවන්නේය. කෙවුළනි, ස්වාමීනි, මා මුදා හරිව්. කාමයෙහි පිහිටි පුරුෂයා කිසිවෙක් නොනසයි. (නොහොත්) කාමයන් හේතුකොට ගෙණ කිසිවෙක් තොප වැන්නවුන් විසින් මරණු නොලැබේ යයි" කීයේය.

**217. සෙග්ගු ජාතකයః-** 1. "සියලු ලෝවැසිතෙම මේ කාමසේවනය හේතුකොටගෙණ සතුටුවූයේ විය.

"සෙග්ගු නම් තැනැත්තිය, ග්‍රාම ධර්මයෙහි අදක්ෂයෙහිද, කුමාරිකාවූ තෝ මා විසින් අත්ගන්නා ලද්දී මහ වනයෙහි අද හඬන්නෙහිය. "තිගේ ස්වභාව ධර්මය කිනම්ද?

**2.** "යමෙක් දුකින් පහකරණ ලද්දාවූ මට පිහිටවන්නේද මාගේ ඒ පියතෙමේ වනයෙහි ද්‍රොහිකම් කෙරෙයි. ඒ මම වනය මැද කවරෙකුට හඬා කියම්ද? යමෙක් රක්ෂා කරන්නේද, හෙතෙමේ සැහැසි කම් කෙරේයයි" කීයේය.

**218. කූටවාණිජ ජාතකයః-** 1. "කෛරාටිකයාට මේ කෛරාටිකකම මනාකොට සිතනලදී. ප්‍රයෝගකාරයාට නැවත ප්‍රයෝගය සුදුසු කොට කරණලදී. ඉදින් මීයෝ හීවැල් කෑවාහුනම් උකුස්සෝ කුමාරයා කුමක් හෙයින් නොගෙණ යන්නාහුද?

**2.** "ප්‍රයෝගකාරයාහට වනාහී අධික ප්‍රයෝග දන්නෝ ඇත්තාහ. තවද වංචාකාරයාහට අනික් වංචාකාරයෙක් වේමැයි පුත්‍රයා නැතිවූ තැනැත්තා සීවැල් නැතිවූ තැනැත්තහුට හීවැල්දෙව, හීවැල් නැතිවූ තැනැත්තාගේ පුත්‍රයා නොගෙණයේ යයි" කීයේය.

**219. ගරහිත ජාතකයః-** 1. "මාගේ අමුරන්ය මාගේ රත්‍රං යයි දාවල්ද, රාත්‍රියෙහිද, ප්‍රඥා නැත්තාවූ ආර්යධර්මය නොදක්නාවූ මිනිසුන්ගේ මේ කථායි.

**2.** "ගෘහයෙහි ගෘහපතීහු දෙදෙන වෙත්ද, උන් දෙන්නා අතුරෙන් එකෙක් රැවුල් නැත්තේය. එල්ලෙන තන ඇත්තේය.

නොයෙක් ආකාරයෙන් බඳින ලද කොණ්ඩා ඇත්තේය. තවද විදිනාලද කන් ඇත්තේය. බොහෝවූ වස්තුවෙන් ගෙණ යන ලද්දේය. ඒ ගෘහපතිතෙම ඒ ගෘහ ජනයා මුඛ ආයුධයෙන් විදින්නේයයි" කීයේය.

**220. ධම්මද්ධජ ජාතකයඃ-** 1. "සුවසේ ජීවත්වූ ස්වරූප ඇත්තෙහිය. රටින් ජලය නැති වනයට ආයේ හේ නුඹ තනිව වනයෙහි ගසක් මුල බැගෑපත්වූවෙකු මෙන් සිතන්නෙහිය. (ඒ කිනම් සිතිවිල්ලක්දැයි විචාළේය.)

2. "සුවසේ ජීවත්වූ ස්වරූප ඇත්තේ වෙමි. ස්වකීයවූ රටින් ජලය නැත්තාවූ වනයට ආයේ වෙමි. ඒ මම හුදකලා වූයේ වනයෙහි ගසක් මුල බැගෑපත්වූවක්හු මෙන් සත්පුරුෂයන්ගේ ධර්මය සිහිකරමින් සිතමියයි" කීයේය.

---

## 23 කාසාව වර්ගය.

**221. කාසාව ජාතකයඃ-** 1. "පහනොකරණලද කෙලෙස් කසට ඇති යමෙක් කාෂාය වස්ත්‍රය වැළඳගන්නේද, ඉන්ද්‍රිය දමනයෙන් හා පරමාර්ථ සත්‍යයෙන් පහවූ ඒ පුද්ගලයා සිවුරට නුසුදුසුයි.

2. "යමෙක් වනාහි දුරුකරණලද කෙළෙස් කසට ඇත්තෙක් වන්නේද, ශීලයන්හි මනාව පිහිටියේද ඉන්ද්‍රිය දමනයෙන් හා වාක් සත්‍යයෙන් යුක්තවූයේද, හෙතෙම ඒකාන්තයෙන් කාෂාව වස්ත්‍රයට හෙවත් සිවුර දැරීමට සුදුසු යයි" වදාළේය.

**222. චුල්ලනන්දිය ජාතකයඃ-** 1. "පාරාසරිය නම් බමුණු තෙම තෝ පාපය නොකරවයි යම්බඳු පාපයක් කරණලදද, තෝ පසුව තැවෙන්නේය කියා යම් වචනයක් එකල්හි කීයේද, මේ ආචාර්යයාගේ කීමයි.

2. "පුරුෂතෙම යම් පාප කෙනෙකුන් කෙරේද, ඒ පාපයන් තමා කෙරෙහි දකියි. යහපත කරන්නේය. යහපත දකියි. පව් කරන්නේද, අයහපතම දකියි. යම්බඳුවූ බිජුවට වපුරාද එබඳුවූ ඵලයක් හැරගණියයි" කීයේය.

**223. පුටභත්ත ජාතකය:-** 1. "නමස්කාර කරන්නාහට නමස්කාර කරන්නේය. තමා සේවනය කරන්නහු සේවනය කරන්නේය. තමාගේ උපන් කටයුත්තට අනුව කටයුතු කරන්නාහට කටයුතු කරන්නේය. අවැඩ කැමැත්තාහට වැඩක් නොකරන්නේය. තමා සේවනය නොකරන්නහුද තෙමේද සේවනය නොකරන්නේය.

2. "තමා අත්හරින්නහු තෙමේද හරනේය. ඔහු කෙරෙහි තෘෂ්ණාව නොකරන්නේය. පහවූ සිතින් සේවනය නොකරන්නේය. ඒ එසේමැයි. වෘක්ෂය, ක්ෂීණවූ ඵල ඇතැයි දැන පක්ෂිතෙම අනික් ගසක් බලා යන්නේය. ලෝකය වනාහි මහත්වේය"යි කීයේය.

**224. කුම්භීල ජාතකය:-** 1. "වානරේන්ද්‍රය, වාක් සත්‍යයද, පරීක්ෂාඥාන ධර්මයද අකම්පාවූ ධෛර්යයද, පරිත්‍යාගයද යන මේ ධර්මයෝ සතරදෙන තොපට මෙන් යම් පුද්ගලයෙකුට විද්‍යමාන වේද්ද, හෙතෙම සතුරා ඉක්ම පවතියි.

2. "සත්‍යය, ප්‍රඥාවය, ධෛර්යය, ත්‍යාගය යන මේ ඉතා යහපත්වූ ගුණයෝ යමෙකුට නැද්ද, හෙතෙම සතුරා ඉක්ම නොපවතින්නේයයි" කීයේය.

**225. ඛන්ති වණ්ණ ජාතකය:-** 1. "දෙවයෙනි, මාගේ සියලු කටයුතුවල ව්‍යාවෘතවූ පුරුෂයෙක් ඇත. ඔහුගේද එක් අපරාධයෙක් ඇත්තේය. එහිලා ඔබ කුමක් නම් සිතන්නෙහිද?"

2. "අපගේද මෙබඳුවූ පුරුෂයෙක් ඇත. ඒ මෙතැන්හිම සිටියේය. සියලු ගුණාංගයෙන් යුක්තවූ පුරුෂයෙක් දුර්ලභවේ. (එසේ හෙයින් මෙහිලා) අපට ඉවසීම රුචිවේයයි" කීයේය.

**226. කෝසිය ජාතකය:-** 1. "සුදුසු කාලයෙහි නික්මීම, (නොහොත්) පරාක්‍රමය, යහපත්වේ. නුසුදුසු කල්හි තමා හුන් තැනින් නික්මීම නොහොත් පරාක්‍රමය යහපත් නොවේ. නුසුදුසු කාලයෙහි වනාහී නික්ම කිසි අභිවෘද්ධියක් නොබබළවයි (හෙවත්) ප්‍රයෝජනයක් නොලබයි. හුදකලා වූවහුද, බොහෝ දෙනා බකමුහුණෙකු නැසූ කාක සේනාව මෙන් විනාශයට පමුණු වන්නේය.

2. ("පුරාතන පණ්ඩිතයන් විසින් නියමකොට තබන ලද) විධියගේ සංවිධාන ක්‍රමය දන්නාවූ අනුන්ගේ සිදුරු දන්නාවූ ප්‍රාඥතෙමේ වනාහි සියලු සතුරන් වසඟකොට මේ නුවණැති බකමුහුණා මෙන් සුවපත්වූයේ වන්නේයයි" කීයේය.

**227. ගූථ පාන ජාතකය:-** 1. "ශූර ගුණයෙන් යුක්තවූ වික්‍රම ස්වභාව ඇති පහර දෙන්නාවූ පුරුෂයා හා සූරවූ පුරුෂතෙම එක්තැනට පැමිණ (ඔවුනොවුන් සටන් නොකොට කුමටයේද, හස්තිය, මෙහි එව, නැවතුව කුමට නම් බියවූයේ පලායෙහිද? මාගේද නුඹගේද වික්‍රමය අඟු මගධ දෙරට වැස්සෝ බලත්වා,

2. "තා පාදයෙන් නොමරන්නෙමි. දත්වලින් නොමරන්නෙමි. සොඬිනුත් නොමරන්නෙමි. වැලි කුමකින්ද, යත්. අශුචියෙන්ම තා මරන්නෙමි. අශුචියෙන් අශුචිය නසනු ලැබේවයි' කියේය.

**228. කාමනී ජාතකය:-** 1. "බමුණ, උත්තර පඤ්චාලයද කුරුරටද කේකය නම් රටද යන මේ තුන් රාජ්‍යයන්ගේ අන්තරයද ප්‍රාර්ථනා කරමි. ඒ බරණැස් රාජ්‍යයට වඩා වැඩියක් ප්‍රාර්ථනා කරමි. බමුණ, කාමයෙන් ව්‍යසනයට පමුණුවනලද, මා පිළියම් කරව.

2. "කළු සර්පයන් විසින් දෂ්ට කරණ ලද්දහුට සමහරු මන්ත්‍රෞෂධාදීන් පිළියම් කරන්නාහුමය. (භූත චිකිත්සාවෙහි දක්ෂවූ) පණ්ඩිතයෝ යක්ෂයා විසින් මඩනා ලද්දහුට පිළියම් කරත්, කිසිවෙක් කාමයෙන් හානියට පමුණුවන ලද්දහුට (අසාධ්‍ය බැවින්) පිළියම් නොකරත්. ඒ එසේමැයි ඉක්මවූ කුශල ධර්ම ඇත්තාහට කවරනම් පිළියමක්දැයි" කීයේය.

**229. පලාසි ජාතකය:-** 1. "උතුම්වූ හස්ති නමැති මේඝයන්ගෙන්ද, අශ්‍රවූ තරංග මාලාවන්ගෙන්ද, රථල නමැති වර්ෂාවන් ඇති රථ නමැති තරංග මාලාවන්ගෙන්ද, කඩු මිටි ඇත්තාවූ ඉතා පරිභ්‍රමණය කොට දැඩිව පහර දෙන යොධයන්ගෙන්ද, හාත්පසින් තක්සලා නුවර වට කරණ ලද්දීය.

2. "නානාප්‍රකාරයෙන් මහත් නාද කරන්නාවූ තෙපි ඇතුන් හා සමග ඉදිරියට දුවව් පනිව්, අද මහත්වූ ඝොෂාවෙක් පවත්වාවා,

ගර්ජනා කරන්නාවූ මේඝයාගේ විදුලි ගැසීමක් මෙන් වහා නුවර වට කරවයි." කීයේය.

**230. දුතිය පලාසි ජාතකය:-** 1. "රථයෙහි මයුර පාදයෙහි නගනලද ධ්වජ අප්‍රමාණය. මාගේ සේනාව කෙළවර නැත. කවුඩන් විසින් සාගරය මෙන්, සතුරන් විසින් මැඩිය නොහැක. සුලඟින් පර්වතයක් මෙන් නැසිය නොහැක්කේය. මම අද තාවැන්නකු විසින් මැඩ පැවැත්විය නොහැක්කේ වෙමි.

2. "තාගේ අඥාන භාවය ප්‍රකාශ නොකරව, තා බඳුවූ පුරුෂයෙක්, රජය ගැන්මෙහි සමර්ථ නොවේ. හුදෙක්, කෙලෙස් දාහයෙන් දවනු ලබන්නෙහිය. මා වැනි වළක්වන කෙනෙකු නොලබන්නෙහිය. එකළාව හැසිරෙන්නාවූ හස්ති රාජයක්හු ළඟට මෙන් එන්නෙහිය. පාදයෙන් සුණු කළාවූ හුණනළ මෙන් හෙතෙම තා පොළා සුණු කරන්නේයයි" කීයේය.

---

## 24 උපාහන වර්ගය.

**231. උපාහන ජාතකය:-** 1. "පුරුෂයාහට සුවපිණිස යම්සේ ගන්නාලද උපහාණයෝ (සෙරෙප්පු සපත්තු) දුක් එළවත්ද, ග්‍රීෂ්මයෙන් විශෙෂයෙන් තැවුනාවූ පාදතලයෙන්, පීඩිතවූවාහු, ඒ පුරුෂයාගේම පාදයන් කා වණ කරන්නාහුය.

2. "එපරිද්දෙන් යම් හීණ කුලයෙහි උපන්නාවූ අනාර්ය පුද්ගලතෙම ගුරුවරයා කෙරෙන් විද්‍යාස්ථානයක්ද, ශ්‍රුතයක්ද, ඉගෙණගෙන, එහි උගත් ශිල්පයෙන් හෙතෙම එයම කන්නේය. අනාර්ය පුද්ගලතෙම උපාහණ බඳුවේයයි" කියනු ලැබේ."

**232. වීණාථූන ජාතකය:-** 1. "මේ කාරණය තනිව සිතනලදද, මේ කුදුමිනිසා (මහළු නමුත් නුවණනැති හෙයින්) බාළයෙක. තම ශක්තියෙන් යා නොහැක්කෙක පින්වතිය, කොටවූ අත්පා ඇති. පිටින් කුදුවූවකු හා එක්වන්නට තී සුදුසු නොවෙහිය.

2. "කුදු පුරුෂයා පුරුෂයන්ට උතුමෙකැයි සිතන්නාවූ මම කුදුවූවහු කැමතිවීමි. ඒ මේ කුදා සිඳිනාලද තත් ඇති වීණා දණ්ඩක් මෙන් හැකුළුනේ සයනය කෙරේයයි" කීයේය.

**233. විකිණ්ණක ජාතකය:-** 1. "ඒකාන්තයෙන් යම් තැනෙක්හි කැමැත්තෙහි නම් එතැන්හි යව, ධර්ම ස්ථානයෙහි හුලෙන් විදිනා ලද්දෙහිය. මත්ස්‍යයන් ලුහු බඳින්නාවූ ලොල්වූ තෝ බෙර වැයීම් සහිතවූ බත කරණකොට ගෙන නටුයේ විය.

2. "ලොකාමිෂවූ පඤ්චකාමයට අනුව දුවන්නාවූ සිතට වසඟව පවත්නාවූ පුද්ගලයා එපරිද්දෙන්ම වැනසේ. හෙතෙම නෑ යහළුවන්ගේ මැද මත්ස්‍යයන් අනුව ගියාවූ කිඹුලා මෙන් වැනසේයයි" කීයේය.

**234. අසිතාභූ ජාතකය:-** 1. "තා කෙරෙහි යම්බඳුවූ මාගේ කාමයෙක් පහව ගියේද, දැන් තෝම කෙළෙහිය. කියතකින් කපනලද ඇත් දළයක් මෙන් ඒ මේ කාමය තෙම නොගැලපිය හැක්කේය.

2. "ඒ ඒ වස්තුවෙහි අධික ආශා ඇත්තේ අධික ලෝභයෙන්ද, අතිලෝභ සංඛ්‍යාතවූ මදයෙන්ද අසිතාභූ නම්වූ රාජ කන්‍යාවගෙන් පිරිහුනු මාමෙන් අර්ථයෙන් මෙසේ පිරිහේයයි" කීයේය.

**235. වච්ඡනඛ ජාතකය:-** 1. "වච්ඡනඛයා මධුර ආහාර අනුභව කොටද මිහිරි පැන් පානය කොටද, යම් ශ්‍රී යහනෙක්හි උකටලී නොව සයනය කරන්නෙහිද, එසේ හෙයින් අමුරන් සහිතවූද භොජන සහිතවූද ගෘහයෝ සැප ඇත්තාහයි වර්ණනා කළෝ.

2. "උත්සාහවත් නොවන්නාහට ගෘහයෝ නැත. බොරු නොකියන්නාහට ගෘහයෝ නැත්තාහ. නොගන්නා ලද දඬු ඇති අන්‍යයන්ට පහරදීම් ආදියෙන් දඬුවම් නොකරන්නාහට ගෘහයෝ නැත්තාහයි මෙකී පරිද්දෙන් සිදුරු ඇති කල්හි දුරාරාධවූ ගිහිගෙට කවරෙක් නම් පැමිණේදැයි" කීයේය.

**236. බකජාතකය:-** 1. "හෙළපියුම් පෙති වැනිවූ ද්විජ නම්වූ මේ පක්ෂිතෙම ඉතා යහපත්ය. සංසිඳුනාවූ පියාපත් වලින් අබල දුබලයෙකු මෙන් ධ්‍යාන කෙරේ. හෙවත් සිතයි.

2. "මොහුගේ ආචාර ශීලයක් නොදනිවු. නොදැන ප්‍රශංසා කරන්නාහුය. මේ පක්ෂිතෙම අප රක්නේ නොවෙයි. එහෙයින් පියාපත් නොසොලවායයි" කීයේය.

**237. සාකෙත ජාතකය:-** 1. "භාග්‍යවතුන් වහන්ස, මේ ලොකයෙහි සමහර පුද්ගලයෙකු කෙරෙහි හෘදය අතිශයින්ම නිවෙන්නේය. සිතද දුටු පමණින් පහදී. එයට හේතු කවරේදැයි" විචාළේය.

2. "පෙර ජාතියෙහි එක්ව විසීමෙන් හෝ මේ භවයෙහි කළාවූ හිතයෙන් හෝ දියෙහි උපුල් ආදිය යම්සේද? එපරිද්දෙන් ඒ ප්‍රේමය හටගණී යයි" වදාළේය.

**238. එකපද ජාතකය:-** 1. "ආරාධනා කරමි නොහොත් විචාරමි. පියාණෙනි, යම් පදයකින් අභිවෘද්ධීන් අස්වමුද, එසේවූ නොයෙක් අර්ථ ඇති පදයන්ගෙන් යුක්තවූ බොහෝවූ පදයන් සංග්‍රහකොට සිටියාවූ එක පදයක් කියනු මැනව.

2. "පුත්‍රය, දක්ෂ භාවයයි කියනලද ප්‍රඥාව හා යෙදුන වීර්යය එක පදයයි. බොහෝවූ අර්ථ පදයන්ගෙන් යුත් එයද ශීලයෙන් යුක්තවූයේ ඉවසීමෙන් උපදවන ලද්දේ මිත්‍රයන් සුවපත් කරන්ටද සතුරන්ගේ දුක් පිණිසද ප්‍රමාණවේයයි" කීයේය.

**239. හාරිත ජාතකය:-** 1. "නීල මැඩියා මව් කොට ඇත්ත කෙමිණෙහි කටට ඇතුල්වූ මා සර්පයෙකු සමානවූ යම්බඳුවූ මා මත්ස්‍යයෝ කත්ද, ඒ තට රුචිවේද?

2. "යම්තාක් මොහුට ඓශ්වර්ය සමෘද්ධිය වේද, ඒතාක් පුරුෂතෙම අනුන් පැහැර ගැණීමය. යම් කලෙක්හි සෙස්සෝ පැහැරගණිත්ද, ඒ බොහෝ දෙනාට පීඩාකළ දුෂ්ටිය පහරණු ලැබේ යයි" කීයේය.

**240. මහා පිංගල ජාතකය:-** 1. "පිංගලනම් රජු විසින් සියලු ජනතෙම පීඩා කරණ ලදී. ඔහු මළ කල්හි ප්‍රීතීන් විඳිත්, දොරටුපාලය, පිඟුවන් ඇස් ඇති ඒ රජ තට ප්‍රියවූයේ වේද? තෝ කුමක් හෙයින් හඬන්නෙහිද?"

2. "පිඟුවන් ඇස් ඇති ඒ රජ මට ප්‍රිය වූවෙක් නොවීය, ඔහුගේ පෙරලා ඊමට භයවෙමි. මෙයින් මිය ගියේ මාරයාට පීඩා කෙළේ නම් හෙතෙම, පීඩා කරණ ලද්දේ නැවත මෙහි එවන්නේයයි" කීයේය.

---

## 25 සිගාල වර්ගය

**241. සබ්බදාඨ ජාතකයඃ-** 1. "හිවලා පිරිවර නිසා මානයෙන් දැඩිවූයේ පිරිවරින් ප්‍රයෝජන ඇත්තේ මහත්වූ සම්පත් භූමියකට පැමිණියේය. සියලු දළ ඇති සතුන්ට රජ විය.

2. "එපරිද්දෙන්ම මිනිසුන් අතුරෙහි යමෙක් පිරිවර ඇත්තේ වේද, හෙතෙම වනාහි දළ ඇත්තවුන්ට රජවූ හිවළා මෙන් එහිලා මහත්වූයේ වන්නේයයි" කීයේය.

**242. ශුනඛ ජාතකයඃ-** 1. "අඥානවූ යම් බල්ලෙක් මේ වරපට ඒකාන්තයෙන් නොකයිද, බන්ධනයෙන් මිදුනේද, බඩපුරා කෑයේද, ගෙට යන්නේය.

2. "මාගේ සිතෙහි මා විසින් තොපගේ කථාව තබන ලදී. නැවත මාගේ හෘදයෙහි තොපගේ කථාව කරණ ලද, නැගීයන්ට සුදුසු කාලයද බලාපොරොත්තුවෙමි. යම්තාක් ජනතෙමේ නිද්‍රොපගත වේවායි" කීයේය.

**243. ගුත්තිල ජාතකයඃ-** 1. "සත් තතක් ඇති ඉතා මිහිරිවූ සිත් කළුවූ වීණාව ගායනා කරණ ආකාරය කීමි. හෙවත් වීණා ශිල්පය ඉගැන්වීමි. ඒ මාගේ ශිෂ්‍යයා මා රඟමඬලෙහි තමා හා වාදයට කැඳවයි. කෝශිය ගොත්‍ර ඇත්ත මට පිළිසරණවෙව."

2. "යහළුව, මම සරණව තා රක්නෙමි. මම ඇදුරන් පුදන්නෙක්මි. ශිෂ්‍යයා තා නොදිනන්නේය. ආචාර්යයා නුඹ ශිෂ්‍යයා පරදවා ජය ගන්නෙහියයි" කීයේය.

**244. විථිවච්ඡ ජාතකයඃ-** 1. "යමක් දකීද, එය නො කැමති වෙයි. යමක් නොදකීද එය වනාහී කැමති වෙයි. බොහෝ

කලක් ඇවිදින්නේයයි සිතමි. හෙතෙම යම් ජල රහිත ගංගාවක් කැමතිද, එය නොම ලබන්නේය.

2. "යමක් ලැබේද එයින් සතුටු නොවේ. ලබන්නට ප්‍රාර්ථනා කෙරෙයි. යමක් යමක් ප්‍රාර්ථනා කොට ලදද ඒ ඒ වස්තුවට නින්දා කරයි. එසේමැයි තෘෂ්ණාව නම් සීමාව ඉක්මවූ රූපාදීන් අරමුණු කොට ඇත්තීය. පහවූ තෘෂ්ණා ඇත්තවුන්ට නමස්කාර කරන්නෙමු" කීයේය.

**245. මූල පරියාය ජාතකය**:- 1. "පෙරවරු ආදී කාලය තෙම තමා හා සමග සියලු සත්වයන් කන්නේය. යම් බඳුවූ කාලය කෑවාවූ සත්වයෙක් ඇද්ද, හෙතෙම තෘෂ්ණාව වැඩීය.

3. රෝම ඇති මහත්වූ බොහෝවූ මිනිසුන්ගේ ශීර්ෂයෝ දක්නා ලැබෙත්. ඒ හිස්ද බෙල්ලෙහි තබන ලද්දාහුය. මෙහිලා කන් ඇත්තෝ හෙවත් ප්‍රඥාවත්හු සමහර කෙනෙකියි" වදාළේය.

**246. තෙලොවාද ජාතකය**:- 1. "සංයම නැත්තාවූ පුරුෂතෙම පහරදී පීඩා කොට මරා දානය දේද, මෙබඳුවූ බත අනුභව කරන්නාවූ හෙතෙම පාපයෙන් තැවරේ. (හෙවත්) යෙදේ.

2. "දුශ්ශීලයා ඉදින් අඹු දරුවන්ද මරා දන් දෙන්නේද, ප්‍රඥා සහිතවූ තැනැත්තේ වනාහි ඒ දානය අනුභව කරන්නේද? පාපයෙන් මිශ්‍ර නොවේයයි" කීයේය.

**247. පාදඤ්ජලී ජාතකය**:- 1. "පාදඤ්ජලී නම් රාජ කුමාරයා ඒකාන්තයෙන් සියල්ලන් ප්‍රඥාවෙන් ඉක්මවා බබළයි. මත්තෙහි එසේමැයි තොල් බිඳියි. ඒකාන්තයෙන් අන් කරුණක් බලයි.

2. "මේ පාදඤ්ජලීනම් කුමාරයා ධර්මයද අධර්මයද අර්ථයද අනර්ථයද නොදනියි. තොල් බිඳුමෙන් පිටත් කිසිවක් මේ තෙම නොදනීයයි" කීයේය.

**248. කිංසුකොපම ජාතකය**:- 1. "තොප හැමදෙනා විසින් කැලගස දක්නා ලදී. මෙහි කුමකට සැකකරව්ද? සියලු තන්හි රථාචාර්යයා තොප විසින් නොම විචාරණ ලද්දේය.

2. "එපරිද්දෙන් සියලු විදර්ශනා නුවණින් යම් කෙනෙකුන් ධර්මයෝ නොදන්නා ලද්දාහුද, ඔහු ඒකාන්තයෙන් කැල ගසෙහි

සැක ඉපදවූ සහෝදරයන් සතරදෙනා මෙන් ධර්මයන්හි සැක කෙරෙත්යයි" වදාළේය.

**249. සාලක ජාතකය:-** 1. "සාලකය; තෝද එකම පුත්‍රවූයේ වන්නෙහිය. අපගේ කුලයෙහි අධිපතිවූවෙක් වන්නෙහි ගසින් බැසපිය, දැන් එව, ගෙට යන්නෙමු.

2. "තා විචාරමි. මා හෘදයෙහියයි හෙවත් තට සුදුසු යයි සිතන්නෙහිද? යම්හෙයකින් මා හුණලීයෙන් ගැසුයෙහිද, එසේ හෙයින් තා හා නොඑමියි මේ පැසුනාවූ අඹ වනයෙහි සිත් අලවයි. තෝ කැමති පරිද්දෙන් ගෙට යවයි" කීයේය.

**250. කපි ජාතකය:-** 1. රාගාදී කෙලෙසුන් සංසිඳීම යයි කියන ලද ශීල සංයමයෙහි ඇලුනාවූ සීතලින් හටගත් බියෙන් පීඩිතවූ මේ තපස්වීතෙම සිටී. එබැවින් මේ තපස්වී තෙම මේ ගෙට ඇතුල්වේවා. සියලු සීතලද පීඩාද දුරු කෙරේවා.

2. "මේ කෙලෙස් සංසිඳීමය හික්මීමය ශීල සංයමය යන මෙහි ඇලුනාවූ ඍෂියෙක් නොවේ. වැලි කවරෙක්ද යත්, මේ තෙම ගස්වල අතු ගෝචර කොට ඇති ගිය ගිය තැන දූෂ්‍ය කරන්නාවූද, කෝප කරන්නාවූද, ලාමකවූ වඳුරෙකි. හෙතෙම ඉදින් මේ ගෙට වදී නම් මේ පන්සල් ගෙයද දූෂ්‍ය කරන්නේයයි" කීයේය.

දුක නිපාතය නිමි.

---

# 3. තික නිපාතය.

## 1. සංකප්ප වර්ගය.

**251. සංකප්ප (රාග) ජාතකය:-** 1. "කාම විතර්කයන්ගෙන් යුත්වූ රාග නැමති ජලයෙන් දෝනාලද විතර්ක නැමති ගලෙහි මුවහත් තබන ලද අලංකාර නොකිරීමෙන් යහපත් නොවූ හී වඩුවෙකු විසින් නොකරණ ලද.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2.** "කන් කෙළවර දක්වා ඇද නොහරණ ලද මොණර පියාපත් ආදීන් නොසාදන ලද සර්වාංගය දවන්නාවූ ඒ කෙලෙස් නැමැති ඊයෙන් හෘදය තුල විදින ලද්දේ වෙමි.

**3.** "යම් හෙයකින් රුධිරය වෑහේද, එසේ විදි තැනකුදු නොදකිමි. ඉතාම නුනුවණින් සිත වඩනා ලදද, එසේ හෙයින් තුබූ මා විසින් දුක පමුණුවා ගන්නා ලදැයි" කීයේය.

**252. තිලමුට්ඨි ජාතකයඃ-** 1. "තල මිටකින් මා අත අල්වාගෙණ හුණ ලීයෙන් නුඹ මට ගැසීද, ඒ පහර අද දක්වා මාගේ සිතෙහි වේ.

**2.** "බමුණ, යම්බඳුවූ මා අත අල්වාගෙන තුන් වරක් ගැසීද, යම් හෙයකින් ආයේද, එහෙයින් තාගේ ජීවිතයෙහි නොඇලෙහි යයි" සිතමි.

**3.** "යම් ආර්යයෙක් තෙම නොකටයුතු කරන්නහු දඬුවමින් වළකයිද, නුවණැත්තෝ එය හික්මවීම පිණිසය. වෛර පිණිස නොවේ කියා දනිත්."

**253. මණිකණ්ඨ ජාතකයඃ-** 1. "මේ මාණික්‍ය රත්න හේතුවෙන් මට ආහාරයද පානයද බොහෝ කොට ශ්‍රේෂ්ඨව උපදී. එය තට නොදෙමි. ඉක්මවා යාඥා කෙළේවෙහිය එසේහෙයින් තාගේ ආශ්‍රමයටද නැවත නොඑන්නෙමි.

**2.** "මුවහත් තබනලද කඩුවෙන් යුක්ත අත් ඇති බාල පුරුෂයෙකු මෙන් මැණික්ගල මගෙන් ඉල්වමින් තැති ගැන්වූවෙහිය. තට එය නොදෙමි. අධික කොට යාඥා කෙළෙහිය. එහෙයින් තාගේ ආශ්‍රමයටද නැවත නොඑන්නෙමි.

**3.** "යම් පුද්ගලයෙකුට යම් වස්තුවක් ප්‍රියයයි දන්නේද, ඒ වස්තුව නොඉල්ලන්නේය. කුමක්හෙයින්ද යත්? පමණ නොදැන අධික කොට යාඥා කිරීමෙන් යාචකයා ද්වෙෂ කටයුතු වන්නේය. එසේමැයි බමුණා විසින් මැණික ඉල්වනලද මණි කණ්ඨක නම් නාරජ එතැන්පටන් නොදැක්මට ගියේ යයි" කීයේය.

**254. කුණ්ඩක කුච්ඡි සින්ධව ජාතකයඃ-** 1. "අශ්ව වෘෂභාදීන් විසින් කා ඉතිරිවූ තණ අනුභව කොට ඉතිරිවූ කැඳ වතුරද

කුඩුද අනුභවකොට වැඩුනෙහි එසේ හෙයින් තට මේ භොජනය විය. කුමක් හෙයින් දැන් එය අනුභව නොකළෙහිද?

2. "යම් තැනෙක්හි බොහෝදෙන පුරුෂයා ජාතියෙන්ද ආචාර විනයෙන්ද නොහඳුනත්ද, මහා බමුණ, එතැන්හි හුළුකැන් දියද කුඩුද අනුභව කෙළෙමි.

3. "මේ උතුම් අශ්වතෙම යම්බඳුද, එසේවූ මා තෝ වනාහි දන්නෙහි, දන්නාවූ තා කරා දන්නෙක්වූ මම අවුත් තොපගේ කුඩු අනුභව නොකරමියි" කීයේය.

**255. ශුක ජාතකයඃ-** 1. "යම්තාක් ඒ විහංගම නම්වූ ගිරාතෙම භොජනයෙහි පමණ දැනගත්තේද? ඒතාක් කල් බොහෝ කලක් පැමිණියේය. මෑණියන්ද පොෂ්‍ය කෙළේය.

2. "යම් කලෙක්හි වනාහි ඒ ගිරාතෙම අධික කොට ආහාරය අනුභව කෙළේද, හෙතෙම පමණ නොදන්නේ වීද, එකල්හි ඒ සමුද්‍රයෙහිම ගිලුනේය.

3. "යම් හෙයකින් ආහාරයෙහි පමණ නොදන්නෝ වනාහි සමුද්‍රයෙහි ගිලෙද්ද, ආහාරයෙහි පමණ දන්නෝ නොගිලෙන්නාහුද, එහෙයින් භොජනයෙහි පමණ දන්නා බවද ගිජු නොවන බවද ප්‍රශස්ත යයි" කීයේය.

**256. ජරූදපාන ජාතකයඃ-** 1. "මහළු ළිඳක් කනින්නාහු දියෙන් ප්‍රයෝජන ඇත්තාවූ වෙළෙන්දෝ කළු යකඩද, තඹද, සුදු ඊයම්ද, කළු ඊයම්ද, රිදීද, රත්රන්ද, මුතුද, වෛදූර්ය මාණික්‍යයද ලැබූහ. එයින් නොසතුටුවූ ඒ වෙළෙන්දෝ වැඩි වැඩිය සෑරූහ.

2. "ඔවුන් එහි තේජස් ඇත්තාවූ දරුණුවූ සර්පයෙක් තමාගේ විෂ තේජසින් පහළේය එහෙයින් කනින්නේය. අධික කොට නොකණින්නේය. කුමක් හෙයින්ද යත්? අතිශයින් සාරණ ලද්ද වනාහි ලාමකවේ. පමණට කැණීම හේතුකොට ගෙන මුක්තාදි වස්තුව ලබන ලදී. අධික කොට කැණීමෙන් ලබන ලද වස්තුවද නසන ලදැයි" කීයේය.

**257 අදාසමුඛ ජාතකය:-** 1. "මෙතෙම ගෘහයන් සම්බන්ධව දක්ෂයෙක් නොවේ. ලොල්වූ රැලි වැටුනු මුහුණු ඇති මෙතෙම කළ කළ දෙයක් වනාහි දූෂ්‍ය කරවන්නේය. එසේමැයි මේ වඳුරන්ගේ කුලය මෙබඳු ස්වභාවය ඇත්තේයි.

2. "පරීක්ෂණ ඥානයෙන් යුක්තවූවෙකුට මෙසේවූ ලෝමය නැත. මෙතෙම අනුන් අස්වසන්නාවූ මෘගයෙක් නොවෙයි. මෙතෙම කිසිවක් නොදනී යයි මට ජන සන්ධ රජහු විසින් අනුශාසනා කරණ ලදී.

3. "මව හෝ පියා හෝ සහෝදරයෙකු හෝ නැගණියකු හෝ යහලුවෙකු හෝ එබඳුවූ පුරුෂයෙක් පොෂණය නොකරන්නේ යයි මට දශරථ නම් රජහු විසින් අනුශාසනා කරණ ලදී.

**258. මන්ධාතු ජාතකය:-** 1. "චන්ද්‍ර සූර්ය දෙදෙනා යම් පමණ තැන් පරිහරණය කෙරෙත්ද, යම් පමණවූ දිසාවන් බබුලුවත්ද, යම්තාක් බබළන ස්වභාව ඇත්තාහුද, ඒතාක් තැන්වල භූමිය ඇසුරු කළාවූ යම් ප්‍රාණීහු ඇත්ද, ඒ සියල්ලෝම මන්ධාතු රජහුගේ දාසයෝය.

2. "කහවණු වර්ෂාවෙන්ද කාමයන්හි තෘප්තියෙක් විද්‍යමාන නොවේ. එහෙයින් කාමයෝ අල්පවූ ආස්වාද ඇත්තෝ යයි දුක් වූවාහුයයි මෙසේ පණ්ඩිතතෙමේ දැන-

3. "ඒ පුරුෂතෙම දිව්‍යවූ කාමයන්හිද ඇල්මට නොපැමිණේ. එසේමැයි සමයක් සම්බුද්ධයන්ගේ ශ්‍රාවකතෙමේ තෘෂ්ණාවගේ ක්ෂය කිරීමයයි කියනලද නිවනෙහි ඇලුනේ වෙයි" වදාළේය.

**259. තිරීට වච්ඡ ජාතකය:-** 1. "මේ තපස්වියාගේ විද්‍යායෙන් නිපදවූ කිසිවක් නැත. තාගේ නෑයෙකුදු නොවේ තාගේ වනාහි යහළුවෙකුත් නොවේ. තවද කවර නම් කරුණකින් තිරීට වච්ඡ නම් ත්‍රි දණ්ඩයක් ඇති මෙතෙම අධිකවූ රස ඇති හෙයින් අග්‍ර නම්වූ පිණ්ඩය හෙවත් මේ බත අනුභව කෙරේද,

2. "යුද්ධ භූමියෙහි පරදවන ලද දුකට පැමිණියාවූ හුදකලාවූ මට විපත්තියෙහි අනුග්‍රහ කොට දරුණුවූ ජල දුර්ග වනයෙහි

ලිඳෙහි වැටීහුන් මට අත දික්කෙළේය. ඒ කාරණයෙන් දුකින් පෙළුනාවූ මම ලිඳෙන් ගොඩ නැංගෙමි.

3. "මේ තාපසයාගේ කටයුත්තෙන් මෙහි පැමිණියෙමි. යමයාගේ විෂයෙන් හෙවත් පරලොවින් මිදී මනුෂ්‍ය ලොකයෙහි වසමි. පුත්‍රය, තිරීට වත්ස නම් තාපසතෙම ලාභයට සුදුසුය. මොහුට භොගය හෙවත් පරිභොග කටයුතුවූ ප්‍රත්‍යයද දෙවූ. යාග කටයුතුවූ යාග ද්‍රව්‍යද දෙවයි නියෝග කළෝ

**260. දූත ජාතකයः-** 1. "සතුරාද යාඥා කරන්නට යමක්හු පිණිස දුරස්ථානයට යෙත්ද, එසේවූ උදාරයාගේ මම දූතයෙක්මි. රාජොත්තමය, මට නොකිපෙව.

2. "යම් උදරයක්හුගේ වසඟ බවට සත්වයෝ දාවල්ද, රාත්‍රියෙහිද, පැමිණෙත්ද, ඒ උදරයාගේ මම දූතයෙක්මි. රාජොත්තමය, මට නොකිපෙව.

3. "බමුණ වෘෂභ රාජයෙකු හා සමග රක්තවර්ණවූ ගවයන් දහසක් තට දෙමි. (එසේ මැයි) දූතයෙක් වනාහි දූතයෙකුට කෙසේනම් නොදෙන්නේද, අපිදු ඒ තා කියනලද උදරයාගේම දූතයෝ වෙමුයි" කීයේය.

---

## 2 පදුම (කොසිය) වර්ගය.

**261. පදුම ජාතකයः-** 1. "යම්සේ හිස කෙස්ද රැවුල්ද කැපු කැපුසේ නැවත හටගනීද එපරිද්දෙන් තාගේ නාශිකාව නැවත හටගණීවා. අප විසින් ඉල්වන ලද්දේ පියුමක් දෙව,

2. "යම්සේ ශරත් කල්හි ගෙණ තිබූ සරු බිජුවට කෙතෙහි වපුරණ ලද්දේ හටගණීද, එපරිද්දෙන් තාගේ නාශිකාව හටගණීවා. යාඥා කරණ ලද්දේ පියුමක් දෙව,

3. "පද්මයන් අපට දෙන්නේ යයි සිතා මොහු දෙදෙන වනාහි මිථ්‍යා ප්‍රලාප කියත්. නැළවිලි වචන කියත්. ඔහු කියන්නාහු හෝ නොකියන්නාහු හෝ නාශිකාවගේ හටගැණීමක් නැත. යහළුව ඉල්වන ලද්දේ පියුම් දෙවයි" කීයේය.

**262. මුදුපාණි ජාතකය**:- 1. "ඉදින් හස්ත තලයද මෙලොක්වූයේ වීනම් හස්තියාද, මනාකොට හික්මවන ලද්දේ වීනම් රාත්‍රියෙහි අන්ධකාරයෙක්ද, වීනම් එකල්හි වසින්නේද වීනම් එසේ ඇති කල්හි ඒකාන්තයෙන් අපගේ අදහස සඵල වන්නේයි.

2. "මොළොක්වූ ප්‍රිය වචනයෙන් තමා කෙරෙහි දිගු කලක් වාසය කරවන්නට නොපිළිවන්හ. නොහොත්, කෙතෙක් පුරුෂයෝත් මොවුන්ට පමණ නැත්තාහ. මොළොක්වූ වචන ඇත්තාහ. නොපිරවිය හැක්කාවූ ගංගාවක් හා සමානවූ ඒ ස්ත්‍රීහු තමා වසඟ බවට පැමිණියවුන් අපායෙහි ගිල්වත් මෙසේ දැන ඇය දුරින්ම දුරුකරන්නේය.

3. "මේ ස්ත්‍රීහු නම් කැමැත්තෙන් හෝ ධන හේතුවෙන් හෝ යම් පුරුෂයක්හු සේවණය කෙරෙද්ද, ස්වකීය ස්ථානය දවන ගින්න මෙන් වහා ඒ සේවණය කළහුම දවත්යයි" කීයේය.

**263. චුල්ල පලොභන ජාතකය**:- 1. "ජලය නොසෙල්වෙන කල්හි තෙමේම ඉර්ධියෙන් අවුත් ස්ත්‍රිය හා මිශ්‍ර බවට පැමිණ මහා සාගරයෙහි ගැලෙන්නෙහිය.

2. "මේ ස්ත්‍රීහු නම් කාමාවර්තයෙන් ආවර්තනය කරණ හෙයින් ආවර්තනීහ. මහත්වූ මායා ඇත්තාහ. ශ්‍රෙෂ්ඨචර්යාවන් විනාශ කිරීමෙන් පුරුෂයන් අපායෙහි ගල්වත්යයි මෙසේ දැන ඇය දුරින්ම දුරු කරන්නේයි.

3. "මේ ස්ත්‍රීහු මේ තමන්ගේ කැමැත්තෙන් හෝ වස්තු ලාභය හේතුකොට ගෙන හෝ යමක්හු සේවනය කෙරෙත්ද? ස්වකීය ස්ථානය දවන ගින්න මෙන් වහා ඒ සේවනය කළහු දවත් යයි" කීයේය.

**264. මහාපණාද ජාතකය**:- 1. "යම් රජක්හුගේ ස්වර්ණමයවූ ප්‍රාසාදය සරසින් ෂොඩශ ශර ප්‍රමාණවීද, උසින් සහස්‍ර කාණ්ඩ ප්‍රමාණයයි කීහුද, ඒ රජතෙමේ පණාද නම්වේ. (උසින් පස්විසි යොදුනක පළලින් අඩ යොදුනක් පමණ යයි කියත්.)

2. උසින් දහසක් කාණ්ඩ ප්‍රමාණවූ ඒ මාළිගාව සියක් මහල් ඇත්තේ ධ්වජයෙන් ගැවසීගත්තේය. නිල් මැණිකෙන් වටකරණ ලද්දේය. එහි සදහසක් නටන ගී කියන නළුවෝ සප්තප්‍රකාරව නැටුවාහුය.

3. "භද්දජී ස්ථවිරයෙනි, යම්සේ කීයෙහිද, ඒ එසේමය. එකල්හි තට වතාවත් කළාවූ මම එකල්හි ශක්‍ර වීමි."

**265. ඛුරප්ප ජාතකයః-** 1. "දුනු වේගයෙන් හරණ ලද ඊතලද තෙල් සණලා සෝදන ලද සියුම් මුවහත් ඇති ගන්නාලද කඩුද, දැක මරණය ලංව සිටියාවූ ඒ භයෙහි දී තට කුමක් හෙයින් තැති ගැන්මක් නොවීද?

2. "දුනු වේගයෙන් හරණ ලද ඊතලද තෙල් සණ ලා ශුද්ධකළ සියුම්වූ මුවහත් ඇති මිටින් ගන්නා ලද කඩුද දැක මරණය පැමිණි කල්හි ඒ භයෙහි බොහෝවූ උතුම්වූම සතුටක් ලදිමි.

3. "සතුරන් දැක සතුටුවූ ඒ මම සතුරන් අභිභවනය කෙළෙමි. පළමුව මාගේ ජීවිතය හරණ ලද්දේ විය. එසේ මැයි ජීවිතයෙහි ආලය කරන්නාවූ සූරතෙමේ කිසිකලෙකත් ශූර කෘත්‍යය නොකරන්නේ මයයි."

**266. වාතග්ග සින්ධව ජාතකයః-** 1. "යම් කාරණයෙකින් කෘශවූයෙහි පාණ්ඩු වර්ණවූයෙහි වීද, යම් කාරණයෙකින් ආහාර රුචි නොකෙරේද? ඒ තී ප්‍රාර්ථනා කරණ මේ පිය තෙමේ ආයේය. දැන් කුමක් හෙයින් පලායන්නීද?

2. "පළමුවෙන්ම සන්ථවය නම් නොම හටගන්නේය. කුමක් හෙයින්ද යත්? ස්ත්‍රීන්ගේ ගර්විතයයි කියන ලද යශස පිරිහෙන්නේය. පුත්‍රය, එහෙයින් මම පලා ගියෙමි.

3. "යශස් ඇත්තාවූ ප්‍රශස්ත කුලයෙහි උපන්නාවූ, තමා ලඟට ආ පුරුෂයා යම් ස්ත්‍රියක් නොකැමති වේද? වාතග්ග නම් අශ්වයා නොකැමතිවූ කුණ්ඩලී නම් කොටළු ධෙනුව මෙන් බොහෝ කලක් ශොක කරන්නේයයි" කීයේය.

**267. කර්කකට ජාතකයః-** 1. "දිගඇස් හා නෙත්‍ර ඇත්තාවූ කටුවම සමකොට ඇත්තාවූ ජලයෙහි සයනය කරන්නාවූ රෝම

නැති නළ ඇතිහෙයින් ශෘංග මෘගනම් දිග ඇස් ඇති කකුළුවෙකි ඔහු විසින් මඩනා ලද්දේ බැගෑ පත්වූ මම හඬමි තීගේ ප්‍රාණය හා සමවූ මා හැරපියා නොයව.

2. "හැට අවුරුද්දෙන් මද බස්නා හෙයින් සට්ඨී හා මූන නම්වූ පොළොව දිරවන හෙයින් කුඤ්ජර නම්වූ ස්වාමිය ව්‍යසනයට පැමිණි ඔබ නොහරින්නෙමි. කුමක් හෙයින්ද යත්? සතර දිග මුහුද හිම් කොට ඇති පොළොවෙහි ඔබ මාගේ ඉතා ප්‍රියතැනැත්තා වෙහිය.

3. "සමුද්‍රයෙහිද ගංගානම් ගඟෙහිද යමුනා නම් නදියෙහිද යම් කකුළු කෙනක් ඇද්ද, ඔවුන්ට දියෙහි උපන්නාවූ ඔබ ශ්‍රෙෂ්ඨයෙහිය. හඬන්නාවූ මාගේ ස්වාමිවූ ඇත් රජු මුදා පියවයි" කීය.

**268. ආරාම දූසක ජාතකයඃ-** 1. "යමෙක් ඒකාන්තයෙන් සියලු රැස්වූවන් අතුරෙන් ශ්‍රෙෂ්ඨයයි ප්‍රසිද්ධවූයේ වීද ඔහුගේද මේ ප්‍රඥාතොමෝ මෙබඳුවී. අන්‍යවූ ලාමකවූ ප්‍රජා තොමෝ කෙබඳුවීද,

2. "බමුණ, නුඹ කාරණා කාරණා නොදැන මෙසේ නින්දා කෙරෙහි බිම බැස පිහිටියාවූ මුල නොදැක ගස කෙසේ නම් දැන ගන්නේද?

3. "මම තොපටද වනයෙහි යම් අනික් වානර කෙනෙක් ඇත්නම් ඔවුන්ටද නින්දා නොකරමි. යළි එකෙක් ඇත යමෙකු සඳහා තොප වැන්නෝ ආරාම රෝපක ධුරයෙහි සිටියාහුද, ඒ විශ්වසේන නම් රජම නින්දා කටයුත්තේයයි' කීයේය.

**269. සුජාත ජාතකයඃ-** 1. "වර්ණයෙන් යුක්තවූ ශබ්දයෙන් මිහිරිවූ ප්‍රිය දර්ශන ඇත්තාවූ යමක්හු රළු වචන ඇත්තාහුද, ඔව්හු මෙලොවද පරලොවද සියල්ලන්ට නොම ප්‍රිය වෙත්.

2. "තෘෂ්ණාවූ දුර්වර්ණවූ තල කැළලින් යුක්තවූ මේ කෝකිලාව දක්නෙහි වේද, ඒ කෝකිළයා පවා මියුරුකොට බිණීමෙන් බොහෝවූ ප්‍රාණීන්ට ප්‍රිය වූයේය.

3. "එහෙයින් සිළුටු වචන ඇත්තෙක් වන්නේය. ප්‍රමාණවත් කථා ඇත්තෙක් වන්නේය. උඩඟු නොව කථා කරන්නෙක් වන්නේය. යමෙක් අර්ථයද ධර්මයද දක්වා කථා කෙරේද ඔහුගේ භාෂිතය මධුරයයි" කීයේය.

**270. උළූක ජාතකයඃ-** 1. "සියලු නෑයන් විසින් කෝසිකයා රජ කරණ ලදී. ඉදින් නෑයන් විසින් අනුදන්නා ලද්දේ නම් කියයුතු එක බසක් කියන්නෙමි.

2. "යහළුව අප විසින් අනුදන්නා ලද්දෙහි හුදෙක් කාරණයද ප්‍රවෙණි ධර්මයද කියව. එසේ මැයි නුවණැත්තාවූ ප්‍රඥා නැමැති ආලෝක දරන්නාවූ තරුණවූ පක්ෂීහු ඇත්තාහුමය.

3. "තොපට යහපතක් වේවා, බකමූණාට අභිෂෙක කිරීමට මට රුචි නොවෙයි. කුමක් හෙයින්ද යත්? නො කිපුනවූවහුගේ මුහුණ බලව. කිපි තැනැත්තේ කෙසේ කරන්නේදෝයි" කීයේය.

---

## 3 අරක්ඛද වර්ගය.

**271. උදපාන දූසක ජාතකයඃ-** 1. "වනයෙහි වසන්නාවූ බොහෝ කලක් රක්ෂා කළ තපස් ඇත්තාවූ ඍෂීහුගේ දුකින් සෑරුවාවූ ලිඳ, යහළුව, කෙසේ දූෂ්‍ය කෙළෙහිද?

2. "යම් තැනෙක්හි ජලය පානය කොට මළ මුත්‍ර කිරීමෙන් කිළුටු කරම්ද, සිවලුන්ගේ මෙතෙම ප්‍රවේණි ධර්මයවේ. එහෙයින් අප පිය මුතුන් සතු ස්වභාවයවේ. ඒ ස්වභාවයට කිපෙන්නට නුසුදුස්සෙහිය.

3. යම් බඳුවූ තොපගේ ධර්මය මෙබඳු නම් අධර්මය වනාහි කෙබඳුද? එසේ හෙයින් තොපගේ ධර්මය හෝ අධර්මය හෝ කිසි කලෙක්හි නොදකුම්හයි" කීයේය.

**272. ව්‍යග්ඝ ජාතකයඃ-** 1. යම්බඳුවූ පාප මිත්‍රයෙකු හා සමග කළ ආශ්‍රය හේතුකොට ගෙන කාය චිත්ත දෙදෙනාගේ සුඛභාවයයි කියන ලද නිවනෙන් පුරුෂයා පිරිහෙන්නේද? ඒ

පාපමිත්‍රයා විසින් මැඩපැවැත්ම පළමු කොටම පණ්ඩිතතෙම ස්වකීයවූ ඇස් දෙක මෙන් රක්ෂා කරන්නේය.

2. "යම්බඳුවූ කල්‍යාණ මිත්‍රයකු හා සමග කළ ආශ්‍රය හේතුකොටගෙන කායචිත්ත දෙදෙනාගේ සුබභාව වැඩේද නුවණැති පුරුෂතෙම ඔහුගේ සියලු කටයුත්තෙහි තමා හා සමවූ පැවැත්ම කරන්නේය.

2. ව්‍යාඝ්‍රයෙනි, එවු, නවතිවු, මේ මහා වනයට නැවත එළෙඹෙවූ ව්‍යාඝ්‍රයන් රහිතවූ වනය නොකපත්වා, ව්‍යාඝ්‍රයෝ වන නැත්තාහු නොවෙත්වා."

**273. කච්ඡප ජාතකය**:- 1. "පුරවන ලද බත් පාත්‍රයක් ගත්තෙකු මෙන් කවරෙක්ද? පිරුණාවූ අත් ඇති බ්‍රාහ්මණයෙකු මෙන් කවරෙක්ද? කවර ප්‍රදෙශයෙක්හි පිඬු පිණිස හැසුරුනෙහිද, කවර නම් ශ්‍රද්ධාවන්තයෙකු වෙත පැමිණියේද?"

2. "මම නුවණ නැත්තාවූ වඳුරෙක්වීමි. ස්පර්ශ නොකළ යුතු තැන් ස්පර්ශ කෙළෙමි. ඔබට යහපතක් වේවා, නුඹ මා මුදනු මැනව. මෙයින් මිදුනේ පර්වතයට යන්නෙමි.

3. "ඉදිබුවෝ නම් කාශ්‍යප ගොත්‍ර ඇත්තෝ වෙත්. වඳුරෝ නම් කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි වූවෝ වෙත්. කාශ්‍යපය, කොණ්ඩඤ්ඤයා මුදව, කාශ්‍යප ගොත්‍රයෙහි උපන් තා හා සමග නොසමවූ කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන් ලොල්වූ මොහු මෛථුන කෘත්‍යයක් කරණ ලදී. එහෙයින් හැරපියවයි කීයේය."

**274. ලොල ජාතකය**:- 1. "සිඛා ඇත්තාවූ චෞරවූ මෙඝයා මුත්තනුවන් කොට ඇති මේ කෙකිණි කවරක්ද? පින්වත් කෙකින්න, මෑතට එව, මාගේ අර පැසෙහි හෝනා කවුඩෙක්වූ යහළුවා චණ්ඩවේ."

2. "මම කුඩිම්බිය ඇත්තාවූ කෙකින්නක් නොවෙමි. මම ලොල්වූ කවුඩෙක්මි. තොපගේ වචනය නොකොට පියාපත් උදුරන ලද්දේ වෙමි. ගොචර භූමියෙහි සිට ආයෙහි මා බලවයි" කීයේය.

3. "යහළුව, නැවතද මෙබඳු දුකට පැමිණෙන්නෙහිද තාගේ ආචාර ශීලය වනාහි එබඳුය. මනුෂ්‍ය ලෝකයෙහිවූ භොගයෝ පක්ෂියා විසින් සුවසේ අනුභව කටයුත්තෝ නොවෙත්යයි" කීයේය.

**275. රුචිර ජාතකය:-** 1. "සිත්කලුවූ මේ කෙකින්න කවඩු කැදැල්ලෙහි හිඳී ඕ කවරක්ද? මාගේ යහළුවූ කවුඩු තෙමේ චණ්ඩය ඔහුගේ මේ නිවාසයවේ.

2. "යහළු ද්විජය, සාමාක නම් ඇ තෘණ බීජ භොජන කොට ඇත්තියක මා හඳුනන්නෙහිද? තොපගේ අවිවාද වචනය නොකොට පියාපත් සිඳුනා ලද්දේ වීමි. ගොචර භූමියෙන් ආයෙහි බලව."

3. "යහළුව, නැවතද දුකට පැමිණෙන්නෙහි තාගේ ශීලය වනාහි එබඳුය. මනුෂ්‍ය ලෝකයෙහි වූ භොගයෝ පක්ෂියෙකු විසින් අනුභව කටයුත්තෝ නොම වෙත්යයි" කීයේය.

**276. කුරුධර්ම ජාතකය:-** 1. "ජනප්‍රධානය, ඔබගේ ශ්‍රද්ධාවද, ශීලයද, වර්ණයද නොහොත් ගුණයද දැන අඤ්ජන වර්ණවූ තොපගේ හස්තිරාජයා කරණකොටගෙන කළිඟුරට රජු සමීපයෙහි, රජ්ජුරුවෙනි, තොපට ඇතු ගෙණ එම්හයි" ධන ධාන්‍යයෙන් පරිවර්තනය කෙළෙමු.

2. "අනුන් නිසා ආහාරාදීන් ජීවත්වන්නාහුද, අනුන් නිසා වැස තමාට කැමතිසේ හැසිරෙන ජීවිත ඇත්තාහුද යන මොවුන්ගෙන් යමෙක් මේ ලෝකයෙහි යමෙකු උදෙසායේද, මේ සියල්ලෝ ප්‍රතික්ෂේප නොකටයුත්තෝවෙති. මේ පූර්වාචාර්යයන්ගේ වචනයයි."

3. "බමුණනි, තොපට රජුන්ට සුදුසුවූ රජුන් විසින් පරිභොග කටයුතුවූ යසස් ඇත්තාවූ අලංකෘතවූ රන් දැලින් මුවහකරණලද හස්ත්‍යාචාරීන් සහිතවූ මේ ඇත් රජහු දෙමි. කැමති මගකින් ගෙණයවුයයි" කීයේය.

**277. රොමක ජාතකය:-** 1. "රෝමකය, ගල්ගුහාවෙහි මඳක් අධිකවූ පනස් අවුරුද්දක් විමසූම්හ. පෙර සැක නොකරන්නාවූ

සන්හුන් චිත්ත සන්තාන ඇති පක්ෂීහු මාගේ අත් පසට එන්නාහුයයි.

2. "වකුවූ බෙල්ලක් ඇතිහෙයින් වක්කවග නම් තැනැත්ත පෙර විශ්වාසවූ පක්ෂීහු දැන් කුමක් සඳහා අන් පර්වතයකින් කඳුරැළියකට යෙත්ද, යම්සේ පෙරවූවාහුද, එසේම මා නොසිතතියි" සිතමි.

2. "බොහෝ කලක් වෙන්ව විසූ හෙයින් නොහඳුනද්ද? නොහොත් මොවුහු ඒ අප අඳුනන පක්ෂීහු නොවෙත්දැයි නොයෙක් ලෙස කියා වසඟ කරන්නට යත්න කෙරේ."

3. "ආජීවකය, තා දනිමු. අපි මුළාවූවාහු නොවෙමු. තෝ ඒ තාපසයාමය. අපි ඔහුමය, අන්‍යයෝ නොවම්හ. තාගේ සිතද, මේ පක්ෂි ජනයා කෙරෙහි වෙනස්වූයේය. එසේ හෙයින් තට භයවෙමු."

278. **මහිස ජාතකයා:-** 1. "සැහැල්ලුවූ හිතේ පැවැත්ම ඇති මිත්‍රද්‍රෝහියාගේ මේ දුක සියලු කැමති අර්ථයන් දෙන්නහු මෙන් කවර කාරණයක් සඳහා ඉවසන්නෙහිද,

2. "මොහු අඟින් ඇන විනාශකරව. පයින්ද මැඬලව. වළකන්නෙක්ද නොවූයේ නම් අඥානයෝ බොහෝසේ කිපෙන්නාහුය.

3. "මෙතෙම මට මෙන් හඟින්නේ සෙස්සහුටද මෙසේ කරන්නේය. ඔහු එතැන්හි ලා ඒ වඳුරා විනාශ කරත්. මට ඒ පාපයෙන් මිදීම වන්නේයයි" කීයේය.

279. **සතපත්ත ජාතකයා:-** 1. "යම්සේ මාර්ගයෙහි මානවකතෙම වනයම ගොචරකොට ඇති වැඩකැමතිව කියන්නාවූ සිවල්දෙන අවැඩ කැමැත්තීයයි සිතාද? අවැඩ කැමති සතපත්‍රයා හෙවත් කෑරලා වැඩ කැමැත්තේයයි සිතාද?

2. "එපරිද්දෙන්ම මෙහි සමහර පුද්ගලයෙක් එබඳුවේ. වැඩකැමැත්තවුන් විසින් වචනයක් කියනලද්දේ විරුද්ධ වශයෙන් පිළිගණී.

3. "යම්කෙනෙක් වනාහි ඔහු භයින් ප්‍රශංසාකෙරෙත්ද? උසස් කෙරෙත්ද? ඔහු වනාහී හෙතෙම මිත්‍රයයි සිතයි. කවරෙක් මෙන්දයත් කෑරලාට මානවකයා මෙනි."

**280. පුටදූෂක ජාතකය:-** 1. "ඒකාන්තයෙන්ම මෘග රාජතෙම මල් මුළු කිරීමට දක්ෂයයි සිතමි. ඒ එසේමැයි උඩින් හෙලු හෙලූ මුල කඩාබිඳ දමයි. අනික් මුලක් ඒකාන්තයෙන් කරන්නේය.

2. "මාගේ පියා හෝ මව හෝ මල් මුළුකිරීමට දක්ෂ නොවෙත්. කළ කළ දේ වනාහි කඩාබිඳ දැමීමු. එසේමැයි, මේ වානර කුලය මෙබඳු ස්වභාව ඇත්තේය.

3. "යම්බඳුවූ තොපගේ ධර්මයතෙම මෙබඳු වේනම් අධර්මය වනාහි කෙබඳුද? තොපගේ ධර්මය හෝ අධර්මය හෝ කිසිකලෙක්හි නොදකුම්හයි" කීයේය.

---

## 4 අබ්භන්තර වර්ගය.

**281. අබ්භන්තර ජාතකය:-** 1. "යම් අඹ ගසක්හුගේ ඵලය දෙවියන් විසින් අනුභවයට සුදුසුද, ඒ අබ්භන්තර නම් අඹ ගසෙහි අඹ අනුභවකොට පහවූ දොළ ඇත්තාවූ ස්ත්‍රි තොමෝ චක්‍රවර්තියක්හු වදයි.

2. "සොඳුර, තීද අගබිසෝවෙහි ඕ තොමෝද, ස්වාමියාහට ප්‍රියවූවාය. තිට රජතෙම මේ අබ්භන්තර නම්වූ අඹ ගසෙහි ඵලය ගෙන්වන්නේයි.

3. "ස්වාමීහට වැඩ පිණිස වීර්ය කරන්නාවූ කාය ජීවිතයෙහි අපෙක්ෂා නැත්තාහු ශූරවූ පුරුෂතෙම යම්බඳුවූ සුඛ කාරණයට පැමිණේද? මමද එය ලබන්නෙක් වෙමි."

**282. සෙයාංස ජාතකය:-** 1. "කුශල ධර්මයෙන් යුක්තවූ යම් පුද්ගලයෙක් උතුම්වූ ධර්ම හෝ ඒ ධර්මයෙන් යුක්තවූ පුද්ගලයා හෝ සෙවනය කෙරේද, හෙතෙම ඉතා උතුම්

වන්නේය. එසේමැයි. එකෙකු හා සමග මෛත්‍රී භාවනාව කොට වධයට සුදුසුවූ සියයක් පමණ තොප මරණින් මිදුවෙමි.

2. "සියලු ලෝකයා හා සමග එකතුව මෛත්‍රී භාවනා කොට කුමක් හෙයින් පරලොව ස්වර්ගයට නොයන්නේද, කශීරට වැසියනි, මේ වචනය අසවු.

3. "කංස නම්වූ බරණැස නිවාස ගෘහ ඇති මහරජතෙම මේ වචනය කියා දුන්නද හියවුරද බහා තබා ශීල සංයමයට පැමිණියේයයි" කීයේය.

**283. වඩ්ඪකී ශූකර ජාතකය**:- 1. "පෙර මේ පෙදෙසෙහි හැසිරෙන්නේ ඌරන් මෙල්ලකොට උතුම් උතුම් ඌරන් මරන්නාවූ තෝ දැන් තනිවූයේ ඉවත්ව සිතන්නෙහිය. ව්‍යාඝ්‍රය, තාගේ බලය අද නැත්තේද?"

2. "මේ ඌරෝ පෙර භයින් පීඩිත වූවාහු රක්ෂාස්ථාන සොයන්නාහු වෙන වෙන දිසාවෙන් දිසාවට යති. දැන් එක තැනට එකතුව නාද කෙරෙත්. යම් තැනෙක්හි සිටියාවූ මොහු අද මා විසින් නොමැඩිය හැක්කාහුයි,

3. "රැස්වූ ශූකර සමූහයන්ට නමස්කාර වේවා. පෙර නොවූ මිත්‍රභාවයක් තෙමේ දැක කියමි. යම් තැනෙක්හි දළ ඇත්තාවූ මෘග සංඛ්‍යාත වූ ඌරෝ ව්‍යාඝ්‍රයා දිනුවාහුද, දළ බලකොට ඇත්තාවූ ඌරන් අතුරෙහි සමගිය හේතුකොට ගෙන සතුරා මැඩ මරණින් මිදුනාහුය."

**284. සිරි ජාතකය**:- 1. "හස්තිශිල්පාදී උගත් ශිල්ප ඇත්තාවූද, ශිල්ප නැත්තාවූද, උත්සාහ ඇත්තාවූ සිත් නැති ජනයෝ බොහෝවූ යම් වස්තුවක් රැස්කෙරෙත්ද, ඒ වස්තූන් පිනැත්තෙක්ම අනුභව කෙරේ.

2. "සෑමතන්හිම කළ පින් ඇත්තාහට අන්‍යවූ ප්‍රාණීන් මැඩපවත්වා ආයතන නොවූ තන්හිද බොහෝවූ සම්පත් වනාහි උපදිත්.

3. "ලාමක නොවූ කළ පින් ඇත්තාවූ සත්වයාහට ශ්‍රීමත් වූ කුකුළෝද, මාණික්‍යයෝද ශ්‍රීමත්වූ ආරක්ෂා යෂ්ටියද කරණලද

පින් ඇති ස්ත්‍රී ලක්ෂණයෙන් යුක්තවූ ස්ත්‍රීහුද උපදිත් යයි” කීයේය.

**285. මණිශූකර ජාතකයඃ-** 1. “සත් හවුරුද්දක් මැණික් ගුහායෙහි තිසක් පමණ දෙන විසුවෙමු. මාණික්‍යයා ගේ ශොභාව නසම්හයි අප විසින් මන්ත්‍රණය කරණ ලද්දේ විය.

2. “මැණික යම් යම්තාක් යමක්උලා ශුද්ධකරමුද, වැඩි වැඩියෙන් බබලයි. බමුණ, නුඹ විචාරමු මේ කාරණයෙහි කටයුත්ත කුමකැයි සිතන්නෙහිද?”

3. “මේ මැණික වෛදූර්ය ජාතිය වෙයි. කර්කෂ නොවේ. නිර්මලය. සුභය, එහෙයින් මේ මාණික්‍යරත්නයාගේ සොභාව නසන්නට නොපිළිවන. ශූකරයිනි බැහැරයවු යයි” කීය.

**286. සාලුක ජාතකයඃ-** 1. “සාලුක නම් ශූකරයාගේ ස්වභාවය. කැමතිනොවෙව, හෙතෙම මරණයට කරුණුවූ ආහාරයන් අනුභව කරයි. එහි නිරුත්සාහ වූයේ බොල් මිශ්‍රවූ රොඩු අනුභව කරව. මෙය දීර්ඝායුෂ ඇතිවීමට කරුණුවේ.

2. “දැන් ඒ විවාහයෙන් යුක්ත පුරුෂයා සේවකයන් හා යුක්තවූයේ අමුත්තෙක්ව මෙහි පැමිණ සිටීද, එකල්හි මොහොලකට බඳු උඩුතොල ඇති මරණ පිණිස හෝනාවූ සාලුක නම් ශූකරයා දක්නෙහිය.

3. “මොහොලටබඳු උඩුතොල ඇති කපනලදුව හෝනාවූ හූරා දැක ගොන්නු අපගේ බොල් මිශ්‍රවූ රොඩු ආහාරයම උතුම්යයි” සිතූහ.

**287 ලාභගරු ජාතකයඃ-** 1. “උමතු නුවූයේ කේලාම් නොකියන්නේ නෘත්‍ය නොකරන්නේ කලබල නැත්තෝ අඥානයන් කෙරෙහි ලාභය නොලබයි. තට මෝතොමෝ අපගේ ලාභානුශාසනායි.

2. “බමුණ, යශස් ලැබීමටද, ධනය ලැබීමටද, තම විනාශවන පරිද්දෙන් හෝ අධර්මයෙහි හැසිරීමෙන් හෝ සම්භවන යම් වෘත්තියක් ඇද්ද, එයට නින්දා වේවා.

3. "ඉදින් පාත්‍රයකුදු ගෙණ ගෘහ නැත්තේ පැවිදිව හැසිරෙන්නේද, අධර්මයෙන් යම් ජීවිකාවෘත්ති සෙවීමකුත් ඇද්ද, ඊට වඩා මේ භික්ෂාවෙන් වන දිවි පැවැත්වීමම උතුම්වේ."

**288 මච්ඡුද්දාන ජාතකයः-** 1. "මත්සායෝ දහසකට වඩා අගිත්යයි යමෙක් මේ කාරණය අදහන්නේද, එසේ වූවෙක් නැත. මාගේද මෙහිලා මසුරන් සතක් වූහ. මමද ඒ මස්වැල මසුරන් සතක්දී ගත්තෙමි.

2. "මත්සායන්ට ආහාරයදී මට පින් අනුමෝදන් කෙළේය. තා විසින් අනුමෝදන් කරණලද ඒ පින සිහිකරන්නාවූ මා විසින් තාගේ ධනය රක්නාලදී.

2. "කිපුනු සිත් ඇත්තාහට මෙලොවද, පරලොවද අභිවෘද්ධිය නොවේ. නරක වැඩ කරන්නාවූ යමෙක් පියා සතුවූ සම්පත්තිය සහෝදරයාට වඤ්චා කෙළේද, ඔහු දෙවතාවෝ නොම පුදත් යයි කීයේය."

**289 නානාච්ඡන්ද ජාතකයः-** 1. "මහරජ, වෙන වෙන අදහස් ඇත්තෝ වූ අපි එක ගෙයි වසමු. එහෙයින් මම ගම්වරයක් කැමැතිවෙමි. බැමිණිද, ගවයන් සියයක් කැමැත්තීය.

2. "මාගේ පුත්‍රවූ ඡත්‍ර නම් මානවකයා ආජානීය අශ්ව රථයක් කැමැත්තේය. මාගේ යෙහෙළිද මාණිකාය කුණ්ඩලාභරණයක් කැමැත්තීය. හීනවූ යම් මේ පූර්ණකා නම් දාසියක් ඇද්ද, ඕතොමෝ කුල්ල මෝල හා සමග වංගෙඩියක් කැමතිවේ.

3. "බ්‍රාහ්මණයාහට ගම්වරයක්ද බැමිණියට ගවයන් සියයක්ද ඡත්‍ර නම් බ්‍රාහ්මණ පුත්‍රයාහට ආජානීය අසුන් යෙදූ රථයක්ද යෙහෙළිවූ කන්‍යාවට මිණි කොඩොලක්ද, යම් පූර්ණිකා නම් ලාමකවූ දාශියක් ඇද්ද, ඈයට වංගෙඩියක් හා මොහොළක්ද පිළියෙල කොට දෙව්යයි" කීයේය.

**290 ශීල විමංසන ජාතකයः-** 1. "ආචාර ශීලයම යහපත් වේමැයි, ලෝකයෙහි ශීලය, නිරුත්තරය, බලව, දරුණු විෂ ඇති, නාගතෙමේ සිල්වත්යයි නොනසනු ලැබේ.

2. "සිල්වත්වූ පුරුෂතෙම යම් ශීලයකින් බුද්ධාදීවූ ආර්යයන්ගේ ප්‍රතිපත්තියෙහි හැසිරේයයි කියනු ලැබේද, ලෝකයෙහි යහපතකැයි දන්නා ලදද, එසේවූ ශීලය, ඒ මම සමාදන් වෙමි.

3. "සිල්වත් තෙමේ නෑයන්ටද පියවූයේ වෙයි. මිත්‍රයන් කෙරෙහිද බබළයි. ශරීරයාගේ බිඳීමෙන් මත්තෙහි සුගතියෙහි උපදීයයි" කීයේය.

---

## 5. කුම්භ වර්ගය

**291 භද්‍රඝට ජාතකය:** 1. "සියලු කැමති වස්තූන් දීමට සමර්ථවූ කුම්භ නම්වූ කළය ලදින් ඒ ධූර්තකයා යම්තාක් ඒ කළය රක්ෂා කෙරේද, ඒතාක් කල් හෙතෙම සැපය වඩන්නේය.

2. "යම් කලෙක්හි සුරාවෙන් මත්වූයේද, ආඩම්බර වූයේ එකල්හි ප්‍රමාදයෙන් කළය බිඳුනේය. ඉක්බිත්තෙන් නග්න වූද එකතු කොටගත් රෙදි කැබලි මසා හැන්දාවූද, අඥානතෙම පසුව වැනසේද,

3. "එපරිද්දෙන්ම යම් පුරුෂයෙක් වස්තුව ලබා පමණ නොදන්නේ අනුභව කෙරේද, ඒ නුවණ නැත්තේ භද්‍රඝටය බිඳිනා ලද ධූර්තකයා මෙන් පසුව තැවේයයි" කීයේය.

**292 සුපත්ත ජාතකය:-** 1 "මහරජ, බාරාණසියෙහි නිබඳව වසන්නාවූ අසූ දහසක් පමණ කවුඩන්ගෙන් පිරිවැරූ සුපත්ත නම් කවුඩු රජෙක් ඇත.

2. "ඔහුගේ දෙළදුක් ඇත්තාවූ සුපස්සා නම් භාර්යාව රජ්ජුරුවන්ගේ මුළුතැන් ගෙයි පිසූ වෙන වෙන මාහැඟිවූ රාජ භොජනය අනුභව කරන්ට කැමති වේ.

3. "ඔවුන්ගේ මම දූතයෙක්මි. රජු විසින්ද මෙහෙයන ලද්දේ මෙහි ආවෙමියි. මාගේ ස්වාමියාට සත්කාර කෙරෙමි. එසේහෙයින් භත්ත කාරකයාගේ නාසිකාවෙහි වණය කෙළෙමියි" කීයේය.

**293. කායවිච්ඡන්ද ජාතකයඃ-** 1. "එක්තරා පාණ්ඩු රෝග නම්වූ ව්‍යාධියකින් දැඩිකොට පහරණ ලද දුක්ඛිතවූ පෙළෙන්නාවූ මාගේ මේ ශරීරය අව්වෙහි වූ හුණු වැල්ලෙහි තබන ලද මලක් මෙන් වියළෙන්නේය.

2. "පවිත්‍ර නොවූ මේ ශරීරය පවිත්‍ර යයි, අඥානයන් විසින් කියන ලදී. යහපත් නොවූ මේ ශරීරය යහපත්යයි සම්මතය. කේශාදී නොයෙක් කුණපයන්ගෙන් සම්පූර්ණවූ මේ ශරීරය නුවණින් නොබලන්නාහට පවිත්‍ර ස්වරූපයෙන් වැටහේ.

3. "යම් ශරීරයෙක්හි ක්ලෙශ මූර්ච්ඡාවෙන් ඉතා මුසපත්වූ සත්වයෝ සුගතියෙහි ඉපදීමට මාර්ගය පිරිහෙළත්ද, එසේවූ ආතුරවූ පිළිකුල් කටයුතුවූ අපවිත්‍රවූ ව්‍යාධිය ස්වභාව කොට ඇත්තාවූ මේ කුණු ශරීරයට නින්දා වේවායි" කීයේය.

**294 ජම්බුඛාදක ජාතකයඃ-** 1. "නොවිසිර පවත්නා ස්වරයෙන් යුක්තවූ මනොඥවූ ශබ්ද ඇති ශබ්ද පවත්වන්නවුනගෙන් උතුම්වූයේ යම් ජම්බු ශාඛාවෙක්හි හුන්නේ මයුර පෝතකයකු මෙන් මේ කවරෙක් නම් නාද කෙරේද?

2. "කුලපුත්‍රයාට ප්‍රශංසා කරන්නට කුලපුත්‍රයෙක්ම දනී. ව්‍යාඝ්‍ර පොතකයෙකු හා සමාන වර්ණ ඇත්තාවූ නුඹ යහළුව, බඩ පිරෙන තුරු දඹගෙඩි අනුභව කරව, තට දෙමි."

3. "බොරු කියන්නාවූ එක්තැන්වූ ඔවුනොවුන් ප්‍රශංසා කරගන්නාවූ වමනය කළ ආහාරාදීන් කන්නාවූ කවුඩාද, කුණප අනුභව කරන්නාවූ හිවලාද යන දෙදෙනා ඒකාන්තයෙන් බොහෝ කලකින් දකුම්හයි" කීයේය.

**295 අන්තජාතකයඃ-** 1. "මෘගරාජය, නුඹගේ කඳ වෘෂභ රාජයෙකුගේ කඳක් මෙන් වටය. ඇඟසෙලවීම සිංහයෙකුගේ මෙනි. තට නමස්කාර වේවා. කිසිවකුත් අපි ලබමු.

2. "කුලපුත්‍රයෙකුට ප්‍රශංසා කරන්නට කුල පුත්‍රයෙක්ම දනී. මොණරෙකුට බඳු බෙල්ල ඇති කවුඩුව, මේ එරඬු ගසෙන් බැස මෙහි එව."

3. "මෘගයන් අතුරෙන් හිවලා ලාමකවේ. පක්ෂීන් අතුරෙන් වනාහි කවුඩා හීනයෙක. ගස් අතුරෙන් එරඬුගස හීනය. මේ හීනයෝ තුන්දෙනෙක් එක්වූවාහුයි" කීවේය.

**296 සමුද්ද ජාතකයඃ-** 1. "ලවණ ජලයෙහි හාත්පසින් දුවයි. මත්ස්‍යයන්ද, මෝරුන්ද, වළක්වයි, රැලෙහිද ගැටෙයි, මේ කවරෙක්ද?

2. "සාගර නම්වූ ගංගාවන්ට ස්වාමිවූ සමුද්‍රය බොන්නට කැමැත්තෙමි. එසේ හෙයින් අනන්තපායී නම්වූ පක්ෂියාවෙමි. පිරවිය නොහැක්කාවූ තෘෂ්ණාවෙන් යුක්ත හෙයින් අතෘප්තය කියා දිශාවන්හි ප්‍රසිද්ධ වූයේ වෙමි.

3. "ඒ මේ සාගරය තෙම දිය බස්නා වේලාවට බසී. වැඩෙන වේලාවට පිරේ. මේ සාගරයාගේ බීමෙන් අඩුවීමෙක් නොපෙනේ. එසේ හෙයින් සාගරය වනාහි බී අවසන් කරන්නට නුපුළුවන් වේයයි" කීයේය.

**297 කාමවිලාප ජාතකයඃ-** 1. "උස් තැන්හි යන්නාවූ පක්ෂිය, පක්ෂ පත්‍රයන් යාන කොට ඇත්තාවූ අහසෙහි ගමන් කරන්නාවූ පක්ෂිය, තෝ වනාහි කෙසෙල් කඳක් මෙන් මනොඥවූ කලවා ඇත්තියට මා හුල උන් බව කීයෙහි. ඕතොමෝ බොහෝ කලක් සිහි කෙරේ.

2. "කඩුවටද හුලටද, නගනලද්දේය. මේ වනාහි ඒ මාගේ ප්‍රියාව නොදනී. ඒ චණ්ඩ තැනැත්තී මා කෙරෙහි ක්‍රොධය කරන්නීය. ඇගේ ඒ කෝපය මා තවයි මෙහි මේ හුල ඇවිණී දුක මා නොතවයි.

3. "හිස සමීපයෙහි තබනලද මේ උත්පලයකට බඳු සන්නාහයද, රනින් කරණ ලද ඇඟිලි මුදුවද මෘදුවූ කශී රට වස්ත්‍ර යුග්මයද ඇත. වස්ත්‍ර කැමැත්තාවූ ඒ මාගේ ප්‍රියාව මෙයින් තෘප්තියට පැමිණේවායි' කීයේය.

**298 උදුම්බර ජාතකයඃ-** "පැසුණු ගෙඩි ඇති මොහු දිඹුල්ගස්ය, නුගගස්ය, ගිවුලුගස්ය, මෙහි එව, නික්ම තෝද අනුභව කරව. සාදුකින් කුමට මිය යන්නෙහිද?

2. "යම්සේ මම අද ගස්වල ගෙඩි කෑයෙම් සුවපත්වීම්ද? එපරිද්දෙන් යමෙක් වෘද්ධයා පුදාද, හෙතෙම සුවපත්වේ.

3. "වනයෙහි උපන්නාවූ වඳුරා වනයෙහි උපන් වඳුරාගේ යම් වචනයක් වංචා කරන්නේද? එසේහෙයින් තා වැනිවූ ළදරු වඳුරෙක්ද, ඒ නොඅදහන්නේය. ජරාවෙන් ජීර්ණවූ මාවැනිවූ මහළු වඳුරෙක් නොඅදහන්නේයයි" කීයේය.

**299 කොමාය පුත්ත ජාතකය:-** 1. "කොල, වඳුර, පෙර තෝ ක්‍රීඩා ස්වභාව ඇත්තාවූ අපගේ සමීපයෙහි පැන පැන ක්‍රීඩා කෙළෙහි. අපගේ ආශ්‍රමයෙහි වැදිරි මුහුණු ආදී ක්‍රීඩාවන් කෙරෙහිය. වානරය, ක්‍රීඩා ස්වභාව ඇත්තාවූ තා කෙරෙහි අපි නොඇලෙමු."

2. "ආයුෂ්මත්නී, මා විසින් බහුශ්‍රැතවූ හෙවත් බොහෝ උගත්වූ කෝමාය පුත්‍රයාගේ උතුම්වූ ධ්‍යාන විශුද්ධි තොමෝ අසන ලද්දීමය. එසේහෙයින් තෝ දැන් මා පෙර මෙන් නොසිතව. ධ්‍යානයෙන් යුක්තවම වාසය කරමු.

3. "ඉදිනුදු ගලෙහි බිජුවට වපුරන්නාහුද, වර්ෂාවද මනාකොට වසින්නේද, ඒ බීජය වනාහි නොමහටගත්තේද, එපරිද්දෙන් ඔවුන්ගේ වනාහි උතුම් වූ විශුද්ධි තොමෝ අසන ලදී. වානරය, තෝ ධ්‍යාන භූමියට දුරවෙහියයි" කීයේය.

**300 වෘක ජාතකය:-** 1. "අනුන් දිවි නැසීමෙන් ජීවත් වන්නාවූ එසේ හෙයින් මස් හා ලෙය භොජන කොට ඇති වෘක තෙමේ ව්‍රතය සමාදන් වයේය. උපොසථයට පැමිණියේය.

2. "ශක්‍රතෙම ඔහුගේ ව්‍රතය දැන එළු රූපයෙන් සමීපයට පැමිණියේය. ඉක්බිති පහවූ තපස් ඇතිව පැමිණියේය. ලේ පානය කරන්නාවූ හෙතෙම තපස බිඳ ගත්තේ.

3. "එපරිද්දෙන්ම මේ ලෝකයේ දුර්වලයෝ හෙවත් සමාදන්වූ ගුණය රැකීමෙහි ශක්තිය නැත්තාවූ සමහරු එළුවා කරණකොට වෘකයා මෙන් තමාම සැහැල්ලු කෙරෙත්යයි" කීයේය.

**(තික නිපාතය නිමි.)**

---

# 4. චතුක්ක නිපාතය

## 31 කාලිංග වර්ගය

**301 චුල්ල කාලිංග ජාතකය:-** 1. "මොවුන්ට වාසල් දොර හරිව්. අරුණ නම් රජුගේ පුරුෂ සිංහවූ ගුරුවරයා විසින් මනාකොට උගන්වන ලද නන්දිසේන නම් මා විසින් මනාකොට රක්නා ලද මේ නුවරට ඇතුළු වෙත්වා.

2. "නොඉවසිය හැක්ක, ඉවසන්ට පුළුවන්වූ කළිඟුරට වැස්සන්ට ජයවේ, අශ්වක දෙසවාසීන්ට පරාජයයි ව්‍යසන යයි තා විසින් මෙසේ කියන ලදී. තපස්විය. ඍජුවූවාහු බොරු නොකියත්."

3. "ශක්‍රය, දෙවතාවෝ බොරුකීම ඉක්මවූවාය. ඒ දෙවියන් කෙරෙහි සත්‍යය උතුම් ධනයවේ. දිව්‍ය රාජවූ මඝවන්තු නම්වූ මහේන්ද්‍රය, ඔබ විසින් කුමක් පිණිස හෝ ඒ බොරුව කියන ලදද?"

4. "බමුණ, ඒ ඒ තන්හි කියනු ලබන කල්හි තා විසින් අසන ලද්දේ නොවේද? දෙවියෝ පුරුෂ පරාක්‍රමයට ඊර්ෂ්‍යා නොකෙරෙද්ද, ආත්ම දමනයද, චිත්තයාගේ සමාධියද, නොවෙනස් බවද, තවන්නට සුදුසුකාලයෙහි නොපසු බස්නා බවද, දෘඪවූ වීර්යයද, පුරුෂ පරාක්‍රමයද, ඒ අශ්වක නම් රජුගේ යෝධයන්ට වූහ. එසේ හෙයින් ඔවුන්ට ජය අත්වූයේයයි" කීයේය.

**302 මහා අශ්වාරෝහ ජාතකය:-** 1. "නොදිය යුත්තන් කෙරෙහි දානය දෙන්නේද දියයුත්තන් කෙරෙහි නොදෙන්නේද, එබඳු පුරුෂයා ආපදාවන්හි ව්‍යසනයට පැමිණියේ යහළුවෙකු නොලබයි.

2. "නොදියයුත්තන් කෙරෙහි දානය නොදෙන්නේද, යමෙක් දීමට සුදුස්සන් කෙරෙහි දේද, හෙතෙම විපත්වලදී ව්‍යසනයට පැමිණියේ ව්‍යසනයෙන් ගලවන්නට සුදුසු යහළුවෙකු ලබන්නේය.

3. "එසේමැයි අනාර්ය ස්වභාව ඇති කෛරාටිකයන් කෙරෙහි කරණ ලද, යම් එක්වීමක් ඇද්ද? යම් එක්ව කටයුතු කිරීමක් ඇද්ද, යම් විශෙෂ දර්ශනයක් ඇද්ද ඒ සියල්ලම දියේ ඇඳි ඉරක් මෙන් වහා නස්නේය. එබඳුවූ පිරිසිදුවූ පුද්ගලයන් කෙරෙහිද ඇදනැති මාර්ගයන්හිද කරණලද උපකාරය ස්වල්ප නමුත් මහත් ඵලවේ.

4. "යමෙක් පළමුව කරණලද යහපත ඇත්තේද, හෙතෙම ලෝකයෙහි කරන්ට දුෂ්කරවූවක් කෙළේය. පසුව උපකාර කරන්නේ හෝ නොකරන්නේ හෝ අතිශයින්ම පූජාවට සුදුස්සෙක් වේයයි" කීයේය.

**303 ඒකරාජ ජාතකය**:- 1. "ඒකරාජය නිරුත්තරවූ සමෘද්ධවූ පඤ්චකාම ගුණයන් අනුභවකොට පෙරවිසූයෙහිය. හේ නුඹ දැන් දුර්ගමවූ නරකයෙහි හෙවත් වළෙහි බහාලන ලද්දේ පැරණිවූ වර්ණය හා බලය නොහරින්නේය.

2. "දබ්බසේනය, මා විසින් පූර්වයෙහිම ක්ෂාන්තියද තපසද, ප්‍රාර්ථනා කරණ ලදී. රාජය, දැන් එය ලදින් මම පැරණිවූ වර්ණය හා බලය කෙසේනම් දුරුකරන්නෙම්ද?

3. "යසස් ඇත්තාවූ ප්‍රඥාවන්තය, නොඉවසිය හැකි දුක් ඉවසන තැනැත්ත, සියල්ලම මා විසින් පෙරම නිමවන ලදහ. පෙර නොවූ උදාරවූ යශසද ලදින් මෛත්‍රී ධ්‍යානය ලදින් පුරාතනවූ වර්ණය හා බලය දුරු නොකරන්නෙමි.

4. "නොඉවසිය හැකි දුක ඉවසන සුළුවූ ජනේන්ද්‍රය, දුකින් සැපය දුරුකොට සැපයෙන් හෝ දුක දුරුකොට සත්පුරුෂයෝ දෙතැන්හිම නිවුනාවූ සිත් ඇත්තාහ. සුවයෙහිද දුකෙහිද සමානවූවෝ වෙත්යයි" කීයේය.

**304 දද්දර ජාතකය**:- 1. "දද්දරය, මනුෂ්‍ය ලෝකයෙහි මැඩියන් කන්නේය, දිය කෙළවර සේවනය කරන්නේයයි, මේ නපුරුකොට කියනලද වචනයෝ විෂ ඇති මා තවත් ගමෙහි විෂ නැතිසේ කුඩා කොල්ලෝ ආක්‍රොෂ කෙරෙත්.

2. "ස්වකීයවූ රටින් නෙරපන ලද්දේ අනික් ජනපදයකට ගියේ නපුරුකොට කී වචනයන්ගේ නිධානය පිණිස මහත්වූ කොටුවක් කරන්නේයි.

3. "යම් තැනෙක්හි පුරුෂයා ජාතියෙන්ද, විනයයෙන්ද නොහඳුනත්ද, හෙතෙම තමාගේ තොරතුරු නොදන්නා ජනයා කෙරෙහි වන්නේ එහිදී මාන්නයක් නොකරන්නේයි.

4. "විදෙශයෙහි වාසය කරන්නාවූ නුවණැත්තාවූ ගින්න හා සමානවූවෙකු විසිනුදු දාසයෙකුගේද තර්ජනය ඉවසිය යුතුයයි" කීයේය.

**305 සීලවිමංස ජාතකයඃ-** 1. "පාප කර්මය කරන්නාහට ලෝකයෙහි රහසක් නම් නැත්තේය. කුමක් හෙයින්ද යත්, වන දෙවතාවෝ බලත් අඥානතෙම එය රහසකැයි සිතයි.

2. "මම පව් කිරීමට රහස් තැනක් නොදනිමි. මිනිසුන් නැතිතැනකුදු නැත්තේය. යම් තැනෙක්හි අනික් මිනිසුන් නැති තැනක් නොදකිම්ද එබඳුවූ ස්ථානය ජනශූන්‍ය නොවේයයි මා විසින් කියන ලදී.

3. "දුජ්ජච්ච නම් ශිෂ්‍යයාද අජච්ච නම් ශිෂ්‍යයාද නන්ද නම් ශිෂ්‍යයාද ශුබවච්ඡ නම් ශිෂ්‍යයාද වෙජ්ජ නම් ශිෂ්‍යයාද අද්ධුවශීල නම් ශිෂ්‍යයාද යන වැඩකැමති ඔව්හු ස්ත්‍රී ලැබීම නම්වූ ස්වභාවය අත්හැරියාහුය.

4. "ඔවුන් කෙරෙන් පිටත් ශීල සම්පන්න බ්‍රාහ්මණයා ඒ ස්ත්‍රී ප්‍රතිලාභය කෙසේ හරින්නේද, එසේමැයි, යමෙක් සියලු ධර්මයන්ගේ එතෙරට ගියේද, ධෛර්ය ඇත්තේද, සත්‍යවූ ධර්මයෙහි වීර්යයෙන් යුක්තද, හෙතෙම උතුම් ගුණ ධර්මය රක්ෂා කෙරේයයි" කීයේය.

**306 සුජාත ජාතකයඃ-** 1. "දෙවයෙනි, රන් තැටියෙහි බහාලන ලද රක්ත වර්ණවූ මනොඥවූ මොහු කිනම් බිජුවට වෙද්ද, හෙවත්, කිනම් ගෙඩිද, ඔවුන් මා විසින් විචාරණ ලද්දේ කියව."

2. "දේවිය, හිස මුඩුකොට කඩපිළිහඳනාවූ තී පෙර යම් එල කෙණෙකුන් ඔඩොක්කුවෙහි තබන ලද අත් ඇතිව කඩා රැස් කෙළෙහිද, එසේවූ තීගේ කුල සතුවූ ඩෙබර එලවේ.

3. "උසස්කොට දවන්නේය. මෙහි සිත් නොඇළෙයි. රාජ සම්පත්තීහු භාග්‍ය නැත්තාවූ අෑ දුරු කෙරෙත්. යම් තැනෙක්හි ඩෙබර කඩා එකතු කෙරේද, එහිම මෑ නැවත ගෙණ යව්."

4. "මහරජ, සමෘද්ධියට පැමිණියාවූ ස්ත්‍රියට මෙසේවූ මේ ප්‍රමාද දෝෂයෝ වෙත්මැයි දෙවයෙනි, ක්ෂමාවුව මැනව, රාජෝත්තමය මේ සුජාතාවට නොකිපෙවයි" කීයේය.

**307 පලාස ජාතකයඃ-** 1. "බමුණ සිත් නැත්තාවූ නොඅසන්නාවූ නොදන්නාවූ මේ කැල ගස අඳුනන්නේයි ඒකාන්තයෙන් පටන් ගන්නාලද වීර්‍ය ඇත්තේ අප්‍රමාදවූයේ නිදීම විචාරයි. ඊට හේතු කිම?"

2. "මේ ගස දූර දෙශයෙහි ප්‍රසිද්ධද, මහත්ද වේ. සමවූ භූමි ප්‍රදෙශයෙහි සිටියේය. දෙවියන්ට නිවාස ස්වභාව ඇත්තේය. එසේහෙයින් මේ කැල ගසද මේ ගසෙහි යම් මහේශාක්‍ය දෙවි කෙනෙක් වෙත්නම්, ඔවුන්ද, වස්තු ප්‍රතිලාභ හේතුවෙන් නමස්කාර කරමි."

3. "බමුණ, කෙලෙහි ගුණ දන්නාවූ හේ මම ඒ ගුණය බලන්නෙම් මාගේ ආනුභාවය පරිද්දෙන් තට උපකාර කරන්නෙමි. තාගේ පිසීම් හැමදීම් ආදී කායවාක් කර්මයෝ සත්පුරුෂයන්ගේ ඉදිරියෙහි කෙසේනම් හිස් වූවාහු වෙද්ද?"

4. "තිඹිරි වෘක්ෂයාගේ එපිට යම් පුලිල රුකෙක්වීද, ඒ පුලිල ගසේ මුල පිරිවරණ ලද පෙර කළ යාග ඇති, (හෙවත්) පෙරකළ යාග වශයෙන් නිපන් උඹගේ අනේක නිදන් සැළිද හිමියෙක් නැත්තාවූ මහත්වූ මේ නිධානය භූමියෙහි සාරා තැන්පත් කරණ ලදී. යව, ඒ නිධානය මතුකොට ගණුවයි" කීයේය.

**308 ජව සකුණ ජාතකයඃ-** 1. "මෘගරාජය, යම් අපගේ බලයෙක් වීද, ඒ බලයවූ පරිද්දෙන් තොපට කටයුතු කෙළෙමු. තොපට නමස්කාර වේවා කිසිවක් ලබමුද?"

2. "රෞද්‍රවූ ක්‍රියාවන් කරන්නාවූ අනුන්ගේ ලේ මස් කන්නාවූ මාගේ දත් අතරට ගියාවූම තෝ යම් හෙයකින් වනාහී ජීවත් වන්නෙහිද, එයම තට අධිකවේ.

3. "කළ ගුණ නොදන්නාවූ කිසි උපකාරයක් නොකරන්නාවූ උපකාර කළහුට ප්‍රත්‍යුපකාර නොකරන්නාවූ පුද්ගලයෙක්වේද, යම් පුද්ගලයෙකු කෙරෙහි කළගුණ දන්නා බවක් නැද්ද, එබඳු වූවහුගේ සේවණය කිරීම නිරර්ථකවේ.

4. "යමෙකුගේ අභිමුඛයෙහි කරණ ලද ගුණයෙන් මිත්‍ර ධර්මය නොලැබේද, ඔහුට ඊර්ෂ්‍යා නොකොට නොබැන සෙමින් ඔහු කෙරෙන් ඉවත්ව යන්නේයයි" කීයේය.

**309 ඡවක ජාතකයః-** 1. "මේ සියල්ල ලාමකය. යමෙකුත් මොහු හදාරවාද, යමෙක් වනාහී ධර්මය හදාරාද, මේ දෙදෙන පුරාතන ධර්මය නොබලත්. දෙදෙනාම ප්‍රකෘති ධර්මයෙන් චුතවූහ.

2. "පවිත්‍රවූ මාංශ රසයෙන් යුක්තවූ ඇල්සාලේ බත අනුභව කරමි. එහෙයින් බුද්ධාදීන් විසින් සේවණය කරණ ලද මේ ධර්මය සේවනය නොකෙළෙමි.

3. "මෙයින් අන් තැනකට යව, ලෝකය මහත්වේ. සෙසු සත්වයෝද පිසත්. හැසිරෙන ලද මේ අධර්මය. නුඹ ගලෙන් කළයක් බිඳින්නාක් මෙන් නොබිඳීවා.

4. "බමුණ ඒ යසස් ලාභයටද, වස්තු ලාභයටද, අපායෙහි වැටෙන පරිද්දෙන් හෝ අධර්මචර්යාවෙන් හෝ යම් පැවැත්මක් ඇද්ද, එයට නින්දාවේවායි" කීයේය.

**310 සය්හ ජාතකයః-** 1. "සමුද්‍රය පිරිවරා සිටි චක්‍රවාට පර්වතය හා සමග සාගරයට කුණ්ඩලාභරණයක් වැනිවූ මහ පොළොව නින්දා සහිතව නොකැමැත්තෙමි. සය්හය, මෙසේ දැනගනුව."

2. "බමුණ, යසස් ලැබීමටද වස්තු ලැබීමටද අපායෙහි වැටෙන පරිද්දෙන් අධර්මයෙහි හැසිරීමෙන් හෝ යම් පැවැත්මක් වේ නම් එයටද නින්දා වේවා.

3. "ඉදින් පාත්‍රයක් ගෙණ ගෘහ රහිතවූයේම, සිඟා ඇවිදිනෙම්ද, අධර්මයෙන් යම්බඳු සෙවීමක් ඇද්ද, මට වඩා ඒ සිඟා ඇවිදීමෙන් වන ජීවිකාවම උතුම් වේ.

4. "ලෝකයෙහි අනිකෙකු නොවෙහෙසමින් ඉදින් පාත්‍රයක් ගෙණ ගෙවල් නැත්තේම සිඟා ඇවිදින්නෙම් නම් එය රාජ්‍යයටත් වඩා උතුම් යයි" කීයේය.

311 **පුචිමන්ද ජාතකයः-** 1. "චෞරය, නැගිටුව, කුමකට වැද හෝනෙහිද? තට වැද හෙවීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද? ගමෙහි දරුණුකම් කළාවූ තා රජදරුවෝ අල්වා නොගණිත්වා.

2. "ගමෙහි වරද කළාවූ සොරු ගන්නාහුය යන යමක් ඇද්ද, වනයෙහි හටගෙන සිටියාවූ කොසඹ ගසට එහිලා කුමක් වේද?

3. "අස්වත්ථය මාගේද, සොරුගේද, අතර නුඹ නොදන්නෙහිය ගමෙහි වරද කළාවූ සොරු රජදරුවෝ ගෙණ කොසඹ හුලෙහි හිඳුවත්. මාගේ සිත ඒ කාරණයෙහි සැක කෙරේ.

4. "සැක කටයුත්තන් සැක කරන්නේය නොපැමිණියාවූ භය රකින්නේය. නොපැමිණියාවූ බිය හේතු කොට ගෙන ප්‍රාඥතෙම මෙලෝ පරලෝ දෙක බලන්නේ යයි" කීයේය.

312 **කස්සප මන්දිය ජාතකයः-** 1. "කාශ්‍යපය, ළදරු බැවින් තරුණයා ආක්‍රොශ කරයි. පහරදීම හෝ කෙරෙයි. ප්‍රාඥතෙමේ ඒ සියල්ලම ඉවසයි. පණ්ඩිතතෙම එය සමාකෙරේ.

2. "ඉදින් වනාහි සත්පුරුෂයෝ විවාද කෙරෙත්ද, වහාම එකතු වෙති. නැවත අඥානයෝ මැටිපාත්‍ර මෙන් බිඳෙත්. ඔවුහු සංසිඳීමට නොපැමිණෙත්.

3. "යමෙක් වනාහි තමා මැඩ උපන් ද්වෙෂය දනීද, යමෙකුත් වරදවූ දෙසීම දනීද, මොවුහු බොහෝසෙයින් එක්වීමට යෙත්. ඔවුන්ගේ මිත්‍ර භාවය නොනසී.

4. "යමෙක් ද්වෙෂයෙන් යටපත් කරණ ලද්දාවූ අන්‍යයන් සන්ධානය කරන්ට තෙමේ සුදුසු වේද, මෙතෙම වනාහී අතිශයෙන් උතුම්වූයේ බර උසුලන්නෙක් ධුරය උසුලන්නෙක් වන්නේයයි" කීයේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

313 **ක්ෂාන්තිවාද ජාතකය**:- 1. "මහාවීරය, යමෙක් ඔබගේ අත් දෙකද පා දෙකද, කන් හා නාසයද, සින්දේද, ඔහුට කිපෙනු මැනව, මෙරට විනාශ නොකරනු මැනව,

2. "යමෙක් මාගේ අත් දෙකද, පා දෙකද කන් හා නාසයන්ද සිඳවීද, ඒ රජතෙම බොහෝ කලක් ජීවත්වේවා, මා වැන්නෝ නොකිපෙත්.

3. "අතීත කාලයෙහි ක්ෂාන්තිය ප්‍රකාශ කරණ ශ්‍රමණයෙක් විය. ක්ෂාන්තියෙහිම සිටියාවූ ඔහු කසී රජතෙම කැප්පවී.

4. "නරකයෙහි පිහිටියාවූ කසී රජතෙම යම් දුකක් වින්දේද, එය කටුක වූයේය. පරුෂවූ ඒ කර්මයාගේ විපාකය වේ."

314 **ලොහකුම්භී ජාතකය**:- 1. "නපුරු ජීවිකාවෙන් ජීවත්වීමු. යම්බඳුවූ අපි විද්‍යමාන කල්හී දන් නුදුන්නෙමුද, එහෙයින් සම්පත් ඇති කල්හි තමහට පිහිටක් නොකෙළෙමු.

2. "සර්වප්‍රකාරයෙන් සැට දහසක් අවුරුදු පිරුණාහ. ලෝකුඹු නරකයෙහි පැසෙන්නාවූ අපට කවර කලෙක්හි කෙළවරෙක් වන්නේද?

3. "නිදුකාණෙනි, එකල්හි වනාහි මා විසින්ද තා විසින්ද, පව් බොහෝකොට කරණ ලදී. එහෙයින් මේ දුකෙහි කෙළවරෙක් නැත. කවර හෙයකින් කෙළවරෙක් පෙනේද, කෙළවරෙක් නොපැනෙන්නේය.

4. "ඒ වනාහි මෙයින් චුතව ගොස් මනුෂ්‍ය යෝනියක් ලැබ දානය ලබන්නන්ගේ වචන දන්නෙක්වූයේ ශීලයෙන් යුක්තවූයේ ඒකාන්තයෙන් බොහෝවූ කුශලය කරන්නෙමියි" කීයේය.

315 **මාංශ ජාතකය**:- 1. "යහළුව, ඉල්වන්නෙක් වෙහිය. තාගේ වචන ඒකාන්තයෙන් පරුෂවූහ. තාගේ වචන දළබුවට සමානය. යහළුව, එහෙයින් තට දළබු කඩක් හෙවත්, බොකු කැල්ලක් දෙමි.

2. "ලෝකයෙහි මනුෂ්‍යයන්ට සහෝදරයාය යන මේ පැනවීම අංගයකැයි කියනු ලැබේ. යහළුව, තාගේ වචන

ශරීරාවයවයට සමානය. එහෙයින් තට අංගයක් හෙවත් ශරීරාවයවයක් දෙමි.

3. "පුත්‍ර තෙමේ "පියාණෙනි, කියන්නේ පියාගේ හෘදය කම්පා කෙරෙයි" තාගේ වචන හෘදයට සමානය. එහෙයින් යහළුව, තට හෘදය මාංශය දෙමි.

4. "යමෙකුගේ ගමෙහි යහළුවෙක් නැද්ද, ඔහුට ඒ ගම අරණ්‍යය මෙන් වේ. එසේ මැයි. තාගේ මියුරු වචන සියල්ලටම සමානය එහෙයින් යහලුව, තට මේ මස් සියල්ලම දෙමියි," කීයේය.

316 **සසජාතකයඃ** 1. "බමුණ, මාගේ ලූල් මත්ස්‍යයෝ සත්දෙනෙක් දියෙන් ගොඩට ගෙණෙනලදහ. මාගේ මේ ආහාරය ඇත. මෙය අනුභව කොට වනයෙහි වාසය කරව,

2. "මාගේ මෙහි මේ කුඹුරු රකින්නහුට රෑ බතට ගෙණෙනලද අඟුරු මස්කොට පැලහු මස්හුල් දෙකක්ද එක් ගොයෙක්ද, එක් මිදුනු කිරි කළයක්ද යන මෙය බමුණ, මට ඇත්තේය. මෙය අනුභවකොට වනයෙහි වාසය කරව.

3. "බමුණ මිහිරි අඹ පලද සිහිල්වූ ගඟ දියද සිත්කළුවූ සිහිල් සෙවනද යන මෙය මට ඇත්තේය. මෙය අනුභව කොට වනයෙහි වාසය කරව,

4. "සාවෙකුට තල නැත, මුංද නැත, සහල්ද නැත, මේ තා විසින් කරණ ලද ගින්නෙන් පැසුනාවූ මාගේ ශරීර මාංශය අනුභව කොට වනයෙහි වාසය කරවයි" කීයේය.

317 **මත රෝදන ජාතකයඃ** 1. "නො මළහුටම හඬව්, යමෙක් මැරෙන්නේද, එයට නොහඬව්, සියලුම සිරුරු දරන්නෝ පිළිවෙලින් තම තමන්ගේ ජීවිතය අත්හරිත්,

2. "දෙවියන් හා මිනිස්සුද සිව්පාවෝද පක්ෂි ගණයෝද, තවද භොග ඇත්තාහු ස්වකීය ශරීරයෙහි ඉසුරු නොවූවාහු සිත් අලවන්නාහුම ජීවිතය හරිත්,

3. "මෙසේ සැළෙන්නාවූ නොපිහිටියාවූ සැපදුක් දෙක මිනිසුන් කෙරෙහි අපේක්ෂාකොට හැඬීම් වැළපීම් නිරර්ථකය තොපගේ ශොකරාගීහු කුමට මඩිද්ද?

4. "ධූර්තවූ සොඬවූ ශාස්ත්‍ර පුරුදු නොකළාවූ, අඥානවූ නොකටයුත්තෙහි ශූරවූ කුශල මනස්කාරයෙහි නොයෙදෙන්නාවූ ධර්මයට අදක්ෂවූ යම් කෙනෙක් වෙද්ද, ඔව්හු ප්‍රාඥවූ මා බාල යෙකැයි" සිතතියි" කීයේයි.

**318 කරවේර ජාතකයː-** 1. "වසන්ත කාලයෙහි රක්තවූ ස්වභාව ඇති කරවේරයන් අතරෙහිදී තෝ යම් බඳුවූ සාමානම් ස්ත්‍රිය, බාහුයෙන් පෙළුයෙහිද, හෝ තොමෝ තට නිරෝගබව කීයේය.

2. "පින්වත, යම් වාතයෙක් පර්වතය තණ පතක් මෙන් ගෙණ යන්නේද, එය නොඇදහිය යුතුමය. ඉදින් වාතය තෙම පර්වතය ගෙණ යන්නේ නම් සියලු පොළොවද ගෙණ යන්නේය. යම් තැනෙක්හි සාමා තොමෝ කළුරිය කළාද, ඕතොමෝ මට නිරෝග බව කීය. (යනුද එසේ මැයි)

3. "සාමාතොමෝ නොම කළුරිය කළාය. ඕතොමෝ අනිකෙකු නොකැමැතිවේ. ඒක භක්තිනීවූ සාමාතොමෝ තා ම ප්‍රාර්ථනා කෙරේ.

4. "සාමාතොමෝ සංසර්ගයක් නොකළාවූ අභිනවවූ මා වෙතට බොහෝ කලක් කරණ ලද සංසර්ග ඇත්තාවූ ස්ථිර ඒ ස්වාමියා කෙරෙන් වෙනස්විය. සාමාතොමෝ මා කෙරෙනුදු අනිකෙකු පාවා ගන්නේය. එහෙයින් මෙයින් ඉතා දුරට ම යන්නෙමියි" කීයේය.

**319 තිත්තිර ජාතකයː-** 1. "වහන්ස, ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වෙමි. අනුභව කිරීමටද, ලබමි. එතෙකුදු වුවත් උපද්‍රවයෙහි සිටිමි. එසේවූ මට කවර ගතියක් වේද?

2. "පක්ෂිය, තාගේ සිතද පාපකර්මයට නොනැමේ. පාපකර්මයෙහි නොයෙදෙන්නාවූ යහපත්වූ තට පාපය නොඇලේ.

3. "අපගේ නෑයෙක් හුන්නේයයි බොහෝවූ පක්ෂි ජනයා එයි. මා නිසා හෙතෙම ප්‍රාණඝාත කර්මය ස්පර්ශ කරන්නේය. එහි මාගේ සිත සැක කෙරේ.

4. "ඉදින් තාගේ සිත දූෂ්‍ය නොවේ නම් තා නිසා ප්‍රාණඝාත කර්මය ස්පර්ශ නොකෙරේ. එසේ මැයි. පව් කිරීමෙහි උත්සාහ නැත්තාවූ යහපත්වූවහුට පාපය නොඇලේයයි" කීයේය.

**320 "සුච්චජ ජාතකය:-** 1. "පර්වතය, වචන මාත්‍රයෙන් නොදෙන්නේ ඒකාන්තයෙන් දෙන්නට පුළුවන් දෙය නුදුන්නේය. වචන මාත්‍රයෙන් පර්වතය දෙන්නාවූ ඔහුට කවර හානියෙක්ද, එතෙකුදු වුවත් වචනයෙන් පර්වතය නුදුන්නේය.

2. "යමක් වනාහි කරන්නේද, එයම කියන්නේය. යමක් නොකරන්නේ නම් එය නොකියන්නේයි කයින් දානාදී ක්‍රියා නොකරන්නාවූ බොරුකියන්නහු පණ්ඩිතයෝ දැනගණිත්.

3. "රාජ පුත්‍රය, සත්‍යවචනයෙහිද ස්වභාව ධර්මයෙහිද, පිහිටියේ වෙහිය. යම්බඳුවූ තාගේ ව්‍යසනයට පැමිණියාවූ සිත සත්‍යවචනයෙහි ඇලේද, එහෙයින් තට නමස්කාර වේවා.

4. "යම් ස්ත්‍රියක් තොමෝ දිළිඳුවූ ස්වාමියාට තොමෝත් දිළිඳු භාර්යාවද, ධනවත් ස්වාමියාට තොමෝත් ධනවත් භාර්යාවද, කීර්තිමත්වූ ඕතොමෝ වනාහි මොහුගේ උතුම්වූ භාර්යාවවේ. ඔව්හු හිරණ්‍යාදී සම්පත් ඇත්තහුට ස්ත්‍රීහු වෙත්මැයි." කීයේය.

---

# 33 කුටිදූසක වර්ගය

**321 කුටිදූසක ජාතකය:-** 1. "වානරය, තාගේ හිසද හස්ත පාදයෝද මනුෂ්‍යයෙකුගේ මෙනි. එසේ ඇති කල්හි කවර නම් ආකාරයකින් තට ගෙයක් නැත්තේද?

2. "සිංගිල නම් පක්ෂිය (මලිතිය) මාගේ හිසද හස්තපාදයෝද මනුෂ්‍යයෙකුගේ මෙනි. එතෙකුදුවුවත් මනුෂ්‍යයන් කෙරෙහි යමක් උතුමයයි කියත්ද? ඒ ප්‍රඥාව මට නැත්තේය.

3. "එක් අරමුණෙක්හි නොපවත්නා සිත් ඇත්තාවූ වහා පෙරළෙන සිත් ඇති මිත්‍රද්‍රොහීවූ අස්ථිර ස්වභාව ඇත්තහුට නිරන්තරයෙන් සැප බවක් නැත්තේය.

4. "වානරය, ඒ තෝ ප්‍රඥාව ලබන උපායක් කරව දුස්සීලභාවය දුරුකරව, සීතල හා සුළඟින් ආරක්ෂාව ඇති කුටිකාවක් කරගනුව,"

**322 දද්දභ ජාතකය:-** 1. "තට යහපතක් වේවා, මම යම් පෙදෙසෙක්හි වාසය කෙරෙම්ද, එතැන්හි දද්දභ යන ශබ්ද කෙළේය. මෙය මමද නොදනිමි. කුමක් හෙයින් මේ දද්දභ යන ශබ්දය ඇසුනේද,

2. "සාවා දද්දභයයි මෙසේ ශබ්ද කළ වැටුනාවූ බෙලිගෙඩියක් අසා දිව්වේය. සාවාගේ වචනය අසා තැති ගත්තාවූ මෘගසේනාවද දිව්වේය.

3. "බාහිර ඝොෂාවට අනුව යන සුලුවූ අනුන්ගේ කීම උතුම් කොට ඇති ඒ අඥානයෝ ඥාණ පදවියට හෙවත් ශ්‍රොතාපත්ති ඥාන භාවයට පැමිණෙනතුරුම අනුන්ගේ බස් උතුම් යයි අදහන්නාහු වෙත්.

4. "යම් ප්‍රාඥකෙනෙක් ආර්යවූ ශීලයෙන් යුක්තවූවාහු මාර්ග ඥානයෙන් කෙලෙසුන් සංසිඳීමෙහි ඇලුනාහු පාපයන්හි නොඇලුනාහු වෙත්ද? ඔවුහු අනුන්ගේ වචන අදහන්නෝ නොවෙත්."

**323 බ්‍රහ්මදත්ත ජාතකය:-** 1. "බ්‍රහ්මදත්ත නම් රජ, යාඥා කරන්නේ නොලැබීමට හෝ වස්තුව ලැබීමට හෝ මේ දෙකට පැමිණේ. එසේමැයි. යාඥාව නම් මෙබඳු ස්වභාව ඇත්තීමැයි.

2. "පඤ්චාල දෙශවාසීන්ගේ රාජොත්තමය, යාඥාව හැඬීමකැයි පුරාතනයෝ කීහ. යමෙක් වනාහි ඉල්ලීම බැහැර කෙරේද? එය නැවත නැවත හැඬීමයයි කීහ.

3. "එහෙයින් රැස්වූ පඤ්චාල නම් රට වැස්සෝ හඬන්නාවූ මාද, නැවත හඬන්නාවූ තාද, නොදකිත්වායි මම රහස් කැමැත්තෙමි.

4. "බමුණ, තට වෘෂභයෙකු හා සමග රක්තවර්ණවූ දෙනුන් දහසක් දෙමි. එසේ මැයි ආර්යයෙක් වනාහි ආර්යවූ තොපගේ කරුණුවලින් යුක්තවූ ගාථාවන් අසා කෙසේ නම් නොදෙන්නේදැයි" කීයේය.

**324 චම්මසාටක ජාතකය:-** 1. "යසස් ඇත්තාවූ යම් මේ බැටළුවෙක් උතුම් ජාති හා මන්ත්‍රයෙන් යුක්තවූ බමුණාට බුහුමන් දක්වාද, මේ සිවුපාවා ඉතා යහපත් ස්වරූප ඇත්තේ විශෙෂයෙන් උතුම්වූවෙක්ද, හික්මුනෙක්ද වේ.

2. "බමුණ, සිවුපාවාගේ ස්වල්ප දැකීමෙන් විශ්වාසයට නොපැමිණෙව. දැඩිවූ ප්‍රහාරයක් දෙනු කැමැත්තේ පසුබසී. දැඩි පහර දෙන්නේය.

3. "කලවා ඇටයද බිඳුනීය තවුස් පිරිකර බරද පෙරළී ගියේය. මෙහිදී බමුණාගේ කෙණ්ඩිය ආදීවූ සියලු භාණ්ඩද බිඳී ගියේය. තපස්වියා නසනු ලැබී. ඉදිරියට දුවව්යයි දෙඅත් හිස බැඳගෙන හඬයි.

4. "යම්සේ නුවණ නැත්තාවූ මම අද බැටළුවා විසින් පහරණ ලද්දේ නටුයේ වීම්ද, එපරිදෙන් යමෙක් නොපිදිය යුත්තෙකුට නමස්කාර කෙරේද, හෙතෙම නටුයේ සයනය කෙරේයයි" කීයේය.

**325 ගෝධ ජාතකය:** 1. "සංයම නැත්තාවූ තා ශ්‍රමණයෙකැයි සිතමින් එළඹීයෙමි. එසේවූ මා හෙතෙම අශ්‍රමණයෙක් යම්සේද, එසේ දණ්ඩකින් ගැසුයේය.

2. "අඥානය, තට ජටාවලින් කවර ප්‍රයෝජනද? අඳුන් දිවි සමෙන් තට කිනම් ප්‍රයෝජනයෙක්ද? තාගේ ඇතුළත ලොභාදීන් ගැවසී ගත්තේය. පිටත පිරිමදින්නෙහිය.

3. "ගොධය, මෙහි එව, නවතුව මට බොහෝවූ තෙල්ද, ලුණුද, තිප්පිලිද, ඇත. ඇල් හාලේ බත අනුභව කරව.

4. "මේ මම පුරුෂ ප්‍රමාණ සියයක් ඇති තුඹසකට නැවත ඇතුල් වන්නෙමි. තෙල්ද, ලුණුද මට ඇතැයි කීයෙහිය. මට තිප්පිලි ආදීවූ කටුක භාණ්ඩ හිත නොවේ යයි" කීයේය.

**326 කක්කාරු ජාතකය:-** 1. "යමෙක් ශරීරයෙන් අනුන් අයත්දේ නොගන්නේද, වචනයෙන් බොරු නොකියන්නේද, යශස් ලැබ මත් නොවන්නේද, ඒකාන්තයෙන් හෙතෙම කැකිරි මලට සුදුසු වෙයි.

2. "දැහැමින් වස්තුව සොයන්නේද, වඤ්චා ප්‍රයෝගයෙන් ධනය රැස් නොකරන්නේද සම්පත් ලැබ මත් නොවන්නේද හෙතෙම කැකිරි මලට සුදුසුවේ.

3. "යමෙකුගේ සිත පෙවූ කහවර්ණයක් මෙන් වහා වෙනස් නොවේද, ශ්‍රද්ධාවද මදකින් නොබිඳේද, මධුරාහාරය තනිව අනුභව නොකරන්නේද, හෙතෙම ඒකාන්තයෙන් කැකිරි කුසුමයට සුදුසුවේ.

4. "යමෙක් සත්පුරුෂයන්ට අභිමුඛයෙහි හෝ අනභිමුඛයෙහි හෝ නින්දා නොකෙරේද, යම්සේ කියන්නේද එසේ කරන්නේවේද, හෙතෙම ඒකාන්තයෙන් කක්කාරු පුෂ්පයට සුදුසු වේය"යි කීයේය.

327 **කාකාති ජාතකය**: 1. "යම් ගුරුළු භවනයෙක්හි මාගේ ප්‍රියාව වෙසේද, එයින් මේ සුගන්ධය හමයි. යමක කෙරෙහි මාගේ සිත ඇළුනේවේද? ඒ කාකාතිතොමෝ මෙයින් දුරවේ.

2. "ජම්බුද්වීප සමුද්‍රය කෙසේ එතෙර කෙළේද, ඉන් ඔබ්බෙහි කේබුක නම් ගංගාව කෙසේ එතෙර කෙළේද, සප්ත සීදන්ත සාගරයන් කෙසේ එතෙර කෙළේද, අපගේ හිඹුල් ගසට කෙසේ නැංගේද?

3. "තා කරණකොටගෙණ සමුද්‍රය එතෙර කෙළෙමි. තා කරණකොටගෙණ කේබුක නම් ගඟ එතෙර කෙළෙමි. තා කරණකොටගෙණ සප්ත සාගරයන් එතෙර කෙළෙමි. තා කරණකොට ගෙණ හිඹුල් ගසට නැගුනෙමි.

4. "යම් හෙයකින් මාගේ ප්‍රියාවට මම ම සොර සැමියා උසුලාගෙණ ගියෙම්ද, නැවත උසුලාගෙණ ආයෙම්ද, එසේ හෙයින් මහත්වූ ශරීරය ඇති මට නින්දා වේවා. මහත් සිරුර බැවින් සැහැල්ලු බව බර බව නොහැගෙන්නාවූ මට නින්දා වේවායි" කීයේය.

328 **අනනු සොචිය ජාතකය**:- 1. පින්වතිතොමෝ බොහෝ මළවුන් අතර විද්‍යාමානය හෙවත් ගණිනු ලැබේ. ඒ මළවුන් හා පවත්නී මට කිනම් තැනැත්තියක් වන්නීද, එහෙයින් ප්‍රියවූ නිතර සිනහ ඇත්තියට ශොක නොකරමි.

2. "ඉදින් ඒ අනුව ශොක කරන්නහුගේ යමක් යමක් නැද්ද, හෙවත් මළේද, ඒ ඒ මළහුට අනුව ශොක කරන්නේය. හැම කල්හි මරුවාගේ වසඟයට ගියාවූ මටම මම අනුව ශොක කරන්නෙමි.

5. ඒ ආයු සංස්කාරය තෙම සිටින්නහු අනුවයයි නොනවතියි හුන්නහු අනුව යයි නොනවතියි. සයනය කරන්නහු අනුවයයි නොනවතියි. පෙරලීහොත්තහු අනුවයයි නොනවතියි. යම්බඳු ඇසිපිය හෙළීමක් නැගීමක් වේද එබඳු සුළුකාලයෙහිද යෞවන ආදී වයස ගමන් කෙරේ.

4. "එහිලා ඒකාන්තයෙන් වයස් නොපිරිපුන් කල්හි වෙන්වීම සැක නැතිකල්හි නොමළහුට මෛත්‍රී කටයුතුයි. පහව ගියහුට හෙවත් මළහුට ශොකනොකොටයුතුයි" කීයේය.

**329 කාළබාහු ජාතකය**:- 1. "රාධය, පෙර මේ රජ සමීපයෙන් යම්බඳු ආහාර පානයක් ලබම්ද, එය දැන් වඳුරෙකු කරා යන්නේය. එසේ හෙයින් ධනඤ්ජය රජු විසින් අපි සත්කාර නොකරණ ලද්දෝම වෙමු. දැන් වනයටම යමු.

2. "පොට්ඨපාදය, ලාභය, අලාභය, කීර්තිය, අපකීර්තිය නින්දාවය, ප්‍රශංසාවය, සැපය, දුකය යන මේ අෂ්ට ලෝක ධර්මයෝ මනුෂ්‍යයන් කෙරෙහි අනිත්‍යයහ. එහෙයින් ශෝක නොකරව. කුමකට ශොක කෙරෙහිද?

3. "රාධය, ඒකාන්තයෙන් නුඹ පණ්ඩිතයෙක් විය. එසේ හෙයින් අනාගතවූ අර්ථයන් දන්නෙහිය. රාජ භවනයෙන් නෙරපන ලද හීනවූ මේ වඳුරා කෙසේ නම් දකින්නෙමුද?

4. "කණ සොලවයි. බැම බිඳීම කරයි. ක්ෂණ ක්ෂණයෙහි රජ කුමරුන් භය ගන්වයි. යම් හෙයකින් ආහාර පානයෙන් දුරුව සිටින්නේද එහෙයින් කාලබාහු නම් වඳුරා තෙමේම ඒ කාරණය කර ගන්නේයයි" කීයේය.

**330 සීල විමංස ජාතකය**:- 1. ලෝකයෙහි ශීලය වනාහි යහපත්ය. ශීලය නිරුත්තරය. බලව, දරුණු විෂ ඇති නාගයා සිල්වත්යයි නොනසයි.

2. "යම්තාක් මේ උකුස්සාගේ මුඛයෙහි කිසිවක් වීද ඒතාක්ම ලෝකයෙහි උකුස්සෝ එකතුව කෑවාහුය. කිසිවක් නැත්තහු හිංසා නොකෙරෙත්.

3. "ආශා නැත්තී සුවසේ නිදයි. ඵල ඇත්තාවූ ආශා තොමෝ සැපයට කරුණුවේ. පිංගලා නම් දාසිය ආශාව සිඳ සුවසේ නිදයි.

4. "මේ ලෝකයෙහිද පරලෝකයෙහිද සමාධියට වැඩියක් නැත. එසේමැයි එකඟවූ සිත් ඇත්තේ අන්‍යයාටද හිංසා නොකෙරෙයි. තමාටද හිංසා නොකෙරේයයි" කීයේය.

---

## කොකිල වර්ගය.

**331 කොකාලික ජාතකය:-** 1. "යමෙක් එකාන්තයෙන් සුදුසු කාලය නොපැමිණි කල්හි සීමාව ඉක්මවා කථා කෙරේද හෙතෙම කෝකිලාවගේ පුත්‍රයා මෙන් නැසුනේ මෙසේ ශයනය කෙරෙයි.

2. "හලාහල විෂයක් මෙන් නපුරු කොට කියන ලද්දාවූ වචනය යම්සේ එකෙණෙහි ජීවිතය හෙලාද එපරිද්දෙන් මනාකොට මුවහත් කළ ආයුධය එසේ ජීවිතය නොහෙලයි.

3. "එසේහෙයින් සුදුසු කාලයෙහිද නුසුදුසු කාලයෙහිද පණ්ඩිත තෙමේ වචනය රකින්නේය. තමා හා සමවූවෙකු සමීපයෙහිද සීමාව ඉක්මවා කථා නොකරන්නේය.

4. "නුවණ පෙරදැරි කොට ඇත්තාවූ විචක්ෂණවූ යමෙක් සුදුසු කාලයෙහි ප්‍රමාණයෙන් යුක්තව කථා කරන්නේද හෙතෙමේ ගුරුළා සර්පයෙකු මෙන් සතුරන් ගන්නේය" කීයේය.

**332 රථලට්ඨි ජාතකය:-** 1. "එකෙක්, තෙමේ පැහැරද අනුන් විසින් පහරණ ලද්දෙමි"යි කියයි. තෙමේ දිනාද අනුන් විසින් දිනන ලද්දෙමි'යි කියයි. පළමු කියන්නහුගේ බස් රජ්ජුරුවනි, ඒකාන්තයෙන් නොඅදහන්නේය.

2. "එසේ හෙයින් පණ්ඩිත ස්වභාව ඇති රජ තෙමේ අනිකාගේද බස අසන්නේය. දෙදෙනාගේ වචනය අසා විනිශ්චය ස්වභාවය යම්සේද එසේ කරන්නේය.

3. "සම්පත් කැමැත්තාවූ අලසවූ ගෘහස්ථයා යහපත් නොවේ. සංයමයක් නැත්තාවූ ප්‍රව්‍රජිතයා යහපත් නොවෙයි පරීක්ෂා නොකොට කටයුතු කරන්නාවූ රජද යහපත් නොවේ. යම් පණ්ඩිතයෙක් කිපෙන සුලුද ඒ කිපීම යහපත් නොවේ.

4. "දිශානායකවූ රජතුමනි, ක්ෂත්‍රියතෙමේ පරීක්ෂා කොට කටයුතු කරන්නේය. පරීක්ෂාවක් නොකොට යම් ක්‍රියාවක් නොකරන්නේය. රාජය, හොඳ නරක සොයා කටයුතු කරන්නහුගේ පරිවාර ආදි යශසද කීර්ති ඝොෂාවද වැඩේයයි කීයේය.

333 **ගොධ ජාතකයඃ-** 1. "රාජොත්තමය, කඩුව දැරුවාවූ, සන්නද්ධවූ, ගස් පොතුවලින් කළ සිවුරු හඳනාවූ, යම්බඳුවූ ඔබගේ ගිනි අඟුරෙහි පිළිස්සූ ගොයා වනය මැද බෝ අත්තෙහි එල්ලුනේ පැන ගියේද එසේ හෙයින් එකල්හිම මා විසින් ඔබ දැන ගන්නා ලද්දේය.

2. "තමහට නැමෙන්නහුට නැමෙන්නේය. තමා සෙවනය කරන්නහු සෙවනය කරන්නේය. තමහට අනුව කටයුතු කරන්නහුට සුදුසු කටයුතු කරන්නේය. තමාට අවැඩ කැමැත්තහුට වැඩක් නොකරන්නේය. තමා වෙත නොපැමිණෙන්නහු කරා තෙමේද නොපැමිණෙන්නේය.

3. "තමා හරණහු තෙමේද හරණේය. මිත්‍රකමින් එක්වීම නම් තෘෂ්ණාව නොකරන්නේය. නොඇළුණු සිතින් නොඑළඹෙන්නේය. කුමක් හෙයින්දයත්, පක්ෂිතෙමේ ගෙඩි නැති ගස හැඳින අනෙක් ඵල ඇති ගසක් බලා යන්නේය, එසේමැයි. ලෝකය මහත්වේමැයි

4. "රාජකන්‍යාව කළගුණ දන්නා බව සලකන්නාවූ ඒ මම හැකි පමණින් තීට උපකාර කරන්නෙමි. තීට සියලු ඓශ්චර්ය දෙමි. යමෙකුට තෝ දෙනු කැමැත්තෙහිද ඔහුට කැමති දෙයක් දෙවයි' කීයේය.

334 **රාජොවාද ජාතකයඃ-** "ගඟ එතෙර වන්නාවූ ගවයන් අතුරෙන් ප්‍රධාන ගවතෙම ඉදින් වක්වූයේද, ප්‍රධාන ගවයා වක්ව ගියකල්හි ඒ සියලු ගවයෝ වක්වයෙති.

2. "එපරිද්දෙන්ම මනුෂ්‍යයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨයයි ප්‍රසිද්ධවූ යමෙක්වේද, ඒ රජතෙම ඉදින් අධර්මයෙහි හැසිරේද, සෙසු ප්‍රජාතොමෝ කියනුම කවරිද, ඉදින් රජතෙම අධර්මයෙන් යුක්තවේ නම් සියලු රට වැසියාද දුකසේ සයනය කරයි.

3. "ගඟින් එතෙරවන්නාවූ ගවයන් අතුරෙන් ඉදින් ප්‍රධාන ගවයා ඍජුවයේද, ප්‍රධාන ගවයා ඍජුව යනකල්හි සියලු ගවයෝ ඍජුවම යෙත්.

4. "එපරිද්දෙන්ම මිනිසුන් අතුරෙහි යමෙක් ප්‍රධානයයි සම්මතවේද, ඉදින් හෙතෙම කුශල ධර්මයෙහි හැසිරේද, සෙසු ජනයෝ කියනුම කවරේද, ඉදින් රජතෙම ධාර්මික වේ නම් සියලු රට වැසියා සුවසේ වාසය කෙරේයයි" කීයේය.

**335 ජම්බුක ජාතකයः-** 1 "ජම්බුකය, ඒ ඇත්තෙම මහත්ය ඉතා වැඩුනු ශරීර ඇත්තේය. දික්වූ දළ ඇත්තේ මැයි. යම් කුලයෙක්හි උපන්නෝ ඒ ඇතු ගනිද්ද, ඒ කුලයෙහි තෝ උපන්නේ නොවෙහිය.

2. "සිංහ නොවූ යමෙක් සිංහ යෙමි යන මානයෙන් වැඩ කෙරේද, හෙතෙම ඇතු කරා පැමිණ තතනන්නාවූ හිවලා මෙන් බිම සයනය කෙරෙයි.

3. "යසස් ඇත්තාවූ මනාකොට හටගත් ශරීරය ඇති මහත් බල ඇති උතුම් පුද්ගලයෙකුගේ ඥාන ශක්තිය හා කාය බලයද, උත්පත්තියද, පරීක්ෂා නොකොට ඇතු විසින් නසන ලද්දාවූ ඒ මේ සිවලා සයනය කෙරෙයි.

4. "යමෙක් වනාහි මේ ලෝකයෙහි තමා කෙරෙහි ඤාණ ශක්තිය හා කාය බලයද ප්‍රමාණකොට දැන කටයුතු කෙරේද, ඒ පරීක්ෂා ඥාණයෙන් යුක්ත පුද්ගලතෙම ප්‍රඥාවෙන්ද මන්ත්‍රණයෙන්ද, නිරවද්‍ය වචනයෙන්ද, මහත් කොට දිනාය"යි කීයේය.

**336 බ්‍රහාඡත්ත ජාතකයः-** 1. "තෘණය, තෘණයයි කියන්නෙහිය, තොපගේ තෘණ කවරෙක් හැරගත්තේද, තෘණම කියන්නෙහිය. කිමෙක්ද, තොපට තෘණවලින් කටයුත්තක් ඇද්ද,

2. "උස්වූ බහුශ්‍රැතවූ ඡත්‍ර නම් වූ බ්‍රහ්මචාරියෙක් මෙහි ආයේය. ඒ තපශ්වීතෙම මාගේ සියලු ධනය හැරගෙණ තෘණ බහාතබා ගියේය.

3. "මදවූ තෘණයෙන් බොහෝවූ ධනය කැමැත්තහු විසින් මෙය මෙසේ කටයුතුවෙයි. ස්වකීය පියාසතු ධනයාගේ සියල්ල ගැණීමයි අනුන් පිළිබඳවූ තෘණයාගේ ද නොගැන්මය.

4. "සිල්වත්හු මෙසේ නොකරත්. අඥානයා මෙබඳු ස්වභාවයන් කරයි. අනිත්‍යවූ සිල් ඇති දුශ්ශීලයාට පණ්ඩිත බව කුමක් කරන්නේදැයි" කීයේය.

337 **පීඨජාතකය:-** 1. "බ්‍රහ්මචාරිය, ඔබට පුටුවක් නුදුනුම්හ. පානයකුත් නුදිනිමු. ආහාරයකුත් නුදුන්නෙමු. මාගේ මේ වරද දකිමි. ක්ෂමාවුව මැනව.

2. "තාගේ දානයෙහි නොම ඇලෙමි. නුදුන්නේ යයි කිපෙන්නේත් නොවෙමි. මට කිසිවක් අප්‍රියද නොමවිය. එතකුදුවුවත් මේ කුලයාගේ ඒකාන්තයෙන් මෙබඳු ස්වභාවයෙක් වේයයි මට චිත්ත සංකල්පයෙක් වූයේය.

3. "හිඳිනා ආසනය සේදීමට සුදුසු ජලය පා ගල්වන තෙලය යන මේ සියල්ල දෙමු. මෙතෙම අපගේ වංශයෙහි හැමකල්හි පිය මුතුන්ගෙන් ආවාවූ ස්වභාව ධර්මයයි.

4. "උතුම්වූ නෑයෙකුමෙන් (ශ්‍රමණ බ්‍රාහ්මණයන් දැක) සකස්කොට උපස්ථාන කරම්හ. මෙතෙම අපගේ වංශයෙහි හැමකල්හි පියන් මුත්තන්ගෙන් ආවාවූ ස්වභාව ධර්මය වේයයි කීයේය."

338 **ථුස ජාතකය:-** 1. "මීයන්ට වී පොතු ප්‍රකටය. සහල්ද ප්‍රකටය. බොල් පොතු හැර සහල් කන්නාහුය.

2. "උයනෙහිදී කරණලද යම් මන්ත්‍රණයක් ඇද්ද, ගමෙහිදී කරණලද යම් ඒ රහස් කීමක් ඇද්ද, මෙසේද යම් මේ පහර දීමට අවකාශ සෙවීමක් ඇද්ද, මෙයද මා විසින් දන්නාලදී.

3. "පියවූ වඳුරා ස්වභාවයෙන් උපන්නාවූ ළදරුවූම පුත්‍රයාගේ අණ්ඩකොෂය දත්වලින් සිඳින්නේලු.

4. "අඹ කෙතෙහි අන්ධවූ එළුදෙනක මෙන් ඔබමොබ බලා පෙරලෙන්නෙහිය යන යමක් ඇද්ද මෙයද යම්බඳුවූ මෙතෙම සයනයට හොවීද, මේ කාරණයද මා විසින් දන්නාලදී."

**339 බාවේරු ජාතකය:-** 1. "කුටුම්බිය ඇත්තාවූ මියුරු හඬ ඇති, මොණරාගේ නොදැක්මෙන් එහි මිනිස්සු කවුඩාට මාංශයෙන්ද, ඵලයෙන්ද පිදූහ.

2. "යම් කලෙක්හි මියුරු හඬ ඇති මොණරා බාවේරු නම් පෙදෙසට ආයේද, එකල්හි ලාභයද සත්කාරයද කවුඩාට පිරිහුනේය.

3. ධර්මරාජාණන්වූ ලොව බබුළුවන්නාවූ සර්වඥයන් වහන්සේ යම්තාක් නූපදීද, ඒතාක් කල් අන්‍ය තීර්ථකවූ බොහෝවූ මහණ බමුණන් ලෝවැස්සෝ පිදූහ."

4. "බ්‍රහ්ම ස්වරයෙන් යුක්තවූ සර්වඥන් වහන්සේ යම් කලෙක්හි චතුස්සත්‍ය ධර්මය දේශනා කළසේක්ද, එකල්හි ලාභයද, සත්කාරයද තීර්ථකයන්ට පිරිහුණේයයි" වදාළේය.

**340 විසය්හ ජාතකය:** 1. "විසය්හය, මින් පෙර දන් දුන්නේය. දෙන්නාවූද, තොපගේ වස්තු විනාශ ස්වභාවය විය. මින් මතු ඉදින් දානය නොදෙන්නේ නම් දීමෙන් වළක්නාවූ තොපට සම්පත් පෙර මෙන් ඇතිවන්නාහ.

2. "දහසක් ඇස් ඇත්තාවූ අධිපතිවූ ඉතා දිළිඳුවූද, ආර්යයා විසින් ලාමක ක්‍රියාවක් නොකටයුතුයයි කීහ. යමෙකුගේ වස්තුව හේතුකොටගෙණ ශ්‍රද්ධාවහරිමුද, ඒ වස්තුව නොවේවා.

3. "ශක්‍රය, යම් මාර්ගයකින් එක් රථයක්යේද, ඒ මාර්ගයෙන්ම අනික් රථයෙක් යන්නේය. එමෙන්ම පෙර මා විසින් තබන ලද දන්වැට දියුනුවට පැමිණේවා.

4. ඉදින් වස්තුව ඇතිවන්නේ නම් දන්දෙමු වස්තු නැතිකල්හි කුමක් දෙම්ද, මෙසේ අනාථවූද මම දීමට පමා නොවෙමියි" කීයේය.

---

# චුල්ලකුණාල වර්ගය.

**341 කණ්ඩරී ජාතකය**:- 1. "මිනිසුන්ගේ ඇල්ම කරන්නාවූ නොයෙක් සිතිවිලි ඇත්තාවූ නිග්‍රහකොට හික්මවිය නොහැක්කාවූ ස්ත්‍රීන් කෙරෙහි විශ්වාස නොකරන්නේය. ඉදින් සියලු ස්ත්‍රීහු තමන් විසින් අප්‍රිති කරවන්නාහු නමුදු තොටුපලවල් හා සමානවන්නාහ.

2. "කණ්ඩරීනම් රජු හා කින්නරා නම් බිසව යන දෙදෙනාට ඒකාන්තයෙන් යම් රාගයක්වීද, එය දැක සියලු ස්ත්‍රීහු ස්වකීය ගෘහයෙහි නො ඇලෙත් යයි දතයුතුයි. එසේමැයි ඒ කණ්ඩරීනම් රජුගේ භාර්යාතොමෝ පිළෙකුවූ අන් පුරුෂයෙකු දැක එබඳුවූ ඒ රජහු හැර (එකතුවූයේය.)

3. "අත්‍යන්තයෙන් කාමයට අනුව ගියාවූ බක නම් රජුගේද, පාවාරික නම් රජුගේද භාර්යාව තමාගේ වසඟයෙහි පවත්නහු (හෙවත්) කීකරු මෙහෙකරන්නෙකු සමග අනාචාරයෙහි හැසුරුනේය. ස්ත්‍රී නම් ස්වකීය පුරුෂයාගෙන් අන්‍යවූ කවරෙකු නමුත් ඉක්ම නොපවතියි.

2. "සියලු ලොවට අධිපතිවූ බ්‍රහ්මදත්ත නම් රජහුගේ පිංගියානි නම් කාමයන් ප්‍රාර්ථනා කරන්නාවූ ප්‍රියවූ භාර්යා තොමෝ කීකරුව මෙහෙ කරන්නෙකු සමග අනාචාර කෙළේය. ඕතොමෝ ඔහුද ඒ අගබිසෝ තනතුරදැයි යන දෙකටම නොපැමිණියේය. හෙවත් දෙකින්ම පිරිහුනේයයි" කීයේය.

**342 වානර ජාතකය**:- 1. "එම්බා ජලය, ජලයෙන් ගොඩට නැගෙන්නට ඒකාන්තයෙන් සමර්ථවීමි. දැන් මම නැවත තාගේ වසඟබවට නොයමි.

2. "මුහුදක් වැනිවූ ගංගාවගේ එතෙර යම් ගෙඩි වර්ග ඇද්ද, එයින් කම්නැත. මේ අඹවලටද, දඹවලටද, වැල, වරකාවලටද වඩා මාගේ දිඹුල්ඵල උතුම්වේ.

3. "යමෙක් වනාහි උපන්නාවූ අර්ථය වහාම දැන නොගණීද හෙතෙම සතුරන්ගේ වසඟයට පැමිණේ. පසුව තැවීමටද පැමිණේ.

4. "යමෙක් වනාහි උපන්නාවූ අර්ථය වහාම දැනගණීද හෙතෙම සතුරන්ගේ පීඩාවෙන් මිදෙන්නේය. පසුව තැවීමටද නොපැමිණෙන්නේයයි" කීයේය.

**343 කුන්තනී ජාතකය**:- 1. "රජ, ඔබගේ ගෙහි නිරන්තරයෙන් සත්කාර කරණලද්දී, පුදනලද්දී විසුවෙමු. දැන් ඔබම (මා දරුවන් නොරක්ම) කෙළෙහි එබැවින් මම යෙමි.

2. "යමෙක් ඒකාන්තයෙන් වරද අනුන් තමහට කළ කල්හි නැවත වරද තමා විසින් අනුන්ට කළ කල්හි එය දනීද, මෙසේ

3. "ඒ වෛරය සංසිඳේ කොස්ළිහිණිය, මෙහි වසව. නොයව,

4. "රාජොත්තමය, අනුන් විසින් පුද්ගලයෙක්ද පෙළන ලද යමෙක් පීඩා කෙරේනම් ඔහුගේද මිත්‍රභාවය නැවත නොගැලපේ. මාගේ හෘදය මෙහි විසීමට නොඅනුදනියි." එහෙයින් යන්නෙම්මය.

5. "අනුන් විසින් උපකාර කරණලද පුද්ගලයාගේද, උපකාර කරන්නාගේද, මිත්‍රභාවය නැවත ගැළපේ, එයද ප්‍රාඥයන්ගේය අඥානයන්ගේ නොවෙයි. කුන්තණිය මෙහි වාසය කරව, නොයවයි" කීයේය.

**344 අම්බචොර ජාතකය**:- 1. "යම් තැනැත්තියක් තාගේ අඹ සොරාගත්තීද, ඕතොමෝ යම්පුරුෂයෙක් බොරු කොල ගෙණ හිස නිල් කිරීමෙන් සරසාද, අඬුවෙන් සුදුකෙස් උදුරා වෙහෙසේද, එසේ වූවහුගේ වසඟබවට පැමිණේවා.

2. "යම් ස්ත්‍රියක් තොපගේ අඹ සොරාගත්තීද, ඕ තොමෝ උත්පත්තියෙන් විසි අවුරුද්දකට හෝ පස්විසි අවුරුද්දකට හෝ විසිනව අවුරුද්දකට හෝ පැමිණ එබඳු වයස් ඇත්තී, වල්ලභයෙකු ලබාවා.

3. "යම් ස්ත්‍රියක් තාගේ අඹ සොරා ගත්තීද, ඕතොමෝ අභිසාරිකාවූවා තනිව දික්වූ මග යේවා. සලකුණු කී ස්ථානයෙහි ස්වාමියා නොදකීවා.

4. "යම් ස්ත්‍රියක් තාගේ අඹ පැහැරගත්තීද, ඕතොමෝ මනාව හැඳි වස්ත්‍ර ඇත්තී පැළැඳි මල්දම් ඇත්තී ගැල්වූ සඳුන්

කල්ක ඇත්තී සැරසුනී හුදකලාව යහනෙහි සයනය කෙරේවායි” කීයේය.

**345 ගජකුම්භ ජාතකයඃ-** 1. “පවලකය, යම් කලෙක්හි වනය පාවක නම්වූද කෘෂ්ණා වර්තනී නම් වූද ගින්න දවාද එසේ වූ කල්හි මදවූ වීර්ය ඇත්තේ කෙසේ නම් කරන්නෙහිද,

2. “ගස් සිදුරුද පොළොවෙහි විවරයෝද බොහෝවෙත්. ඉදින් ඔවුන් කරා නොපැමිණිය හැකි වෙමුනම් අපට කාලක්‍රියාව වන්නේය.

3. “යමෙක් හෙමින් කටයුතු කාලයෙහි ශීඝ්‍රව කෙරේද, ශීඝ්‍රව කටයුතු කාලයෙහි හෙමින් කටයුතු කෙරේද, හෙතෙම ඇක්ම වියලී තල් පතක් මෙන් තමාට වන අභිවෘද්ධිය නසයි.

4. “යමෙක් සෙමින් කටයුතු කාලයෙහි සෙමින් කටයුතු කෙරේද, වහා කටයුතු කාලයෙහි වහා කටයුතු කෙරේද, හෙතෙම රාත්‍රියෙහි කෘෂ්ණ ශුක්ළ පක්ෂ වශයෙන් බෙදෙන්නාවූ චන්ද්‍රයා මෙන් ඔහුගේ සිතේ අදහස සම්පූර්ණවේ”යයි කීයේය.

**346 කේශව ජාතකයඃ-** 1. “සියලු කාම සම්පත්තියෙන් සමෘද්ධවූ අපගේ රජ්ජුරුවන් හැරදමා කේශව නම් භාග්‍යවත් තාපසතෙමේ කප්ප නම් තව්සාගේ ආශ්‍රමයෙහි කෙසේ නම් ඇලේද,

2. “නාරදය, කප්ප නම් තව්සාගේ මිහිරිවූ සිත්කළුවූ යහපත් වචනද මනහරවූ වෘක්ෂද විද්‍යමානවෙත්. මොව්හු මා සිත් අලවත්.

3. “පිරිසිදුවූ මාංශ රශයෙන් යුක්තවූ ඇල්සාලේ බත අනුභව කෙළේය. ලුනු නැති බොඩහමු හූරුැහැල් කෙසේ නම් සතුටු කෙරේද,

4. “විශ්වාස බවට පැමිණියේ යම්හෙයකින් අමධුරවූද, නොහොත් මධුරවූද මඳවූ හෝ නොහොත් බොහෝවූ හෝ භොජනය අනුභව කරන්නේද, (ඒ භොජනය මධුරවේ) කුමක් හෙයින්දයත්, රසයෝ විශ්වාසය උතුම්කොට ඇත්තාහු වෙත් යයි” කීයේය.

**347 අයකූට ජාතකයː-** 1. "ඉතා මහත්වූ කූළගෙඩිය ඔසවාගෙණ ඒ තෝ අහසෙහි සිටින්නේය. තෝ මාගේ රක්ෂාව පිණිස දැන් නියුක්ත වූයේ වෙහිද, (නොහොත්) මාගේ වධය පිණිස සිතන්නෙහිද,

2. "රජ මම මෙහි තොපගේ වධය පිණිස මෙහෙයන ලද්දේ වෙමි. තා දෙවතාවන්ට රජවූ ඉන්ද්‍රතෙමේද රක්ෂා කරයි. එහෙයින් තාගේ මුදුන නොපලමි.

3. "ඉදින් වනාහි දෙවියන්ට අධිපතිවූ මඝවන්තු නම් ඇති සුජාත නම් අසුර කන්‍යාවට ස්වාමිවූ දිව්‍යරාජතෙම මා රක්ෂා කෙරේනම් සියලු පිශාචයෝ හඬත්වා. රාක්ෂසයින්ට භය නොවෙමි.

4. "සියලු කුම්භාණ්ඩයෝද පාංශු පිශාචකයෝද කැමති පරිද්දෙන් හඬත්වා. මා සමග යුද්ධයට පාංශු පිශාචකයෝ නොපොහොසත්හ. ඒ වෙහෙස කිරීම මහත්වේයයි" කීයේය.

**348 අරඤ්ඤ ජාතකයː-** 1. "පියාණෙනි, මම වනයෙන් ගමට පැමිණ කෙබඳු සිල් ඇති කෙබඳු ව්‍රත ඇති පුරුෂයෙකු සේවනය කරන්නෙම්දැයි විචාරණ ලද්දෙහි එය මට කියව.

2. "පුත්‍රය, යමෙක් තා විශ්වාස කරන්නේද, තාගේ විශ්වාසයද කැමතිවන්නේද තාගේ වචනය අසනු කැමැත්තේද, තට ඉවසාද, මෙයින් ගියේ ඔහු සේවනය කරමි.

3. "යමෙකුගේ කයින්ද, වචනයෙන්ද, සිතින්ද නපුරු කොට කරණලද්දක් නැද්ද, ඒ පුද්ගලයා මෙයින් ගියේ ලෙහි වැඩි පුතෙකු මෙන් පිහිටා සේවනය කරව.

4. "පුත්‍රය, කහපාට ගෑමක් මෙන් අස්ථිරවූ වානරයෙකුගේ මෙන් චඤ්චලවූ සිත් ඇති මොහොතකින් ඇලීම නොඇලීම ස්වභාවකොට ඇති එබඳුවූ පුරුෂයා ඉදින් සියලු දඹදිව මිනිසුන් හිස්වන්නේවී නමුත් සේවනය නොකරවයි" කීයේය.

**349 සන්ධිභේදක ජාතකයː-** 1. "රථාචාර්යය, ස්ත්‍රීන් කෙරෙහිද මොවුන් දෙදෙනාගේ සමාන බවක් නොමැත. ගොදුරුවලද, සමාන බවක් නැත්තේය. එතකුදු වුවත් මේ මිත්‍ර

භෙද කරන්නාවූ දුෂ්ට හිවලාගේ යම්තාක් මනාකොට කරණ ලද සිතිවිල්ල බලව.

2. "ප්‍රිය ශූන්‍යව පවත්නා යම් තැනෙක්හි වෘෂභයාද සිංහයාද, සිවල්ලු කත්ද, මාංශයෙහි තියුණුවූ කඩුවක් මෙන් ප්‍රිය ශූන්‍ය වචනය මිත්‍රභාවය පෙරළයි.

3. "රථාචාර්යය, යම් මේ දෙදෙනාගේ මර නින්ද දක්නෙහිද, එපරිද්දෙන් මිත්‍ර භෙද කරන්නාවූ කේලාම් කියන්නහුගේ වචනය යමෙක් දනීද, හෙතෙම මෙබඳුවූ මරනින්දෙහි නිදයි.

4. "රථාචාර්යය, මිත්‍රභෙද කරන්නහුගේ වචනය යම් කෙනෙක් පිළිනොගනිද්ද, ඒ ජනයෝ ස්වර්ගයට ගියාවූ මිනිසුන් මෙන් සැපය වඩත්යයි" කීයේය.

**350 දේවතාපඤ්හ ජාතකයඃ-** 1. "රාජය, පා වලින්ද ගසයි. මුහුණටද පහර දෙයි. ඒකාන්තයෙන් හෙතෙම ප්‍රියවේ. එයින් කවරෙකු දන්නෙහිද,

2. "රජ්ජුරුවෙනි, කැමති පරිද්දෙන් ආක්‍රොශ කෙරෙයි. ඔහුට ආක්‍රොශ පැමිණීමද නොකැමතිවේ. ඒකාන්තයෙන් හෙතෙම ප්‍රියයෙක්වේ. ඒ කාරණයෙන් ඔහු කවරෙකුයයි දන්නෙහිද,

3. "රජ්ජුරුවෙනි, නොවූ දෙයින් පහත්කොට කියයි. බොරුවෙන් සිහිකරවන්නේය. ඒකාන්තයෙන් හෙතෙම ප්‍රියයෙක්වේ. ඒ කාරණයෙන් ඔහු කවරෙකුයයි දක්නෙහිද,

4. "දේවයෙනි, ආහාරයද, පානයද ගෙණ යන්නාවූ වස්ත්‍රද සයනාසනද ඒකාන්තයෙන් හැරගෙණ යන්නාවූ ඔව්හු ඒකාන්තයෙන් ප්‍රියවෙත්. ඒ කාරණයෙන් ප්‍රියවන්නහු කවරෙකුයයි දක්නෙහිදැයි" කීයේය.

---

## මණිකුණ්ඩල වර්ගය

**351 මණිකුණ්ඩල ජාතකයඃ-** 1. "රථය, අශ්වයෝය, මිණි කොඩොල්ය, යන මොවුන් පිරිහී ගියේය. එසේම පුත්‍රයන්ද,

අඹුවන්ද පිරිහුනේය. සියලු සම්පත් ඉතිරිනොකොට ගෙණගිය කල්හි ශෝක කිරීමට සුදුසු කාලයවේ. කුමක් හෙයින් ශොකයෙන් නොතැවෙන්නෙහිද,

**2.** "කාමය කැමැත්තිය, සම්පත්තීහු සත්වයා පළමුකොටම හැරදමත්. සත්වතෙමේද ඒ සම්පත් පළමුකොටම හැරදමයි. සම්පත් ඇත්තාහු සදාකාලික නොවෙත්. එහෙයින් මම ශොක කරන්ට සුදුසු කාලයෙහි ශෝක නොකරමි.

**3.** "සත්තුකය, චන්ද්‍රයා උදාවෙයි. ක්‍රමයෙන් පිරිහීමට යෙයි. විනාශයටද යෙයි. සූර්යයා ලෝකය තවා හෙවත් බබුළුවා බැස ගියේද, එපරිද්දෙන් මා විසින් අෂ්ටලෝක ධර්මයෝ දක්නාලදහ. එහෙයින් මම ශොක කිරීමට සුදුසු කාලයෙහි ශෝක නොකරමි.

**4.** "සම්පත් කැමතිවූ අලසවූ ගෘහස්ථයා යහපත් නොවේ. සංයම නැත්තාවූ, ප්‍රව්‍රජිතයා යහපත් නොවේ. විමසා කටයුතු නොකරන්නාවූ රජතෙමේද, සුදුසු නොවේ. යම් පණ්ඩිතයෙක් කිපෙනුසුළුද ඒ කිපීම සුදුසු නොවේ.

**5.** "දිශාධිපතිය, ක්ෂත්‍රියතෙමේ පරීක්ෂාකොට කටයුතු කරන්නේය. පරීක්ෂා නොකොට ක්‍රියා නොකරන්නේය. රාජය, විමසා කටයුතු කරන්නහුගේ පරිවාරාදි යශසද කීර්ති ඝොෂාවද වැඩේයයි" කීයේය.

**352 සුජාත ජාතකයඃ-** 1. "තිල්වූ තෘණ ඉක්මන් වෙමින්ම කපාගෙණවුත් පහවූ ජීවිතෙන්ද්‍රිය ඇති මහළු ගොණාට කව කවයි කියා කුමට කියන්නෙහිද,

**2.** "ආහාරයෙන්ද, පානයෙන්ද, මළාවූ ගොණා නොම නැගීසිටින්නේය, අඥානයා යම්සේද, එසේ තෝද නිරර්ථක වූවක් කියා හඬන්නෙහිය.

**3.** "හිසද, අත්පාද, වලිගයද එසේම තිබේ. කර්ණයෝද එසේ තිබෙත් එහෙයින් ගොණා නගින්නේයයි" සිතමි.

**4.** "අපගේ මළාවූ මුත්තනුවන්ගේ හිස හෝ අත් පා හෝ නොම දක්නා ලැබෙත්. එසේ වූවක් මැටියෙන් කළාවූ සෑයෙහි හඬන්නාවූ නුඹ අඥාන නොවේද?"

5. "ගිතෙල් ඉසිනලද ගින්නක්මෙන් ශොකයෙන් ඇවිල ගත්තාවූම මා ඒකාන්තයෙන් ජලය ඉසින්නෙකු මෙන් සියලු විඩාව නිවූයේය.

6. "ශෝකයෙන් පෙළුනාවූ මාගේ පීතා ශොකය යමෙක් දුරු කෙළේද, හෙතෙම මාගේ හෘදයෙහිවූ යම් ශොක නමැති හුලක්වීද, ඒ හුල ඒකාන්තයෙන් උදුරාදැමීය.

7. "මානවකය, ඒ මම උදුරා දමනලද ශොක හුල ඇත්තේ වෙමි. එහෙයින් පහවූ ශොක ඇති නොකැළඹුනු සිත් ඇති මම නුඹගේ කරුණු සහිත වචන අසා ශොක නොකරමි. නොහඬමි.

8. "පියා සුජාතයා මෙන් සප්‍රාඥවූ යම් කෙනෙක් අනුකම්පා ඇත්තාහු වෙත්ද, ඔව්හු මෙසේ කෙරෙත්. ශොකයෙන් වළක්වත්යයි" කීයේය.

**353 වෙණසාඛ ජාතකයː-** 1. "බ්‍රහ්මදත්තය, ක්ෂෙම යයි කියාද සුභික්ෂය කියාද ශරීරයෙහි සැප ඇති බවක් වේද මේ සියල්ල නිත්‍යයෙන් නොවිය යුතුය. සාගරය මැද බිඳුනාවූ නැව ඇත්තේ අතිශයින් මුළාවූයේම වේද එපරිද්දෙන් වස්තු විනාශයෙහිද මුළා වන්නේයයි කීහු.

2. "පුරුෂතෙමේ යම් ක්‍රියාවන් කෙරේද ඒ ක්‍රියාවන් තමා කෙරෙහි දක්නේය. යහපත කරන්නේ යහපතක්ම දක්නේය අයහපත කරන්නේ අයහපතක් දක්නේය. ඒ එසේමැයි යම්බඳු බිජුවටක් වපුරාද එබඳුවූ ඵලයක් ලබන්නේය.

3. "යම්බඳුවූ පාපයක් කරණ ලදද, එය පසුව තවන්නේය. එසේහෙයින් තෝ පාපයක් නොකරවයි එකල්හි පාරාසරිය නම් ඇදුරුතෙමේ යමක් කීයේද, මෙය ආචාරීන්ගේ වචනයයි.

4. "පිංගිය නම් බමුණ, යම් ගසක් මුල ක්ෂත්‍රියයන් සම්බන්ධවූ සැරසුණාවූ සඳුන් කල්ක ගැල්වූ දහසක් දෙනා විනාශ කරවීම්ද පතළාවූ අතුපතර ඇති ඒ මේ නුග ගසම එම දුක මා කරා නැවත පමුණුවන ලදී.

5. "සඳුන් කල්ක ගල්වන ලද ශරීරාවයව ඇත්තාවූ සාමාවද මුරුංගා ගසක උඩට නැගුණාවූ යෂ්ටියක් මෙන් බබලන්නාවූ

උබ්බරී නම් මාගේ බිසොව නොදැකම කළුරිය කරන්නෙමි. එය මට මේ මරණ දුකට වඩා ඉතා දුක වන්නේයයි" කීයේය.

**354 උරග ජාතකයඃ-** 1. "දිරුවාවූ සැවය සර්පයා මෙන් ස්වකීය ශරීරය හැරදමායේද, එපරිද්දෙන් සිරුර ජීවිතෙන්ද්‍රිය නැති හෙයින් ප්‍රයොජන ගත නොහැකි කල්හි පරලොව ගිය කල්හි කළුරිය කළ කල්හි (හැඬීමෙන් කවර ප්‍රයෝජනද?)

**2.** දවනු ලබන්නේ නෑයන්ගේ හැඬීම නොදනීද එහෙයින් මෝහට ශෝක නොකරමි. ඔහුගේ යම් ගතියක් ඇද්ද, ඒවූ පරිද්දෙන් හෙතෙමේ ගියේය.

**3.** "මා විසින් නොකැඳවන ලද්දේ එලොවින් මෙලොවට ආයේය. මෙයින්ද මා විසින් නොඅනුදන්නා ලදුව ගියේය. යම් සේ නොකැඳවා ආයේ ද එසේම නොඅනුදැන ගියේය. එහිලා කවර නම් හැඬීමක්ද,

**4.** "හුලෙන් ඇන දවනු ලබන්නේ නෑයන්ගේ හැඬීම නොදනීද, එහෙයින් මෙයට ශොක නොකරමි. ඔහුගේ ගතිය යම්සේද එපරිද්දෙන් හෙතෙමේ ගියේය.

**5.** "ඉදින් හඬන්නෙම් නම් කෘෂවූවා වන්නෙමි. ඒ හඬන්නාවූ මට කවර ප්‍රයෝජනයක් වන්නේද? අපගේ නෑයෝ මිත්‍රයෝය. යහළුවෝය යන මොවුන්ගේ නොඇල්ම රතිය වැඩියක් වන්නේය.

**6.** "දවනු ලබන්නේ නෑයන්ගේ හැඬීම නොදනීද එහෙයින් මෙයට ශොක නොකරමි. ඔහුගේ ගතිය යම්සේ වීද එසේ හෙතෙමේ ගියේය.

**7.** "යම්සේ ළදරුවෙක් අහසෙහි ගමන් කරන්නාවූ චන්ද්‍රයා දැක ඉල්වා හඬයිද, යමෙක් පරලොව ගියහුට ශොක කෙරේද, මේ කාරණය මෙබඳුවූ පහලවීම් ඇත්තේයි.

**8.** "දවනු ලබන්නේ නෑයන්ගේ හැඬීම නොදනීද, එහෙයින් මෙයට ශොක නොකරමි. ඔහුගේ ගතිය යම් බඳුවීද, එසේ හෙතෙමේ පරලොව ගියේය.

9. "බ්‍රහ්මය යම්සේත් බිඳුනාවූ දිය කළය නැවත නොගැලපිය හැක්කේය. එපරිද්දෙන් යමෙක් පරලොව ගියහුට අනුව ශොක කෙරේද, මේ කාරණය මෙබඳු නිෂ්පත්ති ඇත්තේයයි" කීයේය.

**355 ඝත ජාතකයඃ-** 1. "ඝත නම් රජ, අන්‍යයෝ ශොක කෙරෙත් හඬත්. අන්‍ය ජනයා කඳුළු සහිත මුහුණු ඇත්තේ වේ. නුඹ ප්‍රසන්නවූ මුඛ වර්ණ ඇත්තේ වෙහිය. කවර හෙයකින් ශොක නොකරෙහිද?

2. "වධකය, ශොකය ඉකුත්වූ අර්ථය නොඑළවන්නේය. නොපැමිණියාවූ සැපය එළවන්නේ නොවේ. එහෙයින් ශොක නොකරමි. එසේමැයි, ශොකයෙහි සහාය බවක් නැත්තේය.

3. "ශොක කරන්නේ පඬුවන් වූයේද කෘශවූයේද වෙයි. ඔහුට බතද රුචි නොවේ. ශොක නමැති හුලෙන් විදින ලද එයින් පෙළෙන්නහුගේ සතුරෝ සතුටු වෙත්.

4. "ගමෙහි හෝ ඉදින් වනයෙහි හෝ වළතැන්හි හෝ නොහොත් ගොඩ තන්හි හෝ මා කරා ඒ ව්‍යසනය නොඑන්නේය. එපරිද්දෙන් මම දක්නා ලද ධ්‍යාන පද නොහොත් අෂ්ටලෝක ධර්ම පද ඇත්තෙමි.

5. "යමෙකුගේ සියලු කැමති සම්පත් රස පමුණුවන්නාවූ අසහායවූ ආත්මය තෙමේ ධ්‍යාන පමුණුවන්ට සමර්ථ නොවේද, එසේම සියලු පොළොවද ඔහුට සැපය නොම වන්නේය."

**356 කාරණ්ඩිය ජාතකයඃ-** 1. "කාරණ්ඩිය, තනිව වනයෙහි කඳුරැළියෙහි නැවත නැවත ඉක්මන් ස්වභාව ඇත්තේ ගල් දමන්නෙහිය. මෙහිලා තට කවර නම් ප්‍රයෝජනයෙක්ද?

2. "මම වනාහි සාගරය විසින් සෙවුනා ලද ඒ මේ පොළොව හස්තතලය මෙන් පාංශු පර්වතයන්ද ගල් පර්වතයන්ද විසුරුවා සම කරන්නෙමි. එහෙයින් කඳුරැළියෙහි ගල් දමන්නෙමි.

3. "කාරණ්ඩිය, මේ පොළොව තනිවූ මිනිසෙක් හස්තතල වැනි කොට සම කිරීමට හැකි නොවේයයි සිතමි. කඳුරැළිය

පිරවීමට උත්සාහ කරන්නේම මේ සත්ව ලෝකය හරින්නෙහියයි හඟිමි.

4. "බ්‍රාහ්මණය, ඉදින් මේ එක් මනුෂ්‍යයෙක් සියලු පොළොව සම කිරීමට සමර්ථ නොවේද, එපරිද්දෙන් නුඹද නොයෙක් දෘෂ්ටි ඇත්තාවූ ඒ මේ මිනිසුන් වසඟ බවට නොපමුණුවන්නෙහිය.

5. "කාරණ්ඩිය, මිනිසෙකු විසින් මේ පොළොව සම කරන්නට යම්සේ නොපිළිවන්ද එසේම මනුෂ්‍යයෝද හික්මවන්නට නොපිළිවන්හයි පින්වතා සුළු වශයෙන් මට වැඩ පිණිස කීයෙහිද, මෙය මෙසේමයයි" කීයේය.

**357 ලටුකික ජාතකයः-** 1. "හැට අවුරුද්දෙන් බස්නා මද ඇති හස්තිරාජය ඔබට වඳිමි. අරණ්‍යයෙහිවූ හස්තීන්ට ස්වාමිය, යසස් ඇත්ත. මාගේ පියාපත් වලින් ඔබට වඳිමි. දුර්වලවූ මාගේ දරුවන් නොනසව.

2. "හස්තිරාජය, ඔබට නමස්කාර කරමි, තනිව ඇවිදින තැනැත්ත, වනයෙහි හැසිරෙන තැනැත්ත, ගල් පර්වත හා පස් පර්වතයන් ගොචර කොට ඇත්ත, ඔබට පියාපත් වලින් වඳිමි. දුර්වලවූ මාගේ දරුවන් නොනසව.

3. "කැටකිරිල්ල, තීගේ දරුවන් මරන්නෙම්මය. තී දුර්වලයෙහිය. දුර්වලවූ තී මට කුමක් කරන්නෙහිද? තී වැන්නියන්ගේ ලක්ෂයකුදු වම් පයින් විශෙෂයෙන් තලා සුණු කරන්නෙමි.

4. "හස්තිරාජය, හැම තන්හිම ශක්තියෙන් කටයුත්තක් නොවේමය. එසේමැයි අඥානයාගේ බලය වනාහි වධය පිණිසවේ. යමෙක් දුර්වලවූ මාගේ දරුවන් මැරීද ඒ තට අනර්ථයක් කරන්නෙමි.

5. "කවුඩාද, කැටකිරිල්ලද මැඩියාද නිලමැස්සාද බලව. මොහු සතරදෙනා එකතුව ශක්තිමත්වූ හස්තියා නැසුවාහුය. වෛර ඇත්තන්ගේ වෛරයේ හටගැන්ම බලව. එහෙයින් යම් කිසිවෙකු සමගද වෛරය නොකරව්යයි" කීයේය.

**358 චුල්ල ධම්මපාල ජාතකය:-** 1. "දෙවයෙනි, මහා ප්‍රතාප නම් රජුට අපරාධ කළ තැනැත්තී නසන ලද වැඩ ඇත්තී මම්මය. එහෙයින් මේ ධර්මපාල කුමරු මුදාවා, මාගේ හස්තයන් කපව.

2. "දෙවයෙනි, මහා ප්‍රතාප නම්වූ රජුට අපරාධ කළාවූ නසන ලද අභිවෘද්ධිය ඇත්තී මම්මය. එසේ හෙයින් මේ ධර්මපාල කුමරු මුදවා ඉදින් කැමැත්තෙහි නම් මාගේ පාදයන් කපව.

3. "දෙවයෙනි, මහා ප්‍රතාප නම්වූ රජුට අපරාධ කළාවූ නසන ලද අර්ථ ඇත්තී මම්මය. එසේ හෙයින් මේ ධර්මපාල කුමරු හරීවා, ඉදින් කැමැත්තෙහි නම් මාගේ හිස කපව.

4. රජ්ජුරුවන්ට උරෙහි ජාතවූ පුත්‍රයා නොමරවයි යම් කෙනෙක් නොකියද්ද, එසේහෙයින් මේ රජුගේ මිත්‍රයෝද අමාත්‍යයෝද, යහළුවෝද, නැත්තාහයි සිතමි.

5. "රජ්ජුරුවන්ට තමහට දාවූ පුත්‍රයා නොමරවයි යම් කෙනෙක් නොකියත්ද, එසේහෙයින් මේ රජහුගේ මිත්‍රයෝද, නෑයෝද, යහළුවෝද, නැත්තාහයි සිතමි.

6. "මුළු පොළොවට හිමිවූ ධර්මපාල කුමරුන්ගේ සඳුන් කල්ක ගැල්වූ අත් දෙක කපනු ලබත්. දෙවයෙනි, මාගේ ප්‍රාණයෝ නිරුද්ධ වෙත්යයි" කීය.

**359 සුවණ්ණමිග ජාතකය:-** 1. "භවත් මෘගය, රන්වන් පා ඇත්ත, වීර්ය කරව. භවත් මහා මෘගය, වීර්ය කරව. වරපටින් කළ පුඩුව සිඳව. මම තනිව වනයෙහි නො ඇලෙන්නෙමි.

2. "වීර්ය කරමි. පුඩුව සිඳින්නට නොහැක්කෙමි. ඉතා වේගයෙන් බිමට ගසමි. මාගේ පාදය හාත්පසින් කැපෙයි.

3. "වැද්දානෙනි, මස් තබන පිණිස කොළ අතුරව ආයුධය මැතට ගණුව. පළමුකොට මා මරා ගෙණ මහා මෘගයා පසුව මරව.

4. "මුවදෙනක මනුෂ්‍ය භාෂාව කියන්නියක් ම විසින් නොඅසන ලදී. දක්නා ලද්දී හෝ නොවෙයි සොඳුර තීද

සුවපත්වෙව. තීගේ ස්වාමිවූ මේ මහා මෘගතෙමේද සුවපත් වේවා.

5. "වැද්දානෙනි, පාශයෙන් මිදුනාවූ මහා මෘගයා දැක අද යම්සේ මම සතුටු වෙම්ද, එපරිද්දෙන් සියලු නෑයන් සමග ඔබද බොහෝ කලක් සතුටු වෙවයි" කීයේය.

**360 සුසන්ධි ජාතකයඃ-** 1. "තම්බ නම් රජ, මිදෙල්ල මල් වල සුවඳ හමයි කුඩා සාගරයද සොෂා ඇත්තේය. මෙයින් වනාහි සුසන්ධි නම් බිසොව දුර පෙදෙසෙක්හි වේ. එසේහෙයින් කාමයෝ නොහොත් තාම්බ්‍රයා විසින් කැමති වූවෝ මා විදිත්.

2. "සාගරය කෙසේ නම් එතෙර වීද? සේරුම නම් දිවයින කෙසේ නම් දුටුවේද? සග්ගය, ඇගේද තාගේද සමාගමය කෙසේ නම් වූයේද?

3. "හරුකච්ඡා නම් පටුණු ගමින් පිටත්ව යන්නාවූ ධන සොයන්නාවූ වෙළෙඳුන්ගේ නැව මෝරුන් විසින් බිඳින ලද මම පුවරු කඩකින් එතෙරට ගියෙමි.

4. "නිරන්තරයෙන් සඳුන් සුවඳ ඇති ඒ භද්‍රාතොමෝ සිළුටුවූ මෘදු වචනයෙන් මා ඖරස පුත්‍රයෙකු මවක මෙන් ඇකයෙන් හෙවත් බාහු යුග්මයෙන් ගොඩ ගත්තේය.

5. "තම්බය, ඒ චිත්‍රලොචනාතොමෝ මා ආහාරයෙන්ද පානයෙන්ද, වස්ත්‍රයෙන්ද, ශයනයෙන්ද සතුටු කළාය. හුදෙක් ආහාරාදියෙන් පමණක් නොව තොමෝ මා අභිරමණය කරන්නී පිණවීයයි" මෙසේ දනුව.

---

# පඤ්චක නිපාතය

## වණ්ණාරොහ වර්ගය.

**361 වණ්ණරොහ ජාතකයඃ-** 1. "වර්ණයෙන්ද ආරොහයෙන්ද උතුම් ජාතියෙන්ද කාය බලයෙන් හා වීර්යයෙන්ද යන මෙයින් සුබාහු නම් ව්‍යාඝ්‍රතෙමේ මට වඩා

උතුම් නොවේයයි ශොභනවූ දළ ඇත්ත මෙසේ කීයෙහි දැයි විචාළේය.

2. "වර්ණයෙන්ද ආරොහයෙන්ද ජාතියෙන්ද කාය බලයෙන්ද නිෂ්ක්‍රමණ වීර්යයෙන්ද මේ සුදාඨ නම් මෘග රාජයා මට වඩා උතුම් නොවේයයි ශොභනවූ බාහු ඇත්ත, මෙසේ තෝ කීයෙහි සැබෑදැයි විචාළේය.

3. "සුබාහු නම් යහළුව, මෙසේම වසන්නාවූ මට ද්‍රොහ කෙරෙහිද, දැන් මම තා සමග එක්ව විසීමට නො කැමැත්තෙමියි.

4. "යමෙක් අනුන්ගේ මිථ්‍යාවචනයන් සැබෑ මෙන් අදහන්නේද, හෙතෙමේ මිත්‍රයා කෙරෙහි වහා බිඳෙන්නේය. බොහෝවූ වෛරයද රැස් කරන්නේයි.

5. "යමෙක් හැම කල්හි අප්‍රමාද වූයේ මිත්‍රයාට විශ්වාසය නොදේද බිඳීමෙහි සැක ඇත්තේ වේද, සිදුරුම සොයන්නේ වේද හෙතෙමේ මිත්‍රයා නොවේ. යම් මිත්‍රයෙකු කෙරෙහි ලයෙහි ජාත පුත්‍රයෙකු මෙන් පවතීද යම් මිත්‍රයෙක් අනුන් විසින් බිඳිය නොහැකි වේද, හෙතෙමේ ඒකාන්තයෙන් මිත්‍රයා වේයයි" කීයේය.

**362 ශීලවිමංස ජාතකයඃ-** 1. "ශීලය උතුම්වේ. ශ්‍රැතයද හෙවත් උගත්කමද උතුම්යයි මෙසේ මට සැකයක් විය. ශ්‍රැතයට වඩා ශීලයම උතුම්වේයයි කීමෙහි මට සැකයක් නැත.

2. ක්ෂත්‍රියාදී ජාතියද රූප වර්ණයද හිස්ය. ශීලයම උතුම්වේමැයි ඒ එසේමැයි ශීලයෙන් යුක්ත නොවන්නාහට ශ්‍රැතයෙන් ප්‍රයෝජනයක් නැත.

3. "අධර්මයෙහි පිහිටියාවූ ක්ෂත්‍රිය තෙමේද අධර්මයන් ඇසුරු කළාවූ වෛශ්‍ය තෙමේද යන ඒ දෙදෙනා දිව්‍ය මනුෂ්‍ය යන දෙලොව හැර අපායෙහි උපදිත්.

4. "ක්ෂත්‍රියයෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය, ශුද්‍රයෝය, චණ්ඩාලයෝය, බඹුරෝය යන මොහු මෙලොව දස කුසල ධර්මයෙහි හැසිර දෙව්ලොවදී සමවූවාහු වෙත්.

5. "වේදයෝද පරලොව පිණිස නොවන්නාහ. ජාතියද පරලොව පිණිස නොවේ. නෑයෝද පරලොව පිණිස නොවන්නාහ. පිරිසිදුවූ ස්වකීය ශීලයම පරලොව සුව පිණිසද මෙලොව සුව පිණිසද වන්නේයි."

**363 හිරි ජාතකය:-** 1. "ලජ්ජාව දුරු කරන්නාවූ මිත්‍ර භාවයෙන් පිළිකුල් කරන්නාවූ තාගේ මම මිත්‍ර වෙමියි" මෙසේ වචනයෙන් පමණක් කියන්නාවූ උතුම් කටයුතු දෙමියි. කෙරෙමියි හෝ නොකරන්නාවූ පුද්ගලයා මාගේ මෙතෙමේ මිත්‍රයෙක් නොවෙයි කියා මෙසේ ඔහු දැන ගන්නේයි.

2. "යමක් වනාහි කරන්නේද එයම කියන්නේය. යමක් නොකරන්නේද එය නොකියන්නේය. නොකරණ දෙය වචනයෙන් කියන්නාවූ ඔහු පණ්ඩිතයෝ දැනගණිත්.

3. "බිඳීමෙහි සැක කරන්නාවූ වරදම බලන සුළුවූ යමෙක් හැමකල්හි අප්‍රමාද වූයේ මිත්‍රයාට විශ්වාසය නොදේද, හෙතෙමේ මිත්‍ර නොවේ. අනුන් විසින් හෙද කළ නොහැකිවූ යමෙක් යමෙකු කෙරෙහි වනාහි උරෙහි ජාත පුත්‍රයෙකු මෙන් පවතීද හෙතෙමේ ඒකාන්තයෙන් මිත්‍රයාවේ.

4. "පුරුෂයා පිළිබඳවූ බර උසුලන්නාවූ ඵලයද ආනිශංසයද විඳිනු කැමැත්තේ සතුටුවීමට කරුණුවූ ප්‍රශංසා එළවන්නාවූ සැපය වඩයි.

5. "ධර්ම ප්‍රීති රසය බොන්නේ උසස් විවේක රසයද කෙලෙස් සංසිඳීමෙන් ලැබූ රසයද පානය කොට හෙතෙමේ පහවූ කෙලෙස් පීඩා ඇත්තේ වේ. කෙලෙස් තැවීමෙන් පාප රහිතද වේ."

**364 ඛජ්ජොපනක ජාතකය:-** මෙය මතු දැක්වෙන උම්මග්ග ජාතකයෙහිදී විස්තර වන්නේය.

**365 අහිගුණ්ඨික ජාතකය:-** 1. "යහළු සුමුඛය, මිදුනේ වීමි. දූ කෙළියෙහි පැරදුනේ අඹ ගෙඩි මට හෙලව. තාගේ වීර්යය අනුභව කරමු.

2. "යහලුව, මට අවිද්‍යමාන ගුණයෙන් ප්‍රශංසා කෙරෙහි එය ඒකාන්තයෙන් බොරුය කුමක් හෙයින්ද යත්? වානරයෙක් ශොභනවූ මුහුණු ඇත්තේයයි තා විසින් කවර තැනක අසන ලද්දේ හෝ දක්නා ලද්දේ හෝ වේද?

3. "අහිගුණ්ඨිකය, මත්වූ තෝ සයින් පීඩිතවූ මට වැල්පෙට්ටියට ඇතුළුකොට යම් හෙයකින් වේවැලින් පහරගැසීද එය දැනුදු මාගේ සිතෙහි වේ.

4. "ඒ දුක්වූ සයනය සිහි කරන්නාවූ මම ඉදින් රාජ්‍යයද කරවන්නෙහි වී නමුත් ඉල්වන ලද්දෙම් තට එක අඹ ඵලයකුත් නොදෙමි. එසේමැයි භයින් තැති ගත්තේ වෙමි.

5. "පූජ්‍ය කුලයෙහි උපන්නාවූ සුභොජන රසයෙන් මාතෘ ගර්භයෙහි දෝහෝ නොහොත් අලංකෘත සයන ගර්භයෙහි තෘප්තවූ නොමසුරුවූ යමක්හු වනාහි උපදීද, ඔහු සමග යහළුකමද මිත්‍රභාවයද ප්‍රාඥාතෙමේ ගැලපීමට සුදුසුයයි" කීයේය.

**366 ගුම්බිය ජාතකයඃ-** 1. "මී වැනි පැහැ ඇති මී බඳු රස ඇති, මී මෙන් සුවඳ ඇති විෂයක් විය. ගුම්බිය නම් යක්ෂයා තමාට ආහාරයක් සොයන්නේ වනයෙහි විෂ තැබූයේය.

2. "මීයයි සිතන්නාවූ යමක්හු වෙද්ද, ඔව්හු ඒ විෂ කෑවාහුද, ඔවුන්ට ඒ විෂ කටුක විය. එයින් මරණයට පැමිණියාහ.

3. "යම් කෙනෙක් වනාහි නුවණින් සළකා ඒ විෂය දුරුකළාහුද, ඔහු මරණාසන්නවූවන් අතුරෙහි සුවපත් වූහ. විෂයෙන් දවන්නවුන් අතුරෙහි නිවුනාහ.

4. "එපරිද්දෙන්ම මිනිසුන් කෙරෙහි රූපාදී පංච කාමයෝ ඒ ඒ තන්හි බහාලන ලද්දාහු විෂයයි දතයුත්තාහුය. මේ පංච කාම ගුණය ආමිෂයවේ. බන්ධනයවේ. මේ පංච කාම ශරීර නමැති ගුහාවෙහි සයනය කරන්නාවූ මාරයාවේ.

5. "එපරිද්දෙන්ම කෙළෙස් නමැති පරිවාරකයන් ඇති මේ පංච කාම ගුණයන් මරණාසන්නවූ යම් නුවණැති මනුෂ්‍යකෙනෙක් හැමකල්හිම දුරු කෙරෙත්ද, ඔහු ලෝකයෙහි රාගාදීවූ ක්ලෙශයන් ඉක්මෙව්වාහු වෙත්."

**367 සාලිය ජාතකයා:-** 1. "යම් මේ දුෂ්ට වෙදෙක් සැළලිහිණිපැටියා යයි කෘෂ්ණ සර්පයා කිසිවක් නොදත් බාළයෙකු ලවා ගැන්වීද, එසේවූ මේ ලාමකවූ අනුශාසකයා ඒ සර්පයා විසින් දෂ්ට කරණලද්දේ නැසුනේය.

2. "යම් මිනිසෙක් තමා කිසිවකින් නොගසන්නාවූ නොනසන්නාහු නසන්නට කැමති වේද, හෙතෙම යම්සේ මේ පුරුෂයා නැසුනේද, එසේ නැසුනේ සයනය කෙරෙයි.

3. "යම් මිනිසෙක් තමා කිසිවකින් නොගසන්නාවූ කිසිවෙකු නොමරන්නාහු නසන්නට කැමතිවේද, හෙතෙම යම්සේ මේ පුරුෂයා නැසුනේද එපරිද්දෙන් නටුයේ මරණ සෙයාාවෙන් සයනය කෙරෙයි.

4. "යම්සේ පස් මිටක් පුරුෂයෙක් උඩු සුලඟට දන්නේද, ඒ ධූලි යම්සේ ඔහුටම ගසාද, එපරිද්දෙන් මේ පුරුෂ තෙම නැසුනේවේ.

5. "නිරපරාධවූ කෙලෙස් රහිතවූ කිසි දොසක් නැත්තාවූ මිනිසෙකුට ද්වෙෂ කෙරේද, උඩු සුළඟට දමනලද සියුම්වූ ධූලි මෙන් ඒ අඥානයා කරාම පාපය පෙරලා එන්නේ යයි" කීයේය.

**368 තචසාර ජාතකයා:-** 1. "හුණ දන්ඩෙන් බඳනා ලදුව සතුරන් අතට පත්වූ තෙපි ප්‍රසන්නවූ මුඛ වර්ණ ඇත්තහුය. තෙපි කුමක් හෙයින් ශොක නොකරව්ද,

2. "ශොක කිරීමෙන්ද හැඬීමෙන්ද ස්වල්පවූ ප්‍රයෝජනයකුත් නොලැබිය හැක්කේමය. ශොක කරන්නාවූ දුකට පැමිණියාවූ මොහු දැන සතුරෝ සතුටු සිත් ඇත්තාහු වෙත්.

3. "වැඩ අවැඩ දන්නාවූ පණ්ඩිතතෙම යම්හෙයකින් වනාහි ආපදාවන්හි කම්පා නොවේද, එහෙයින් මොහුගේ විකාරයට නොපැමිණියාවූ පෙර මෙන් තුබූ මුහුණ දැක සතුරෝ දුකට පැමිණියාහු වෙත්.

4. "මන්ත්‍ර ජප කිරීමෙන්ද මන්ත්‍රණය කිරීමෙන්ද ප්‍රිය වචන කීමෙන්ද, අල්ලස් දීමෙන්ද පරම්පරාව කීමෙන්ද යන මෙයින්

යම් යම් පරිද්දෙකින් යම් තැනක වැඩක් හෝ දියුණුවක් ලබන්නේද, ඒ ඒ පරිද්දෙන් එතැනදී උත්සාහ කරන්නේයි.

5. "මා විසින් හෝ අනිකෙකු විසින් හෝ මේ අර්ථය ලබන්ට නොපිළිවනැයි යම්හෙයකින් දන්නේ නම් ශොක නොකරන්නේ දැඩිවූ අකුශල කර්මය කෙළේනම් දැන් කුමක් කෙරෙම්දැයි ඉවසන්නේයයි" කීයේය.

**369 මිත්තවින්ද ජාතකයඃ-** 1. "යම් කරුණකින් චක්‍රය මාගේ හිසෙහි පැහැර මස්තකයෙහි කැරකේද, එහෙයින් මම දෙවියන්ට කිනම් වරදක් කෙළෙම්ද, මා විසින් කවර නම් පාපයක් කරණ ලදද,

2. "පළිඟු ප්‍රාසාදයද රිදී ප්‍රාසාදයද මැණික්මය ප්‍රාසාදයද රත්රන් ප්‍රාසාදයද ඉක්මවා කවර නම් කාරණයකින් මෙහි ආයේද, මෙයට වඩා මෙහි සම්පත් ඉතා බොහෝ වන්නාහයි හැඟීම් මෙසේ මේ හැඟීමෙන් ව්‍යසනයට පැමිණියාවූ මා බලව.

3. "සතර දෙනෙකුගෙන් නොසතුටුව අට දෙනෙකු ළඟට ගියේය. අටදෙනෙකු කෙරෙනුදු නොසතුටුව සොළොස් දෙනෙකු ළඟට ගියේය. සොළොස් දෙනෙකුගෙන්ද නොසතුටුව දෙතිස් දෙනෙකු ළඟට ගියේය. වැඩි වැඩියත් පතන්නේ උර චක්‍රයට ලංවිය තෘෂ්ණාවෙන් නසනලද පුරුෂයාගේ මස්තකයෙහි උර චක්‍රය කැරකේ.

4. "මත්තෙහි විශාලවූ පුරවන්ට නොහැකිවූ ආසාවෙන් පැතිර පවත්නාවූ ඒ තෘෂ්ණාව යම් කෙනෙක් අනුව ගිජු වෙත්ද, ඔහු උර චක්‍රය දරන්නාහු වෙත්යයි" කීයේය.

**370 පළාස ජාතකයඃ-** 1. හංසතෙම පළාසයාට කීය. "යහළුව, නුග ගසෙක් හටගණියි. තාගේ ඇකයෙහි හෙවත් වෙළෙප්හී හුන්නාවූම ඒ නුගගස තාගේ මරුතැන් සිඳින්නේයි.

2. නුග ගස වැඩෙන්නේම වේවා මොහුට මම පියා හෝ මව හෝ මෙන් පිහිට වෙමි. මෙතෙම මෙසේ වන්නේය.

3. "යම් හෙයකින් තෝ භයානකවූ කිරි ගස ඇකයෙහි වඩන්නෙහිද, එහෙයින් තා ආමන්ත්‍රණය කොට යවූ කුමක් හෙයින්දයත්? මේ නුග ගසේ වැඩීම මට රුචිනොවේ.

4. "දැන් වනාහි මා භයගන්වයි හංසරාජයාගේ මහමෙර හා සමානවූ වචනය අසා නොදැන මට මහත්වූ භය පැමිණියේය.

5. "වැඩෙන්නාවූ යමෙක් තමාගේ මුල් පිහිට නසාද, ඔහුගේ වැඩීම නුවණැත්තන් විසින් පසස්නා ලද්දී නොවෙයි. ඔහුගේ විනාශය සැක කරන්නාවූ ප්‍රාඥතෙම මුලින් නැසීමට යත්න කරන්නේයයි" කීයේය.

---

## අට්ඨ වර්ගය

**371 දීඝීති කොශල ජාතකය:-** 1. රාජය, මාගේ වසඟ බවට ආවාවූ මෙබඳුවූ තොපගේ යම්කිසි කාරණයෙක් තා මේ දුකින් මුදන්නේද, එසේවූ කාරණයක් ඇත්ද,

2. "දරුව, තාගේ වසඟ බවට ආවාවූ මෙබඳුවූ මාගේ යම්කිසි කාරණයෙක් මා මෙබඳු දුකින් මුදාද, එසේවූ කාරණයෙක් නැත්තේය.

3. "රාජය, සුචරිතයට වඩා අනිකක් මරණ කාලයෙහි රක්ෂා නොකරන්නේය. රජ, ශුභාෂිතයට වඩා මරණ කාලයෙහි අනිකක් රක්ෂා නොකරන්නේය මෙයින් අන්‍යවූ මුක්තා මාණික්‍යාදී ධනයද මෙසේ මැයි.

4. "මට ආක්‍රොශ කෙළේය. මට ගැසුවේය. මා දිනුවේය. මා අයත් දෙය හැරගත්තේ යයි මෙසේ යම් කෙනෙක් ඒ සිත බැඳගණිත්ද, ඔවුන්ගේ වෛරය නොසංසිඳේ.

5. "මට ආක්‍රොශ කෙළේය. මට ගැසුවේය. මා දිනුවේය. මාගේ අයිති දෙය හැර ගත්තේයයි යම් කෙනෙක් ඒ සිත බැඳ නොතබත්ද, ඔවුන්ගේ වෛරය සංසිඳේ.

6. "මෙහි වෛරයෙන් වෛරයෝ කිසිකලෙකත් නොම සංසිඳෙත් වෛර නොකිරීමෙන්ම සංසිඳෙති. මෙතෙම සත්පුරුෂයන්ගේ ප්‍රවේණි ධර්මය වේයයි" වදාළේය.

**372 මිග ජාතකය**:- 1. "පරලොව ගියහු අනුව ශොක කෙරෙහි යන යමක් ඇද්ද, එය ගිහිගෙන් ඉවත්වූ අනගාරික වූ ශ්‍රමණවූම තොපට සුදුසු නොවේ.

**2.** "ශක්‍රය, ඒකාන්තයෙන් එක්ව විසීමෙන් මනුෂ්‍යයාගේද මෘගයාගේද හෘදයෙහි ප්‍රෙමය හටගණියි. එය ශොක නොකරන්නට නොපිළිවන.

**3.** "මළහුටද මැරෙන්නහුටද, යම් කෙනෙක් හඬත්ද, ඔව්හු හඬත්මය වැළපෙත්මය. ඍෂිය, නොහඬව, ඒ හැඬීම සත්පුරුෂයෝ හිස් යයි කීහ.

**4.** "බ්‍රහ්මය, ඒකාන්තයෙන් හැඬීමෙන් මළාවූ පරලොව ගිය තැනැත්තේ නැගී සිටින්නේ නම් සියල්ලෝ එකතුව ඔවුනොවුන්ගේ මළ නෑයන්ට හඬමු.

**5.** "ගිතෙලින් ඉසිනලද ගින්නක් මෙන් ශොකයෙන් ඇවිළුනාවූම මා ඒකාන්තයෙන් ජලයෙන් ඉසින්නාක් මෙන් සියලු පීඩාව නිවූයේය.

**6.** "ශොකයෙන් පෙළුනාවූ මාගේ පුත්‍ර ශොකය යමෙක් දුරු කෙළේය. හෙතෙම මාගේ හෘදය ඇසුරු කළාවූ යම් ශොක නමැති හුලක් වීද, එය ඒකාන්තයෙන් උදුරා දැමීය.

**7.** "ශක්‍රය, ඒ මම උදුරණලද ශොක හුල ඇත්තේ වෙමි. එහෙයින් පහවූ ශොක ඇති නොකැළඹුනු සිත් ඇති මම ඔබගේ වචනය අසා ශොක නොකරමි. නොහඬමි."

**373 මූසික ජාතකය**:- 1. "කොයි ගියාදෝ, කොයි ගියාදෝ'යි කියා මෙසේ ජනතෙම වැළපෙයි. මුෂිකා තොමෝ ලිඳ ළඟ නසන ලද්දීයයි තනිවූ මමම දනිමි.

**2.** "යම්සේ මෙසේද මෙසේද පහරදීමට අවකාශ සොයමින් කොටළුවෙකු මෙන් පසුබස්නෙහිද, එසේ හෙයින් මේ කාරණය දනිමි. ලිඳ ළඟ, මූෂිකා නම් දාසිය නසා යවනම් රජුද නසන්ට කැමැත්තෙහිද,

**3.** "දුෂ්ප්‍රාඥය, තරුණද වෙහි, ප්‍රථම වයසින් යුක්ත වූයේද වෙහි. යෞවනද වෙහි. දික්වූද මේ යෂ්ටියෙන් යුත් ආයුධයක් එල්බගෙණ සිටියෙහි. තාගේ ජීවිතය නොදන්නෙමි.

4. "අහසෙහිවූ දිව්‍ය භවනයෙන්ද, ශරීරාවයව හා සමානවූ පුත්‍රයා කරණකොටගෙණද මිදුනේ නොවෙමි. කෙසේ මිදුනේද යත්, පුත්‍රයා විසින් මරණය පතන ලද්දේ බන්ධනය කොට දුන් ගාථාවලින් මිදුනේ වෙමි.

5. "ලාමකවූද, උසස්වූද, මධ්‍යමවූද, සියලු විද්‍යාව හදාරන්නේය. සියලු ශාස්ත්‍රයාගේ අර්ථය දැනගන්නේය. සියලු ශාස්ත්‍රය නොම ප්‍රයොග කරන්නේය. යම් කලෙක උගත් ශාස්ත්‍රය අර්ථ එලවයිද, එබඳුවූ කාලයක් වේයයි' කීයේය.

**374 චුල්ල ධනුග්ගහ ජාතකයඃ-** 1. "බමුණ, සියලු භාණ්ඩය ගෙණ පරතෙරට පැමිණියේ වෙහි. වහාම නැවත එව. දැන් මේ නදියෙන් මාද වහා එතෙර කරව.

2. "පින්වතිය, සංසර්ගයක් නොකළාවූ අභිනවවූ මා දිගු කලක් කරණලද සංසර්ග ඇති, ස්ත්‍රීරවූ (ඒ ස්වාමියා කෙරෙන්) පරිවර්තනය කෙළෙහි නම් පින්වතිය, තී මා කෙරෙනුදු අනිකෙකු පෙරළා ගන්නේය. එහෙයින් මෙයින් ඉතා දුරකට මම යන්නෙමි.

3. "තුවරගස් ලැහැබෙහි මේ කවර නම් තැනැත්තියක් මහසිනා කෙරේද, නෘත්‍යයක් හෝ ගීතයක් හෝ මොනවට පවත්වන ලද කුලුතාලමක් හෝ මෙහි නැත. සුන්දරවූ කළවා ඇති ශොභනවූ තැනැත්තිය, හැඬිය යුතු කාලයෙහි කුමක් හෙයින් මහසිනා කෙරෙහිද,

4. "අඥානවූ නුවණනැත්තාවූ ජම්බුකය. තෝ ප්‍රඥා නැත්තෙහි වී. මත්ස්‍යයාද මස්පිඬද යන දෙකින් පිරිහුනේ බැගෑපත්වූවෙකු මෙන් සිතන්නෙහි.

5. "අනුන්ගේ වරද දැකීමට පහසුවේ. තමාගේ වරද වනාහි දක්නට නොහැක්කේය. එහෙයින් නුඹද, සැමියාද සොර සැමියාද යන දෙදෙනාගෙන් පිරිහුනි. මා මෙන් සිතන්නෙහිය.

6. "මෘගරාජවූ ජම්බුකය, යම්සේ කීයෙහිද, මෙය මෙසේමය. ඒ මම ඒකාන්තයෙන් මෙයින් ගොස් අනික් හිමියෙකු ලැබ වසඟ බවට අනුව යන්නියක් වන්නෙමි.

7. "යමෙක් මැටි තළියක් සොරාගණීද, හෙතෙම බොහෝ තළියකුදු සොරා ගන්නේය. තී විසින් පාපය කරණ ලද්දේමය. නැවතද මෙසේ කරන්නෙහියයි" කීයේය.

**375 කපොත ජාතකයː-** 1. "දැන් වනාහි පරවි තෙමේ නික්ම ගියේය. එහෙයින් සුවපත් වූයේ නිරෝගි වූයේ සතුරු නමැති කටු රහිතවූයේ වෙමි. දැන් මාගේ සිතට සතුටක් කරන්නෙමි. එසේමැයි මේ මාංශයද අවශෙෂ රසයද මට බල කරයි.

2. "මේසය, මුත්තනුවන් කොට ඇති සෙරවූ සිඛා ඇති මේ කෙකණි කවරක්ද, කෙකින්න මැතට නැගී එව, මාගේ යහළුවූ කවුඩා චණ්ඩවේ.

3. "අරක්කැමි පුත්‍රයා විසින් සිඳිනාලද පියාපත් ඇති පිටි කළලින් මැඬීමෙන් ගැල්වූ මෙබඳු වූ මා දැක තාගේ සිනාසීමෙන් කම් නැත.

4. "මනාකොට නගන ලද්දේ මනාකොට විලවුන් ගල්වන ලද්දේ වෙහිය. ආහාරපානයෙන් සන්තර්පණය කරණ ලද්දෙහිය. තාගේ ග්‍රීවයෙහි වෛඩූර්යය මාණිකායෙක. එහෙයින් බරණැස් නුවරට ගියේද,

5. "තාගේ මිත්‍රයෙක් හෝ අමිත්‍රයෙක් හෝ බරණැස් නුවරට නොයේවා. කුමක්හෙයින්දයත්, එහිලා පියාපත් සිඳ දමා බොටුවෙහි කැබිලිත්ත බඳිත්.

6. "යහළුව, නැවතද මෙබඳු දුකකට පැමිණෙන්නෙහිය තාගේ ස්වභාවය වනාහි එබඳුමය. මිනිසුන් අයත්වූ සම්පත්තීහු පක්ෂියෙකු විසින් සුවසේ අනුභව කළහැකි නොවෙත්යයි" කීයේය.

---

# ඡක්ක නිපාතය

## අවාරිය වර්ගය.

**376 අවාරිය ජාතකයः-** 1. "පෘථිවීශ්වරයාණෙනි, නොකිපුන මැනවි. රාජොත්තමය, නොකිපෙනු මැනවි. කිපුනහුට නැවත නොකිපෙන්නාවූ රජතෙම රටවැස්සා විසින් පුදනු ලද්දෙක් වේ.

2. "ගමෙහි හෝ (නොහොත්) වනයෙහි හෝ වලතැන්හි හෝ (නොහොත්) ගොඩබිමෙහි හෝ සියලු තන්හි නුඹ වහන්සේට අනුශාසනා කරමි. රාජොත්තමය, නොකිපුණ මැනව.

3. "ගංගාවෙහි අවරියපිතා නම් වූ නැවියෙක්වී. හෙතෙම පළමුකොට මගී ජනයා එතෙර කොට පසුව වැටුප් ඉල්වයි. ඒ කාරණයෙන් ඔහුගේ දබරය වේ. භොගයෙන්ද නොවැඩේ.

4. "දරුව, නාවිකය, මෙතෙර සිටියාවූ එතෙර නොවූම ජනයාගෙන් වැටුප් ඉල්වව. පරතෙරට ගියහුගේ සිත අනිකෙක්මැයි. (වැටුප් නොදී යනු කැමතිවෙයි.) එතෙරවීම සොයන්නහුගේ සිත අනිකක් වේ. (හෙවත්) වැඩියකුත් දී යනු කැමතිවේ.

5. "ගමෙහි හෝ (නොහොත්) වෙනෙහි හෝ වලෙහි හෝ (නොහොත්) ගොඩෙහි හෝ සියලු තන්හි තොපට අනුශාසන කරමි. නාවිකය, නොකිපෙව,

6. "යම්බඳු අනුශාසනාවකින්ම රජතෙම ගම්වරක් තපස්වීහට දුන්නේද, ඒ අනුශාසනාවෙන්ම නාවිකතෙම තපස්වීහුගේ මුඛයට පහර දුන්නේය.

7. "බත්තළිය බිඳිනාලදී. භාර්යාතොමෝ නසනලදී. දරුගර්භයද, භූමියෙහි හෙළනලදී. පාගාපසුකොට ගියාවූ ස්වර්ණයෙන් මුවෙකු මෙන් ඒ අවවාදයෙන් ඒ අඥානවූ තොටියා තමහට අභිවෘද්ධියක් නිපදවන්ට නොහැකිවූයේයයි" කීයේය.

**377 සේතකේතු ජාතකය:-** 1. "දරුව, සේතකේතු නම් තැනැත්තෙනි, නොකිපෙව, ක්‍රොධ කිරිම යහපත් නොවේ. තා විසිනුදු නොදක්නා ලද්දද, නොඅසනලද දෙයද බොහෝ වෙයි. මවු පිය දෙදෙන දරුවන්ට පූර්වදිශා බව වේ. ආචාර්යයෝ දක්ෂිණෙය හෙයින් දිශාවන්ගෙන් ප්‍රශස්තවූ දක්ෂිණ දිශාවයයි බුද්ධාදී ආර්යයෝ කියත්.

**2.** "සේතකේතුව, ආහාර දෙන්නාවූ පාන වර්ග දෙන්නාවූ වස්ත්‍ර දෙන්නාවූ දත් පිණිස කැඳවන්නාවූ යම් ගෘහස්ථ කෙනෙක් ඇද්ද? එයද දිශාවකැයි බුද්ධාදීහු කියති. (නොහොත්) ආහාර දෙන්නාවූ පානවර්ග හා වස්ත්‍ර දෙන්නාවූ යම් ගෘහස්ථයෝ වෙද්ද? ඔවුන්ට සදෙව් ලොව සම්පත් දීමෙන් මතු මතු කැඳවන ශ්‍රමණ බ්‍රාහ්මණයන්ද බුද්ධාදීන් උපරිම දිශායයි කියති. යම් දිශාවකට පැමිණ දුක්පත් ජනයෝ සුවපත් වෙද්ද, මේ දිශාතොමෝ උතුම්වේ.

**3.** "රළුවූ අඳුම්දිවි සම් අඳින්නාවූ ජටාමඩුළු බැන්දාවූ මළ සහිත දත් ඇත්තාවූ කිළුටුවූ ස්වභාවය ඇත්තාවූ යම් මේ තපස්වී කෙනෙක් ඇද්ද, ඔහු මන්ත්‍ර ජපකෙරෙද්ද, කිමෙක්ද, මෙය දන්නාවූ මොව්හු අපායෙන් මිදුනාහු වෙද්ද?

**4.** "රජ ඉදින් බහුශ්‍රැතයෙකුදු (හෙවත්) බොහෝ උගතෙකුදු පව්කම්කොට කුශල ධර්මයෙහි නොහැසිරෙන්නේ නම් සහශ්‍රවේදයාගේ (හෙවත්) දහස් ගණන් වේද දත් තැනැත්තේද ඒ දැනීම නිසා ශීලයට හා අෂ්ටසමාපත්තියට නොපැමිණ දුකින් නොමිදෙන්නේය.

**5.** "සහශ්‍රවේද, වූයේද, ශීලයට නොපැමිණ, ඒ බහුශ්‍රැතභාවය නිසා දුකින් නොමිදෙන්නේද, එහෙයින් වේදයෝ නිෂ්ඵල වෙත් යයි හඟිමි. එසේමැයි ශීලය සහිතවූ චරණයම එක් සත්‍යයකි.

**6.** "වේදයෝ නිෂ්ඵලවූවාහු නොමවෙත්. ශීලය සහිත වූ චරණ ධර්මසංඛ්‍යාත සමාපත්තියම උත්තමය. ඒ එසේමැයි වෙදයන් හදාරා කීර්තියට පැමිණේ. නැවත චරණධර්ම කරණකොටගෙණ දැමුනේ නිවනට පැමිණේයයි" වදාළේය.

**378 දරීමුඛ ජාතකය**:- 1. "බ්‍රහ්මදත්තය, කාමයෝ නම් පංකය හෙවත් මඩ වැනිද වේ. කාමයෝ නම් පැතුරුණු මඩෙකි, එහෙයින් තුන් මුලකින් සිටියාක් මෙන් අචලවූ මේ කාමය මහත් භයකැයි කියනලදී. රජය යයිද ධූමයයිද මා විසින් ප්‍රකාශකරණලදී. මේ කාමයන් හැර නුඹ පැවිදිවෙව.

2. "බ්‍රාහ්මණය, කාමයන්හි ගැටගැසුනාවූද, ඇළුනාවූද, අතිශයින් මූර්ඡාවූද, ජීවිකාවෙහි කැමතිවූ මම භයජනක ස්වභාවය ඇති ඒ කාමය දුරුකරන්ට උත්සාහ නොකරමි. එහෙයින් බොහෝ වූ පිංකරන්නෙමි.

3. "වැඩ කැමතිවූ හිත සිතින් අනුකම්පා කරන්නහු විසින් අවවාද කරණු ලබන්නාවූ යමෙක් මෙයම උතුම්යයි සිතමින් අනුශාසනය නොකෙරේද, අඥානවූ හෙතෙම නැවත නැවත මාතෘගර්භයට පැමිණෙන්නේය.

4. "සසර බියපත්වූ සිත වඩන්නවුන්ට අශුභවූ මළ මුත්‍ර වලින් පිරුනාවූ දරුණු ස්වභාව ඇති මවු කුසයයි කියනලද නරකයට පැමිණෙන්නේය. යම් කෙනෙක් කාමයන්හි පහනොවූ රාග ඇත්තාහු, ගිජුවූවාහු, ඇළුනාහු වෙද්ද ඔව්හු ඒ මවුකුස වාසය නොහරිත්.

5. "අශුචියෙන් තැවරුණාවූ, ලෙයින් වැකුණාවූ සෙමෙන් තැවරුණ වූ සත්වයෝ නික්මෙන්නාහුද, යමක් යමක්ම ශරීරයෙන් ස්පර්ශ කෙරෙද්ද, ඒ සියල්ල එකෙණෙහි අමධුරය. හුදෙක් දුක්මැයි අනිකෙකු කෙරෙන් අසා නොම කියමි. පෙරවිසූ කඳපිළිවෙළ දැක කියමි. බොහෝකොට පූර්වෙනිවාසය මම සිහිකරමියි වදාළේය.

6. "මහණෙනි, දරීමුඛ නම් පසේබුදුතෙම විසිතුරුවූ මනාකොට කියනලද ගාථාවලින් යහපත් නුවණැති රජු තමාගේ වචන ගැන්වීය."

**379 නේරු ජාතකය**:- 1. "වන කව්ඩෝද, පක්ෂි රාජවූ අපිද යන සියල්ලෝම මේ පර්වතයට පැමිණ සමාන වෙමු.

2. "මේ පර්වතයෙහි සිංහයෝද, ව්‍යාඝ්‍රයෝද, මෘගාධමවූ හිවල්ලුද යන සියල්ලෝම සමාන වෙත්. මේ පර්වතය කිනම් වේද,

3. "මේ උතුම් පර්වතය මිනිස්සු සවර්ණ පර්වතයයි කියා දනිත්. මේ පර්වතයෙහි සියලු ප්‍රාණීහු වර්ණයෙන් යුක්තව වාසය කරත්.

4. "යම් තැනෙක්හි සත්පුරුෂයන්ට සම්භාවනා නොකිරීම හෝ අවමන් කිරීම හෝ හීනයන්ට සම්මාන කිරීම හෝ වන්නීද එහි විසීමද නොවසන්නේය.

5. "යම් තැනෙක්හි අලසයාද, දක්ෂයාද, ශූරයාද, බියසුල්ලාද යන මොහු පිදියයුත්තාහු වෙද්ද, විශෙෂයක් නොකරණ ඒ පර්වතයෙහි සුජනයෝ නොවසන්නාහුය.

6. "මේ ස්වර්ණ පර්වතය හීනය, උත්කෘෂ්ටය මධ්‍යමය, යන සියල්ලන් විභාග නොකෙරෙයි. මේ ස්වර්ණ පර්වතය විශෙෂයක් නොකෙරෙයි. එබැවින් ස්වර්ණ පර්වතය අත්හරිමුයි" කීයේය.

**380 ආසංක ජාතකයඃ-** 1. "චිත්‍රලතා වනයෙහි ආසාවතී නම් වූ ලතාවක් හටගත්තීය. ඒවැලේ අවුරුදු දහසකින් එක් ගෙඩියක් හටගණියි. ඒතාක් දුරවූ එල ඇති කල්හී ඒ ලතාවට දේවතාවෝ නැවත නැවත පැමිණෙත්.

2. "රාජය, නුඹද ප්‍රාර්ථනා කරන්නෙහිමය. ඒ එසේමැයි. එලවත්වූ ආසාතොමෝ සැප වන්නීයයි ඒ පක්ෂිතෙම ප්‍රාර්ථනා කරන්නේමය. ඒ පක්ෂිතමෙ ලබමියි පතන්නේමය.

3. "ඔහුගේ ඒතාක්දුර ගියාවූද ආසාතොමෝ සමෘද්ධවීමය එසේ හෙයින් රාජය, නුඹද ප්‍රාර්ථනාම කරව. කුමක්හෙයින්ද යත්, එලවත්වූ ප්‍රාර්ථනාතොමෝ සුව ඇත්තීමැයි.

4. "සුවඳ නැත්තාවූ වර්ණවත්වූ මහරි වෘක්ෂයාගේ මල් මෙන්ම මා වචන මාත්‍රයකින් සතුටු කෙළෙහිය. ක්‍රියාවෙන් සතුටු නොකෙළෙහිය.

5. "යමෙක් නොදෙන්නේ සම්පත් නොහරින්නේ යාළුවන් කෙරෙහි නිෂ්ඵලවූ මියුරුවූ වචන කියාද, ඔහු සමග මොහුගේ මිත්‍රසන්ථවය නොගැලපේ.

6. "යමක් වනාහි කරන්නේද, හෙම කියන්නේය. යමක් නොකරන්නේද, එය නොකියන්නේය. ඒ නොකරන්නහු කෙරෙමියි වචනයෙන් කියන්නහු නුවණැත්තෝ දැනගණිත්.

7. "ඒකාන්තයෙන් මාගේ බලයද, අවිය. මාර්ගොපකරණයද, නැත්තේය. එසේහෙයින් ප්‍රාණයාම මගේ වැළැක්මෙහි සැක කරමි. එබැවින් දැන් හැරයෙමි.

8. "රාජොත්තමය, මෙහිලා යම්බඳු නමක් ඇද්ද, මෙයම මාගේ නාමය වේ. මහරජ බලාපොරොත්තුවෙව, මම පියා කැඳවමියි" කීයේය.

381 **මිගාලොප ජාතකයː-** 1. "මිගාලොපය, යම්බඳුවූ තාගේ එබඳුවූ ගමන මට රුචි නොවීය. පුත්‍රය, අත්‍යන්ත දෙශයට හෙවත් ඉතා උඩටයෙහිය, පුත්‍රය, තට නුසුදුසු භූමිය සේවනය කෙරෙහිය.

2. "යම් කලෙක්හි තට මුළු පොළොව සිව් රැස් ලියද්දක් මෙන් පෙනීම වන්නේද, පුත්‍රය, එතැන්හි නවතුව, එයින් ඔබ්බට නොයව.

3. "පියාපත් යානාකොට ඇත්තාවූ අහසින් යන්නාවූ සෙසු පක්ෂීහුද ඇත්තාහ. ඔහුද පවන් වේගයෙන් අදනාලදුව නටහ. පෘථිවිය පර්වතය සමකොට සිතන්නාවූ ඔහු පවා නැසුනාහුය.

4. "අපරන්න නම් වූ මහළුවූ පියාගේ අනුශාසනය නොකොට තෘෂ්ණා වාතය ඉක්මවා වේරම්බ වාතයන්ගේ වසඟබවට ගියේය.

5. "ඒ මිගාලෝප නම් පක්ෂියා අවවාදය නොකළ කල්හි ඔහුගේ දරුවෝද, අඹුවෝද, එයින් අන්‍යවූ ඔහු නිසා ජීවත් වන්නෝද යන සියල්ලෝ විනාශයට පැමිණියාහුය.

6. "මෙපරිද්දෙන් යමෙක් වනාහී මේ ලෝකයෙහි ගුණ නුවණින් වැඩිහිටියන්ගේ වචනය අවබෝධනොකෙරේද, ඔහු

ඉක්මුණු අනුශාසනා ඇති, උඩගුවූ, සීමාව ඉක්මවා හැසුරුණාවූ මිගාලෝප නම් ගිජුලිහිණියා මෙන් සියල්ලෝම වැඩිහිටියන්ගේ අනුශාසනය නොකොට විනාශයට පැමිණෙත්."

**382 සිරිකාලකණ්ණි ජාතකයඃ-** 1. "ශරීර වස්ත්‍රාභරණයන්ගේ නීලවර්ණයෙන් යුක්තවෙහිය. ප්‍රිය දර්ශන ඇත්තියක්ද නොම වෙහිය. එබඳුවූ තී කවර තැනැත්තියක්ද, තී කවර තැනැත්තියක් හෝ වෙහිද, කවරහුගේ දුවක් හෝ වෙහිද, අපි තී කෙසේ දනිමුද,

**2.** "මම විරූපාක්ෂ නම්වූ මහරජහුගේ දුව වෙමි. ක්‍රොධ ස්වභාවයෙන් චණ්ඩ නම් ඇත්තී කළුපාට ඇත්තී අධන්‍යවූවා කාලකණ්ණියයි මා දනිත්. ඉල්වනලද්දේ මට අවකාශයක් වෙව, ඔබගේ සමීපයෙහි අද එක රැයක් වාසය කරමු.

**3.** "කෙබඳු සිල් ඇති කෙබඳු හැසුරුම් ඇති පුරුෂයෙකු කෙරෙහි තී වෙසෙහිද, කාළිය, මා විසින් විචාරණ ලද්දී යම්සේ අපි තී දනිමුද එසේ කියව,

**4.** "යම් පුරුෂයෙක් ගුණමකුවේද, තමා හා තරගයට පැමිණේද කළ දේට වඩා කිරීමෙන් යුක්තද, ඊර්ෂ්‍යා ඇත්තේද, මසුරුවූයේද, කෛරාටිකවේද, යමෙකුගේ ලද දෙය විනාශ වේද, එබඳු පුරුෂතෙම මට ප්‍රියවේ.

**5.** "යමෙක් කිපෙනසුළුද, බද්ධවෛර ඇත්තේද, කේලාම් කියන්නේද, මිත්‍රයන් බිඳිනසුළුද, දෝෂ සහිත වචන ඇත්තේද, රළු බස් ඇත්තේද, හෙතෙම යටකී පුරුෂයාට වඩා අතිශයින් ප්‍රියවේ.

**6.** "පුරුෂතෙම අද කටයුතුය හෙට කටයුතුයයි ස්වකීය කටයුත්ත නොදනීද, අවවාද කරණු ලබන්නේ කිපේද, හෙතෙම තමාට වඩා උත්තමයා ඉක්මවා සිතාද,

**7.** "පඤ්චකාමයෙහි නිතර පැවති ඡන්දරාගයෙන් මඩනා ලද පුරුෂතෙම සියලු මිත්‍රයන්ගෙන් පිරිහේද එබඳු පුරුෂ තෙම මට ප්‍රියවේ. ඔහු කෙරෙහි දුක් නැත්තියක් හෙවත් සුවසේ වසන්නියක් වෙමි.

8. "කාලිය, තී මෙයින් පහව යව, මේ තී කැමතිවූ මක්ඛාදී ගුණය අප කෙරෙහි විද්‍යමාන නොවේ. අනික් ජනපදයකට හෝ නියම්ගම්වලට හෝ රාජධානිවලට හෝ යවයි කීය.

9. "මෙය තොප කෙරෙහි නැතැයි මමද එය දනිමි. ලෝකයෙහි පින් නැත්තෝ ඇත්තාහ. ඔව්හු බොහෝ වූ ධනය රැස්කරත්. ඒ ධනය මමද මාගේ සහෝදරවූ දිව්‍ය පුත්‍රයාද යන දෙදෙනා වනසන්නෙමු.

10. "දිව්‍යවූ වර්ණයෙන් යුක්තව පෘථිවියෙහි මනාව පිහිටියාවූ මෝතොමෝ කවර තැනැත්තියක්ද, තී කවර තැනැත්තියක් වෙහිද, කවරක්හුගේ දුවක් වෙහිද, තී අපි කෙසේ දනිමුද?

11. "ශ්‍රීමත්වූ ධ්‍රතරාෂ්ට්‍ර නම් ලද මහරජහුගේ දුව මම වෙමි. ශ්‍රී නම්ද ලක්ෂ්මී නම් වූවාද මම ය. මා මහත්වූ ප්‍රඥා ඇත්තී යයි දෙව්ලෝවාසීහු දනිති. යාච්ඤා කරණලද්දේ අවකාශයක් දෙව, ඔබගේ සමීපයෙහි වාසය කරමු.

12. "ලක්ෂ්මිය, කෙබඳු සිල් ඇති, කෙබඳු හැසුරුම් ඇති පුරුෂයා කෙරෙහි නුඹ වෙසෙහිද, මා විසින් විචාරණ ලද්දී කියව, අපි තී යම්සේ දනිමුද, එසේ කියවයි කීයේය.

13. "යමෙක් වනාහි සීතයන්ද, නොහොත් උෂ්ණයන්ද අව්, සුළඟන්ද, ඩැහැ ලේ බොන මැසි මදුරුවන්ද, දීර්ඝජාතික සර්පයන්ද, සා දුකද, පිපාසාවද යන සියල්ල මැඩ හෙවත් මේ සියල්ල තෘණ ලවයක් කොටද නොගෙණ යමෙක් රෑ දාවල් නිතර තමන්ගේ කටයුත්තෙහි යෙදුනේවේද, සුදුසු කාලයට, එළඹ සිටි ප්‍රයෝජනය නොපිරිහෙලාද, එසේවූ පුරුෂතෙම මට ඉෂ්ට දෙව්වේ. ඔහු කෙරෙහි වාසය කරමු.

14. "යමෙක් නොකිපෙනසුළුද, කළණ මිතුරන් ඇත්තේද, ධන පරිත්‍යාග ඇත්තේද, ශීලයෙන් යුක්තද කෛරාටික නොවේද, ඍජු වූයේද, මිත්‍ර සංග්‍රහාදිය කරන්නේද, මෘදු වචන ඇත්තේද, සියලු තෙපුල් ඇත්තේද, මහත් බවට පැමිණියේවේද, යටත්පහත් පැවතුම් ඇත්තේද, එබඳු පුරුෂයා කෙරෙහි

සමුද්‍රයාගේ වර්ණය බලන්නවුන්ට යම්සේ රළ වේගය වැටහේද, එපරිද්දෙන් මම මහත්වූවා වෙමි.

15. "යමෙක් වනාහි මිත්‍රයා කෙරෙහිද, නොහොත් සතුරා කෙරෙහිද, තමහට උසස්වූවහු කෙරෙහිද, සමානවූවහු කෙරෙහිද, නොහොත් හීනයා කෙරෙහිද තමාට වැඩ කරන්නහුටද, නොහොත් අවැඩකරන්නහුටද යන සියල්ලන් කෙරෙහි පැමිණි තැන හෝ රහසිගතව හෝ චතුර්විධ සංග්‍රහයම පවත්වාද,

16. "කිසිකලෙකත් රළු බස් නොකියන්නේද, එසේවූ මළාවූද, ජීවත්වන්නාවූද ඔහුට සමීපවෙමි. නුවණ නැත්තාවූ යමෙක් මොවුන් ගෙන එක්තරා කාන්තවූ ශ්‍රීයක් ලබා එයින් ප්‍රමාදවේද, ඒ උඩගු ස්වභාව ඇති විසමව හැසිරෙන්නහු අසුචි පිරුණු වළක්මෙන් දුරුකෙරෙමි.

17. "පුරුෂතෙමේ ලක්ෂ්මිය තමා විසින්ම තමාට කරන්නේය. අලක්ෂ්මියද තමා විසින්ම තමාට කරන්නේය ශ්‍රීයවේවයි අශ්‍රීය හෝ වේවයි අනිකෙකුට අනික් කරන්නෙක් නැත්තේමැයි.

383 **කුක්කුට ජාතකය**:- 1. "මනා විසිතුරු පියාපතින් කළ සෙවෙනි ඇති එල්ලෙන සිළු ඇති පක්ෂිරාජය, දෘම ශාඛාවෙන් හෙවත් ගස අත්තෙන් බසිනු මැනව. ඔබට කිසිවක් නොගෙණ නිකම්ම භාර්යා වෙමි.

2. "කළ්‍යාණිය, තී සිව්පා ඇත්තී වෙහි. මනහර තැනැත්තිය, මම දෙපා ඇත්තෙමි. සිව්පා ඇති තී හා දෙපා ඇති මම නුසුදුස්සහ. හෙවත් නොගැළපෙති එහෙයින් අනික් සැමියෙකු සොයාගණුව.

3. "ඔබට බාල කල පටන් අන් පුරුෂ සංගමයක් නොකළ අඹුවක් වන්නෙමි. මිහිරි කථායෙන් ප්‍රිය තෙපුල් කියන්නියක් වෙමි. සුන්දරවූ ප්‍රතිලාභයෙන් මා ප්‍රතිලාභය කරව. ඉදින් කැමැත්තෙහි නම් මා දාසියක්කොට අස්වව.

4. "පක්ෂීන් අනුභව කරන්නාවූ ලේ බොන්නාවූ සෙරවූ කුකුළන් මරන්නී වූ තී බ්‍රහ්මචරිය ලාභයෙන් ස්වාමිවූ මා කැමැත්තී නොවෙහියයි කීයේය.

5. "මෙසේ දක්ෂවූ ස්ත්‍රීහුද, පුරුෂයෙකු දැකම සිළුටුවූ තෙපුලෙන් බැළලී කුකුලකු මෙන් තමන් වසඟබවට පමුණුවත්.

6. "යමෙක් වනාහි උපන්නාවූ අර්ථය වහා දැන නොගණීද, එසේ වූයේ සතුරන්ගේ වසඟයට පැමිණේ. පසුව තැවෙන්නේදවේ.

7. "යමෙක් වනාහි උපන්නාවූ අර්ථය වහාම දැනගණීද, හෙතෙමේ බැළලිය කෙරෙන් මිදුනාවූ කුකුළා මෙන් සතුරා කෙරෙන් මිදෙන්නේයි"

384 **ධර්මධ්වජ ජාතකයඃ-** 1. නෑයෙනි, කුශලධර්මයෙහි හැසිරෙව. නැවත නැවත කුශල ධර්මයෙහි හැසිරෙව්. තොපට යහපතක් වන්නේය. කුශලධර්මයෙහි හැසිරෙන තැනැත්තේ මෙලොවද, පරලොවද සුවසේ සයනය කරයි.

2. "එකපසින් සිටින්නාවූ පක්ෂිතෙමේ ධර්මයක්ම අනුශාසනා කෙරේද එහෙයින් උතුම් ධර්මයෙහි පිහිටියාවූ මේ පක්ෂිතෙමේ ඉතා යහපත්වේ.

3. "මොහුගේ ශීලයක් නොදනිව්. ශීලාදී ගුණයක් ඇතැයි නොදැන ප්‍රශංසා කරන්නහුය. හෙතෙම බිජුවටද පැටවුන්ද අනුභවකොට ධර්මය ධර්මයයි කියයි.

4. "වචනයෙන් අනිකක් කියයි. ශරීරයෙන් අනිකක් කෙරෙයි. වචනයෙන් ධර්මයයි කියයි. කයින් නොකරයි. හෙතෙම ඒ ධර්මයෙහි පිහිටියේ නොවෙයි.

5. "වචනයෙන් සිළුටුවේ. සිතින් නොවැදගත හැක්කේය. හෙවත් විසම කල්පනා ඇත්තෙක. සැඟවුනු අදහස් ඇත්තේය. ලිඳෙහි හෝනා කෘෂ්ණ සර්පයෙකු වැනිවූ ධර්මය ධ්වජයක්කොට ඇවිදිනාවූ ගම් නියම්ගම්වල යහපතැයි සම්මතවූ මේ දුශ්ශීලයා අඥාන පුරුෂයා විසින් දැනගත නොහැක්කේය.

6. "මොහු කුඩුවලින්ද, පියාපත්වලින්ද, පාවලින්ද, පහර දෙව් ලාමකවූ මොහු වනසව්. මෙතෙම එකතැන වාසයට සුදුස්සෙක් නොවේයයි" කීයේය.

**385 මිග ජාතකයඃ-** 1. "බමුණ සාකෙත නම් නුවර අනජ වන නම් උයනට ඉදින් යන්නෙහි නම් තාගේ මව්ද පියාද යන මහලුවූ ඔහු දෙදෙන තා දක්නට කැමැත්තාහයි අපගේ ඖරස පුත්‍ර නන්දිය නම්වූ ඒ පුත්‍රයාට කියවයි" කීහ.

**2.** "බමුණ, රජුගේ ගෝචර පිණිස වපුරණ ලද තෘණයෝ මා විසින් අනුභව කරණ ලදහ. පැන් හා බොජුන් අනුභව කරණ ලදී. මේ රජහු සතුවූ පිණ්ඩය නපුරුකොට අනුභව කරන්නට මම උත්සාහ නොකරමි.

**3.** "මහ හීයෙන් යුක්තවූ අත් ඇති රජුට මාගේ පාර්ශවය (ඇලය) මම එලවන්නෙමි. (පා සිටින්නෙමි) එකල්හි සුවපත්වූ මරණින් මිදුනාවූ මම මෑණියන් දක්නෙම් නම් යෙහෙකියි" කීය.

**4.** "කොසොල් රජහුගේ උයනෙහි විශිෂ්ට රූ ඇති පා සතරක් ඇති නමින් නන්දිය නම්වූ මෘග රාජයෙක් පෙර වූයෙම්ද.

**5.** "මුවන්ගේ නිවාසය පිණිස දෙනලද අජත වන නම් උයනෙහි කොසොල් රජතෙම දුන්න දුනුදිය සමග නගාලා ශරය දුනුදියෙහි පිහිටුවා ඒ මා විදින්ට ආයේය.

**6.** "හී තල ගත් අත් ඇති ඒ රජුට මාගේ මහා පාර්ශවය මම එල්වීමි. හෙවත් මා මරවයි ඇලය පා සිටියෙමි. එකල්හි සුවපත්වූ මරණින් මිදුනාවූ මම මෑණියන් දක්නට ආයේ වෙමියි" වදාළෝ

**386 ඛරපුත්ත ජාතකයඃ-** 1. "එළුවා අඥානයයි නුවණැත්තෝ සැබවක්ම කීලු. බලව, අඥානතෙම රහස්හි කටයුතු කර්මය ප්‍රකාශ ස්ථානයෙහි කරන්නේ එය නුසුදුසුයයි දැන නොගණී"යි කීය.

**2.** "යහළු කොටළු පුත්‍රය, නුඹ වනාහි මට වඩා අඥානයෙහිය කුමක් හෙයින්ද යත්? රැහැණින් විය හා සමග ග්‍රීවයෙහි බඳනා ලද වක්වූ තොල් ඇත්තේ මුඛ බන්ධනයෙන් බඳනාලද මුව ඇත්තේ වෙහි, මොහුට වඩා මම අඥානයෙමියි" දැනගණුව.

3. "යහලුව බැම්මෙන් මුදන ලද්දාවූ යම්බඳුවූ තෝ පැන නොයන්නෙහිද එය තාගේ අනාථවූද අඥානකමෙක යහළුව තෝ යම්බඳුවූ සෙනක නම් රජෙකු උසුලාගෙණ යෙහිද හෙතෙමේද ඉතා අඥානයෙකැයි" කීය.

4. "යහළුව අජ රාජය, යම්හෙයකින් මම අඥානයයි දැනගත්තෙහිද (එසේ වේවා) ඉක්බිති සේනක නම් රජ කවර හේතුවකින් අඥාන වීද මා විසින් විචාරණ ලද්දේ එය මට කියව.

5. "යමෙක් සියළු ශබ්ද දන්නා මන්ත්‍රය ලැබ භාර්යාවට දෙන්නේද ඒ කාරණයෙන් ඔහුගේ ආත්මය පිරිහෙන්නේය. ඕතොමෝද ඔහුට නොවන්නේය.

6. "ජනේශ්වරය, තා වැන්නෙක් ආත්මය හැරපියා මෙය මට ප්‍රියයයි ප්‍රියවූවන් ඒකාන්තයෙන් සේවනය කෙරේද, කුමක් හෙයින්ද යත්? ලෝකයෙහි උතුම් සියල්ලට වඩා ආත්මයම ශ්‍රෙෂ්ඨවේ. එසේමැයි, රැස්කරණ ලද වස්තු ඇත්තහු විසින් පසුව ප්‍රිය වස්තූහු ලැබිය හැක්කාහු යයි" කීයේය.

387 **සුචි ජාතකය**:- 1. "රළු නොවූ සිළුටුවූ කරගලෙහි ශුද්ධ කරණ ලද්දාවූ යහපත් මලින් යුක්තවූ සියුම්වූ තියුණුවූ අගද ඇති ඉඳිකටුව මිළදී ගන්ට කවරෙක් කැමැත්තේද,

2. "යහපත් කොට මදිනා ලද්දාවූද යහපත් මළ ඇත්තා වූද පිළිවෙලින් මනාව මට කරණ ලද්දාවූද ගටනා කල්හි ඝනවූ කිණිහිරි පලාගෙණ ඇතුළට වදනාවූද තදවූ ඉඳිකටුව මිළ දී ගන්ට කවරෙක් කැමැත්තේද,

3. "දැන් බොහෝ ඉඳිකටුද බිලී කටුද මේ කම්බුරු ගමින් බැහැරට යන්නාහ. කම්බුරු ගමෙහි ඉඳිකටු විකුණන්ට මේ කවරෙක් කැමති වේද,

4. "මෙයින් නොයෙක් ආයුධයෝද බැහැරට යෙත්. නානාප්‍රකාරවූ බොහෝවූ කර්මාන්තයෝද වෙත්. මේ කම්බුරු ගමෙහි ඉඳිකටු විකුණන්ට මේ කවරෙක් සුදුසුවේද,

**5.** "දන්නාවූ පුරුෂයා විසින් ඉඳිකටුව කුඹුරු ගමෙහි විකිණිය යුතුය. කුමක් හෙයින්ද යත්? මනාව කරණලද නොමනාව කරණලද කර්මාන්තය ශිල්පාචාරීහුම දනිත්.

**6.** "සොඳුර, තීගේ පියතෙමේ මා විසින් කරණලද මේ ඉඳිකටුව හැඳින්නේවී නම් තී ලවාද මා පවරන්නේය. යම් බඳුවූ අනික් ධනයකුත් ගෙයි ඇද්ද, ඉතිදු පවරන්නේයයි" කීයේය.

388 **තුණ්ඩිල ජාතකයඃ-** 1. "අභිනවාකාරවූ දානය දෙනු ලැබෙයි. මේ අපගේ බත් ඔරුව සුදු බතින් පිරුණීය. අපගේ ස්වාමි දුවද සිටියාය. ඈ පමණක් නොව මල පුඩුගත් අත් ඇති බොහෝ දෙනා සිටියාහ. එසේ හෙයින් බත් කන්නට මට නොවැටහේ.

**2.** "තුණ්ඩිලය, ත්‍රස්ත වෙහි, භ්‍රමනය වෙහි, පිහිටක් කැමැත්තෙහි අසරණ වූයේ වෙහිය. කොහි යන්නෙහිද, නිරුත්සාහීව අනුභව කරව, මාංශ පිණිසම අපි පෝෂණය කරණු ලබමු.

**3.** "මඩ රහිතවූ විලට බසුව, සියලු ඩහදිය මල දුරු කරව, යමෙකුගේ ගන්ධය කිසිකලෙකත් නොසිඳේද, එබඳු අළුත්වූ විලෙපනය ගණුවයි" කීයේය.

**4.** "මඩ නැති විල කවරේද? ඩහදිය මලයයි කුමකට කියනු ලැබේද, අළුත්වූ විලවුන් නම් කවරේද? කවරෙකුගේ ගන්ධය කිසිකලෙක්හි නොසිඳේද?

**5.** "පඤ්ච ශීලාදීවූ ධර්මයතෙම රාගාදී මඩ රහිත හෙයින් මඩ නැති විලය පාපය ඩහදිය මලයයි කියනු ලැබේ. ශීලයද අළුත්වූ විලවුන් හා සමවේ. ඒ සීලයාගේ ගන්ධය කිසිකලෙකත් නොසිඳෙයි.

**6.** "අනුන්ගේ සිරුරු නසන්නාවූ අඥානයෝ සතුන් නැසීමෙහි සතුටු වෙත්. සිරුරු දරන්නාහු නොම සතුටු වෙත්. ගුණෙන් පිරුණාවූ පූර්ණ චන්ද්‍රයා යුක්ත දිනයෙහි අප වැන්නෝ සතුටු වන්නාහුම ජීවිතය හරිත්."

**389 සුවණ්ණ කක්කටක ජාතකය:-** 1. "එම්බා යහලුව, දික්වූ චක්ෂුස් නම්වූ නෙත්‍ර ඇති ඇටම සිවිය කොට ඇති දියෙහි වාසය කරන්නාවූ රෝම නැති නල සංඛ්‍යාත ශෘංගයන් ඇති හෙයින් සිංගී මිග නම්වූ කකුළුවෙකි. ඔහු විසින් මඩනා ලද්දේ බැගෑපත්ව හඬමි. කිම මා හැරයෙහිද,

2. "යහළුවූ ප්‍රශ්වාස කරන්නාවූ ඒ සර්පතෙම යහළුවූ කපුටුවා රක්නේ මහත්වූ පෙනයෙන් යුක්තව කකුළුවා වෙත පැමිණියේය. කකුළුතෙම ඒ සර්පයාද වම් නලින් අල්වා ගත්තේය.

3. "කකුළුතෙමේ ආහාර පිණිස කැමතිවූයේ කපුටුවා නොගන්නේය. කෘෂ්ණ සර්පයාද නොගන්නේය. දික්වූ නෙත්‍ර සංඛ්‍යාත ඇස් ඇත්ත, තා විචාරමි. එසේ ඇතිකල්හි කවර හේතුවකින් තා විසින් අපි දෙදෙන ගන්නා ලද්දෝ වෙමුද,

4. "මේ පුරුෂතෙම මට වැඩ කැමත්තේය. හෙතෙම මා ගෙණ දියට පමුණුවයි. ඔහු මළ කල්හි මට බොහෝවූ දුක් වන්නේය. මමද මෙතෙමේද යන දෙදෙනම ජීවත් නොවෙමු.

5. "ඉතා වැඩුනු සිරුරු ඇති මධුරවූද මහත්වූද මොළොක්වූද මස් ඇති මාද දැක සියලුදෙනා හිංසා කරන්නටම කැමැතිවන්නේය. කවුඩෝද මා දැක හිංසා කරන්නාහුම යයි" කීයේය.

6. "ඉදින් ඔහු හේතුකොටගෙණ අප දෙදෙන ගන්නා ලද්දෙමු නම් පුරුෂතෙමේ නැඟී සිටීවා. විෂය උරා ගණිමි. විෂය මිනිසා දැඩිකොට ගණීද, ඉන් පළමු මාද කවුඩුවාද වහා මුදව.

7. "පළමුකොට සර්පයා මුදමි. කවුඩුවා නොහරිමි. කුමක් හෙයින්ද යත්, කවුඩුවා වනාහි තව ඇපවන්නේය. යම්සේ සර්පයා හැරියෙම්ද, එපරිද්දෙන් කවුඩුවාද සුවපත්වූ නිරෝගවූ පුරුෂයා දැක මුදා හරින්නෙමියි" කීයේය.

**390 මය්හක ජාතකය:-** 1. "ශිලා පර්වතයෙහිද පාංශු පර්වතයෙහිද, පර්වත විවරයෙහිද හැසිරෙන්නාවූ "මය්හං

මය්හං" කියා හඬන හෙයින් මය්හක නම්වූ පක්ෂියෙක් පැසුනු ගෙඩි ඇති පුළිල ගසකට නැඟී මාගේ මාගේ යයි කියා හඬයි.

2. "මෙසේ හඬන්නාවූ ඔහුගේ පුළිලගෙඩි රැස්වූ පක්ෂි සමූහයා අනුභව කොට යත්. ඒ පක්ෂි තෙමේ හඬාමැයි.

3. "එපරිද්දෙන්ම මේ ලෝකයෙහි සමහරෙක් බොහෝවූ වස්තුව රැස්කොට කොටස්වූ පරිද්දෙන් තමහටද නොම ප්‍රයෝජන කරයි. නෑයන්ටද දියයුතු පරිද්දෙන් නොදෙන්නේමැයි.

4. "හෙතෙම වස්ත්‍රද බත්ද එකවරක් නොඅනුභව කෙරෙයි. මල් නොපළඳියි, විලවුන් නොගනියි, කිසි නෑ කෙනෙකුන්ටද සංග්‍රහ නොකෙරෙයි.

5. "මාගේ මාගේයයි රක්නාවූ මෙසේ හඬන්නාවූ ඔහුගේ වස්තුව රජවරුද, නොහොත් සොරුද, අප්‍රියයෝද හිමියෝද ගෙණයත්. ඒ මනුෂ්‍යතෙමේ හඬාමැයි.

6. "ප්‍රාඥතෙමේ වනාහි සම්පත්තියට පැමිණ නෑයන්ටද සංග්‍රහ කෙරෙයි. එයින් කීර්තියටද පැමිණෙයි. පරලොවද "ස්වර්ගයෙහි සතුටුවෙයි."

**391 ධජවිහෙඨන ජාතකයා:-** 1. "යහපත්වූ වර්ණ ඇති ඔබ දුර්වර්ණරූප ඇත්තහු ඉදිරිකොට ඇඳිලිබැන්දේ නමස්කාර කෙරෙහිය. මෙතෙම ඔබට උතුම්ද, නොහොත් සමානයෙක්ද, අනිකාගේද, තමාගේද නාමය කියව,

2. "රාජය, සම්‍යක් ප්‍රතිපන්නවූද, ඍජුව පිළිපන්නා වූද, උතුම්වූ විශුද්ධි දෙවියන්ගේ නාම ගොත්‍ර දෙක උත්පත්ති දෙවතාවෝ නොගණිත්. මම වනාහි තට මාගේ නම කියමි. තව්තිසා වැසි දෙවියන්ට අධිපතිවූ මම ශක්‍රනම් වෙමි.

3. "දෙව රාජය මේ කාරණය ඔබ විචාරමි. මරණයෙන් යුක්තවූ භික්ෂුවක්හු දැක අභිමුඛකොට බදැඳිලිවූයේ යමෙක් නමස්කාර කෙරේද, හෙතෙම මෙයින් චුතවූයේ කිනම් සුවයක් ලබන්නේද,

4. "යමෙක් චරණයෙන් යුක්තවූ භික්ෂුවක්හුදැයි අභිමුඛ කොට බදැඳිළිව නමස්කාර කෙරේද? හෙතෙම මේ ආත්මයෙහිම ප්‍රශංසාව ලබයි. ශරීර භෙදයෙන් මතු ස්වර්ගයටද පැමිණෙයි.

5. "අද දෙවතාවන්ට ස්වාමිවූ ශක්‍රයා යම් හෙයකින් දුටුවෙමුද, එහෙයින් මට ලක්ෂමී තොමෝ පහළ විය ශක්‍රය, භික්ෂුවද ඔබද දැක බොහෝවූ පුණ්‍යයන් කරන්නෙමි.

6. "බහුශ්‍රැතවූ බොහෝ කරුණු සිතන්නාවූ ප්‍රඥා සහිතවූ යම් කෙනෙක් ඇද්ද, ඔව්හු ඒකාන්තයෙන් සේවනය කටයුත්තාහ. රාජය, මේ භික්ෂුහූද මාද දැක බොහෝවූ පින් කරව.

7. "දෙවරාජය, ඔබගේ සුභාෂිතයන් අසා ක්‍රොධ නැත්තේ නිරන්තරයෙන් ප්‍රසන්නවූ සිත් ඇත්තේ සියලු ආගන්තුගයන්ගේ ඉල්ලීමට සුදුසු නුවූයෙම් මාන්නය නසා අභිවාදනය කරන්නෙමියි" කීයේය.

**392 භිසපුප්ඵ ජාතකය:-** 1. "යම් හෙයකින් දියෙහි හටගත්තාවූ කයින් වචනින් නුදුන්නාවූ මේ නෙළුම් මල සුඹුනෙහිද මෙය අදත්තාදාන චේතනාවන්ගේ එක් කොටසකි. නිදුකාණෙනි, එසේ හෙයින් සුවඳ සොරෙක් වෙහිය.

2. "පද්මය හැරගෙණ නොයමි, නොබිඳිමි, දුර සිට සුඹුනෙමි. එසේ කල්හි කවරකාරණයකින් සුවඳ සොරායයි කියනු ලැබේද?

2. "යමෙක් යම් හෙයකින් නෙළුම් අල සාරයිද, හෙළ නෙළුම් බිඳීද, මෙසේ දරුණු කර්මාන්ත ඇති මේතෙම සොරායයි නොකියනු ලැබේද?

4. "ගැවසීගත් රෞද්‍රබව ඇති පුරුෂතෙම කිරි මවකගේ ඉතා කිළුටු වස්ත්‍රයක් මෙන් පවින් වැකුණේමය. එසේ හෙයින් ඔහු කෙරෙහි මාගේ වචනයක් නැත. ඔබට වනාහි කියන්නට සුදුසු වෙමි.

**5.** "නිර්දොෂවූ නිරන්තරයෙන් පිරිසුදු ගුණධර්මයන් සොයන්නාවූ පුරුෂයාගේ පාපය සම්බන්ධව කෙසඟක් පමණවූද දෝෂය මහාමේඝයක් ප්‍රමාණව වැටහෙන්නේය.

**6.** "යක්ෂය, ඒකාන්තයෙන් මා හඳුනන්නෙහිය නැවත මට අනුකම්පා කරව. යක්ෂය, යම් කලෙක්හි මෙබඳු වරදක් දක්නෙහිද, එකල්හි නැවතද අවවාද වශයෙන් කියව.

**7.** "භික්ෂුව" තා අනුව ජීවත් නොවෙමි. තාගේ බැළයෙන්ද ජීවත් නොවම්හ. යම් ගුණධර්මයකින් සුගතියට යන්නේ නම් එය ඔබම දැන ගන්නෙහියයි" කීයේය.

**393 විඝාසාද ජාතකයඃ-** 1. "යම් ජන කෙනෙක් කා ඉතිරි දෙය කන්නාහුද ඔහුද ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වෙත්. මේ ආත්මයෙහිම පැසසිය යුත්තෝ වෙති. පරලෙව්හිදී සුගතියම වන්නේයි.

**2.** "ප්‍රාඥයෙනි, කියන්නාවූ ගිරවාගේ වචනය නො අසව්. සහෝදරයෙනි, මේ වචනය අසව මෙතෙම අපටම ප්‍රශංසා කරයි.

**3.** "කුණප අනුභව කරන්නෝ මාගේ වචනය අසව්. මම තොපට ප්‍රශංසා නොකරමි. තෙපි ඉඳුල් කන්නාහු වෙති. තෙපි භුක්තාවශෙෂය කන්නාහු නම් නොවෙත්.

**4.** "මෙද්ධ්‍යාරණ්‍යයෙහි කුඩිම්බි ඇත්තාවූ පැවිදිවූ අපට සප්ත වර්ෂ කෙනෙක් ඉක්මුනාහ. කා ඉතිරි දෙයින්ම යැපෙන්නාවූ අපි ඉදින් පින්වතාට ගැරහිය යුත්තෝ වෙමු නම් භවත් හට පැසසිය යුත්තෝ කවරහුද,

**5.** "තෙපි හැම දෙනම සිංහයන්ගේද ව්‍යාඝ්‍රයන්ගේද වල් මෘගයන්ගේද ඉතිරිවූ යම් භෝජනයක් ඇද්ද, ඒ ඉඳුලෙන්ම යැපෙන්නාහු විඝාසාදීම්හයි හඟින්නහුය.

**6.** "යම් කෙනෙක් බ්‍රාහ්මණයෙකුටද ශ්‍රමණයෙකුටද අන්‍යවූ ගුණ කියා ඉල්වන්නෙකුටද ආහාරාදිය දී එයින් ඉතිරිවූවක් අනුභව කෙරෙද්ද, එසේවූ ජනයෝ විඝාසාදීහු නම් වෙතියි" කීයේය.

**394 වට්ටක ජාතකය:-** 1. "කව්ඩු මයිලනුවෙනි, ප්‍රණීතවූ බත අනුභව කෙරෙහි ගිතෙල්ද තලතෙල්ද, අනුභව කෙරෙහි එසේ කල්හි කවර නම් කාරණයකින් නුඹ කෘශවෙහිද?

2. "සතුරන් මැද වසන්නාවූ ඔවුන් අතුරෙහි ආහාරය සොයන්නාවූ නිරන්තරයෙන් කලකිරුණු සිත් ඇති කවුඩුවාගේ දැඩි බවෙක් හෙවත් පුෂ්ටියෙක් කොයින්ද?

3. "වක්වූ ග්‍රීවා ඇති කවුඩුවෝ නිරතුරුම භයින් වෙව්ලන්නාහ. පාප කර්මයෙන් ලබන ලද ආහාරය නො පිනවයි. වටුව, ඒකාරණයෙන් මම කෙට්ටුවෙමි.

4. "වටුව, රළුවූ මඳ ඕජා ඇති තෘණ බීජයන් අනුභව කෙරෙහිය. එතකුදුවුවත් තෝ කවර කාරණයකින් සම්පූර්ණවූ මස් ලේ ඇත්තෙහිද?

5. "කව්ඩුව, ආහාරයෙහි මඳ ආශාවෙන්ද මද සිතිවිලි ඇතිහෙයින්ද, දුර නොවූ ගමන් යාමෙන්ද ලද ලද දෙයින් යැපෙන්නේ වෙමි. ඒ කාරණයෙන් මම තරවීමි.

6. "මද ආශා ඇත්තාවූ ස්වල්ප සිතිවිලි ඇති සැපයෙන් යුක්තවූ මනාකොට ගන්නාලද ආහාර ප්‍රමාණ ඇති පුද්ගලයාට දිවි පැවැත්ම සැපසේ නිපදවිය හැක්කේයයි" කීයේය.

**395 කාක ජාතකය:-** 1. "මැණිකක් දරන්නාවූ යහළුවෙකු බොහෝ කලකින් දක්නෙමු මනාව කරණ ලද රැවුල් කැපීම ඇති මාගේ යහළු තෙම හොබනේය.

2. "රාජකාරිවල යෙදුණවූ මම වැඩුණවූ කිසිලි රෝම හා නිය ඇත්තේ වීමි. කලකින් කරනැවැමියෙකු ලදින් ඒ රෝම අද දුරුකරවූයෙමි.

3. "යම් හෙයකින් දුර්ලභවූ කරනැවැමියෙකු ලදින් ලෝමය දුරුකරවූයෙහිද නැවත යහළුව, දැන් කුමක් බොටුවෙහි කිනි කිනියන නාද පවත්වා දැයි කවුඩුවාට පරිහාස කෙළේය.

4. "සියුමැලි මිනිසුන්ගේ බොටුවෙහි මැණිකෙක් එල්බෙයි. එහෙයින් මම ඔවුන්ට අනුව හික්මෙමි. හෙවත් පිළිපදිමි නුඹ එය කෙළිපිණිස කරණ ලද්දෙකැයි නොසිතව.

5. "යහළුව, ඉදින් මට මනාකොට කරණ ලද රැවුල් කැපීම කැමැත්තෙහි නම් තටද එය කරවන්නෙමි. තට මේ මැණිකද දෙමි.

6. "තෝම මේ මැණිකට සුදුසුය. මනාව කරණ ලද රැවුල් කැපීමටද තෝම සුදුසුය. යහළුව තාගේ නොදැනීම මට ප්‍රියවේ. එහෙයින් තට ආමන්ත්‍රණය කොට යෙමියි" කීයේය.

**ෂට්ක නිපාතය නිමි.**

---

# කුක්කුට වර්ගය.

**396 කුක්කුට ජාතකය:-** 1. මුදුන උසින් එක්රියන් හමාරක එය අට වියතක් වටයවේ. හරය ඇති ගෙඩි නැති ඇට්ටේරිය වලින් කරණ ලද්දාවූ යම් මුදුනක් වේද, ඕතොමෝ කොහි පිහිටියා මත්තෙන් නොයේද,

2. "ඍජුනොවූ හරමවූ තිසක් පමණවූ යම් ඒ පරාල වලින් වට කරන ලදුව සම බැවින් සිටියාහුද ඔහුතුමූ බලයෙන් පෙළෙන ලද්දාහු මනාකොට එකට බැඳී සමව සිටියාහු උඩින් නොවැටෙති.

3. "මෙසේ නුවණැති රජ තෙමේ දැඩි මිත්‍රවූ නොබිඳෙන ස්වභාව ඇති පිරිසිදු පැවතුම් ඇති මන්ත්‍රීන් හා මනාකොට සම්බන්ධවූයේ පරාල බර උසුලන්නාවූ පියසි මණ්ඩලය මෙන් ශ්‍රීයෙන් නොපිරිහෙයි.

4. "යම්සේ ආයුධ ඇත්තේ තදවූ ලෙල්ල ඇති ජම්බල ගෙඩියේ පිට ලෙල්ල තුනීකොටද නොසහින්නේ තිත්ත රස ඇත්තක් කෙරේද, පිට ලෙල්ල සැසහරින්නේ මධුර කෙරේද, මහ රජාණෙනි, තුනීවූ ලෙල්ල උදුරන්නේ අම්හිරි කරන්නේද,

5. "මෙසේ නුවණ ඇති රජතෙමේ නොසැහැසිව ගම් නියම්ගම්හි රජුන් පිළිබඳ ධනයන් හෙවත් අයබදු රැස්කරන්නේ දහම් අනුව පැවැත්මෙහි පිළිපදිමින් අනුන් නොපෙළෙන්නේ හෙතෙමේ දියුණුව කරන්නේයි.

**6.** "යම්සේ සුදුවූ මුල් ඇති පවිත්‍ර වූ ජලයෙහි හටගත්තා වූ පොකුණුවල හටගත් අම්බුජ නම්වූ හිරු රැසින් පිපියාවූ පියුම මඩ නොතැවරේද, ජලය හෝ නොතැවරේද,

**7.** "මෙසේම විනිශ්චය ව්‍යවහාරයෙහි පිරිසිදුවූ සාහසික ක්‍රියා නොකරන්නාවූ පිරිසිදුවූ කර්මාන්ත ඇති පහවූ පාපකර්ම ඇති, රජහු සතුන් මැරීම් ආදී කර්ම ක්ලේශතෙමේ නොකරයි කවර හෙයින්දයත්, පොකුණුවල හටගත්තාවූ පියුම යම්සේද, එසේම එබඳුවූ රජතෙමේ 'නොඇලුණේ' නම් වේ."

**397 මනොජ ජාතකය:-** 1. "යම්සේ දුන්න නැමේද දුනුදිය පොළනලද්දී හඬාද, එසේහෙයින් මනොජ නම්වූ මාගේ යහළුවූ සිංහයා නසනු ලැබීයයි හඟිමි.

**2.** "එබැවින් දැන් වනාන්තරයට සුවසේ යෙමි. මෙබඳුවූ මළ තැනැත්තෝ යාළුවෝ නොවෙත්. ජීවත්වන්නාවූ මට යාළුවෝ ලැබිය හැක්කාහුයි.

**3.** "ලාමක ජනයන් සේවනය කරන්නේ බොහෝ කලක් සුව නොලබන්නේය. ඊ පහර ලදින් හෝනාවූ මනොජ නම්වූ සිංහයා බලව. ගිරිය නම් හිවලාගේ අනුශාසනාව මෙබඳුයි.

**4.** "පවට නැමුනාවූ පුත්‍රයා කරණකොටගෙණ මව සතුටුනොවෙයි. ඒ එසේමැයි. ස්වකීයවූ ලෙයෙහි ගැලී නිදන මනොජයා බලව,

**5.** "යමෙක් ඒකාන්තයෙන් මතු වැඩ දක්නාවූ හිතවතුන්ගේ අවවාදය නොකෙරේද, එබඳු පුරුෂතෙම මෙසේ වූ දුකට පැමිණෙයි. ලාමක බවටද පැමිණෙයි.

**6.** "උතුම්වූ යමෙක් හීන ජනයන් සේවනය කරන්නේද හෙතෙම ඒ හීනයාට වඩා මෙපරිද්දෙන් ඉතා ලාමකවේ. එසේමැයි හීන ජනයා සේවනය කළාවූ උතුම්වූ හී පහරින් විද මළාවූ සිංහයා බලව.

**7.** "හීනයන් සේවනය කරන්නාවූ පුරුෂතෙම පිරිහේ. සමානවූවෙකු සේවනය කරන්නේ කිසිකලෙක්හි නොම පිරිහෙන්නේය. උතුම්වූවෙකු කරා පැමිණෙන්නේ වහාම

අභිවෘද්ධියට පැමිණේ. එහෙයින් තමාට වඩා ශීලාදී ගුණයෙන් වැඩිහිටියක්හු සේවනය කරන්නේය."

**398 සුතනු ජාතකය**:- 1. "මේ නුග ගසෙහි වාසය කරන මඛාදේව නම් දෙවතාවෙනි, රජතෙම ඔබට පවිත්‍රවූ මසින් යුක්තවූ බත එවීය. මැතට එව හුන් තැනින් නික්ම මා ගෙනා ඒ බත අනුභව කරව.

**2.** "මානවකය, මාංශ සූප ඇති ආහාරය හැරගෙණ ඔබින් මෙහි එව, මානවකය, තෝද තා ගෙණා බතද, යන දෙකම මට ගොදුරුවන්නහුය.

**3.** "යක්ෂය, මරණයෙහි භය සංඥා ඇත්තාවූ ජනයෝ තට බත නොගෙනෙන්නාහුය. එහෙයින් තෝ ස්වල්පයකින් මහත්වූ අර්ථයක් හැර දමන්නෙහිය.

**4.** "යක්ෂය, රශයෙන් යුක්තවූ පිරිසිදුවූ, ප්‍රණීතවූ තට නිත්‍ය ආහාරය ලැබෙන්නාවූ ආගමනය ඇත්තේය. මා කෑ කල්හි ආහාරය ගෙනෙන්නාවූ මිනිසෙක් මෙහි ඉතා දුර්ලභ වන්නේය.

**5.** "සුතනු නම් මානවකය, යම්සේ කීයෙහිද, ඒ මේ වචනය මට වැඩ පිණිස වේ. නුඹ මා විසින් අනුදන්නා ලද්දෙහි මට සුවසේ දකුව,

**6.** "මානවකය, තාගේ කඩුවද, කුඩයද, රන්තලියද හැරගෙනම යව. තාගේ මව සුවසේ තා දකීවා. තෝද මව දකුව.

**7.** "යක්ෂය, මා විසින් ධනයද ලබනලදී. රජුගේ වචනයද කරණලදී. එපරිද්දෙන් සියලු නෑයන් හා සමග එබද සුවපත්වේවායි කීයේය."

**399. ගිජ්ක්ධ ජාතකය**:- "නිලීය නම් වැද්දාගේ වසඟ බවට පැමිණියාවූ මම මළ පුඩුවෙන් බැඳුනේ වෙමි. පර්වත ගුහාවෙහි හෝනාවූ ඒ මාගේ මහලු මව්පියෝ කෙසේ නම් කරන්නාහුද,

**2.** "ගිජුලිහිණිය, කුමට හඬන්නෙහිද, තාගේ හැඬීම කවරක්ද, මනුෂ්‍ය භාෂාව කියන්නාවූ පක්ෂියෙක් මා විසින් නො අසනලදී. දක්නාලද්දේ හෝ නොවේ.

3. "පර්වත ගුහාවෙහි හෝනාවූ මහලුවූ මව්පියන් පොෂණය කෙරෙමි එසේවූ මම තාගේ වසඟ බවට ගියෙමි. ඒ මව්පිය දෙදෙන කෙසේ නම්කරන්නාහුද,

4. "ගිජුලිහිණියා යොදුන් සියයක් තැන කුණපයන් දක්නේයි කුමක් හෙයින් දළටද පාශයටද සමීපවත් දැන නොගත්තෙහිද,

5. "යම් කලෙක්හි විනාශයවේද එකල්හි පුරුෂතෙම ජීවිත විනාශයෙහි දැළටද පුඩුවටද සමීපවූවත් බැඳෙන බව නොදනී.

6. "පර්වත ගුහාවෙහි හෝනාවූ මහලුවූ මව්පියන් පොෂණය කරව, මා විසින් මනාකොට අනුදන්නාලද තෝ නෑයන් සුවසේ දකුව,

7. "වැද්දාණෙනි, පර්වත ගුහාවෙහි වැටී සිටින මහලුවූ මව්පියන් සුවසේ ගොස් පොෂණය කෙරෙම්ද, එපරිද්දෙන් සියලු නෑයන් හා සමඟ ඔබ බොහෝ කලක් සතුටුවේවා.

**400 දබ්භපුප්ඵ ජාතකයː-** 1. "ඉවුර අද්දර හැසිරෙන යහළුව, තට යහපතක් වේවා මා කරා දිව එව, මා විසින් මහත්වූ මත්ස්‍යයෙක් අල්ලා ගන්නාලදී. ඒ මත්ස්‍යයා වේගයෙන් මා දියට ඇදගණියි.

2. "ගැඹුරේ හැසිරෙන්න, තට යහපතක් වේවා. ශක්තියෙන් දැඩි කොට අල්ලා ගණුව මම තා ගුරුළා සර්පයෙකු මෙන් දියෙන් ගොඩට ගන්නෙමි.

3. "කුසතණ මල් (හා සමාන හෙයින් එ) නම්වූ ශෘගාලය මාගේ වචනය අසව, අපගේ විවාදයෙක් උපන්නේ වෙයි. යහළුව, කලහය සංසිඳුව, අපගේ විවාදය සංසිඳුව.

4. "පෙර මම ධර්මයෙහි පිහිටියෙම්වීමි මා විසින් බොහෝ වූ අර්ථ නිශ්චය කරණලදී. යහළුව, තොප දෙදෙනාගේ කලහය සංසිඳුවම්. තොපගේ විවාදය සංසිඳේවා.

5. "ඉව්රෙහි ඇවිදින තැනැත්ත, තෝ නඟුට ගණුව, ගැඹුරු දියෙහි හැසිරෙන්නහුට හිස වෙයි. අනතුරු මේ මැද කොටස ධර්මිෂ්ටවූ හෙවත් විනිශ්චය ස්වාමිවූ මට වන්නේයි.

**6.** "ඉදින් විවාද නොකෙළෙම් නම් අපට කීප දවසකට කැයුත්තක් වන්නේය. හිස නැති නඟුට නැති රෝහිත මත්ස්‍යයා හිවල් තෙමේ ගෙණයයි.

**7.** "යම්සේ ක්ෂත්‍රියවූ රජෙක් රාජ්‍යයක් ලැබ සතුටු වන්නේද, එපරිද්දෙන් මම අද පිරුණාවූ මුහුණු ඇති ස්වාමියා දැක සතුටුවෙමි.

**8.** "ගොඩවූයේම දියෙහි මත්ස්‍යයා කෙසේ නම් අල්ලා ගත්තෙහිද, යහළුව, මා විසින් විචාරණලද නුඹ එය කියව, තා විසින් කෙසේ බලනලදදැයි (අඹු විචාළා)

**9.** "මායාවී තැනැත්තිය, විවාදය හේතුකොට ගෙණ කාශවූවාහු වෙත්. විවාදය හේතුකොට ගෙණ ධන විනාශ වූවාහුවෙත්. එසේමැයි මස්කාවෝ විවාදය කරණ කොටගෙණ පිරිහුණාහ. රෝහිත මත්ස්‍යයා අනුභව කරව.

**10.** "එපරිද්දෙන්ම හෙවත් යම්සේ මස්කාවෝ දෙදෙන විවාදකොට ලද රේමසු කෙරෙන් පිරිහුනාහුද, එපරිද්දෙන්ම මිනිසුන් අතුරෙහි කලහය යම් තැනක උපදීද, ධර්මස්ථවූ හෙවත් විනිශ්චය ස්වාමීහු සමීපයට පැමිණෙති. හෙතෙම වනාහි ඔවුන්ගේ විවාද සංසිඳුවන්නේයයි එහිලා ධනයෝද පිරිහෙත්, රජහුගේ කොටුගුලම වැඩේයයි" කීයේය.

**401 දසණ්ණක ජාතකයः-** 1. "දසාර්ණක දෙශයෙහි වූ තියුණු මුවහත් ඇති පර ලේ බීමෙන් යුක්තවූ කඩුව පුරුෂ තෙම පිරිස් මැද ගිලියි. එයට වඩා ඉතා දුෂ්කරවූ අන්‍යවූ, යම් කරුණක් ඇද්ද, එය මට විචාරණලද්දේ කියව,

**2.** "මගධෙශ්වරය, අනුන්ගේ ලේ බොන්නාවූ කඩුව ලෝභය හේතු කොටගෙණ පුරුෂතෙම ගිලින්නේය. යමෙක් මෙනම් දෙයක් දෙමියි කියන්නේ නම් ඒ කඩුව ගිලීමට වඩා ඒ වස්තුව දෙමියි කීම ඉතා දුෂ්කරවේ. මෙයින් අන්‍යවූ සියලු කරුණු කරන්ට පහසුයයි මෙසේ දනුව.

**3.** "අර්ථයෙහිද, ධර්මයෙහිද, දක්ෂවූ ආයුර නම් පණ්ඩිත තෙම මාගේ ප්‍රශ්නය ප්‍රකාශ කෙළේය. දැන් පුක්කුස නම්

පණ්ඩිතයා විචාරමි. ඒ මෙනම් දෙයක් දෙමි. කීමට වඩා කුමක් නම් ඉතා දුෂ්කරද, එයින් අන්‍යවූ යම් දුෂ්කර කාරණයක් ඇද්ද, එය මට විචාරණ ලද්දේ කියව.

4. "කිසිවෙක් කියනලද නිෂ්ඵලවූ වචනය අනුව ජීවත් නොවෙත්. යමෙක් අසවල් දෙය දෙමියි ප්‍රතිඥාදී එය දීමෙන් ලෝභය සිඳින්නේය. ඒ කාරණය ඒ දෙමි කීමට වඩා ඉතා දුෂ්කරය. අනික් සියලු කරුණු කරන්නට පිළිවනැයි මාගධය මෙසේ දනුව,

"අර්ථ ධර්ම දෙකට දක්ෂවූ පුක්කුසතෙම ප්‍රශ්නය කීයේය. දැන් සේනක පණ්ඩිතයන් විචාරමි. ඒ කඩුව ගිලීමටද දෙමි. කීමටද දෙමි. කී වස්තුව දීමටද වඩා කුමක් නම් ඉතා දුෂ්කරද, මෙයින් අන්‍යවූ කළ නොහැකිවූ යම් කරුණක් ඇද්ද, එය මට විචාරණලද්දේ කියව,

6. "මාගධය, යම් පුරුෂයෙක් මදවූ හෝ නොහොත් බොහෝවූ හෝ දානය දෙන්නේද, දානයකොට නොතැවෙන්නේද ඒ පසුව නොතැවීම එකී කරුණුවලට වඩා ඉතා දුෂ්කරය. එයින් අන්‍යවූ සියලු කාරණය සුවසේ කළ හැකි යයි මෙසේ දනුව.

7. "අසුර තෙමේද ප්‍රශ්නය විසඳුයේය. පුක්කුස නම් පුරුෂයාද විචාළ ප්‍රශ්නය කීය. සේනක පණ්ඩිත තෙමේ යම් සේ කියයිද, එය සියලු ප්‍රශ්න විසඳීම් ඉක්මවා පවතීයයි" කීයේය.

**402 සත්තුභස්ත ජාතකයः-** 1. "බමුණ, චඤ්චලවූ සිත් ඇත්තේ ඇළලී ගිය ඉඳුරන් ඇත්තේ වෙහිය. තාගේ ඇස්වලින් කඳුළු දිය බිඳු වැහෙත්. තාගේ කුමක් නැතිවූයේද, කුමක් ප්‍රාර්ථනා කරමින් මෙහි ආයේද, එබැවින් ඒ කාරණය කියව.

2. "සේනක පණ්ඩිතයෙනි, අද ගෙටයන්නාවූ මාගේ අඹුව මියයන්නේය. ගෙට නොයන්නාවූ මට අතර මග මරණය වන්නේයයි යක්ෂයෙක් කීයේය. මේ දුකින් වෙව්ලන්නේවෙමි. මේ කාරණය මට කියව,

3. "බමුණ, බොහෝවූ කරුණු විශෙෂයෙන් කල්පනා කොට මෙහි යමක් කියන්නෙමිද, එයම සත්‍යය. තාගේ අක්සුණු

පසුම්බියට නොදැනුවත්ව කෘෂ්ණ සර්පයෙක් ප්‍රවිෂ්ට වූයේයයි සිතමි.

4. "දණ්ඩක්ගෙණ පසුම්බිය පහරව, මුඛයෙන් කෙළ වැගිරෙන දිව් දෙකක් ඇති පිටතට නික්මුනු සර්පයා බලව. අද තාගේ සැකයද, විචිකිච්ඡාවන්ද සිඳුව සර්පයා බලව, පසුම්බිය මුදව.

5. "සංවේගයට පැමිණි ස්වභාව ඇති ඒ බමුණුතෙමේ හක්සුණු පසුම්බිය මිදුයේය. එකල්හි උරයෙන් ගමන් කරන්නාවූ උග්‍රවූ තේජස් ඇති ශීඝ්‍රවූ විෂ ඇති සර්පයා පෙනේ කොට පසුම්බියෙන් නික්මුනේය.

6. "යමෙක් යහපත්වූ ප්‍රඥා ඇති සේනක පණ්ඩිතයන් නිතර දක්නේද එසේවූ ජනක නම් රජහට මනාකොට ලැබුනු ලාභයකි.

7. "බ්‍රාහ්මණය, විවෘත කරණ ලද කෙලෙස් සෙවෙනි (පියසි) ඇති සියල්ල දක්නාවූ සර්වඥ වූයෙහිද, ඔබගේ ඥාණයට වනාහි සර්වඥ ඥානයක් මෙන් භයංකාර රූපයක් ඇත්තේයයි ඔබ විසින් දෙනලද ජීවිතය මා විසින් අද ලබනලදී. තවද මාගේ අඹුවටද සුවයක් කෙළේය. එසේහෙයින් මාගේ මේ සත්සියයක් පමණ කහවණු ඇත. ඒ සියල්ල ඔබට දෙමි එය ගණු මැනව.

8. "මනාකොට කියනලද විසිතුරු ගාථාවන් කරණ කොටගෙණ පණ්ඩිතයෝ කුලී නොගණිති. තට මෙයිනුදු ධනය දෙත්වා එය ගෙණ තෝ ස්වකීය ගෙට යවයි' කීයේය.

**403 අට්ඨිසෙන ජාතකයඃ-** 1. "අට්ඨිසේනය, මම ඒකාන්යෙන් යම් යාචක කෙනෙකුන් නොහඳුනම්ද ඔව්හු මා වෙත පැමිණ ඉල්වති. ඔබ මා කුමක් හෙයින් නොඉල්ලන්නෙහිද?

2. "යාඥා කරන්නේ අප්‍රියවේ. යාඥා කළ වස්තුව නොදෙන්නේද අප්‍රියවේ. මට නොසතුට නොවේවයි එහෙයින් මම තාගෙන් නොඉල්වමි.

3. "යාඥාවෙන් ජීවත් වන්නාවූ යමෙක් ඒකාන්තයෙන් සුදුසු කාලයෙහි ඉල්විය යුත්ත නොඉල්වාද, හෙතෙම අනිකාද පිනෙන් පිරිහෙළයි. තෙමේද ජීවත් නොවෙයි.

4. "ඉල්වීමෙන් ජීවත් වන්නාවූ යමෙක් වනාහි සුදුසු කාලයෙහි ඉල්විය යුත්ත ඉල්වාද, හෙතෙම අන්‍යයාටද පින ලබාදෙයි. තෙමේද ජීවත්වේ.

5. "නුවණැත්තෝ තමා කරා ආවාවූ යාචකයන් දැක නොකිපෙත්. බ්‍රහ්මචාරිය, මම ප්‍රියවූයේ වෙමි. එහෙයින් කියයුතු දෙයක් කැමැත්තෙහිද, එය ඉල්වව.

6. "නුවණැත්තෝ ඒකාන්තයෙන් මෙනම් මෙනම් වස්තුවක් අපට දෙවයි නොඉල්වති. නුවණැති උපස්ථායකයාද මෙනම් දෙයක් මේ සමයට වුවමැනවැයි දැනගන්ට සුදුසු වෙයි. ආර්යයෝ උදෙසා සිටිති. මෝතොමෝ ආර්යයන්ගේ යාඥාවවේ.

7. "බමුණ, වෘෂභ රාජයෙකු හා සමග රතුපාට වූ දෙනුන්ගෙන් දහසක් ඔබට දෙමි. ඔබගේ ධර්මයෙන් යුක්තවූ ගාථාවන් අසා ඔබ සේවූ ආර්යයෙකුට ආර්ය පුද්ගලයෙක් කෙසේ නම් නොදෙන්නේද?"

**404 කපි ජාතකය**:- 1. "යම් තැනෙක්හි වෛර ඇත්තා වෙසේද? එතැන්හි නුවණැත්තා නොවසන්නේය. කුමක් හෙයින්ද යත්, වෛර ඇත්තන් අතුරෙහි එක රැයකුදු දෙරැයකුදු දුකසේ වසයි. (එහෙයිනි.)

2. "අනුව කටයුතු කරන්නාවූ පුරුෂයා හට සැහැල්ලු සිතේ පැවැත්ම ඇත්තේ ඒකාන්තයෙන් සතුරෙක් වන්නේය. එසේමැයි හුදකළාවූ වානරයාගේ හේතුවෙන් වානර සමූහයට ව්‍යසන කරණ ලදී.

3. "සේනාව පරිහරණය කරන්නාවූ අඥානවූ මම පණ්ඩිතයෙමියි සිතන තැනැත්තේ ස්වකීයවූ චිත්තයාගේ වසඟ බවට පැමිණ මේ වානරයා මෙන් විනාශයට පැමිණ හෝනේය.

**4.** "සමූහයා පරිහරණය කරන්නාවූ අයහපත්වූ බලවත්වූ අඥාන තෙම ලිහිණියන්ට චෙතකයා හෙවත් සේවටුවා මෙන් නෑයන්ට සතුරෙක් වේ.

**5.** "යමෙක් වනාහි ශීලයද ප්‍රඥාවද ශ්‍රැතයද තමා කෙරෙහි දකීද? හෙතෙම තමාටද අනිකාටද යන දෙදෙනාට අර්ථය කරන්නේයි.

**6.** "එසේ හෙයින් තමා ශීල ප්‍රඥා ශ්‍රැත යන මොවුන් මෙන් සමානකොට ප්‍රාඥතෙම සමූහයා හෝ පරිහරණය කරන්නේය. හුදකලාව හෝ පවත්නේයි."

**405 බකබ්‍රහ්ම ජාතකයः-** 1. "ගෞතමයෙනි, ජාති ජරා දෙක ඉක්මවූ අනුන් තමා වසඟයෙහි පවත්වන්නාවූ කළ පින් ඇත්තෝ මේ බ්‍රහ්ම ලෝකයෙහි දෙසැත්තෑ කෙනෙක් වෙත්. මෝතොමෝ කෙළවරවූ ප්‍රඥාවෙන් පැමිණියාවූ ශ්‍රෙෂ්ඨවූ පැමිණීමය අප බොහෝ ජනයෝ ඇදිළිබැඳගෙණ ප්‍රාර්ථනා කෙරෙති.

**2.** "බකනම් බ්‍රහ්මය නුඹ යම් තැනක් දීර්ඝායු ඇත්තේ යයි සිතන්නෙහිද එය දීර්ඝායුෂ නොවේ. ස්වල්ප ආයුෂ ඇත්තේ මැයි නිරබ්බුදයන්ගේ සියක් දහසෙක්යයි තට ආයුෂය මම දනිමි.

**3.** "සර්වඥයෙනි, මම අප්‍රමාණවූ සියල්ල දක්නේවෙමි. ජාතිය ජරාය ශොකය යන මොවුන් ඉක්මවා සිටියේ වෙමි"යි කීයෙහිය. එබැවින් මාගේ පුරාතනවූ කවර නම් ව්‍රත සමාදානයක්වත් සමාදන් වීමක්ද සිල්වත් කමක්ද යමක් මම දන්නෙම්ද එය මට කියව.

**4.** "ග්‍රීෂ්ම කාලයෙහි එයින් පීඩිතවූ හටගත් පිපාස ඇති බොහෝවූ මිනිසුන් නුඹ යම් හෙයකින් පානය කරවීද, ඒ තාගේ පුරාතනවූ ව්‍රත සමාදානය හා සිල්වත්කම නින්දෙන් පිබිදියෙකු මෙන් සිහිකරමි.

**5.** "ඒනි නම් ගං ඉවුරෙහි ලාගෙණ යන්නවූ යම් ඒ ජනයා මිදීද, ඒ තාගේ පුරාතනවූ ව්‍රත සමාදානය හා සිල්වත්කම නිදා පිබිදියෙකු මෙන් සිහිකරමි."

6. "මිනිසුන් නසනු කැමැතිවූ නාගයා විසින් ගංගාවගේ සැඩ පහරෙහි ගන්නාලද නැව බලයෙන් මැඩ මිදූයෙහිද, තාගේ ඒ පුරාණවූ ව්‍රත සමාදානය හා සිල්වත්කම නිදා පිබිදියක්හු මෙන් සිහි කරමි.

7. "යම්බඳුවූ තා බුද්ධිමත්ය, ව්‍රත සම්පන්නයයි සිතූ යෙම්ද, එසේවූ කප්පනම් අත වැස්සෙක් විය. ඒ තාගේ පුරාතනවූ ව්‍රත සමාදානය හා සිල්වත්කම නිදා පිබිදියක්හු මෙන් සිහි කරමි.

8. "මාගේ මේ ආයුෂ ඒකාන්තයෙන් දන්නෙහිය. සෙසු සියල්ලද දන්නෙහිය. එසේ හෙයින්ම බුද්ධයෙහිය. ඔබගේ මේ දිලිසෙන ආනුභාවය බ්‍රහ්ම ලෝකය බබුළුවමින් සිටියි."

---

## ගන්ධාර වර්ගය.

**406 ගන්ධාර ජාතකය:-** 1. "සම්පූර්ණවූ සොළොස් දහසක් ගම්ද, මුක්තාමාණික්‍යාදීන් පිරුණාවූ කොටුගුල්ද හැර දැන් හෙටටය. අනිද්දාටයයි ලුණු ටිකක් රැස්කොට තිබීම කරන්නෙහිද?

2. "බොහෝවූ ධන ධාන්‍ය ඇති ගන්ධාර රට හැර අවවාද අනුශාසනායෙන් නික්මුනේ දැන් මෙහිලා අනුශාසනා කෙරෙහිද?

3. "වෛදේහය, ධර්මය කියමි. මට අධර්මය රුචි නොවේ ධර්මය කියන්නාවූ මට පාපය නොඇලේ.

4. "යම්කිසි කාරණයකින් අනික් තැනැත්තේ ගැටීම ලබයිද, පණ්ඩිත තෙමේ මහත් අර්ථ ඇත්තාවූද ඒ වචනය නොකියන්නේය.

5. "ඒකාන්තයෙන් ගැටීම හෝ වෙන රොඩු මිටක්සේ විසිකිරීම හෝ වේවා. ස්වභාව ධර්මය කියන්නාවූ මට පාපයක් නොඇලේ.

6. "ස්වකීයවූ ප්‍රඥාතොමෝ ඉදින් නොවන්නේනම් මනාව හික්මෙන ලද ආචාර විනය හෝ නොවේනම් බොහෝවූ

ජනතෙම වනයෙහි ඇවිදිනාවූ ඇස් නැති මීමෙකු මෙන් ඇවිදින්නේය.

7. "යම් හෙයකින් වනාහි මෙහිලා සමහර කෙනෙක් ආචාරීන් සමීපයෙහි මනාව හික්මුනාහුද, එහෙයින් හික්මුනු ආචාර විනය ඇත්තෝ මැදහත් සිත් ඇතිව හැසිරෙත්."

**407 මහා කපි ජාතකය:-** 1. "මහා කපිය, යමෙක් තමා හෙයක් කොට සුවසේ වානර සේනාව එතෙර කෙළේද? තෝ ඒ වානරයන්ට කවරෙකු වෙහිද තට ඔව්හු කවරහු වෙද්ද?

2. "අරින්දම නම්වූ නරේන්ද්‍රය ඒ අසූදහසක් පමණ වානරයන්ට මම ප්‍රධානව සිටි රජවෙමි. ඔබගෙන් බියපත්වූ ශොකයෙන් මඩනාලද ඔවුන්ගේ සමූහයා පරිහරණය කරන්නෙමු.

4. "ඒ මම පැන තමා දුනු සියයක් හැර මේ වෘක්ෂයෙන් පැනගිය තැනින් ඈතදී අපර පාදයන්හි හෙවත් මාගේ ඉඟෙහි වැල්බාණක් දැඩිකොට බඳනා ලදී."

5. "වාතයෙන් සිඳිනලද මල්කඩක් මෙන් මා හරණ ලද්දෙම් වෘක්ෂයට පැමිණියෙමි. එසේ පැන්නාවූද ඒ මට ගසට ලංවන්ට නොහැකිවන්නේ එහි අත්තක් අත්වලින් අල්ලාගතිමි.

6. "අතින් ගන්නාලද ශාඛාවෙන්ද, ඉඟබඳනාලද ලතායෙන් විශෙෂයෙන් ආයතවූ හෙවත් ඇද සදනලද වීණා තතක් මෙන් ඒ මා පාවලින් නිතර ඇක්මෙන්නාවූ වානරයෝ සුවසේ ගියාහ.

7. "ඒ මා වැලින් බැඳුනේ නොතවන්නේය. මාගේ හිංසාවද නොතවන්නේය. කුමක් හෙයින්දයත්? යම් කෙනෙකුන්ට මම රාජ්‍ය කෙළෙම්ද? ඔවුන්ට මා විසින් සුව එළවන ලදී. එහෙයිනි.

8. "රාජය. ඔබට වැඩ දක්වන්නාවූ මේ උපමා තොමෝ කරණ ලදී. ප්‍රඥා සම්පන්නවූ ක්ෂත්‍රිය නම්වූ රජහු විසින් සියලු රාජ්‍යයටද යොග්ග නම්වූ අශ්වාදීන්ටද බල සේනාවටද නියම්ගම් වැස්සන්ටද යන සියල්ලවුන්ට සුවය සෙවිය යුතුයි."

**408 කුම්භකාර ජාතකය:-** 1. "වනාන්තරයෙහි මනාව වැඩුණාවූ නිල් පැහැ ඇති පලගත් අඹරුකක් මම දිටිමි. එය

එල හේතුකොටගෙණ විශෙෂයෙන් බිඳින ලද්ද දිටිමි. එය දැක පිඬු සිඟීමෙහි හැසිරෙමි.

2. "මනුෂ්‍ය වීරයන් විසින් නිමවනලද ඉතා මටවූ හඬක් නැති මැණික් වළලුදෙක ස්ත්‍රීතොමෝ දැරීය. දෙවන වළල්ලට පැමිණ ශබ්ද වූයේය. එය දැක මම පිඬු සිඟීමෙහි හැසිරෙමි.

8. "කුණපය ගෙණ එන්නාවූ තනි පක්ෂියෙකු බොහෝ පක්ෂීහු රැස්ව ඒ කුණපාහාරය හෙතුකොටගෙණ පැහැර හෙළූහ, එය දැක මම පිඬු සිඟීමෙහි හැසිරෙමි.

4. "ගව සමූහයා මැද සැලෙන මොල්ලිය ඇති වර්ණයෙන් හා බලයෙන් යුක්තවූ වෘෂභයෙකු මම දිටිමි. කාමය හේතුකොටගෙණ අඟින් විදිනා ලද ඔහුත් දිටිමි. එය, දැක පිඬු සිඟීමෙන් හැසිරෙමි.

5. "කලිඟු රට වැස්සන්ගේ කරණ්ඩුක නම් රජද ගන්ධාර දෙශ වාසීන්ගේ නග්ගජී නම් රජද විදෙහ රට වැස්සන්ගේ නිමි නම් රජද පඤ්චාල දෙශවාසීන්ගේ දුර්මුඛ නම් රජද යන මොව්හු රාජ්‍යයන් හැර කිසි වරදක් නැත්තාහු පැවිදිවූහ.

6. "භාර්ගවය, එක්වූ විශුද්ධ දෙවියන්ට සමානවූ මේ සියල්ලෝ දිලිසෙන්නාවූ ගිනි යම්සේද එමෙන් මේ තපස්වීහුද බබළන්නාහුය. මමද අධික වශයෙන් සිටියාවූ රූපාදී කාමයන් හැර තනිවූයේම හැසිරෙන්නෙමි.

7. "භාර්ගවය, මෙම ප්‍රව්‍රජ්ජ්‍යාවට සුදුසු කාලයවේ. අනික් කාලයෙක් නොම ඇත. පසුව ඒකාන්තයෙන් අනුශාසනා කරන්නෙක් නොවන්නේය. පුරුෂයාගේ අතින් මිදුනාවූ ලිහිණියෙකු මෙන් මමද තනිවම හැසිරෙන්නෙමි.

8. "නොපැසුනාවූද පැසුනාවූද නොහොත් ලුණු ඇත්තාවූද නැත්තාවූද කෑම දරුවෝ දනිති. මම එය දැක පැවිදිවීමි. තෝද පිඬු සිඟීමෙහි හැසිරෙව, මම පිඬු සිඟීමෙහි හැසිරෙමි."

**409 දළ්හ ධම්ම ජාතකයඃ-** 1. දූත කර්මාදී කටයුතු උසුලන්නාවූ උරෙහි බඳිනලද හෙල්ලය දමා ගසන්නාවූ

යුද්ධයෙහි වික්‍රමකොට හැසිරෙන්නාවූ මමද දළ්හ ධර්ම නම් රජහුගේ සිත සතුටු නොකෙළෙම් නම් කවරෙක් සතුටු කෙළේද,

2. "මාගේ වික්‍රමයද පුරුෂ ධෛර්යයද යුද්ධයෙහි මනා කොට කරණලද කටයුතුද කරණලද දූත මෙහෙවරද ඒකාන්තයෙන් තොපගේ රජ නොදනියි.

3. "නෑයන් රහිතවූ පිළිසරණක් නැත්තාවූ ඒ මම යම් හෙයකින් කුඹලාට ගොම වැරටි අදින්නක් කොට රජු විසින් දෙන ලද්දී වෙම්ද, එසේ හෙයින් ඒකාන්තයෙන් මැරෙන්නෙමි.

4. "පුරුෂතෙම යම්තාක් ප්‍රාර්ථනා කෙරේද, ඒතාක් සේවනය කරයි. අර්ථයාගේ පහව යාම ඇතිකල්හි ගිලන්වූ ඔටුදෙන ඒ රජතෙමේ හැර දැමුවාක් මෙන් හැර දමත්.

5. "යමෙක් පෙර කරණලද යහපත් කටයුතු ඇත්තේ කරණලද අර්ථ ඇත්තේ පසුව නොදනීද, ඔහුගේ ප්‍රාර්ථනා කරණලද යම් අර්ථ කෙනෙක් වෙද්ද, ඒ අර්ථයෝ විශෙෂයෙන් නසිත්.

6. "යමෙක් පෙර කරණලද යහපත් කටයුතු ඇත්තේ අනුන් විසින් කළ වැඩ ඇත්තේ පසුව දනීද, ඔහුගේ ප්‍රාර්ථනා කරණලද යම් අර්ථ කෙනෙක් වෙත්ද ඔව්හු වැඩියෙන් වැඩෙත්.

7. "මෙහිලා යම් පමණ කෙනෙක් රැස්වූවාහුද එපමණ තොපට යහපතක් වේවා එය තොපට කියමි. හැමදෙනා කෙළෙහිගුණ දන්නෝවව් බොහෝ කලක් ස්වර්ගයෙහි සිටින්නහුයයි" කීයේය.

**410 සෝමදත්ත ජාතකය:-** 1. "යමෙක් පෙර වනාහි දුරවූ මා පෙර මගට යේද, මහත් ශරීර ඇති දිගින් යුක්තවූ සෝමදත්තතෙම නොදක්නා ලැබේ. කොයි ගියේදෝ

2. "සිදිනාලද මාළුවා වැලක් මෙන් ඒ සෝමදත්ත තෙම මලේ සයනය කෙරෙයි. මේ හෙතෙමේ මැයි. භූමියෙහි වැටුණේ සයනය කෙරෙයි. හස්තිතෙම ඒකාන්තයෙන් මළේය.

3. "පරලොව ගියහු අනුව ශොක කෙරෙයි යන යමක් ඇද්ද, එය අනගාර්ය භාවයෙන් යුක්තවූ කාමයන්ගෙන් වෙන්වූ සිත් ඇති ශ්‍රමණයෙකුට සුදුසු නොවෙයි.

4. "ශක්‍රය, ඒකාන්තයෙන් එක්ව වාසය කිරීමෙන් මනුෂ්‍යයෙකුටද මෘගයෙකුටද, හෘදයෙහි ප්‍රේමය හටගණියි. ඔහුට ශොක නොකරන්නට නොපිළිවනි.

5. "යම් කෙනෙක් ඒ මළහුට හඬත්ද, මම මැරෙන්නෙමියි හඬත්ද, වැලපෙත්ද එය හිස්යයි සත්පුරුෂයෝ කීහ. එසේහෙයින් නොහඬව, නොවැලපෙව,

6. "බමුණ, ඒකාන්තයෙන් හැඬීමෙන් මළාවූ පරලොව ගිය තැනැත්තා නැගී සිටින්නේ නම් ඔවුනොවුන්ගේ මළ නෑයන්ට සියල්ලෝ එකතුව හඬමු.

7. "ගිතෙල් ඉසින ලද්දාවූ ඇවිල ගන්නා ලද්දාවූම ගින්නක් වන්වූ මා ජලයෙන් තෙමන්නක්හු මෙන් සියලු පීඩාව නිවූයෙහිය.

8. "මාගේ හෘදය ඇසුරු කළාවූ යම් ශොක හුලයක් වීද, යමෙක් ශොකයෙන් පෙළුනාවූ මාගේ පුත්‍ර ශොකය දුරු කෙළේද, හෙතෙම මාගේ ශොක නමැති හුල උදුරා දැමීය.

9. "දුරුවූ ශොක ඇති නොකැළඹුන සිත් ඇති ඒ මම උදුරා දමනලද ශොක හුල් ඇත්තේ වෙමි. එහෙයින් ශක්‍රය, ඔබගේ කීම අසා ශොක නොකරමි. නොහඬමි."

**411 සුසීම ජාතකයා:-** 1. "හිසෙහි සුදුසු ප්‍රදෙශයෙහි හටගත්තාවූ කෙශයෝ පෙර කාලවර්ණ වූහ. සුසීමය, අද සුදුවූ ඔවුන් දැක දස කුශල ධර්මයෙහි හැසිරෙව, මෛථුනයෙන් වෙන්වීම නම්වූ බ්‍රහ්මචර්යාවට සුදුසු කාලය වේ.

2. "දේවයෙනි, මාගේ හිස පැසුනේය. තොපගේ හිස නොවෙයි ඒ මාගේම හිසය. මාගේ හිස වේ. යහපතක් කරන්නෙමි බොරු කීවෙමි. රාජ ශ්‍රෙෂ්ඨය, එක අපරාධය ක්ෂමා කළ මැනව.

3. "රාජය, නුඹ තරුණයෙහි දැකුම් කළුවෙහිය. කිළිලයක් මෙන් පළමු වයසින් නැඟී සිටියේවෙහි. එහෙයින් රාජ්‍යයද කරව, මාද බලව, ජනෙන්ද්‍රය කාලික සැපය අනුව ධාවනය නොකරව,

4. "සිළිටුවූ ස්පර්ශ ඇති මනාවූ ශරීර ඇති යහපත් මධ්‍ය ප්‍රදෙශ ඇති කුමාරිකාව මම දකිමි. කළුවැල් පැලෑටියක් මෙන් ලෙළදෙන්නාවූ ඕතොමෝ ක්ලෙශ වසඟයෙන් පොළඹවන්නියක් මෙන් පුරුෂයන් සමීපයෙහි යෙයි.

5. "උත්පත්තියෙහි පටන් අසූ හැවිරිදිවූ හෝ අනූ හැවිරිදිවූ හෝ දණ්ඩක් ගෙණ වෙව්ලන්නාවූ පරාළයක් මෙන් තුන් තැනකින් බිඳුනාවූ ඇවිදිනාවූ ඒ ස්ත්‍රිය මා පසුකලෙක දකිමි.

6. "ඒ මම එයම නැවත නැවත සිතන්නේ යහන් මැද හුදකළාව සයනය කරමි. මමද මෙසේයයි බලන්නේ ගෘහයෙහි නොඇලෙන්නෙම් බ්‍රහ්මචර්යාවට සුදුසු කාලයයි.

7. "ගිහිගෙයි වසන්නහුගේ යම් පස්කම්හි ඇල්මක් ඇද්ද, මෝතොමෝ එළෙන්නාවූ රැහැණක් වැන්නීය. මෙයද සිඳ බලාපොරොත්තුවක් නැත්තාවූ ප්‍රාඥයෝ කාම සැපය හැර තපසට යෙත්."

**412 කොටසිම්බිලි ජාතකයඃ-** 1. "මම බඹ දහසක් පමණ ඇති නයෙකු ගෙණ ආයෙමි. මහත්වූ ශරීර ඇති ඒ නයාද මාද දරන්නේ නොවෙවුලයි.

2. "කෝට සිම්බලිය, එසේ කල්හි මට වඩා ඉතා මදවූ මස් ඇති මේ කුඩා පක්ෂියා දරන්නේ බිය පත්වූයෙහි, කුමට වෙව්ලන්නෙහිද,

2. "රාජය, තෝ මස් කන්නෙහි මේ පක්ෂිතෙම ගෙඩි කන්නේය. මෙතෙම නුග ඇටද පුලිල ගෙඩිද දිඹුල් ගෙඩිද ඇසතු ගෙඩිද අනුභව කොට මාගේ කඳෙහි වර්චස් හෙලන්නේ (මළ පහ කරන්නේය.)

4. "මාගේ පසෙක්හි වාත රහිත ස්ථානයෙහි හටගත්තා වූ ඒ නුග ආදී වෘක්ෂයෝ මනාව වැඩෙත්. ඔව්හු මා වැළඳ ගන්නාහ. මා වෘක්ෂ නැත්තහු කරන්නාහ.

5. "නුග ආදී බිජුවට ගෙණෙන ලද මේ කුරුලු ජාතීන් විසින් නසනලද මුල් සහිත කඳ ඇති අන්‍යවූද දාම නම්වූ වෘක්ෂයෝ ඇත්තාහ.

6. "රාජය, මහත්වූද වනදෙටු රුක් යටපත් කොට හටගන්නාහු වැඩෙත්. එසේහෙයින් මතු පැමිණෙන භය දක්නෙම් වෙව්ලමි.

7. "සැක කටයුත්තන් සැක කරන්නේය. නොපැමිණියාවූ භය රක්නේය. ප්‍රාඥතෙම නොපැමිණි භය හේතුකොට ගෙණ දෙලොව බලන්නේය.

**413 ධූමකාරි ජාතකය:-** 1. "දහම් කැමැතිවූ යුධිට්ඨිල නම් රජතෙම විධුර පණ්ඩිතයන් විචාළේය. බ්‍රාහ්මණය, හුදකලාවූ කවරෙක් නම් බොහෝ කරුණෙන් ශොක කෙරේයයි දන්නෙහිදැයි විචාළේය.

2. "එළු සමූහයාගෙන් යුක්තව බොහෝ දර ඇතිව වනයෙහි වසන්නාවූ වාසෙට්ඨ නම් බමුණුතෙම රෑ දාවල් අනලස්ව මැසි උවදුරු හරණ පිණිස ගිනි දුම් කෙළේය.

3. "ඒ ගිනිදුම් ගඳින් මැසි මදුරුවන්ගෙන් පෙළුනාවූ සරභ මෘගයෝ ඒ ගිනිදුම් කරන්නාවූ බ්‍රාහ්මණයාගේ සමීපයෙහි වර්ෂා කාලයෙහි විසීමට පැමිණියාහුය.

4. "ඒ බමුණුතෙම සරභ මෘගයන් කෙරෙහි ස්නෙහ උපදවා ගොදුරු පිණිස හැසිර එන්නාවූද ගාලින් නික්ම යන්නාවූද එළුවන් නොදනියි. එසේ නොසළකන්නාවූ ඔහුගේ ඒ එළුවෝ සිංහ උපද්‍රව ආදියෙන් විනාශ වූහ.

5. "සරභ මෘගයෝ මැසි මදුරුවන් ප්‍රහීණවූ වනය ඇති, ශරත් කාලයෙහි ගංගාවන්ගේ හටගැන්ම ඇත්තාවූ පර්වත දුර්ගවලට පිවිසියාහුය.

6. "වනයට ගියාවූ සරභ මෘගයන්ද විනාශයට පැමිණියාවූ එළුවන්ද දැක ඒ අජපාල බ්‍රාහ්මණතෙම ශොකයෙන් කෘශවූයේ දුර්වර්ණ ශරීර ඇත්තේ හටගත් පාණ්ඩු රෝග ඇත්තෙක්ද වූයේය.

7. "මෙසේ යමෙක් ස්වකීය ජනයා හැර දමා ආගන්තුග ජනයා ප්‍රිය කෙරේද හෙතෙම හුදකළාවූ ඒ ධූමකාරී බ්‍රාහ්මණයා මෙන් බොහෝසෙයින් ශොක කෙරෙයි.

**414 ජාගර ජාතකය:-** 1. "මේ ලෝකයෙහි කවරෙක් තෙම නිදි දුරු කරන්නවුන් අතුරෙහි සයනය කෙළේවේද? මේ

ලෝකයෙහි කවරෙක් තෙම සයනය කළවුන් අතුරෙහි නිදි දුරු කෙළේවේද, කවරෙක්තෙම මාගේ මේ ප්‍රශ්නය දනීද කවරෙක් මා විසින් අසනලද ඒ ප්‍රශ්නය විසඳන්ට සමර්ථ වේදැයි විචාළේය.

2. "නිදි දුරු කරන්නවුන් අතුරෙහි මම සයනය කරන්නෙමි. සයනය කරන්නවුන් අතුරෙහි මම නිදි දුරු කෙරෙමි. මම මේ ප්‍රශ්නය දනිමි. මම තට එය ප්‍රකාශ කරන්ට පොහොසත්වෙමි.

3. "කෙසේනම් තොප නිදි දුරු කරන්නවුන් අතුරෙහි නිදීම් කෙළෙහිද, කෙසේ නිදන්නවුන් අතුරෙහි නිදි දුරු කෙළෙහිද, කෙසේ මේ ප්‍රශ්නය දන්නෙහිද, මා විසින් අසන ලද ප්‍රශ්නය කෙසේ කියන්ට පොහොසත් වෙහිද,

4. "යම් කෙනෙක් ශීල සංයමය (සන්සුන්කම) කියාද, ඉන්ද්‍රිය දමනය (හික්මවීම) කියාද, ධර්මය නොදන්නාහුද, ඒ සත්වයන් ක්ලේශ නිද්‍රාවෙන් නිදන කල්හි දේවතාවෙනි, මම අප්‍රමාද වශයෙන් නොනිදුවෙමි.

5. "දේවතාවෙනි යම් ක්ෂීණාශ්‍රව තෙර කෙනෙකුන්ගේ රාගයද ද්වෙෂයද අවිද්‍යාවද යන මොහු ප්‍රහීණ වූවාහුද, ඒ ආර්යයන් නොනිදන කල්හි මම නිදීම කෙළේ වෙමි.

6. "මෙසේ මම නිදි දුරු කරන්නවුන් අතුරෙහි නිදන්නේ වෙමි. මෙසේ නිදන්නවුන් අතුරෙහි නිදි දුරු කරන්නේ වෙමි මෙසේ මේ ප්‍රශ්නය දනිමි. මෙසේ තව ප්‍රකාශ කරන්ට හැකිවෙමි.

7. "යහපත්කොට නොනිදන්නවුන් අතුරෙහි නිදන්නෙහිය. යහපත්කොට නිදන්නවුන් අතුරෙහි නොනිදන්නෙහි, යහපත්කොට මේ ප්‍රශ්නය දන්නෙහිය. යහපත්කොට මා විසින් අසනලද ප්‍රශ්න විසඳන්ට සමර්ථ වෙහියයි" ප්‍රශංසා කෙළේය.

**415 කුම්මාස පිණ්ඩ ජාතකය:-** 1. "ආලමකවූ දර්ශන (දැකුම්) ඇති පසේ බුදුවරයන් කෙරෙහි පවත්වන ලද පරිචර්යා (වත්පිළිවෙත්) තොමෝ ස්වල්පවූවා නොවේමය. තෙල් නැති පැණි නැති කොමුපිඬු දීමෙහි විපාකය බලව.

2. "මට ඇත් ගව අස්හුද ධන ධාන්‍යයෝද සියලු පෘථිවියද දෙවඟනන් වැනිවූ මේ වරඟනෝද බොහෝ වෙත්. කොමුපිඬු දීමෙහි විපාකය බලව.

3. "පින්වත් රාජොත්තමය, නිරන්තරයෙන් ගාථාවන් කියන්නෙහිය. රට වඩන තැනැත්ත, ඔබ විචාරමි. අතිශයින් සතුටු සිත් ඇත්තේ මෙහි අර්ථය කියන්නෙහි.

4. "මේ නුවරම එක් වෙළඳ කුලයෙක්හි උපන්නේවීමි. අනුන්ගේ වැඩකොට ජීවිකාව කරන්නාවූ බැළයෙන් රැකෙන්නාවූ ශීලසංවරයෙන් යුක්තවූවෙක් වීමි.

5. "කර්මාන්ත පිණිස නික්මෙන්නාවූ මම ආචාරයෙන් හා ශීලයෙන් යුක්තවූ සිහිල් බවට පැමිණියාවූ කාමාදී ආශ්‍රව රහිතවූ ප්‍රව්‍රජිතයන් සතර දෙනෙකුන් දුටුයෙමි.

6. "ඒ පසේ බුදුවරයන් කෙරෙහි සිත පහදවා කොළ ඇතිරියෙහි වඩා හිඳුවා පසේ බුදුවරුන්ට පහන් සිත් ඇත්තේ සියතින් කොමුපිඬු දුන්නෙමි.

7. "මාගේ ඒ කුශල කර්මයාගේ මේ විපාකඵලය මෙබඳුය. සියලු සම්පත්තීන් සමෘද්ධවූ උතුම්වූ පෘථිවිය ඇති මේ රාජ්‍යය අනුභව කරමි.

"පිනට අධිපතිය, දානය කොටම අනුභව කරව. දානාදී පින්කමෙහි ප්‍රමාද නොවෙව, ධර්මචක්‍රය පවත්වව, රාජය, අධාර්මිකයෙක් නොවෙව කුශලාධිපතිය, ධර්මය රක්ෂා කරව.

8. "සොඳුර කොසොල් රජහුගේ යහපත් දුව ඒ මම නැවත නැවත ආර්යයන් විසින් පුරුදු කරණ ලද ඒ මාර්ගයෙහිම හැසිරෙන්නෙමි. රහත්වූ පසේ බුදුවරයෝ මා දක්නට මනාප වෙත්.

9. "කොසොල් රජුගේ යහපත් දුවවූ සොඳුර, දෙවඟනක් බඳුවූ දේවියක් මෙන් මෙවරඟනන් මැද හොබනෙහිය. යහපත්වූ කිනම් කර්මයක් පෙර කෙළෙහිද, කවර කාරණයකින් වර්ණ ඇත්තියක් වීද,

10. "මහරජ, මම එක්තරා කෙළෙඹි කුලයක අනුන්ගේ පනිවුඩ කාරීවූ දාසියක්වීමි. තුන්දොරින් සන්සුන්ව දැහැමින් දිවිපවත්වන්නී ආචාර ශීලයෙන් යුක්තවූ යහපත් දැකුම් ඇත්තියක්ද වීමි.

11. "එකල්හි මම තමන්ට පැමිණි ඔසවා ගෙණෙන ලද බත් කොටස පිඩු පිණිස හැසිරෙන්නාවූ භික්ෂුවූ පසේ බුදු කෙනෙකුන්ට සතුටු වූයෙම් සොම්නස් ඇත්තී සියතින් දුනිමි. මාගේ ඒ කර්මයාගේ විපාකය මෙබඳුයයි කීයේය."

**416 පරන්තප ජාතකයඃ-** 1. "මට අනිෂ්ටයක් එන්නේය, මට භයක් පැමිණෙන්නේය. ඊට හෙතු කවරේදයත්, එකල්හි වනාහි අත්ත, මිනිසෙකු විසින් හෝ මෘගයෙකු විසින් හෝ සොලවන ලදී.

2. "බියවන සුලුවූ නුදුරුැතන්හි වසන්නාවූ මාගේ බැමිණිය කෙරෙහි මට කාමය උපන්නේද, හෙතෙම ඒකාන්තයෙන් පරන්තපනම් දාසයා බියගැන්වූ ඒ අත්ත මෙන් මා කෙට්ටුවූවෙකුද පඬුවන්වූවකුද කරන්නේය.

3. "මාගේ කාන්තාතොමෝ ගමෙහි වසන්නී නින්දා නොකටයුක්ති මා ශොක කරවන්නීය. ඒ අත්ත පරන්තප යාමෙන් මා කෘශවූවෙකුද පඬුවන්වූවෙකුද කරන්නේය.

4. "කෘෂ්ණවූ ඇස් කෙළවර ඇත්තිය තී විසින් වනාහි පවත්වන මද සිනාද මියුරු තෙපුල්ද මා ඒ අත්ත පරන්තපයා මෙන් කෘශවූවෙකුද පඬුවන්වූවෙකුද කරන්නේය.

5. ඒ අතු ශබ්දය තෙම තා කරා පැමිණියේ යයි සිතමි. ඒ ශබ්දය තෙමේ තට සැලකෙළේයයි සිතමි. යමෙක් තෙමේ ඒ අත්ත (ශාඛාව) සෙලවීද, ඔහු විසින් ඒ පියා මැරූ කාරණය කියන ලද්දේයයි සිතමි.

6. අඥානවූ මා සිතන ලද මේ වනාහි තා කරා පැමිණියේය. කුමක් හෙයින්දයත්? එකල්හි වනාහි කම්පිතවූ ශාඛා තොමෝ මිනිසෙකු විසින් හෝ මෘගයෙකු විසින් හෝ කම්පිතවූදැයි පෙනිණි.

7. මාගේ පියා තෝ මැරූවෙහිය. නසා අතුවලින් වසමින් තට භයක් පැමිණෙන්නේයයි එසේම තෝ දැන ගත්තෙහියයි" කීයේය.

**(සප්තක නිපාතය නිමි.)**

# අට්ඨක නිපාතය.

## කච්චානි වර්ගය

**417 කච්චානි ජාතකය:-** 1. කාත්‍යායනිය, හැඳි සුදුවත් ඇත්තී පිරිසිදුවූ තෙත්වූ කෙහෙඇත්තී පිසන තලිය මිනිස් හිස් උදුනට නංවා තල පිටියෙන් සහල් කිම දෝනෙහිද තල බත කුමකට වන්නේද?

2. යහපත් නුවණ ඇති බ්‍රාහ්මණය, මේ තල බත වනාහි බොජුන් පිණිස නොවන්නේය. වැලිකුමටද යත් ධර්මයතෙම මළේය. ඒ ධර්මයට සොහොන් මැද මම මේ මතක බත කරන්නෙමි.

3. කාත්‍යායනිය විමසා දැන මේ කටයුත්ත කරව. ධර්මය තෙම මළේයයි මෙය තව කවරෙක් නම් කීයේද, අසමවූ ආනුභාව ඇති දහසක් නෙත් ඇති ශක්‍ර තෙමේ උතුම් ධර්මයවේ. කිසිකලෙකත් හේ නොමියේයයි" කීයේය.

4. බමුණෙනි ධර්මයතෙම මළේයයි මෙහි මාගේ දැඩිවූ ප්‍රමාණයවේ. මට මෙහිලා සැකයක් නැත්තේය. ඊට කරුණු කිමයත්? දැන් යම් යම් කෙනෙක්ම පාපයෝ වෙද්ද ඔව්හු ඔව්හුම දැන් සුවපත්වූවෝ වෙත්.

5. මාගේ යෙහෙළිණිය වනාහි වඳවූවාය. ඕතොමෝ මට හිංසාකොට පුතකු වැදුවාය. ඕතොමෝ දැන් කුලයට අධිපතිවූවාය. මම වනාහි බැහැරදමනලද්දී අනාථ වීමි.

6. මම ජීවත්වෙමි. මම මළේ නොවෙමි. තී සඳහාම මෙහි ආයේ වෙමි. යම් යෙහෙළිණියක් තොමෝ තීට වධ කොට පුතෙකු වැදුවාද, පුතු හා සමගම ඇය භළු කෙරෙමියි කීයේය.

7. දිව්‍ය රාජය, මෙයද ඔබට රුචිවේ. මා සඳහාම මෙහි ආයේ වෙහිය. මමද පුතුද යෙහෙළියද මුණුබුරුද සතුටු වෙමින් ගෙහි වෙසෙමු.

8. කාත්‍යායනිය තීට මෙයද රුචිවේ. තලනු ලැබුවාමවූ තීද පුතුන් කෙරෙහි මෛත්‍රී ධර්මය දුරුනොකෙළෙහිය. තීද පුත්‍රයාද යෙහෙළීද මුණුබුරාද සතුටුවෙමින් ගෙහි වාසය කරව්.

**9.** "ඒ කාත්‍යායන ගොත්‍ර ඇත්තී යෙහෙළිණිය හා සමග සතුටුවෙමින් ගෘහයෙහි විසීය. දෙවෙන්ද්‍රවූ ශක්‍රයා විසින් අධිගෘහිතවූ පුත්‍රයාද මුණුබුරාද ඇයට උපස්ථාන කළාහුයයි" වදාළේය.

**418 අට්ඨසද්ද ජාතකය:-** 1. "කොක් රජුට නිවෙස්වූ මාගේ පියා සතු ගෙයවූ මේ මඟුල් පොකුණ පෙර දියසොරොව්වෙන් දිය පිවිසි කල්හි බොහෝ මසුන් ඇත්තේයයිද බොහෝ දිය ඇත්තේයයිද කියත්. ඒ අපි අද මැඩියෙකු පමණින් යැපෙමු. එසේ වුවත් වාසස්ථානය නොහරිමු.

**2.** "නොහික්මුනාවූ බන්ධුර නම් ඇත් ගොච්වාගේ දෙවෙනි ඇස කවරෙක් බිඳීද, කවරෙක්තෙමේ මාගේ පුතුන්ද කූඩුවද මාද සුවපත් කරන්නේද,

**3.** "යම්තාක් ඒ ඵලය පිළිබඳ ගමනවීද සියලු ඵලය කන ලද්දීය. මහරජ, ක්ෂයවූ කෑයුතු ඵලය ඇති ගුල්ලා හරෙහි නොඇලේ.

**4.** "ඒ මම මෙයින් ගොස් රජ නිවෙසින් මිදුනී රැක් අතු නිවෙස් කොට ඇත්තී තමා කවර දවසක සතුටු කරවන්නෙම්දෝහෝ

**5.** "ඒ මම මෙයින් ගොස් රජහුගේ නිවෙසින් මිදුනේ මෘග සමූහයාගේ ඉදිරියෙන් ගමන් කරන්නේ උතුම් දිය හෙවත් නොඉඳුල් පැන් කවර දවසක පානය කරන්නෙම් දෝ හෝ

**6.** "පිටත්හි රටවැසි භරත නම් වැදිතෙම පස්කම් සැපයෙන් සම්පූර්ණවූ රාගයෙන් රත්වූ කාමයන්හි මූර්ඡාවූ ඒ මා මෙහි ගෙණායේය. තට යහපතක් වේවා.

**7.** "බලවත් අන්ධකාරයෙහි උස්වූ පර්වතය මතුයෙහි ඒ මාගේ බිරිඳවූ කිඳුරී තොමෝ ගලෙහි පය නොපැකිලේවායි සිළුටුවූ මෘදු වචනයෙන් මට කීවාය.

**8.** "ජාතීන්ගේ ක්ෂය කිරීමයයි කියන ලද නිවන්දුටු මම නිසැකව මව් කුස හිඳීමට නැවත නොපැමිණෙන්නෙමි. මෝතොමෝ වනාහි මාගේ කෙළවරවූ කුස පිළිසිඳීම වේ. මාගේ නැවත ඉපදීම ඇති සසර ගෙවුණේය."

**419 සුළසා ජාතකය:-** 1. "පින්වත, මේ ගෙල පළඳනා ආභරණයද, බොහෝවූ මුතුද වෛදූර්ය මාණික්‍යද යන සියල්ල හැර ගණුව, මාද දාසියකැයි මහජනයාට අස්වව.

2. "සොඳුර, මේ පළඳනා මුදා තබව, බොහෝ කොට නොවැළපෙව, තී නොමරා ගෙණෙන ලද ධනය මම නොදනිමි. නොගනිමියි සේයි.

3. "යම් කලක පටන් තමා සිහි කෙරෙම්ද, යම් කලක පටන් දැනුම් ඇති බවට පැමිණියේ වෙම්ද, මම තට වඩා ඉතා ප්‍රියවූ අනිකෙකු නොම දනිමි.

4. "එව, ඔබ වැළඳගන්නෙමි. ඔබ ප්‍රදක්ෂිණාද කරන්නෙමි. දැන් නැවත මාගේද ඔබගේද එක්වීමෙක් නොම ඇත්තේය.

5. "සියලු තන්හි පුරුෂ තෙම පණ්ඩිත නොමවේ. පණ්ඩිතවූ ස්ත්‍රිද ඒ ඒ තන්හි විචක්ෂණා වන්නීවේ.

6. "සියලු තන්හි පුරුෂතෙමේ පණ්ඩිත නොමවේ. වහා කරුණු සිතන්නීවූ ස්ත්‍රී තොමෝද පණ්ඩිතවේ.

7. "ඒකාන්තයෙන් යුහුවද ශීඝ්‍රවද සමීපයෙහි සිටම ඔහු මරණ උපාය සිතී සම්පූර්ණවූ දුන්නෙන් මුවෙකු මෙන් සුළසා තොමෝ සත්තුක නම් සොරහු මැරීය.

8. "මේ ලෝකයෙහි යමෙක් තෙමේ පැමිණි කාරණය වහා දැන නොගනීද, මද නුවණැති හෙතෙමේ පර්වත ප්‍රපාතයෙහි සොරාමෙන් නැසේ.

9. "මේ ලෝකයෙහි යමෙක්තෙමේ තමන් වෙත පැමිණි කාරණය වහාම දැනගණීද, හෙතෙමේ සුළසා තොමෝ සත්තුක නම් සොරාගෙන් මිදුනාක් මෙන් සතුරු උපද්‍රවයෙන් මිදේයයි" කීයේය.

**420 සුමංගල ජාතකය:-** 1. "අතිශයින්ම මම කිපියෙමියි බලා පෘථිවිශ්වර තෙමේ පළමුකොට දඬුවම් නොපනවන්නේය. කුමක් හෙයින්දයත්, අකාරණයෙන් තමා රජ බවට නුසුදුසු දෙය කරවයි. අන්‍යයන්ට බලවත් දුක් කියන්නේය.

2. "යම් කලෙක තමාගේ ප්‍රසාදය දන්නේද, අන්‍යයාගේ දුෂ්කෘතවූ කාරණය පරීක්ෂා කරන්නේද, එකල්හි මෙයම ඔහුගේ දෝෂයයි තෙමේ බලා ඉක්බිති ඔහුට සුදුසුවූ දඬුවම නිමකරන්නේය.

3. "ඡන්දාදීන් මුසපත් නොවූ යමෙක් තෙමේ නීතිය හෝ අනීතිය පමුණුවාද, හෙතෙම අන්‍යයාද නොම දවයි. තමාද නොම දවයි. මේ ලෝකයෙහි යම් පෘථිවිශ්වරයෙක් තෙම වරදට සුදුසු දඬුවම් පණවමින් දණ්ඩධාරීවේද, ගුණයෙන් හා යශසින් රැකුණාවූ ඒ රජතෙමේ රාජ්‍ය ශ්‍රීයෙන් නො පිරිහේ.

4. "නොවිමසා කටයුතු කරන්නාවූ යම් රජ කෙනෙක් මුසපත්වූවාහු වහා දඬුවම් පණවත්ද, අවර්ණයෙන් යුක්තවූ ඔහු ජීවිතය හරිත්. මෙයින් මිදුනාහුද දුර්ගතියට යෙත්.

5. "යම් රජ කෙනෙක් ආචාරයෙන් ආර්යවූ ධාර්මික රජුන් විසින් ප්‍රකාශ කරණ ලද දශ රාජ ධර්මයෙහි ඇළුණාහුද, ඒ රජහු වචනයෙන්ද සිතින්ද ක්‍රියායෙන්ද ශ්‍රෙෂ්ඨයහ. ශාන්තියෙහිද සුරතභාවයෙහිද සමාධියෙහිද, පිහිටියාවූ ඒ එබඳු දැහැමි රජහු දෙලොවටම පැමිණෙත්.

6. "මම ස්ත්‍රී පුරුෂයන්ට ස්වාමිවූ රජවෙමි. ඉදින් කිපුණෙම් නමුදු තමා නීතියෙහි පිහිටුවමි. එබඳුවූ ජන සමූහයා නොමග යාමෙන් වළක්වමින් නුවණින් අනුකම්පා කොට දඬුවම් පවත්වමි.

7. "ජනාධිපතිවූ රජතුමනි, පරිවාර සම්පත්තියද ප්‍රඥාවද ඔබම කිසිකලෙකත් අත්නොහරීවා. ක්‍රොධනොවූයේ නිතර පහත්වූ සිත් ඇත්තේ නිදුක්වූයේ ඔබ හවුරුදු සියයක් රට පාලනය කෙරේවා.

8. "මේ ගුණවලින් යුක්තවූ ක්ෂත්‍රියය, පිහිටි ආර්ය වූ පැවතුම් ඇත්තේ කීකරු වූයේ ක්‍රොධ නොකරන්නේ සුවපත්වූයේ ජනයා නොපෙළෙමින් පොළොව අනුශාසනා කරව, මෙයින් මිදුනේද සුගතියට පැමිණෙව,

9. "මෙසේ මනා නීතියෙන්ද යහපත් වචනයෙන්ද, සුචරිත ධර්මයෙන්ද ත්‍යාගයෙන්ද උපාය දක්ෂකමෙන්ද රාජ්‍ය

අනුශාසනා කරන්නේ කැළඹුනාවූද මහාජනයා මහවැස්සක් ජලයෙන් පොළොව තිවන්නාක් මෙන් තිවන්නේය.”

421 ගංගාමාල ජාතකය:- 1. “මහී නම්වූ පෘථිවිතොමෝ ගිනි අඟුරු මෙන් උෂ්ණවූවා. උණු අළුබඳු උණුවැලි එක්වූවා එතකුදුවුවත් අයොග වෘත්තයන්ට නගා ගී ගායනා කරන්නෙහි අව්ව තා නොතවයිද,

2. “උඩ සූර්යතෙමේ තවයි. යට වැල්ල තවයි. එසේ ඇතිකල්හි අයොග වෘත්තයන් ගායනය කෙරෙතියි අව්ව තා නොතවාද,

3. “අව්ව මා නොතවයි. වස්තුකාම ක්ලේශකාමයෝ මා තවයි. මහරජ, මට නොයෙක් කටයුතු ඇත්තාහ. ඔහු මා තවත් අව්ව නොතවයි.

4. “කාමය, තාගේ මුල මම දුටුවෙමි. කාමය, කාම විතර්කය හේතුකොටගෙණ තෝ උපදින්නෙහිය. එහෙයින් තා කල්පනා නොකරන්නෙමි. මෙසේ ඇතිකල්හි කාමය, තෝ ඇතිනොවන්නෙහිය.

5. “ස්වල්පවූද වස්තුකාම ක්ලේශකාමයෝ සුදුසු නොවෙත්. බොහෝවූද වස්තුකාම ක්ලේශකාමයන් හේතු කොට පෘථග්ජනයා තෘප්තියට නො පැමිණෙයි. අඥාන ව්‍යවහාර ඇති කාමයෝ බෙදයහ. විදසුන් වැඩීමෙන් මනාව දකින කුලපුත්‍රතෙම කාමයන් දුරුකරන්නේය.

6. “උදය නම්වූ මම මහත් බවට ගියාවූ සම්පතට පැමිණියෙම්ද, මෙය මාගේ ස්වල්පවූ කර්මයාගේ විපාකයවෙයි. යමෙක් තෙමේ කාමාශාව හැරදමා පැවිදිවීද, මාගේ යහළුවූ මානවකයාට එය යහපත් ලාභයෙක් විය.

7. “යම් කෙනෙක් තපස කරණකොටගෙණ අකුශල කර්මය යම්සේ දුරුකෙරෙද්ද, එසේ තපසින් කපු කුඹල් බැව් දුරුකෙරෙද්ද, ගංග මාලය, තපොගුණයෙන් මැඩ බ්‍රහ්මදත්ත යයි අද නමින් කථාකෙළෙහිද,

8. "අධිවාසන ක්ෂාන්තියගේ හා සුරතභාවයාගේ යම් විපාකයක්වේද, සාන්දෘෂ්ටික විපාකයම බලව්. යමෙක් තෙමේ සියලු දෙනා විසින් වඳිනලද්දේ වීද, ඔහු රජුන් සහිතව ඇමතියන් සහිතව වඳිමු.

9. "අගාරික මුනි ආදී මුනිවරුන් අතුරෙහි මෞන පථයන්හි (කථා නොකිරීමෙහි) හික්මෙන්නාවූ ගංගමාල නම්වූ පසේබුදුන්ට කිසිවක් නොකියව්. යමක් තරණය කොට පහවූ ශෝක ඇත්තාහු හැසිරෙද්ද, ඒ සංසාර සාගරය මෙතෙම වනාහි එතෙර කෙළේය."

**422 චෙතිය ජාතකය:-** 1. "ඒකාන්තයෙන් සත්‍ය ධර්මය තෙම මුසවා කීමෙන් නසනලද්දේ, වැඩිමහල්ලන් පිදීමේ ධර්මය තෙමේම නැසේ. ධර්මය නොනසනලද්දේ කිසිවක් නොනැසේ. එහෙයින් සත්‍ය ධර්මය නොනසන්නේය. නුඹවහන්සේ ධර්මය නසන ලද්දේ නො නැසෙව.

2. "විචාරණලද යමෙක්තෙම දන්නේ ප්‍රශ්නය අන් පරිද්දකින් ප්‍රකාශ කරන්නේද, එසේ බොරු කියන්නහුගේ දෙවියෝ පහවයෙත්. මුඛයද දුගඳහමයි. අහස තමා සිටි තැනින්ද ගිළිහේ.

3. "චේතිය නම් රජ ඉදින් වනාහි සැබව කීයෙහි නම් පෙරමෙන් වෙහිය. ඉදින් බොරුව කීයෙහි නම් මහරජ භූමියෙහි සිටිනු මැනව.

4. "යම් රජෙක්තෙම ප්‍රශ්නය අසනලද්දේ දන්නේ එය අන් පරිද්දෙකින් ප්‍රකාශ කරන්නේද, ඔහුගේ රාජ්‍යයට නොකල්හි වසියි. ඔහුගේ රාජ්‍යයට සුදුසු කල්හි නොවසියි.

5. "චේතිය නම් රජුනි, ඉදින් වනාහි ඇත්ත කීයෙහි නම් මහරජ, බිම සිටිනු මැනව.

6. "මහරජ, අසනලද යමෙක් තෙම දනිමින් ඒ ප්‍රශ්නය අන්පරිද්දෙකින් විසඳන්නේද, සර්පයාගේ මෙන් ඔහුගේ දිව විප්‍රකාරවේ.

7. "එම්බා චේතිය නම්වූ මහරජ, ඉදින් වනාහි සත්‍ය වචනය කීයෙහි නම් පෙර මෙන් වෙහි. ඉදින් බොරු කීයෙහි නම් මහරජ, බිමට බැස සිටිනු මැනව.

8. "එම්බා මහරජ අසනලද යමෙක් තෙම දන්නේ ඒ ප්‍රශ්නය අන්පරිද්දෙකින් විසඳන්නේද, මත්ස්‍යයාගේ මෙන් ඔහුගේ දිව ඇති නොවේ.

9. "චේතිය නම්වූ මහරජ ඉදින් වනාහි සත්‍යය කීයෙහි නම් පෙර මෙන් වෙති. ඉදින් බොරු කීයෙහි නම් මහරජ, බිමට බසිනු මැනව.

10. "විචාරණ ලද යමෙක්තෙම දනිමින් ඒ ප්‍රශ්නය අන්පරිද්දකින් ප්‍රකාශකරන්නේනම් ඔහුගේ කුලයෙහි ස්ත්‍රීහු උපදිත්. පුරුෂයෝ නූපදිත්.

11. "චෙතිය නම්වූ මහරජ, ඉදින් වනාහි ඇත්ත කීයෙහි නම් පෙර මෙන් වෙව, ඉදින් බොරු කීයෙහිනම් භූමියට පිවිසෙව,

12. "අසනලද්දාවූ යමෙක්තෙම දනිමින් ඒ ප්‍රශ්නය අන් පරිද්දකින් කියන්නේනම් ඔහුගේ පුත්‍රයෝ ඔහුට උපකාර ඇත්තෝ නොවෙත්. දිශානුදිශාවට පලායෙත්.

13. "චේතිය නම් රජ, ඉදින් වනාහී ඇත්ත කීයෙහිනම් පෙර මෙන් වෙව, මහරජ, ඉදින් බොරු කීයෙහිනම් භූමියට ප්‍රවිෂ්ට වෙව,

14. "ඒ චේතිය රජතෙම පූර්වයෙහි කපිල නම් මහර්ෂීන් කරණකොටගෙණ රජ බවට පැමිණියේ අහස හැසිරෙන්නාවූ මෙතෙම පිරිහුණ ස්වභාව ඇත්තේ කාලානුරූප බවට පැමිණ පොළොවටද ඇතුළුවූයේය.

15. "එහෙයින් වනාහි ඡන්දයෙන් අගතියට යාම ප්‍රාඥයෝ ප්‍රශංසා නොකෙරෙත්. එහෙයින් දුෂ්ට නොවූ සිත් ඇත්තේ සත්පුරුෂයන් විසින් යහපතැයි කියනලද සත්‍ය වචනය කියන්නේය."

**423 ඉන්ද්‍රිය ජාතකය**:- 1. "එම්බා නාරදය, යමෙක්තෙම කාමාශාවෙන් ඉන්ද්‍රියයන්ගේ වසඟයට යේද, හෙතෙම දෙලොව සැප හැරදමා ජීවත්වන්නේ නමුදු කැමැතිදේ නොලත් ශොකයෙන් වියලේ.

**2.** "පස්කම් සැපයට අනතුරුව නිරාදුකට පැමිණෙත්. සිල් රැකීම් වශයෙන් පැමිණෙන දුකට අනතුරුව දෙව් මිනිස් සැපයට පැමිණෙත්. ඒ නාරද ඍෂිතෙමේද නෛෂ්ක්‍රම්‍ය සැපය නසා දුකට පැමිණියේය. උතුම්වූ ඒ ධ්‍යාන සැපය කැමතිවනු මැනව.

**3.** "යමෙක් තෙමේ දුක් උපන් කල්හි දුක් ඉවසන්නේද දුක මැඩ විනාශ කෙරේද, ඒ ප්‍රාඥතෙම දුක් කෙළවර ඇති සැපයවූ ධ්‍යානයට මනාව පැමිණේ.

**4.** "කාමයන්ට නොම කැමතිවිය යුත්තාහ. අර්ථය රහිතවන හෙයින්ද, අර්ථයට උපකාර නොවන හෙයින්ද, වෙත්. උපදවනලද්දාවූද ධ්‍යානය විනාශකොට කුශල ධර්මයෙන් චුතවන්ට සුදුසු නොවේ.

**5.** "ගෘහපතියෙකුට ඇතිවන දුක මැනව. බෙදාදී වැළඳීමද මැනව. මහත්වූ අර්ථලාභයන්හි උඩඟු නොවීමද මැනව. ධන විනාශයෙහි ක්ලාන්ත නොවීමද මැනව.

**6.** "ඒ දේවල ඍෂිතෙම යමක් කීයේද, මේ පණ්ඩිත බවද මෙපමණක්මය යමෙක් තෙම ඉන්ද්‍රියයන්ගේ වසඟයට යන්නේද, මීට වඩා කිසියම් ලාමක බවෙක් නැත්තේය.

**7.** "එම්බා සිවි මහරජ, සතුරන්ගේ අතට පත්වූවෙක් වැනි මා මෙන් විනාශයට පැමිණේද, ගොවිතැන්, වෙළඳාම් ආදී කර්මාන්තද හස්තිශිල්ප ආදී විද්‍යාවද ධන රැස්කිරීමෙහි දක්ෂ බවද, විවාහයද, ශීලය හා මෘදුබවද යන

**8.** "මෙතෙක් අභිවෘද්ධිදායක කරුණු නසා ස්වකීය අකුශල කර්මයෙන් මනුෂ්‍යප්‍රේතව උපන්නාවූ ඒ මම දහසකින් පැරදුණාහු මෙන් නෑයන් රහිතවූයේ පිළිසරණ රහිතවූවෙක් වෙමි.

**9.** "ආර්ය ධර්මයෙන් පහව ගියාවූ මම ප්‍රෙතයෙක් යම්සේද එමෙනි. සැප කැමැත්තවුන් දුක් පත්කරවා මේ මනුෂ්‍යප්‍රෙත බවට පැමිණියෙමි. ඒ මම ගින්නෙහි සිටියෙකු මෙන් සැපයට නොපැමිණෙමි.

**424 ආදිත්ත ජාතකය:** 1. "ගෘහය ගිනිගත් කල්හි යම්කිසි භාණ්ඩයක් බැහැර කෙරේද, ඒ ගෘහ ස්වාමියාහට වැඩ පිණිස වේ. යමක් එසේ බැහැර නොකරණලදද එය එහි හළුවේ.

2. "එපරිද්දෙන් ලෝකයතෙම ජරාවෙන්ද මරණයෙන්ද ගිනිගන්නා ලද්දේය. දන්දීමෙන්ම බැහැර කරන්නේය. දෙනලද්ද, මනාකොට බැහැර කරණ ලද්දේ වේ.

3. "යම් සත්වයෙක්තෙම උට්ඨාන (නැඟීසිටින) වීර්යයෙන් ලබනලද දැහැමින් ලබනලද දෙයින් දන්දේද, හෙතෙම යමයාගේ වේතරණී නම් නරකය ඉක්මවා දිව්‍ය සම්පත්වලට පැමිණේ.

4. "දන් දීමද යුද්ධ කිරීමද සමානයයි කීහු. ස්වල්පවූද හරිනාලද ජීවිතාශා ඇත්තෝ බොහෝ සතුරන් දිනත්. නොහොත් කුශල ධර්මයෝ ස්වල්ප වූවාහුද, බොහෝ වූ අකුශලයන් දිනත්. ඉදින් ස්වල්පයකුදු කම්පල අදහමින් දේද, එහෙයින්ම හෙතෙම පරලොව සුවපත් වේ.

5. "දක්ෂිණාර්හයන් (දනට සුදුස්සන්) සොයා දන්දීම සර්වඥයන් වහන්සේලා විසින් පසස්නාලදී මේ මනුෂ්‍යලෝකයෙහි යම් දක්ෂිණාර්හ කෙනෙක් වෙද්ද, උන්වහන්සේලා කෙරෙහි දෙනලද දානයන් මනාකෙතෙහි වපුරණලද බීජ මෙන් මහත්ඵල ඇතිවෙත්.

6. "යමෙක් තෙමේ ප්‍රාණ නම් වූ භූතයන් නොපෙළමින් හැසිරෙන්නේ අනුන්ට නින්දා නිමිත්තෙන් පව් නොකෙරේද, පවට භය ඇත්තාහට ප්‍රශංසා කරත්ද, එහි දක්ෂවූවහුට ප්‍රශංසා නොකෙරෙද්ද, සත්පුරුෂයෝ බියෙන් පව් නොකෙරෙත්.

7. "ලාමකවූ බ්‍රහ්ම චර්යාවෙන් රජකුලෙහි උපදී. මධ්‍යමවූ බ්‍රහ්ම චර්යාවෙන් දෙව්බවට පැමිණේ. උතුම්වූ බ්‍රහ්මචර්යාවෙන් පිරිසිදුවේ.

8. "ආමිෂ දානය වනාහී ඒකාන්තයෙන් බොහෝසේ පසස්නාලදී. දානයටද වඩා ධර්ම පදයම උතුම්. පෙරද ඉතා පෙරද සප්‍රාඥවූ ඒ බුද්ධාදී සත්පුරුෂයෝ නිර්වාණයටම පැමිණියාහුය.

**425 අට්ඨාන ජාතකය:-** 1. "යම් කලෙක්හි සියලු ගංගාවෝ කෞමදයෙන් (සුදු නෙළුම්න්) සැදුම් ලද්දාහු වෙද්ද, කොවුල් පක්ෂීහු සකසේ සුදුවන් වෙද්ද, දඹගස තල් ගෙඩියක් දේද, ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**2.** "යම් කලෙක්හි ඉබ්බාගේ ලොම්වලින් ත්‍රිවිධවූ උතුරු සළුවක් හේමන්තයෙහිවූ පොරෝණය වන්නේද? ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**3.** "යම් කලෙක්හි මදුරු පාවලින් දැඩිවූද නොසැලෙන්නාවූද අටල්ලෙක් මනාව කරණ ලද්දේ වන්නේද, ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**4.** "යම් කලෙක්හි දෙව්ලොවට නැගීම පිණිස සස විශානයන්ගෙන් (හා අංවලින්) හිණක් මනාකොට කරණ ලද්දී වන්නීද ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**5.** "යම් කලෙක්හි මූෂිකතෙම හිණට නැගී සඳ කන්නේද? රාහු ග්‍රහයාද පෙරලාද වන්නේද, ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**6.** "යම් කලෙක මැස්සෝ රා කලයක් පානය කොට සමූහ චාරීව ගිනි අඟුරෙහි වාසය කරන්නාහුද? ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**7.** "යම් කලෙක්හි බිඹු පලවැනි තොල් ඇති යහපත් මුහුණු ඇති නෘත්‍ය ගීතයට දක්ෂවූ කොටළුවෙක් වන්නේද? ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**8.** "යම් කලෙක කවුඩෝද බකමූණෝද රහසිගතවූවාහු මන්ත්‍රණය කරන්නාහුද ඔවුනොවුන් ප්‍රිය වන්නාහුද ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**9.** "යම් කලෙක කෑලපත්වලින් කළ ඡත්‍රය වැසි වැළක්ම පිණිස ස්ථිර සාරවූවක්වන්නේද, ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්නේය.

**10.** "යම් කලෙක උකුසු පක්ෂීතෙම ගන්ධමාදන පර්වතය තුඩින් ගෙණ යන්නේද, ඉක්බිති එකල්හි ඒකාන්තයෙන් සමාගමය වන්ය.

11. "යම් කලෙක යන්ත්‍රාදී උපකරණ සහිතවූ පටාකාර සහිතවූ සමුද්‍රයෙහිවූ නැවක් කොලුවෙක් ගෙනියන්නේද, ඉක්බිති එකල්හි එකාන්තයෙන් සමාගමය වන්නේය."

**426 දීපි ජාතකයඃ-** 1. "මයිලණුවෙනි, කිම ඉවසිය හැකිද යැපිය හැකිද, ඔබට සැපද ඔබගේ සුවය මව් තොමෝ අද විචාළීය. අපිද ඔබට සුව කැමැත්තාහුද වෙමු.

2. "එළුදෙන, මාගේ වල්ගා හවරිය පාගා බලාත්කාරකම්කොට අද මයිලනුවෙනි යන වචනයෙන් මිදිය යුත්තීයයි සිතන්නෙහිද?

3. "පූර්ව දිශාවට අභිමුඛව හුන්නෙහිය. මම නුඹ වහන්සේගේ ඉදිරියෙන් ආමි. පසුපසින් ඔබගේ නගුටවෙයි කෙසේ නම් පැගුයෙම්ද?

4. "සමුද්‍ර සහිතවූ පර්වත සහිතවූ සතර දිවයින යම් තාක් වේද්ද, මාගේ වල්ගා හවරිය ඒතාක්වේ. කෙසේ නම් තී එය නොගන්නීද?

5. "දුෂ්ටයාගේ නගුට දික්ය යන ඒ කරුණ මව්පියෝද සහෝදරයෝද පෙරම මට කීහු. ඒ මම අහසින් ආමි.

6. "එළුදෙන අහසෙහි එන්නාවූද තී දැක මුව සමූහයා පැන ගියේය. තී විසින් මාගේ ගොදුර නසන ලදී.

7. "මෙසේ කියා එසේ වලප්නාවූ එළුදෙනගේ ගෙල ලෝහිත පානය කරන්නාවූ දිවිතෙමේ ඩැහැගෙණ පෙළීය. දුෂ්ටයා කෙරෙහි සුභාෂිත (හිත) වචනයෙක් නැත්තේය.

8. "දුෂ්ටයා කෙරෙහි නීතියක් නොම ඇත්තේය. ස්වභාව ධර්මයෙක්ද නොම ඇත්තේය. යහපත් වචනයෙක්ද නැත්තේය. දුෂ්ටයා කෙරෙහි පරාක්‍රමය යොදන්නේය. ඒ දුෂ්ට තෙමේද සත්පුරුෂයන් හා නොඇලේයයි කීයේය."

**(අෂ්ටක නිපාතය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# නවක නිපාතය.

**427 ගිජ්ඣ ජාතකයː-** 1. "කණු සිටුවා රැහැන් ඇද කරණ ලදහෙයින් සංකුපථ නම්වූ පැරණිවූ ගිජුකුළු මුදුනෙහි මාර්ගයක් විය. එහි ගිජුලිහිණියෙක් මහළු මව්පියන් පොෂණය කෙළේය.

**2.** "ඔවුන්ට වුරුණු තෙල් සහිත පිඹුරුමය බොහෝ සෙයින් ගෙණායේය. පියතෙමේද දන්නේ උස්තැන්හි පැන යන්නාවූ මහත් බල ඇති ඉතා දුර යන්නාවූ පක්ෂ බලඇති සුපත්ත නම්වූ පුත්‍රයාහට මෙසේ කීයේය.

**3.** "දරුව, යම් කලෙක මුහුදින් වටවූ රිය රෝදයක් මෙන් රවුම්වූ ඉල්පෙන්නාවූ පෘථිවිය දන්නේද, හෙවත් දකින්නෙහිද දරුව එයින් නවතුව ඉන් එහා නොයව.

**4.** "බලවත්වූ පියාපත් ඇති වක්වූ ග්‍රීවා ඇති පක්ෂි රාජතෙම පර්වතයන්ද වනයන්ද බලමින් වේගයෙන් අහසට පැන නැංගේ විය.

**5.** "යම්සේ යවයි කියා පියාගෙන් අසන ලදද, එසේවූ සයුරෙන් වට කරණ ලද රිය රෝදයක් මෙන් වටවූ පෘථිවිය ගිජු ලිහිණිතෙම දුටුයේය.

**6.** "හෙතෙම ඒ පියාගේ අවවාදයද ඉක්මවා ඈතටම ගියේය. බල ඇති ඒ පක්ෂියාද තියුණුවූ වළාමඩුළු පැහැර ගත්තේය.

**7.** "වේරම්බ වාතයන්ගේ වසයට ගියාවූ කියන ලද මාර්ගය ඉක්මවා ගියාවූ පක්ෂිරාජතෙම නැවත නවතින්ට නොහැකි විය. විනාශයටම පැමිණුණේය.

**8.** "අවවාදය අනුව නොපිළිපදින්නාවූ යම් ගිජුලිහිණියෙක්වීද ඔහුගේ පුත්‍රයෝද භාර්යාවෝද සෙසු පිරිවර ජනයෝද යන යම් කෙනෙක් ඇද්ද? ඒ සියල්ලෝ විනාශයට පැමිණියාහුය.

**9.** "මෙසේම මේ ලෝකයෙහි යමෙක් තෙම වැඩිහිටියන්ගේ වචනය දැන නොකෙරේද, සීමාව ඉක්මවා හැසිරෙන්නාවූ

උඩඟුවූ ඉක්මවූ අනුශාසනා ඇති ගිජුලිහිණියා මෙන් වැඩිහිටියන්ගේ අවවාදය නොකොට සියල්ලෝ විනාශයට පැමිණෙත්.”

**428 කොසම්බ ජාතකය:-** 1. “පතළාවූ ශබ්ද ඇති සමානවූ ජනතෙම කිසිවෙක් අඥානයයි නොදන්නේය. සංඝයා බිඳෙන කල්හි අනිකක් බොහෝසෙයින් නොදත්හ.

**2.** “අඥානයෝ පණ්ඩිත මානී බැවින් වචනවල ආඩම්බර ඇත්තාහ. මුඛාරූඪවූවක්ම කියන්නාහ. යම්තාක් කැමති වෙද්ද, ඒතාක් මුඛාරූඪකොට යම් කලහයකින් මේ නිර්ලජ්ජී භාවයට පමුණුවන ලද්දාහුද, එය නොදත්හ.

**3.** “මට ආක්‍රොශ කෙළේය. මට ගැසීය. මා පැරදවීය. මා සතු දෑ සොරකම් කොට ගත්තේයයි යමෙක් තුමූ ඒ වෛරය බැඳ ගනිද්ද, ඔවුන්ගේ වෛරය නොසංසිඳේ.

**4.** “මට බැන්නේය. මා පැරදවීය, මා අයිති දෙය සොරකම්කොට ගන්නේයයි යමෙක් තුමූ ඒ වෛරය නැවත නැවත නොබැඳ ගණිද්ද, ඔවුන්ගේ වෛරය සංසිඳේ.

**5.** “මේලෝකයෙහි වෛරයෝ කිසිකලෙකත් වෛරයෙන් නොසංසිඳෙත්. වෛරය නොකිරීමෙන්ම සංසිඳෙත්. මේ අවෛරයෙන් වෛරය සංසිඳුවීම බුද්ධාදී උතුමන්ගේ පුරාතන ධර්මයකි.

**6.** මේ සඟමැද අන්‍යයෝ අපි මරුමුවට යම්හයි නොහොත් කලහ කිරීමට උත්සාහ කරම්හයි නොදනිත්. එහි යමක්හු වනාහි අපි කලහ කිරීමට යත්න කෙරෙමුයි දනිද්ද, එහෙයින් කලහයෝ සංසිඳෙත්.

**7.** ඇට සිඳිනාලද දිවිතොර කරන්නාවූ ගවයන් අශ්වයන් හා රන් රුවන් ආදී ධන සොරකම්කොට ගන්නාවූ රට කොල්ල කන්නාවූ ඒ රජවරුන්ගේද එක්වීමවේ. කුමක් හෙයින් තොපගේ සමගිය නොවන්නේද?

**8.** “නුවණැති, සමග හැසිරෙන, යහපත් හැසුරුම් ඇති ධෛර්යවත්වූ කල්‍යාණ මිත්‍රයෙකු ඉදින් ලබන්නේ නම් සියලු

උපද්‍රවයන් මැඩ ඔහු හා සතුටු සිත් ඇත්තේ ස්මෘතිමත් වූයේ හැසිරෙන්නේය.

**9.** "නුවණැති, සමග හැසිරෙන මනා හැසුරුම් ඇති ධෛර්ය්‍ය සම්පන්නවූ යහපත් මිත්‍රයෙකු ඉදින් නොලබන්නේ නම් දිනන ලද රටහැර වනගතවූ මහාජනක රජහු මෙන්ද වනයෙහි හුදකලාව වසන මාතංග නම්වූ පාරිලෙය්‍යක ඇතු මෙන්ද තනිව හැසිරෙන්නේය.

**10.** "තනිවූවහුගේ හැසිරීම උතුම්වේ. අඥානයා කෙරෙහි සහාය බවක් නැත්තේය. වනයෙහි තනිව වසන මාතංග නම්වූ ඇතු මෙන් උත්සාහ රහිතව තනිව හැසිරෙන්නේය. පව් නොම කරන්නේය."

**429 මහා සුව ජාතකය:-** 1. "යම් කලෙක්හි ගස හටගත් ගෙඩි ඇත්තේ වේද, එකල්හි එය කුරුල්ලෝ අත්තෙන් අත්තට යන්නාහු කත්. ගෙඩි අවසන්වූ කල්හි ගස ගෙඩි නැතැයි දැන කුරුල්ලෝ එයින් දිශානු දිශාවට යෙත්.

**2.** "ලේවන් තුඩු ඇති පක්ෂි රාජය, සැරිසරමින් හැසුරුනෙහි. කීර පක්ෂිය, නුඹ වියලි ගසෙහි කිම, සිතිවිලි සිතන්නෙහිද, එබැවින් එය කියව. වසන්ත වනයට බඳු පැහැ ඇති කීර පක්ෂිය, කුමක් හෙයින් වියලි ගස නොහරනෙහිද,

**3.** "එම්බා හංසරාජය, ඉදින් යහළුවන්ට යම් යහළු කෙනෙක් වෙද්ද, ඔහු තුමූ දිවි තොරවීමෙහිද සුව දුක් දෙක්හිද පිරිහුණේයයිද නොපිරිහුණේයයිද එය සත්පුරුෂයෝ සත්පුරුෂයන්ගේ ධර්මය සිහිකරන්නාහු අත්නොහරිත්.

**4.** "එම්බා හංස රාජය, ඒ මම සත්පුරුෂයන්ගෙන් එක්තරා එකෙක් වෙමි. මට මේ රුක නෑයාද වේ. යහළුවාද වේ. පිරිහුණේයයි දැන ජීවත්වීම ප්‍රයෝජනකොට ඇත්තේ එය හැර දමන්ට උත්සාහ නොකරමි. ඒ හැරදැමීම සත්පුරුෂ ධර්මය නොවේ.

**5.** "යහළු බවද මෛත්‍රියද පිරිස් මැද සමාගමයද මනා කොට කරණ ලද්දේවේ. ඉදින් ඒ ධර්ම තුන රුචිවෙහි නම් දන්නවුන්ගේ ප්‍රශංසාවට සුදුස්සෙක් වෙහිය.

**6.** "පියාපත් යානා කොට ඇති අහසින් ගමන් කරන්නාවූ වකුවූ ග්‍රීවා ඇති කීර පක්ෂි රාජය, ඒ මම තොපට කැමති වරයක් දෙමි. සිතෙහි යම්කිසිවක් කැමැත්තෙහි නම් එය ඉල්වා ගණුව.

**7.** "එම්බා හංස රාජය, නුඹ ඉදින් මට වරයක් දෙන්නේ නම් මේ දිඹුල් රුක නැවත ආයුෂ ලබාවා ඒ ගස අතු ඇත්තේ ගෙඩි ඇත්තේ මනාව වැඩුණේ මිහිරි ඵල ඇත්තේ ශොභමානව සිටීවා.

**8.** "යහළුව, මහත්වූ ඵල ඇති ඒ වෘක්ෂය බලව දිඹුල් ගස හා සමගම තාගේ වාසය වේවා. ඒ දිඹුල් රුක අතු ඇත්තේ ගෙඩි ඇත්තේ මනාව වැඩුණේ මිහිරි ඵල ඇත්තේ සොභමාන වෙමින් සිටීවා.

**9.** "එම්බා ශක්‍ර දෙවේන්ද්‍රය, මම ගෙඩි සහිතවූ ගස දැක අද යම්සේ සුවපත් වූයෙම්ද, එසේ සියලු නෑයන් සමග ඔබ සුවපත්වේවා.

**10.** "උදුම්බර ගස ගෙඩි සහිතකොට කීර පක්ෂියාටද වරය දී සුජා නම් භාර්යාව හා සමග දෙවියන්ගේ නන්දන නම් උයනට ශක්‍රතෙම ගියේය."

**430 චුල්ල සුක ජාතකයඃ-** 1. "නිල්වන් කොල ඇති ගස් ඇත්තාහුය. බොහෝ ගෙඩි ඇති නොයෙක් වෘක්ෂයෝ ඇත්තාහුය. පවනින් හඬන්නාවූ වියලි ගසෙහි කුමක් හෙයින් ගිරවාගේ සිත ඇළුණේද,

**2.** බොහෝ නොයෙක් සිය ගණන් අවුරුදු ඵලය අනුභව කෙළෙමු. ඵල නැති රුකද දැන පෙර යම්සේ මිත්‍ර බවක් වීද, ඵල නැති කල්හිද එයමවී.

**3.** "වියලී ගියාවූද පවනින් හඬන්නාවූ කොළ වැටුණු දාම නම් වෘක්ෂය හැරදමා පක්ෂීහු යෙත්. ගිරවා මෙහි කවර දොෂයක් දක්නෙහිද,

**4.** යම් කෙනෙක් ඵලය පිණිස සේවනය කෙරෙද්ද, ඵල නැතැයි එය හැර දමත්ද, ආත්මාර්ථය පිළිබඳ නුවණ ඇති

දුෂ්ට බුද්ධි ඇති ඔහු තුමූ මිත්‍ර පක්ෂය නසන්නාහු වෙත්. නොහොත් ආත්මාර්ථ පක්ෂයෙහිම වැටෙන්නාහු වෙත්.

5. "යහළු බවද මෛත්‍රියද සමූහයා මැද සමාගමයද මනාකොට කරණ ලද්දේවේ. ඉදින් ඒ ධර්මය කැමති වෙහි නම් ප්‍රාඥයින්ගේ ප්‍රශංසාවට සුදුස්සෙක් වෙහිය.

6. "පියාපත් යානාකොට ඇති අහසින් ගමන් කරන්නාවූ වක්වූ බෙල්ල ඇති සුවරාජය, ඒ මම තොපට වරයක් දෙමි. සිත්හි යම්කිසිවක් කැමැත්තෙහි නම් එය ඉල්වව.

7. "කොළ ඇති ගෙඩි සහිත ඒ ගස දක්නේනම් ඉතා යෙහෙක නිධානයක් ලැබූ දිළින්දෙක් මෙන් නැවත නැවත එය සතුටු කරන්නේය.

8. "ඒ ගංගායෙන් අමෘත ජලය ගෙන දිඹුල් ගසට වත්කෙළේය. ඒ ගසේ සිහිල් හෙවණ ඇති සිත් කලුවූ අතු පතර වැඩුණාහුය.

9. "එම්බා ශක්‍ර දෙවෙන්ද්‍රය, මම ගෙඩි සහිත ගස දැක අද යම්සේ සුවපත්වූයෙම්ද එසේ ඔබද සියලු නෑයන් සමග සුවපත් වෙව.

10. දිඹුල් ගස එල සහිතකොට ගිරවාටද වර දී සුජාතාව හා සමග දෙවියන්ගේ නන්දනවන නම් උයනට ශක්‍ර තෙම ගියේය."

431 **හාරිත ජාතකය:-** "මහා බමුණාණෙනි, හාරිත නම් තපස්වීතෙම කාමයන් අනුභව කෙරේයයි මා විසින් මේ කාරණය අසනලදී. කිමෙක්ද, මේ කීම බොරුද, කිමෙක්ද, පිරිසුදුවූයේ වාසය කෙරෙහිද,

2. "මහරජ, තා විසින් අසනලද වචනය යම්සේද, මේ කාරණය එසේමැයි. නින්දිතවූ මාර්ගයට පිළිපන්නේ වෙමි. මුළාවිය යුතුවූ පඤ්චකාම ගුණයන්හි මුළාවූයේ වෙමි.

3. "සියුම්වූ සියල්ල මනාකොට සිතන්නාවූ ප්‍රඥාව කුමකටද? යම් ප්‍රඥාවකින් උපන්නාවූ රාගය කෙබඳු සිත් ඇත්තේ දුරු නොකරන්නේද,

4. "මහරජ, ලොකයෙහි යමෙකු කෙරෙහි ප්‍රඥාතොමෝ පිහිට නොලබාද, රාගයද, ද්වෙෂයද මදයද මොහයද යන මේ සතරදෙන අතිශයින් ඉතා බල ඇත්තෝයි.

5. "පූජාවට සුදුසුවූ සිල්වත්වූ පිරිසිදුවූ හාරිත නම් තපස්වීතෙම ප්‍රඥා ඇත්තේය. පණ්ඩිතද වේයයි මෙසේ පින්වත්තෙම අප විසින් සම්භාවනා කරණලදී.

6. "මහරජ, ශුභ වශයෙන් ගත්තාවූ රාගයෙන් යුක්තවූ ලාමකවූ කාම විතර්කයෝ ධර්ම ගුණයෙහි ඇළුණු නුවණ ඇත්තාවූද තපස්වියාට හිංසා කෙරෙත්.

7. "තොපට යහපතෙක් වේවයි, බොහෝදෙනා අතුරෙන් නුවණ ඇත්තේයයි ප්‍රසිද්ධවූයේ විය. තගේ ශරීරයෙහි හටගත්තාවූ ගුණ වර්ණ රූප වර්ණ දෙක කිළුටු කරන්නාවූ මේ රාගය උපන්නේය. එය දුරු කරව,

8. "නුවණ ඇස අන්ධ කරන්නාවූ බොහෝ දුක් ඇත්තාවූ මහත් විෂයක් වැනිවූ ඒ කාමයන් දුරු කිරීමට ඔවුන්ගේ මුල සොයන්නෙමි. රාගය බැඳුම් සහිතව සිඳිමි.

9. "හාරිත නම්වූ සත්‍යවූ පරාක්‍රම ඇති තපස්වීතෙම මෙය කියා කාම රාගය දුරුකොට බඹ ලොවට පැමිණියේ විය."

**432 පදමානවක ජාතකයः-** 1. "බොහෝ ශාස්ත්‍ර දත් විසිතුරු කථා ඇති පාටල නම් ගාන්ධර්වයා ගංගාතොමෝ ගසාගෙන යයි. ගඟ දියෙන් ගෙන යනු ලබනු තැනැත්ත, තට යහපතක් වේවා. මට එක් කුඩා ගාථාවක් කියව.

2. "දුකට පැමිණියහු යම් ජලයකින් තෙමද්ද, ආතුර වූවහු යම් ජලයකින් තෙමෙද්ද, ඒ ජලය මැද මිය යන්නෙමි. එසේවූ පිහිට ඇති තැනින් භය උපනි.

3. "යම් පොළොවෙක බීජයෝ හටගනිද්ද, සත්වයෝ යම් තැනෙක්හි පිහිටියාහුද, ඒ පොළොව මාගේ හිස පෙළයි. පිහිට ඇති තැනින් භය උපනි.

4. "යමක් කරණකොට ගෙණ බත් පිසද්ද, යමක් කරණකොට ගෙණ ශීත නසීද, ඒ මේ ගින්න තෙම මාගේ ශරීරය දවයි. පිහිටවූ තැනින් භය උපනි.

5. "අනුභව කළාවූ යම් ආහාරයකින් බොහෝවූ බ්‍රාහ්මණ ක්ෂත්‍රියයෝ යැපෙද්ද, ඒ ආහාරය තෙම අනුභව කරන ලද්දේ මා විනාශයට පමුණුවයි. පිහිට ඇති තැනින් භය උපනි.

6. "ග්‍රීෂ්ම ඍතුන් සම්බන්ධවූ අන්තිම මාසයෙහි පණ්ඩිතයෝ වාතය කැමතිවෙත්. ඒ වාතය තෙම මාගේ ශරීරය බිඳිනේය. පිහිට ඇති තැනින් භය උපනි.

7. "යම්බඳුවූ ගසක් පක්ෂීහු ඇසුරු කළෝද, ඒ මේ ගස ගිනිපිට කෙරේද, පක්ෂීණි, දිශාවන් භජනය කරව්. පිහිට ඇති තැනින් භය උපනි.

8. "මල්දම් පැලැන්දාවූ සඳුන් සුවඳ ගැල්වූ යමක් සොම්නස් සහිතව ගෙනයෙම්ද, ඒ යෙහෙළිතොමෝ මා ගෙදරින් නෙරපන්නීය. එවැනි පිහිට ඇති තැනින් භය උපනි.

9. "උපන්නාවූ යමකු කරණකොට ගෙණ සතුටුවීම්ද යමකුගේ අභිවෘද්ධිය කැමතිවීම්ද, හෙතෙම මා ගෙයින් නෙරපයි. එසේවූ පිහිට ඇති තැනින් භය උපනි.

10. "රැස්වූ ජනපද වාසීහුද නියම්ගම් වාසීහුද මාගේ වචනය අසත්වා. යම් ජලයෙක් ඇද්ද, ඒ ජලය ගිනි ඇවිල ගත්තේය. යම් රජෙකු කෙරෙන් ක්ෂෙම වේද, ඒ රජහු කෙරෙන් භය උපන්නේය. ඒ කෙසේද යත්.

11. "රජතෙමේද පුරෝහිත බ්‍රාහ්මණයාද රට පැහැර ගණියි. එහෙයින් පිහිට ඇති තැනින් භය උපනි. තෙපි තමන් විසින් රක්ෂා කරණලද්දාහු වාසය කරව්."

**433 ලොමස කස්සප ජාතකයඃ-** 1. "ඉදින් තෝ ලෝමස කස්සප නම්වූ තාපසයා ගෙන්වා පශුඝාතක නම් යාගය කරවන්නේ නම් අතිශයින්ම අජරාමරයෙහි ශක්‍රයා හා සමානවූ රජෙක් වන්නේය.

2. "සය්හය, සමුද්‍රයෙන් වටවූ සාගරයෙන් සිසාරා වැළඳ සිටි හෙයින් කුණ්ඩලාකාරවූ පෘථිවිය නින්දාව සමග නොකැමැත්තෙමි. මෙසේ දැනගණුව.

3. "බ්‍රාහ්මණය, මෙසේ අධර්මයෙන් යම් යසස් ලාභයක් වේද, යම් ධන ලාභයක් ඇද්ද, එයටද අපායෙහි වැටෙන පරිද්දෙන් යම් වෘත්තියක් ඇද්ද, අධර්මචර්යාවෙන් හෝ යම් වෘත්තියක් ඇද්ද, ඇයටද නින්දා වේවා.

4. "ඉදින් පාත්‍රයක් ගෙණ ගෘහ රහිතවූයේම භික්ෂාවෙහි හැසිරෙන්නෙම් නමුත් අධර්මයෙන් යම් සෙවීමක් ඇද්ද, ඊට වඩා ඒ පිඬු සිඟීමෙන් ජීවත්වීමම උතුම් වේ.

5. "ලෝකයෙහි අනිකෙකුට හිංසා නොකරන්නේ ඉදින් පාත්‍රයක් ගෙණ ගෙයක් නැත්තේම පිඬු සිඟා ඇවිදින්නෙම් නම් එය රාජ්‍යයටද වඩා උතුම් වේ.

6. "චන්ද්‍රතෙම අඳුරු නසන හෙයින් බල නම් වන්නේය. සූර්යයාද එහෙයින්ම බල නම් වන්නේය. මහණ බමුණෝ හොඳ නරක ඉවසීමෙහි සමර්ථ හෙයින් බල නම්වෙති. සමුද්‍රයාගේ වෙරලද තමා ඉක්ම නොයන හෙයින් බල නම්වේ. ස්ත්‍රීහු වනාහි මෙකී බලයන්ට වඩා බල නම් වෙත්.

7. "යම්සේ උග්‍ර තපස් ඇති ලෝමස කාශ්‍යප නම්වූ ඍෂීහු ලවා චන්ද්‍රාවතී තොමෝ තම පියාට වැඩ පිණිස වාජපෙය්‍ය නම් යාගය කරවීද, එසේ හෙයිනි.

8. "ලෝභය හේතුකොටගෙණ කරණ ලද්දාවූ පඤ්ච කාමය හේතුකොට ඇත්තාවූ ඒ පාප කර්මය කටුක විපාක ඇත්තේයි. ඒ කර්මයාගේ මුල් හේතුව සොයන්නෙමි. බන්ධන සහිතවූ රාගය සිඳින්නෙමි.

9. "මහරජ, ලෝකයෙහි ඉතා බොහෝවූද කාමයන්ට නින්දාවේවා. මෙකී කාම ගුණයන්ට වඩා තපසම උතුම්වේ. එහෙයින් කාමයන් හැර තපස කරන්නෙමි. රටද මේ චන්ද්‍රාවතී නම් රාජ කුමාරිකාවද ඔබටම වේවා."

**434 චක්කවාක ජාතකය:-** 1. "කාශාය වස්ත්‍ර පෙරෙවියන් බඳුවූ රන්වන් පැහැ ඇති දෙදෙන දෙදෙනව සතුටු සිත් ඇතිව හැසිරෙන පක්ෂීවූ තොපට කියමි. හෙවත් තොපගෙන් විචාරමි. එම්බා පක්ෂීනි, මිනිසුන් අතුරෙහි කිනම් පක්ෂියා කියා තොපගේ

ජාතිය ප්‍රශංසා කෙරෙද්ද, එබැවින් එය කියව් නොහොත් පක්ෂීන් හා මිනිසුන් අතුරෙහි කිනම් පක්ෂියයි කියා තොපගේ ජාතිය පසසත්ද,

2. මනුෂ්‍ය හිංසකය, ඔවුනොවුන්ට අනුගතවූ ප්‍රිය සංවාස ඇතිව අප චක්‍රවාකයයි මිනිසුන් අතුරෙහි කියත්. පක්ෂීන් අතුරෙහි කල්‍යාණ භාවයෝ යයි සම්මත වෙමු. නිර්භය ස්වභාව ඇත්තෝ වෙමු. පියුම් විලෙහි හැසිරෙමු. (ආහාරය පිණිස පාපයක් නොකරමු.)

3. "අලාමකවූ චක්‍රවාකයෙනි, තොපගේ ශක්තියද වර්ණයද අලාමකවූ ස්වරූප ඇත්තේය. එහෙයින් කිමෙක්ද, මේ විලෙහි කවර ඵලයන් අනුභව කෙරෙද්ද, කවරෙකුගේ ශරීරයෙන් මස් කන්නාහුද, කිනම් ආහාරයක් අනුභව කරව්ද,

4. "කව්ඩුව, මේ විලෙහි ඵලයෝ නැත්තාහ. චක්‍රවාකයාට මස් කන්ට කොයින්ද? එහෙයින් අපි සෙවෙල් අනුභව කරන්නෝ වෙමු. ගස්පොතු නැති ජලය භෝජන ඇත්තෝ වෙමු. ආහාර පිණිස පාපයක් නොකරමු.

5. "චක්‍රවාකය, මේ තොපගේ ආහාරය මට රුචිනොවේ. එසේහෙයින් මේ ජාතියෙහි ආහාරයට සමාන ආහාර ඇත්තේ නොවෙයි" කියා මට පෙර වූයේය. ඉන්පසු මට අන් පරිද්දෙකින් වීයයි මෙසේ මේ තොපගේ ශරීර වර්ණයෙහි මට විමතියක් හටගත්තීය.

6. "මම වනාහි මස්ද ගෙඩිද ලුණු සහිතවූද තෙල් සහිත වූද, ආහාරයන් අනුභව කරන්නෙමි. සංග්‍රාම භූමියෙහි ශූරයෙකු මෙන් හැරගෙන මිනිසුන් කෙරෙහිවූ රසය අනුභව කරන්ට ලබමි. එසේවුවත් චක්‍රවාකය, තාගේ වර්ණය යම්සේද, එබඳුවූ වර්ණයෙක් මට නොම ඇත්තේය.

7. "කව්ඩුව, තෝ අපිරිසිදු දේ අනුභව කිරීම ඇත්තෙහිය. ප්‍රමාදවූ කෙණෙහි වැටෙන සුළුය. තට කන බොන දෙය දුකින් ලැබේ. වෘක්ෂ ඵලයෙන්ද සොහොන් මැද යම් මසක් ඇත්නම් එයින්ද නොසතුටු වන්නෙහිය.

8. "ක්ෂණයෙහි වැටෙන සුලුවූ කාකය, යමෙක් තෙම සැහැසිකමින් ලබාගෙන අනුභව කෙරේද, එහෙයින් ඔහුට ස්වභාව ධර්මයතෙම ගර්හා කරන්නේය. එසේ උපක්‍රොශ කරණ ලද්දේ වර්ණයද බලයද දුරුකෙරේ.

9. "ඉදින් සැහැසිකමක් නොකිරීමෙන්ද, අනුන් නොනැසීමෙන්ද නිමියාවූ හෙවත් දැහැමින් ලද්දාවූ මඳවූද ගොදුරු කා නම්, එකල්හී ඔහුගේ ශරීරය ශක්තියද වර්ණයද වන්නේය එසේහෙයින් සියලු වර්ණය ආහාරයෙන්ම හටගන්නේ නොවේ."

**435 හලිද්දීරාග ජාතකය:-** 1. "වනයෙහි ඉතා දුර සෙනසුන්හි ශීතාදිය ඉවසන්නට පිළිවන. යම් කෙනෙක් ගමෙහි ඉවසත්ද ඔව්හු එයට වඩා අතිශයින් උදාරවෙත්.

2. "පියාණෙනි, මම වනයෙන් ගමට පැමිණ කෙබඳු ශීලයක් කෙබඳු ව්‍රතයක් කෙබඳුවූ පුරුෂයකු සේවනය කරන්නෙම්ද, මට එය විචාරණ ලද්දෙහි කියව.

3. "පුත්‍රය, යමෙක් තා හා විශ්වාස කරන්නේද, තාගේ විශ්වාසයද බොහෝ කලක් පවත් වන්නේද, යමෙක් තාගේ වචනය අසනු කැමැත්තේද, යමෙක් තාගේ වචනය ඉවසන්නේද ඔහු මේ වනයෙන් ගියේ සෙවණය කරව.

4. "යමෙකුගේ කයින්ද වචනයෙන්ද, සිතින්ද වැරදි කිරීමක් නැද්ද, ඔහු ලෙහි සිටි පුත්‍රයෙකු සේ පිහිටුවා මේ වනයෙන් ගියේ සේවනය කරව.

5. "යමෙක් වනාහි සුචරිත ධර්මයෙන් හැසිරේද, එසේ හැසිරෙන්නේද මානය නොකරේද, විසුද්ධ නම් දශකුශලයන් කරන්නාවූ සප්‍රාඥ වූ ඔහු මෙයින් ගමට ගියෙහි භජනය කරව.

6. "පුත්‍රය, ඉදින් සියලු දඹදිව් තලය මිනිසුන් රහිතවූ නමුදු ස්ථිරවූ පැවැත්මක් නැති හෙයින් කහපාට සායම් පෙවීමක් වැනිවූ වඳුරෙකුට බඳු සිත් ඇති ඇලීම් නොඇලීම් දෙකින් යුක්තවූ එබඳු පුරුෂයා සේවනය නොකරව.

7. "කිපුනාවූ සර්පයෙකු වැනිවූ අශුචි තැවරුණු මහා මාර්ගයක් වැනිවූ අඥානයා විෂමවූ මාර්ගය යානාවකින් යන්නෙකු මෙන් දුරින් දුරු කරව.

8. "පුත්‍රය, අඥානයා අධික වශයෙන් සේවනය කරන්නහුට අනර්ථයෝ වැඩෙත්. සියලු කල්හි පස මිතුරුවූම අඥානයා හා සමාගමයට නොයව.

9. "පුත්‍රය, එහෙයින් මම තාගෙන් ඉල්වමි. මාගේ වචනය කරව, අඥානයා හා සමාගමට නොයව, කුමක් හෙයින්දයත්, අඥානයන් හා සංගමයතෙම දුක්වන්නේය." (එහෙයිනි.)

**436 සමුග්ග ජාතකය:-** 1. "පින්වත්නි, තෙපි තුන්දෙනා කොයි සිට එව්ද, මෙහි මනාකොට ආවාහු ආසනයෙහි හිඳගනිව්. පින්වත්නි, සුව කවරහුද, කිම නිරෝගවම්ද, තොපගේ මෙහි පැමිණීම බොහෝ කලකින්ම විය.

2. "තපස්විය, හුදකළාවූයේ මමම මෙහි පැමිණියේ වෙමි. මට දෙවැනිවූ කිසිවෙක් නොම ඇත්තේය. පින්වත තෙපි තුන්දෙනා කොයින් ආවාහුදැයි ඔබ විසින් කුමක් සඳහා කියන ලදද.

3. "තෝ වනාහි තනිව බඩ තුළ කරඬුවෙක්හි බහා තබන ලද්දාවූ තොපගේ භාර්යාවද විය. තාගේ කුක්ෂියට පැමිණියාවූම තා විසින් රක්ෂා කරණ ලද්දාවූ ඕතොමෝ වායු පුත්‍රනම් විද්‍යාධරයෙකු හා ඒ ඇතුළු කුක්ෂියෙහිදීම ක්ලෙශවශයෙන් ඇලුණීවේ. (මෙසෙයින් තෙපි තුන්දෙනායයි කීමි.

4. "තපස්වීහු විසින් කියන ලද්දාවූ කලකිරුණු ස්වභාව ඇති. ඒ දානවතෙම එහිලා තමා බඩතුබූ කරඬුව වමෑරීය. ඊට අනතුරුව වායු පුත්‍ර නම් විද්‍යාධරයා හා ඔහු කෙරෙහි ඇළුනාවූ පිවිතුරු ලේ බර දරන්නාවූ භාර්යාව දුටුවේය.

5. "උග්‍රවූ තපස් අනුව පවත්නාවූ ඔබ විසින් කාරණය මනාකොට දක්නා ලදී. එසේහෙයින් යම්සේ ඒකාන්තයෙන් මෙහිලා මාගේ ප්‍රාණය මෙන් රක්නා ලද්දී මා කෙරෙහි දුෂ්ටවූවා අනික් පුරුෂයෙකු කැමතිවීද, එහෙයින් යම්පුරුෂ කෙනෙක් ස්ත්‍රීන්ගේ වසඟයට ගියාහුද ඔව්හු හීනයෝ වෙත්.

6. "වනයෙහි වසන්නාවූ තපස්වීහු විසින් ගින්නක් මෙන් මා විසින් දාවල්ද රාත්‍රියෙහිද උපස්ථාන කරණ ලද ඕතොමෝ පතිව්‍රතා ධර්මයෙන් ඉවත්ව අධර්මයෙහි හැසුරුණේය. එහෙයින් ස්ත්‍රීන් සමග සම්බන්ධය නොකටයුතු ස්වරූප ඇත්තේයි.

7. "මාගේ ශරීර මධ්‍යයෙහි හෙවත් කුසතුල සිටියා යයිද මෝතොමෝ මාගේ යයිද අසත්පුරුෂවූ සංයම නැත්තාවූ තැනැත්තියයි මම සිතීමි. ඕතොමෝ පතිව්‍රතා ධර්මයෙන් ඉවත්ව අධර්මයෙහි හැසුරුනේය. එහෙයින් ස්ත්‍රීන් හා එක්වීම නොකළ යුත්තේ වේ.

8. "මා විසින් මනාකොට රක්නා ලද්දීයයි කෙසේ නම් විශ්වාස කෙරෙම්ද, නොයෙක් සිත් ඇති ස්ත්‍රීන් කෙරෙහි රැකීමක් නම් නැත. එය එසේමැයි. මොහු වනාහි ලෝකශ්වාද වශයෙන් පිරවීමට අපහසු හෙයින් සමුද්‍ර පාතාලයයි කියන ලද ප්‍රපාතය හා සමානය. මෙහි ප්‍රමාදවූ පුරුෂ තෙම ව්‍යසනයට පැමිණේ.

9. "එහෙයින් යම් කෙනෙක් ස්ත්‍රීන් කෙරෙන් දුරුවූවාහු හැසිරෙද්ද, ඔහු සුව ඇත්තාහු පහවූ ශොක ඇත්තාහු වෙත්. උතුම්වූ මේ ක්ෂෙමවූ කාරණය ප්‍රාර්ථනා කරන්නේ ස්ත්‍රීන් හා සමග එක්වීම නොකරන්නේය."

**437 පූතිමාංශ ජාතකය:-** 1. "යෙහෙළිය, පූතිමාංශ නම් තී හිමියාගේ බැලීම මට රුචිනොවේ. මෙබඳුවූ යහළුවා කෙරෙන් දුරින් දුරු වන්නේය.

2. "උතුම්වූ මේ වේණීතොමෝ ස්වාමියාහට යෙහෙළිය වර්ණනා කරයි. ආවාවූ මේලමාතා නම් එළුදෙන නැවත යන්නියට අනුව ශොක කරයි.

3. "යහළුව, යම්බඳුවූ තෝ මළවුන්ගේ ආකාරය කොට ලඟට එන්ට ප්‍රථම බැලුයෙහිද ඒ නුඹ වනාහි පරීක්ෂා බුද්ධි නැත්තේ උමතුවූවෙක් වෙහිය.

4. "නුවණැත්තේ නුසුදුසු කල්හි නොබලන්නේය. සුදුසු කාලයෙහි බලන්නේය. කුමක් හෙයින්දයත්, යමෙක් බලන්නට

නුසුදුසු කල්හි බලාද, හෙතෙම පූතිමාංශ නම් හිවලා මෙන් සිතුවිලි සිතයි.

**5.** "යෙහෙළිය; මට ප්‍රිය වේවා, මට සතුටු පඬුරුදෙව, මාගේ ස්වාමිතෙම මනාව ජීවත්වූයේය. ප්‍රියයන් විචාරන්නීය, මා හා සමග එව.

**6.** "යෙහෙළිය, තිට ප්‍රිය වේවා, තිට සතුටු පඬුරු දෙමි. මහත්වූද පිරිවර හා සමග එන්නෙමි. ඒ අපට ආහාරය පිළියෙළ කරව.

**7.** "යම් කෙනෙකුන්ට ආහාරය පිළියෙල කරම්ද, ඒ තොපගේ පිරිවර කෙබඳුද, ඒ සියල්ලෝ කිනම් ඇත්තාහුද, එය මට විචාරණ ලද්දී කියව.

**8.** "මාලියයාද, චතුරක්ඛයාද, පිංගියයාද නැවත ජම්බුකයාද මාගේ පිරිවර මෙබඳුය. හෙවත් පන්සියය බැගින් පිරිවර ඇති මේ බල්ලෝ සතර දෙන මාගේ පිරිවරය. ඔවුන්ට සෑහෙන ආහාරය පිළියෙල කරව.

**9.** "ගෙදරින් නික්මුණාවූ තොපගේ බඩුද විනාශ වන්නේය. තොපගේ යහළුවාට නිරෝග බව මමම කියන්නෙමි. මෙහිම වාසය කරව, නොයවයි" කීයේය.

**438 තිත්තිර ජාතකයः-** 1. "තා විසින් දෙනලද බත් ඇති යමෙක් තාගේ නිදොස්වූ දරුවන් කෑයේද, ඔහු කෙරෙහි දළ හෙළව, හෙවත් ගසව, තාගේ අතින් ජීවත්වූයේ නොමිදේවා.

**2.** "අතිශයින් දරුණුවූ පුරුෂතෙම කිරි මවකගේ වස්ත්‍රයක් මෙන් කිළුටුවූයේය. එහෙයින් මොහුගේ යම් තැනෙක්හි දළ ගසම්ද, එබඳු තැනක් නොදකිමි.

**3.** "කළගුණ නොදන්නාවූ නිතර වරද දක්නා සුළුවූ පුරුෂයාහට ඉදින් සියලු පොළොව දුන්නේවී නමුත් ඔහු නොම සතුටු කළ හැක්කේය.

**4.** "මනා බාහු ඇත්ත, කිමෙක්ද, ඉක්මන් ස්වභාව ඇත්තේ මානවකයෙකු හා පෙරළා ආයේ වෙහි. මෙහිලා තට මොහු

විසින් කටයුතුවූ කිනම් වැඩක් ඇද්ද, මා විසින් විචාරණ ලද්දේ මේ කාරණය කියව.

**5.** "තාගේ යහළුවූ යහපත් ස්වභාව ඇති යම් වටුවෙක් ඇද්ද, අද ඒ පුරුෂයාගේ කර්මාන්තයන් අසා වධය සැක කරමි. මම අද වටුවා සුවපත්යයි නොසිතමි.

**6.** "මේ පුරුෂයාගේ ජීවිකා පැවැත්ම ගැලපීමට කවර නම් කර්මාන්තයන් ඇසුයෙහිද, පුරුෂයාගේ කිනම් ප්‍රතිඥාවක් හෝ අසා මානවකයා විසින් තිත්තිර පණ්ඩිතයා මරණ ලදැයි සැක කෙරෙහිද?

**7.** "කාළිංග දෙශයේ හැසිරෙන ලදහ. වෙළඳාම කරණ ලදී. වේවැලගෙන හැසිරිය යුතුවූ කණු ඇති මාර්ගයද පුරුදු කරණ ලදී. නළුවන් සමගද හැසිරෙන ලදී. වරදැල් වැද්දන් සමගද හැසිරෙන ලදී. සභා මධ්‍යයෙහි මුගුරෙන් යුද්ධ කරණ ලදී.

**8.** "ඔහු විසින් ලිහිණිද බඳනාලදහ. නැළියෙන් මැනීමද කරණලදී. අක්ෂධූර්තයෝ (හෙවත්) පසැටින් ක්‍රීඩා කරන්නාහු පුරුදු කරණ ලදහ. ශීලසංයමය ඉක්මවනලද්දේ අර්ධ රාත්‍රියෙහි ලේ නොවැගිරෙන සේ කෙළේ. ආහාර පිළිගැන්මෙන් මොහුගේ අත්ද දැවුනාහ.

**9.** "ජීවිකා වෘත්තිය ගැළපීම පිණිස මේ පුරුෂයාගේ ඒ කර්මාන්තයන් ඇසීමි. යම්සේ මේ වටුවාගේ ලොම් පිඩ ජටාවෙහි දක්නාලැබේද, එහෙයින් ගවයෝද මොහු විසින් නසනලදහ. වටුවා ගැන කියනුම කවරේද."

---

# 10 දශක නිපාතය.

**439 චතුද්වාර ජාතකයː-** 1. "මේ නුවර සතර දොරටුවක් ඇත්තේය. අයොමයවූ දැඩිවූ තොරණ ඇත්තේය. ඇතුල් කොට හාත්පස පව්රෙන් වටකරණ ලද්දේ වෙමි. මා විසින් කිනම් පාපයක් කරණ ලදද,

2. "යක්ෂය, සියලු දොරටු වසනලදහ. පක්ෂියෙකු මෙන් ගමන් වලකන ලද්දේ වෙමි. කවර කරුණකින් මම චක්‍රයෙන් ගසන ලද්දෙම්ද,

3. "යහළුව, තෝ දහසක් ලැබ වෙළඳාමෙන් ලක්ෂයක් හා අධිකවූ විසිදහසක් ලැබ අනුකම්පා ඇත්තාවූ නෑයන්ගේ කීම නොකෙළේය. නැව ඉක්ම යාමට සමර්ථවූ අල්පවූ සිද්ධිය ඇති සාගර නම්වූ මුහුදට පැන ගියෙහිය.

4. "සතර දෙනෙකුගෙන් නොසතුටුව අටදෙනෙකු ලඟට ගියේය. අට දෙනෙකුගෙන් නොසතුටුව සොළොස් දෙනෙකු ළඟට ගියේය. සොළොස් දෙනෙකුගෙන් නො සතුටුව දෙතිස් දෙනෙකු ළඟට ගියේය. වැඩි වැඩියක් කැමැත්තේ ක්ෂුරචක්‍රයට ළංවීය. තෘෂ්ණාවෙන් නසනලද පුරුෂයාගේ මතුයෙහි ක්ෂුර චක්‍රය කැරකේ.

5. "මතුයෙහි විශාලවන්නාවූ, නොපිරවිය හැක්කාවූ පඤ්චකාමයන්හි ආශාවෙන් පැතිර යන්නාවූ ඒ තෘෂ්ණාව අනුව යම් කෙනෙක් ගිජුවෙද්ද, ඔව්හු ක්ෂුරචක්‍රය දරන්නාහු වෙත්.

6. "බොහෝවූ වස්තුව හැරදමා මාර්ගය නොබලා යම් කෙනෙකුන්ගේ සිත පරීක්ෂාකාරී නොවේද, ඔව්හු ක්ෂුරචක්‍රය දරන්නාහුවෙත්.

7. "යමෙක් තෙම තමා විසින් කළයුත්තද සලකා බලා මහත්වූ සම්පත්තියද බලා අනර්ථයෙන් යුක්තවූ ආශාව සේවනය නොකරන්නේද, අනුකම්පා ඇත්තවුන්ගේ කීම කරන්නේද, එබඳුවූ පුරුෂයා මේ ක්ෂුර චක්‍රය මැඩනොපවත්නේය.

8. "යක්ෂය, මේ ක්ෂුර චක්‍රය මාගේ හිසෙහි කෙතෙක් කල් කෙතෙක් අවුරුදු දහස්ගණන් සිටින්නේද, එය මට විචාරණ ලද්දෙහි කියව,

9. "මිත්ත වින්දකය, මාගේ වචනය අසව, තෝ වනාහි ඉතා දොස් ඇත්තෙහි බලවත්වූ දොස් ඇත්තෙහි තාගේ හිසෙහි ඇවිණෙනලද ඒ චක්‍රය ජීවත්වන්නේ නො මුදන්නෙහිය."

**440 කණ්හ ජාතකය:-** 1. "ඒකාන්තයෙන් කළුවූ මේ පුරුෂතෙම කළුවූ භොජනය අනුභව කරයි. කළුවූ භූමිප්‍රදේශයෙහි වේ. මාගේ සිතට ප්‍රිය නොවේ.

2. "ශක්‍රය, සමින් කළුනම් නොවෙයි. ඇතුළත හර ඇත්තේ බ්‍රාහ්මණ නම් වේ. යමෙකු කෙරෙහි පාපකර්මයෝ ඇද්ද, හෙතෙම ඒකාන්තයෙන් කෘෂ්ණවේ.

3. "බ්‍රාහ්මණය, තාගේ සුදුසුවූ මේ යහපත් කීම නිමිති කොට යම් කිසිවක් සිතින් කැමැත්තෙහි නම් එබඳු වරයක් තට දෙමි.

4. "සියලු දේවතාවන්ට අධිපතිවූ ශක්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් විශෙෂයෙන් ක්‍රොධ රහිතවූ විශෙෂයෙන් ද්වෙෂ රහිතවූ නිර්ලෝභීවූ ස්නෙහ රහිතවූ තමාගේ ප්‍රවෘත්තිය ප්‍රාර්ථනා කෙරෙමි. මට මේ සතර වරයන් දෙව,

5. "බ්‍රාහ්මණය, ක්‍රොධයෙහි හෝ ද්වෙෂයෙහි හෝ ලාභයෙහි හෝ ස්නේහයෙහි හෝ කිනම් ආදීනවයක් සිහිකරන්නෙහිද, මට ඒ කාරණය විචාරණ ලද්දේ කියව,

6. "නොඉවසීමෙන් උපන්නාවූ මේ ක්‍රෝධයතෙම පළමු මදව ඉපිද පසුව බොහෝ වේ. නැවත වැඩේ. ඇලෙන්නේය. බොහෝවූ සිත් තැවුල්ද ඇත්තේය. එහෙයින් ක්‍රොධය නො කැමැත්තෙමි.

7. "දුෂ්ටයාගේ පළමු එරුෂ වචනයවේ. අනතුරුව අතින් ඇල්ලීම වේ. ඉන්පසුව පොරබැදීම වන්නේය. ඊට අනතුරුව දඬු පහර වන්නේය. ඉන්පසු කොපයෙන් ආයුධයෙන් ගසන්නේය. ද්වෙෂයතෙම ක්‍රෝධයෙන් උපදනේය. මෙබඳු ද්වෙෂය නොකැමැත්තෙමි."

**441 චතුපොසථ ජාතකය:-** 1. "ගම් පැහැරීමද බලාත්කාරයෙන් ගැණීමද වංචාවෙන් ගැනීමද යන මොහු ලෝභ ධර්මයන් අතුරෙහි දක්නා ලැබෙත්. එහෙයින් ලෝභය නොකැමැත්තෙමි.

2. "සියලු දෙවතාවන්ට අධිපතිවූ ශක්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් වනයෙහි වසන්නාවූ නිතර තනිව වාසය

කරන්නාවූ මට අතිශයින් තපසට අන්තරාය කරන්නාවූ ආබාධයෝ නූපදින්නාහුද, එබඳු වරයක් කැමැත්තෙමි.

3. "සියලු භූතයන්ට අධිපතිවූ ශක්‍රය, ඉදින් මට වරයක් දෙන්නෙහි නම් මා පිණිසවූ කිසිවක්හුගේ සිත හෝ කය හෝ වචනය හෝ කිසිකලෙක්හි අපිරිසිදු බවකට නොපැමිණෙන්නේ නම් ශක්‍රය, මෙබඳුවූ වරයක් කැමැතිවන්නෙමි."

**442 සංඛ ජාතකය**:- 1. "සංඛ නම් බ්‍රාහ්මණය, නුඹ වනාහි බහුශ්‍රැතවූයේ අසනලද ධර්ම ඇත්තේවෙහිය. ඔබ විසින් මහණ බමුණෝද, දක්නාලදහ. එසේ ඇතිකල්හි නුසුදුසු කාලයෙහි වැළපීම දක්වන්නෙහිය. මා හැර ප්‍රතිවචන දෙන්නාවූ අනික් කවරෙක්වේද,

2. "මනා බැම ඇති. සිත් කළුවූ මනාකොට බහා ලන ලද ස්වර්ණාභරණ ඇති ස්ත්‍රියක් ස්වර්ණමයවූ තලියක් දෙඅතින් ගෙන සතුටු සිත් ඇත්තී බත් අනුභව කරවයි. මෙසේ මට කියයි. ඈට මම නොකැමැත්තෙමියි කියමි.

3. "බ්‍රාහ්මණය, තමහට සුව කැමැත්තාවූ පුරුෂතෙම මෙබඳුවූ යක්ෂයා දැක විචාරන්නේය. එහෙයින් නැගී සිටුව, ඔහු ඇඳිළි බඳනාලද්දේ නුඹ දෙවතා දුවක් වෙහිද, නොහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් වෙහිදැයි විචාරව.

4. "මහත් ආනුභව ඇති ස්ත්‍රිය යම්හෙයකින් නුඹ සුවසේ මා බලන්නෙහිද? නුඹ බත් අනුභව කරවයි. මෙසේ මට කියන්නෙහිද, තී විචාරමි. නුඹ දෙව්දුවක් වෙහිද, මනුෂ්‍ය ස්ත්‍රියක් වෙහිදැයි විචාළේය.

5. "සංඛ නම් බ්‍රාහ්මණය, සමුද්‍ර ජලය මධ්‍යයෙහි මෙතනට ආවාවූ මම මහත් ආනුභාව ඇති දෙව්දුවක්මි. අනුකම්පා ඇත්තී තොපටම වැඩ සඳහා මෙතැනට පැමිණියෙමි. ඉතා දූෂ්‍යවූ සිත් ඇත්තී නොපැමිණියාද වෙමි.

6. "සංඛනම් බ්‍රාහ්මණය, ඒ ඔබගේ සිතින් යම්කිසිවක් කැමතිවන ලදද, එසේවූ ආහාර පානයද ශයනාසනද

අනෙකප්‍රකාරවූ යානාවන්ද යන මේ සිල්ලම මම පිළියෙල කොට දෙමි.

7. "මනාවූ ගාත්‍ර ඇති මනාවූ කටිපෙදෙස් ඇති මනාවූ බැම ඇති, මනාවූ මධ්‍ය ප්‍රදෙශ ඇති තැනැත්තිය මාගේ යම්කිසි දෙනලද දානයක් හෝ කරණ ලද ආගන්තුග සත්කාරයක් හෝ ඇද්ද, අපගේ ඒ සියල්ලට නුඹ අධිපතිය. මාගේ කවර කර්මයක්හුගේ මේ විපාකය වේද,

8. "බ්‍රාහ්මණය, ග්‍රීෂ්ම කාලයෙහි මාර්ගයෙහි හුණු වැල්ලෙහි ගැටුණු පා ඇති පිපාසිතවූ ක්ලාන්තවූ එක් පසේ බුදු කෙනෙකුට වහන් සඟලක් පිළියෙල කොට දුන්නේය. ඒ තා දුන් දානය තොපට අද කැමති සම්පත් දෙන්නෙහිය.

9. "අතික් යානාවකට භූමියක් නොම ඇත්තේය. එහෙයින් ඒ නැව නොයෙක් පුවරුයෙන් යුක්තවූවා දිය නොවැදගන්නී අනුකූලවාතයෙන් යුක්තවූවක් වේවා. අදම මා මෝලිනී නම් නුවරට පමුණුවාවා.

10. "එතැන්හිලා ප්‍රීතියෙන් යුක්තවූ සුන්දර සිත් ඇත්තාවූ සතුටුවූ ඒ දෙව්දුව විචිත්‍රවූ නැවක් මවාගෙන සහචර පුරුෂයා සමග සංඛ නම් බ්‍රාහ්මණයා ගෙන ගොස් ඉතා රම්‍යවූ මෝලිනී නම් නුවරට පැමිණවීය."

**443 චුල්ලබොධි ජාතකයː-** 1. "බමුණ, යමෙක්තෙම තොපගේ මහත්වූ ඇස් ඇති මඳ සිනාවෙන් යුක්තව බණන්නාවූ ප්‍රියාව බලාත්කාරයෙන් හැරගෙන යන්නේනම් කුමක් කරන්නෙහිද,

2. "මෑ ගෙණයන්නවුන් කෙරෙහි කෝපයෙන් උපන්නේ නම් හෙතෙම නොමුදන්නේය. ජීවත්වන්නාවූ මාගේ ඒ කෝපය නොම්දෙන්නේය. එහෙයින් ධූලිය මහත් වර්ෂාවක් මෙන් වහාම එය වළක්වන්නෙමි.

3. "හේ නුඹ පෙර යමක් කල්පනා කෙළෙහිද, අද බලය ප්‍රකාශ කළාහු මෙන් නිශ්ශබ්දවූයේ දැන් සඟල සිවුර මසමින් හිදිනෙහි (මේ කිමෙක්ද?)

4. "මාගේ ක්‍රොධය උපන් නමුත් අනුන්ට හැඟෙන පරිද්දෙන් පහළ නුවූයේය. ජීවත්වන්නාවූ මාගේ කෝපය නොමිදෙන්නේය. එහෙයින් ධූලිය මහත්වූ වර්ෂාවක් මෙන් වහාම වැළැක්වූයේ වෙමි.

5. "තාගේ සිත්හි කුමක් උපන්නේද, තාගේ කුමක් නොමිදුනේද හෙවත් ප්‍රකාශ නොවීද, ජීවත්වන්නාවූ තොපගේ කුමක් නොමිදිනීද, ධූලිය මහත්වූ වර්ෂාවක් මෙන් කවරක්හු නුඹ වැළැක්වීද,

6. "උපන්නාවූ යමක් කරණකොටගෙණ දුක සොයන්නාවූ සතුරෝ සතුටු වෙද්ද, එබඳුවූ අඥානයන්ට ගොචරවූ ක්‍රොධයතෙම මාගේ සිත්හි උපනි. නොමිදුනේය.

7. "යමක්හු වනාහි උපදනා කල්හි ස්වාර්ථය නොදනීද, අඥානයන්ට ගොචරවූ ඒ ක්‍රොධය තෙම මාගේ සිත්හි උපනි. නොමිදුනේය.

8. "මහරජ, යම් ක්‍රොධයකින් මඩනාලද්දේ දශ කුශලයන් දුරුකෙරේද, මහත්වූද අර්ථය බැහැර කෙරේද, භයානකවූ ක්ලෙශ සංඛ්‍යාත සේනා ඇති බලවත්වූ ඒ ක්‍රොධය තෙම උදාර සත්වයන් පවා මඩින්නේය. හෙතෙම මා කෙරෙන් නොමිදුණීමය.

9. "දරදණ්ඩ ගටන කල්හි ගින්න වනාහි උපදනේය. ඒ ගින්න යමකින් උපදීද, ඒ දර දණ්ඩම හළු කෙරේ.

10. "එපරිද්දෙන් මදවූ නුවණ ඇති බාල භාවයෙන් යුක්තවූ කිසිවක් නොදන්නාවූ පුරුෂයාගේ උත්තර ප්‍රත්‍යුත්තර නම් එකට එක කීමෙන් ක්‍රොධය තෙම හටගනියි. හෙතෙමේද ඒ ක්‍රොධයෙන්ම දවනු ලැබේ.

11. "තණ කොළෙහිද දරෙහිද ගින්න මෙන් ක්‍රොධය තෙම යමෙකුට වැඩේද, ඔහුගේ යසස කරුවල පක්ෂයෙහි චන්ද්‍රයාමෙන් පිරිහෙන්නේය.

12. "යමෙකුගේ ක්‍රොධය තෙම දර නැත්තාවූ ගින්න මෙන් සංසිඳේද, ඔහුගේ යසස පුර පක්ෂයෙහි සඳ මෙන් පිරෙන්නේය."

444 කණ්හදීපායන ජාතකයඃ- 1. "පහන්වූ සිත් ඇති පින් කැමතිවූ මම සත් දවසක් බ්‍රහ්ම චර්යාවෙහි හැසුරුනෙම්ද, නැවත අන්‍යවූ මාගේ යම් මේ හැසිරීමක් ඇද්ද, මම යම් අධිකවූ පනස් අවුරුද්දක් ප්‍රව්‍රජ්‍යාව නොකැමැත්තේම යම් තපසක් කෙරෙම්ද, මේ සත්‍යයෙන් සුවයෙක් වේවා. විෂ නසන ලද්දේ වේවා. යඤ්ඤදත්ත කුමාරතෙම ජීවත්වේවා.

2. "කිසිකලෙක්හි මම යම්හෙයකින් දානයට සතුටු නොවීමද, ලැගුමට ආකල්හි ආගන්තුකයාද දැක සතුටු නොවීමද, බහුශ්‍රැතවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝද මාගේ අප්‍රිය බව දැන නොගත්තාහුද, මම වනාහි නොකැමැත්තේම දෙන්නෙම්ද, මේ සත්‍යයෙන් සුවයෙක් වේවා. විෂයතෙම නසන ලද්දේ වේවා, යඤ්ඤදත්ත තෙම ජීවත් වේවා.

3. "පුත්‍රය, මහත්වූ තේජස් ඇති යම් සත්වයෙක් තෙම තුඹසින් උඩට නැගී තා දෂ්ට කෙළේද, ඒ සර්පයා කෙරෙහිද තාගේ පියා කෙරෙහිද අද අප්‍රිය බැවින් මට කිසි විශේෂයෙක් නැත. මේ සත්‍යයෙන් සුවයෙක් වේවා, විෂයතෙම නසන ලද්දේ වේවා, යඤ්ඤ දත්ත තෙමේ ජීවත්වේවා.

4. "කෘෂ්ණයා හැර සෙසු ශාන්තවූද, තත්වූම ප්‍රව්‍රජ්‍යා නොකැමැති නොවන්නාහු පැවිදිවන්නාහුයි දීපායනයෙනි, කුමකට පිළිකුල් කරමින් නොකැමැත්තේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නෙහිද,

5. "කෙළතොලුවූ ඒකාන්තයෙන් අඥානවූ ඒ මෙතෙම ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම නැවත ඒ පිණිසම නැවතුණේය. යන කීමට පිළිකුල් කරන්නෙමි.

6. "නොකැමැත්තේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙමි. එතකුදු වුවත් ප්‍රව්‍රජ්‍යාවෙහි පින නුවණැත්තන් විසින් පසස්නා ලදී. සත්පුරුෂයන්ගේ ස්ථානයකැයි මෙසේද මම කුසල් කරන්නෙක් වෙමි.

7. "තෝ ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද මගින්ද භික්ෂුවද ආහාර පානයෙන් සන්තර්පණය කරව. කන බොන දෙයින් යුක්තවූ

තොපගේ මේ ගෘහය සතරමං සන්ධියෙහි පැන් පොකුණක් වැනි වූවක්ද වන්නේය. නැවත කවර කීමකට පිළිකුල් කරමින් නොකැමැත්තේ මේ දානය දෙන්නෙහිද,

8. "මාගේ මවුපියෝද මුතුන්මිත්තෝද ශ්‍රද්ධා ඇත්තෝ වූහ, දානපතීවූහ. පිළිගන්නවුන්ගේ වචන දත්තෝවූහ. ඒ කුලපරම්පරාවෙන් ආ චාරිත්‍රය අනුව පවත්නාවූ මම මාගේ කුලයෙහි හීනවූ අන්තිමවූ කුලයෙහි බොල්වූවෙක් නොවෙම්වායි මේ කීමට පිළිකුල් කරමින් නොකැමැත්තේ මේ දානය දෙමි.

9. "මනා ශරීර ඇත්තිය, තරුණවූ කුමාරිවූ සමර්ථ නොවන්නාවූ ප්‍රඥා ඇති යම්බඳුවූ තීගේ නෑ සමූහයාගෙන් ගෙණායෙම්ද, ඒ තී වනාහි කාමයෙන් ජීවත්ව සෙසු උපස්ථානයෙන් මට අත්පා මෙහෙවර කරන්නීද අප්‍රිය බවක් මට නොදැන්වීය. පින්වතිය, එසේ ඇතිකල්හි කවර කරුණකින් මා සමග තිගේ සංවාසභාවය මෙබඳුවූයේ වීද,

10. "මේ අපගේ කුලයෙහි ඉතා දුර සිටම පුරුෂ පරම්පරාවක් නම් කිසිකලෙකත් නොම ඇත. ඒ කුලයෙහි වෘත්තිය අනුව පවත්නාවූ මම අන්තිම වූයෙම්ද, කුල බොල් වූයෙම්ද, නොවෙම්වායි මේ කීමට පිළිකුල් කරමින් නොකැමැත්තී තොපට පාදපරිචාරිකා වීමි.

11. "මණ්ඩව්‍යය, නොබිණිය යුතුවූ යමක් තොපට බිණීම්ද, මාගේ ඒ වචනය අද මේ පුත්‍රයා පිණිස ක්ෂමා කෙරේවා. මේ ලෝකයෙහි පුත්‍ර ප්‍රේමයට වැඩිවූ කිසිවක් නැත්තේය. අපගේ පුත්‍රවූ ඒ මේ යඤ්ඤදත්ත කුමාරතෙම ජීවත් වේවා."

**445 නිග්‍රොධ ජාතකය:-** 1. "නිග්‍රොධ රජ මම මොහු නොහඳුනමි. මේ කවරෙක්ද, කාගේ එකෙක්දැයි ශාඛයා යම්සේ කීයේද, එපරිද්දෙන් කිමෙක්ද, තොපිත් සිතව්ද,

2. "ශාඛයාගේ වචනය කරන්නාවූ පුරුෂයෝ මුඛප්‍රහාරයන් දී ඉන්පසු ගෙල අල්වා ගැන්මෙන් මාංස පිටත දැමූහ.

3. "ජනාධිපතිය, තොපගේ යහළුවූ නුවණ නැත්තාවූ කළගුණ නොදන්නාවූ මිත්‍ර ද්‍රෝහීවූ ශාඛයා විසින් මෙබඳුවූ අකටයුත්තක් කරණ ලදී.

4. "යහළුව, තෝ මට යමක් කීයෙහිද, එය මම නොදනිමි. ශාඛයා විසින් කරණ ලද පීඩාව මට වනාහි කිසිවෙක් නොකීයේය.

5. "ඒ තෝ මටද ශාඛයාද යන මේ යහළුවන් දෙදෙනාට සමානව ජීවත්වීම සිදුකෙළෙහිය. අපට තෝ ඓශ්චර්ය දෙන්නෙහි මිනිසුන් අතරෙහි මහත් බවද සමෘද්ධියද තා කෙරෙන් ලබනලද්දෝ වීමු. මෙහිලා සැකයෙක් නැත.

6. "ගින්නෙහි බහාලු බීජයද යම්සේ දවාද, නොහටගණීද එපරිද්දෙන් අසත්පුරුෂයා කෙරෙහි කළ උපකාරය නස්නේය. නොකැඩෙන්නේය.

7. "සිල්වත්වූ ආර්යයන්ට බඳු පැවතුම් ඇති කෘතඥවූ ඒ පුරුෂයා කෙරෙහි කළ උපකාරය මනා කෙතෙහි බහාලු බිජුවට මෙන් නොනස්නේයි.

8. "අසත්පුරුෂ සිතිවිලි ඇති ලාමකවූ වඤ්චනිකවූ මේ ශාඛයා අඩයටි වලින් නසත්වා. මොහුගේ ජීවිතය නොකැමැත්තෙමි.

9. "මහරජ, අසත්පුරුෂවූ මොහුට ක්ෂමා කෙරේවා. මළහුගේ ප්‍රාණයෝ නැවත ගෙන්විය නොහැකි වෙත්. දෙවයෙනි, ක්ෂමා කරව. මොහුගේ වධය මම නොකැමැත්තෙමි.

10. "න්‍යග්‍රොධයාම සෙවනය කරන්නේය. ශාඛයා වෙත නොමියන්නේය. ඉදින් ශාඛයා කෙරෙහි යම් ජීවත්වීමක් වේද, එයට වඩා නිග්‍රෝධයා කෙරෙහි මියයාම උතුම්වේ."

**446 කක්කාල ජාතකයා:-** "1. "පියාණෙනි, කුකුළලද නැත. වැල් අලද නැත. සිරි අලද නැත. තල් අලද නැත. එතකුදු වුවත් හුදකළාවූයේ වනයෙහි සොහොන් මැද වලක් කණින්නෙහිය. පියාණෙනි, කුමක් කැමැත්තෙහිද,

2. "පුත්‍රය, තාගේ මුත්තනු තෙම නොයෙක් ලෙඩ වලින්වූ දුකින් පහරණ ලද්දේ ඉතා දුර්වලය. අද මම ඔහු වලෙහි ලන්නෙමු. ඔහුගේ ඒ ජීවිතය නොකැමැත්තෙමි.

3. "මේ අදහස පාපකාරීය. එහෙයින් යහපත ඉක්මවා සිටියාවූ දරුණුවූ කර්මයක් කරන්නෙහිය.

4. "පියාණෙනි, ජරාවට පැමිණියාවූ නුඹද මා විසින් මෙබඳුවූ කර්මයක් ලබන්නෙහිය. ඒ කුලයෙහි ආ පැවතීම බල පවත්නේ මමද නුඹ වලෙහි බහා ලන්නෙමි.

5. "කුමාරය, තෝ පරුෂ වචනවලින් නින්දා කරමින් මා ගටා බණින්නෙහිය. පුත්‍රය, තෝ මාගේ ලෙහි උපන්නාවූ පුත්‍රවූයේම මට අහිතානුකම්පා ඇත්තෙක් වෙහිය.

6. "පියාණෙනි, මම නුඹට අහිතානුකම්පා ඇත්තේ නොවෙමි. පියාණෙනි, මමද නුඹට ජාතානුකම්පා ඇත්තේ වෙමි. එහෙයින් පාප කර්මය කරන්නාවූ තා එයින් වළක්වන්ට සුදුස්සෙමි.

7. "සවිට්ඨය, පාප ස්වභාව ඇත්තාවූ යමෙක් තෙම නිරපරාධවූ මවට හෝ පියාට හෝ හිංසා කෙරේද, හෙතෙම ශරීර භෙදයෙන් මත්තෙහි පරලොව සැක නැතිව නරකයට පැමිණේ.

8. "සවිට්ඨය, යමෙක් තෙම මවට හෝ පියාට හෝ ආහාරයෙන්ද පානයෙන්ද උපස්ථාන කෙරේද, හෙතෙම ශරීර භෙදයෙන් මත්තෙහි පරලොව සැක නැතිව සුගතියට පැමිණේ.

9. පුත්‍රය, තෝ මට අහිතානුකම්පා ඇත්තේ නොවෙහි පුත්‍රය, තෝ මට හිතානුකම්පා ඇත්තෙහිය, මමද තාගේ මව විසින් කියන ලද්දේ මෙබඳුවූ දරුණු කර්මය කෙරෙමි.

10. තාගේ අයහපත් ස්වභාව ඇති යම් ඒ භාර්යාවක් වේද? මට වැදූ මවවූ ස්වකීයවූ මෝතොමෝ මව්ය. සිය ගෙදරින් මැය බැහැර කරව, නුඹට ඕතොමෝ අනිකුදු දුකක් පමුණු වන්නීය.

11. "තාගේ අනාර්ය ස්වරූපවූ යම් මේ භාර්යාවක් ඇද්ද, ඕතොමෝ මාගේ ස්වකීයවූ උත්පාදකවූ මව්ය. ඇතින්නක් මෙන් දැමුනාවූ වසඟ බවට පැමිණියාවූ ඒ ලාමක ස්වභා ඇත්තී නැවත පැමිණේවා."

**447 මහා ධම්මපාල ජාතකය:-** 1. "තාගේ ව්‍රත සමාදානය කිමෙක්ද' බ්‍රහ්මචර්යාව කිමෙක්ද? මේ විපාකය කවර නම් සුචරිතයක්හුගේද, මට මේ කාරණය කියව. කවර නම් කාරණයකින් තොපගේ කුලයෙහි බාලයෝ නො මියන්නාහුද?

2. "දශකුශල ධර්මයෙහි හැසිරෙමු. බොරු නොකියමු. සෙසු පාප කර්මයන්ද දුරු කරමු. සියලු අනාර්යවූ කර්මය දුරු කරමු. ඒ කාරණයෙන් අපගේ බාලයෝ නොමියෙත්.

3. "අසත් පුරුෂයන්ගේද සත්පුරුෂයන්ගේද ධර්මය අසමු. අසත් පුරුෂයන්ගේ ධර්මය නොම කැමැත්තෙමු. අසත්පුරුෂයන් හැර සත් පුරුෂයන් අත් නොහරිමු. ඒ කාරණයෙන් අපගේ බාලයෝ නොමියන්නාහ.

4. "දන් දීමට පළමුකොටද සතුටු සිත් ඇත්තෝ වෙමු. දෙමින්ද සතුටු සිත් ඇති වෙමු. දානය දීද පසුව පසුතැවිලි නොවෙමු. එසේ හෙයින් අපගේ බාලයෝ නොමියන්නාහ.

5. "ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද මගීන්ද ගුණකියා ඉල්ලන්නවුන්ද යාචකයන්ද දිළිඳුවූවන්ද යන මොවුන් බතින් පැනින් අපි පිනවම්හ. එසේ හෙයින් අපගේ බාලයෝ නොමියන්නාහ.

6. "අපිද භාර්යාවන් ඉක්ම නොයම්හ. භාර්යාවෝද අප ඉක්ම නොයත්. ඔවුන් කෙරෙන් පිටත් ස්ත්‍රීන් කෙරෙහි බ්‍රහ්මචර්යාව හැසිරෙමු. එසේ හෙයින් අපගේ බාලයෝ නොමියන්නාහ.

7. "අපි හැමදෙන සතුන් මැරීමෙන් වැළකීමු. ලෝකයෙහි නුදුන්දෙය දුරුකරමු. මද්‍යපානය කරන්නෝ නොවෙමු. බොරුද නොකියමු. එසේ හෙයින් අපගේ ළදරුවෝ නොමියත්.

8. "සුශිලවූ මේ අප ස්ත්‍රීන් කෙරෙහි යම් පුත්‍ර ස්ත්‍රී කෙනෙක් උපදිද්ද, මොහු ඒකාන්තයෙන් ධාරණ ශක්ති ඇත්තෝ වෙත්. බොහෝවූ නුවණ ඇත්තාහු බහුශ්‍රැත වූවාහු වේදයෙහි පරතෙරට ගියාහුද වෙති. එසේ හෙයින් අපගේ ළදරුවෝ නොමියෙත්.

9. "මව්ද, පියාද, සහෝදරයෝද, සහෝදරියෝද, පුත්‍රයෝද, භාර්යාවෝද යන අපි හැමදෙනම පරලොව හේතුකොටගෙණ කුශල ධර්මයෙහි හැසිරෙමු. එහෙයින් අපගේ ළදරුවෝ නොමියත්.

10. "දාසයෝද, දාසීහුද, අප අනුව ජීවත් වන්නෝද පිරිවර ජනයෝද කම්කරුවෝද යන හැමදෙන පරලොව පිණිස කුශල ධර්මයෙහි හැසිරෙත්. එහෙයින් අපගේ බාලයෝ නොමියෙත්.

11. "ඒකාන්තයෙන් කුශල ධර්මයතෙම ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා රක්ෂා කරයි. මනාකොට පුරුදු කරණ ලද කුශල ධර්මයතෙම සුව එළවයි. මනාකොට පුරුදු කළාවූ කුශල ධර්මයෙහි මෙතෙම ආනිශංසයවේ. ධර්මයෙහි හැසිරෙන තැනැත්තේ දුර්ගතියට නොපැමිණේ.

12. "ඒකාන්තයෙන් කුශල ධර්මයතෙමේ ධර්මයෙහි හැසිරෙන්නාහු වර්ෂා කාලයෙහි මහත්වූ කුඩයක් මෙන් රකියි. ධර්මයෙන් රක්ෂාකරණ ලද මාගේ ධර්මපාල නම්වූ කුමාර තෙම සුවපත් වේ. (එසේ හෙයින් මේ) අනිකෙකුගේ ඇට වෙතියි" කීයේය.

448 **කුක්කුභ ජාතකයා**:- 1. "කරණ ලද පව් ඇත්තහු කෙරෙහි විශ්වාස නොකරන්නේය. බොරු කියන්නහු කෙරෙහිද විශ්වාස නොකරන්නේය. තමා පිණිස පවත්නා නුවණැත්තහු කෙරෙහිද විශ්වාස නොකරන්නේය. ඉතා ශාන්තයෙකු මෙන් සිටින්නහු කෙරෙහිද විශ්වාස නොකරන්නේය.

2. "පිපාසිත ගවයන් සමානවූ සමහර පුරුෂ කෙනෙක් වෙත්. ඔහු මිත්‍රයන් වචනයෙන් කා දමන්නවුන් වැන්නෝය. ක්‍රියාවෙන් කිසිවක් නොකරත්.

3. "යමෙකු කෙරෙහි කෘතඥ බවක් නැද්ද, එසේවූ හිස්වූ ඇඳිළි බැඳීම් ඇති වචනයෙන් වැඩිසිටියාවූ නිශ්ශාර මනුෂ්‍යයා කරා නොපැමිණෙන්නේය.

4. "වෙන වෙන පවත්වන සිත් ඇති ස්ත්‍රීන්ද පුරුෂයන්ද නොම විශ්වාස කරන්නේය. යම් කෙනෙක් වෙන්වම සංසර්ගය කොට පවතිද්ද, එබඳුවූවහුද විශ්වාස නොකරන්නේය.

5. "අනාර්යවූ ක්‍රියාවට බැසගත්තාවූ අස්ථිරවූ වචන ඇති සියල්ල නසන සුළුවූ පිළිසන්වූ මුවහත් කරණලද කඩුවක් බඳුවූ ඒ පුරුෂයා විශ්වාස නොකරන්නේය.

6. "මෙහි සමහර කෙනෙක් මිත්‍ර රූපකවූ සිත් නැත්තාවූ සිළුටු වචනයෙන්ද අනෙක ප්‍රකාරවූ උපායවලින් යුක්ත වෙද්ද, එබඳු වූවහුද විශ්වාස නොකරන්නේය.

7. "එබඳු නුවණ නැත්තාවූ පුරුෂතෙම යම් තැනෙක්හි ආහාරයක් හෝ ධනයක් හෝ දක්නේ වීනම් ද්‍රොහ කරන්නේය. ඔහුද නසායන්නේය.

8. "බොහෝවූ සතුරෝ මිත්‍රරූපයෙන් කැමති වූවාහු සේවනය කෙරෙත්. මෙබඳු නින්දා කටයුතු පුරුෂයන් ඇටිකුකුළා උකුස්සා මෙන් දුරු කරන්නේය.

9. "යමෙක් උපන්නාවූ අර්ථය වහා අවබොධ නොකෙරේද හෙතෙම සතුරන්ගේ වසඟයට පැමිණේ, පසුවද තැවේ.

10. "යමෙක් වනාහි උපන්නාවූ අර්ථය වහාම දැනගණීද, සතුරන්ගේ වියවුලින් උකුස්සා කෙරෙන් ඇටිකුකුළා මෙන් මිදෙන්නේය.

11. "වනයෙහි අටවනලද සොර උගුලක් මෙන්ද ධාර්මිකවූ නිතර විනාශ කරන්නාවූ එබඳුවූ ඔහු හුණවනයෙහි වසන ඇටිකුකුළා උකුස්සා මෙන් පරීක්ෂා ඥානයෙන් යුක්තවූ පුරුෂතෙම දුරින් දුරුකරන්නේය."

449 **මට්ටකුණ්ඩලී ජාතකයः-** 1. "සැරසුනාවූ මට කොඩොල් ඇති මල් දරන්නාවූ රන්වන් සඳුන් ගැල්වූ තෝ මේ වනමැද කුමකට දුක්වූයේ හිස අත්බැඳගෙණ හඬන්නෙහිද?

3. "ස්වර්ණමයවූ බබළන්නාවූ රියකුඩුවක් මට ලැබුනේය. එයට රෝද දෙකක් නොලබමි. ඒ දුකින් ජීවිතය හරිමි.

3. "ස්වර්ණමයවූ, මාණික්‍යමයවූ, ලෝහමයවූ නැවත රජතමයවූ රථයක් තට කරන්නෙමි. කියව, ඒ චක්‍ර යුග්මය තට ලබාදෙමි.

4. "ඒ මානවකතෙම ඔහුට මෙසේ කීය. මාගේ රථය තෙම ස්වර්ණමය විය. මෙහිලා බබළන්නාවූ සඳහිරු දෙදෙන වෙත්. ඒ චක්‍ර යුග්මයෙන් මාගේ රථය සොභමානවේ.

5. "මානවකය, තෝ වනාහි අඥානයෙහිය යම්බඳු තෝ නොපැතිය යුත්තක් පතන්නෙහිද, එහෙයිනි තෝ මිය යන්නෙහියයි සිතමි. තෝ සඳහිරු දෙදෙන නොලබන්නෙහිය.

6. "ගමනාගමනයද වර්ණධාතුවද මේ අහසෙහි උභය වීථිහුද දක්නා ලැබේ. පරලොව ගිය තැනැත්තේ වනාහි නොම දක්නා ලැබේ. හඬන්නාවූ අප දෙදෙනා අතුරෙන් කවරෙක් වනාහි අතිශයින් අඥානවේද?

7. "මානවකය, සැබවක්ම කීයෙහිය. හඬන්නාවූ අප දෙදෙනාගෙන් මමම ඉතා අඥානවෙමි. චන්ද්‍රයා ඉල්වා අඬන්නාවූ ළදරුවෙකු මෙන් කළුරිය කළ පරලොව ගියහු ප්‍රාර්ථනා කරමි. එහෙයින් සැබවක්ම කීයෙහිය.

8. "ගිතෙල් ඉසින ලද්දාවූ ගින්නක් මෙන් ශොකාග්නියෙන් ඇවිල ගත්තාවූ මා ඒකාන්තයෙන් ජලයෙන් ඉසින ලද්දක් මෙන් සියලු පීඩා නිවූයේය.

9. "ශොකයෙන් පෙළුනාවූ මාගේ පුත්‍ර ශොකය යමෙක් දුරු කෙළේද, හෙතෙම මාගේ හෘදයෙහි පැවැත්තාවූ යම් ශොක නොමැති හුලක් වීද, ඒ හුල ඒකාන්තයෙන් උදුරා දැමීය.

**450 බිළාරකොසිය ජාතකයඃ-** 1. "නොපිසන්නාවූද සත්පුරුෂයෝ භෝජනය ලැබ දෙනු කැමතිවෙත්. තෝ වනාහි කිමෙක්ද, පිසන්නේ යම් හෙයකින් නොදෙන්නේ නම් එය සුදුසු නොවේ.

2. "මසුරුකමින්ද ප්‍රමාදයෙන්ද මෙසේ දානය නොදෙනු ලැබේ. පින කැමතිවන්නාවූ නුවණැත්තහු විසින් දිය යුතුවේ.

3. "යමකට බියපත්වූ මසුරු පුද්ගලයා නොදේද, නොදෙන්නාහුට ඒ භයම වන්නේය. මසුරු තැනැත්තේ සාදුකද පිපාසාවද යන යමකට බියවේද, එයම අඥානයා මෙලෙව්හිද පරලෙව්හිද ස්පර්ශ කෙරේ.

4. "එහෙයින් මසුරු මළ මැඩපවත්වන්නේ මසුරු බව දුරුකොට දානය දෙන්නේය. කරණලද පින් පරලෙව්හි ප්‍රාණීන්ට පිහිට වෙත්.

5. "දීමට දුෂ්කරවූ දානය දෙන්නවුන්ගේ දුෂ්කරවූ කර්මය කරන්නවුන්ගේ ප්‍රතිපත්තියට අසත් පුරුෂයෝ අනුව කටයුතු කරන්නෝ නොවෙති. එසේමැයි සත්පුරුෂයන්ගේ ධර්මය තෙම අනුව පවත්නට නොපිළිවනි.

6. "එහෙයින් සත්පුරුෂයන්ගේද, පරලොව ගතිය මෙයින් වෙනස්වේ. එසේමැයි. අසත්පුරුෂයෝ නරකයට යෙති. සත්පුරුෂයෝ දෙව්ලොවට යන්නාහ.

7. "සමහරු මද වස්තුවක් ඇතිකල්හිද දන්දෙත්. සමහර කෙනෙක් ඇත්තාවූ බොහෝ වස්තුවෙන්ද නොදෙන්නාහ. මදකිනුදු දෙන ලද දක්ෂිණාතොමෝ දහසක් පමණ දීම හා ප්‍රමාණ කරණලද්දී සමවේ.

8. "යමෙක් වනාහි අඹුදරුවන්ද රකිමින් ස්වල්පවූ දෙයාහ ධර්මය දෙමින් සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේවී නම් පිඬු සිඟා යාමද හැසිරෙන්නේ නම් දහසක් යාග ඇත්තාවූ ලක්ෂයක් ඇති නමුත් ඒ යාගයෝ එබඳු දැහැමින් සොයා දන් දෙන්නාවූ දුගියාගේ දානයෙහි සොළොස්වැනි කොටසද නොඅගිත්.

9. "මහත්වූ මහත් වටිනාකම ඇත්තාවූ මේ දාන සංඛ්‍යාත යාගයතෙම දැහැමින් සෙමෙන් දුන් දානයට වඩා කවරහෙයින් අගනා බවට නොයේද, දහසක් යාග ඇත්තාවූ ඒ ලක්ෂයක් දෙන එබඳු වූවහුගේ කොටසකට කෙසේ නොඅගනාහුද,

10. "විෂමවූ කාය කර්මාදියෙහි පිහිටියාවූ සමහර කෙනෙක් අනුන්ට පීඩාකොට අනුන් නසා තවද අනුන් ශොක කරවා දෙන්නාහුද, කඳුළු මුහුණු ඇති දඬුවම් සහිතවූ ඒ දක්ෂිණාතොමෝ දැහැමින් සෙමෙන් දුන් පුද්ගලයාගේ සමබවට නොපැමිණේ. මෙසේ දහස් ගණන් යාග ඇත්තාවූ ලක්ෂයක් ඒ පුරුෂයෝ එබඳුවූ තැනැත්තාගේ සොළොස් වෙනි කලාවටද නො අගිත්."

451 "චක්කවාක ජාතකයඃ- 1. "චක්‍රවාකය තෝ වනාහි ශරීරවර්ණ ඇත්තෙහිය. විශිෂ්ට රූ ඇත්තෙහිය. ඝනවූ මනාව හටගත් රන්වන් පැහැ ඇත්තේ මනාවූ රූ ඇත්තේ විශෙෂයෙන් ප්‍රසන්නවූ මුහුණ හා ඉඳුරන් ඇත්තේ වෙහිය. එහෙයින් ගං ඉවුරුවල හුන්නේ පෙටි මස්ද, ලූල් මස්ද, ලේල්මස්ද, යන මෙසේවූ භොජනය අනුභව කෙරෙහිද,

3. "යහළුව, මම මේ භොජනය හෝ දිය සෙවෙල් යන මෙයින් අන්‍යවූ ජංගල දෙශයෙහිවූ මාංශයන් හෝ අනුභව නොකරමි. දියෙහි මස් හෝ අනුභව නොකරමි. මේ සෙවෙල් දිය පරඬලා දෙක මාගේ භොජනයයි.

4. "මම මේ සෙවෙල් දිය පරඬලා යන දෙක සක්වා ලිහිණියාගේ භොජනයයි නොම හදහමි. යහළුව මම වනාහි ගමෙහි ලුණුවලින්ද, තෙල්වලින්ද යුක්තවූ මිනිසුන් අතරෙහි කරණලද පවිත්‍රවූ මසින් යුක්තවූ භොජනය අඩුනැතිව කෙරෙමි. එතකුදු වුවත් සක්වාලිහිණිය, තට මෙන් මට එබඳු වූ ශරීරවර්ණයෙක් නම් නොමැත.

6. "තමා කෙරෙහි වෛර සිත බලන්නේ මනුෂ්‍ය ප්‍රජාව පෙළන්නේ හටගත් චිත්තොත්‍රාස ඇත්තේ, බියපත්වූයේ අනුභව කරන්නෙහිය. එහෙයින් තාගේ ශරීර වර්ණය මෙබඳුවේ.

7. "කව්ඩුව, තෝ වනාහි පාප කර්මයෙන් සියලු ලොවට විරුද්ධ වෙහිය. තා විසින් ලබනලද ආහාරය තා නොපිනවයි. එහෙයින් තාගේ ශරීර වර්ණය මෙබඳුවේ.

8. "යහළුව, මමද සියලු සතුන්ට හිංසා නොකරන්නේ මද උත්සාහ ඇත්තේ, සැකයක් නැත්තේ, ශොක නැත්තේ කොයිනුත් බියක් නැත්තෙම් අනුභව කරමි.

9. "හේ තෝ උත්සාහ කරව, ස්වකීය දුශ්ශීල භාවය ඉක්මවා පවතුව, එකල්හි අවිහිංසාවෙන් යුක්තව ලෝකයෙහිම හැසිරෙන්නෙහි මා මෙන් ලොවට ප්‍රියයෙක් වන්නෙහිය.

10. "යමෙක්තෙම අනුන් නොනසාද, විනාශයක් නොකෙරේද, ධන හානියක් නොකෙරේද, ධන හානියක්

අනුන්ලවා නොකරවාද, සියලු සතුන් කෙරෙහි මෛත්‍රී කොටස් ඇත්තේද, ඕහට කිසිවෙකු හාද වෛරයක් නැත්තේය.

**452 භූරිපඤ්ඤ ජාතකය:-** 1. "බොහෝ ප්‍රඥා ඇත්ත, නුඹ මාළු නැත්තාවූ යව සාලේ බත අනුභව කෙරෙහිද, එසේ වූ විපතට පැමිණියාවූ නුඹ එබඳු ශ්‍රී තොමෝද ධෛර්යයද ස්මෘතියද රක්ෂා නොකෙරේ. එහෙයින් එය සැබෑවිල.

2. "මම දුකින් පුරාතන සැපය වඩන්නෙම් කාලය හා අකාලය සොයන්නෙම් මාගේ කැමැත්තෙන් සැඟවුනේ අභිවෘද්ධියට ද්වාරයන් විවෘත කරන්නේ වෙම්ද, ඒ කාරණයෙන් යවසාලේ බතින් සතුටුවෙමි.

3. "උත්සාහ කිරීමට කාලය දැන නුවණින් අර්ථය වඩා සිංහ විජාම්භනයෙන් විජාම්භනය කෙරෙමි. නැවතද ඒ සමෘද්ධියෙන් යුක්තවූ මා දක්නෙහිය.

4. "සුවපත්වූ සමහරු වනාහී පව් නොකෙරෙත්. නැවත අපකීර්තිය හා එක්වන භයින් පව් නොකෙරෙත්. නුඹවනාහි ප්‍රබලවූයේම බොහෝවූ කරුණු සිතන්නේ මට කවර කරුණකින් දුකක් නොකෙරෙහිද,

5. "පණ්ඩිතයෝ තමහට සුව සඳහා පව්කම් නොකෙරෙත්. කායික චෛතසික දුකින් පෙළුනාවූ විපතට පැමිණියාහුද, ඡන්දයෙන් ද ද්වේෂයෙන්ද ධර්මය අත්නොහරිත්."

6. "මොළොක්වූද, දරුණුවූද, යම්කිසි කාරණයකින් බැගෑවූ තමා නගාසිටුවන්නේය. එසේ සිට පසුව සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේය.

7. "යම් ගසක්හුගේ සෙවෙනෙහි හුන්නේ වීනම් හෝ ශයනය කෙළේනම් හෝ ඒ වෘක්ෂයාගේ ශාඛාවක් නොබිඳින්නේය. කුමක් හෙයින්දයත්, බිඳුනේවී නම් ඒ පවිටුතෙම මිත්‍රද්‍රෝහියාමවේ.

8. "මනුෂ්‍යතෙම යමෙකුගේ වනාහි ධර්මය දන්නේද, යම් සත්පුරුෂ කෙනෙක් මොහුගේ සැකය දුරුකෙරෙද්ද, එයම

මොහුට පිහිටදවේ. පිළිසරණදවේ. එහෙයින් ඒ ගුරුවරයා සමග මිත්‍ර බව නුවණැත්තේ නොදිරවන්නේය.

9. "ගෘහස්ථතෙම කම් සැප අනුභවකරන්නේ අලසවීනම් යහපත් නොවේ. පැවිදිතෙම සංයම නැත්තේනම් යහපත් නොවේ. රජතෙම පරීක්ෂාකාරි නොවේ නම් යහපත් නොවේ. යම් පණ්ඩිතයෙක් කිපෙනසුළු වී නම් හෙතෙම යහපත් නොවේ.

10. "ක්ෂත්‍රියතෙම කරුණු විමසා කරන්නේය. රජ තෙම නොවිමසා නොකරන්නේය. කුමක්හෙයින්දයත්, රාජය, විමසා කටයුතු කරන්නහුගේ යශසද, කීර්තියද වැඩේ.

**453 මහාමංගල ජාතකයඃ-** 1. "මනුෂ්‍යතෙම මංගල ප්‍රාර්ථනා කාලයෙහි කුමක් නම් ජපකරන්නේ කවර නම් වේදයක් හෝ ශ්‍රැතයන් අතුරෙන් කවරක් හෝ හදාරා ඒ මංගලාර්ථ පුරුෂතෙම මේ ලෙව්හිද, පරලෙව්හිද, කෙසේ කරන්නේ මංගලයෙන් රක්නාලද්දෙක් වන්නේද,

2. "සියලු දෙවියෝද, බ්‍රහ්මයෝද, සියලු දීර්ඝ ජාතීහුද, සියලු සත්වයෝද, යන මොහු යමක්හුගේ මෛත්‍රී සිතින් පුදන ලද්දාහු වෙද්ද, එය සියලු භූතයන් කෙරෙහි මිනිසුන්ට මංගල නම් වෙයි කියත්.

3. යමෙක් සියලු ලෝකයහට යටත් පැවතුම් ඇත්තේ බාලයන් සහිතවූ ස්ත්‍රී පුරුෂයන්ගේ නපුරුකොට කියනලද වචනයන් ඉවසන්නේද, නොපිළිකුල් වචන ඇත්තේද? ඒ ඉවසීම පුරුෂයා හට නිරපරාධවූ මංගලයයි කියත්.

4. "යමෙක් තෙම යහළු මිත්‍රයන් කෙරෙහිද ශිල්පයෙන් හෝ කුලවත් බැවින් හෝ වස්තුවෙන් හෝ ජාතියෙන් හෝ අවමන් නොකෙරේද? යහපත් ප්‍රඥා ඇත්තේ වැඩට සුදුසු කාලයෙහි ස්මෘති ඇත්තේ වේද, යහළුවන් කෙරෙහි ඒ නින්දා නොකිරීම ඔහට මංගලයයි කියත්.

5. "නොරැවටීම් ඇති යමෙක්හට සත්පුරුෂයෝ ඒකාන්තයෙන් මිත්‍ර වෙද්ද, ඉතාම විශ්වාස වෙද්ද, එසේම මිත්‍ර ද්‍රෝහී නොවේද, වස්තුවෙන් බෙදීම ඇති ඔහුට මිත්‍රයන් අතුරෙහි ලැබිය යුතුවූ ඒ විශ්වාසය මංගලයයි කියත්.

**6.** "යමෙක්හුගේ භාර්යාව සමවූ වයස් ඇත්තීද, සමගි වූවාද, අනුව පවත්නීද, සුචරිත ධර්මයන් කැමැත්තීද, දරුවන් ඇත්තීද, කුලවත්වීද, පතිව්‍රතා ඇත්තීද, එබඳු අඹුවන් කෙරෙහි ඒ සුවපත් භාවයයි කියත්.

**7.** "ජනාධිපතිවූ යශස් ඇත්තාවූ රජතෙම යමක්හුගේ පවිත්‍ර බවද වික්‍රමයද දනීද, මට සුහෘදයයි නොවෙනස් බැවින් දනීද, රජුන් කෙරෙහිලා ඒකාන්තයෙන් එය මංගලයයි කියත්.

**8.** "සැදැහැ ඇත්තේ ප්‍රසන්න සිත් ඇත්තේ සතුටු වෙමින් ආහාරයද පානයද සුවඳද මල්ද දෙන්නේ නම් එය ස්වර්ගයන්හි ඒකාන්තයෙන් ස්වස්ථානයයි කියත්.

**9.** "ඥාන වෘද්ධවූ යහපත් ප්‍රතිපත්තියෙන් ආරාධනා කරණ ලද්දාවූ සත්පුරුෂවූ බහුශ්‍රැතවූ සිල්වත්වූ ඍෂිහු යමක්හු උතුම් ධර්මයෙන් පවිත්‍ර කෙරෙත්නම් එය රහතුන් මැදවිය යුතුවූ ස්වස්ථානයයි කියත්.

**10.** "මෙකී මංගලයෝම ලෝකයෙහි නුවණැත්තන් විසින් පසස්නා ලදහ. සුවවැඩීමට කාරණයහ. එහෙයින් ප්‍රඥා සහිතවූ මනුෂ්‍යතෙම මෙහිලා ඒ මංගලයන්ම සෙවනය කරන්නේය. මෙයින් පිටත් දෘෂ්ට මංගලයන්ගෙන් සත්‍යවූ කිසිවක් නොම ඇත්තේය.

**454 ඝත ජාතකයඃ-** 1. "කණ්හය, නැගී සිටුව, කුමට වැද හොවීද, නුඹ නිදීමෙන් කවර වැඩෙක්ද, කේශවය, නුඹගේ හෘදය වැනිවූ දකුණු ඇස වැනිවූ ඝත නම්වූ යම් ස්වකීය සහෝදරයෙක් ඇද්ද, ඔහුගේ හෘදය අපස්මාර වාතයෝ බලකෙරෙත්. හෙතෙම නැවත නැවත කියයි. හෙවත් සාවා මට දෙවයි කියා නන් දොඩයි.

**2.** ඒ රෝහණෙයය නැමැත්තහුගේ ඒ වචනය අසා යුහුසුළු ස්වභාව ඇති කෙශවතෙම භාතෘ ශොකයෙන් පෙළුනේ නැගී සිටියේය.

**3.** "කිමෙක්ද, උමතුවූවෙකු මෙන් මේ සියලු ද්වාරවතී නුවර ඇවිදිනෙහි සාවාය සාවායයි දොඩවන්නෙහිය. කවරෙක් වනාහි තොපගේ සාවා හැර ගත්තේද?

4. “ස්වර්ණමයවූද මැණික්මුවාවූද ලෝහමයවූද තවද රජතමයවූද සංඛමයවූද සිලාමයවූද ප්‍රවාළමයවූද, සාවෙකු තට කරවන්නෙමි. නොහොත් වනයෙහි වසන්නාවූ මෙයින් අන්‍යවූද සාවෝ ඇත්තාහ. තට ඒ සාවුන්ද ගෙණ දෙන්නෙමි. තෝ වනාහි කෙබඳුවූ සාවෙකු කැමැත්තෙහිද කෙශවය, යම් සා කෙනෙක් පොළොව ඇසුරු කළාහුද ඔවුන් මම නොකැමැත්තෙමි. චන්ද්‍රයා කෙරෙන් සාවා කැමැත්තෙමි. ඒ සාවා මට හැරගෙණ දෙව.

5. “ප්‍රිය ඥාතිය, යමෙක් නොපැතිය යුත්තක් පතන්නෙහිද, චන්ද්‍රයා කෙරෙන් සාවා කැමැත්තෙහිද, ඒ තෝ ඒකාන්තයෙන් මධුරවූ ජීවිතය හරින්නෙහිය.

6. “කණ්හය, ඉදින් මෙසේ දන්නෙහි වීනම් යම් අනිකෙකුට අනුශාසනා කරන්නෙහි නම් කවර හෙයකින් පෙර මළාවූ පුත්‍රයාට අදත් ශොක කෙරෙහිද?

7. “මාගේ උපන්නාවූ පුත්‍රතෙම නැවත නොමියේවායි මිනිසෙකු විසින් හෝ නොමිනිසෙකු විසින් යම් හෙයකින් නොලැබිය හැක්කේද එහෙයින් ලැබිය නොහැකි දෙයක් කොයින් ලැබෙන්නේද,

8. “කණ්හය, පරලොව ගියාවූ යමෙකු අනුව ශොක කෙරෙහිද, ඒ පුත්‍රයා මන්ත්‍රයකින් හෝ මුල් බෙහෙතකින් හෝ අන් ඖෂධවලින් හෝ වස්තුවෙන් හෝ ගෙණෙන්නට නොපිළිවනි.

9. “ගිතෙල් ඉසින ලද ගින්නක් මෙන් ඇවිලගත්තාවූ මා ඒකාන්තයෙන් දිය ඉසිනලද්දාක් මෙන් සියලු පීඩාව නිවූයේය.

10. “යමෙක් තෙම ශොකයෙන් පෙළුනාවූ මාගේ පුත්‍ර ශොකය දුරුකෙළේද, හෙතෙම මාගේ හෘදය ඇසුරුකළාවූ යමක්වීද, මාගේ ඒ ශොක නමැති හුල ඒකාන්තයෙන් ඇද දැමීය.

11. “මානවකය, ඔබගේ වචනය අසා ඒ මම උදුරා දැමූ ශොක නමැති හුල් ඇත්තේ පහව ගියාවූ ශොක ඇත්තේ නොකැළඹුනු සිත් ඇත්තේ වෙමි. ශොක නොකරමි. නොහඬමි.

12. "යම්කෙනෙක් අනුකම්පා ඇත්තාහු වෙද්ද, වැඩිමහළු සොහොයුරා සතයා මෙන් ශොකයෙන් වළක්වත්ද, එබඳුවූ ප්‍රඥා සම්පන්නවූ ඔව්හු මෙසේ කෙරෙත්."

---

# එකදස නිපාතය

**455 මාතුපොසක ජාතකයා:-** 1. "ඒ මාගේ පුත්‍රවූ හස්ති රාජයාගේ වෙන්වීමෙන් ඉඳුසල්ගස්ද හෙවත් ඇඹැල්ල ගස්ද කෙළිඳ ගස්ද කුරුඳුගස්ද ඉළුක් ආදී මහ තෘණද නෙළුම්ද බොඩහමුද යන සියල්ල වැඩුනාහුය. පර්වත පාදයෙහි කිණිහිරි ගස්ද පිපුනාහුය.

2. "කිසියම් තැනෙක ස්වර්ණාභරණයෙන් යුක්තවූවෝ හස්තිරාජයා ආහාරයෙන් පොෂණය කෙරෙත්. යම් ඇතෙකු පිට රජද රජ කුමරෙක්ද හිඳ භය නැතිව සතුරන්ගේ යුද්ධ සැට්ටය බිඳින්නේද, (ඒ හස්තිරාජයායි.)

3. "හස්තිරාජය, ආහාරය ගනුව. හෙවත් අනුභව කරව. හස්ති රාජය, කාශවූවෙක් නොවෙව. හස්තිරාජය රාජකෘත්‍යයෝ බොහෝ වෙත්. ඒ රාජකෘත්‍යයන් කරව.

4. "ඒකාන්තයෙන් බැගෑපත්වූ අන්ධවූ පිළිසරණක් නැත්තාවූ ඒ මේ මාගේ මව් ඇතින්න චණ්ඩොරණ පර්වතය දිශාවට පාදයෙන් යමින් කණුව ගවයි.

5. "මහා හස්තිය. අන්ධවූ පමුණුවන්නෙකු නැත්තාවූ යම් ඇතින්නක් චණ්ඩොරණ පර්වතයට යමින් පාදයෙන් කණු ගටයිද, ඕතොමෝ තාගේ කවරක් වන්නීද,

6. "මහරජ, අන්ධවූ පිරිනමන්නෙක් නැත්තාවූ මාගේ මවු වූ ඕතොමෝ චණ්ඩෝරණ පර්වතයට අභිමුඛව කම්පා වෙමින් පයින් කණු ගටන්නීය.

7. "යම් මේ හස්තියෙක්තෙම මව පොෂ්‍ය කෙරේද, මේ හස්තිරාජයා මුදාහරිව්. හස්තිතෙම සියලු නෑයන් සමග මව හා එක්වේවා.

8. "හස්තිතෙම බන්ධනයෙන් මිදුනේද කුඤ්ජරතෙම දාමයෙන් මිදුනේ මොහොතක් කල් අස්වැසීමකොට චණ්ඩෝරණ පර්වතය යම් තැනෙක්හිද එහි ගියේය.

9. "ඉක්බිත්තෙන් ඒ හස්තිතෙම සිහිල්වූ දිය ඇති ඇතුන් විසින් සේවනය කරණ ලද විලට ගොස් සොඬින් දිය ගෙණ මවට ඉස්සේය.

10. "මේ කිනම් නුසුදුසු වර්ෂාවෙක් නොකල්හි වස්නේද, යමෙක් මට උපස්ථායකවූයේද, ස්වකීය පුත්වූ මාගේ ඒ පුත්‍රතෙම ගියේය.

11. "මැණියෙනි, නැගී සිටුව. කුමට හෝනෙහිද නුඹගේ පුත්‍රවූ මම ආයේ වෙමි. වේදේහවූ යස පිරිවර ඇත්තාවූ කශී රජහු විසින් මම මුදන ලද්දේ වෙමි.

12. "යමෙක්තෙම හැමකල්හි වැඩිහිටියන් පුදන්නාවූ මාගේ පුත්‍රයා මුදාහැරියේද, කශීරට වැස්සන්ගේ රට දියුණු කරන්නාවූ ඒ රජතෙම බොහෝ කලක් ජීවත්වේවා."

456 **ජුණ්හ ජාතකයා**:- 1. "ජනප්‍රධානවූ මහරජ, මාගේ වචනය ඇසුව මැනව. ජුණ්හවූ ඔබවහන්සේ කෙරෙහි එක් අර්ථයක් සඳහා මෙහි පැමිණියේ වෙමි. දෙපා ඇත්තවුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨවූ මහරජ්ජුරුවන් වහන්ස, බ්‍රාහ්මණයන්ද මගීන්ද පැමිණ සිටින කල්හි ඔවුන් නොබලා නොයායුතුයයි කියත්.

2. "බ්‍රාහ්මණය, තොපගේ වචනය අසමි. සිටිමි කියව. යම් අර්ථයකින් මෙහි පැමිණියෙහිද, බ්‍රාහ්මණය, මා කෙරෙහි කුමක් හෝ පතන්නේ කුමක් සඳහා මෙහි ආයෙහිද, එසේ නම් එය කියව.

3. "මට ගම්වර පසක්ද දාසීන් සියයක්ද ගවයන් සත් සියයක්ද දහසකින් වැඩිවූ ස්වර්ණ නිෂ්කයන්ද (නිෂ්කය නම් පස්විසි කළඳයි) දුනමැනව. මට සදෘශභාවය ඇත්තාවූ භාර්යාවන් දෙදෙනෙක්ද දුනමැනව.

4. "බ්‍රාහ්මණය, තාගේ බලවත් ස්වරූපවූ තපසක් ඇත්තේද නොහොත් බමුණ තාගේ විසිතුරුවූ මන්ත්‍රයෝ ඇද්ද නොහොත්

තාගේ කීකරුවූ යම් යක්ෂ කෙනෙක් ඇද්ද, නොහොත් මට තා විසින් කරණ ලද යම් අර්ථයක් හෝ දන්නෙහිදැයි ඇසීය.

5. "මාගේ තපසෙක් නැත්තේය. මන්ත්‍රයෝද නොමැත. මාගේ කීම කරන්නාවූ කිසියම් යක්ෂ කෙනෙක්ද නැත. ඔබට මා විසින් කරණ ලද අර්ථයකුදු නොදනිමි. පූර්වයෙහි වනාහි සමාගමය පමණක් විය.

6. "දන්නාවූ මාගේ මේ පළමු දැක්මවේ. මෙයින් පෙර තා නොහඳුනමි. කවර කලෙක්හි කොතැනක හෝ අපගේ සංගමයවීද, මේ කාරණය විචාරණ ලද්දේ මට කියව.

7. "දෙවයන්වහන්ස, ගන්ධාර රජහුගේ රම්‍යවූ තක්සලා පුරයෙහි විසූයෙමු. එහිදී ඝනාන්ධකාරවූ රාත්‍රියෙහි අන්ධකාරයෙහි අංසයෙන් අංසය ගැටීම කෙළෙමු.

8. "ජනෙන්ද්‍රය, ඒ අපි දෙදෙන එහි සිට එතැනදීම සිහිකළයුතු කථාවක් කොට නිමවූයෙමු. අපගේ ඒ සමාගමය පමණක්විය. ඉන්පසුවද සමාගමයෙක් නොවීය. ඉන් පෙරද නොවූයේය.

9. "බ්‍රාහ්මණය, යම්කිසි කලෙක්හි මිනිසුන් අතුරෙහි සත්පුරුෂයකු හා සමාගමය වේද, පණ්ඩිතයෝ ඒ මොහොතක් කළ සමාගමය හෝ බොහෝ කල් කළ සන්ථවයන් හෝ පෙර කළ ගුණයක් හෝ නොනසත්.

10. "අඥානයෝද වනාහි මොහොතක් කල් කළ සංගමය හෝ බොහෝකල් කළ මිත්‍ර සන්ථවයන් හෝ පෙර කළ ගුණය හෝ නසත්. ප්‍රාඥයා කෙරෙහි මනාකොට කරණලද ස්වල්පවූද ගුණධර්මය නොනැසේ. ඒ එසේමය. ප්‍රාඥයෝ මනා කළගුණ දන්නා ස්වභාව ඇත්තෝ වෙත්.

11. "තට ගම්වර පසක්ද දාසීන් සියයක්ද ගවයන් සත් සියයක්ද දහසකින් වැඩිවූ ස්වර්ණ නිෂ්කයන්ද දෙමි. තට කුල රූපාදියෙන් සමානවූ භාර්යාවන් දෙදෙනෙක්ද දෙමි.

12. "මහරජ, සත්පුරුෂයන්ගේ සංගමයට පැමිණ මෙසේ වෙයි. කශී රටට අධිපතිවූ රජතෙමේ තාරකාවන්ගේ මැද

චන්ද්‍රයා මෙන් සම්පූර්ණ වන්නේය. නුඹවහන්සේ හා සමග අද සංගමය ලද්දාවූ මමද එසේමයයි" කීයේය.

**457 ධම්ම දෙවපුත්ත ජාතකය:-** 1. මම දෙවි මිනිසුන්ට යශස් ඇතිකරන්නෙක්වෙමි. පින් කරන්නෙක් වෙමි. මහණ බමුණන් අතර හැමකල්හි ස්තුතිලද්දෙක් වෙමි. මාර්ගය ලැබීමට සුදුස්සෙක් වෙමි. දෙවි මිනිසුන් විසින් පුදනලද්දෙක් වෙමි. අධර්ම නම් දිව්‍යපුත්‍රය, මම ධර්ම නම් දිව්‍ය පුත්‍රයා වෙමි. එහෙයින් මට මාර්ගය දෙව.

**2.** "ධර්ම නම් දිව්‍යපුත්‍රය, ඒ මම අධර්ම නම් දිව්‍ය පුත්‍ර වෙමි. මම දැඩිවූ අධර්ම නම් යානාවට නැගී තැතිගැන්මක් නැත්තෙම් බලවත්වූයෙම් කුමක් හේතුකොටගෙණ යහළුව අද මම කිසිවෙකුට නුදුන්විරූ මාර්ගය තට දෙම්ද,

**3.** පළමුකොට ඒකාන්තයෙන් ලෝකයෙහි දශ කුශල කර්මපථ ධර්මයතෙම පහළවූයේය. ඉන්පසුව අධර්මය තෙම පහළවිය. එහෙයින් ජ්‍යෙෂ්ඨවූයේද ශ්‍රෙෂ්ඨවූයේද පුරාතන වූයේද ධර්මය වෙයි. කණිෂ්ඨවූ අධර්ම දිව්‍ය පුත්‍රය, වැඩිමහළුවූ ධර්ම දිව්‍ය පුත්‍රවූ මාගේ මාර්ගයෙන් ඉවත්ව යව.

**4.** "මම තොපට ඉල්වීම නිසා මාර්ගය දෙන්නෙම් නම් නුසුදුසු වේ. සුදුසු වචන කීමෙන් හෝ මාර්ග ලැබීමට සුදුසු බැවින් හෝ දෙන්ට යොග්‍ය නොවේ. අද අප දෙදෙනාගේ යුද්ධයද වේ. යුද්ධයෙහි යමෙක් දිනන්නේද, ඔහුට මාර්ගය වේ.

**5.** "මම සියලු දිශාවන් අනුව පැතුරුනේ වෙමි. මහත් බල ඇත්තාවූ අප්‍රමාණ යශස් ඇත්තාවූ සමානයෙක් නැත්තාවූ සියලු ගුණයන්ගෙන් යුක්තවූ ධර්ම නම් දිව්‍යපුත්‍රයා වෙමි. අධර්ම නම් දිව්‍යපුත්‍රය, තෝ කෙසේ ජය ගන්නෙහිද,

**6.** "ඒකාන්තයෙන් අයොමය මිටියෙන් ස්වර්ණය නසයි. ස්වර්ණයෙන් ලෝහය හෙවත් යකඩය නොනසත්. මාගේ ඒ අධර්මයතෙම අද තොපගේ ධර්මය බිඳියි. කුමක් මෙන්දයත්, දර්ශනීයවූ ස්වර්ණය බිඳින්නාවූ අයෝමය මිටිය මෙනි.

7. "අධර්ම නම් දිව්‍ය පුත්‍රය, ඉදින් තෝ යුද්ධය බලකොට ඇත්තෙහි නම් තට වැඩිහිටියෝද ගරුකටයුත්තෝද නැත. එසේවූ තට මාර්ගයද දෙන්නාවූ ප්‍රිය අප්‍රිය දෙදෙනෙකු කෙරෙන් ප්‍රියයෙකු විසින් මෙන් දෙමි. තාගේ නපුරුකොට කියනලද වචනයන්ද ඉවසමි.

8. "අධර්ම දිව්‍යපුත්‍රතෙම මේ වචනයද අසා ඉදින් යුද කැමැත්තේ නමුත් යුද්ධය නොලබමියි වැළපෙමින් හිස යටිකුරු වූයේ පා උඩුකුරු වූයේ වැටුනේය. මෙපමණකින් අධර්ම දිව්‍යපුත්‍රතෙම නටුයේ වෙයි. (පෘථිවි විවරයෙන් අවීචි මහනරකයට බටුයේය.)

9. "යුද්ධ බලය ජයගෙණ අධර්ම, දිව්‍යපුත්‍රයා නසා පොළොවෙහි හෙළා මහත්වූ බල ඇති සත්‍යයම පරාක්‍රමකොට ඇති ක්ෂාන්ති බලයෙන් යුක්තවූ දිව්‍යපුත්‍රතෙම හටගත් සතුටු සිත් ඇත්තේ දිව්‍ය රථයට නැගී මාර්ගයෙන්ම ගියේය.

10. "මව්පියෝද, මහණ බමුණෝද, යමක්හු ස්වකීය ගෘහයෙහි සත්කාර නොකරණලද්දාහුද, මේ ලෝකයෙහිම ශරීර සංඛ්‍යාතවූ දෙහය බහා ඔහු තුමූ අධර්ම දිව්‍යපුත්‍රතෙම හිස යටිකුරුව යම්සේ නරකයෙහි වැටුනේද, එපරිද්දෙන් ශරීරයාගේ භෙදයෙන් නරකයට පැමිණෙත්.

11. "මව්පියෝද, මහණ බමුණෝද යමක්හුගේ ස්වකීය ගෘහයෙහි මනාකොට සත්කාර කරණ ලද්දාහුද, මෙහිම ශරීර සංඛ්‍යාත දේහය බහා ඔහුතුමූ ධර්ම නම් දිව්‍යපුත්‍රතෙම දිව්‍ය රථයට නැගී යම්සේ ගියේද, එපරිද්දෙන් ශරීරයාගේ භෙදයෙන් සුගතියට පැමිණෙත්."

**458 උදයභද්ද ජාතකය:-** 1. "පිරිසුදුවූ වස්ත්‍ර හැඳි මනා දෙවටොර ඇති, නින්දා නොකටයුතු ශරීර අවයව ඇති කිඳුරන්ගේ නෙත් වැනි ඇස් ඇත්තිය තී ප්‍රාසාදයට නැග හුදකලාව හිඳිනෙහි මේ එකරැය, මේ සැරසූ යහන මැද අපි දෙදෙන වාසය කරමුයි තිට යාඥා කරමි.

2. "ප්‍රවිෂ්ටවන්ට නොහැකිවූ මේ පුරය අතරතුර දිය අගලින් ගැවසීගත්තේය. දැඩිවූ අටළු දොරකොටුවලින් යුක්තය. කඩුගත් අත් ඇත්තවුන් විසින් රක්නාලදී.

3. "ළදරුවෙකුටද යුද්ධ භටයෙකුටද මෙහි පැමිණීමෙක්ද නැත්තේය. එකල්හි කවර කරුණකින් නුඹවහන්සේ මා හා එක්වීම කැමැත්තෙහිද,

4. "සුන්දරිය, මම එක් දිව්‍යපුත්‍රයෙක් වෙමි. තීගේ සමීපයට දිව්‍යානුභාවයෙන් ආයේ වෙමි. තිට යහපතක් වේවා තී මා අද සතුටුකරව, තිට රන් මසු පිරූ තලිය දෙමි.

5. "මහත් ආනුභව ඇති යක්ෂය, උදය රජු ඉක්මවා අන්‍යවූදෙවියෙකු හෝ මනුෂ්‍යයෙකු හෝ යක්ෂයෙකු හෝ මම ප්‍රාර්ථනා නොකරමි. නුඹ යව, ගොස් නැවතද නොඑවයි කීය.

6. "සොඳුර, කාමභෝගී සත්වයන්ගේ යම් ඇල්මක් ඇද්ද, එය උතුම් වන්නීය. යමක් හේතුකොටගෙණ සත්වයෝ විෂමව හැසිරෙද්ද, මනා හසිතයෙන් යුක්තවූ සොඳුර, ඒ කාමරතිය තී නොනසව, තිට රත්‍රං පිරූ රිදී තළියක් දෙමි.

7. "පුරුෂතෙමේ ස්ත්‍රිය ධනයෙන් සිත්ගන්නේ යමක කෙරෙහි ආලය කෙරේද, ඈ උසස් කෙරෙයි. දෙවය, ඔබගේ ස්වභාව ධර්මය ඊට විරුද්ධවේ. ප්‍රත්‍යක්ෂයෙන් ඉතා ස්වල්ප ධනයකින් යුක්තව ආයෙහිද, එහෙයිනි.

8. "සොභන ගාත්‍රයෙන් යුත් රාජ කුමාරිකාවෙනි, මනුෂ්‍යලෝකයෙහි මිනිසුන්ගේ ආයුෂයද ශරීර වර්ණයද පිරිහේ. ඒ හේතුවෙන්ම තිට දෙනලද ධනයද, පිරිහෙයි. අද තී ඉතා දිරාගියෙහිය.

9. "යශස් ඇත්තාවූ රජකුමරිය, මෙසේ මා විසින් බලා සිටියදීම රෑ දාවල් දෙදෙනාගේ ඉක්මයාමෙහි ඒකාන්තයෙන් තීගේ රූපවර්ණය තෙම පිරිහේ.

10. "යහපත් ප්‍රඥා ඇති රාජ පුත්‍රිය, තී මේ වයසින්ම බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙව, වැඩියක් ශරීර වර්ණය ඇත්තී වන්නීය.

11. "මිනිසුන් මෙන් දෙවියෝ නොදිරන්නාහුද, ඒ දෙවියන්ගේ ශරීරයන්හි රැළි නොවැටෙන්නාහුද, ඒ කාරණය මහත් ආනුභාව ඇති යක්ෂය ඔබගෙන් විචාරමි. ඒ දෙවියන්ගේ ශරීර දේහයතෙම කෙසේනම් නොදිරන්නේද,

12. "මිනිස්සු යම්සේ දිරත්ද, දෙවියෝ එසේ නොදිරත්. ඔවුන්ගේ ශරීරයන්හි රැළි නොවැටෙත්. දවස දවස ඒ දෙවියන්ගේ ඉතා අධිකවූ දිව්‍යමයවූ වර්ණයද මහත්වූ භොගයෝද වැඩෙන්නාහ.

13. "මේ ලෝකයෙහි නොයෙක් ජනයෝ කුමකට බිය වූවාහු වෙත්ද, නොයෙක් තීර්ථායතනයෝ පණ්ඩිතයන් විසින් කියන ලද දෙව්ලොවට යන මග වේ. මහත් ආනුභාව ඇති දිව්‍ය රාජය පරලොවට එන තැනැත්තේ කවර මාර්ගයෙක්හි සිටියේ බිය නොවන්නේද.

14. "සොඳුර, වචනයද සිතද මනාකොට පිහිටුවා කයින් පව් නොකරන්නේ බොහෝ ආහාරපාන ඇති ගෘහයෙහි වාසය කරන්නේ සැදැහැ ඇත්තේද මොළොක් සිත් ඇත්තේද දාන සංවිභාග ඇත්තේද ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නේද සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරන්නේද, ප්‍රිය වචන ඇත්තේද සිළුටු වචන ඇත්තේද යන මේ ගුණයන්හි සිටි තැනැත්තේ පරලොවට බිය නොවන්නේය.

15. "උදාර වර්ණ ඇත්තාවූ දිව්‍ය රාජය, මට මවක මෙන් පියෙකු මෙන් අනුශාසනා කෙරෙහිය. ඉතා මහත්වූ නුඹ වහන්සේ කවරෙක් වෙහිද,

16. "සුන්දරිය, මම උදය නම් රජවෙමි. පෙර ගිවිස ගත් අවුල් කාරණයක් නිසා මෙහි ආයෙමි. තිට ආමන්ත්‍රණය කොට යම් තීගේ ඒ අවුලෙන් මිදුනේ වෙමි.

17. "ඉදින් වනාහි නුඹවහන්සේ උදය රජවෙහි නම් සංකරය මුදන පිණිස මෙහි ආයෙහි නම් රාජපුත්‍රය, යම්සේ නැවත එක්වීම වන්නේද, එපරිද්දෙන් මට අනුශාසනා කළ මැනව.

18. "උදය භද්‍රාවෙනි, වයස ඉතා ඉක්මයෙහි ක්ෂණයද එසේම ඉක්ම යන්නේය. ඔවුන්ගේ සිටීමක් නැත්තේය.

ඒකාන්තයෙන් සත්වයෝ චුත වෙත්. අස්ථිරවූ මේ ශරීරය දිරන්නේමය. ප්‍රමාදයෙහි නොහැසිරෙව, දශ කුශල ධර්මයෙහි හැසිරෙව,

19. "උදය භද්‍රාවෙනි ධනයෙන් පිරුණාවූ සියලු පොළොව එකම රජෙක්හට වන්නීද, අනිකෙකුට අයිති නොවන්නීද පහ නොවූ රාග ඇති ඒ පුද්ගලතෙම ඒ යසස ද අත් හැර පරලොව යන්නේය. ප්‍රමාද නොවෙව, ධර්මයෙහි හැසිරෙව,

20. "උදය භද්‍රාවෙනි, මව්පියෝද නැගනීහුද සහෝදරයෝද භාර්යාවෝද ධනයෙන් තෘප්ති රහිතවූවාහු වෙත්. ඔහු තුමූද ඔවුනොවුන් හැරදමත්. එහෙයින් ප්‍රමාද නොවෙව, ධර්මයෙහි හැසිරෙව.

21. "උදය භද්‍රාවෙනි, මේ ශරීරය අන් සතුන්ගේ භෝජනයයි දැන සංසාරයෙහි සුගතියද දුගතියද ස්වල්ප කාලයක් වාසය කිරීම ඇත්තෙක්යයි දැන ප්‍රමාද නොවෙව, දශ කුශල ධර්මයෙහි හැසිරෙව.

22. "සත්වයන්ගේ ජීවිතය ස්වල්පයයි මේ දෙවතෙම යහපතක් කියන්නේය. කුමක් හෙයින්දයත්, මේ ශරීරය දුක් ඇත්තේද ස්වල්ප කලක් පවත්නේද එය දුකින් යෙදුනක්ද වන්නේය. ඒ මම සුරුන්ධන පුරයද කශීරටද හැර දමා තනිවම පැවිදි වන්නෙමියි" කීය.

**459 පානීය ජාතකයඃ-** 1. "මහරජ, මම එකෙකුට මිත්‍රවූයේ ඒ මිත්‍රයාගේ නොදෙනලද පැන් පරිභොග කෙළෙමි. ඒ පාපය මා විසින් කරණ ලදී. ඒ කරණකොටගෙණ පසුව පාපයට පිළිකුල් කෙළෙමි. එහෙයින් මම නැවත පාපයක් නොකරන්නෙමියි පැවිදිවූයේ වෙමි.

2. "මහරජාණෙනි, අනුන්ගේ භාර්යාවක්ද දැක මට කාමාශාවෙක් උපන්නේය. ඒ පාපය මා විසින් කරණලදී. ඒ කරණකොටගෙණ පසුව පිළිකුල් කෙළෙමි. එහෙයින් මම නැවත පාපය නොකරන්නෙමියි පැවිදිවූයේ වෙමි.

3. "මහරජාණෙනි, මාගේ පියා සොරු අල්වාගත්හ. ඒ සොරුන්ට විචාරණලද මම දැන දැන අන් පරිද්දෙකින් එය ප්‍රකාශ කෙළෙමි.

4. "මා විසින් යම් ඒ පාපයක් කරණ ලදද, ඒ හේතුවෙන් පසුව පිළිකුල් කෙළෙමි. එහෙයින් මම නැවත පාපයක් නොකරන්නෙමියි පැවිදිවූයෙමි.

5. "සෝම නම් යාගය එළඹ සිටි කල්හි ප්‍රාණඝාතය කළාහුය. ඔවුන්ගේ ඒ කර්මය අනුමෝදන් වූයේවීමි. ඒ කරණකොට ගෙණ පසුව පිළිකුල් කෙළෙමි. මා විසින් ඒ පාපය කරණලදී. එහෙයින් මම නැවත පාපයක් නොකරන්නෙමියි පැවිදිවූයේ වෙමි.

6. "සුරාවද මේරයද මිහිරියයි බොන්නාහු අපගේ ගම්හි යම් ජනයෝ පළමු වූවාහුද, ඒ ගම්වැසි ජනයෝ බොහෝ දෙනාට අවැඩ පිණිස මද්‍යපානය කළාහුය.

7. "මම ඔවුන්ගේ ඒ කර්මය අනුමෝදන්වූයේ වෙමි. එයින් පසුව පිළිකුල් කෙළෙමි. මා විසින් ඒ පාපය කරණලදී. එහෙයින් මම නැවත පාපයක් නොකරන්නෙමියි පැවිදි වූයේ වෙමි.

8. "යම්බඳුවූ මම කාමයන් සේවනය කරන්නේ එබඳුවූ ධ්‍යාන සුවයෙන් නොලැබුයෙම්ද, දුර්ගන්ධවූ බොහෝ පසමිතුරු කටු ඇති ඉතා බොහෝවූ කාමයන්ට නින්දාවේවා.

9. "මහරජ්ජුරුවෙනි, කාමයෝ නම් මහත්වූ ආශ්වාද ඇත්තාහ. සැප ඇත්තාහ. කාමයන් හැර අන් සැපයෙක් නම් නැත්තේය. යම් කෙනෙක් තුමූ කාමයන් සේවනය කෙරෙද්ද, ඔව්හු ස්වර්ගයෙහි උපදනාහ.

10. "කාමයෝ ස්වල්පවූ ආශ්වාද ඇත්තාහුය. දුක් ඇත්තාහ. කාමයන් හැර අන් දුකක් නැත්තේය. යමෙක් තුමූ කාමයන් සේවනය කෙරෙද්ද, ඔව්හු නරකයෙහි උපදනාහුය.

11. "මනාව මුවහත් තබන ලද කඩුව යම්සේද, මනාව ඇසුරු කරණ ලද ක්‍ෂුරවූ නෙත්තිංස නම් කඩුව යම්සේද, ලෙහි පහරණ ලද ආයුධයක් යම්සේද, ඊට වඩා කාමයෝ අතිශයින් දුක් ඇත්තාහ.

12. "ගිනි අඟුරෙන් දිළිහුනාවූ පුරුෂ ප්‍රමාණයකට අධිකවූ අඟුරුවළක් යම්සේද, දවසක් රත්කරණලද හීවැළක් යම්සේද ඊට වඩා කාමයෝ අතිශයින් දුක් ඇත්තාහ.

13. "දරුණු විෂයක් යම්සේද, කකියවන ලද තෙලක් යම්සේද, රත්වීමෙන් දියවූ තඹලෝහයක් යම්සේද ඊට වඩා කාමයෝ ඉතා දුක් ඇත්තාහුය."

**460 යුධඤ්ජය ජාතකයః-** 1. "මම මිත්‍රාමාත්‍යයන් විසින් පිරිවරණ ලද පියවූ රාජෝත්තමයන් වඳිමි. මහරජ මම පැවිදි වන්නෙමි. දෙවයන් වහන්සේ එය අනුදනීවා.

2. "යුධඤ්ජය කුමාරය, ඉදින් තොපට කාමයන්ගෙන් අඩුවක් ඇද්ද, මම තොපට එය සම්පූර්ණ කරමි. යමෙක් තොපට හිංසා කෙරේද, ඔහු වළක්වමි. පැවිදි නොවෙව.

3. "කාම සම්පත්වලින් අඩුවක් නොම ඇත. මට හිංසා කරන්නෙක්ද නැත්තේය. යම් හෙයකින් ජරාතොමෝ විනාශය නොකෙරේද, එහෙයින් පිහිටක් කරන්ට කැමැත්තෙමි.

4. "පුත්‍ර තෙමේද පියහු යාඥා කරන්නේය. පිය තෙමේද ඖරශ පුත්‍රයා යාඥා කරන්නේය. පුත්‍රය, නියම් ගම් වැසි ජනතෙම යාඥා කෙරෙයි. යුධඤ්ජය නම් පුත්‍රය, පැවිදි නොවෙව,

5. "රාජෝත්තමවූ දෙවයන් වහන්ස, පැවිදිවන්නාවූ මා නොවැළැක්කුව මැනව, මම කාමයන්ගෙන් මත්වූයෙමි ජරාවගේ වසඟයට යන්නෙක් නොවෙම්වා.

6. "පියාණෙනි, මම ඔබට යාඥා කරමි. පුත්‍ර තෙම කීය. පුත්‍රය, මම වළක්වමි. ඔබ කලක් දක්නට කැමැත්තෙමි. යුධඤ්ජය නම් පුත්‍රය, පැවිදි නොවෙවයි රජ තෙම කීය.

7. "මැණියෙනි, සූර්යයාගේ උදාවීමෙහි තණ අග පිනි බිඳු යම්සේද, මිනිසුන්ගේ ආයුෂය මෙසේමය. මා නොවැළැක්කුව මැනව,

8. "රාජෝත්තමය, මේ මව තරණය කරණ පුරුෂයෝ යානාවට ආරෝපනය කෙරේවා. මාගේ මව් තොමෝ සසර තරණය කරන්නාවූ මට අන්තරාය කරන්නියක් නොවේවා.

**9.** "සබ්බ මිත්‍ර නම් රජු විසින් යුධඤ්ජය කුමාර තෙම පැවිදිවීමට අනුදන්නා ලද්දේය. එහෙයින් තෙපි වහා දිවයව්. ඔබට යහපතක්වේවායි කියව්. රම්ම නම් නගරය මාගේ පුත්‍රයා නික්ම යාමෙන් හිස් වන්නේය.

**10.** "පුත් කුමරුන් දහසට ශ්‍රේෂ්ඨවූ තරුණවූ ස්වර්ණයට බඳු පැහැ ඇති යමෙක්වීද, ඒ මේ කුමාර තෙම පැවිදිවූයේ කශාවත් පෙරවීම බලකොට ඇත්තේය.

**11.** "යුධඤ්ජය කුමාර තෙමේද යුධිෂ්ඨිල කුමාර තෙමේද යන කුමාරයෝ දෙදෙන මව්පියන් හැර මරුවාගේ රාගාදී සංගය සිඳ පැවිදිවූවාහුය."

**461 දශරථ ජාතකයː-** 1. "මලනුවූ ලක්ෂමණ කුමාරද නැගිනිවූ සීතා දේවියද එව්. දෙදෙනාම මේ ජලයට බසිව්, මෙසේ මේ භරත කුමාර තෙම කියයි. දසරථ රජතෙම කාලක්‍රියා කෙළේය යනුයි.

**2.** "රාම කුමාරයන් වහන්ස, කවර ආනුභාවයකින් ශොක කටයුත්තට ශොක නොකෙරෙහිද, පියරජහු කළුරිය කළ බව අසා දුක නුඹ නොපෙලන්නේද,

**3.** "බොහෝකොට හඬන්නවුන් අතර යම් බඳුවූවෙකු පුරුෂයා විසින් රක්ෂාකරන්ට නොහැක්කේද, අෂ්ට ලෝක ධර්මයන් දන්නාවූ ඒ ප්‍රාඥ තෙමේ කුමට තමා තවන්නේද,

**4.** "ළදරුවෝද මහළුවූවෝද යම් අඥාන කෙනෙක් වෙත්නම් ඔහුද යම් පණ්ඩිත කෙනෙක් වෙත් නම් ඔහුද ඓශ්වර්යයෙන් ආඪ්‍ය වූවාහුද දිළින්දෝද යන සියල්ලෝ මරුවා පිහිට කොට ඇත්තාහුය.

**5.** "පැසීගිය ඵලයන්ගේ වැටීම හෙතුකොට ගෙණ නිබඳ භය වන්නේ යම්සේද, එමෙන් උපන් මිනිසුන්ට මරණය හේතුකොටගෙණ බිය ඇති වන්නේය.

**6.** "උදෑසන දක්නාලද ඇතැම් බොහෝ දෙනා සවස නොදක්නා ලැබෙත්. සවස දක්නාලද සමහර බොහෝ දෙනෙක් උදෑසන නොදක්නා ලැබෙත්.

7. "ඉදින් හඬනු ලබන්නේ කිසි අර්ථයක් එළවන්නේද, ප්‍රාඥතෙම මුළාවූයේ මේ හැඬීම කරන්නේ නම් තමන්ට වෙහෙස කරන්නේය.

8. "තමහට පීඩා කරන්නේ තමා කෘශවූයේ දුර්වර්ණයෙක් වේ. ඒ හැඬීමෙන් පරලොව ගියාහු නොරැකෙත්. වැළපීම් නිරර්ථක වෙත්.

9. "යම්සේ ඇවිලගත් ගෘහය ජලයෙන්ම නිවන්නේද එසේම ධෛර්යවත්වූ ශ්‍රැතවත්වූ නුවණැත්තාවූ පණ්ඩිත පුරුෂ තෙම හටගත් ශොකය වාතය තෙම පුලුනක් මෙන් නසන්නේය.

10. "සත්වතෙම හුදකලාවම මෙයින් පරලොවයයි. කුලයෙහි හුදකලාවම උපදියි. සියලු ප්‍රාණීන්ගේ මාතෘ පිතෘ සෙවනාදී සම්භෝගයෝ ආලය සහිත බන්ධනය පරමකොට ඇත්තාහුමය.

11. "එහෙයින්ම බහුශ්‍රැතවූ මෙලොවද පරලොවද මනාකොට දක්නාවූ ධර්මය දැන සිටියාවූ ප්‍රාඥයාගේ හෘදය වස්තුවද සිතද මහත්වූද ශොකයෝ නොතවත්.

12. "ඒ මම යශසද සම්පත්තියද සුදුස්සන්ට දෙන්නෙමි. නෑයන්ද පොෂණය කරන්නෙමි. රාජ්‍ය සම්පතද පාලනය කරන්නෙමි. නුවණැත්තහුගේ මේ කටයුත්ත වේ.

13. "රන් මිහිගු බෙරයක්සේ රේඛාතුනකින් යුත් ග්‍රීවා ඇති මහත්වූ බාහු ඇති රාම රජතෙම සොළොස් දහසක් හවුරුදු රාජ්‍යය කරවීය."

**467 සංවර ජාතකය:-** 1. "මහරජ, අප පිය මහරජ තෙමේ මේ එකුන්සියක් පමණ කුමාරයන් ජනපදදීමෙන් පුදන්නේ නුඹ වහන්සේ කිසියම් කුඩා දනව්වකින් පමණවත් පිදිය යුතුයයි මෙනෙහි නොකෙළේය. එසේ කෙළේ නුඹ වහන්සේ රාජ්‍යයෙහි පිහිටවන බව දැනගෙණද,

2. "මහරජ, තමාගේ වැඩ මනාකොට දක්නාවූ ඥාතීහු නුඹ වහන්සේට සතුටුවූහ. එසේ කරණ ලද්දේ අපගේ පිය මහරජහු ජීවත්ව සිටින කල්හිද නොහොත් දෙව්ලොව ගිය කල්හිද,

3. "එම්බා සංවර මහරජ, කවර ශීලයකින් සමාන ජාති ඇති එකුන් සියයක් සොහොයුරන් මැඩ සිටිනෙහිද, රැස්වූ ඥාති සමූහයෝ කුමකින් නුඹ වහන්සේ ඉක්මවා නොපවතිද්ද,

4. "එම්බා රාජපුත්‍රය, මම කිසිවෙකුට ඊර්ෂ්‍යා නොකරමි. මහර්ෂිවූ තාදී ගුණයෙන් යුක්තවූ ශ්‍රමණයන්ගේ පාවඳිමි. උන්වහන්සේලාට සකස්කොට නමස්කාර කරන්නෙමි.

5. "ධර්මගුණයෙහි යෙදුනාවූ කීකරුවූ මොහු කීකරුයයි දැන කරණ අනුශාසනා අසන්නාවූ මට සෘෂි ධර්ම ගුණයෙහි ඇළුනාවූ ඒ ශ්‍රමණයෝ අනුශාසනා කෙරෙත්.

6. "මම මහර්ෂිවූ ඒ ශ්‍රමණයන් වහන්සේලාගේ අනුශාසනාව අසා කිසිවක් නොඉක්මවමි. එහෙයින් මාගේ සිත ධර්මයෙහි ඇළුනේය.

7. "හස්ත්‍යාරෝහකයෝය, බලඇනිවල සිටියාහුය. රථාරෝහකයෝය. පාබල සේනාවෝය යන ඔවුන්ගේ නිබඳ බත් වැටුප් නොවළක්වමි.

8. "චතුෂ්කර්ණාදී මන්ත්‍ර පාරගතවූ මහ ඇමැතියෝද මට ඇත්තාහ. සෙසු පිරිවර ඇමැතියෝද ඇත්තාහ. බරණැස බොහෝවූ මස් අවුළු සුරාපානාදිය ඇතැයි ව්‍යවහාර කෙරෙත්.

9. "තවද සමෘද්ධවූ නොයෙක් රටින් මෙහි පැමිණි වණික් ජනයෝ ඇද්ද, ඔවුන් කෙරෙහිද මා විසින් ආරක්ෂාව කරණ ලද්දීය. එම්බා සොහොවුරු උපොසථය, මෙසේ දනුව,

10. "එම්බා සංවර මහරජ, නෑයන් පිළිබඳවූ ධර්මයෙන් වනාහි රාජ්‍යය කරණු මැනව, නුවණැත්තාවූ පණ්ඩිතතෙමේ නැවතද නෑයන්ට හිතවූවෙක්ම වෙහිය.

11. "ඒ ඒ නෑයන් විසින් පිරිවරණලද රැස්කොට තබන ලද නොයෙක් රත්න ඇති නුඹවහන්සේ වේපචිත්ති අසුර රජතෙම ශක්‍රයා මෙන් පසමිතුරෝ නොමැඩලිය හැක්කාහු වෙත්."

**463 සුප්පාරක ජාතකයː-** 1. "දැලිපිහි මුවහත් බඳු නැහැ ඇති මිනිස් රූ ඇති මත්ස්‍යයෝ මේ සාගරයෙහි මතුවෙත්. යට

ගිලෙත්. සුප්පාරක පණ්ඩිත නම්වූ නුඹවහන්සේ ඒ කාරණය විචාරමු. මේ සාගරයතෙම කවරේද,

2. "හරුකච්ඡා නම් පටුනු ගමින් පැමිණියාවූ ධන සොයන වෙළඳුන්ගේ විනාශවූ නෞකා ඇතිවේ. සමුද්‍රය පුරවාලීයයි කියනු ලැබේ.

3. "ගිනි මෙන්ද, හිරු මෙන්ද මේ සමුද්‍රයතෙම දක්නා ලැබේ. සුප්පාරක නම් නුඹවහන්සේ එය විචාරමි. මේ සමුද්‍රය තෙම කවරේද,

4. "හරුකච්ඡානම් තොටින් පැමිණියාවූ ධන සොයන වෙළඳුන්ගේ විනාශවූ නෞකා ඇති මේ මුහුදට අග්ගිමාලී යයි කියනු ලැබේ.

5. "දීමෙන්ද, කිරීමෙන්ද, මේ මුහුද දක්නාලැබේ. සුප්පාරක නම්වූ නුඹවහන්සේ එය විචාරමි. මේ මුහුද කවරේද,

6. "හරුකච්ඡා නම් නැව්තොටින් පැමිණියාවූ ධන සොයන වෙළඳුන්ගේ විනාශවූ නෞකා ඇති මේ මුහුදට ඛිරවාලීයයි කියනු ලැබේ.

7. "කුශතණ මෙන්ද, තරුණ ශෂ්‍ය මෙන්ද මේ සමුද්‍රය තෙම දක්නාලැබේ. සුප්පාරක නම්වූ ඔබවහන්සේ එය විචාරමි. මේ සමුද්‍රයතෙම කවරේද,

8. "හරුකච්ඡා නම් පටුනු ගමින් පිටත්ව ගියාවූ ධන සොයන වෙළඳුන්ගේ විනාශවූ නෞකා ඇති මෙයට කුශමාලීයයි කියනු ලැබේ.

9. "බට මෙන්ද, හුණමෙන්ද, මේ සමුද්‍රයතෙම දක්නා ලැබේ. සුප්පාරක පණ්ඩිතයන් වහන්සේ ඒ කාරණය විචාරමි. මේ සමුද්‍රයතෙම කවරේද,

10. "හරුකච්ඡා නම් පටුනුගමින් පිටත්ව ගියාවූ ධන සොයන වෙළඳුන්ගේ විනෂ්ටවූ නෞකා ඇති මෙයට නලවාලී යයි කියනු ලැබේ.

11. "මහත් භය ඇති බිය එළවන්නාවූ අමනුෂ්‍ය හඬ ඇසේ. සමුද්‍රයතෙම හැමපැත්තෙන් බිඳීගිය හෙබක් මෙන්ද එක් පසකින්

රැළ නැගීමෙන් ප්‍රකාශයක් මෙන්ද දක්නා ලැබේ සුප්පාරක පණ්ඩිතයන් වහන්සේ එය විචාරමි. මේ සමුද්‍රයතෙම කවරේද,

12. "හරුකච්ඡා නම් පටුනු ගමින් පැමිණියාවූ ධන සොයන වෙළඳුන්ගේ විනාශවූ නෞකා ඇති මෙයට වළවාමුඛී යයි කියනු ලැබේ."

13. යම් කලක පටන් තමන් සිහි කෙරෙම්ද, යම් කලක පටන් නුවණැති බවට පැමිණියෙම්ද, මෙදෑතුර දැනගෙණ එක් කුඩා සතෙකු පවා නසන ලද්දේ නොදනිමි. මේ සත්‍ය වචන බලයෙන් නැව සුවසේ පවතීවා."

**(ඒකාදස නිපාතය නිමි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk